# වාර්ෂික වාර්තාව

# 2021


**සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

**ප්‍රධාන ලේකම් කාර්යාලය**

**උතුරු මැද පළාත් සභාව**

**අනුරාධපුර**

**+94252222238/+94252225295/ncp.planning@yahoo.com**



**සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

**ප්‍රධාන ලේකම් කාර්යාලය**

**උතුරු මැද පළාත**


දුරකථන - +94252222695/+94252225295
ෆැක්ස් - +94252224941/ +94252225295
විද්‍යුත් තැපැල - ncp.planning@yahoo.com

# වාර්ෂික වාර්තාව - 2021

**උතුරු මැද පළාත**

**මග පෙන්වීම**

ප්‍රධාන ලේකම් - එල්.ජේ.එම්.ජී.චන්ද්‍රසිරි බණ්ඩාර මයා

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) - පී.බී.දයාරත්න මයා

**නිර්මාණය සැකසීම හා අධීක්ෂණය**

නියෝජ්‍ය අධ්‍යක්ෂ ( ක්‍රමසම්පාදන) - කේ.ඒ.නොයෙල් මයා

**සහාය**

සංවර්ධන නිලධාරි - වි.එච්.සුකුමාරන් මිය

# උතුරු මැද පළාත පිළිබඳව සැකෙවින්....



රජරට නුවරකලාවිය නොහොත් වැව් බැඳි රාජධානිය ලෙස විරුදාවලිය ලද උතුරු මැද පළාත, ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ ද්විතීය රාජධානි ඇතුළත් වූ අතිශයින්ම පුණ්‍යවන්ත වූ ස්වර්ණ භූමියකි.

අනුරාධපුර සහ පොළොන්නරුව ලෙස වර්තමානයේදී භාවිතාවන පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් සමන්විත උතුරු මැද පළාත එයටම ආවේණික, අනන්‍ය, අද්විතීය අගයන්ගෙන් හා ශ්‍රී විභූතීන්ගෙන් සමන්විතය. අග්‍රගණ්‍ය සහ අසමසම අගයන් හා ජාතික උරුමයන් රැසක් දැයට දායාද කරමින් එම පෞඩත්වය මිහිදන්ව සහ ඇතැම්විට ඉස්මතු වී පෙනෙමින් ශ්‍රේෂ්ඨ ජාතියක විශ්මයජනක ගමන්මඟ යළි යළිත් සුජාතවන පරපුරට නිහඬව කියා දෙයි. සිංහල රාජ්‍ය වංශකතාව, ශිෂ්ටාචාරය හා සංස්කෘතියේ ප්‍රභවය හා විකාශනය මෙන්ම සිදු වූ ප්‍රවණතා පිළිබඳ සැලකීමේදී ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත් කිරීමේදී ඒ සඳහා අවශ්‍යවන ඓතිහාසික ශක්තිමත් අඩිතාලම රජරටින් සපයයි.




ශ්‍රී ලංකාවේ ජනාවාසකරණය, ජල ශිෂ්ටාචාරය, රාජ්‍ය වංශ කතාව, දේශපාලනය, කළමනාකරණය හා පරිපාලනය, බෞද්ධ දර්ශනය, පුරාවිද්‍යාව-වාස්තු විද්‍යාව, මූර්ති හා කැටයම් කලාව, භාෂාව හා සාහිත්‍ය ආදී සංස්කෘතිකාංග මෙන්ම ඒ මත ගොඩනැගුණු ශිෂ්ටාචාරයන් හා සභ්‍යත්වයන් ලොවට කියාපාන්නේ රජරට පුණ්‍ය භූමියෙන් ය. නවතම ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රමෝපායන් සහ තාක්ෂණය සොයා අප යා යුතු වන්නේ රජරට පැවති ශ්‍රී විභූතිය වෙතට ගමන් කිරීමෙනි.




ක්‍රි.පූ.543 දී පමණ එනම් සම්බුද්ධ පරිනිර්වාණ දිනයේදීම සිදු වූ විජයාවතරණයෙන් පසු අනුරාධ නම් සෙනෙවියෙකු අනුරාධ නැකතින් මල්වතු ඔය අසල අනුරාධපුර ජනාවාසය ආරම්භ කරන ලදී. ක්‍රි.පූ.4 දී පමණ ජෝතිය නැමැති ජෛන බමුණකුගේ සැලසුමකට අනුව පණ්ඩුකාභය රජතුමා විසින් අනුරාධපුර නගරය නිර්මාණය කර ඇත. එම නගර නිර්මාණය වර්තමානයේදී අගනගර නිර්මාණයේදී අනුගමනය කරනු ලබන අංගෝපාංග බහුතරයකගෙන් සමන්විත වී තිබීම විශ්මයජනකය.

පොළොන්නරුව මුලින්ම අගනුවර කරගත්තේ චෝල ආක්‍රමණිකයන් විසින්ය. ක්‍රි.ව 1070 පමණ චෝල ආක්‍රමණිකයන් පළවාහැර පළමුවන විජයබාහු රජු විසින් අගනුවර ලෙස පොළොන්නරුව තෝරා ගෙන ඇත. චෝල පාලන සමයේදී ජනනාතමංගලම් ලෙස හැඳින් වූ පොළොන්නරු යුගය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දී ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන වකවානුවකි.

අනුරාධපුර මෙන්ම ජල ශිෂ්ටාචාරය මත පදනම් වූ මෙම යුගය විශ්මිත කලා නිර්මාණ හා භාෂා සාහිත්‍ය අතින්ද ස්වර්ණමය යුගයකි. එම කාලයේදී මෙරටින් පිට රටට පවා සහල් යැවූ බව පැරණි පොතපතෙහි සඳහන් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට සමගාමීව 1987 අංක 42 දරණ පළාත් සභා පනතින් සැලසුණු අවකාශයට අනුව ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත විය. මේ අනුව යහපාලන සංකල්පයට අනුගත වීම රජයේ ප්‍රධාන අරමුණක් වන අතර ඊට අනුව යමින් ශ්‍රී ලංකාවේ දේශපාලන හා පරිපාලන ව්‍යුහය තුළ පළාත් සභා ක්‍රමය හැරවුම් ලක්ෂයක් වන අතර පළාත් සභා ක්‍රමය තුළින් බලය බෙදා හැරීම සහ ප්‍රාදේශියව පවත්නා සමාජ ආර්ථික සංවර්ධන විෂමතා අවම කිරීම සඳහා මූලික දායකත්වයක් පළාත තුළින් සපයා ඇත.



මධ්‍යම රජයට අමතරව මධ්‍යම රජයේ නියාමනයට අනුව පළාතේ සංවර්ධන පරිපාලන සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ මෙන්ම පුනරුත්ථාපන හා ප්‍රතිසංවර්ධන කටයුතු වලදී ද ප්‍රධානම කළමනාකරණ කේන්ද්‍රස්ථානය වන්නේ පළාත් සභාවයි. පළාතක ජන ජීවිතයේ යහපැවැත්ම, සමෘද්ධිමත් බව, සුභසිද්ධිය, තිරසාර බවට බාධා පමුණුවන පීඩාවන්, ප්‍රබල අභියෝග හා ගැටළු හඳුනාගෙන ඒ සඳහා තිරසාර, කඩිනම්, විධිමත් සහ ඉලක්කගත පිළියම් යෙදීමට පළාත් සභා ක්‍රමය යොදාගෙන ඇත.



පළාතේ සම්පූර්ණ ජනගහනය 1,514,967ක් වන අතර මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර 10,472ක් පමණ වේ. එය ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 16% ක ප්‍රමාණයකි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ විසිනවයකින් ද [29], මහනගර සභා දෙකකින් ද [02], ප්‍රාදේශීය සභා විසිපහකින් ද [25], ග්‍රාම නිලධාරී වසම් නමසිය අසූ අටකින් ද [988] සමන්විත වේ.

උතුරු මැද පළාතේ ජනගහනය ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 6.2%ක පමණ ප්‍රතිශතයකි. පළාතේ මුළු පවුල් සංඛ්‍යාව 456,576ක් පමණ වේ. දළ දේශීය නිෂ්පාදිතයට පළාතෙන් කරනු ලබන දායකත්වය 5.9%ක ප්‍රතිශතයකි.



ජනඝනත්වය දෙස බැලීමේදී වර්ග කිලෝ මීටර එකක පදිංචි පුද්ගලයන් සංඛ්‍යාව 142 කි. මෙහිදී විශේෂත්වය වන්නේ ජනඝනත්වය අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයට වඩා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජනඝනත්වය ඉහළ අගයක් ගැනීමයි. පළාතේ භූමි ප්‍රමාණයෙන් විවිධ ප්‍රමාණයේ ජලාශයන්ගෙන් වර්ග කිලෝමීටර 1,031ක් පමණ ආවරණය වී ඇත. සමස්ත ජනගහනයෙන් 5%ක් පමණ නාගරිකව ජීවත් වේ. පළාතේ පවතින විවිධ සම්පත් සහ විභව ශක්තීන් අතර මානව සම්පත, සරුසාර පස, ජලය, වනාන්තර, දැව, පොස්පේට්, රෝස තිරුවානා, සත්ව හා මිරිදිය ධීවර සම්පත, පරිසර පද්ධතිය සහ විශේෂයෙන්ම එල්ලංගා වාරි පද්ධතිය සහ 250,000 ද ඉක්මවා ඇති පළාතේ ගව සම්පත විශේෂිත වේ.

## උතුරු මැද පළාතේ වැදගත් සමාජ ආර්ථික තොරතුරු

### 01. භූමි ප්‍රමාණය හා විශාලත්වය - 2020

| දිස්ත්‍රික්කය | ප්‍රමාණය (හෙක්) | | | පළාතේ මුළු භූමි ප්‍රමාණයෙන් ප්‍රතිශතය (%) | ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් ප්‍රතිශතය (%) | විශාලත්වය අනුව පළාත්/ දිස්ත්‍රික් තරාව |
|---|---|---|---|---|---|---|
| | අභ්‍යන්තර ජලාශ | ගොඩ බිම් | මුළු භූමි ප්‍රමාණය | | | |
| අනුරාධපුර | 70,005 | 647,895 | 717,900 | 68.55 | 10.94 | 1 |
| පොළොන්නරුව | 33,087 | 296,213 | 329,300 | 31.45 | 5.02 | 5 |
| උ.මැ.ප | 103,092 | 944,108 | 1,047,200 | 100.00 | 15.96 | 1 |

මූලාශ්‍රය: ජාතික භූමි පරිහරණ සමීක්ෂණය, භූමි පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, උමැප

### 02. ජනගහනය හා ජන ඝනත්වය

| විස්තරය | 2012* | 2016** | 2017** | 2018** | 2019** | 2020** |
|---|---|---|---|---|---|---|
| මුළු ජනගහනය | 1,266,700 | 1,401,561 | 1,476,265 | 1,492,485 | 1,509,946 | 1,514,967 |
| නාගරික ජනගහනය (5.9%) | 50,600 | 55,866 | 87,100 | 88,057 | 89,087 | 89,383 |
| ග්‍රාමීය ජනගහනය (94.1%) | 1,216,100 | 1,345,695 | 1,389,165 | 1,404,428 | 1,420,859 | 1,425,584 |
| ජන ඝනත්වය | 128 | 142 | 156 | 158 | 162 | 142 |

මූලාශ්‍රය: * 2012 ජන හා නිවාස සංගණනය, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, සම්පත් පැතිකඩ 2020

### 03. ජාතික දළ දේශීය නිෂ්පාදිතයට පළාතේ දායකත්වය

| වර්ෂය | උ.මැ.ප (රු.මි.) | ජාතික (රු.මි.) | පළාතේ දායකත්වය (%) | පළාත් අතර ස්ථානය |
|---|---|---|---|---|
| 2012 | 379,243 | 7,578,554 | 5 | 7 |
| 2013 | 489,622 | 9,592,125 | 5.1 | 7 |
| 2014 | 561,261 | 10,361,151 | 5.4 | 8 |
| 2015 | 644,667 | 10,950,621 | 5.9 | 6 |
| 2016 | 696,804 | 11,996,083 | 5.8 | 6 |
| 2017 | 748,798 | 13,328,103 | 5.6 | 7 |
| 2018 | 809,019 | 14,290,907 | 5.7 | 6 |
| 2019 | 815,743 | 15,012,953 | 5.4 | 7 |
| 2020 | 876,300 | 14,972,955 | 5.9 | 6 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2021

### 04. පළාතේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික බෙදී යාම (%)

| කර්මාන්ත ප්‍රභවය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකාර්මික | 12.35 | 12.77 | 12.76 | 11.4 | 13.0 | 14.6 | 13.5 | NA |
| කර්මාන්ත | 21.24 | 18.62 | 18.92 | 22.0 | 17.8 | 16.3 | 17.8 | NA |
| සේවා | 59.60 | 61.81 | 61.12 | 66.6 | 69.2 | 69.1 | 68.7 | NA |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2021

### 05. පළාත් සෞභාග්‍යතා දර්ශකය (2020) - 0.531

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව 2020

## 06. දිස්ත්‍රික්ක අනුව දරිද්‍රතා දර්ශකය

| දිස්ත්‍රික්කය | දරිද්‍රතා දර්ශකය (%) | | | | | |
|---|---|---|---|---|---|---|
| | **1995/96** | **2002** | **2006/07** | **2009/10** | **2012/13** | **2016** |
| අනුරාධපුර | 27 | 20.4 | 14.9 | 5.7 | 7.6 | 3.8 |
| පොළොන්නරුව | 20.1 | 23.7 | 12.7 | 5.8 | 6.7 | 2.2 |
| උ.මැ.ප | 24.7 | 21.5 | 14.2 | 5.7 | 7.3 | 3.3 |
| ශ්‍රී ලංකාව | 28.8 | 22.7 | 15.2 | 8.9 | 6.7 | 4.1 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2020, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2016 දත්ත පමණක් ඇත)**

## 07. දිළිඳු ගෘහ ඒකක සහ දරිද්‍රතා පරතරය

| දිස්ත්‍රික්කය | දිළිඳු ගෘහ ඒකක (%) | | | දරිද්‍රතා පරතරය (%) | | |
|---|---|---|---|---|---|---|
| | **2009/10** | **2012/13** | **2016** | **2009/10** | **2012/13** | **2016** |
| අනුරාධපුර | 4.6 | 6.3 | 2.7 | 1.0 | 1.1 | 0.5 |
| පොළොන්නරුව | 4.5 | 5.6 | 1.7 | 1.0 | 0.9 | 0.5 |
| උ.මැ.ප | 4.6 | 6.1 | 2.4 | 1.0 | 1.0 | 0.5 |
| ශ්‍රී ලංකාව | 7.0 | 5.3 | 3.1 | 1.7 | 1.2 | 0.6 |

**මූලාශ්‍රය: සමාජ ආර්ථික දත්ත - 2018, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 08. සේවා වියුක්ති අනුපාතය සහ සේවා නියුක්තියේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2020

| | | සාක්ෂරතාවය | ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතය | විරැකියා අනුපාතය | සේවා නියුක්තියේ ව්‍යාප්තිය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | බැදුම් සහිත සේවා නියුක්තික | සේවා යෝජක | තමාගේම රැකියාවක් කරන | පවුලේ රැකියා සඳහා දායකවන |
| 2017 | අ/පුර | 92.8 | 61.3 | 4.6 | 38.3 | 1.2 | 41.6 | 18.9 |
| | පො/නරුව | 89.1 | 50.0 | 3.6 | 46.4 | 2.3 | 42.4 | 8.9 |
| 2018 | අ/පුර | 93.3 | 57.3 | 4.6 | 40.8 | 0.8 | 43.8 | 14.6 |
| | පො/නරුව | 90.1 | 49.8 | 4.2 | 44.0 | 0.9 | 46.6 | 8.6 |
| 2019 | අ/පුර | 92.4 | 57.7 | 3.1 | 37.9 | 0.9 | 44.7 | 16.6 |
| | පො/නරුව | 90.0 | 53.0 | 3.6 | 44.7 | 0.7 | 45.2 | 9.4 |
| 2020 | අ/පුර | 93.0 | 56.4 | 3.9 | 38.6 | 0.7 | 45.8 | 14.9 |
| | පො/නරුව | 88.6 | 48.2 | 4.5 | 48.9 | 1.4 | 41.0 | 8.8 |

**මූලාශ්‍රය: ශ්‍රම බලකා සමීක්ෂණය - වාර්ෂික වාර්තාව 2020,** සංඛ්‍යාන අත්පොත 2021, **ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 09. තරුණ විරැකියා ප්‍රතිශතය

| වර්ෂය | උ.මැ.ප | ශ්‍රී ලංකාව |
|---|---|---|
| 2013 | 15.2 | 19.2 |
| 2014 | 13.6 | 20.3 |
| 2015 | 16.3 | 20.8 |
| 2016 | 19.7 | 21.6 |
| 2017 | 17.3 | 18.5 |
| 2018 | 24.5 | 21.4 |
| 2019 | 19.4 | 21.5 |
| 2020 | 23.6 | 26.5 |

**මූලාශ්‍රය: ශ්‍රම බලකා සමීක්ෂණය - වාර්ෂික වාර්තාව 2020**

## 10. අධ්‍යාපන

| විස්තරය | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|
| පාසල් සංඛ්‍යාව | 811 | 814 | 815 | 817 | 817 | 813 |
| ගුරුවරුන් සංඛ්‍යාව | 16,264 | 16,674 | 16,905 | 16,238 | 16,353 | 16,157 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | 280,963 | 289,971 | 297,845 | 298,869 | 297,850 | 301,319 |
| ගුරු සිසු අනුපාතය | 1:17 | 1:17 | 1:18 | 1:18 | 1:18 | 1:19 |
| පරිගණක සාක්ෂරතාව [%] (උ.මැ.ප.) | 21.6 | 20.9 | 22.1 | 20.7 | 22.5 | 24.8 |
| පරිගණක සාක්ෂරතාව [%] (ශ්‍රී ලංකාව) | - | 28.6 | 29.0 | 30.8 | 32.3 | 35.0 |

**මූලාශ්‍රය: පාසල් නාමාවලිය හා අධ්‍යාපනික දත්ත, උතුරු මැද පළාත, පරිගණක සාක්ෂරතා සංඛ්‍යා ලේඛන, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

## 11. ජාතික විභාග ප්‍රතිඵල

| 2017 | | | 2018 | | | 2019 | | | 2020 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය | උ.මැ.ප | ශ්‍රී ලංකා | පළාත් ස්ථානය |
| අ.පො.ස.(සා.පෙළ) සමත් ප්‍රතිශතය (උ.පෙළ. සඳහා සුදුසුකම් ලැබූ) | | | | | | | | | | | |
| 70.03 | 73.05 | 6 | 72.78 | 75.0 | 5 | 71.78 | 73.84 | 5 | 74.19 | 75.12 | 7 |
| අ.පො.ස (උ.පෙළ.) සමත් ප්‍රතිශතය (විශ්ව විද්‍යාල ප්‍රවේශය ලැබීමට සුදුසුකම් ලැබූ) | | | | | | | | | | | |
| 63.01 | 66.02 | 8 | 62.23 | 64.7 | 7 | 63.81 | 65.76 | 7 | 63.3 | 65.98 | 8 |

**මූලාශ්‍රය:-** අ.පො.ස. (සා.පෙළ) සහ (උ.පෙළ) විභාග - අපේක්ෂකයින්ගේ කාර්ය සාධනය, විභාග දෙපාර්තමේන්තුව

## 12. උතුරු මැද පළාතෙන් විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් වීම.

| පළාත් සහ දිස්ත්‍රික්ක | 2012/13 | 2013/14 | 2014/15 | 2015/16 | 2016/17 | 2017/18 | 2018/19 | 2019/20 |
|---|---|---|---|---|---|---|---|---|
| උ.මැ.ප | 1,186 | 1,294 | 1,327 | 1,472 | 1,554 | 1,672 | 1,783 | 2,326 |
| අනුරාධපුර | 830 | 935 | 966 | 1,054 | 1,097 | 1,185 | 1,296 | 1,644 |
| පොළොන්නරුව | 356 | 359 | 361 | 418 | 457 | 487 | 487 | 682 |

**මූලාශ්‍රය:** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## 13. සෞඛ්‍ය තොරතුරු

| විස්තරය | 2019 | | | | 2020 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික | එකතුව | පුරුෂ | ස්ත්‍රී | ජාතික |
| දළ උපත් අනුපාතිකය | 15.9 | 16.5 | 15.3 | 14.6 | 15.0 | 15.5 | 14.5 | 13.8 | 13.6 | 14.2 | 13.1 | 12.9 |
| දළ මරණ අනුපාතිකය | 6.1 | 7.3 | 5.0 | 6.7 | 5.6 | 6.6 | 4.7 | 6.0 | 6.6 | 7.7 | 5.5 | 7.4 |

**මූලාශ්‍රය:** පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, උතුරු මැද පළාත

## 14. අනෙකුත් සෞඛ්‍ය අංශය හා සම්බන්ධ තොරතුරු

**පළාතේ රෝහල් සංඛ්‍යාව - 2021**

| ආයතනය | අනුරාධපුරය | පොළොන්නරුව | උතුරු මැද පළාත |
|---|---|---|---|
| ශික්ෂණ රෝහල | 1 | - | **1** |
| දිස්ත්‍රික් මහා රෝහල | - | 1 | **1** |
| මූලික රෝහල A | 1 | 1 | **2** |
| මූලික රෝහල B | 5 | 2 | **7** |
| ප්‍රදේශීය රෝහල A | 1 | - | **1** |
| ප්‍රදේශීය රෝහල B | 10 | 5 | **15** |
| ප්‍රදේශීය රෝහල C | 22 | 3 | **25** |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක | 21 | 16 | **37** |

මූලාශ්‍රය:- පළාත් සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව, උතුරු මැද පළාත

**රෝහල් පහසුකම් පිළිබඳ විස්තර - 2021**

| | |
|---|---|
| රෝහල් | 89 |
| ඇඳන් සංඛ්‍යාව | 6,354 |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ගණන | 1,114 |
| රජයේ හෙද නිලධාරීන් ගණන | 2,509 |

මූලාශ්‍රය:- පළාත් සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව, උතුරු මැද පළාත

## 15. වී නිෂ්පාදනය - යල හා මහ කන්නය -2021

| | වාරි ක්‍රමය | 2020/21 මහ | | | | | | 2021 යල | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අ/පුර | පො/ව | උ.මැ.ප. | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාවට දක්වන දායකත්වය | පළාත් තරාව | අ/පුර | පො/ව | උ.මැ.ප. | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාවට දක්වන දායකත්වය | පළාත් තරාව |
| බීජ වැපුරූ ප්‍රමාණය (හෙක්.) | මහ | 51,479 | 57,596 | 109,075 | 352,875 | 30.91% | 2 | 40,880 | 56,994 | 97,874 | 310,669 | 31.50% | 2 |
| | සුළු | 48,058 | 6,526 | 54,584 | 196,722 | 27.75% | | 20,703 | 5,632 | 26,335 | 124,507 | 21.15% | |
| | වර්ෂා | 13,012 | 2,401 | 15,413 | 220,643 | 6.99% | | 521 | - | 521 | 66,291 | 0.79% | |
| | එකතුව | 112,549 | 66,523 | 179,072 | 770,240 | 23.25% | | 62,104 | 62,626 | 124,730 | 501,467 | 24.87% | |
| අස්වැන්න නෙලා ගත භූමි ප්‍රමාණය (හෙක්.) | මහ | 51,406 | 57,596 | 109,002 | 351,492 | 31.01% | 2 | 40,870 | 56,994 | 97,864 | 309,294 | 31.64% | 2 |
| | සුළු | 47,959 | 6,526 | 54,485 | 195,592 | 27.86% | | 20,626 | 5,405 | 26,031 | 122,641 | 21.23% | |
| | වර්ෂා | 13,001 | 2,401 | 15,402 | 215,327 | 7.15% | | 521 | - | 521 | 64,826 | 0.80% | |
| | එකතුව | 112,366 | 66,523 | 178,889 | 762,411 | 23.46% | | 62,017 | 62,399 | 124,416 | 496,761 | 25.05% | |
| දළ නිෂ්පාදිතය (MT) | | 460,585 | 307,190 | 767,775 | 3,061,394 | 25.08% | 1 | 233,948 | 300,317 | 534,265 | 2,088,202 | 25.58% | 2 |

**මූලාශ්‍රය:** කෘෂිකාර්මික සහ පාරිසරික සංඛ්‍යාලේඛන අංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 16. අතිරේක බෝග නිෂ්පාදනය (මෙ.ටො.) - යල හා මහ කන්නය - 2021

| බෝගය | 2020/21 මහ | | | | | | 2021 යල | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අනු/පුර | පො/රුව | උ.මැ.ප. | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාවට දක්වන දායකත්වය | පළාත් තරාව | අනු/පුර | පො/රුව | උ.මැ.ප. | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාවට දක්වන දායකත්වය | පළාත් තරාව |
| කුරක්කන් | 1,530.1 | 46.7 | 1,576.8 | 5,129.9 | 24.2% | 1 | 191.8 | 5.8 | 197.6 | 2,934.4 | 1.6% | 3 |
| **බඩඉරිඟු** | 244,713.9 | 1,089.7 | 245,803.6 | 432,152.6 | **56.5%** | **1** | 9,595.7 | 1,228.8 | 10,824.5 | 40,291.3 | **26.9%** | **2** |
| මුං | 665.6 | 309.9 | 975.5 | 6,515.2 | 14.9% | 2 | 332.3 | 699.8 | 1,032.1 | 12,416.0 | 8.3% | 5 |
| කව්පි | 881.1 | 160.2 | 1,041.3 | 5,682.5 | 17.4% | 3 | 454.1 | 244.8 | 698.9 | 6,195.6 | 11.3% | 5 |
| රටකජු | 2,108.1 | 810.1 | 2,918.2 | 21,224.4 | 12.3% | 5 | 646.4 | 1,066.1 | 1,712.5 | 15,722.5 | 10.9% | 4 |
| **උඳු** | 6,287.8 | 51.1 | 6,338.9 | 10,506.4 | **60.6%** | **1** | 2,146.5 | 84.9 | 2,231.4 | 3,897.7 | **57.2%** | **1** |
| **තල** | 273.3 | 3.3 | 276.6 | 2,725.0 | 10.0% | 3 | 5,578.9 | 2.6 | 5,581.5 | 9,274.4 | **60.2%** | **1** |
| මඤ්ඤොක්කා | 6,425.2 | 4,299.2 | 10,724.4 | 169,216.6 | 6.5% | 9 | 4,104.7 | 3,389.1 | 7,493.8 | 145,165.7 | 5.2% | 9 |
| බතල | 871.9 | 545.8 | 1,417.7 | 23,905.0 | 6.0% | 8 | 316.2 | 290.7 | 606.9 | 19,509.8 | 3.1% | 9 |
| රතු ළූණු | 63.4 | 3.0 | 66.4 | 30,828.3 | 0.3% | 8 | 640.0 | 0.9 | 640.9 | 22,955.4 | 2.8% | 4 |
| **ලොකු ළූණු** | 164.8 | - | 164.8 | 4,426.6 | 14.7% | 3 | 27,505.5 | 1,700.7 | 29,206.2 | 61,480.2 | **47.5%** | **2** |
| **අමු මිරිස්** | 10,399.3 | 595.0 | 10,994.3 | 37,168.0 | **30.8%** | **1** | 3,676.3 | 374.1 | 4,050.4 | 31,397.4 | 12.9% | 4 |
| අබ | 41.3 | - | 41.3 | 358.2 | 11.7% | 2 | 0.4 | - | 0.4 | 13.7 | 2.9% | 4 |
| අමු ඉඟුරු | 110.3 | 140.5 | 250.8 | 27,084.3 | 0.9% | 8 | 173.1 | 172.4 | 345.5 | 29,757.6 | 1.2% | 7 |
| අමු කහ | 62.8 | 149.4 | 212.2 | 23,625.9 | 0.9% | 8 | 156.0 | 286.6 | 442.6 | 28,319.2 | 1.6% | 7 |

**මූලාශ්‍රය: කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යාලේඛන අංශය, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

| විස්තරය | ප්‍රමාණය (මිලියන) |
|---|---|
| පොල් (ඇස්තමේන්තු කර ඇති නිෂ්පාදනය) - 2020 | 314 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව - 2020

## 17. පලතුරු නිෂ්පාදනය (මෙ.ටො) - 2020/2021

| බෝගය | අනු/පුර | පො/නරුව | උ.මැ.ප. | ශ්‍රී ලංකාව | ශ්‍රී ලංකාවට දක්වන දායකත්වය | පළාත් තරාව |
|---|---|---|---|---|---|---|
| කෙසෙල් | 9,810.0 | 371.7 | 10,181.7 | 62,090.4 | 16.4% | 1 |
| අඹ | 122,939.7 | 10,550.5 | 133,490.2 | 496,487.5 | 26.9% | 1 |
| ගස්ලබු | 26,910.3 | 692.8 | 27,603.1 | 86,413.7 | 31.9% | 1 |
| කිලෝ පේර | 9,251.6 | 313.5 | 9,565.1 | 26,735.0 | 35.8% | 1 |
| දොඩම් | 14,101.3 | 1,541.3 | 15,642.6 | 58,644.4 | 26.7% | 1 |
| දෙහි | 39,526.4 | 4,047.0 | 43,573.4 | 333,015.1 | 13.1% | 2 |

මූලාශ්‍රය: කෘෂිකාර්මික සහ පාරිසරික සංඛ්‍යාලේඛන අංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 18. කිරි එකතු කරන/ නිෂ්පාදනය කරන මධ්‍යස්ථාන - 2021

| | |
|---|---|
| කිරි එකතු කරන මධ්‍යස්ථාන ගණන | 769 |
| අගය එකතු කළ කිරි නිෂ්පාදනය කරන මධ්‍යස්ථාන ගණන | 154 |
| පශු සම්පත් ගොවිපලවල් ගණන * | 70,639 |

මූලාශ්‍රය: කෘෂිකාර්මික සහ පාරිසරික සංඛ්‍යාලේඛන අංශය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

* මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, උ.මැ.ප.

## 19. වාර්ෂික කිරි නිෂ්පාදනය (ලීටර මිලියන) - 2019-2020

| වර්ෂය | අ/පුර | පො/නරුව | උමැප | ශ්‍රී ලංකාව * | උ.මැ.ප. ශ්‍රී ලංකාවට දක්වන දායකත්වය |
|---|---|---|---|---|---|
| 2019 | 32.93 | 12.14 | 45.07 | 422.13 | 10.68% |
| 2020 | 40.06 | 13.51 | 53.56 | 414.83 | 12.91% |
| 2021 | 43.72 | 15.37 | 59.09 | 439.84 | 13.43% |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, උ.මැ.ප.

*මූලාශ්‍රය: සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව - වෙබ් අඩවිය

## 20. වාර්ෂික බිත්තර නිෂ්පාදනය (මිලියන) - 2019-2021

| වර්ෂය | අ/පුර | පො/නරුව | උමැප | ශ්‍රී ලංකාව * | උ.මැ.ප. ශ්‍රී ලංකාවට දක්වන දායකත්වය |
|---|---|---|---|---|---|
| 2019 | 17.87 | 20.96 | 38.83 | 2,630.74 | 1.48% |
| 2020 | 28.49 | 10.20 | 38.69 | 2,435.96 | 1.59% |
| 2021 | 37.01 | 99.65 | 136.67 | 2,934.55 | 4.66% |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, උ.මැ.ප.

*මූලාශ්‍රය: සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව - වෙබ් අඩවිය ■ මෙම අගය ඇස්තමේන්තු කර ඇත

## 21. ගෘහ ඒකක ආදායම් සංඛ්‍යාති 2019

| | අනුරාධපුර | පොළොන්නරුව | උ.මැ.ප |
|---|---|---|---|
| ගෘහ ඒකකයක සාමාන්‍ය මාසික ආදායම (රු) | 64,409 | 65,180 | 64,645 |
| ගෘහ ඒකකයක මධ්‍යස්ථ මාසික ආදායම (රු) | 46,379 | 48,657 | 47,415 |
| ඒක පුද්ගල සාමාන්‍ය මාසික ආදායම (රු) | - | | 18,131 |
| ඒක පුද්ගල මධ්‍යස්ථ මාසික ආදායම (රු) | | | 13,863 |
| ආදායම් උපයන්නන්ගේ සාමාන්‍ය මාසික ආදායම(රු) | 38,577 | 36,754 | |
| ගෘහ ඒකකයක ආදායම් උපයන්නන් සංඛ්‍යාව | 1.7 | 1.8 | |
| ගෘහ ඒකක ආදායමේ ගිනි සංගුණකය | 0.44 | 0.41 | |

මූලාශ්‍රය :-ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය 2019, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව

## 22. ගෘහ ඒකක වියදම් සංඛ්‍යාති 2019

| | අනුරාධපුර | පොළොන්නරුව | උ.මැ.ප |
|---|---|---|---|
| ගෘහ ඒකකයක සාමාන්‍ය මාසික වියදම (රු) | 52,796 | 51,295 | 52,337 |
| ගෘහ ඒකකයක මධ්‍යස්ථ මාසික වියදම (රු) | 43,362 | 41,193 | 42,924 |

මූලාශ්‍රය :-ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය 2019, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව

## 23. පළාතේ මාර්ග හා ප්‍රවාහනය

### පළාතේ මාර්ග පිළිබඳ පද්ධතිය පිළිබඳ තොරතුරු - 2021

| ශ්‍රේණිය | මාර්ග මුළු දිග (කි.මී.)) දිග (කි.මී.) | | |
|---|---|---|---|
| | අනුරාධපුර | පොළොන්නරුව | උතුරු මැද පළාත |
| A ශ්‍රේණිය | 318.77 | 184.93 | 503.70 |
| AB ශ්‍රේණිය | 19.52 | - | 19.52 |
| B ශ්‍රේණිය | 450.84 | 230.70 | 681.54 |
| C ශ්‍රේණිය | 740.59 | 486.12 | 1,226.71 |
| D ශ්‍රේණිය | 697.60 | 23.01 | 720.61 |
| ග්‍රාමීය මාර්ග | 9,110.75 | 2,910.15 | 12,020.90 |
| **එකතුව** | **11,019.30** | **3,649.98** | **14,669.28** |

මූලාශ්‍රය:- පළාත් පාලන දෙපාර්තමේන්තුව,උතුරු මැද පළාත

### පළාතේ රථ වාහන පිළිබඳ තොරතුරු -2021

| අනු අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1 | ලියාපදිංචි කර ඇති මගී ප්‍රවාහන බස්රථ සංඛ්‍යාව | 734 |
| 2 | ලියාපදිංචි කර ඇති පාසල් ප්‍රවාහන රථ සංඛ්‍යාව | 60 |
| 3 | ලියාපදිංචි කර ඇති සිසු සැරිය බස්රථ සංඛ්‍යාව | 129 |
| 4 | ලියාපදිංචි කර ඇති භාණ්ඩ ප්‍රවාහන රථ සංඛ්‍යාව | 21 |
| 5 | ලියාපදිංචි කර ඇති මගී ප්‍රවාහන ත්‍රීරෝද රථ සංඛ්‍යාව | 6829 |
| 6 | ලියාපදිංචි කර ඇති කාර්යාල සේවා බස්රථ සංඛ්‍යාව | 10 |
| 7 | 2021 වසර වනවිට බලපත්‍ර නිකුත්කර ඇති වාහන සංඛ්‍යාව | බස්රථ :- 720<br>ත්‍රීරෝද රථ :- 811 |
| 8 | 2021 වසරේ දී බලපත්‍ර නිකුත්කර ඇති නව වාහන සංඛ්‍යාව | බස්රථ :- 36<br>ත්‍රීරෝද රථ :- 44 |

මූලාශ්‍රය:- මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය,උතුරු මැද පළාත

## දැක්ම

සංවර්ධනයේ ප්‍රතිලාභ මැනවින් හිමිකරගත් අභිමානවත් ප්‍රජාවක්.

## මෙහෙවර

**සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, පළාතේ පවතින සියළුම සම්පත් හා විභවතාවන් ප්‍රශස්ත අයුරින් උපයෝජනයෙන්, පළාතේ මානව සම්පත් සංවර්ධනය ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධන ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව පළාත සංවර්ධනය කරමින් ජාතික සංවර්ධනයට සෘජු හා අඛණ්ඩ ලෙස දායක වීම.**

## පළාත් සභාවේ ප්‍රධාන කාර්යයන්

- නීතිය හා සාමය පවත්වාගෙන යාම.
- පළාත් සභා පරිපාලනය.
- මූල්‍ය කළමනාකරණය.
- මානව සම්පත් කළමනාකරණය.
- ඉඩම් පරිපාලනය හා සංවර්ධනය.
- වාරිමාර්ග සංවර්ධනය.
- කෘෂිකර්ම සංවර්ධනය.
- පශු සම්පත් සංවර්ධනය.
- කර්මාන්ත සංවර්ධනය.
- ප්‍රාදේශීය සංවර්ධනය.
- සමූපකාර සංවර්ධනය.
- ප්‍රජා සංවර්ධනය.
- රෝහල් සේවාවන් සංවර්ධනය හා පවත්වාගෙන යාම.
- මහජන සෞඛ්‍ය සේවාවන් සංවර්ධනය.
- පොදු සෞඛ්‍ය සේවාවන් සහ පෝෂණ කටයුතු.
- දේශීය වෛද්‍ය සේවාවන්.
- පර්යේෂණ හා සංවර්ධන.
- ප්‍රාථමික හා ද්වීතීයික අධ්‍යාපනය.
- අධ්‍යාපන ප්‍රවේශය සහ සහභාගීත්වය දියුණු කිරීම.
- අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා.
- ක්‍රීඩා සංවර්ධනය.
- සංස්කෘතික සංවර්ධනය.
- සමාජ ආරක්ෂණය හා සමාජ සුභසාධනය.
- සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් සැකසීම හා සංවර්ධන වැඩසටහන් මෙහෙයවීම ඇතුලත් සමස්ත සැලසුම්කරණ ක්‍රියාවලිය මෙහෙයවීම.
- මාර්ග සංවර්ධනය.
- තොරතුරු තාක්ෂණය.
- මාර්ගස්ථ මගී ප්‍රවාහනය.
- ග්‍රාම සංවර්ධනය.
- ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා.
- නිවාස සංවර්ධනය.
- පළාතේ විගණන හා විමර්ශන කටයුතු.
- පළාත් ආදායම් කටයුතු.
- පළාත් පාලන කටයුතු.
- සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය හරහා ඉංජිනේරුමය, ආරක්ෂක සේවා හා මුද්‍රණ කටයුතු සිදු කිරීම.
- සංස්කෘතික හා කලා කටයුතු සංවර්ධනය.
- මුල් ළමාවිය සංවර්ධනය.
- පරිවාස හා ළමාරක්ෂක සේවා සැපයීම.
- මාර්ග සංවර්ධන හා මගී ප්‍රවාහන කටයුතු.

## පළාත් ගීතය

දිලේ රන්වැලි සෑ හිසින් හිරු
රන් කිරණ ගෙන සිළුමිණේ
සැලේ මහ බෝ ළඳළු පවනින්
සිසිල පතුරා බුදු ගුණේ

සයුරු පරදන වැව් තලා මත
සිය දහස් සියපත් පිපේ
අතවනා සිරිකතට හිනැහෙයි
රන් කරල් පුලතිසි කෙතේ

සව් සිරින් ගැදි පැදි කුසුම් මී
පන්හිඳෙන් උතුරා හැලේ
රළු පරළු සෙල් කුළු මෙලෙක් වී
රූ රටා විස්කම් මැවේ

සියකමින් නොව යුතුකමින් සිත්
පහන්කළ විරු පරපුරේ
ගැමුණු පැරකුම් රජුන් විකුමන්
දිසෙයි යළි රජරට බිමේ

පද රචනය - පූජ්‍ය පල්ලේගම හේමරතන හිමි
සංගීතය - විශාරද කරුණාරත්න විජේවර්ධන

**පළාත් පුෂ්පය (ඇහැල මල)**



**පළාත් ධජය**




උතුරු මැද පළාත - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ
වවුනියා දිස්ත්‍රික්කය
මන්නාරම දිස්ත්‍රික්කය
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
පුත්තලම දිස්ත්‍රික්කය
කුරුණෑගල දිස්ත්‍රික්කය
මාතලේ දිස්ත්‍රික්කය
මඩකලපුව දිස්ත්‍රික්කය
අම්පාර දිස්ත්‍රික්කය
අනුරාධපුර දිස්ත්‍රික්කය
1. ගලෙන්බිඳුණුවැව
2. ගල්නෑව
3. හොරොව්පොතාන
4. ඉපලෝගම
5. කහටගස්දිගිලිය
6. කැබිතිගොල්ලෑව
7. කැකිරාව
8. මහවිලච්චිය
9. මැදවච්චිය
10. මිහින්තලේ
11. නාච්චාදූව
12. නොච්චියාගම
13. මධ්‍යම නුවරගම් පළාත
14. නැගෙනහිර නුවරගම් පළාත
15. පදවිය
පොළොන්නරුව දිස්ත්‍රික්කය
1. දිඹුලාගල
2. ඇලහැර
3. හිඟුරක්ගොඩ
4. ලංකාපුර
5. මැදිරිගිරිය
6. තමන්කඩුව
7. වැලිකන්ද

## උතුරු මැද පළාත් සභාවේ සංවිධාන ව්‍යුහය



# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01. | ආණ්ඩුකාරවර කාර්යාලය | 1-16 |
| 02. | පළාත් සභාව සහ පළාත් සභා ලේකම් කාර්යාලය | 17-21 |
| 03. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 22-35 |
| 04. | පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව | 36-40 |
| **05.** | **ප්‍රධාන ලේකම් කාර්යාලය** | **41-57** |
| 5.1. | පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | 58-84 |
| 5.2. | පළාත් භාණ්ඩාගාරය | 85-96 |
| 5.3. | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 97-105 |
| 5.4. | පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | 106-110 |
| 5.5. | පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය | 111-117 |
| 5.6. | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 118-123 |
| **06.** | **පළාත් ප්‍රධාන අමාත්‍යාංශය** | **124-147** |
| 6.1. | පළාත් පාලන දෙපාර්තමේන්තුව | 148-163 |
| 6.2. | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 164-232 |
| 6.3. | පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | 233-243 |
| 6.4. | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය | 244-248 |
| 6.5. | මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය | 249-260 |
| 6.6. | පුස්තකාල සේවා මණ්ඩලය | 261-278 |
| **07.** | **පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය, ධීවර සහ නිවාස කටයුතු අමාත්‍යාංශය** | **279-290** |
| 7.1. | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 291-309 |
| 7.2. | පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 310-329 |
| **08.** | **පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය** | **330-346** |
| 8.1. | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | 347-372 |
| 8.2. | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | 373-385 |
| 8.3. | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 386-406 |
| 8.4. | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | 407-432 |

**09. පළාත් ප්‍රවාහන, ක්‍රීඩා සහ යෞවන කටයුතු, සමුපකාර වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය 433-442**

9.1. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 443-454

9.2. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව 455-473

9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය 474-480

9.4. මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය 481-499

9.5. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව 500-513

**10. පළාත්, ඉඩම්, වාරිමාර්ග,මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය 514-523**

10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව 524-539

10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 540-553

10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව 554-586

10.4. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය 587-597

**ඇමුණුම්**

ඇමුණුම් 01 - පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති - 2021 599-606

ඇමුණුම් 02 - උතුරු මැද පළාතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති ප්‍රගති සාරාංශය- 2021.12.31 දිනට 607-610

# උතුරු මැද පළාත් සංවර්ධන වැඩසටහන පිළිබඳ විශ්ලේෂණය - 2021

# OVERVIEW OF NORTH CENTRAL PROVINCIAL DEVELOPMENT PROGRAMME – 2021

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව එකඟතාවය පළ කළ තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රයෙහි වූ අභිමතාර්ථ හා ඉලක්ක අතුරින් පළාත් සංවර්ධනයට අදාල වන තිරසර අරමුණු ලෙස සියළුම ආකාරයේ දරිද්‍රතාව තුරන් කිරීම, සියළුම ආකාරයේ කුසගින්න හා මන්දපෝෂණය තුරන් කිරීම, ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය, මැලේරියාව හා අනෙකුත් වසංගත රෝග තුරන්කරමින් සෞඛ්‍ය හා යහපැවැත්ම සහතික කිරීම, සියළුම ගැහැණු හා පිරිමි ළමුන් නිදහස්, ප්‍රාථමික හා ද්විතීයික පාසැල් අධ්‍යාපනය සම්පූර්ණ කරන බවට තහවුරු කිරීම, සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට අදාළ විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම, දැරිය හැකි විදුලිය සඳහා විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම, අවම ආදායම් කාණ්ඩවලට අයත් ආදායම් උපයන්නන් බලගැන්වීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය හා ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය වැනි කරුණු නොසලකා සමාජයේ සියළු දෙනාම ඇතුළත් වන පරිදි ආදායම් ප්‍රවර්ධනය සහතික කරලීම, වනාන්තර, තෙත් බිම්, වියළි ඉඩම් සහ කඳු යන භෞමික පරිසර පද්ධතීන් කඩිනමින් සංරක්ෂණය හා ස්ථාපනය කිරීම හා සියල්ලන් සඳහා යුක්තිය හිමිකර ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම සැලකේ.

එමෙන්ම ආයතනය විසින් තම මෙහෙවරට අනුව හඳුනා ගන්නා ලද වැඩසටහන් මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයට අනුව පළාත් සභාවලට අදාලව වැඩසටහන් 23ක් ලෙස හඳුනා ගෙන ඇති අතර එම වැඩසටහන් ලෙස පළාත් සභා පරිපාලනය, මූල්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ඉඩම් පරිපාලනය සහ සංවර්ධනය, වාරිමාර්ග, කෘෂිකර්ම සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය, කර්මාන්ත සංවර්ධනය, ප්‍රාදේශීය සංවර්ධනය, සමුපකාර සංවර්ධනය, ප්‍රජා සංවර්ධනය, රෝහල් සේවාවන්, මහජන සෞඛ්‍ය සේවාවන්, පොදු සෞඛ්‍ය සේවාවන්, දේශීය වෛද්‍ය සේවාවන්, පර්යේෂණ හා සංවර්ධන, ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතීයික අධ්‍යාපනය, අධ්‍යාපන ප්‍රවේශය හා සහභාගීත්ව දියුණු කිරීම, අධ්‍යාපන සැලසුම් හා පාලන සේවා, ක්‍රීඩා, සංස්කෘතික සංවර්ධනය හා සමාජ ආරක්ෂණය හඳුනා ගෙන ඇත.

**2021 වර්ෂයේ ප්‍රාග්ධනය සඳහා නිර්දේශිත ප්‍රතිපාදන ලෙස රු.මි.2,850ක ආයෝජනයක් කර ඇත**

2021 වර්ෂයේ උතුරු මැද පළාත් සභාව වගකීමෙන් බැඳෙන ප්‍රධාන කාර්යයන් 39ක් ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමට අපේක්ෂා කළ ද කොවිඩ් - 19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් මුදල් කොමිෂන් සභාව මඟින් පළාතේ සියළු අංශයන්ගේ සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීම සඳහා ප්‍රාග්ධන වැය ලෙස නිර්දේශිත ප්‍රතිපාදනය වූයේ රු.මි. 2,850ක් පමණි.

පළාත් අධ්‍යාපන අංශයේ සංවර්ධනය උදෙසා සියළු මූල්‍ය ප්‍රභවයන්ගෙන් කරන ලද සංවර්ධන ආයෝජනය හා දායකත්වය අතිමහත් ය. පළාතේ දූවාදරුවන්ගේ අධ්‍යාපනය ප්‍රමාණාත්මකව මෙන්ම ගුණාත්මකව ඉහළ

මට්ටමකට ගෙන ඒමට කරන ලද ආයෝජනය තුළින් පාසැල් පද්ධතියේ අත්‍යාවශ්‍යයෙන්ම සිදු කළ යුතුව පැවති පංති කාමර ගොඩනැගිලි, විද්‍යාගාර හා අනෙකුත් අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කරන ලද ආයෝජනය කැපී පෙනේ. මේ සඳහා රු.මි.307.15ක මුදලක් ආයෝජනය කරන ලදී. එපමණක්ද නොව අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම මගින් පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ ප්‍රතිඵල ලබා ගෙන ඇති ප්‍රගතිය සැලකිය යුතු මට්ටමක පවතී.

පළාතේ සෞඛ්‍ය සේවා නගා සිටුවීම සඳහා බටහිර ප්‍රතිකාරක සේවා හා රෝග නිවාරණ සේවා සඳහා සුවිශාල දායකත්වයක් වර්ෂය තුළදී සැපයිය හැකි විය. ඒ සඳහා රු.මි.1,514.87ක ආයෝජනයක් සිදුකර ඇත. ඉන් වැඩිම ආයෝජනයක් සිදුකර ඇත්තේ කොවිඩ්-19 ගෝලීය වසංගතය මැඩලීම හා පාලනය සම්බන්ධ කටයුතු සඳහාය. එසේම පාරම්පරික මෙන්ම උතුරු මැද පළාත තුළ දේශීය වෛද්‍ය ක්‍රමය නගා සිටුවීම සඳහා 2021 වර්ෂයේදී රු.මි.130.30ක ආයෝජනයක් සිදුකර ඇත.

2030 වර්ෂයේදී සපුරා ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක 01 සියළු තන්හි සෑම ආකාරයෙන්ම පවතින දුගී බව තුරන් කිරීම, අංක 02 සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය සහිත තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම, අංක 12 තිරසර පරිභෝජන හා නිෂ්පාදන රටාවක් සහතික කිරීම යන අරමුණු කරා පළාතේ දායකත්වය සැලකිය යුතු මට්ටමකින් සැපයීම සඳහා පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මධ්‍යම රජයේ සහ රේඛීය අමාත්‍යාංශවල සහය සහිතව ඒකාබද්ධව සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන ලදී.

ඒ සඳහා රු.මි.219.16 ක් ආයෝජනය කර ඇත. එසේම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පළාතේ පශු සම්පත් සංවර්ධනය මෙන්ම පශු සම්පත් අංශයේ නියැලී ගොවීන්ගේ ආදායම් තත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රතිපාදන ආයෝජනය කරන ලදී. ඒ යටතේ රු.මි.112ක් ආයෝජනය කර ඇත. ඒ අනුව කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය උදෙසා රු.මි.331.16 ක් ආයෝජනය කර ඇත.

පළාත් වාරි පද්ධතියේ සංවර්ධනය උදෙසා මෙන්ම ප්‍රශස්ත වාරි කළමනාකරණයක් තුළින් සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා 2021 වර්ෂයේදී රු.මි.410.06ක ආයෝජනයක් කර ඇත. ඒ යටතේ වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම, නිරන්තර නඩත්තුව, වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් එකතු කිරීම, ගොවි සංවිධාන බලගන්වමින් ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරීම, ජල ගැලීම් හා හානි කළමනාකරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ කමිටු සක්‍රීයව පවත්වාගෙන යාම, පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම, තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාමට අදාල ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාවට නංවන ලදී. එසේම කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා මෙන්ම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය අංශයේ සංවර්ධනය උදෙසා මෙම ආයෝජනය ඉවහල්වන බව කිව යුතුය.

පළාතේ සමාජ ආරක්ෂණය උදෙසා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් ඒ ඒ විෂය පථයන්ගේ සංවර්ධනය උදෙසා 2021 වර්ෂයේදී කැපී පෙනෙන ආයෝජනයක් සිදුකර ඇත. ඒ යටතේ ළමා නිවාස හා රැඳවුම් නිවාස සංවර්ධනය කිරීම, ළමා රැකවරණය හා සුභසාධනය නගා සිටුවීම, ළමා අයිතිවාසිකම් සුරැකීම හා ළමා අපයෝජන හා අපචාර අවම කිරීම, උපදේශන මධ්‍යස්ථාන හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රු.මි.78.90ක් ආයෝජනය කර ඇත. එසේම පළාතේ වැඩිහිටි නිවාස, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ රැකවරණ මධ්‍යස්ථාන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය

මෙන්ම විවිධ මහජන ආධාර සපයමින් සමාජ ආරක්ෂණය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ සඳහා පළාත් ආයෝජනය රු.මි.40.24කි. ඒ අනුව අංශයේ සංවර්ධනය උදෙසා සමස්ත ආයෝජනය රු.මි.119.14කි.

පළාතේ පළාත් පාලන විෂය යටතේ පවතින සේවා සංවර්ධනය උදෙසා 2021 වර්ෂයේ දායකත්වය කැපී පෙනේ. ඒ යටතේ පළාත් පාලන ආයතන බලප්‍රදේශවල ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම, වෙළෙඳ පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රජා ජල පහසුකම් වැඩිදියුණු කිරීම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා තිරසර යාන්ත්‍රණයක් සැකසීම, පොදු සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදුයුණු කිරීම, ග්‍රාමීය පුස්තකාල, පෙරපාසල්, ළමා උද්‍යාන, සුසාන භූමි සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු විය. ප්‍රධාන අමාත්‍යාංශය, රේඛීය අමාත්‍යාංශයන්හී මූල්‍ය සහය සහිතව මෙම ව්‍යාපෘති ක්‍රියාවට නංවන ලදී. පළාත් සභාව සතු මාර්ග පද්ධතිය පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මාර්ගවල යටිතල පහසුකම් එනම් පාලම්, බෝක්කු හා නිර්මිතයන් සංවර්ධනය කිරීම, මාර්ග සංඥා සහ සලකුණු ස්ථාපිත කිරීම, දෛනික කාලීන හා හදිසි අවස්ථා සහිත ක්‍රමානුකුල නඩත්තුව සඳහා පළාත් සංවර්ධන ආයෝජනයන් සිදු කරන ලදී. මේ සඳහා රු.මි.326.76ක මුදලක් ආයෝජනය කර ඇත.

උතුරු මැද පළාතේ සමුපාකාර අංශයේ සංවර්ධනය උදෙසාත් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහාත් සමුපකාර අමාත්‍යාංශය හා කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබූ අතර ඒ සඳහා රු.මි.66.08ක මුදලක් ආයෝජනය කරන ලදී. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් රු.මි.445.08ක ආයෝජනයක් සිදු කරන ලදී.

ක්‍රීඩා අංශය මගින් පළාත තුළ ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා රු.මි.6.42ක මුදලක් 2021 වර්ෂය තුළදී ආයෝජනය කරන ලදී. 2021 වර්ෂයේ ඉඩම්වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉඩම් අංශයන්හී පවතින අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය හා නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය උදෙසා රු.මි. 11ක මුල්‍ය ආයෝජනයක් සිදු කරන ලදී.

ඉතාමත් වැදගත් මෙන්ම ශක්තිමත් කළ යුතු අංශයක් වන ග්‍රාම සංවර්ධන අංශය යටතේ පළාත තුළ ග්‍රාම සංවර්ධන සමිති හා කාන්තා සමිති ශක්තිමත් කිරීම, ග්‍රාම සංවර්ධන සමිති පිහිටුවා පවත්වාගෙන යාම, ව්‍යවසායකත්ව සංගම් ප්‍රවර්ධන වැඩසටහන්, සපිරි සමිති වැඩසටහන්, දැහැමි නිවහන, ගමට මිලියනයක් හා ශ්‍රමාභිමානී වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක සඳහා රු.මි.51ක මුදලක් ආයෝජනය කෙරිණි. සංචාරක අංශයේ සංවර්ධනය උදෙසා පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන අමාත්‍යාංශය මගින් රු. මි. 34.21ක් ආයෝජනය කර ඇත.

ආණ්ඩුකාරවර කාර්යාලය මඟින් 2021 වර්ෂයේදී රු.මි.205.60 ක මුදලක් ආයෝජනය කරන ලදී. ඒ යටතේ ආණ්ඩුකාර නිල නිවසේ අත්‍යාවශ්‍ය ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු, අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාල වල කාර්ය මණ්ඩල සඳහා ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හා

ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා සම්බන්ධ කටයුතු සිදු කර ඇත.

එසේම ප්‍රධාන ලේකම් කාර්යාලය හා ඒ යටතේ පවතින ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා රු.මි.112.1ක් වැයකර ඇත. 2021 වර්ෂයේදී උතුරු මැද පළාතේ අනුමත සේවක සංඛ්‍යාව 9115ක් වුවද වර්ෂය තුළදී සේවයේ නියුතු සංඛ්‍යාව 7073කි. විශේෂයෙන්ම පළාත් සෞඛ්‍ය අංශයේ සේවාවන් ජනතාව වෙත සමීප කරලීම සඳහා සේවයේ නියුතු වූ සේවකයින් සංඛ්‍යාව 4147කි. එසේම පළාතේ අධ්‍යාපන අංශය සැලකූ විට 2021 වර්ෂයේදී 301319ක් වන ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීම සඳහා ගුරුවරුන් 16353කගේ මෙන්ම ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් 787ක් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ ද දායකත්වය සපයන ලදී.

ඒ සියල්ල සමග 2021 වර්ෂයේ ප්‍රාග්ධනය සඳහා නිර්දේශිත ප්‍රතිපාදන ලෙස රු.මි.2,850ක ආයෝජනයක් කර ඇත.

# තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උතුරු මැද පළාතේ සැලකිළිමත් බව.

# Concern of the North Central Province towards achieving global sustainable development goals and objectives.

උතුරු මැද පළාත් දැක්ම කරා ළඟාවිම සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන තිස් හතක් (37) මගින් වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබයි. එසේම වාර්ෂිකව එකිනෙක අංශයන් මගින් අපේක්ෂිත සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟා විම ප්‍රමුඛ කොට සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවනු ලබයි.







තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ සාධනය කරගැනිම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරමින් සංවර්ධන සැලැස්ම සකස් කරන ලදී. මෙම කාර්යයයේදී ජාතික මට්ටමෙන් තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ කරා ළඟා වීමට පළාතේ දායකත්වය සැපයිය හැකි අයුරින් පළාතට උචිත මෙන්ම ගැළපෙන අයුරින් සකස් කරගන්නා ලද දර්ශක හා ඉලක්ක කෙරෙහි වාර්ෂිකව ආයෝජනයන් සිදුකරයි. පළාත් මට්ටමෙන් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම කෙරෙහි සාධනීය පෙළඹීමක් සහිත ගමනක පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන නිරතවිම උතුරු මැද පළාත 2021 වර්ෂයේ ලද ජයග්‍රහණයකි.

එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් අනුබද්ධ ආයතන තම ආයතනයට අනන්‍ය වු තිරසර සංවර්ධන අරමුණු සාධනය කරගැනිම කෙරෙහි ඍජුව දායක වන අතර අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන ඒකාබද්ධ (INTEGRATED) ලෙස ද තිරසර සංවර්ධන අරමුණු සාධනය කරගැනිම කෙරෙහි දායකත්වය සපයයි.

2021 වර්ෂය තුළදී ගෝලිය තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනිම සම්බන්ධයෙන් රටක් ලෙස ශ්‍රී ලංකාවේ දායකත්වය අපේක්ෂිත මට්ටම කරා ළඟා වීමට පළාතේ දායකත්වය ප්‍රශස්ත අයුරින් ලබා දීමටත් සැලකිය යුතු මට්ටමකින් දායක වීමටත් අමාත්‍යාංශයට හා දෙපාර්තමේන්තුවට අයත් විෂයපථය තුළ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

උතුරු මැද පළාත් සභාවට අයත් සියළු ආයතන 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සියළු ව්‍යාපෘති හා වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම කෙරෙහි අවධානය යොමු කරමින් මෙහෙයවන ලද අතර ඒ සඳහා රු.මි.2,850ක පමණ ප්‍රාග්ධනය සඳහා නිර්දේශිත ප්‍රතිපාදන මුදලක් ආයෝජනය කරන ලදී.

# 01.ආණ්ඩුකාරවර කාර්යාලය

## ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය

### ජාතික විධායකයේ පළාත් නියෝජනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ (1) අනු ව්‍යවස්ථාව අනුව සෑම පළාත් සභාවකම ආණ්ඩුකාර ධූරයක් පවතී. 154 ආ (2) අනුව ව්‍යවස්ථාවප්‍රකාර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමාගේ අත්සන යටතේ වූ අධිකාරී පත්‍රයකින් පත් කෙරෙන ආණ්ඩුකාර ධූරය පළාත් සභාවක ජනාධිපතිතුමාගේ නියෝජිතයා ලෙස වූ කාර්යභාරයක් ද ඉටු කරනු ලබයි. ජනාධිපතිතුමාගේ විධානය මත ආණ්ඩුකාරතුමා විසින් ගනු ලබන තීරණ අවසානාත්මක වන අතර, එය අධිකරණයක දී ප්‍රශ්න කළ නොහැකි බලයකි.

### ආණ්ඩුකාර ධූරය සතු බලතල

- විධායක බලතල
- මූල්‍ය බලතල
- පරිපාලන බලතල

### 01. විධායක බලතල

13 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවක විෂය ක්ෂේත්‍රය පිළිබඳ ආණ්ඩුකාරවර ධූරය සතු විධායක බලතල 154 හා (ඇ) 154 (ඊ) ව්‍යවස්ථා පරිදි සෘජුව හෝ අමාත්‍ය මණ්ඩලය මගින් හෝ නිළධාරීන් මගින් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

### පළාත් සභා කටයුතු පිළිබඳ බලතල

- 154 අ (8) (අ) වගන්තිය අනුව ආණ්ඩුකාරවරයා නිශ්චය කරන අවස්ථාවකදී නියම කරනු ලබන වේලාවක සභාව කැඳවීම.
- 154 අ (8) ( ආ) වගන්තිය අනුව සභාව වාර අවසාන කිරිම.

### අමාත්‍ය මණ්ඩලය පිළිබඳ බලතල

- 154 ඊ (4) වගන්තිය අනුව ප්‍රධාන අමාත්‍යවරයා පත් කිරීම.
- 154 ඊ (5) වගන්තිය අනුව අමාත්‍යවරුන් 4 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් පළාත් අමාත්‍ය මණ්ඩලය පත් කිරීම.
- අමාත්‍යවරු අතර විෂයන් බෙදීම.
- 154 අ (11) (අ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය පිළිබඳ අමාත්‍ය මණ්ඩලය ගන්නා සියලු යෝජනා දැන ගැනීම.
- 154 අ (11) (ආ) වගන්තිය අනුව පළාතේ පරිපාලනය සම්බන්ධ සහ නීති සම්පාදනය සඳහා වූ යෝජනා පිළිබඳ තොරතුරු ලබා ගැනීම.
- 154 අ (11) (ඇ) වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී නොමැති එහෙත් අමාත්‍යවරයෙකු විසින් ගන්නා ලැබූ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරවරයාට නියම කළ හැකිය.

- 154 අ (10) (අ) වගන්තිය අනුව සභාව ඇමතීම හා ඒ සඳහා මන්ත්‍රීවරුන් කැඳවීමට නියමයන් කිරීම.
- 154 අ (8) (ඇ) වගන්තිය අනුව සභාව විසුරුවා හැරීම.

### 02. මූල්‍ය බලතල

- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 19 (5) වගන්තිය අනුව පළාත් සභා අරමුදල් භාරය, අරමුදලට මුදල්

ගෙවීම ආදී සියලු රීති මගින් විධිමත් කිරීම.

- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 20 (1) වගන්තිය අනුව පළාතේ හදිසි අවස්ථා අරමුදල පිළිබඳ භාරය දැරීම හා පාලනය සඳහා රීති සෑදීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 23 (2) වගන්තිය අනුව පළාත් සභා අරමුදලේ ගිණුම් සම්බන්ධ විගණකාධිපතිවරයාගේ වාර්තා අනුව පළාත් සභාවට ඉදිරිපත් කිරීම.
- 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධන) පනතේ 27 (4) වගන්තිය අනුව පළාත් සභාව විසුරුවා හැර හෝ කටයුතු කිරීම නතර කර ඇති අවස්ථාවක පළාතේ පරිපාලන කටයුතු සඳහා අරමුදලෙන් වියදම් කිරීමට අනුමැතිය දීම.
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව බදු පැනවීම, අහෝසි කිරීම, අඩු කිරීම, වෙනස් කිරීම, විධිමත් කිරීම, ඊට අදාල නීති සංශෝධනය , පළාත් සභා අරමුදල් විසර්ජනය කිරීම, පළාත් සභා අරමුදලට මුදල් භාර ගැනීම සහ වියදම් දැරීම සඳහා වූ ප්‍රඥප්ති නිර්දේශ කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 24 (1) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය ඇතුළු ක්‍රියාත්මක වන ප්‍රඥප්ති සහ නව ප්‍රඥප්ති අනුමැතියට පෙර සලකා බලන ලෙස සභාවට දැන්වීම.
- 154 (උ) වගන්තිය අනුව පළාත් සභාවෙන් අනුමත කළ වියදම් සඳහා බලය දීම.
- 154 (උ) වගන්තිය අනුව පරිපූරක ප්‍රදානයන් සඳහා අනුමැතිය ලබා දීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 28 (2) වගන්තිය අනුව ප්‍රදාන කිරීමට නිර්දේශ කිරීම.
- 154 (උ) වගන්තිය අනුව වාර්ෂික විසර්ජන ප්‍රඥප්තිය අනුමත කිරීම.

## 03. පරිපාලන බලතල

- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ විනය පාලන කටයුතු කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 වගන්තිය අනුව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (2) වගන්තිය අනුව බලතල පැවරීම, නියෝග නිකුත් කිරීම.
- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 (8) වගන්තිය අනුව විනය අභියාචනා පිළිබඳ අවසන් තීරණ ගැනීම.

1987 අංක 42 දරන පළාත් සභා පනතට අනුව උතුරු මැද පළාත් රාජ්‍ය සේවය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධයෙන් හා මූල්‍ය පාලනය සම්බන්ධ සියලු බලතල ආණ්ඩුකාර ධූරයට හිමිව ඇත. එම බලතල අවස්ථානුකූලව අදාළ නිලධාරීන් වෙත පවරා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ, පළාතේ මූල්‍ය පාලනයේ හා පළාත සංවර්ධනයේ සියලු කටයුතු මෙහෙයවීම, අධීක්ෂණය හා මග පෙන්වීම සඳහා පහත කාර්යයන් සිදු කෙරේ.

- පළාත් සභාවේ අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම.

- විසර්ජන ප්‍රඥප්ති නිර්දේශ කර ඉදිරිපත් කිරීම, පරිපූරක ඇස්තමේන්තු නිර්දේශ කිරීම.
- විසර්ජන ප්‍රඥප්ති අනුමත කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් අනුයුක්ත කිරීම / ස්ථාන මාරු කිරීම/ නිදහස් කිරීම.
- විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත පත් කිරීම.
- දීප ව්‍යාප්ත සේවයේ වැඩ බැලීම, පත් කිරීම, පාරිශ්‍රමික අනුමත කිරීම.
- විධිමත් විදේශ ගමන් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැරට යාමට අනුමැතිය දීම.
- සියලු නව බඳවා ගැනීම්, පත් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම.
- දීමනා හා ගාස්තු අතිරේක පාරිශ්‍රමික ගෙවීමට අනුමැතිය දීම.
- බඳවා ගැනීමේ පටිපාටි සහ ව්‍යවස්ථා සංග්‍රහ අනුමත කිරීම / සංශෝධන සඳහා අනුමැතිය ලබා දීම.
- අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ පෞද්ගලික ලිපි ගොනු සම්බන්ධ කටයුතු කිරීම වැටුප් වර්ධක හා කාර්ය සාධන වාර්තා අනුමත කිරීම.
- ආණ්ඩුකාරවර අරමුදලින් ලබා දෙන ආධාර හා පරිත්‍යාග පිළිබඳව කටයුතු කිරීම.
- පළාත් සභා රාජ්‍ය සේවයට අදාල නිලධාරීන්ගේ ආයතන කටයුතු සඳහා ආයතන අධ්‍යක්ෂ ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දීම.
- මධ්‍යම රජයේ චක්‍රලේඛ පළාත් සභා රාජ්‍ය සේවයට අදාල කිරීම.
- උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විනය නියෝගවලට එරෙහිව අභියාචනා පිළිබඳ තීරණ ලබා දීම.
- උතුරු මැද පළාත් සභා නිලධාරීන්ගෙන්, අමාත්‍යාංශවලින්, ආයතනවලින් ලැබෙන ලිපි පෙත්සම් පිළිබඳ කටයුතු කිරීම.
- පළාත් සභාවේ රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ අභියාචනා දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- වෘත්තීය සමිති ඉල්ලීම් අනුව සාකච්ඡා කැඳවීම, රැස්වීම් පැවැත්වීම, වාර්තා නිකුත් කිරීම.

## දැක්ම

"අභිමානවත් ජනතාවක් සහිත සමෘද්ධිමත් පළාතක්"

## මෙහෙවර

"ව්‍යවස්ථාපිත කටයුතු, ආයතනික කටයුතු, මූල්‍ය නියාමනය, සමාජ සංවර්ධන කටයුතු සහ යහපාලන කටයුතු සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වය ඇතිව ජාතික ප්‍රතිපත්තියට අනුගතව හා විනිවිදභාවයෙන් යුතුව සාධාරණ ක්‍රමවේදයක් මඟින් අභිමානවත් ජනතාවක් ජීවත්වන සමෘද්ධිමත් පළාතක් ගොඩනැගීම සඳහා අඛණ්ඩව දායකවීම".

## අරමුණු

- ගුණාත්මක පළාත් රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම.
- විධිමත් මූල්‍ය කළමනාකරණයක් ඇති කරලීම.
- පළාතේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීම.
- මහජන ගැටලු විසඳීම සඳහා මඟ පෙන්වීම.
- සාරධර්ම පිළිපදින සමාජයක් කරා යොමු කිරීමට කටයුතු කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ඵලදායිතාවය වැඩිදියුණු කරලීම සඳහා පංචවිධ සංකල්පය යොදා ගැනීම, ඵලදායිතාවය මඟින් සේවක පිරිස් අභිප්‍රේරණය කරලීම, පළාත් රාජ්‍ය සේවයේ අක්‍රමිකතා අඩුකරලීම හා ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ, පුහුණු වැඩමුළු, සාකච්ඡා, සම්මන්ත්‍රණ සංවිධානය හා පසු විපරම් කාර්යය ක්‍රියාත්මක කරලීම. (අහඹු පරීක්ෂා කිරීම් හා සමීක්ෂණ මඟින්)
- වාර්ෂික මුදල් ප්‍රකාශයට අනුව ඇස්තමේන්තු කරන ලද කාර්යයන් අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කරවීම. (පළාත් භාණ්ඩාගාරය මඟින් සිදුකරන දැනුවත් කිරීම් සඳහා මග පෙන්වීම, උපදෙස් හා අනුමැතීන් ලබාදීම, පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂික වැඩසටහන් ක්‍රියාත්මක කරවීම හා පසු විපරම් ක්‍රියාවලියක් ඇති කරවීම,සිදුකරන ලද විමර්ශන වාර්තා අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදාල බලධාරීන් දැනුවත් කිරීම හා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම.)
- සාරධර්ම ප්‍රවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් සමාජ සංවර්ධනයට අත්වැලක් සැපයීම, ආගමික හා සිවිල් සමාජ සංවිධාන හරහා අධ්‍යාපනික මට්ටමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අඩු පහසුකම් සහිත විහාරස්ථාන සංවර්ධනය හා සාමණේර වහන්සේලා සඳහා අධ්‍යාපන උපකාර කිරීම හා දහම් පාසල් සංවර්ධනය කිරීම හා රණවිරු පවුල් සුභසාධනයට මග පෙන්වීම.

## ප්‍රධාන කාර්යයන්

### ප්‍රධාන උපාය මාර්ගයන්




පළාතේ පරිපාලන හා මූල්‍ය යාන්ත්‍රණය ක්‍රියා කරවීමේ ප්‍රධානම ආයතනය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හා පළාත් සභා පනතින් ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා ප්‍රධාන ලේකම් ඇතුළු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ක්‍රියාත්මක කරවීම.

එසේම ජනතා සුභසාධනය හා සමාජ සංවර්ධනය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට අවශ්‍ය ජාතික හා පළාත් සැලසුම් නිර්දේශයන් අනුව ක්‍රියාත්මක වෙමින් ඒ සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පළාත් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 21ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 17 කි. පුරප්පාඩු සංඛ්‍යාව 04 කි.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි.) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ආණ්ඩුකාර නිල නිවසේ අත්‍යාවශ්‍ය ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු | 4.69 | 4.3 | 0.45 | 91 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (කාර්ය මණ්ඩලය) අනුරාධපුර | 0.40 | 0.39 | 0.06 | 97 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (කාර්ය මණ්ඩලය) පොළොන්නරුව | 0.60 | 0.60 | 0 | 100 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (කාර්ය මණ්ඩලය) අනුරාධපුර | 0.40 | 0.11 | 0.28 | 27 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (කාර්ය මණ්ඩලය) පොළොන්නරුව | 0.60 | 0 | 0.60 | 0 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (ආණ්ඩුකාර ලේකම් කාර්යාලය) අනුරාධපුර | 0.40 | 0.37 | 0.02 | 92 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (ආණ්ඩුකාර උප කාර්යාලය) පොළොන්නරුව | 0.06 | 0.06 | 0 | 100 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (ආණ්ඩුකාර ලේකම් කාර්යාලය) අනුරාධපුර | 0.02 | 0 | 0.02 | 0 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ (ආණ්ඩුකාර උප කාර්යාලය) පොළොන්නරුව | 0.30 | 0.25 | 0.04 | 83 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ. (ආණ්ඩුකාර උප කාර්යාලය) පොළොන්නරුව | 2.4 | 1.9 | 0.01 | 79 |
| පොළොන්නරුව ආණ්ඩුකාර කාර්යාලය සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදීගැනීම | 1.0 | 0.9 | 0.01 | 90 |
| **එකතුව** | **11.41** | **9.42** | **1.54** | |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

ජාතික ප්‍රතිපත්තියට අනුගතව වසර 2030 වන විට පළාත් සංවර්ධනයට අදාල තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් හා මගපෙන්වීම අනුව පළාතේ සියලුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාල අරමුණු ක්‍රියාවට නැංවීම මගින් පළාතේ තිරසර සංවර්ධනය ඇති කිරීම මුලික අරමුණ වේ.

1. උතුරු මැද පළාත තුළ ගුණාත්මක අධ්‍යාපනයක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා සේවකයන් බඳවා ගැනීමට අනුමැතිය ලබාදීම, දහම් පාසල් සංවර්ධනය හා ආගමික සිද්ධස්ථාන සංවර්ධනය කිරීම.
2. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ ග්‍රාමීය මාර්ග කෘෂි මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.
3. උතුරු මැද පළාත තුළ දිළිඳුකම පිටු දැකීමේ අරමුණින් ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව යටතේ ග්‍රාමීය ජනතාව උදෙසා පොදු ලිං ඉදිකිරීම හා වැව් ප්‍රතිසංස්කරණය කිරීම.
5. උතුරු මැද පළාත තුළ යහපැවත්ම උදෙසා නව නිවාස ඉදි කිරීම, සෙවිලි තහඩු ලබාදීම හා වැසිකිලි ආධාර ලබාදීම.
6. සියලු අමාත්‍යාංශ මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන සියලු ව්‍යවස්ථාපිත කරුණු සම්බන්ධයෙන් (උසස්වීම් /ස්ථාන මාරු/කොන්ත්‍ර පදනම මත බඳවා ගැනීම්/ බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම හා සංශෝධනය කිරීම, දිවයිනෙන් බැහැර වීම සඳහා අවසර ලබාගැනීම) තීන්දු, තීරණ ගැනීමේදී ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂිත අවධානය යොමු කරමින්, අපක්ෂපාතීව සැමට සාධාරණ, විනිවිධභාවයෙන් යුක්තව අවශ්‍යතාවය මතම පමණක් කළමනාකරණය කරමින් කඩිනම් තීන්දු තීරණ ගැනීමේදී තිරසාර සංවර්ධන අරමුණු (SDG) සාක්ෂාත් වන අයුරින් කටයුතු කිරීම .

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශය පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය

| **ශක්තීන්** | **දූර්වලතා** |
| --- | --- |
| ➢ මනා මඟපෙන්වීමක් සහිත උපදේශනාත්මක නායකත්වයන්.<br>➢ සේවයට කැපවූ ආයතන කාර්යය මණ්ඩලය.<br>➢ ගරු ආණ්ඩුකාරතුමාගේ බලතල ප්‍රකාරව බඳවාගැනීම් පරිපාටි අනුමත කිරීම හා සේවකයින් බඳවා ගැනීම.<br>➢ පළාතේ සම්පත් අනුව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට හැකිවීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ➢ පරිපාලන සේවා නිලධාරී හිඟය.<br>➢ කාර්යය මණ්ඩල හිඟය.<br>➢ පළාත තුළින් බිහිවන උගතුන් ප්‍රමාණය අවම මට්ටමක පැවතීම මත රාජ්‍ය සේවයට බඳවා ගැනීමට නොහැකි වීම. |
| **අවස්ථාවන්** | **තර්ජන** |
| ➢ පළාත් සභාව විසුරුවා ඇති අවස්ථාවේ අමාත්‍යාංශ 05 නියමුවානන් ලෙස ගරු ආණ්ඩුකාරතුමා ක්‍රියා කිරීම.<br>➢ විවිධ මූල්‍ය ප්‍රභේද යටතේ ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන. | ➢ කොවිඩ් 19 වසන්ගත තත්වය හේතුවෙන් රට වසා තැබීම.<br>➢ කොවිඩ් 19 වසන්ගත තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කිරීම හා කාර්යය මණ්ඩලය වරින් වර නිරෝධායනයට ලක් කිරීම.<br>➢ පළාත් සභා ආදායම් මාර්ග ඇහිරීයාම.<br>➢ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ස්වයංරැකියා උපකරණ වෙළඳපලේ හිග වීම. |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යය සාධන දර්ශකය | නිමැවුම | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 01 | ප්‍රතිපත්ති සම්පාදනය හා මූල්‍ය නියාමනය | 1.ප්‍රතිපත්තිමය තීරණ හා චක්‍රලේඛ අනුමැතිය | චක්‍රලේඛ සංඛ්‍යාව | 18 |
| | | 2.බදුවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම හා සංශෝධනය කිරීම | අනුමැතිය දුන් හා සංශෝධනය කරන ලද බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | 16 |
| | | 03.ප්‍රඥප්ති අනුමැතිය හා සංශෝධනය කිරීම | අනුමත කරන ලද ප්‍රඥප්ති සංඛ්‍යාව | 2 |
| | | 04.පළාත් පාලන ආයතනවල උසාවි දඩ මුදල් ගාස්තු උපයෝගී කර ගනිමින් ප්‍රාදේශීය සංවර්ධනය කාර්යයන් ඉටු කිරීම සඳහා අනුමැතිය ලබා දීම. | අනුමැතිය දුන් ව්‍යාපෘති සංඛ්‍යාව | 68 |
| 02 | සමාජ ආර්ථික හා ආයතන කටයුතු සංවර්ධනය | 1.බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දීම | අනුමත කරන ලද බඳවා ගැනීම් සංඛ්‍යාව | - |
| | | 2.උසස් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම. | අනුමත කරන ලද උසස් වීම් සංඛ්‍යාව | 416 |
| | | 3.අන්තර් පළාත් ස්ථාන මාරු සඳහා අනුමැතිය ලබා දීම. | අනුමත කරන ලද ස්ථාන මාරු සංඛ්‍යාව | 553 |
| | | 4.විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම. | අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීම් සංඛ්‍යාව | 55 |
| | | 5.කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දීම | අනුමත කරන ලද කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සංඛ්‍යාව | 21 |
| 03 | ආයතනික ධාරිතා සංවර්ධනය | 1.විනය අභියාචනා සඳහා කටයුතු කිරීම | ක්‍රියාකරන ලද විනය අභියාචනා සංඛ්‍යාව | 3 |
| | | 2. අභියාචනා සඳහා කටයුතු කිරීම | ක්‍රියාකරන ලද අභියාචනා සංඛ්‍යාව | 1965 |
| 04 | ජන ජීවිත නගා සිටුවීම සඳහා විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 1.පොදු යටිතල පහුකම් සංවර්ධනය | ආගමික සිද්ධස්ථාන සංවර්ධනය | 121 |
| | | | පාසැල් ගොඩනැගිලි සංවර්ධනය | 9 |
| | | | පොදු පහසුකම් සංවර්ධනය | 59 |
| | | | දහම් පාසල් සංවර්ධනය | 47 |
| | | 2.සමාජ යටිතල පහසුකම් සංවර්ධනය. | අඩු ආදායම්ලාභී නිවාස සංවර්ධනය | 47 |
| | | | අඩු ආදායම්ලාභී සෙවිලි තහඩු ලබා දීම | 88 |
| | | | අඩු ආදායම්ලාභී වැසිකිලි ඉදිකිරීම් | 72 |
| | | 3. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය | සුළු වාරිමාර්ග සංවර්ධනය | 02 |
| | | | ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 37 |
| | | | සමිති ස්වෙච්ඡා සංවිධාන සඳහා පුටු ලබාදීම | 177 |
| | | 4.ජීවනෝපාය සංවර්ධනය | වගා ලිං ඉදිකිරීම | 156 |
| | | | ස්වයං රැකියා උපකරණ ලබාදීම | 58 |
| | | | කෘෂි උපකරණ ලබාදීම | 150 |
| 05 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 1.ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගත් ප්‍රමාණය | ගෘහ භාණ්ඩ | 5 |
| | | | ලැප්ටොප් | 1 |
| | | | ඩෙක්ස්ටොප් | 1 |
| | | | මුද්‍රණ යන්ත්‍ර | 3 |
| 06 | යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම | 1.යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ මිලදී ගත් ප්‍රමාණය | වායු සමීකරණ යන්ත්‍ර | 3 |

## එකිනෙක සංරචක සඳහා උප සංරචකයන්හි කාර්යය සාධන දර්ශකවල ඉලක්ක ලගා කර ගැනීම සඳහා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යය සාධන දර්ශකය | නිමැවුම | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රතිපත්ති සම්පාදනය හා මූල්‍ය නියාමනය | 1.ප්‍රතිපත්තිමය තීරණ හා චක්‍රලේඛ අනුමැතිය | චක්‍රලේඛ සංඛ්‍යාව | 18 | 100% |
| | | 1.බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම හා සංශෝධනය කිරීම | අනුමැතිය දුන් හා සංශෝධනය කරන ලද බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | 16 | 100% |
| | | 1. ප්‍රඥප්ති අනුමැතිය හා සංශෝධනය කිරීම | අනුමත කරන ලද ප්‍රඥප්ති සංඛ්‍යාව | 2 | 100% |
| | | 2. පළාත් පාලන ආයතනවල උසාවි දඩ මුදල් ගාස්තු උපයෝගී කර ගනිමින් ප්‍රාදේශීය සංවර්ධනය කාර්යයන් ඉටු කිරීම සඳහා අනුමැතිය ලබා දීම. | අනුමැතිය දුන් ව්‍යාපෘති සංඛ්‍යාව | 68 | 100% |
| 02 | සමාජ ආර්ථික හා ආයතන කටයුතු සංවර්ධනය | 1.බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දීම | අනුමත කරන ලද බඳවා ගැනීම් සංඛ්‍යාව | | 100% |
| | | 2.උසස් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම. | අනුමත කරන ලද උසස් වීම් සංඛ්‍යාව | | 100% |
| | | 3.අන්තර් පළාත් ස්ථාන මාරු සඳහා අනුමැතිය ලබා දීම. | අනුමත කරන ලද ස්ථාන මාරු සංඛ්‍යාව | | 100% |
| | | 4.විශ්‍රාම ගැන්වීම් සඳහා අනුමැතිය ලබා දීම. | අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීම් සංඛ්‍යාව | | 100% |
| | | 5.කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දීම | අනුමත කරන ලද කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සංඛ්‍යාව | | 100% |
| 03 | ආයතනික ධාරිතා සංවර්ධනය | 1.විනය අභියාචනා සඳහා කටයුතු කිරීම | ක්‍රියාකරන ලද විනය අභියාචනා සංඛ්‍යාව | | 100% |
| | | 2.අභියාචනා සඳහා කටයුතු කිරීම | ක්‍රියාකරන ලද අභියාචනා සංඛ්‍යාව | | 100% |

එකිනෙක සංරචක සඳහා උප සංරචකයන්හි කාර්යය සාධන දර්ශකවල ඉලක්ක ලගා කර ගැනීම සඳහා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස.............

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යය සාධන දර්ශකය | නිමැවුම | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|---|
| 04 | ජන ජීවිත නගා සිටුවීම සඳහා විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 1.පොදු යටිතල පහුකම් සංවර්ධනය | ආගමික සිද්ධස්ථාන සංවර්ධනය | 121 | 100% |
| | | | පාසැල් ගොඩනැගිලි සංවර්ධනය | 9 | 100% |
| | | | පොදු පහසුකම් සංවර්ධනය | 59 | 100% |
| | | | දහම් පාසල් සංවර්ධනය | 47 | 100% |
| | | 2.සමාජ යටිතල පහසුකම් සංවර්ධනය. | අඩු ආදායම්ලාභී නිවාස සංවර්ධනය | 47 | 100% |
| | | | අඩු ආදායම්ලාභී සෙවිලි තහඩු ලබා දීම | 88 | 100% |
| | | | අඩු ආදායම්ලාභී වැසිකිලි ඉදිකිරීම් | 72 | 100% |
| | | 3. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය | සුළු වාරිමාර්ග සංවර්ධනය | 02 | 100% |
| | | | ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 37 | 100% |
| | | | සමිති ස්වෙච්ඡා සංවිධාන සඳහා පුටු ලබාදීම | 177 | 100% |
| | | 4.ජීවනෝපාය සංවර්ධනය | වගා ලිං ඉදිකිරීම | 156 | 100% |
| | | | ස්වයං රැකියා උපකරණ ලබාදීම | 58 | 95% |
| | | | කෘෂි උපකරණ ලබාදීම | 150 | 100% |
| 05 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | | ගෘහ භාණ්ඩ<br>ලැප්ටොප්<br>ඩෙක්ස්ටොප්<br>මුද්‍රන යන්ත්‍ර | 5<br>1<br>1<br>3 | 100%<br>100%<br>100%<br>100% |
| 06 | යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම | | වායු සමීකරණ යන්ත්‍ර | 3 | 100% |

## ප්‍රධාන කාර්යය සාධන දර්ශකය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යය සාධන දර්ශකය | නිමැවුම | ඉලක්කය | වියදම (රු.මි) | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|---|---|
| 01 | ජන ජීවිත නගා සිටුවීම සඳහා විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 1.පොදු යටිතල පහුකම් සංවර්ධනය | ආගමික සිද්ධස්ථාන සංවර්ධනය | 121 | 55.5 | 100% |
| | | | පාසැල් ගොඩනැගිලි සංවර්ධනය | 9 | 14.9 | |
| | | | පොදු පහසුකම් සංවර්ධනය | 59 | 25.8 | |
| | | | දහම් පාසල් සංවර්ධනය | 47 | 7.9 | |
| | | 2.සමාජ යටිතල පහසුකම් සංවර්ධනය. | අඩු ආදායම්ලාභී නිවාස සංවර්ධනය | 47 | 13.5 | |
| | | | අඩු ආදායම්ලාභී සෙවිලි තහඩු ලබා දීම | 88 | 5.0 | |
| | | | අඩු ආදායම්ලාභී වැසිකිලි ඉදිකිරීම | 72 | 2.5 | |
| | | 3. ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය | සුළු වාරිමාර්ග සංවර්ධනය | 02 | 1.0 | |
| | | | ග්‍රාමීය මාර්ග සංවර්ධනය | 37 | 34.8 | |
| | | | සමිති ස්වෙච්ඡා සංවිධාන සඳහා පුටු ලබාදීම | 177 | 5.9 | |
| | | 4.ජීවනෝපාය සංවර්ධනය | වගා ලිං ඉදිකිරීම | 156 | 33.3 | |
| | | | ස්වයං රැකියා උපකරණ ලබාදීම | 58 | 1.4 | 95% |
| | | | කෘෂි උපකරණ ලබාදීම | 150 | 4.1 | 100% |
| 02 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | මිලදී ගෙන ඇති භාණ්ඩ හා උපකරණ | ගෘහ භාණ්ඩ<br>ලැප්ටොප්<br>ඩෙක්ස්ටොප්<br>මුද්‍රණ යන්ත්‍ර | 5<br>1<br>1<br>3 | 1.2 | 100% |
| 03 | යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම | මිලදී ගෙන ඇති යන්ත්‍ර | වායු සමීකරණ යන්ත්‍ර | 3 | 0.9 | |

## ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති - 2022



උතුරු මැද පළාත සඳහා උපාධිධාරී හා නව ගුරුවරුන් බඳවා ගැනීම



ආගමික සිද්ධස්ථාන හා දහම් පාසල් සංවර්ධනය




සමුපකාර බැංකුව විවෘත කිරීම



ග්‍රාමීය මාර්ග සංවර්ධනය



සුළු වාරිමාර්ග සංවර්ධනය


පාසල් ගොඩනැගිලි සංවර්ධනය


කෘෂි උපකරණ ලබාදීම


උතුරු මැද පළාතේ සෞඛ්‍ය අංශය නගාසිටුවීම


උතුරු මැද පළාතේ කෘෂි කර්මාන්තය නගා සිටුවීම


ස්වයං රැකියා උපකරණ ලබාදීම

## හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| තිරසාර සංවර්ධනය සඳහා වූ සාමකාමී හා අන්තර්ගහණය වූ සමාජ ප්‍රවර්ධනය හා සැමට සාධාරණය සඳහා ප්‍රවේශය සැපයීම හා වගකීමක් සහිත හා අන්තර්ග්‍රහණය වූ ආයතන සැම මට්ටමකම ස්ථාපිත කිරීම. | සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම | නිලධාරීන් බඳවා ගැනීම, මූල්‍ය නියාමනය හා අනුමත කිරීම. | විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, සමාජ සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,බඳවා ගැනීම් අනුමත කිරීම | | | √ |

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

මෙම කාර්යාලයේ සෘජු මැදිහත්වීම ඇතිව පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇත.

ඒ අනුව උතුරු මැද පළාත තුළ දිළිඳුකම පිටුදැකීමේ අරමුණෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇති අතර, ස්වයං රැකියා ආදායම් උත්පාදක මාර්ග සලසාදීම.

ආණ්ඩුකාර කාර්යාලය මඟින් ක්‍රියාත්මක මක කරනු ලැබූ විශේෂ සංවර්ධන ව්‍යාපෘති යටතේ පළාතේ තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් වෙත ධාන්‍ය ඇඹරුම් යන්ත්‍ර, බ්ලොක් ගල් සැකසුම් යන්ත්‍ර, රෙදි මහන යන්ත්‍ර (ඔවලොක් මහන මැෂින්), තණකොළ කපන මැෂින්, තෙල් හිඳින යන්ත්‍ර, වතුර පොම්ප, පෙදරේරු කට්ටල, මිරිස් ඇඹරුම් යන්ත්‍ර ආදිය සහනදායී මිලකට සැපයීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමත්, රැකියා අවස්ථා සලසා දීමටත් කටයුතු කර ඇත. ඒ ඔස්සේ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා අවස්ථා වර්ධනය කිරීමට දායක වී ඇත.

තවද මෙම කාර්යාලය යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් කොටසක් තිරසර සංවර්ධන අරමුණු පෙරදැරිව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තුව වෙත වෙන් කර, පළාතේ තෝරාගත් ගොවි ජනතාව සඳහා වගා ළිං ඉදිකර ගැනීමට අවස්ථාව උදා කර ද තිබුණි. ඒ අනුව කුසගින්නෙන් මිදෙන්න, ආහාර සුරක්ෂිතතාවයෙන්

හා යහපත් පෝෂණයක් ලබා ගෙන තිරසර කෘෂි කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම සඳහා දායකත්වය සැපයීම සිදු කරනු ලැබේ.

තවද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් හා පළාත් පාලන ආයතන හරහා පොදු ස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනයට උරදී ඇත. ප්‍රධාන අමාත්‍යාංශය යටතේ ඇති ආගමික ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනයට අවශ්‍ය කටයුතු සලසා දී ඇත. ඒ අනුව යටිතල පහසුකම් සංවර්ධනය ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණ ප්‍රවර්ධනය වෙනුවෙන් ද වක්‍ර දායකත්වයක් මෙම කාර්යාලය මඟින් සපයා ඇත. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් නිවාස ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

උතුරු මැද පළාත් සභාවේ සියලු අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු තීරණ සඳහා අනුමත බලධාරියා හා පරිපූරක ප්‍රතිපාදන අවශ්‍යතාවය, උතුරු මැද පළාත් සභාවේ දීමනා ලබාදීම සම්බන්ධයෙන් වර්තමාන අනුමත බලධාරියා ගරු ආණ්ඩුකාරතුමා වන බැවින් ද ඒ සඳහා අවශ්‍ය අනුමැතිය හා නිරීක්ෂණ කඩිනමින් ප්‍රමුඛව ඉටු කිරීමටත් කටයුතු කිරීම. ඒ අනුව පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් දායකත්වය සැපයීම ද මෙම කාර්යාලය මඟින් ඉටු කරනු ලැබේ.

- සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.
- නගර සහ ජනාවාස ඇතුළත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර බවට පත්කිරීම.
- තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.
- දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට හදිසි පියවර ගැනීම. (කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ සිදු කරනු ලබන දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)

සියලු අමාත්‍යාංශ මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන සියලු ව්‍යවස්ථාපිත කරුණු සම්බන්ධයෙන් (උසස්වීම් /ස්ථාන මාරු/ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් / බඳවා ගැනීමේ පරිපාටි අනුමත කිරීම හා සංශෝධනය කිරීම, දිවයිනෙන් බැහැර වීම සඳහා අවසර ලබාගැනීම ) තීන්දු , තීරණ ගැනීමේදී ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂිත අවධානය යොමු කරමින්, අපක්ෂපාතීව සැමට සාධාරණ, විනිවිද භාවයෙන් යුක්තව අවශ්‍යතාවය මතම පමණක් කළමනාකරණය කරමින් කඩිනම් තීන්දු තීරණ ගැනීමට කටයුතු කිරීම. විශේෂයෙන් අධ්‍යාපන විෂය හා සෞඛ්‍ය විෂය වැනි ජනතාවට ඉතා සමීප මාතෘකාවන්හී තීරණ ගැනීමේදී තිරසාර සංවර්ධන අරමුණු ( SDG) සාක්ෂාත් වන අයුරින් කටයුතු කිරීම .

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේ දී සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණදුන් ගැටළු හා දුෂ්කරතා

නිශ්චිත ඉලක්ක ගත කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට බාධා ඇති වූ අතර වර්ෂ අවසානය වන විට ඉලක්ක සපුරා ගැනීමට හැකි විය.

# 02.පළාත් සභා ලේකම් කාර්යාලය

## පළාත් සභා ලේකම් කාර්යාලය පිළිබඳ මූලික විග්‍රහය
## පළාත් සභා ඉතිහාසය
## ආයතනයේ කටයුතුවලට බලාධිකාරිය ලැබී ඇති ආකාරය

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (සංශෝධනය)
- පනත් -- 1987 අංක 42 දරණ පළාත් සභා පනත
- ආඥා පනත්
- ප්‍රඥප්ති -- 1990 අංක 14 දරණ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය
- චක්‍රලේඛ හා වෙනත්

## ආයතනය ආරම්භ කරන ලද දිනය හා ඊට අදාළ මූලික තොරතුරු

- දිනය - 1988 මැයි මස
- 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 17.1, 17.2 වගන්ති ප්‍රකාර පිහිටුවන ලද පළාත් සභාවේ කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා සභා ලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

## ආයතනය මේ දක්වා පැමිණි අතීත ගමන් මග

1988 මැයි මස ආරම්භ කරන ලද පළාත් සභා ලේකම් කාර්යාලයට ස්ථිර වශයෙන් ගොඩනැගිල්ලක් නොතිබූ අතර මහලේකම් කාර්යාලයේ ලබාගත් කුඩා කාමරයක කාර්යාලයක් ස්ථාපිත කරන ලදී. පළාත් සභා රැස්වීම් පැවැත්වීම සඳහා නිසි ස්ථානයක් නොතිබුණි. අනුරාධපුර පණ්ඩුලගම ගම් උදා භූමියේ ඇති ගොඩනැගිල්ලක 1988.05.12 වෙනි දින ප්‍රථම සභා රැස්වීම පවත්වා ඇත. පසුව අනුරාධපුර විවේකානන්ද විද්‍යාලයේ සන්ථාගාර ශාලාව ද මාස කිහිපයක් ප්‍රයෝජනයට ගත් අතර, නැවත අනුරාධපුර මහලේකම් කාර්යාලීය ගොඩනැගිල්ලේ කුඩා රැස්වීම් ශාලාවක් ස්ථාපිත කර 2004 සැප්තැම්බර් දක්වා එහි සභා රැස්වීම් කටයුතු පවත්වාගෙන ගොස් ඇත.

ඉන් පසුව 2004 ඔක්තෝබර් මස පළාත් සභා සංකීර්ණයක් ඉදිකර එහි පළාත් සභා ලේකම් කාර්යාලය ඇතුළු පළාත් සභා රැස්වීම් පැවැත්වීම සඳහා පළාත් සභා රැස්වීම් ශාලාව, සභාපතිතුමා ඇතුළු ධූරධාරීන් සඳහා කාර්යාල, පුස්තකාලයක් ඇතුළු ව සියලු පහසුකම්වලින් සමන්විත කාර්යාල සංකීර්ණයක් අනුරාධපුර, හරිස්චන්ද්‍ර මාවතේ ඉදිකර ඇත.

## දැක්ම

"මනා ක්‍රියාකාරිත්වයෙන් යුත් ජනතාවාදී පළාත් සභාවක්, සමෘද්ධිමත් පළාතක්".

## මෙහෙවර

"උතුරු මැද පළාතේ සමස්ත පළාත් සභා කටයුතුවල සංවර්ධනය උදෙසා සැසි හා රැස්වීම් කටයුතු සහ කාරක සභා කටයුතු අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව බල ගැන්වීම"

## දිගුකාලීන අරමුණු

පළාත් ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නංවමින් පොදුවේ පළාතේ ජන ජීවිතය ඉහළ නැංවීමට දායක වීම.

## කෙටි කාලීන අරමුණු

- පළාත් සභාවට පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීම උදෙසා පිහිටුවා ඇති ආයතන (පළාත් සභාව සහ කමිටු) විධිමත්ව හා අඛණ්ඩව පවත්වා ගෙන යැම තුළින් ජනතාවගේ එදිනෙදා ප්‍රශ්න හා ගැටළු නිරාකරණය කිරීම
- ගරු පළාත් අමාත්‍යවරුන්ට මන්ත්‍රී වරප්‍රසාද යටතේ හා ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු විපක්ෂනායකතුමා, ගරු

සභානායකතුමා, ගරු ආණ්ඩු පක්ෂයේ හා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන්ට ජන ජීවිතය ඉහළ නැංවීම සඳහා වරප්‍රසාද හා අවශ්‍ය පහසුකම් සැලසීම.

- ඉහත I හා II කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම උදෙසා ලේකම් කාර්යාලය පවත්වාගෙන යාම.

## ප්‍රධාන කාර්යයන්

1. පළාත් සභා සැසි හා රැස්වීම් කටයුතු
2. කාරක සභා සංවිධාන කටයුතු
3. පාර්ලිමේන්තුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණ කටයුතු
4. කාර්යාල පරිශ්‍රය හා අවට පරිසරය ක්‍රමවත්ව හා පිරිසිදුව පවත්වාගෙන යාම.
5. ආයතනයේ දෛනික රාජකාරි කටයුතු හා කාර්යය මණ්ඩල ධාරිතා සංවර්ධන කටයුතු
6. තිරසාර සංවර්ධනයට අදාල කටයුතු

## ප්‍රධාන උපාය මාර්ගයන්

ව්‍යවස්ථාදායකයේ තීරණ කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 22ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 21 කි. පුරප්පාඩු සංඛ්‍යාව 03 කි.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය | උපයෝජනය % |
|---|---|---|---|---|
| 1. ගොඩනැගිලි සහ ඉදිකිරීම | 0.7 | 0.68 | 0.02 | 100% |
| 2. වාහන | 0.8 | - | 0.8 | 0% |
| 3. වෙනත් මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම | 0.6 | - | 0.6 | 0% |

## ශදූඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| ➢ පළාත් සභාවේ ප්‍රධාන කාර්යාලයක් වීම.<br>➢ පුහුණු කාර්යය මණ්ඩලයක් සිටීම.<br>➢ පළාත් භාණ්ඩාගාරයෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම. | ➢ කාර්ය මණ්ඩලය සීමා සහිතවීම<br>➢ පළාත් සභාවට අදාළ තොරතුරු ඇතුළත් අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් නොමැතිකම.<br>➢ සභා ලේකම් කාර්ය මණ්ඩලය සංවෘත කාර්යය මණ්ඩලයක් වීම |
| **අවස්ථා** | **තර්ජන** |
| ➢ රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ අනෙකුත් ආයතන මගින් ලැබෙන සහයෝගය<br>➢ අනෙකුත් පළාත් සභාවලින් ලැබෙන සහයෝගය | ➢ පළාත් සභාවේ කාර්යයන් පිළිබඳ ප්‍රජාවගේ දැනුවත් බව අඩුවීම.<br>➢ පළාත් සභාව පිහිටුවීම පිළිබඳ නිශ්චිත කාලවකවානුවක් දැනට සඳහන් නොවීම හේතුවෙන් පවතින අවිනිශ්චිත බව සහ ප්‍රතිපාදනයන් සීමාවීම. |

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමැවුම්) | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස % | | |
|---|---|---|---|
| | 100% - 90% | 75%- 89% | 50%- 74% |
| පළාත් සභා ප්‍රතිපාදන අනුව මූල්‍ය පරිහරණය සිදු කිරීම | 100% | | |
| අදාල චක්‍ර ලේඛණ වලට අනුව වැටුප් හා දීමනා ලබා දීම | 100% | | |
| පළාත් සභාවට වෙන් කර ඇති සම්පත් අරපිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීම | 100% | | |
| වාහන නිසි පරිදි නඩත්තුව හා පාලනය | 100% | | |
| ආයතනික කටයුතු පහසු කිරීම | 100% | | |
| සිත් ඇද ගන්නා සුළු උද්‍යානයක් පවත්වා ගැනීම. | 100% | | |
| ගුණාත්මක හා ඵලදායි රැස්වීම් පැවැත්වීම | | | 50% |
| පළාත් සභා ප්‍රතිපාදන අනුව විනිවිද භාවයෙන් යුතු මූල්‍ය පරිහරණය සිදු කිරීම | 100% | | |

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

| අනු අංක | ප්‍රධාන අරමුණ | නිමැවුම්/ ප්‍රතිපල | ක්‍රියාකාරකම් |
|---|---|---|---|
| 01. | සාර්ථක මූල්‍ය පරිහරණය | පළාත් සභා ප්‍රතිපාදන අනුව මූල්‍ය පරිහරණය සිදු කිරීම | මුදල් ගෙවීම, සුළු මුදල් අග්‍රිමය, වාර්ෂික ඇස්තමේන්තු,මාසික ගිණුම් සාරාංශ, බැංකු සැසඳුම් වාර්තා, ණය අත්තිකාරම්,වාර්ෂික විසර්ජන ගිණුම්, මිලදී ගැනීම් යනාදී ආයතනික මූල්‍යමය කටයුතු සිදු කිරීම හා ඒවා ලේඛන ගත කිරීම |
| 02. | වැටුප් හා දීමනා ලබා දීම ක්‍රමවත් කිරීම | අදාල චක්‍ර ලේඛණ වලට අනුව වැටුප් හා දීමනා ලබා දීම | කාර්යය මණ්ඩලයේ වැටුප් හා දීමනා සකස් කිරීම හා විශ්‍රාම වැටුප් වැන්දඹු අනත්දරු දත්ත ඇතුලත් කිරීම ආදී කටයුතු. |
| 03. | සීමිත සම්පත් මඟින් උපරිම ඵලදායිතාවක් ලබා ගැනීම | පළාත් සභාවට වෙන් කර ඇති සම්පත් අරපිරිමැස්මෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීම | පළාත් සභා ගොඩනැගිල්ලට අයත් සියළුම බඩු බාහිරාදිය හා යන්ත්‍ර සූත්‍ර ලේඛණගත කිරීම හා ඒවා යාවත් කාලීන කිරීම |
| 04 | ආයතනික වාහන කාර්යක්ෂමව පරිහරණය | වාහන නිසි පරිදි නඩත්තුව හා පාලනය | ආයතනයට අදාල සියළුම වාහන අලුත්වැඩියාව, ලොග් සටහන් පොත, දෛනික ධාවන සටහන් ඉන්ධන දීමනා වාහන කුලී දීමනා යන සියළු කටයුතු සිදු කිරීම හා ලේඛන ගත කිරීම. |
| 05 | කාර්යක්ෂම ආයතනයක් බිහි කිරීම | ආයතනික කටයුතු පහසු කිරීම | දෛනික තැපැල හා අනෙකුත් කාර්යාල කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම. |
| 06 | අලංකාර පරිසරයක් නිර්මාණය කිරීම | සිත් ඇද ගන්නා සුළු උද්‍යානයක් පවත්වා ගැනීම. | පළාත් සභා ගොඩනැගිල්ල අවට උද්‍යානය නඩත්තු කර අවට පරිසරය පිරිසිදුව හා අලංකාරවත් ආකාරයෙන් පවත්වා ගැනීම. |

## පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මහජනතාව වෙත ලබාදුන් සේවාවන්

| අනු අංකය | ලබා දුන් සේවාවන් | ක්‍රියාත්මක කරන ලද ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | සහය දැක්වූ ආයතන |
|---|---|---|---|---|
| 1 | කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා වීම සදහා දැන්වීම් පුවරු පදර්ශනය කිරීම | කාර්යාල පරිශය | මහජනතාව වෙන්වෙන් | කාර්යාල නිලධාරීන් |
| 2 | දැත් සේදීම සදහා ජල කරාම සවි කිරීම හා න්ලධාරීන්ට මුඛ ආවරණ ලබාදීම | | | |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේ සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

කාර්යාලයේ නිලධාරියකු කොවිඩ් 19 වසංගතයට ගොදුරු වී මිය යාම හා කාර්යාල නිලධාරීන් බහුතරයක් එම වෛරසයට ගොදුරු වීමත් සමග කාර්යාල කටයුතුවලට කෙටි කාලසීමාවක් සඳහා බාධා ඇති වුව ද , මුඛ ආවරණ පැළදීමත්, සමාජ දුරස්තභාවය තබා ගැනීම වැනි සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමෙන් කාර්යාල රාජකාරි කටයුතු නිසි පරිදි යථාවත් කරගත හැකි විය.

# 03.පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල පැවරෙන ආකාරය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ, 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන අනුව, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

1987 අංක 42, 1989 අංක 12 දරණ පළාත් සභා අනුශාංගික විධිවිධාන පනත හා 1990 අංක 28 දරණ පළාත් සභා සංශෝධිත පනත අනුව, ගරු ආණ්ඩුකාරතුමා සතු පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධ කටයුතු සිදු කිරීමේ බලතල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරේ.

උතුරු මැද පළාත් සභාව ස්ථාපනය කරන ලද දින සිට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ක්‍රියාත්මක වන අතර පළාත් සභා පනතේ හා සංශෝධිත වගන්ති අනුව සහ ගරු ආණ්ඩුකාරතුමා විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල අනුව කටයුතු කරනු ලබයි.

### දැක්ම

"ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක්"

### මෙහෙවර

"පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල කළමනාකරණය සියළු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව විධිමත්ව ඉටුකරමින් ප්‍රශංසනීය පළාත් රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව දායක වීම."

### දිගුකාලීන අරමුණු

- ❖ තෘප්තිමත් රාජ්‍ය සේවයක් ගොඩනැංවීම පිණිස පළාත් රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල අවශ්‍යතා නිවැරදිව පුරෝකථනය කිරීම, කාලීනව සුදුසු තීරණ ගැනීම හා ක්‍රියා කිරීම.
- ❖ පළාත් රාජ්‍ය සේවය තුළ විනය පවත්වාගෙන යාම සහ නියාමනය කිරීම.
- ❖ ප්‍රශස්ත රාජ්‍ය සේවයක් පවත්වා ගැනීම සඳහා අඛණ්ඩව මැදිහත්වීම.

### කෙටිකාලීන අරමුණු

- ❖ උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ ආයතනික කටයුතු විධිමත් කිරීම.
- ❖ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.
- ❖ විනය නියෝගවලට අදාල අභියාචනා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා කිරීම.
- ❖ නිසිකලට කාර්යක්ෂමතා කඩඉම් විභාග හා දෙපාර්තමේන්තුගත පරීක්ෂණ පැවැත්වීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

- කාර්ය මණ්ඩල තොරතුරු හඳුනා ගැනිම හා යාවත්කාලීන කිරීම.
- බඳවා ගැනීමේ පරිපාටි විධිමත්ව අනුමත කරගැනීම හා කාලීන අවශ්‍යතා අනුව අදාල සංශෝධන කිරීම.
- පත් කිරීමේ සිට විශ්‍රාම ගැන්විම දක්වා ආයතනික කටයුතු ක්‍රියාත්මක කිරිම.
- විනය පාලනයට අදාල අභියාචනා පිළිබඳව සමාලෝචනය හා තීරණ ගැනීම.
- පත් කිරීම හා ස්ථානමාරු පිළිබඳව මධ්‍යම රජය හා අනෙකුත් පළාත් සභා සමග කටයුතු කිරීම.
- බඳවා ගැනීමේ හා උසස්වීම් සඳහා වූ වාර්ෂික විභාග සැලැස්ම විධිමත්ව සකස් කිරීම හා සැලසුම්සහගතව ක්‍රියාත්මක කිරීම.
- විනය කටයුතු හා කාර්ය මණ්ඩල නියාමනය සඳහාවන උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම.
- අවශ්‍යතා පරිදි නිසි කල්හී පුරප්පාඩු පිරවීම, උසස්වීම්, ස්ථිර කිරීම් ලබා දීම හා විනය ක්‍රියාමාර්ග ගැනීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතතයේ අනුමත සේවක සංඛ්‍යාව 29ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 27 කි. පුරප්පාඩු සංඛ්‍යාව 02 කි.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1.ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 0.1 | 0.00132 | 0.09 | 1% |
| 2.යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.17 | 0.14 | 0.03 | 83% |
| 3.වාහන | 0.4 | 0.24 | 0.16 | 60% |
| 4.වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 3.16 | 3.16 | 0 | 100 |
| **එකතුව** | **3.83** | **3.40** | **0.28** | **88%** |

## අංශය පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය

මෙම කාර්යාලය මගින් ඉදි කිරීම් හා මහජන සේවාලාභී සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරයි. පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා නියාමනය කිරීමට දායක වීම තුලින් ප්‍රශස්ත රාජ්‍ය සේවයක් ඇතිකරලීම අපේක්ෂාව වේ.

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා නිමැවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක | පළාත් නිමැවුම් දර්ශකය | ආයෝජනය ඉලක්ක/ප්‍රගතිය |
|---|---|---|---|
| තිරසාර පරිපූර්ණ අර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම. | වසර තුළ ලබාදෙන ලද පත්වීම් ගණන | පත්වීම් ගණන | ඉල්ලීම් ලැබෙන පරිදි |
| | වසර තුල සිදුකරන ලද ස්ථිර කිරීම් ගණන | ස්ථිර කිරීම් ගණන | |
| | වසර තුල සිදුකරන ලද උසස්වීම් ගණන | උසස්වීම් ගණන | |
| | වසර තුල සිදුකරන ලද විශ්‍රාම ගැන්වීම් ගණන | විශ්‍රාම ගැන්වීම් ගණන | |
| | වසර තුල පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් ප්‍රමාණය | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ගණන | |
| | වසර තුල අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | |
| | වසර තුල අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංශෝධන ප්‍රමාණය | සංශෝධන ගණන | |
| | පළමු අභියාචනා බලධරයා වශයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව | ලබාදී ඇති තීරණ ගණන | |
| | වසර තුල තොරතුරු ලබාදී ඇති තොරතුරු ඉල්ලීම් ගණන | ලබාදී ඇති තොරතුරු ඉල්ලීම් ගණන | |
| | වසර තුල ප්‍රතික්ෂේප කර ඇති තොරතුරු ඉල්ලීම් ගණන | ප්‍රතික්ෂේප කළ තොරතුරු ඉල්ලීම් ගණන | |
| | වසර තුල ලැබෙන මානව හිමිකම් පැමිණිලි ගණන | පැමිණිලි ගණන | |
| | වසර තුල පැවරෙන නඩු ගණන | නඩු ගණන | |

**ප්‍රධාන අංශයන්හි කාර්යසාධනය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්හි ප්‍රගතිය**

## I. 2021 වර්ෂය තුලදී බඳවා ගැනීම් හා පත්කිරීම් විස්තර

| අනු අංකය | තනතුරු නාමය | ආයතනය | ලබාදී ඇති පත්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා ගුරු සේවයට පත් කිරීම | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 04 |
| 2 | කෘෂි ව්‍යාප්ති නිලධාරීන් බඳවා ගැනීම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 03 |
| 3 | කෘෂිකර්ම උපදේශක | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 17 |
| 4 | සත්ත්ව සංවර්ධන උපදේශක | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 07 |
| 5 | කළමනාකරණ සේවා නිලධාරී | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට | 106 |
| 6 | බදු නිලධාරීන් | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | 02 |
| 7 | සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | 08 |
| 8 | ආයුර්වේද නියෝජ්‍ය කොමසාරිස් | ආයුර්වේද දෙපාර්තමේන්තුව | 01 |
| 9 | නිවාස මාතා | පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | 01 |
| 10 | මේට්‍රන් | පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | 03 |
| 11 | වෘත්තීය උපදේශක | පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | 04 |
| 12 | ප්‍රමාණ සමීක්ෂක | පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | 02 |
| 13 | රියදුරු | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට | 08 |
| **එකතුව** | | | 166 |

## II. 2021 වර්ෂයේදී පවත්වන ලද බඳවා ගැනීමේ විභාග

2021 වර්ෂයේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ විභාග මෙම ආයතනය මගින් පවත්වා නැත.

## III. 2021 වර්ෂයේදී පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග

**පළමු වාරය**

| අනු අංක | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | විෂයය | මාධ්‍යය | ඉල්ලුම් කළ අයදුම්කරුවන් ගණන | පෙනී සිටි අයදුම්කරුවන් ගණන | විභාගය පවත්වන ලද දිනය |
|---|---|---|---|---|---|---|
| 1 | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක සේවයේ 11 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 02. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | සිංහල | **02** | **02** | **2021.04.03** |
| 2 | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක සේවයේ 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. ආයතන රෙගුලාසි | සිංහල | **06** | **04** | **2021.04.03** |
| | | 02. පළාත් පාලන ආයතන වල මූල්‍ය නීතිරීති | සිංහල | **05** | **04** | |

2021 වර්ෂයේදී පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග ඉතිරි කොටස....................

| අනු අංකය | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | විෂයය | මාධ්‍යය | ඉල්ලුම් කළ අයදුම්කරුවන් ප්‍රමාණය | පෙනී සිටි අයදුම්කරුවන් ප්‍රමාණය | විභාගය පවත්වන ලද දිනය |
|---|---|---|---|---|---|---|
| 3 | පළාත් පාලන ආයතන වල වැඩ පරිපාලක / සෞඛ්‍ය පරිපාලක / පොදු වෙළඳසැල් පරිපාලක සේවයේ 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. ආයතන රෙගුලාසි | සිංහල | 01 | 01 | 2021.04.03 |
| | | 02. පළාත් පාලන ආයතන වල මූල්‍ය රීති | සිංහල | 02 | 02 | |
| 4 | පළාත් පාලන ආයතන වල පෙර පාසල් ගුරු (පාලිකා) සේවයේ 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. පෙර පාසල් ව්‍යවස්ථා රෙගුලාසි | සිංහල | 01 | 01 | 2021.04.03 |
| | | 02. විෂය නිර්දේශිත දැනුම | සිංහල | | | |
| 5 | පළාත් පාලන ආයතන වල ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ (පෙදරේරු) 1 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | (අ) කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම | සිංහල | 01 | 01 | 2021.04.03 |
| | | (ආ) ආයතන සංග්‍රහය | සිංහල | | | |
| 6 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ තාක්ෂණික බණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) තනතුරේ 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සහ කාර්යාල පරිපාලන ආයතන සංග්‍රහය | සිංහල | 03 | 02 | 2021.04.03 |
| | | 02. මුදල් රෙගුලාසි | සිංහල | 07 | 06 | |
| 7 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ (අරක්කැමි) 1 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. විෂයානුබද්ධ නව්‍යකරණය | සිංහල | 01 | 01 | 2021.04.03 |
| 8 | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ (උපස්ථායක) 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සහ ආයතන රෙගුලාසි | සිංහල | 35 | 34 | 2021.04.03 |
| 9 | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) 1 ශ්‍රේණිය | 01. විෂය දැනුම | සිංහල | 04 | 04 | 2021.04.03 |
| 10 | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය / කණිෂ්ඨ) 11 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. ආයතන සංග්‍රහය, උතුරු මැද පළාත් විනය කාර්ය සංග්‍රහය හා උතුරු මැද පළාත් මූල්‍ය රීති | සිංහල | 10 | 09 | 2021.04.03 |
| | | | දෙමළ | 01 | 01 | |
| 11 | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. සාමාන්‍ය පරිපාලනය | සිංහල | 20 | 18 | 2021.04.03 |
| | | | දෙමළ | 01 | 01 | |
| | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ (මුරකරු) 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. සාමාන්‍ය පරිපාලනය | සිංහල | 04 | 04 | |
| 12 | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත බණ්ඩ 02 සේවා ගණයේ සමාජ සේවා නිලධාරි 11 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. ආයතන සංග්‍රහය | සිංහල | 10 | 10 | 2021.04.03 |
| | | 02. මුදල් රෙගුලාසි හා පළාත් සභා මූල්‍ය රීති | සිංහල | 06 | 06 | |

| අනු අංකය | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | විෂයය | මාධ්‍යය | ඉල්ලුම් කළ අයදුම්කරුවන් සංඛ්‍යාව | පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව | විභාගය පවත්වන ලද දිනය |
|---|---|---|---|---|---|---|
| 13 | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ (උපස්ථායක) 11 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (වාචික පරීක්ෂණය) | වාචික | සිංහල | 03 | 03 | 2021.04.27 |
| 14 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරී තනතුරේ 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. කාර්යාල ක්‍රම | සිංහල | 02 | 02 | 2021.04.03 |
| | | 02. ගිණුම් ක්‍රම | සිංහල | 02 | 02 | |
| | | 03. සමුපකාර නීතිය හා පොදු නීතිය | සිංහල | 03 | 03 | 2021.04.04 |
| 15 | ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මැහුම් උපදේශිකා 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත) | 01.ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති | සිංහල | 01 | 01 | 2021.04.03 |
| | | 02. මුදල් රෙගුලාසි | සිංහල | | | |
| 16 | ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටිගත රීති (ආයතන රෙගුලාසි පිළිබඳ මූලික දැනුම) | සිංහල | 08 | 06 | 2021.04.03 |
| | | 02.ක්‍රීඩා පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම | සිංහල | 04 | 03 | |
| 17 | ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. පුහුණු න්‍යාය, ශාරීරික යෝග්‍යතාවය සහ පුහුණු සැලසුම් | සිංහල | 04 | 03 | 2021.04.03 |
| 18 | ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. ක්‍රීඩා පනත | සිංහල | 03 | 03 | 2021.04.04 |
| | | 02. මුදල් රෙගුලාසි | සිංහල | 03 | 03 | 2021.04.03 |
| | | 03. පරිපාලනය | සිංහල | 02 | 02 | |
| 19 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂ කර්මාන්ත උපදේශිකා තනතුරේ 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 02. මුදල් රෙගුලාසි පිළිබඳ මූලික දැනුම | සිංහල | 01 | 01 | 2021.04.03 |
| 20 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ 1 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (වාචික පරීක්ෂණය) | වාචික | සිංහල | 03 | 03 | 2021.08.11 |
| 21 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ 11 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. කාර්ය පරිපාටික රීති ඇතුළත් ලිඛිත පරීක්ෂණය | සිංහල | 02 | 02 | 2021.04.03 |
| | | ප්‍රායෝගික | සිංහල | 02 | 02 | 2021.08.11 |
| 22 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. මහා මාර්ග නීති, මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම මැනීම හා ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ දැනුම මැන බැලීමේ ලිඛිත පරීක්ෂණය | සිංහල | 04 | 03 | 2021.04.03 |
| | | වාචික | සිංහල | 01 | 01 | 2021.08.11 |
| 23 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ තාක්ෂණික බණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක 111 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (ලිඛිත පරීක්ෂණය) | 01. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | සිංහල | 01 | අයදුම්කරුවන් පැමිණියේ නැත | 2021.04.03 |
| | | 02. මුදල් රෙගුලාසි | සිංහල | 02 | | |

## දෙවන වාරය

| අනු අංකය | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | විෂයය | මාධ්‍යය | ඉල්ලුම් කළ අයදුම්කරුවන් ප්‍රමාණය | පෙනී සිටි අයදුම්කරුවන් ප්‍රමාණය | විභාගය පවත්වන ලද දිනය |
|---|---|---|---|---|---|---|
| 1 | ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සේවයේ - 111 ශ්‍රේණිය | 03. දෙපාර්තමේන්තු / ආයතන ක්‍රමවේදයන් පිළිබඳ ලිඛිත පරීක්ෂණය | සිංහල | 05 | **04** | **2021.12.11** |
| 2 | අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන හා විමර්ශන නිලධාරී - 1 ශ්‍රේණිය | 01. රජයේ මූල්‍ය ක්‍රියා පරිපාටි | සිංහල | 01 | **01** | **2021.12.11** |
| | | 02. ආයතන රෙගුලාසි | සිංහල | 01 | **01** | |
| 3 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - 111 ශ්‍රේණිය | 01. ආයතන රෙගුලාසි | සිංහල | 03 | **03** | **2021.12.11** |
| | | 02. මුදල් රෙගුලාසි | සිංහල | 03 | **03** | |
| 4 | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරී - 111 ශ්‍රේණිය | 02. ගිණුම් ක්‍රම | සිංහල | 02 | **02** | **2021.12.11** |
| | | 01. කාර්යාල ක්‍රම | සිංහල | 01 | **01** | |
| 5 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ 1 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. – 2021 (1) (වාචික පරීක්ෂණය) | වාචික | සිංහල | 01 | **01** | **2022.01.26** |
| 6 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ - 111 ශ්‍රේණිය | 01. මහා මාර්ග නීති, මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම මැනීම හා ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳ දැනුම මැන බැලීමේ ලිඛිත පරීක්ෂණය | සිංහල | 09 | **08** | **2021.12.11** |
| | | වාචික | සිංහල | 08 | **08** | **2022.01.26** |
| 7 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ තාක්ෂණික බණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක - 111 ශ්‍රේණිය | 02. මුදල් රෙගුලාසි | සිංහල | 02 | **01** | **2021.12.11** |
| | | 01. කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | සිංහල | 01 | **01** | **2021.12.11** |
| 8 | උතුරු මැද පළාත් සංවර්ධන නිලධාරී - 1 ශ්‍රේණිය | 01. ව්‍යාපෘති කළමනාකරණය | සිංහල | 67 | **62** | **2022.01.29** |
| 9 | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත බණ්ඩ 02 සේවා ගණයේ සමාජ සේවා නිලධාරි 11 ශ්‍රේණිය | 02. මුදල් රෙගුලාසි හා පළාත් සභා මූල්‍ය රීති | සිංහල | 05 | **05** | **2021.12.11** |
| | | 01. ආයතන සංග්‍රහය | සිංහල | 01 | **01** | |
| 10 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂ කර්මාන්ත උපදේශිකා තනතුරේ - 1 ශ්‍රේණිය | 01. කාර්ය විශේෂිත දැනුම | සිංහල | 01 | **01** | **2021.12.11** |
| 11 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂ කර්මාන්ත උපදේශිකා තනතුරේ 11 ශ්‍රේණිය | 01. කාර්යාල ක්‍රම / මුදල් රෙගුලාසි | සිංහල | 01 | **01** | **2021.12.11** |
| | | 03. පොදු ප්‍රශ්න පත්‍රය | සිංහල | 01 | අයදුම්කරු පැමිණියේ නැත | **2021.12.11** |
| 12 | ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී - 11 ශ්‍රේණිය | 01. පරිගණක පරීක්ෂණය | සිංහල | 01 | **01** | |

2021 වර්ෂයේදී පවත්වන ලද කාර්යක්ෂමතා කඩඉම් විභාග ඉතිරි කොටස....................

| අනු අංකය | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය | විෂයය | මාධ්‍යය | ඉල්ලුම් කළ අයදුම්කරුවන් ප්‍රමාණය | පෙනී සිටි අයදුම්කරුවන් ප්‍රමාණය | විභාගය පවත්වන ලද දිනය |
|---|---|---|---|---|---|---|
| 13 | ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී - 111 ශ්‍රේණිය | 01. ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටිගත රීති (ආයතන සංග්‍රහය පිළිබඳ මූලික දැනුම) | සිංහල | 06 | **05** | **2021.12.11** |
| | | 02.ක්‍රීඩා පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම | සිංහල | 01 | **01** | **2021.12.11** |
| 14 | ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු - 111 ශ්‍රේණිය | 01. පුහුණු න්‍යාය, ශාරීරික යෝග්‍යතාවය සහ පුහුණු සැලසුම් | සිංහල | 02 | **02** | **2021.12.11** |
| 15 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ තාක්ෂණික බණ්ඩ 03 සේවා ගණයේ තාක්ෂණ සහායක (කෘෂි ව්‍යාප්ති) තනතුරේ 111 ශ්‍රේණිය | 01. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සහ කාර්යාල පරිපාලන ආයතන සංග්‍රහය | සිංහල | 05 | **03** | **2021.12.11** |
| | | 02. මුදල් රෙගුලාසි | සිංහල | 05 | **03** | |
| 16 | උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තිය උපදේශක - 111 ශ්‍රේණිය | 01. විෂයානුබද්ධ | සිංහල | 04 | **04** | **2021.12.11** |
| 17 | උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිවාස මාතා - 111 ශ්‍රේණිය | 01. පෝෂණවේදය හා සෞඛ්‍ය (ලිඛිත) | සිංහල | 01 | **01** | **2022.01.29** |
| | | 01. පෝෂණවේදය හා සෞඛ්‍ය (ප්‍රායෝගික) | සිංහල | 01 | **01** | **2022.01.25** |
| 18 | පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක - 111 ශ්‍රේණිය | 01. ආයතන රෙගුලාසි | සිංහල | 09 | **05** | **2021.12.11** |
| | | 02. පළාත් පාලන ආයතනවල මූල්‍ය නීතිරීති | සිංහල | 08 | **06** | |
| 19 | පළාත් පාලන ආයතන වල ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - 1 ශ්‍රේණිය | (අ) කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම | සිංහල | 03 | **03** | **2021.12.11** |
| | | (ආ) ආයතන සංග්‍රහය | සිංහල | 03 | **03** | |
| 20 | පළාත් පාලන ආයතන වල වැඩ පරිපාලක / සෞඛ්‍ය පරිපාලක / පොදු වෙළඳසැල් පරිපාලක සේවයේ 111 ශ්‍රේණිය | 02. පළාත් පාලන ආයතන වල මූල්‍ය රීති | සිංහල | 01 | **01** | **2021.12.11** |
| 21 | පළාත් පාලන ආයතන වල ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - 11 ශ්‍රේණිය | වාචික | සිංහල | 01 | **01** | **2022.01.19** |
| 22 | පළාත් පාලන ආයතන වල ප්‍රාථමික ශිල්පීය සේවා ගණය - 111 ශ්‍රේණිය | වාචික | සිංහල | 01 | අයදුම්කරු පැමිණියේ නැත | **2022.01.26** |
| 23 | සමාජ සේවා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - 11 ශ්‍රේණිය | වාචික | සිංහල | 05 | **05** | **2021.12.16** |
| 24 | සමාජ සේවා සාත්තු සේවිකා - 11 ශ්‍රේණිය | වාචික | සිංහල | 06 | **06** | **2021.12.16** |
| 25 | ආයුර්වේද ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය - 111 ශ්‍රේණිය | වාචික | සිංහල | 04 | **04** | **2021.12.13** |

IV. 2021.12.31 දිනට කොමිෂන් සභා වාර්ෂික ප්‍රගති වාර්තාව

| අනු අංකය | කාරණය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම | 74 |
| 02 | i. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (මුදා හැරීම) | 512 |
| | ii. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (සුහද) | 08 |
| | iii. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (තුන්කොන් සුහද) | 02 |
| | iv. අන්තර් පළාත් ගුරු ස්ථාන මාරු (පැමිණීම්) | 60 |
| 03 | i. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (මුදා හැරීම්) | 57 |
| | ii. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (සුහද) | 24 |
| | iii. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (තුන්කොන් සුහද) | 08 |
| | iv. අන්තර් පළාත් / රාජ්‍ය වෙනත් ස්ථාන මාරු (පැමිණීම්) | 40 |
| 04 | i. අභ්‍යන්තර ස්ථාන මාරු (මුදා හැරීම්/ පැමිණීම්) | 19 |
| | ii. අභ්‍යන්තර ස්ථාන මාරු (සුහද) | 06 |
| | iii. අභ්‍යන්තර ස්ථාන මාරු (සුහද තුන්කොන්) | 01 |
| 05 | විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීම. | 136 |
| 06 | පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කිරීම. | 253 |
| 07 | උසස්වීම. | 576 |
| 08 | විශ්‍රාම ගැන්වීම් | |
| | i. ශ්‍රී ලංකා විදුහල්පති සේවය | 41 |
| | ii. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 03 |
| | iii. පළාත් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු | 21 |
| 09 | වෙනත් තීරණ -<br>i. කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද තීරණ | 432 |
| | ii.කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද තීරණ | 294 |
| | iii.කොමිෂන් සභාවේ ආවරණ අනුමැතියට යොමු කළ ලිපි | - |
| | iv.උතුරු මැද පළාත් රාජ්‍ය සේවයට අදාළව කොමිෂන් සභාව විසින් ගන්නා ලද වෙනත් තීරණ | 02 |

## ආයතනයේ කාර්ය සාධක දර්ශක - ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමවුම) | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| ලබාදෙන ලද පත්වීම් ගණන | √ | | |
| සිදුකරන ලද උසස්වීම් ගණන | √ | | |
| සිදුකරන ලද විශ්‍රාම ගැන්වීම් ගණන | √ | | |
| සිදුකරන ලද සේවය ස්ථිර කිරීම් ගණන | √ | | |
| පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් ප්‍රමාණය | √ | | |
| අනුමත කර ගන්නා බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | √ | | |
| අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංශෝධන ප්‍රමාණය | √ | | |
| පළමු අභියාචනා බලධරයා වශයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව | | √ | |
| තොරතුරු ලබාදී ඇති තොරතුරු ඉල්ලීම් ගණන | √ | | |
| ප්‍රතික්ෂේප කර ඇති තොරතුරු ඉල්ලීම් ගණන | | | √ |
| ලැබෙන මානව හිමිකම් පැමිණිලි ගණන | √ | | |
| ලැබෙන නඩු ගණන | √ | | |
| සිදුකරන ලද ස්ථාන මාරු වීම් ගණන | | √ | |

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පවතින තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ප්‍රතිපාදන අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරන අතර, ඉදිරිපත් කරන සේවය ස්ථිර කිරීම්, විශ්‍රාම ගැන්වීම්, උසස් කිරීම් ආදිය හැකි උපරිම අයුරින් කඩිනමින් ඉටු කිරීමට අපේක්ෂා කරයි. පවතින කාර්යාලයේ ඉඩ කඩ ප්‍රමාණවත් නොවීම, මානව සම්පත ප්‍රමාණවත් නොවීම හා භෞතික සම්පත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදුවී ඇත. එබැවින් එම අඩුපාඩු නිවැරදි කර ගනිමින් වඩාත් ඵලදායි ලෙස 2022 වසර තුළ රාජ්‍ය සේවකයින්ගේ කටයුතු ඉටු කිරීමට අපේක්ෂිතය.

## හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

- තිරසාර පරිපූර්ණ අර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරිම.

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතනය සැලසුම්කළ ඉලක්ක | එම ඉලක්කය පහාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| තිරසාර පරිපූර්ණ අර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරිම. | විභාග හා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | පවත්වන විභාග ගණන සම්මුඛ පරීක්ෂණ ගණන | වසර තුළ ලබාදෙන ලද පත්වීම් ගණන | | | √ |
| | ලිපිගොනු පරීක්ෂා කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම | • පරීක්ෂා කරන ලිපිගොනු ගණන<br>• සකස් කරන සභා සටහන් ගණන | වසර තුල සිදුකරන ලද ස්ථිර කිරීම් ගණන | | | √ |
| | ලිපිගොනු පරීක්ෂා කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම | • පරීක්ෂා කරන ලිපිගොනු ගණන<br>• සකස් කරන සභා සටහන් ගණන | වසර තුල සිදුකරන ලද උසස්වීම් ගණන | | | √ |
| | ලිපිගොනු පරීක්ෂා කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම | • පරීක්ෂා කරන ලිපිගොනු ගණන<br>• සකස් කරන සභා සටහන් ගණන | වසර තුල සිදුකරන ලද විශ්‍රාම ගැන්වීම් ගණන | | | √ |
| | අයදුම්පත් කැඳවා විභාග පැවැත්වීම | • කැඳවන අයදුම්පත් ගණන<br>• සකස් කරන ප්‍රශ්න පත්‍ර ගණන | වසර තුල පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් ප්‍රමාණය | | | √ |
| | කෙටුම්පත් සකස් කර ආයතන සමග සාකච්ඡා කර අනුමැතියට ඉදිරිපත් කිරීම | • සකස් කරන කෙටුම්පත් ගණන<br>• ආයතන සමග සාකච්ඡා කරන වාර ගණන | වසර තුල අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංඛ්‍යාව | | | √ |

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම්කළ ඉලක්ක | එම ඉලක්කය පහාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටු කළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| තිරසාර පරිපූර්ණ අර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිත්වයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරිම. | කෙටුම්පත් සකස් කර ආයතන සමග සාකච්ඡා කර අනුමැතියට ඉදිරිපත් කිරිම | • සකස් කරන කෙටුම්පත් ගණන<br>• ආයතන සමග සාකච්ඡා කරන වාර ගණන | වසර තුල අනුමත කර ඇති බඳවා ගැනීම් පරිපාටි සංශෝධන ප්‍රමාණය | | | √ |
| | ලිපිගොනු පරීක්ෂා කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම | • පරීක්ෂා කරන ලිපිගොනු ගණන<br>• සකස් කරන සභා සටහන් ගණන | පළමු අභියාචනා බලධරයා වශයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග සංඛ්‍යාව | | √ | |
| | අදාළ ආකෘති පත්‍රවලට අනුව පිළිතුරු සැපයීම | • සකස් කරන ආකෘති පත්‍ර ගණන | පිළිතුරු සපයා ඇති තොරතුරු ඉල්ලීම් ගණන | | | √ |
| | අදාළ ආකෘති පත්‍රයට අනුව පිළිතුරු සැපයීම | සකස් කරන ආකෘති පත්‍ර ගණන | ප්‍රතික්ෂේප කර ඇති තොරතුරු ඉල්ලීම් ගණන | √ | | |
| | අදාළ ලිගොනු අධ්‍යනය කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම | • අධ්‍යනය කරන ලිපිගොනු ගණන<br>• සකස් කරන සභා සටහන් ගණන | මානව හිමිකම් පැමිණිලි ගණන | | | √ |
| | අදාළ ලිගොනු අධ්‍යනය කර කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම | • අධ්‍යනය කරන ලිපිගොනු ගණන<br>• සකස් කරන සභා සටහන් ගණන | නඩු ගණන | | | √ |
| | ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම, මාරු මන්ඩල පිහිටුවීම | • ස්ථාන මාරු අයදුම්පත් ගණන<br>• සකස් කරන සභා සටහන් ගණන | ස්ථාන මාරු වීම් ගණන | | √ | |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2021 වර්ෂයේදී මුහුණ පෑමට සිදු වූ Covid 19 ගෝලීය වසංගතය හේතුවෙන් මෙම ආයතනයේ දෛනික කටයුතු අඩපන වීම වර්ෂය මැද භාගය තෙක් සිදු වූ නමුත් අත්‍යවශ්‍ය කඩිනම් කටයුතු කාර්යාලීය වාහන යොදාගෙන නිලධාරීන් ගෙන්වාගෙන ඉටු කරන ලදි. පසුව 50% සේවක මණ්ඩලයක් යොදාගෙන රාජකාරී කටයුතු සිදු කරන ලදි. නිලධාරීන් කිහිප දෙනෙකු නිරෝධායනයට ලක් කල බැවින් අතපසු වූ දෛනික රාජකාරී කටයුතුද 2021.12.31 වන දින විට අවසන් කරන ලදි.

පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත දිනට පැවැත්වීමට නොහැකි වුවද පසුව සැලසුම් කල ආකාරයට සියළුම විභාග වෙනත් දිනයන් වලදී පවත්වන ලදි. පවතින වසංගතය හේතුවෙන් ආයතනයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

සමාලෝචිත වර්ෂයේ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව 04 ක් වූ අතර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 27 ක් විය. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මෙහෙවර ප්‍රකාශය අනුව යමින් අනුමත රාජ්‍ය ප්‍රතිපත්ති වලට හා විධිමත් කාර්ය පටිපාටිවලට අනුකූලව 2021 වර්ෂය තුළදී ක්‍රියාකර ඇත.

2021 වර්ෂය තුලදී 602 වැය ශීර්ෂය යටතේ පෞද්ගලික පඩිනඩි වශයෙන් රු.19,015,088.00 ක මුදලක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙන් රු.4,278,134.00 ක මුදලක් වියදම් දරා ඇත. 2021 වර්ෂයේදී මූලධන වියදම් යටතේ මෙම ආයතනයට වාර්ෂික ඇස්තමේන්තු අනුව රු.3,158,183.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන්කර තිබුණි. එයින් යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු.3,158,183.00 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර, රු.3,158,183.00 ක මුදලක් වැය කර කාර්ය මණ්ඩලයේ හා පරිපාලනයේ කාර්යක්ෂමතාවය ඉහළ නංවන පරිදි යන්ත්‍ර සූත්‍ර, ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සපයා ගන්නා ලදි.

මෙම කාර්යාලයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් අංක 60201 සඳහා වාර්ෂික ඇස්තමේන්තු යටතේ රු.2,000,000.00 ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, ඒ යටතේ රු.2,000,000.00 ක මුදලක් කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම් වශයෙන් ගෙවීමට හා ණය ශේෂ පියවීමට කටයුතු කර ඇත. එසේම වාර්ෂික ඇස්තමේන්තු යටතේ අවම බැර සීමාව රු.1,200,000.00 ක් වූ අතර තත්‍ය බැරකිරීම් ප්‍රමාණය රු.1,508,034.00 ක් විය.

කාර්ය සාධනය ළඟා කර ගැනීම සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් තම රාජකාරිය මැනවින් ඉටු කර ඇත. එමෙන්ම පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා කටයුතු නියාමනය කිරීමට අදාළ රාජ්‍ය සේවකයින්ගේ සියලුම කටයුතු මෙම ආයතනයට ලැබෙන පරිදි ඉටු කිරීම සිදු කර ඇත.

## අදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 602 | 1 | 4.5 | 449% |

# 04. පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව

## දැක්ම

"තෘප්තිමත් සමුපකාර කාර්යය මණ්ඩලයක්, උසස් මට්ටමේ සේවාවක්".

## මෙහෙවර

"සමුපකාර සේවකයින්ගේ ආයතනික ගැටළු හා සේව්‍ය සේවක ගැටුම් නිරාකරණය සහ ආයතනික ධාරිතාව වර්ධනය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යහපාලනය පවත්වා ගනිමින් තෘප්තිමත් කාර්යය මණ්ඩලයක් බිහිකොට සමුපකාර සේවාව උසස් මට්ටමකට ගෙන ඒමට අඛණ්ඩව දායක වීම".

## දිගුකාලීන අරමුණු

- ගුණාත්මක සමුපකාර සේවක ආයතනික ක්‍රියාවලියක්.
- යහපත් සේව්‍ය සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේව්‍ය සේවක සබඳතාවක්.
- ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක්.
- සංහිදියාවෙන් යුත් ආයතනයක්.

## කෙටිකාලීන අරමුණු

- සමුපකාර සේවක පත් කිරීම්, උසස් කිරීම්, සේවා ස්ථිරත්වය ලබා දීම.
- සමුපකාර සේවක පුහුණු පැවැත්වීම.
- සේවක අභියාචනා සලකා බැලීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

- නව චක්‍රලේඛ නිකුත් කිරීම හා නිකුත් කර ඇති චක්‍රලේඛ කාලීන අවශ්‍යතා අනුව සංශෝධනය
- ක්ෂේත්‍ර පරීක්ෂාව
- සමුපකාර සේවක කොමිෂන් සභාව, සමුපකාර සමිතිවල අධ්‍යක්ෂ මණ්ඩල සමග සාකච්ඡා කිරීම.
- අන්තර් පුද්ගල හා අන්තර් ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

- සමුපකාර සේවක පත්වීම්, ස්ථිර කිරීම්, උසස් වීම් ලබාදීම මගින් විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීම.
- සමුපකාර සේවක පුහුණු වැඩමුළුව පැවැත්වීම මගින් සේවකයින්ගේ දැනුම වර්ධනය වීම, සමිතිවල උසස් මට්ටමේ සේවාවක් පවත්වාගෙන යාමට හැකි වීම, මහජන සේවාවන් උසස් මට්ටමින් ලබා දීමට හැකි විම.
- සමුපකාර සේවක අභියාචනා පිළිබඳව නිවැරදි තීරණ ගැනීම, සමුපකාර සේවක අභිප්‍රේරණය වැඩි දියුණු වීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 08ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 07 කි. පුරප්පාඩු සංඛ්‍යාව 01 ක් වන අතර 01 ක් අයකු පුහුණුවේ.

## මූලධන වියදම - 2021

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| යන්ත්‍ර සූත්‍ර සවි කිරිම හා උපකරණ | 0.2 | 0.18 | 0.02 | 91 |
| **එකතුව** | **0.2** | **0.18** | **0.02** | **91** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන්මග

- සමුපකාර ක්ෂේත්‍රයේ සමුපකාර සේවකයින්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු කිරීම් සිදු කිරීම හා විනය ක්‍රියාමාර්ග සම්බන්ධව ඉදිරිපත් වන අභියාචනා සම්බන්ධයෙන් සාධාරණ විසඳුමක් ලබා දීම.
- ඒ තුළින් සමුපකාර ක්ෂේත්‍රය කෙරෙහි සමුපකාර සේවකයින් අභිප්‍රේරණය කිරීම හා ඔවුන් ක්ෂේත්‍රය තුළ රඳවා ගැනීමට කටයුතු කිරීම.
- ඉහත 1 හා 2 අනුව කටයුතු කර සමුපකාර සේවයේ සමුපකාර ව්‍යාපාර සංවර්ධනය සඳහා නැඹුරු කිරීම හා නියාමනය.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල ඉටුකළ කාර්යයන් | වර්ෂය තුල ලැබුණු ප්‍රමාණය | දර්ශකයට අදාලව ඉටු කළ ගණන | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස | | |
|---|---|---|---|---|---|---|
| | | | | 100%-90% | 75%-89% | 50%-74% |
| සේවකයින්ගේ දැනුම වර්ධනය | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 02 | 01 | | √ | |
| විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට හැකිවීම | පත්වීම්, උසස්වීම්, සේවය ස්ථිර කිරීම්, බඳවා ගැනීම්, අභියාචනා | 154 | 154 | √ | | |
| සේවකයින්ට සහන සැලසීම | වර්ෂය තුල ලැබුණු අභියාචනා සඳහා කටයුතු කිරීම | 05 | 05 | √ | | |

## අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ හැදින්වීමක්

සේවකයින්ගේ දැනුම වර්ධනය මගින් මනා ක්‍රියාකාරි බුද්ධිමත් මෙන්ම විධිමත් ආයතනික ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට හැකිවිය. තවද සේවකයින්ට සහන සැලසීම මගින් ප්‍රිය මනාප මෙන්ම, රැකියා ක්ෂේත්‍රය තුල රැකියාලාභින් රඳවා ගැනීමට හැකි වීම.

## හදුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | 2021 වන විට අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියාවක් නොමැති යෞවනයින්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම. | අධ්‍යාපන නොලබන, රැකියවක නියුක්ත නොවන නැතහොත් පුහුණුවක් නොලබන යෞවනයන්ගේ (වයස 15-24) ප්‍රමාණය. | | | | √ |
| | කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුලු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වූවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා ආරක්ෂාකාරි සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය | ස්ත්‍රී පුරුෂ භාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන් | | | | √ |

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • සමුපකාර සමිතිවල පුරප්පාඩු සම්පූර්ණ ඉතිරි සහ උතුරුමැද පළාත් සමුපකාර සේවකයින් සඳහා අනුමත තනතුරු 03-20-06 සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව නිළධාරින් හා සේවකයින් සමිති අභ්‍යයන්තරයෙන් හා බාහිරව බඳවා ගැනීමට කටයුතු කිරීම.<br>• උසස්වීම් ලැබීම. | • රාජ්‍ය සේවයේ වැටුප් හා සැසඳීමේදී සමුපකාර ක්ෂේත්‍රය තුල අඩුම වැටුප් පරිමාන ලබා දී සිටීම නිසා නිළධාරින් සේවකයින් ක්ෂේත්‍රය තුළ රඳවා ගැනීමේ අපහසුතාවය.<br>• සමිතිවලට බඳවාගෙන ඇති සේවකයින්ගේ පත්වීම් ස්ථිර කිරීම් ගැටළු<br>• පත්වීම් විධිමත් කිරීමට අවශ්‍ය තොරතුරු නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් නොවීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| • උසස් අධ්‍යාපන මට්ටමකින් යුතු සේවකයින්/ නිළධාරින් සමුපකාර ක්ෂේත්‍රයට බඳවා ගැනීම.<br>• ඉහල දැනුම් මට්ටමකින් යුත් නිළධාරි/ සේවක කණ්ඩායමකින් යුක්ත විම නිසා සමුපකාර ක්ෂේත්‍රයේ බැංකු හා ව්‍යාපාර කටයුතු පුළුල්වීම හා වැඩිදියුණු වීම.<br>• කෘෂි ව්‍යාපාර, ග්‍රාමීය ස්වයං රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම. | • සමිති අභ්‍යන්තරව සුදුසුකම් සහිත නිළධාරින් සේවකයින් සීමිත සංඛ්‍යාවක් සිටීම.<br>• බාහිරව බදවාගැනීමේදී සමුපකාර ක්ෂේත්‍රයේ වැටුප් තලයන් අවම අගයක් ගන්නා බැවින් අයදුම්කරුවන් ඉදිරිපත් වීමේ අවස්ථා සීමිත වීම.<br>• කොමිෂන් සභා තීරණ ක්‍රියාත්මක කිරීමට ඇතැම් සමිතිවල සභාපතිවරු මැලියාව දැක්වීම. |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදි සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

Covid 19 ගෝලීය වසංගතය හේතුවෙන් සමුපකාර සේවකයින් සඳහා පැවැත්වීමට නියමිතව තිබු පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් ලෙස සිදුකර ගැනීමට නොහැකි විය. එමෙන්ම සමුපකාර සේවක ගැටළු විසඳීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවල යෙදීමේ ගැටළු මතුවිය. ඊට පිළියම් ලෙස 2022 වර්ෂයේ පුහුණු වැඩසටහන් ප්‍රමාණවත් ලෙස පැවැත්වීමට සූදානම් කිරීම හා සමුපකාර සේවක ගැටළු වලට කඩිනමින් විසඳුම් ලබාදීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු පුළුල් කිරීමට සැලසුම් කර ඇත.

# 05.ප්‍රධාන ලේකම් කාර්යාලය

ප්‍රධාන ලේකම් කාර්යාලයේ සංයුතිය ආයතන 07කින් සමන්විත වේ.




## දැක්ම

"කාර්යක්ෂම, ඵලදායි හා ජනතාවාදී පළාත් රාජ්‍ය සේවයක්, සංවර්ධිත පළාතක්"

## මෙහෙවර

"පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන කටයුතු, මානව සම්පත්, මූල්‍ය, සැලසුම්, ඉංජිනේරු කටයුතු හා මධ්‍යම රජය ප්‍රමුඛ බාහිර පාර්ශව සමග සම්බන්ධීකරණය, විශේෂ සමාජ ආර්ථික වැඩසටහන්වලට පහසුකම් සැපයීම, ආපදා කළමනාකරණය සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම. "

## දිගුකාලීන අරමුණු

- මහජනතාව අමන්දානන්දනයට පත් කල හැකි කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා දීමේ හැකියාව ඇති ස්වයංඅභිප්‍රේරිත, දැනුම හා කුසලතාවයෙන් පෝෂිත පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය නිළධාරී හා සේවක මණ්ඩලයක් බිහි කිරීම
- වර්තමාන නෛතික හා පරිපාලන ව්‍යුහයට අනුගත වෙමින් අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල සංවර්ධන, සැලසුම් හා පරිපාලන යන ත්‍රිත්ව කාර්යයන්හී සම්බන්ධීකරණය හා නියාමන කටයුතු සඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකර දීම.
- පළාත තුල මූල්‍ය හා භෞතික සම්පත් කළමනාකරණය හා සංවර්ධන කාර්යයන් පිළිබද පළාතේ විධායකය හා ව්‍යවස්ථාදායකය විසින් ගනු ලබන තීරණ හා තීන්දු, ක්‍රමවත් සන්නිවේදනයක් හා සම්බන්ධීකරණයක් තුලින් විධිමත්ව ක්‍රියාත්මක කිරීම හා විනිවිදභාවයෙන් යුතු වැඩ නියාමන ක්‍රමවේදයක් ඇති කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ කාර්යය මණ්ඩලයේ කුසලතා හා ධාරිතා සංවර්ධනය.
- ❖ කාර්යක්ෂම හා සඵලදායි සේවයක් ලබාදීම සඳහා ආයතනික පරිසරය, පිරිසැකැස්ම හා කාර්යක්ෂම ක්‍රියාවලි පද්ධතියක් ඇති කිරීම.
- ❖ මහජනතාවට ඵලදායි දීර්ඝකාලීනව ප්‍රතිලාභ ලැබිය හැකි සමාජයීය හා ආර්ථික සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම, තක්සේරුකරණය සහ ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අධිකාරී යන ආයතන මගින් ඉටුකරන, විශේෂ සමාජ -ආර්ථික වැඩසටහන් හා ව්‍යාපෘති, ආපදා කළමනාකරණ වැඩසටහන්, රට හදන සෞභාග්‍යයේ දැක්ම යටතේ සිදුකරන සංවර්ධනය වැඩසටහන් ආදී කාර්යයන් නිසිපරිදි ඉටුවන බව අධීක්ෂණය හා නියාමනය කිරීම.
- පළාතේ විධායකය හා ව්‍යවස්ථාදායකය විසින් ගනු ලබන තීරණ හා තීන්දු සම්බන්ධව සියළුම අමාත්‍යාංශවලට දැන්වීම, සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම මෙන්ම අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනවල කාර්යයන් සම්බන්ධීකරණය කිරීම.
- මූල්‍ය හා භෞතික සම්පත් සංවර්ධනය සහ මානව සම්පත් කලමනාකරණය කිරීම, පුහුණු කිරීම හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ආයතනගත පරිපාලන කටයුතු සිදු කිරීම.
- පළාත් සභා මට්ටමින් බාහිරව ජනාධිපති ලේකම් කාර්යාලය, මහා භාණ්ඩාගාරය, මුදල් කොමිෂන් සභාව, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හා රේඛීය අමාත්‍යාංශ වලින් පළාත් සභා වෙත ලබාදෙනු ලබන උපදෙස් හා කාර්යයන් සම්බන්ධීකරණය.

## ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

- ♦ විශේෂ සමාජ, ආර්ථික වැඩසටහන් හා ව්‍යාපෘති, ආපදා කළමනාකරණ වැඩසටහන්, යහපාලන කටයුතු සංවර්ධනය, මත්ද්‍රව්‍ය නිවාරණය ආදී කාර්යයන් නිසි පරිදි ඉටුවන බව අධීක්ෂණය සඳහා විවිධ සාකච්ඡා, රැස්වීම් හා වැඩසටහන් පැවැත්වීම.
- ♦ විවිධ තීන්දු තිරණ අදාළ ආයතන වෙත දැනුම් දීම සඳහා විවිධ චක්‍රලේඛ නිකුත් කිරීම හා රැස්වීම් පැවැත්වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ගිවිසුම්ගත වීම් සිදු කිරීම.
- ♦ පළාත් රාජ්‍ය ආයතනවල නීතිමය ගැටළු සඳහා සහය ලබා දීම.
- ♦ පළාත තුළ පවත්වන ආගමික, සංස්කෘතික හා වෙනත් උත්සව පැවැත්වීම හා සංවිධානය සඳහා අවශ්‍ය පූර්ණ සහය ලබාදීම.
- ♦ මානව සම්පත් සංවර්ධනය උදෙසා දෙස්-විදෙස් පුහුණු අවස්ථා සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම, නිලධාරීන්ගේ වරප්‍රසාද හා සුභසාධක කටයුතු වෙනුවෙන් වන විධිමත් ඉල්ලීම් සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා දීම.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2020

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 85ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 60 කි. පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය % |
|---|---|---|---|---|
| 1.ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 185.6 | 40.83 | 144.76 | 22 |
| 2.යන්ත්‍ර සූත්‍ර සවිකිරීම් හා උපකරණ | 0.30 | - | 0.30 | 0 |
| 3. ප්‍රාග්ධන මාරු කිරීම් | 0.41 | 0.40 | 0.01 | 98 |
| 4.වෙනත් මූලධන වත්කම් පුනරාවර්ථන හා වැඩිදියුණු කිරීම් | 3.04 | 2.58 | 0.46 | 85 |
| **එකතුව** | 189.34 | 43.81 | 145.53 | 23 |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

- ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක් යන රජයේ ප්‍රතිපත්තියට අනුකූලව උතුරු මැද පළාත තුළ මානව සම්පත් සංවර්ධනය තුලින් දැනුමෙන් පරිපූර්ණ සමාජයක් බිහි කිරීම උදෙසා උතුරු මැද පළාත තුළ අධ්‍යාපනය, සෞඛ්‍ය නගා සිටුවීම උදෙසා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් යන රජයේ ප්‍රතිපත්තියට අනුකූලව උතුරු මැද පළාත තුළ කෘෂිකර්මාන්තය, සංචාරක කර්මාන්තය හා කුඩා හා මධ්‍යපරිමාණ කර්මාන්ත නගා සිටුවීම උදෙසා විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාවට නැංවීම.
- කොවිඩ් 19 ගෝලීය අර්බුදය හමුවේ උතුරු මැද පළාත තුළ රාජ්‍ය සේවකයින්ගේ මෙන්ම සියළු මහජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු ලඟාකරගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතනික සැළැස්ම | අදාළ අමුණ මුදුන් පමුණුවා ගැනීම උදෙසා ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතියේ නම |
|---|---|---|
| සියලු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම (තිරසාර අරමුණු අංක 01) | 2030 වන විට දරිද්‍රතාවයෙන් පෙලෙන්නන්ගේ සහ අවධානමට ලක් විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණ තත්වයන්ගෙන් ඇති වන්නා වූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇති වන්නා වූ හානී සහ ආපදා වලට නිරාවරණය වීම ද අඩු කිරීම. | • Local Development Support Project (LGSP)<br>• North and East Local Services Improvement Project (NELSIP)<br>• The Project for Formulating Cascade System Development Plan Under North Central Province |

තිරසර සංවර්ධන අරමුණු ලඟාකරගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය ඉතිරි කොටස.......

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනික සැළැස්ම | අදාළ අමුණ මුදුන් පමුණුවා ගැනීම උදෙසා ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතියේ නම |
|---|---|---|
| සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පොෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම (තිරසාර අරමුණු අංක 02) | • 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට පත් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා බව ගැනීමට හැකි බව තහවුරු කිරීම.<br>• 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශීය ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා , වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගෙවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මඟින් දෙගුණ කිරීම<br>• 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානි කර කාලගුණ තත්වයන්, නියග, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාරුමික භාවිතාවන් ක්‍රියාවට නැංවීම. | • Climate Smart Irrigated Agriculture Project (CSIAP)<br>• Agriculture Sector Modernization Project<br>• Climate Resilient Integrated Water Management Project (වැව් ගම් පුබුදුව)<br>• Mahaweli Water Security Investment Program<br>• Enhancing Biodiversity Conservation and Sustenance of Ecosystem Service in Environmentally Sensitive Areas |
| නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධන ප්‍රවර්ධණය කිරීම (තිරසාර අරමුණු අංක 03) | • 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදු වන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම<br>• 2030 වන විට රසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත්, අපිරිසිදු වීමත් නිසා ඇති වන මරණය සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම | • Local Development Support Project (LGSP)<br>• Second Health Sector Development Project |
| පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම (තිරසාර අරමුණු අංක 04) | • ළමුන්, ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම, වැඩිදියුණු කිරීම සහ සියලුම දෙනාට ආරක්ෂාකාරී, ප්‍රචණ්ඩත්වයෙන් තොර, සියලුදෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයෙන් තහවුරු කර දීම | • General Education Modernization (GEM) Project |

තිරසර සංවර්ධන අරමුණු ලඟාකරගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සහිත පළාත් දායකත්වය ඉතිරි කොටස.......

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනික සැළැස්ම | අදාළ අමුණ මුදුන් පමුණුවා ගැනීම උදෙසා ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතියේ නම |
|---|---|---|
| සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම (තිරසාර අරමුණු අංක 06) | • 2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම<br>• 2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, බානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදා හැරීම අඩු කිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිත කිරීම | • Local Government Enhancement Sector Project – PURA NEGUMA<br>• Rural Infrastructure Development Project in Emerging Regions (RIDEP) |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරිගැන්වීම (තිරසාර අරමුණු අංක 09) | • තාක්ෂණවේදී සහ තාක්ෂණික සහයෝගය ලබා දීම මඟින් ප්‍රදේශයට ඔරොත්තු දෙන ආකාරයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම | • Transport Connectivity and Asset Management Project / Provincial Road Development Project<br>• Rural Bridge Project |

## අංශය තුළින් ඉටුකර ගැනිමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 16

**තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයක් ඇති කිරිම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දිම සහ සැම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.**

16.6. සියළුම මට්ටම්වලදී ඵලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම.

16.7. සියළුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියළු දෙනා අන්තර්ගත වු සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම.

## අමාත්‍යංශය/ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු/ ඉලක්ක හා නිමවුම් දර්ශක

| තිරසර සංවර්ධන අරමුණු | තිරසර සංවර්ධන ඉලක්ක හා නිමවුම් දර්ශක |
|---|---|
| සුරක්ෂිත වැඩ පරිසරයක් තුළින් තෘප්තිමත් නිලධාරීන් හා සේවක මණ්ඩලයක් බිහි කිරීම උදෙසා උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ, රාජ්‍ය නිළධාරීන්ගේ සේවා හා සුභ සාධක අවශ්‍යතා සපුරාලීම ක්‍රමවත්ව සිදු වන බවට තහවුරු කිරීම. | (තිරසාර සංවර්ධන ඉලක්ක අංක 08)<br>දැනුමෙන් හා හැකියාවෙන් පරිපූර්ණ කාර්යක්ෂම රාජ්‍ය නිලධාරීන් පිරිසක් බිහිවීම |
| යුක්තිය හා සාධාරණය සඳහා වගවීමක් සහිතව මනා විනිවිදභාවයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම. | (තිරසාර සංවර්ධන ඉලක්ක අංක 16)<br>ක්‍රමානුකූල නීති රාමුවක් තුළ සේවා සැපයීමේ අවස්ථාව හිමි වීම<br>නව නීති සම්පාදනය කිරීම |
| යහපත් සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, ගුණාත්මක අධ්‍යාපනය සහ සුරක්ෂිත පරිසරයක් බිහි කිරීම උදෙසා කැපවූ ආයතන පද්ධතියක් ඇති කිරීම වෙනුවෙන් ක්‍රමවත් අධීක්ෂණය හා නියාමනය ක්‍රමවේදයක් ඇති බවට තහවුරු කිරීම. | (තිරසාර අරමුණු අංක 03, අංක 04, අංක 06, අංක 15 )<br>පළාත තුළ සෞඛ්‍යය, අධ්‍යාපනය හා පරිසර ආරක්ෂාව පිළිබඳ ධනාත්මක දර්ශකවල අගය ඉහළ යාම |

## අංශයේ සංවර්ධනය මැනීම සඳහා තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සලකා බලමින් ගොඩනගාගත් පළාත් නිමැවුම් දර්ශක හා ඉලක්ක

1. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා අප යටතේ ක්‍රියාත්මක වන ආයතන මෙහෙයවීම සහ එම ආයතනයන්හී කටයුතු අධික්ෂණය කිරීම.
2. ප්‍රධාන ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘති, තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා හඳුනාගත් ඉලක්කයන් හා දර්ශක ඔස්සේ මෙහෙයවීම සහ එම කටයුතු අධිකෂණය කිරීම.
3. තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා පළාත තුළ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති මෙහෙයවීම සඳහා හඳුනාගත් ඉලක්කයන් හා දර්ශක ලඟා කර ගැනීම සම්බන්ධයෙන් අධික්ෂණය කිරීම.

## තිරසාර අරමුණු අංක 01. සියලු තැන්හී පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| **1.5**<br>2030 වන විට දරිද්‍රතාවයෙන් පෙලෙන්නන්ගේ සහ අවධානමට ලක් විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණ තත්වයන්ගෙන් ඇති වන්නා වූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇති වන්නා වූ හානී සහ ආපදා වලට නිරාවරණය වීම ද අඩු කිරීම | 1.5.2. ලෝක දළ දේශිය නිෂ්පාදනයට සාපේක්ෂව ස්වාභාවික ආපදා හේතුවෙන් සිදු වන සෘජු ආර්ථික හානිය | 1. ඔවුන් වෙත ලබා දෙන ලද පහසුකම් පිළිබද සංඛ්‍යාත්මක තොරතුරු | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත විදේශාධාර ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. විදේශාධාර ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසාර අරමුණු අංක 02. සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම**

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| **2.1**<br>2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුළත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට පත් වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම. | 2.1.2. ආහාර අනාරක්ෂිතතා අත්විඳීම් දර්ශකය පදනම් කර ගනිමින් ජනගහනය තුළ මධ්‍යස්ථ හෝ තිව්‍ර ආහාර අනාරක්ෂිත භාවයේ ව්‍යාප්තිය | 1. ආහාර භෝග නිෂ්පාදන කිරීමේදී සහ ගබඩා කිරීමේදී යොදා ගන්නා ලද රසායනික ද්‍රව්‍ය ප්‍රමාණය<br>2. ආහාර නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගන්නා ලද රසකාරක ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත විදේශාධාර ව්‍යාපෘති ගණන<br>2. පළාතේ දේශීයව සහ ආවේණික ආහාර බෝග ව්‍යාප්තියේ වැඩිවීම සංඛ්‍යාත්මකව<br>3. දේශීය ආහාර ද්‍රව්‍ය පරිභෝජනය කරන පාරිභෝගිකයින් ගණන<br>4. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>5. මෙම ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| **2.3**<br>2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශීය ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මඟින් දෙගුණ කිරීම | 2.3.1.<br>ගොවි/ගව පාලන/ වනාන්තර ආශ්‍රිත කර්මාන්තය පන්තින්හී විශාලත්වය අනුව, ග්‍රාම ඒකකයක් සඳහා වන නිෂ්පාදන පරිමාව<br>2.3.2.<br>ස්ත්‍රීපුරුෂභාවය සහ ස්වදේශ මට්ටම් අනුව සුළු පරිමාණ ආහාර නිෂ්පාදකයන් ගේ සාමාන්‍ය ආදායම | 1. ඒකකයක් සඳහා වන නිෂ්පාදන පරිමාව<br>2. සුළු පරිමාණ ආහාර නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය වන සැපයුම් ප්‍රමාණය සහ සාමාන්‍ය ආදායම | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. කෘෂිකර්මික නිෂ්පාදන ඵලදායිතාවය සහ දේශීය නිෂ්පාදකයින් සඳහා වෙළඳපොළ විවෘත කිරීම් සහ ආදායම් ප්‍රමාණය<br>3. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>4. ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |
| **2.4**<br>2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවැතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම කහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නාවූ, කාලගුණ වෙනස්වීම්වලට හැඩගැසීම සහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානි කර කාලගුණ තත්වයන්, නියග, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම | 2.4.1<br>ඵලදායි සහ තිරසාර කෘෂිකර්මය සිදු කරන කෘෂිකාර්මික භූමි ප්‍රමාණය | 1. වගා කටයුතු සඳහා යොදා ගන්නා ලද භූමි ප්‍රමාණය<br>2. ලබා දෙන ලද භාණ්ඩ හා සේවා ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. ව්‍යාපෘති මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසාර අරමුණු අංක 03. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධන ප්‍රවර්ධනය කිරීම**

<table>
<tr><th rowspan="2">ඉලක්කය</th><th rowspan="2">දර්ශකය</th><th colspan="2">පළාත් දර්ශක</th></tr>
<tr><th>ප්‍රතිඵල දර්ශකය<br>(Outcome Indicator)</th><th>නිමැවුම් දර්ශකය<br>(Output Indicator)</th></tr>
<tr><td>3.4<br>2030 වන විට බෝ නොවන රෝග නිසා සිදු වන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම</td><td>3.5.1.<br>මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් හට ගන්නා ආබාධ තත්වය සඳහා ප්‍රතිකාරමය පහසුකම් (ඖෂධමය, මනෝ විද්‍යාත්මක, පුනරුත්ථාපනමය සහ රැකබලා ගැනීමේ සේවා) ව්‍යාප්තිය</td><td>1. දෛනිකව හඳුනා ගන්නා රෝගීන් ගනන<br>2. දෛනිකව මනෝ විද්‍යාත්මක උපදෙස් ලබා ගැනීම සඳහා පැමිණෙන ප්‍රමාණය<br>3. දෛනිකව පුනරුත්තාපනය සඳහා යොමු කරන ගණන<br>4. මාසිකව/ කාර්තු ලෙස සහ වාර්ෂිකව මධ්‍යසාර භාවිතා කරන පිරිසගේ විචලනය<br>5. මාසිකව/ කාර්තු ලෙස සහ වාර්ෂිකව මධ්‍යසාර භාවිතා කරන ප්‍රමාණය (ලීටර/ ග්රෑම් ලෙස)</td><td>4. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>5. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්රගති සමාලෝචන රැස්වීම ගණන<br>6. පවත්වනු ලබන සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් ප්‍රමාණය<br>7. පවත්වනු ලබන වෛද්‍ය සායන ප්‍රමාණය<br>8. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි</td></tr>
<tr><td>3.9<br>2030 වන විට රාසායනික, වාතය, ජලය සහ පස දූෂණය වීමත්, අපිරිසිදු වීමත් නිසා ඇති වන මරණය සහ රෝගී තත්වයන් සැලකිය යුතු මට්ටමින් අඩු කිරීම.</td><td>3.9.2 ආනාරක්ෂිත ජලය , අනාරක්ෂිත සනීපාරක්ෂක තත්වයන් සහ පවිත්‍රතාවය අවම වීම (සියළු සේවාවන් සඳහා අනාරක්ෂිත ජලය, සනීපාර්කෂණය සහ පවිත්‍රතාවයෙන් තොරවීම - Wash)</td><td>6. බෙදා දෙන ලද ජලපෙරණ ප්‍රමාණය<br>7. ඉදි කරන ලද වැසිකිළි ප්‍රමාණය<br>8. ඉදි කරන ලද ජල ටැංකි ප්‍රමාණය</td><td>1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. පවත්වනු ලබන වෛද්‍ය සායන ප්‍රමාණය<br>4. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි</td></tr>
</table>

**තිරසාර අරමුණු අංක 04. පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම**

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| **4.අ** ළමුන්, ආබාධිත පුද්ගලයින් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම, වැඩිදියුණු කිරීම සහ සියලුම දෙනාට ආරක්ෂාකාරී, ප්‍රචණ්ඩත්වයෙන් තොර, සියලුදෙනා අන්තර්ගතකරණය වූ සහ ඵලදායී ඉගෙනීම් වාතාවරණයෙන් තහවුරු කර දීම | 4.අ.1(අ). විදුලිය; (ආ) ඉගැන්වීම් පහසුකම් පිණිස අනුතර්ජාලය භාවිතය; (ඇ) ඉගැන්වීමේ පහසුකම් පිණිස පරිගණක භාවිතය, (ඈ) ආබාධ සහිත දරුවන් සඳහා විශේෂිත වූ යටිතල පහසුකම් සහ උපකරණ, (ඉ) මූලික පානීය ජල පහසුකම්, (ඊ) ස්ත්‍රී/ පුරුෂ භාවය අනුව වෙන් කරන ලද ස්වස්ථා පහසුකම්, (උ) මූලික අත්සේදීමේ පහසුකම් (WASH දර්ශකයේ නිර්වචන අනුව) යන ප්‍රවේශයන් සහිත පාසල් ප්‍රමාණය. | 1.ඉදි කරන ලද නව ගොඩනැගිලි ප්‍රමාණය<br><br>2.බෙදා දෙන ලද පරිගණක ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br><br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br><br>3. මෙම කටයුතු සඳහා පාසල් මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

**තිරසාර අරමුණු අංක 06. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම**

<table>
<tr><th rowspan="2">ඉලක්කය</th><th rowspan="2">දර්ශකය</th><th colspan="2">පළාත් දර්ශක</th></tr>
<tr><th>ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator)</th><th>නිමැවුම් දර්ශකය (Output Indicator)</th></tr>
<tr><td>6.1<br>2030 වන විට සියලුදෙනාට සමානාත්මතාවෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම.</td><td>6.1.1. සුරක්ෂිතව කළමනාකරණය කෙරෙන පානීය ජල සැපයුම් සේවා භාවිතය</td><td>1. ඉදි කරන ලද නව ජල පෙරන ප්‍රමාණය<br>2. ලබා දී ඇති ජල සැපයුම් ප්‍රමාණය</td><td>1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි</td></tr>
<tr><td>6.3<br>2030 වන විට ජල දූෂණය අඩු කරමින් ජලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, හානිකර විෂ රසායනික සහ වෙනත් ද්‍රව්‍ය බැහැර කිරීම සහ මුදා හැරීම තුරන් කිරීම, පිරිපහදු නොකරන ලද අපජලය මුදා හැරීම අඩු කිරීම සහ ජලය සැලකිය යුතු මට්ටමින් ප්‍රතිචක්‍රීකරණය සහ ආරක්ෂාකාරීව නැවත භාවිත කිරීම.</td><td>6.3.2. ගුණාත්මක භාවයෙන් යුක්ත ජලය සහිත ජලාශ ප්‍රමාණය</td><td>1. ප්‍රතිසංස්කරණය කරන ලද වැව් ප්‍රමාණය<br>2. ස්වාභාවික ජල උල්පත් මඟින් පානිය ජල සැපයුම් ලබා දීමේ ප්‍රමාණය.</td><td>1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි</td></tr>
</table>

**තිරසාර අරමුණු අංක 09. සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම**

| ඉලක්කය | දර්ශකය | පළාත් දර්ශක | |
|---|---|---|---|
| | | ප්‍රතිඵල දර්ශකය (Outcome Indicator) | නිමැවුම් දර්ශකය (Output Indicator) |
| 9.අ<br>අප්‍රිකානු රටවලට, අවම වශයෙන් සංවර්ධනය වූ රටවලට, අනෙකුත් රටවලින් වට වූ රටවලට සහ සංවර්ධණය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍ය වලට මූල්‍යමය, තාක්ෂණවේදී සහ තාක්ෂණික සහයෝගය ලබා දීම මඟින් සංවර්ධණය වෙමින් පවත්නා රටවලට ඔරෝත්තු දෙන ආකාරයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම | 9.අ.1. යටිතල පහසුකම් සඳහා වන සමස්ත නිළ ජාත්‍යන්තර සහාය (නිළ සංවර්ධන ආධාර සහ වෙනත් නිළ වශයෙන් ලැබෙන සැපයුම්) | 1. ඉදි කරන ලද පාළම් ප්‍රමාණය<br>2. ප්‍රතිසංස්කරණය කරන ලද මාර්ග ප්‍රමාණය<br>3. අලුතින් ඉදි කරන ලද මාර්ග ප්‍රමාණය<br>4. ඉදි කරන ලද ගොඩනැගිලි ප්‍රමාණය<br>5. ප්‍රතිසංස්කරණය කරන ලද ගොඩනැගිලි ප්‍රමාණය | 1. පළාතට අවශ්‍ය පරිදි ව්‍යාපෘති හදුනා ගැනීම සහ ගිවිසුම්ගත ව්‍යාපෘති ගණන<br>2. අවශ්‍ය අරමුණු ළඟා කර ගැනීමට හැකි වන පරිදි මෙම කටයුතු සිදු වන්නේද සොයා බැලීම සඳහා පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම ගණන<br>3. මෙම කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් බෙදී ගිය මුදල රු.මි |

## ප්‍රධාන ලේකම් කාර්යාලයේ දායකත්වය

ප්‍රධාන ලේකම් කාර්යාලය ආයතන අංශය, ගිණුම් අංශය, තොරතුරු තාක්ෂණික ඒකකය, නීති අංශය, භාෂා පරිවර්තක ඒකකය, මත්ද්‍රව්‍ය නිවාරණන ඒකකය යන අංශවලින් සමන්විත වේ.

## 01. කාර්යාලීය සේවා සැපයීම් ප්‍රගතිය

| අනු අංකය | සපයනු ලැබූ සේවාව / ඉටුකල කාර්යය | අගය |
|---|---|---|
| 01 | 2021 වසර තුලදී උතුරු මැද පලාත සඳහා අනුමත වූ නව තනතුරු සංඛ්‍යාව | නව තනතුරු අනුමත වී නොමැත |
| 02 | 2021 වසරේදී නිකුත් කළ අභ්‍යන්තර චක්‍ර ලේඛ සංඛ්‍යාව | ප්‍ර.ලේ/චක්‍රලේඛ - 2021/1 - උතුරු මැද පළාතේ රාජ්‍ය සේවකයින්ට එරෙහිව පවත්වන විනය කටයුතු සම්බන්ධයෙන් වන විධිවිධාන ක්‍රියාත්මක කිරීම |
| 03 | අනුග්‍රහ පදනම යටතේ 2021 වසර තුලදී අනුමත කරන ලද වාහන ආනයන බලපත්‍ර සංඛ්‍යාව | 58 |
| 04 | විදේශ නිවාඩු / ශිෂ්‍යත්ව සඳහා අනුමැතිය ලබාදීම යටතේ අනුමත කරන ලද විදේශ නිවාඩු (රාජකාරි ) ඉල්ලීම් සංඛ්‍යාව | 02 |
| 05 | විදේශ නිවාඩු ( පෞද්ගලික) සඳහා අනුමැතිය ලබාදීම යටතේ අනුමත කරන ලද විදේශ නිවාඩු (පෞද්ගලික ) ඉල්ලීම් සංඛ්‍යාව | 17 |

| අනු අංකය | සපයනු ලැබූ සේවාව / ඉටුකල කාර්යය | අගය |
|---|---|---|
| 06 | විදේශ නිවාඩු සංශෝධන සංඛ්‍යාව | 11 |
| 07 | 2021 වර්ශයේදී ප්‍රායෝගික පුහුණුව සඳහා අවස්ථාව ලබාදුන් සිසුන් සංඛ්‍යාව | 133 |
| 08 | 2021වර්ශයේදී උතුරු මැද පළාත් සභාව යටතේ පවතින අමාත්‍යාංශ, ආයතන හා දෙපාර්තමේන්තුවල ඉල්ලීම පරිදි ලබා දුන් සිංහල දෙමළ භාෂා පරිවර්ථන සේවාවවන් සංඛ්‍යාව | 15 |
| 09 | 2021 වර්ශයේදී උතුරු මැද පළාත් සභාව යටතේ පවතින අමාත්‍යාංශ, ආයතන හා දෙපාර්තමේන්තුවල ඉල්ලීම පරිදි ලබා දුන් සිංහල ඉංග්‍රීසි භාෂා පරිවර්ථන සේවාවවන් සංඛ්‍යාව | 12 |
| 10 | 2021 වර්ෂයේදී රාජකාරියේ යෙදී සිටියදී සිදුවූ අනතුරු සම්බන්ධ උතුරු මැද පළාත් වන්දි කමිටු තිරණය අනුව වන්දි ගෙවීම එකක් සිදු කරනු ලැබූ අතර ගෙවීම් කරන ලද වන්දි මුදල් වටිනාකම | රු. 624350 |
| 11 | තොරතුරු පනතට අදාළව පිලිතුරු යොමු කර ඇති තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 32 |

- පලාත් සභා සංකීර්ණයේ ස්ථාපනය කරන ලද සූර්ය බල පද්ධතියේ ක්‍රියාකාරීත්වය මත 2019 වර්ශයේදී දළ වශයෙන් ලක්ෂ 12-13 සීමාවේ තිබූ පළාත් සභා ගොඩනැගිල්ලේ විදුලි බිල්පත 2020 වර්ෂයේදී මාසිකව ලක්ෂ 6-7 සීමාව දක්වා අඩුකර ගැනීමට හැකිවූ අතර 2021 වර්ෂය තුළදී දළ මාසික විදුලි බිල්පත් අගය මාසිකව ලක්ෂ 6-4 සීමාව දක්වා තව දුරටත් අඩුකර ගැනීමට හැකියාව ලැබී ඇත.

- ජාත්‍යන්තර ආබාධ සහිත පුද්ගලයින්ගේ දිනය සැමරීමට නව අරුතක් එක් කරමින් මුලතිව්, මන්නාරම, නුවරඑළිය, අනුරාධපුර හා පුත්තලම දිස්ත්‍රික්කවල ආබාධ සහිත පුද්ගලයින්ගේ සංවිධාන 30ක සිංහල, දමිළ හා මුස්ලිම් ප්‍රජා නායකයින් 120 කගේ සහභාගීත්වයෙන් වර්තමානයේ ඔවුන් තනි තනිව හා සංවිධාන ලෙස මුහුණ දෙන සමාජ ආර්ථික ගැටලු පිලිබඳ කතිකාවතක් උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් ගරු චන්ද්‍රසිරි බන්ඩාර මැතිතුමන්ගේ ප්‍රදානත්වයෙන් 2021.12.17 දින අනුරාධපුරයේදී ආරම්භ කරන ලද අතර ගෝලීය කොවිඩ් ව්‍යසන තත්වය හමුවේ ඔවුන්ට අවැසි සෞඛ්‍ය ,අධ්‍යාපන,වෘත්තීය, ආර්ථීක හා සමාජීය සියලු සේවාවන් පෙරටත් වඩා අවහිර වී ඇති බවත් එකී සේවාවන් සපයන ආයතන එම සීමාවන් නැවත යථා තත්වයට පත් කිරීමට සුදුසු උපායමාර්ගික ක්‍රමවේදයන් හඳුන්වා සීම එහිදී සිදුකරන ලදි.

## 01. නීතිමය අංශය සවිබල ගැන්වීම සඳහා 2021 වසරේ සෘජු දායකත්වය

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ නීති ඒකකයක් පිහිටුවා ඇති අතර මෙම ඒකකය හරහා උතුරු මැද පළාත් සභාවට අයත් ආයතනයන්හී සියළුම නෛතික කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්වලදී නීති සහය ලබාදීම සිදු කරනු ලැබේ. 2021 වසරට අදාලව ලැයිස්තු ගත වු නඩු සංඛ්‍යාව 27ක් වු අතර 2021 වසරේ අවසන් වු නඩු සංඛ්‍යාව 08 කි.

## 2021 වර්ෂය තුළ සකස් කරන ලද ගිවිසුම්

| අ.අ | ගිවිසුම | ආයතනය |
|---|---|---|
| 01 | තොරතුරු හා දත්ත කළමණාකරණ පද්ධතිය | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 02 | බොරවැව උණු දිය උල්පත් සංවර්ධනය කිරීම | ප්‍රධාන අමාත්‍යංශය |
| 03 | නිල නිවාස | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| 04 | කැට පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය | පළාත් පාලන කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| 05 | ආරක්ෂක සේවා සැපයිම | ප්රධාන ලේකම් කාර්යාලය |
| 06 | සූර්යය බල විදුලි ජනක පැනල පද්ධති උතුරු මැද පළාත් සභාවේ ගොඩනැගිලිවල ස්ථාපිත කිරිම | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 07 | විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ගේ පෝෂණ තත්වය ඉහල නැංවීම | පළාත් කෘෂිකර්ම අමාත්‍යංශය |
| 08 | වැව්ගම් පුබුදුව යටතේ වන අවබෝධතා ගිවිසුම | ප්‍රධාන ලේකම් කාර්යාලය |

## 2021 වර්ෂය තුළ උපදෙස් හා නිරීක්ෂණ ලබා දීම

| අ/අ | කාරණය | ආයතනය |
|---|---|---|
| 1 | පළාත් සභාවට හිමි දඩ හා ගාස්තු අය කරනු ලබන N-100 රිසිට් පොත් පරික්ෂා කිරිම සඳහා අවසර ඉල්ලීම | පළාත් ආදායම් දෙපාර්තමේන්තුව |
| 2 | පළාත් සභා ලේකම් කාර්යාලයේ කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් අදාළ නීති උපදෙස් ලබා දිම | පළාත් සභා ලේකම් කාර්යාලය |
| 3 | නඩු අංක SC/FR/224/99 නඩුව සම්බන්ධව පත්විම් පෙරදාතම් කිරිම සම්බන්ධව | ආණ්ඩුකාර ලේකම් |
| 4 | 21586/M නඩුවේ වියදම් ප්‍රතිපූර්ණය කිරිම | ප්‍රධාන අමාත්‍යාංශය |
| 5 | මැදවච්චිය ආර්ථික මධ්‍යස්ථානය මැදවච්චිය ප්‍රාදේශීය සභාව වෙත පැවරීම | |
| 6 | සී/ස අනුරාධපුර සමූපකාර සමිතියේ වර්තමාන සභාපතිවරයාගේ තනතුරු දැරීමට එරෙහිව ඉදිරිපත් වී ඇති කරුණු විමර්ෂනය කිරීම සම්බන්ධව | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 7 | සාමාන්‍ය රාජකාරි කටයුතුවලට බාධා නොවන පරිදි කාර්යාල වේලාවෙන් බැහැරව කාර්යාලීය නොවන නීතිඥ වෘත්තිය හා සබැදි වෘත්තිමය කාර්යයන්හි නියැලීම සඳහා අනුමැතිය ලබා දීම | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 8 | ඇප රහිතව ණය ලබාගෙන සේවය හැර යෑම නිසා ණය ශේෂය නිරවුල් නොවීම- ජේ.ගුණරත්න මයා | සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 9 | ගිවිසුම් ගතවූ වැඩ කොටස් අතරමග නවතා දැමීමට ලක්වූ කොන්ත්‍රාත්තුවක් සම්බන්ධව නීතිමය පියවර ගැනීම | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 10 | ඉඩම් භුක්තිය අර්ථ ගන්වා ගැනීම | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| 11 | රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම යටතේ සේවය අත්හිටවූ නිළධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ නිරවුල් කර ගැනිම- එච්.එම්.සී.බී.හේරත් මයා | පළාත් කෘෂිකර්ම අමාතයංශය |
| 12 | රජයේ නිළ නිවාසයෙන් ඉවත්විම | ප්‍රධාන අමාත්‍යාංශය |
| 13 | අත්තිකාරම් වශයෙන් ලබා දුන් මුදල අය කර ගැනීම- පැරකුම් කන්ස්ට්‍රක්ෂන් | පළාත් කෘෂිකර්ම අමාතයංශය |
| 14 | අනවසර පෙර පාසැල් සම්බන්ධව | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| 15 | ඉඩම් ආරවුලක් සම්බන්ධව නීති උපදෙස් ලබා ගැනීම- අතරගල්ලෑව | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |

## තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය මගින් ඉටුකරන ලද කාර්යයන්

- උතුරු මැද පළාත් රාජ්‍ය අයතනයන්හි විශේෂයෙන් පළාත් සභා සංකිර්ණයේ පිහිටි ආයතනවල පරිගණක දත්ත ජාලා පද්ධතිය කළමනාකරණය හා නඩත්තු කටයුතු සිදු කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව Desktop පරිසණක 450 ක් සඳහා ජාලගත සම්බන්ධතා හා නඩත්තු සේවා සැපයීම.
- පළාත් සභා සංකිර්ණයේ පිහිටි ආයතනවල ජාලගත දුරකථන පද්ධතිය නඩත්තු සේවා සැපයීම සිදු කරනු ලබයි. ඒ අනුව සෘජු දුරකථන ජාල සම්බන්ධතා 48ක් හා අභ්‍යන්තර දුරකථන ජාල සම්බන්ධතා 600 ක් සඳහා ජාලගත සම්බන්ධතා හා නඩත්තු සේවා සැපයීම.

- පළාත් සභා සංකීර්ණයේ ස්ථාපිත ඇමතුම් පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික සහය සැපයීම.
- ඇඟිළි සළකුණු යන්ත්‍ර හා අදාළ පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම හා නඩත්තු සේවා සැපයීම. ( ඇඟිළි සළකුණු යන්ත්‍ර 22ක් පවතී)
- පළාත් සභා සංකීර්ණයේ ස්ථාපිත ආරක්ෂිත කැමරා පද්ධතිය ක්‍රමවත්ව පවත්වාගෙන යාම, නඩත්තු කිරීම හා අවශ්‍ය Backup ලබා ගැනීම.
- පළාත් ආයතනයන්හි (අමාත්‍යාංශ 05, දෙපාර්තමේන්තු 05 හා වෙනත් ආයතන 15ක වෙබ් අඩවි) ත්‍රෛභාෂිත වෙබ් අඩවි යාවත්කාලීන කිරීම්, වැඩි දියුණු කිරීම් හා ක්‍රමවත්ව පවත්වා ගැනීම සිදු කිරිමේ සේවා සැපයීම.




## මත්ද්‍රව්‍ය නිවාරණ අංශය මගින් ඉටුකරන ලද කාර්යයන්

2021 වර්ෂය තුළදී මත්ද්‍රව්‍ය භාවිතෙයන් නිදහස්විම හා නිදහස්ව පැවැත්ම සම්බන්ධ උපදේශණ සේවා සැපයූ ඒකල පවුල් සංඛ්‍යාව 1336 කි. පළාත තුළ කණ්ඩායම් උපදේශන දැනුවත් කිරීමේ වැඩමුළු 214 පවත්වා ඇති අතර පුද්ගලයන් 1420ක් එම වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. සිරකඳවුරු වල පවත්වන ලද උපදේශන වැඩමුළු සංඛ්‍යාව 44කි. මානසික සංවර්ධන හා උපදේශන සේවා වැඩමුළු 14 ක් පවත්වා ඇති අතර ZOOM තාක්ෂණය ඔස්සේ උපදේශන සේවා සැපයීම් 161 සිදු කර ඇත. ගෙයින් ගෙය දැනුවත් කිරිම මැයින් 2021 වර්ශය තුළදී මත්ද්‍රව්‍ය නිවාරණ ප්‍රතිකාර හා පුනරුත්තාපනය සම්බන්ධ වැඩසටහන් 12ක් පවත්වා ඇත. මත්ද්‍රව්‍ය නිවාරණ, ප්‍රතිකාර හා පුනරුත්තාපනය සම්බන්ධ උපදේශන සේවා සැපයීම පිළිබඳ සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් ද, සිරකඳවුරුවල සේවයේ නියුතු නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් ද, අධ්‍යයන පුහුණු වැඩසටහන් 01ක්ද, NAITA ආයතනය හා සම්බන්ධව පුහුණු වැඩසටහන් 31ක්ද 2021 වර්ශය තුළ දී පවත්වා ඇත.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස

2021 වර්ෂයේ ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් වාර්ෂික කාර්ය සාධනය ළඟාකර ගැනීම සඳහා සැලසුම්ගත ක්‍රියාවලියක නිරත විය. පැවති කොරෝනා 19 ගෝලීය අර්බුදය හමුවේ උතුරු මැද පළාතේ මහජන සෞඛ්‍ය ක්‍රමවත් පරිදි පවත්වා ගැනීමටත්, කොරෝනා රෝග ව්‍යාප්තිය අවම කර ගැනීමටත්, රෝගී ජනතාව හඳුනා ගැනීම සඳහා ක්‍රමවත් පරීක්ෂණ පහසුකම් ස්ථාපනය කිරීමටත් මෙන්ම ක්‍රමවත් නිරෝධායන නීති රීති පළාත තුල ක්‍රියාත්මක කිරිමටත් ප්‍රධාන ලේකම්තුමාගේ මග පෙන්වීම යටතේ භාරදූර රාජකාරී රාශියක් ඉටු කිරීමට හැකියාව ලැබිනි. තවද කොරෝනා මර්ධන එන්නත්කරණ වැඩසටහන ක්‍රමවත්ව, කාර්යක්ෂමව හා සක්‍රීයව පළාත තුළ ක්‍රියාත්මක කිරිමටද ප්‍රධාන ලේකම්තුමාගේ සෘජු මගපෙන්වීම ලබා දෙන ලදි.

තවද පවතින අර්බුද හමුවේ උවද පළාත තුළ මහජනතාවට සේවා සැපයෙන පළාත් රාජ්‍ය ආයතනික ක්‍රියාවලිය මනාව පවත්වා ගැනීම උදෙසා නිවැරදි හා ඉක්මන් තීන්දු තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීමටත්, පවත්නා අර්ථික අර්බුද හමුවේ පළාතේ සංවර්ධනය උදෙසා විවිධ විෂයන් සඳහා ගිවිසුම් සකස් කිරීම, උපදෙස් හා නිරීක්ෂණ ලබා දෙමින් මග පෙන්වීම, වැනි කාර්යයන් ඉටුකිරිමටක් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු කාර්යමණ්ඩලය යුහුසුළුව ක්‍රියාත්මක වන ලදි.

# 5.1.පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

1988.05.12 දින උතුරු මැද පළාත් සභාව ස්ථාපනය කිරීමත් සමඟම ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ඒකකයක් වශයෙන් මෙම ආයතනය ආරම්භ කරන ලදී. පසුව මෙම ආයතනය පළාත් සභා කැබිනට් තීරණයක් මඟින් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලදී. මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

## දැක්ම

"ඵලදායි පළාත් සංවර්ධන සැලසුම්කරණ ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්."

## මෙහෙවර

"පළාතේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ සැලසුම්කරණය , ප්‍රගති පාලනය හා ඇගයීම , අංගසම්පූර්ණ දත්ත පද්ධතිය , අධ්‍යයන හා පර්යේෂණ , විදේශ ව්‍යාපෘති අධීක්ෂණය , පළාතේ සංවර්ධන සැලසුම් අංශ මනාව මෙහෙයවීම, ප්‍රතිපත්ති, කාර්ය සාධනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් , විනිවිදභාවයෙන් හා සමතාවයෙන් ක්‍රියාවට නංවමින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අඛණ්ඩව දායකවීම"



## ප්‍රධාන කාර්යයන්

01. පළාත සඳහා දීර්ඝකාලීන හා මධ්‍යකාලීන සැලසුම් පිළියෙල කිරීම.
02. වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුමක් පිළියෙලකර එය ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය ඇගයීම අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම.
03. සංවර්ධන සැලසුම් සඳහා දත්ත රැස් කිරීම, පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම.
04. සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම.
05. පළාත් සංවර්ධන සැලැස්ම  පිළියෙල කිරීම, ප්‍රගතිය ඇගයීම හා ඉලක්කයන් කරා ළඟා වීම.
06. නව ව්‍යාපෘති හඳුනා ගැනීම, ඇගයීම හා තක්සේරුව.
07. විදේශාධාර හා ණය ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
08. ආංශික සැලසුම් හා ආයතනික සැලසුම් පිළියෙල කිරීම හා ඒ සඳහා ආයතනවලට සහාය වීම.
09. අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සැලසුම් ඒකක මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
10. ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් රැස්කර ගැනීම හා පළාත් සැලසුම් සඳහා අදාලකර ගැනීම.
11. රජයේ ආයතන සමඟ සැලසුම් කටයුතු සම්බන්ධීකරණය.
12. අනෙකුත් පළාත් සභාවල සැලසුම් දෙපාර්තමේන්තු සමඟ  කටයුතු කිරීම.
13. සැලසුම්වලට අදාල මුදල් කොමිෂම, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කටයුතු කිරීම.
14. ප්‍රධාන අමාත්‍යවරයාට, අමාත්‍යවරුන්ට හා ප්‍රධාන ලේකම්වරයාට සැලසුම්කරණයට සහය වීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

1. දිගුකාලීන,මධ්‍යකාලීන හා කෙටිකාලීන සංවර්ධන සැලසුම් සැකසීම.
2. වාර්ෂික ක්‍රියාකාරි සැලසුම සැකසීම, ක්‍රියාත්මක කිරිම හා ප්‍රගතිය මැනීම.
3. සංවර්ධන සැලසුම්කරණය සඳහා යාවත්කාලීන කරන ලද දත්ත භාවිතය.
4. නව ව්‍යාපෘති අවස්ථා හඳුනා ගැනිම හා ක්‍රියාත්මක කිරිම.
5. අන්තර් ආයතන සම්බන්ධීකරණය.
6. විදේශ ව්‍යාපෘති සම්බන්ධීකරණය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 55ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 44 කි. එසේම පුරප්පාඩු සංඛ්‍යාව 11 ක් වේ.

## මුලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරිම් | 0.20 | 0.195 | 0.005 | 98 |
| වාහන | 0.50 | - | 0.50 | 0 |
| ගෘහ භාණ්ඩ  හා කාර්යාල උපකරණ | 1.04 | 1.02 | 0.02 | 98 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.01 | - | 0.01 | 0 |
| දැනුම සංවර්ධනය හා ආයතනික සංවර්ධනය | 3.25 | 1.60 | 1.65 | 49 |
| **එකතුව** | **5.00** | **2.81** | **2.18** | **56** |

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය

| **ශක්තීන්** | **දුර්වලතා** |
| --- | --- |
| 1.දක්ෂ මෙන්ම කාර්යශූර කාර්ය මණ්ඩලයක් සිටීම.<br>2.ප්‍රමාණවත් පරිදි භෞතික සම්පත් පැවතීම.<br>3.ඉලක්ක කරා යෑම සඳහා සැලසුම් සහගත අංශ ස්ථාපිත කර තිබීම.<br>4.අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා සැලසුම් සේවයේ නිලධාරීන් සේවයේ යොදවා තිබීම.<br>5. නියෝජ්‍ය ප්‍රධාන ලේකම්/ අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සක්‍රීයව රාජකාරියේ යෙදී සිටීම.<br>6.ජාතික මට්ටමේ ශක්තිමත් ආයතන පද්ධතියක් පැවතීම. | 1.වරින් වර වෙනස් වන නීති පද්ධතිය.<br>2.සකස් කරන ලද සැලසුම් වලට අනුකූලව සංවර්ධන කටයුතු ගලාගෙන යාමට පවතින බාධාවන්.<br>3.ස්වයං අභිප්‍රේරණයකින් රාජකාරී කටයුතු සිදු කිරීම සඳහා නොපෙළඹීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| 1.අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා සැලසුම් සකස් කිරීමට පවතින අවශ්‍යතාවය.<br>2.එක් එක් අංශ සඳහා ආංශික සැලසුම් සඳහා පවතින අවශ්‍යතාවය හා ඉඩකඩ.<br>3.විදේශ ආධාර ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තා සැකසීමට පවතින ඉඩකඩ.<br>4.පළාතේ සංවර්ධනය සිදු කිරීම සඳහා පවතින විභවතාවය.<br>5. උපායමාර්ගික සැලසුම් සඳහා පවතින ඉල්ලීම්. | 1.ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන නොමැතිකම.<br>2.දේශපාලන අස්ථාවර බව හා ඉතා ඉක්මණින් වෙනස් වන ජාතික ප්‍රතිපත්තීන්.<br>3.අනවශ්‍ය දේශපාලන අතපෙවීම් හා බලපෑම්.<br>4.ආර්ථිකය මුහුණ දෙන අයහපත් බලපෑම.<br>5.රට තුළ පවතින අධික උද්ධමනය හේතුවෙන් නිලධාරීන් හා කාර්ය මණ්ඩලය පසුගාමී මට්ටමකට ඇද වැටීම.<br>6. අමාත්‍යාංශයන්හි විෂයපථයන් මාරු වීම. |

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු




පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙයවීමේ භාරදූර වගකීම ඉටු කරන ආයතනයක් ලෙස කටයුතු කරමින් 2030 වර්ෂය වනවිට ළඟාකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමට පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මෙහෙයවීම සිදු කරන ලදී. ඒ යටතේ පළාත් හා මධ්‍යම රජයේ රාජ්‍ය නිලධාරීන් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදු කරන ලදී. එපමණක් ද නොව පළාතේ සංවර්ධන සැලසුම් සකස් කිරිමේදි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කෙරෙහි අවධනය යොමු කරවිමටත්, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි පළාත් මට්ටමෙන් ජාතික මට්ටමට සැලකිය යුතු දායකත්වයක් ලබා දිමටත් හැකිවන පරිදි තිරසර සංවර්ධන ඉලක්ක කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කරවිමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි.

## 01. පළාත් සංවර්ධන සැලැස්ම සැකසීම හා මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචනය කිරීම.

2021 වර්ෂයේ උතුරු මැද පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා අදාල ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම ප්‍රමුඛ කාර්යය විය. මේ යටතේ විවිධ මට්ටම්වලදී කාර්තුමය හා මාසිකව සහ විශේෂයෙන් අත්‍යාවශ්‍ය අවස්ථාවන්හීදී විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් මගින් අදාල ව්‍යාපෘති ඉලක්ක කරා රැගෙන යාමට අවශ්‍ය පියවර ගන්නා ලදී. මේ අනුව පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද පසුවිපරම් ඇගයුම්, මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන කටයුතු සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට 2021 වසරේදීද කටයුතු කරන ලදී. ඒ අනුව 2021 වර්ෂයේදී පහත සඳහන් පරිදි සංවර්ධන වැඩසටහන විවිධ මට්ටම්වලදී ප්‍රගතිය සවිස්තරාත්මකව සමාලෝචනය කරන ලදී.

## පළාත් සංවර්ධන සැලසුම් මෙහෙයුම් සහ ප්‍රගති සමාලෝචන ක්‍රියාවලිය

පළාත් සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ක්‍රමානුකූල ක්‍රමවේදයක් තුළ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී. එහිදි ප්‍රධාන අවස්ථා කිහිපයකදී ප්‍රගතිය සමාලෝචනය කරමින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදි. ඒ අනුව පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් උතුරු මැද පළාත් අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු මට්ටමින් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කරන ලදී.

1. 2021 සංවර්ධන සැලැස්මට අදාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

   සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතනයන්හි 2021 වර්ෂයට ක්‍රියාත්මක ව්‍යාපෘතීන්හි භෞතික හා මුල්‍ය ප්‍රගතිය ඇතුලුව ප්‍රගතිය සාකච්ඡා කිරිමට මෙහිදී කටයුතු කරන ලදී.

2. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
   මෙහිදී දිස්ත්‍රික්කය ඇතුලත ක්‍රියාත්මක වන සංවර්ධන වැඩසටහන් හා මහජනතාව මුහුණ දෙන ගැටළු පිළිබඳව දේශපාලන අධිකාරිය සමඟ සාකච්ඡා කරන ලදී.

3. තිරසර ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම සඳහා දත්ත පරිඝනකගත කිරිමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

තිරසර ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්මට අදාලව සකස් කරන ලද “ගම” පොත සඳහා දත්ත ඇතුලත් කිරිමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අනියුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් හා කාර්යාල නිලධාරීන් පුහුණු කිරිම සිදු කරන ලදී.

4. සංවර්ධන නිලධාරින් සමග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම. මෙමගින් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනියුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන් වර්ෂයේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති පිළිබඳව මාසිකව ප්‍රගතිය සාකච්ඡා කිරිම සිදු කරන ලදී.

**01**
- 2021 සංවර්ධන සැලැස්මට අදාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රැස්වීම් 03ක් පැවැත්වීම (උතුරු මැද පළාත් අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු මට්ටමින්)

**02**
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.
- අනුරාධපුර 02, පොළොන්නරුව 02

**03**
- තිරසර ඒකාබද්ධ ප්‍රතිඵල පාදක සංවර්ධන සැලස්ම සඳහා දත්ත පරිඝනකගත කිරිමේ පුහුණු වැඩසටහන් 04 ක් පැවැත්විම.

**04**
- සංවර්ධන නිලධාරින් සමග සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචන රැස්විම් 02ක් පැවැත්විම.

## 02.පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් සියළුම සංවර්ධන අංශ ආවරණය වන පරිදි ඉදිරි වසර සඳහා පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරිම.

ඉදිරි වසරෙහි පළාතේ සංවර්ධන කටයුතු වෙනුවෙන් ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත ව්‍යාපෘති හඳුනා ගනිමින් එම ව්‍යාපෘති සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල පිළිබඳව ගණනය කිරීම හා එය මුදල් කොමිෂන් සභාවට ඉදිරිපත් කිරිම මෙහිදී සිදු කරන ලදි. මුදල් කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති ආකෘතිප්‍රකාරව උතුරු මැද පළාත් සභාවට අයත් සියළුම ආයතන වෙත යොමුකර නිලධාරීන් දැනුවත් කිරීම සිදු කරනු ලබන අතර සංවර්ධන යෝජනාවන්හී යෝග්‍යතාවය පිළිබඳ සාකච්ඡා සිදු කරනු ලබයි. මෙහිදී වඩාත් ඵලදායි යෝජනා ලබාගත් පසු උතුරු මැද පළාත වෙනුවෙන් ඉදිරි වසර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතාවය තක්සේරුකර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

## 03. වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරිම.

ඉදිරිපත් කරනු ලැබූ ප්‍රාග්ධන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ එක් එක් විෂයට අදාලව ලබා දිය හැකි ප්‍රතිපාදන ප්‍රමාණය මුදල් කොමිෂන් සභාව මගින් දැනුම් දීමෙන් පසු සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබයි. මුදල් කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති ආකෘති ප්‍රකාරව අදාල වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස්කර මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි. 2021 වර්ෂයේදී වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් වැඩමුළු 05ක් ද 2022 වර්ෂයේ සංවර්ධන සැලැස්ම හා ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම සම්බන්ධයෙන් වැඩමුළු 04 ක්ද පවත්වන ලදී. මෙම වැඩමුළු සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහභාගී විය.

## 04. උතුරු මැද පළාත් වාර්ෂික වාර්තාව සකස් කිරිම.




උතුරු මැද පළාත් සභාවට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන මගින් තම දැක්ම හා මෙහෙවර අනුව තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම සඳහා 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇතුළත් කරමින් උතුරු මැද පළාත් වාර්ෂික වාර්තාව සකස් කරන ලදී.

## 05. 2022 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා උපදෙස් සහිත චක්‍රලේඛය සැකසීම.

2022 වර්ෂයට අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී අනුගමනය කළ යුතු උපදෙස් ඇතුලත් කරමින් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව, පළාත් භාණ්ඩාගාරය හා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව එක් වී පළාත් සැලසුම් චක්‍රලේඛ අංක - 2021/01 චක්‍රලේඛය 2021.12.10 දින නිකුත් කරන ලදී.

## 06. පළාත් සංවර්ධනය උදෙසා තොරතුරු තාක්ෂණය භාවිතය.

### 6.1 වෙබ් අඩවි යාවත්කාලීන කිරීම.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ මානව හා භෞතික සම්පත් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව පළාතේ සමස්ත සංවර්ධනය සඳහා යොමු කිරීමේදී ලොව වේගවත්ම තාක්ෂණය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරමින් එය වඩාත් සාර්ථකව ඉටු කිරීමේ අවශ්‍යතාවය මත ස්ථාපනය කර ඇති උතුරු මැද පළාතේ තොරතුරු තාක්ෂණ ඒකකය මගින් 2021 වර්ෂය තුළදී පළාතේ පවතින රාජ්‍ය ආයතන සඳහා වන වෙබ් අඩවි යාවත්කාලීනව පවත්වාගෙන යාමට පියවර ගෙන ඇත.

උතුරු මැද පළාත් සැලසුම් ඒකකයේ පූර්ණ අධීක්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ ඒකකය මගින් යාවත්කාලීනව පවත්වාගෙන යන වෙබ් අඩවි 34 න් 28 ක් Joomla CMS (Content Management System) වෙනුවට WordPress CMS (Content Management System) හට මාරු කර වෙබ් අඩවි සියල්ලෙහි යාවත්කාලීන කිරීම් කටයුතු සිදු කරමින් ආයතන වල සිටින නව්‍යකරණ නිලධාරීන් හට වෙබ් අඩවි යාවත්කාලීන කිරීම පිළිබඳව දින 02 ක ප්‍රායෝගික පුහුණුවක් ලබා දී එම වෙබ් අඩවි සියල්ල යාවත්කාලීන කර ප්‍රකාශයට පත් කරන ලදි.

2021 වර්ෂය පුරාවට වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් හතරක් පවත්වා වෙබ් අඩවියේ ගුණාත්මක භාවය ඉහළ නංවන ලදි. මෙම පුහුණුව අතරතුර විවිධ දැනුම් මට්ටම්වල සිටින නිලධාරීන් සඳහා අවශ්‍ය පොටෝෂොප් හා ග්‍රැපික් ඩිසයින් දැනුමද ලබා දෙන ලදි. යාවත්කාලීන කරන ලද වෙබ් අඩවිවල මුහුණත පෙනුම හා දත්ත ඇතුලත් කිරීම හා බාගත කිරීමේ ක්‍රම වෙනස් මුහුණුවරකින් දැකිය හැකි විය. යාවත්කාලීන කරන ලද වෙබ් අඩවි වල මුල් පිටු කිහිපයක් පහත පරිදි වේ.









## 6.2.පද්ධති පරිපාලනය

උතුරු මැද පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුළ ඇති සියළුම පරිගණක හා උපාංගවල හා පරිගණක හරහා අන්තර්ජාල පද්ධතිය භාවිතා කිරීම පිළිබඳ දැනුවත් කිරීම හා ගැටළු නිරාකරණය කිරීමත් පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ ඇති අන්තර්ජාල පද්ධතිය හා දුරකථන පද්ධතිය සම්බන්ධ Server Room එක සහ Switching Rooms පහක ක්‍රියාකාරීත්වය රැකගැනීමත් සිදු කරන ලදි. පළාත් රාජ්‍ය සේවයේ නිලධාරින්ට බාධාවකින් තොරව තොරතුරු තාක්ෂණය භාවිතා කිරීම සඳහා අවශ්‍ය දැනුම හා සහාය ලබා දීම ඇතුළු පහත සඳහන් කාර්යයන් ඉටු කරමින් පළාත් තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යභාරය ඉටු කරමින් අදාල කාර්යසාධනය වෙත ළඟාවී ඇත.

### 6.2.1 පළාත් රාජ්‍ය සේවයේ සියළුම ආයතනවල පරිගණක ජාලගත කිරීම

පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුළ ජාලගත කරන ලද 450 කට අධික පරිගණකවල ක්‍රියාකාරිත්වය යාවත්කාලීනව පවත්වා ගැනීම.

- ➢ අභ්‍යන්තර ඇමතුම් ඇතුලු සියලුම දුරකථන ඇමතුම් පද්ධති යාවත්කාලීනව පවත්වා ගැනීම.
- ➢ ජාලගත කිරීම මඟින් පරිගණක සඳහා Share folder පහසුකම එක් එක් ආයතනය සඳහා වෙන වෙනම සපයා දී ඇත.
- ➢ එමෙන්ම අඩු පිරිවැයක් යටතේ වැඩි කාර්යක්ෂමතාවයකින් මුද්‍රණ පිටපත් ලබා ගැනීමට ගොඩනැගිල්ලේ සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සඳහා තෝරාගත් මුද්‍රණ පිටපත් යන්ත්‍ර 18ක් සැකසුම් වෙනස්කර ජාලගත කොට ඇත.

### 6.2.2. තොරතුරු තාක්ෂණය හා බැඳුණු උපකරණවල දෝෂ නිරාකරණය කිරීම.

උතුරු මැද පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ ජාල ගතකොට ඇති 450 කට අධික පරිගණක හා අභ්‍යන්තර ඇමතුම් දුරකථන පද්ධතිය මෙන්ම 70කට අධික බාහිර ඇමතුම් දුරකථන ජාලයේ දෝෂ පැන නැගුනහොත් එම පරිගණක හා දුරකථන පද්ධති සියල්ලේම නඩත්තු කටයුතු (දෘඩාංග හා ජාලගත ප්‍රශ්න) සියල්ලක්ම තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් නිරාකරණය කර දෙමින් පරිගණකය භාවිතා කරන්නාට සෑම අයුරකින්ම සහාය වේ. ඒ අනුව පසුගිය වර්ෂයේදී පහත සේවාවන් සපයන ලදී.

- පළාත් සභා පරිපාලන ගොඩනැගිලි සංකීර්ණයේ ඇති කාර්යාලවල පරිගණක සම්බන්ධයෙන් විටින් විට පැන නගින පරිගණක දෘඩාංග හා මෘදුකාංග දෝෂ නිරාකරණය කරන ලදී.
- සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සතු මුද්‍රන යන්ත්‍ර ජාලගත කිරිම හා එහි දෝෂ නිරාකරණය කිරීම.
- පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ලේ කාර්යාලවල පරිගණකවල විටින් විට ජාලගත අවහිරතා ඇතිවන අතර එම අවහිරතා ඉවත් කරමින් දෝෂ නිරාකරණය කරන ලදි.
- පරිගණක භාවිතාකරන්නන්ට අවශ්‍ය මෘදුකාංග පරිගණකයට සපයා දෙමින් ඔවුන්ට සහය වීම. (Ms office, Internet Browsers, Photoshop, etc..)
- පරිගණක මෙහෙයුම් පද්ධති ගැටළු පැන නගින විට අළුතින් මෙහෙයුම් පද්ධතිය ස්ථාපිත කර දීම සහ ඒ හා සම්බන්ධ දෝෂ නිරාකරණය.

### 6.2.3. CCTV කැමරා පද්ධතිය සම්බන්ධ දෝෂ නිරාකරණය කරමින් යාවත්කාලීනව පවත්වාගෙන යාම.

පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුළ පැය 24 පුරාම ක්‍රියාකාරිත්වයෙන් යුත් කැමරා 16 ක් පවතින අතර ගොඩනැගිල්ලේ සෑම පිවිසුමකටම හා ගොඩනැගිල්ලේ ආයතන පවතින ස්ථාන එමගින් ආවරණය වී ඇති එම කැමරා 16 හිම පිරිසිදුතාවය රැකගත යුතු අතර මෙම ඒකකය මගින් එම කාර්යන් නිසියාකාරව සිදු කරන ලදි.

- ✓ අවස්ථා කිහිපයකදී භාණ්ඩ අස්ථානගත වීම් හා අනෙකුත් ක්‍රියාකාරකම්වලට අදාල වීඩියෝ අවශ්‍ය පාර්ශව වෙත ලබා දී සහය වීම.

### 6.2.4. ඇඟිලි සලකුණු යන්ත්‍ර මනා ක්‍රියාකාරිත්වයෙන් පවත්වා ගැනීම හා මාස් පතා ඇඟිලි සලකුණු වාර්තා ලබාදීම.

ඇඟිළි සලකුණු කරන නිලධාරීන්ගේ ඇඟිලි සටහන් නොවීමේ දෝෂය පැන නැගුණු අවස්ථාවල එම දෝෂ නිරාකරණය කිරීම සිදු කරන ලදී.

- පළාත් සභා පරිපාලන ගොඩනැගිල්ල තුල ඇඟිලි සලකුණු යන්ත්‍ර 22 ක් පවතින අතර එම යන්ත්‍ර 22 ම එක් එක් ආයතන සඳහා වෙන්කර ඇත.
- එම යන්ත්‍රවල ක්‍රියාකාරිත්වය මනාව පවත්වාගෙන යන අතර යම් දෝෂයක් පැන නැගුනහොත් එය සොයා බලා නිරාකරණය කරනු ලබයි.
- සෑම මසකම පළමුවන දින පසුගිය මාසයේ ඇඟිලි සලකුණු වාර්තාව එක් එක් ආයතන සඳහා වෙන වෙනම ලබාදීම සිදු කිරීම.
- ස්ථාන මාරුවී / නව පත්වීම් ලබා පැමිණෙන නිලධාරීන්ගේ ඇඟිළි සලකුණු ලබාගෙන එම ආයතනවලින් ස්ථාන මාරු යන/ විශ්‍රාම යන/ ඉවත් වන නිලධාරීන්ගේ ඇඟිලි සලකුණු ඉවත් කර මෘදුකාංගය යාවත්කාලීනව පවත්වා ගැනීම.

### 6.2.5. පරිපාලන ගොඩනැගිල්ල අභ්‍යන්තරය පමණක් අවරණය වන පරිදි ස්ථාපිත පොදු අභ්‍යන්තර ඇමතුම් පද්ධතිය ( Public Address System) සම්බන්ධ කටයුතු.

- ❖ පරිපාලන ගොඩනැගිල්ලේ සියලු කාර්යාා මණ්ඩලය සඳහා නිවේදන ලබා දීමට එම පද්ධතිය මෙහෙයවා ඇත.
- ❖ එම පද්ධතිය සම්බන්ධව පැන නගින සෑම දෝෂයක්ම නිරාකරණය කර දෙමින් නිවැරදි තොරතුරු ශ්‍රවණයට සහය වීම.

## 6.3. මෘදුකාංග පද්ධති නිර්මාණය කිරීම හා යාවත්කාලීනව පවත්වාගෙන යාම

මේ වනවිට උතුරු මැද පළාතේ රාජ්‍ය ආයතනවල දත්ත ගබඩා පවත්වාගෙන යාම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී සංවර්ධන සැලසුම් සඳහා තීරණ ගැනීම සඳහා හා තොරතුරු දැන ගැනීම සඳහා අවශ්‍ය වන අත්‍යාවශ්‍ය දත්ත පවත්වාගෙන යාම සඳහා මෘදුකාංග පද්ධති හයක් නිර්මාණය කර යාවත්කාලීනව පවත්වාගෙනයයි.

01. පළාත් පුහුණු ඒකකය සඳහා Training Management System

පළාත් පුහුණු ඒකකය මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් වලට අදාලව පුහුණුවලට කැඳවීම, සහභාගි වන සංඛ්‍යාව, පුහුණු තොරතුරු හා වැඩසටහන් දැනුවත් කිරීම් පිළිබඳ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියකි.

02. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සඳහා Revenue Management System

පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මඟින් එකතු කරන බදු ආදායම් සහ ආදායම් පද්ධතිය හරහා සිදුකිරීමට මෙම දත්ත පද්ධතිය උපයෝගී කර ගනී.

03. පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා Examination Results Release Information System

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් සිදු කරන සියළු විභාග අයදුම් කිරිමේ සිට විභාග පැවැත්වීම, විභාග ප්‍රතිඵල නිකුත් කිරිම, තෝරා ගැනීම හා පත්වීම් ලබා දීම දක්වා තොරතුරු මෙම දත්ත පද්ධතියෙහි ඇතුලත්ව ඇත.

04. පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා Development Plan Monitoring System

පළාත් සභාවට වෙන් කරන සියළුම ව්‍යාපෘති වල භෞතික මුල්‍ය ප්‍රගතිය (Physical Financial Progress) ඇතුළු සියළුම වාර්තාවන් මේ හරහා සිදු කෙරේ.

05. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා Agriculture Plan Monitoring System

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවි සංවිධාන තොරතුරු ලියාපදිංචි කිරිම, කෘෂිකර්ම උපදේශනයට අදාළ තුලාන් වල ක්‍රියාත්මක වන ව්‍යාපෘති වල කාර්යසාධනය මෙම දත්ත පද්ධතිය තුල ඇතුලත්ව ඇත.

06. ප්‍රධාන ලේකම් කාර්යාලය සඳහා Carder information Management System

පළාත් සභාව තුළ පවතින සියළුම ආයතන වල අනුමත කාර්යය මණ්ඩල හා සේවයේ නියුතු කාර්යය මණ්ඩලය ප්‍රධාන ලේකම් කාර්යාලය තුළින් විශ්ලේෂණය කිරිම සඳහා මෙම දත්ත පද්ධතිය භාවිතයට ගැනේ.

## 7. පළාත් සංවර්ධනය උදෙසා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) හා සංඛ්‍යාලේඛන ඒකකයේ දායකත්වය.

උතුරු මැද පළාත අනුරාධපුරය සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක දෙකින් සමන්විත වේ. කෘෂිකාර්මික ආර්ථිකය ප්‍රධාන ආදායම් මාර්ගය වන මෙම පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක් මහ නගර සභා දෙකක් ඇතුළු පළාත් පාලන ආයතන 27 ක් ඇත. එමෙන්ම ග්‍රාම නිලධාරී තුලාන 988 ක් ඇත. පළාතේ වර්තමාන ජනගහනය 1,366,000 ක් වන අතර ජනගහන ඝනත්වය 282 ක් පමණ වේ. පළාතේ පාසල් 817 ක් ඇත. එමෙන්ම වැව්, වන ගහනය, මාර්ග පද්ධතිය, ආදායම් බල ප්‍රදේශ, රෝහල්, ආයුර්වේද මධ්‍යස්ථාන, සංචාරක ආකර්ශණ ස්ථාන, ආගමික සිද්ධස්ථාන, ඓතිහාසික ස්ථාන ඇතුළු බොහෝ දෑ පිළිබඳ භූගෝලීය තොරතුරු සිතියම්ගත කිරීම සියළු සංවර්ධන කටයුතු කෙරෙහි මහත් සේ ප්‍රයෝජනවත් වේ.

මෙම සියළු කරුණු පිළිබඳ පැහැදිළිව හඳුනා ගැනීම සඳහා සිතියම් ලබා දීමට භූගෝලීය තොරතුරු පද්ධතිය භාවිතයෙන් හැකි විය. GIS සමඟ අප බැඳී සිටිමින් මහජනතාවට හිතකර පරිසරයක් ඇති කිරීම හා අපගේ පළාත සඳහා තිරසාර සංවර්ධනයක් ඇති කිරීම සඳහා අදාළ කළමණාකරණ තීරණ ගැනීම සඳහා විශ්වාසනීය සහ යාවත්කාලීන දත්ත සහ තොරතුරු ලබා ගැනීම සඳහා කළමනාකරුවන්ට ප්‍රයෝජනවත් වන දත්ත හා තොරතුරු ලබා දීම සිදු කරන ලදි. අදහස් අර්ථ නිරූපණය කිරීම සඳහා සිතියම් වඩා නිවැරදිව භාවිත කිරීම මෙහිදී සිදු කරන ලදි.

භූගෝලීය තොතුරු පද්ධතිය සකස් කිරීම සඳහා 2021 වර්ෂයේදී සකස් කරන ලද සිතියම් සහ පළාත් රාජ්‍ය සේවයේ ආනෙකුත් නිලධාරීන් සඳහා ලබා දුන් පුහුණු අවස්ථාවන් සම්බන්ධව කරුණු පහත පරිදි දැක්විය හැකිය.

## 7.1. භූගෝලිය තොරතුරු පද්ධතිය මගින් සකස් කරන ලද සිතියම්

**සකස් කරන ලද සිතියම් පිළිබඳ විස්තරය**

උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ පාලනය වන මාර්ග පද්ධතිය සිතියම් ගත කිරීම.

| ප්‍රාදේශිකය | මාර්ග ගණන | දිග (කි.මී.) |
|---|---|---|
| අනුරාධපුර | 63 | 370.52 |
| මරදන්කඩවල | 44 | 374.95 |
| නොච්චියාගම | 39 | 319.48 |
| මින්නේරිය | 24 | 153.45 |
| මනම්පිටිය | 41 | 238.18 |
| සේවාගම | 25 | 117.50 |
| හොරොව්පොතාන | 41 | 373.24 |

මාර්ග සිතියම හොරොව්පොතාන ප්‍රාදේශිකය




උතුරු මැද පළාතේ ක්‍රියාත්මක පානිය ජල ව්‍යාපෘති සිතියම සකස් කිරිම.




උතුරු මැද පළාතේ විදේශාධාර ව්‍යාපෘති ක්‍රියාත්මක ප්‍රදේශවල සිතියම් සකස් කිරිම.



| | |
|---|---|
| උතුරු මැද පළාතේ පාසල් සිතියම සකස් කිරීම. |  |
| උතුරු මැද පළාත් දිගුකාලීන සංවර්ධන සැලැස්ම සඳහා මාතෘකා 14ක් යටතේ සිතියම් සකස් කිරීම.<br>1. කෘෂිකර්ම සංවර්ධනය<br>2. සත්ව පාලනය<br>3. ඉඩම් පරිහරණය<br>4. දේශීය ආහාර නිෂ්පාදනය හා අලෙවිය<br>5. සෞඛ්‍ය සංවර්ධනය<br>6. අධ්‍යාපන පද්ධතියේ සංවර්ධනය<br>7. මාර්ග සහ ප්‍රවාහන පහසුකම් සංවර්ධනය<br>8. ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය<br>9. අපද්‍රව්‍ය කළමනාකරණය<br>10. වාරි ජල කළමනාකරණය<br>11. පාරිසරික තුළිතතාවය<br>12. ව්‍යවසාය සංවර්ධනය<br>13. සංචාරක කර්මාන්ත සංවර්ධනය<br>14. ආගමික සහජීවනය සහ යහපත් ජීවන රටාව |  |

**භූගෝලීය තොරතුරු පද්ධති අංශය මගින් සිදු කරන ලද වෙනත් සේවාවන්**

- පළාත් පාලන ආයතන සතු හා එම ආයතන මගින් නඩත්තු කරනු ලබන මාර්ග සිතියම සකස් කිරිම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා GIS පුහුණුව ලබා දීම.
- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අභ්‍යාසලාභී උපාධිධාරින් සඳහා GIS පුහුණුව ලබා දීම.

## 7.2. සංඛ්‍යාලේඛන අංශය

මෙම ඒකකය මගින් පළාතේ සියළු සංඛ්‍යාලේඛන තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාම තුළින් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු නිවැරදිව සහ කඩිනම්ව ලබා ගැනීමට අවස්ථාව සලසා දී ඇත.

- උතුරු මැද පළාත් දස අවුරුදු සංවර්ධන සැලැස්මට අදාල සංඛ්‍යාලේඛන තොරතුරු ලබා දීම.
- උතුරු මැද පළාත් 2020 වර්ෂයට අදාලව සංඛ්‍යාලේඛන අත්පොත සකස් කිරීම.

උතුරු මැද පළාතේ ජනගහනය පිළිබඳ තොරතුරු, කෘෂිකර්ම සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ තොරතුරු, අධ්‍යාපනය පිළිබඳ තොරතුරු, රෝහල් පිළිබඳ තොරතුරු, සමාජ සේවා පිළිබඳ තොරතුරු, කර්මාන්ත වෙළඳ හා සේවා පිළිබඳ තොරතුරු, ඉඩම් භාවිතය පිළිබඳ තොරතුරු, දේශගුණය පිළිබඳ තොරතුරු, ප්‍රවාහන හා සංනිවේදනය පිළිබඳ තොරතුරු, සමාජ ආර්ථික දත්ත පිළිබඳ තොරතුරු හා ශ්‍රම බලය හා සේවා නියුක්තිය යන සංරචකයන් පිළිබඳව සංඛ්‍යාත්මක තොරතුරු මෙහි ඇතුලත් කර ඇත.

**සංඛ්‍යාලේඛන අංශය මගින් පවත්වාගෙන යන තොරතුරු පද්ධති**

**01.** උතුරුමැද පළාත් කර්මාන්ත තොරතුරු පද්ධතිය

උතුරු මැද පළාත තුළ සිටින සුළු, මධ්‍ය හා මහා පරිමාණ කර්මාන්ත පිළිබඳ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියකි. මෙහි නිෂ්පාදන කර්මාන්ත, මාසික නිෂ්පාදන ප්‍රමාණයන් හා දේශීය විදේශීය වෙළඳපල සඳහා සිදු කරන සැපයීම ආදී තොරතුරු රැසක් අන්තර්ගත වේ.

**02.** උතුරුමැද පළාත් සංවර්ධන නිලධාරි තොරතුරු පද්ධතිය

උතුරුමැද පළාතේ සියළුම ආයතන වල සේවය කරන සංවර්න නිලධාරීන් පිළිබඳ වූ දත්ත පද්ධතියකි. මෙම පද්ධතිය තුල සේවයේ නියුතු ආයතනය, සේවා කාලය, ලබා ගෙන ඇති පුහුණු හා නිලධාරියාව පහසුවෙන් සම්බන්ධ කර ගැනීමට වූ සන්නිවේදන මාර්ගයන් පිළිබඳ තොරතුරු ඇතුලත්ව ඇත.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%- 90% | 75%-89% | 50%- 74% |
| අනුමත කරන ලද වාර්ෂික සංවර්ධන සැලැස්ම | 100% | | |
| පවත්වන ලද අමාත්‍යාංශ මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | | | 50% |
| සකස් කරන ලද කාර්යසාධන වාර්තාව | 100% | | |
| සකස් කරන ලද වාර්ෂික ප්‍රගති වාර්තාව | 100% | | |
| සකස් කරන ලද වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශනය | 100% | | |
| සකස් කරන ලද සිතියම් ගණන (**GIS** භාවිතයෙන්) | | | |
| **I.** මාර්ගත සිතියම් | 100% | | |
| **II.** භූමි පරිහරණ සිතියම් | 100% | | |
| **III.** ප්‍රකාශයට පත් කරන ලද වාර්තා ගණන | 100% | | |
| වෙබ් අඩවි නවීකරණය (**Modifacation**) | 100% | | |

## අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැදින්වීමක්.

2021 වර්ෂයේ පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නව කාර්යසාධන අත්පත් කර ගනිමින් පහත ආකාරයේ සාර්ථකත්වයන් ලඟාකරගෙන ඇත.

- වාර්ෂිකව සකසනු ලබන වාර්ෂක පළාත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, වාර්ෂක වාර්තාව සකස් කිරීම, වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කිරීම හා ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීම අදාල කාලයට අනුරූපව සම්පූර්ණ කරන ලදි. එම කාර්යය සියල්ල ප්‍රගතිය 100%කි.
- පළාත් සැලසුම් දෙපාර්තමේන්තුවේ භූගෝලිය තාක්ෂණ ඒකකය මගින් 2021 වර්ෂයෙහි සැලසුම් කරන ලද කාර්යය වන පළාත් මාර්ග සිතියම් ගත කිරීම සම්පූර්ණයෙන් අවසන් කරන ලද අතර, 2021 වර්ෂය තුල සැලසුම් කරන ලද භූමි පරිමාණ සිතියම් 05ක් නිර්මාණය කර අවසන් කරන ලදි. 2021 වර්ෂය තුල සංඛ්‍යා ලේඛණ අංශය මඟින් ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කරන ලද සංඛ්‍ය ලේඛන අත්පොත සකස් කරන ලදි.
- පළාත් වෙබ් අඩවිය යාවත්කාලින කිරීම සම්බන්ධයෙන් වන කටයුතු නිසි කාලයට අනුව සිදුකර ඇති අතර එහි ප්‍රගතිය 100%කි.
- මෙහෙයුම් කරන කටයුතුවල ප්‍රධාන කටයුත්ත වන අමාත්‍යාංශය මට්ටමේ ප්‍රගති සමාලෝචන රැස්විම පැවැත්විමට පැවති වසංගත තත්ත්වය මත සම්පූර්ණ කිරිමට නොහැකි වූ අතර එහි ප්‍රගතිය 50%කි. සැලසුම් කරන ලද රුස්වීම් ගණන 12 ක් වූ නමුත් පවත්වන ලද්දේ 05 කි.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| **17.** ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය. | 17.3.2.1. විදේශීය ආයෝජන ව්‍යාපෘති ප්‍රාදේශීය වශයෙන් ගලා යාම පිළිබඳව ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන.<br>17.3.2.2 පළාත තුළ ක්‍රියාත්මක වන විදේශීය ආයෝජන ව්‍යාපෘති ගණන.<br>17.3.2.3 විදේශීය ආයෝජන ව්‍යාපෘති මගින් ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමට ගලා ගිය මුදල රු.මි. | ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම<br>විදේශීය ආයෝජන ව්‍යාපෘති මෙහෙයවීම | | | 100<br>100 |
| | 17.8.1.1පළාත් වෙබ් අඩවිය යාවත්කාලීන කරන වාර ගණන<br>17.8.1.2. භූගෝලීය තොරතුරු තාක්ෂණය (GIS) භාවිතයෙන් සකස් කරන ලද සිතියම් ප්‍රමාණය<br>17.8.1.4.සංවර්ධන සැලසුම්කරණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) භාවිතය පිළිබඳව පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරන ලද වාර ගණන | පළාත් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>භූගෝලීය තොරතුරු තාක්ෂණය (GIS) භාවිතයෙන් සකස් කරන ලද සිතියම් සැකසීම | | 50 | 100 |
| | 17.14.1.1. තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව හඳුන්වා දීමේ වැඩසටහන්.<br>17.14.1.2. පළාත් මට්ටමින් සකස් කරන ලද තිරසර සංවර්ධන ඉලක්ක.<br>17.14.1.3. තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කරා ළඟාවීම පිළිබඳ විමර්ශනය කරන ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | පළාතට ගැලපෙන ඉලක්ක සැකසීම<br>ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම | 0 | 60 | |
| | 17.16.1.1. තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කරා ළඟාවීම පිළිබඳ ප්‍රගති වාර්තා ගණන. | ප්‍රගති වාර්ථා සකස් කිරීම | | | |
| | 17.18.1.2. තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක කරගත් දිගු කාලීන සැලැස්ම (2020-2030) | දිගු කාලීන සැලැස්මක් සකස් කිරීම | | | 90 |
| | 17.19.1.1. තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක කරා ළඟාවීම මැනීම. සඳහා සකස් කරන ලද අංග සම්පූර්ණ දත්ත පද්ධතිය (Decision Support System) | දත්ත පද්ධතියක් සකස් කිරීම | | | 100 |

## තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ලත් ජයග්‍රහණ හා එම ජයග්‍රහණ ලබා ගැනීමට ආයතනය සතු වූ ශක්තීන්, අවස්ථා, අභියෝග, දුර්වලතා හා තර්ජන

පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව සෘජුවම අදාලවන තිරසර් සංවර්ධන අරමුණු පැහැදිලිව හඳුනා ගැනීම අපහසු උවත් අංක 17 යටතේ ඇති ඉලක්කයන් සඳහා අදාල ක්‍රියාකාරකම් හඳුනාගැනීමට හැකිවිය. කොවිඩ් වසංගතය පැවති කාලයේ පවා හැකි අයුරින් එම ඉලක්ක කරා ලගා විමට කටයුතු කරන ලදී. මෙම ඉලක්ක ආයතනික මට්ටමින් සකසා ගෙන ඇත. මේ යටතේ ආයතනික ඉලක්ක 12ක් සකස්කරගෙන තිබන අතර එයින් 54ක ප්‍රතිඵල 100% ක් වාර්තා වේ. භූගෝලීය තාක්ෂණ පද්ධතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කිරීම, තිරසර සංවර්ධන අරමුණු හඳුන්වා දීම, තිරසර සංවර්ධන ඉලක්ක සැකසීම, සහ ඉලක්ක ලගාකර ගැනීම සම්බන්ධ වන ප්‍රගතිය 60%ට වඩා අඩු මට්ටමක පවතීමට හේතුව පැවති වසංගත තත්ත්වයයි.

## උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සහ පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘතීන්හි දායකත්වය

උතුරු මැද පළාත ආර්ථික හා සාමාජීය වශයෙන් සංවර්ධන කිරිම උදෙසා දේශීය මුලාශ්‍ර මඟින් මෙන්ම විදේශීය මුලාශ්‍ර මඟින්ද විශාල දායකත්වයක් සිදු කරනු ලබයි. මෙම දායකත්වය අපේක්ෂිත මට්ටමින් සිදුකරලීමට පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මෙහෙයවීම, සම්බන්ධීකරණය හා ප්‍රගති සමාලෝචනය හරහා මඟපෙන්වීම සිදුකරයි.

## 2017 – 2024 දක්වා උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන හා පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වර්ගය | ප්‍රතිපාදන ලබා දෙන රට/ ආයතනය | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|---|---|
| දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Irrigated Agriculture Project) | කෘෂිකාර්මික සහ වාරි පද්ධති පුනරුත්ථාපනය | World Bank (ලෝක බැංකුව) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.<br>කෘෂිකර්ම අමාත්‍යාංශය | 5242.00 | 2018-2024 |
| නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) | යටිතල පහසුකම් සංවර්ධනය | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයJICA - ජපානය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශය. | 3200.00 | 2018 - 2023 |
| පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය ( පුරනැගුම) | ජල සම්පාදනය | ADB<br>ශ්‍රී ලංකා රජය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය | 2300.00 | 2017-2021 |
| සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ( Health System Enhancement Project (HSEP) | සෞඛ්‍ය පහසුකම් සංවර්ධනය | ආසියානු සංවර්ධන බැංකුව | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 1484.00 | 2019-2023 |

උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සහ පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති ඉතිරි කොටස...

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වර්ගය | ප්‍රතිපාදන ලබා දෙන රට/ ආයතනය | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|---|
| විල්පත්තු වනෝද්‍යාන බලපෑම් ප්‍රදේශ කළමණාකරන ව්‍යාපෘතිය | පාරිසරික, සංචාරක | ජර්මනිය | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | යුරෝ මිලියන 60 | 2019-2022 |
| ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය. | ආහාර | ජර්මනිය | අනුරාධපුර දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය | - | 2019-2021 |
| පළාත් පාලන ආයතන සඳහා වූ ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය | කිලධාරී ධාරිතා සංවර්ධනය (පුහුණු) | UNDP | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රු.මි.41 | 2020.09.10 - 2022.03.31 |
| අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | අධ්‍යාපන සංවර්ධනය | World Bank(ලෝක බැංකුව) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ඇ.ඩො.මි.100 | 2018-2024 |
| අයි මාර්ග ව්‍යාපෘතිය (i- Roads) | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩි දියුණු කිරීම | ADB | මාර්ග සංවර්ධන අධිකාරිය | 10154.00 | 2016.08.01- 2021.07.31 (වැඩිදියුණු කිරීම - අ.වු 02ක් සහ නඩත්තු කිරීම - අ.වු.03) |
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය | යටිතල පහසුකම් සංවර්ධනය | ලෝක බැංකුව ශ්‍රී ලංකා රජය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, පළාත් පාලන දෙපාර්තමේන්තුව උතුරු මැද පළාත | 1583.33 | 2019-2022 |

උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සහ පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති ඉතිරි කොටස...

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වර්ගය | ප්‍රතිපාදන ලබා දෙන රට/ ආයතනය | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|---|
| අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | නාගරික යටිතල පහසුකම් සංවර්ධනය | සංවර්ධනය සඳහා වූ ප්‍රංශ ආයතනය (AFD)/ප්‍රංශය ඇ.ඩො.මි.57.5 සහ ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රතිපාදන ඇ.ඩො.මි.10.0 | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය(AIUDP) (උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන/මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය) | 10125.00 (ඇ.ඩො.මි.) | 2016-2022 |
| වැව්ගම් පුබුදුව (CRIWMP) | කෘෂිකාර්මික හා වාරිමාර්ග | GEF (හරිත දේශගුණික අරමුදල) | මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය<br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව<br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>ආපදා කළමණාකරණ අමාත්‍යාංශය / කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව | 1872.00 | 2017-2024 |
| කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) | කෘෂිකාර්මික හා වාරි මාර්ග | World Bank (ලෝක බැංකුව) | පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය. | 1710.00 | 2016-2021 |

උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන සහ පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති ඉතිරි කොටස...

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති වර්ගය | ප්‍රතිපාදන ලබා දෙන රට /ආයතන | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|---|
| තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | ජල සම්පාදනය | චීන සංවර්ධන බැංකුව, ලංකා රජය | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය | 16166.28 | 2018 - 2021 |
| උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය. | වාරි මාර්ග ඉදිකිරීම | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | කෘෂිකර්ම වාරිමාර්ග හා මහවැලි අමාත්‍යාංශය | 65,000.00 | 2017 - 2023 |
| ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය | එක්සත් රාජධානිය (I,II) නෙදර්ලන්තය (III) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 5840.88 | 2013 සිට මේ දක්වා |
| අනුරාධපුර උතුර - අදියර I ජල සම්පාදන ව්‍යාපෘතිය | ජල සම්පාදනය | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය, ශ්‍රී ලංකා රජය | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය | 11515.00 | 2013-2022 |
| අනුරාධපුර උතුර - අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය | | | | ජපන් යෙන් මි.27,496 | 2018-2024 |
| මාර්ග සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | මාර්ග | ලෝක බැංකුව | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 1483.00 | 2019-2023 |

## විවිධ වූ සංරවකයන් යටතේ සිදු කරනු ලබන විදේශාධාර ව්‍යාපෘති

<table>
<tr><th>සංරවකය</th><th>ව්‍යෘපෘතිය</th><th>ක්‍රියාත්මක කරන ආයතනය</th><th>ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි)</th></tr>
<tr><td rowspan="10">කෘෂිකාර්මික සහ වාරි පද්ධති පුනරුත්ථාපනය</td><td rowspan="3">දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Irrigated Agriculture Project)</td><td>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.</td><td rowspan="3">5242.00</td></tr>
<tr><td>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.</td></tr>
<tr><td>කෘෂිකර්ම අමාත්‍යාංශය</td></tr>
<tr><td rowspan="6">වැව්ගම් පුබුදුව (CRIWMP)</td><td>මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය</td><td rowspan="6">1872.00</td></tr>
<tr><td>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව</td></tr>
<tr><td>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය</td></tr>
<tr><td>ආපදා කළමණාකරණ අමාත්‍යාංශය / කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව</td></tr>
<tr></tr>
<tr><td>කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP)</td><td>පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.</td><td>1710.00</td></tr>
<tr><td rowspan="5">නාගරික යටිතල පහසුකම් සංවර්ධනය</td><td>නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)</td><td>අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශය.</td><td>3200.00</td></tr>
<tr><td>පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය ( පුරනැගුම)</td><td>අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය</td><td>2300.00</td></tr>
<tr><td>විල්පත්තු වනෝද්‍යාන බලපෑම් ප්‍රදේශ කළමණාකරන ව්‍යාපෘතිය</td><td>වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව</td><td>යුරෝ මිලියන 60</td></tr>
<tr><td>අයි මාර්ග ව්‍යාපෘතිය (i- Roads)</td><td>මාර්ග සංවර්ධන අධිකාරිය</td><td>10154.00</td></tr>
<tr><td>ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය</td><td>අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,පළාත්පාලන දෙපාර්තමේන්තුව උතුරු මැද පළාත</td><td>1583.33</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| නාගරික යටිතල පහසුකම් සංවර්ධනය | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය(AIUDP) (උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන/මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය) | 10125.00 (ඇ.ඩො.මි.) |
| | තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය | 16166.28 |
| | උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය. | කෘෂිකර්ම වාරිමාර්ග හා මහවැලි අමාත්‍යාංශය | 65,000.00 |
| | ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 5840.88 |
| | අනුරාධපුර උතුර - අදියර I ජල සම්පාදන ව්‍යාපෘතිය | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය | 11515.00 |
| | අනුරාධපුර උතුර - අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය | | ජපන් යෙන් මි.27,496 |
| | මාර්ග සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 1483.00 |
| සෞඛ්‍ය පහසුකම් සංවර්ධනය | සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ( Health System EnhancemenProject (HSEP) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 1484.00 |
| | ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය. | අනුරාධපුර දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය | - |
| නිලධාරී ධාරිතා සංවර්ධනය (පුහුණු) | පළාත් පාලන ආයතන සඳහා වූ ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රු.මි.41 |
| අධ්‍යාපන සංවර්ධනය | අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | ඇ.ඩො.මි.100 |

## 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද විදේශ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

2021 වර්ෂයේදී උතුරු මැද පළාත තුළ දැනට ක්‍රියාත්මක වන විදේශ ව්‍යාපෘති 20න් 16ක ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

| ව්‍යාපෘතිය | සිදුකරන ලද ක්‍රියාකාරකම් හා ප්‍රගතිය |
|---|---|
| දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Irrigated Agriculture Project) | 1.මධ්‍යම පරිමාණ කාබනික පොහොර නිෂ්පාදනය - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>2.සුළු පරිමාණ කාබනික පොහොර නිෂ්පාදනය - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>3.තනි පුද්ගල ඒකක - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>4.මහ කන්න වගා වැඩසටහන - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>5.ආදර්ශ ගම්මාන වැඩසටහන - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>6.වගාළිං වැඩිදියුණු කිරිම- ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>7.පවතින කෘෂි මාර්ග සංවර්ධනය- ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 01<br>8.වැව් පුනුරුත්තාපනය - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 02<br>9.ධාන්‍ය වියලීමේ කමත් - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>10.රටකජු ගැලවීමේ යන්ත්‍ර - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>11.ආදර්ශ ව්‍යාපෘතියක් ලෙස යන්ත්‍රෝපකරණ ඒකකය- ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 01<br>12.පැරිෂුට් තැටි - ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>13.බීජ වප්කරය හා වල් ඉවත් කිරිමේ උපකරණ ව්‍යාපෘති බල ප්‍රදේශ/ ප්‍රා.ලේ.කො. 06<br>14.තිරප්පනේ ගොවිපල පාසැල සඳහා නේවාසිකාගාරය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරිම<br>15.තිරප්පනේ ගොවිපල පාසැල සඳහා වගයාකුලම වැව ප්රතිසංස්කරණය<br>16.තිරප්පනේ ගොවිපල පාසැල සඳහා වගාළිං 36ක් වැඩිදියුණු කිරිම<br>17.තිරප්පනේ ගොවිපල පාසැල දේශගුණික සුහුරු කෘෂිකාර්මික ක්ෂේත්‍රයක් සැකසීම |
| වැව්ගම් පුබුදුව (CRIWMP) | i. කුඩා වැව් 106ක් හා අමුණු 11ක් ප්‍රතිසංස්කරණය<br>ii.දේශගුණික සුහුරු කෘෂිකර්මය<br>iii.ප්‍රජා ජල සම්පාදන පද්ධති 02ක් ඉදිකිරිම.<br>iv. කුඩා පරිමාණ 10ක් ලබාදීම<br>v.විශාල පරිමාණ පෙරහන් පද්ධති 7ක් ලබාදීම.<br>vi.වැසි ජල ටැංකි 245ක් ලබාදීම.<br>vii.ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම. |
| කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) | 1.ඉදිකරන ලද පේර එකතු කිරිමේ මධ්‍යස්ථානය 01<br>2.ඉදිකරන ලද බිම්මල් වගාමළ නිෂ්පාදනාගාරය 02<br>3.ඉදිකරන ලද බිම්මල් වගා ගෘහ 70<br>4.පුනුරුත්තාපනය කරන ලද වාරි ව්‍යාපෘති 23<br>5.පුනුරුත්තාපනය කරන කෘෂි මාර්ග 02<br>6.ආරම්භ කරන ලද ඇඹුල් කෙසෙල් පොකුරු ගම්මානය 01<br>7.ආරම්භ කරන ලද මිරිස් පොකුරු ගම්මානය 02<br>8.ආරම්භ කරන ලද පේර පොකුරු ගම්මානය 01<br>9.වියළි මිරිස් සැකසුම් මධ්‍යස්ථානය 01<br>10.සහතික කළ බඩඉරිඟු බීජ නිෂ්පාදන වැඩසටහන - ගොවීන් 100<br>11.ගොවි ව්‍යාපාරික පුහුණුව හා නිෂ්පාදන කණ්ඩායම් සවිබල ගැන්වීමේ පුහුණුව ලද ප්‍රතිලාභීන් - පුහුණු වැඩසටහන් 500 |
| තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | ජල පවිත්‍රාගාරය, ජල කුලුණ, නල මාර්ග පද්ධතිය ඉදි කිරීම. ආවරණය - තඹුත්තේගම ග්‍රාම් වසම් 26, තලාව වසම් 12, ගල්නෑව වසම් 04 (නව ජල සැපයුම් 20000ක් ලබාදීම)<br>1.තුමුළුව<br>2.ජල පවිත්‍රාගාරය<br>3.ජල කුළුණු<br>4.අමු ජලය පොම්පීකරණ නල මාර්ගය<br>5.පවිත්‍ර ජලය පොම්පීකරණ නල මාර්ගය<br>6.පවිත්‍ර ජලය බෙදා හැරීම් නල මාර්ගය<br>7.වෙනත් සිවිල් කටයුතු |

2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද විදේශ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ඉතිරි කොටස ...............

| | |
|---|---|
| නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) | පානීය ජල ව්‍යාපෘති 05<br>1.උඩුරුවහල්මිල්ලෑව, කටුකැලියාව<br>2.කෝඳුරුවාව, කඳුලේගම<br>3.ඉහළගම<br>4.දූණුමඩලාව<br>5.රත්මල්කණ්ඩිය |
| | මාර්ග 07<br>1.පුහුලේවැව-මහමැස්සැල්ලාව මාර්ගය<br>2.මොරකැව මාර්ගය<br>3.ගිරාණේගම-නාරංගස්වැව මාර්ගය<br>4.කල්ලංචිය-කැදැව මාර්ගය<br>5.මහඇලගමුව-මඩාටුගම මාර්ගය<br>6.ඉහලගම මාර්ගය<br>7.හිඹුටුගොල්ලෑව මාර්ගය |
| | වාරිමාර්ග ව්‍යාපෘති 06<br>1.සුරුක්කුලමවැව හා පනිච්චකල්ලවැව<br>2.තෝඩාමඩුව වැව හා දූනුමඩලාවවැව,උපුල්දෙනිය වැව<br>3.තලාකොළවැව,කැදැවකුඩාවැව,තම්මැන්නාඇලවක වැව<br>4.මහමැස්සැල්ලාව,එලවිස්සාගොඩ,කණුගහඋල්පත වැව<br>5.ගුරුහල්මිල්ලෑව, කොහොඹපිටිය,උඩවැව<br>6.මහින්දාගම ප්‍රධාන D ඇළ මහසෙන්පුරවැව |
| පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය ( පුරනැගුම) | ජල සැපයුම් ලබාදීම.<br>1.ජල සැපයුම ගනේවල්පොල සිට උත්තුපිටිය දීර්ඝ කිරීම සහ ජලය බෙදා හැරීමේ නල මාර්ග ඉදිකිරීම.<br>2.තිරප්පනේ සහ මහඉලුප්පල්ලම නල පද්ධතිය ඉදිකිරීම<br>3.ජල සැපයුම ජයන්තිපුර සිට බැදිවැව තබලවැව ජලය බෙදාහැරීමේ ජල නල මාර්ග ඉදිකිරීම.<br>4.මින්නේරිය ජල පිරිපහදුවේ ජල ධාරිතාව වර්ධනය කිරීම.<br>5.දඹුල්ල ප්‍රධාන ජල සැපයුමෙන් කිතුල්හිටියාව සිට එලගමුව දක්වා ප්‍රධාන ජල නල එලීමේ මාර්ග ඉදිකිරීම හා බෙදා හැරීමේ නල මාර්ග ඉදිකිරීම.<br>6.නුවරවැව ජල පිරිපහදුවේ ජල ධාරිතාව වර්ධනය කිරීම.<br>7.ජල සැපයුම් සේවාගම සිට තඹාල දක්වා දීර්ඝ කිරීම.<br>8.ජල සැපයුම සේවා ගම තුනේ ඇල ජල නල දීර්ඝ කිරීම.<br>9.කලාවැව ජල පිරිපහදුවේ ධාරිතාවය ඉහල නැංවීම.<br>10.තිසාවැව ජල පිරිපහදුවේ ජල ධාරිතාව වර්ධනය කිරීම.<br>11.ගල්ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය<br>12.කැබිතිගොල්ලෑව ජල සම්පාදන ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම.<br>13.ඉතිරි වැඩ-මින්නේරිය ජල පිරිපහදුව වැඩිදියුණු කිරීම<br>14.පවතින ජල යෝජනා ක්‍රමය වැඩිදියුණු කිරීම,රාජාංගනය,නාමල්ගමුව සහ කන්දේගම.<br>15.ජල සම්පාදන යෝජනා ක්‍රමය කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව |
| විල්පත්තු වනෝද්‍යාන බලපෑම් ප්‍රදේශ කළමණාකරන ව්‍යාපෘතිය | විල්පත්තු වනෝද්‍යානයට යාබද විලච්චිය හා නොච්චියාගම ප්‍රා.ලේ.කො. ඇතුලත්ව සංවර්ධන කටයුතු සිදු කිරීම. |
| අයි මාර්ග ව්‍යාපෘතිය (i- Roads) | 1.කි.මී.105ක් දිග ප්‍රධාන මාර්ග 04ක් සංවර්ධනය<br>i) හබරණ - මරදන්කඩවල මාර්ගය (A011)<br>ii)තලාව - කැකිරාව (B213), කැකිරාව -<br>iii)ගනේවල්පොල (B212), ගනේවල්පොල - ගලෙන්බිදුණුවැව - ඛච්චිහල්මිල්ලෑව මාර්ගය (B133) |
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය | ප්‍රාදේශීය සභා වැඩි දියුණු කර අත. |
| අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහල නැංවීම සඳහා සංරචක 6ක් ඔස්සේ ක්‍රියාත්මක විය. |

2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද විදේශ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය ඉතිරි කොටස ...............

| | |
|---|---|
| අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 1.ගං වතුර අවදානම අවම කිරීම සඳහා නාගරික ජලාපවහනය වැඩිදියුණු කිරීම.<br>2.නාගරික සංචලතාව වැඩිදියුණු කිරීම - ප්‍රවේශය,සංසරණය සහ රථවාහන කළමණාකරනය වැඩිදියුණු කිරීම.<br>(i)ශ්‍රී මහ බෝධිය නැගෙනහිර රථගාල ඉදිකිරීම සහ පූජා භූමියෙහි අර්ථ නිරූපණ පුවරු ඉදිකිරීම.<br>(ii)ශ්‍රී මහා බෝධිය දක්ෂිණ ප්‍රෙවිශ රථගාල ඉදිකිරීම<br>(iii)ලංකාරාම රථගාල ඉදි කිරීම<br>(iv)මිරිසවැටි රථගාල ඉදිකිරීම<br>3.පොදු අවකාශය වැඩිදියුණු කිරීම-පොදු අවකාශයේ ගුණාත්මකභාවය සහ ආකර්ශනීය බව වැඩිදියුණු කිරීම සහ උරුම කළමණාකරනය.<br>(i)මධ්‍යම දුම්රිය ස්ථානය ඉදිරිපිට පොදු මහජන චතුරශ්‍රය ඉදිකිරීම.<br>සිංහ කණුව වටරවුම ප්‍රතිසංවර්ධනය කිරීම.<br>(ii)ධර්මපාල මාවත දෙපස භූදර්ශණය කිරීම.<br>සුරපුර රඟහල ප්‍රතිසංවර්ධනය කිරීම<br>රජරට ගුවන් විදුලි සේවයෙහි විවෘත රඟහල සංවර්ධනය කිරීම<br>4.යටිතල පහසුකම් තිරසාර ලෙස කළමණාකරනය කිරීම සඳහා පාර්ශව ආයතනයන්හි ධාරිතා වර්ධනය<br>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපදේශක සේවාව.<br>ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ සන්නිවේදන සැලැස්ම. |
| උතුරු මැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය. | 1.ICB/2B -කළුගහ -මොරගහකන්ද භූවමාරු උමගය.<br>2.ICB/01 - 0+100 කි.මී.සිට 6+226 කි.මී.ඉදිකිරීම් කටයුතු.<br>3.ICB/2A -27+509 කි.මී.සිට 55+600 කි.මී.කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමේ කටයුතු.(උතුරු මැද පළාත් මහ ඇළ උමං මාර්ගය(28කි.මී)<br>4.ICB/03-6+226 කි.මී.සිට 17+715 කි.මී.දක්වා.ටෙන්ඩර් පත්‍රිකා පිළියෙල කිරීම සිදු කරයි.<br>5.ICB/04 17+715 කි.මී.සිට 27+509 කි.මී.දක්වා<br>6.ICB/05-55+600 කි.මී.සිට 65+500 කි.මී.ටෙන්ඩර් පත්‍රිකා පිළියෙල කිරීම සිදු කරයි.<br>7.ICB/06-යකල්ල සිට මහකනදරාව සමීක්ෂණ කටයුතු සිදු කරයි. |
| ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | මුළු පාලම් ගණන 174කි. ඉන් 156ක වැඩ අවසන් අතර 18ක වැඩ කෙරී ගෙන යයි. |
| අනුරාධපුර උතුර - අදියර I ජල සම්පාදන ව්‍යාපෘතිය | රඹෑව වසම් 38 ක් හා මැදවච්චිය වසම් 37 ක් ආවරණය කරන ලදී.<br>1. Lot A (Access Engineering<br>2. Lot B (NCC Sierra JV)<br>3. Lot C1 (Finite Lanka Pvt.Ltd.<br>4. Lot C3 (Squire Mech Engineerng Pvt.Ltd. |
| අනුරාධපුර උතුර - අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය | පදවිය,හොරොව්පොතාන,කහටගස්දිගිලිය,කැබිතිගොල්ලෑව ප්‍රදේශ වල ග්‍රාම නි වසම් 127ක් ආවරණය කරන ලදී. |
| මාර්ග සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | NCP/01 පැකේජය<br>1.(A/p) නොච්චියාගම - ගාලේදිවුල්වැව පාර<br>2.(A/p) ඔයාමඩුව - ජේමඩුව පාර<br>NCP/02 පැකේජය<br>1.(Pol) ඩී 2 ප්‍රධාන ඇල පාර<br>2.(Pol) කොතලාවල පාර<br>3.(Pol)මැදිරිගිරිය නව නගරය පාර<br>4.(Pol) අසේල පුර කුරුලු බැද්ද මාර්ගය<br>NCP/03 පැකේජය<br>1.දඹුලුහල්මිල්ලෑව - ගල්කිරියාගම මාර්ගය<br>2.නෑගම-හල්මිල්ලෑව මාර්ගය<br>3.රත්මලේ-නාච්චාදූව මාර්ගය<br>4.අලිස්ථාන-තුරුවිල මාර්ගය |
| ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය. | අනුරාධපුර දිසුත්‍රික්කයේ ආහාර පරිහරණ ආයතන හා ආහාර පරිහරණ කටයුතු වල නියුතු පුද්ගලයන් බලගැන්වීමට දැනුවත් කිරීම් සදු විය. |

| | |
|---|---|
| සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ( Health System EnhancemenProject (HSEP) | 1.ඇල්ලවැව - ඉදිකිරීම් කටයුතු.<br>2.සෙවනපිටිය - ඉදිකිරීම් කටයුතු.<br>3.දම්මින්න - ඉදිකිරීම් කටයුතු.<br>4.අඹගස්වැව- ඉදිකිරීම් කටයුතු<br>5.හොරොව්පොතාන-ඉදිකිරීම් කටයුතු<br>6.ගලෙන්බිඳුණුවැව-ඉදිකිරීම් කටයුතු<br>7.නෑගම්පහ-ඉදිකිරීම් කටයුතු<br>8.කෝන්වැව-ඉදිකිරීම් කටයුතු<br>9.තිත්තගෝනෑව-ඉදිකිරීම් කටයුතු<br><br>දෙවන වටය - පලමු අදියර<br><br>1.ඇතාකඩ PMCU<br>2.කටියාව DH<br>3.ආඩියාගල DHC<br>4.මහසෙන්පුර PMCU<br>5.සිංහපුර PMCU<br>6.මැදගම PMCU<br>7.පරාක්‍රම සමුද්‍රය PMCU<br>8.විජයපුර PMCU |
| පළාත් පාලන ආයතන සඳහා වූ ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය | ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් 36 |

## ක්‍රියාත්මක වන විදේශ ව්‍යාපෘති පිළිබඳ විස්තර

- **දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Irrigated Agriculture Project)-world Bank**

මේ යටතේ කෘෂිකාර්මික සහ වාරි පද්ධති පුනරුත්ථාපනය සිදු කරයි. කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය, කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සම්පාදනය, ව්‍යාපෘති කළමණාකරණය, මෙහෙයවීම හා ඇගයීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි140කි. ව්‍යාපෘති කාල සීමාව 2018-2024 වේ.

- **නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) - ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය JICA**

මේ යටතේ ග්‍රාමිය ජල ව්‍යාපෘති සැලසුම් කිරීම හා ඉදිකිරීම, ග්‍රාමිය මාර්ග සැලසුම් කිරීම හා ඉදිකිරීම, වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සිදු කරයි. අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශය මගින් මෙය ක්‍රියාත්මක කරන අතර මුළු පිරිවැය රු.මි.32,000ක් වන අතර ව්‍යාපෘති කාලසීමාව 2018 – 2021 දක්වා වේ.

- **පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය - (පුරනැගුම)**

ජල සැපයුම් ලබා දීම මේ යටතේ සිදු කරනු ලබන අතර අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. මුළු පිරිවැය රු.මි.2,630 ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2017-2020 දක්වා වේ.

- **සෞඛ්‍ය සේවා පද්ධති ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Health System Enhancement Project)**

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත මෙම ව්‍යාපෘතිය උතුරු මැද පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.මි 1484කි.

- **අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය**

සංවර්ධනය සඳහා වූ ප්‍රංශ නියෝජිතායතනය හා ශ්‍රී ලංකා රජය ඒකාබද්ධව මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මෙහෙයවීමෙන් සිදු කරන මෙම ව්‍යාපෘතිය සඳහා අනුරාධපුර නගරය ආශ්‍රිත කලාපය පහත අංග 4 යටතේ සංවර්ධනය කරයි.

- ජල කළමනාකරණය.
- ගමනාගමන පහසුකම් සංවර්ධනය.
- නගර අලංකරණය හා පහසුකම් සංවර්ධනය.
- නගර සංවර්ධනයට හා උරුම කළමනාකරණයට සම්බන්ධ ආයතනවල ධාරිතා සංවර්ධනය.

අනුරාධපුර නගරයට මෙතෙක් වෙන්වූ විශාලම මුදල වන ඇමරිකානු ඩොලර් මිලියන 57.5ක මුදලක් මේ සඳහා ආයෝජනය කිරිමට නියමිත අතර, මෙම ව්‍යාපෘතියේ ප්‍රධානතම සම්බන්ධීකාරක ලෙස පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු ද පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. 2013- 2024 දක්වා උතුරු මැද පළාතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘති පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව මගින් සම්බන්ධීකරණය කරනු ලබයි.

- **වැව්ගම් පුබුදුව (CRIWMP) -GEF(හරිත දේශගුණ අරමුදල)**

කුඩා වැව් 52 ප්‍රතිසංස්කරණය, දේශගුණික සංවේදි කෘෂිකර්මය, ප්‍රජා ජල සම්පාදන පද්ධති ඉදිකිරීම, පෙරහන් පද්ධති ලබාදීම හා වැසි ජල ටැංකි ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය එක්ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි.52.04 (රු.මි.9400)ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2017-2024 වේ.

- **කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) - World Bank**

කෘෂිකාර්මික අංශය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. නවීන කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන පිහිටුවීම, (නියමු ව්‍යාපෘතීන්), නිෂ්පාදන සහ අලෙවි යටිතල පහසුකම් සංවර්ධනය (වැව් පුනරුත්තාපනය, ඇලමාර්ග නවීකරණය, කෘෂි මාර්ග නවීකරණය) හා ව්‍යාපෘති කළමණාකරණය, මෙහෙයවීම හා ඇගයීම මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් වේ. ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි.58.63ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව 2016-2021 වේ.

- **උතුරුමැද පළාත් මහ ඇළ ව්‍යාපෘතිය - (ADB)**

වාරිමාර්ග ඉදිකිරීම් මෙම ව්‍යාපෘතිය යටතේ සිදු වේ. මෙහි ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ මොරගහ කන්ද ජලාශයේ සිට අනුරාධපුරය දක්වා නව ඇළ මාර්ගයක් ඉදිකිරීමයි. මහවැලි අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මුළු පිරිවැය රු.මි.65,000ක් වන අතර ව්‍යාපෘති කාල සීමාව වසර 06 කි.

**පළාත තුළ විදේශ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති නියාමනයේදී උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා වශයෙන් පළාතේ සියළු විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති ප්‍රගතිය අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රගති සමාලෝචනය කරනු ලබයි. එහිදී අවශ්‍ය තීන්දු තීරණ ගැනීම හා නියාමන කටයුතු පළාත් මට්ටමින්, ජාතික මට්ටමින් පිහිටුවා ඇති කමිටු නියෝජනය කරමින් අපේක්ෂිත අරමුණු කරා ව්‍යාපෘතිය මෙහෙයවීම සඳහා ප්‍රමාණවත් ලෙස අවශ්‍ය මැදිහත්වීම් 2021 වර්ෂය තුළ දී සිදුකර ඇත.**

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණු දුන් ගැටළු හා දුෂ්කරතා

ජාතික ප්‍රතිපත්තීන්ට සහ නියාමනයන්ට සමගාමීව ජාතික සංවර්ධනයට සෘජුවම දායක වෙමින් පළාතේ ජනතාවගේ අභිවෘද්ධිය සහ යහපැවැත්ම සඳහා 2021 වර්ෂයේදීද පළාත් සභා සංවර්ධන කටයුතුවලදී පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සුවිශාල වගකීමක් සහ කාර්යභාරයක් ඉටුකරන ලදී.

මෙහිදි පළාතට උචිත ප්‍රතිපත්ති, සැලසුම්, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ද ක්‍රමානුකූල වැඩපිළිවෙලක් තුළ ක්‍රියාත්මක වු මෙහෙයුම් සහ ඇගයුම් ක්‍රියාවලිය තුළින් පළාතේ සංවර්ධන කාර්යය වඩාත් ක්‍රමික එකක් කිරිම සඳහා දායකත්වය සපයන ලදී. 2021 වර්ෂයේදී සියළු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් විධිමත් සහ කඩිනම් වැඩසටහන් රැසක්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

පළාතේ සංවර්ධන, පරිපාලන, සමාජ සුභසාධන, සමාජ ආරක්ෂණ, ආදායම් උත්පාදන, ව්‍යවසායකත්ව සහ ජීවනෝපාය සංවර්ධන ආදී ක්ෂේත්‍රයන් වෙත විශේෂ අවධානයක් යොමු කරන ලදී. මෙහිදී විනිවිදභාවය, වළදායිතාව සහ ආයෝජනයන්ට සාපේක්ෂ ප්‍රතිලාභ ඉලක්කගත පුද්ගලයන්ට ලැබීම පිළිබඳවද සංවර්ධන ව්‍යාපෘතිවල ගුණාත්මක අගය සහ යෙදවුම් පිළිබඳවද විවිධ මෙහෙයුම් කටයුතු සිදු කෙරිණි.

ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ අනුව ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති 100% නිරීක්ෂණ පදනම මත පරීක්ෂා කිරීමටත් එහි ප්‍රගතිය මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සඳහා ඉදිරිපත් කිරීමටත් පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ඇත. ඒ අනුව 2021 වර්ෂයේදී ද ප්‍රතිලාභ රැසක් පළාතේ ජනතාවට ලබා දීම සඳහා පළාත් සභා යාන්ත්‍රණය වෙත සෘජු සහ සක්‍රීය දායකත්වයක් ලබා දීමට හැකි විය.

2021 වර්ෂය තුළදි පළාත් සංවර්ධන සැලසුම ක්‍රියාවට නංවමින් පළාත් සංවර්ධන ක්‍රියාවලිය මෙහෙය වු අතර විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පළාතේ අත්‍යාවශ්‍ය අවශ්‍යතා සැලකිය යුතු ප්‍රමාණයකින් සම්පූර්ණ කිරීමටත් හැකි විය. එසේම ප්‍රතිඵල පාදක සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ කටයුතු ක්‍රියාත්මක කළ අතර පළාත තුළ විදේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති නියාමනය කිරීම ද සිදු විය.

# 5.2. පළාත් භාණ්ඩාගාරය

## ආයතනය පිළිබඳ හැඳින්වීම

ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක් යන දැක්ම කරා ළඟා වීම උදෙසා රාජ්‍ය මූල්‍ය පිළිබඳ තීරණ ගැනීම පිණිස මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන පළාත් සභා ආදායම්, වියදම්, අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් ඇතුළු මූල්‍ය කටයුතු වාර්තා කිරීමේ මධ්‍යගත ආයතනය වශයෙන් "පළාත් භාණ්ඩාගාරය" ක්‍රියාත්මක වේ.

අමාත්‍යාංශයක් යටතට නොවැටෙන දෙපාර්තමේන්තුවක් වන මෙම ආයතනයේ උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා පළාත් භාණ්ඩාගාරයේ ද ලේකම්වරයා වන අතර, මෙහෙයුම් කටයුතු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) මගින් සිදුවේ. පළාත් භාණ්ඩාගාරය යටතේ පහත සඳහන් දෙපාර්තමේන්තු හා අංශ ක්‍රියාත්මක වේ. අයවැය දෙපාර්තමේන්තුව, මුදල් හා ආදායම් දෙපාර්තමේන්තුව, ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව සහ පරිපාලන හා ගිණුම් අංශය වශයෙනි.

## අයවැය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනයේ නව වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ පළාත් සභාවලට පැවරී ඇති විෂයයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දීමේ අරමුණින් අයවැය ඇස්තමේන්තු පිළියෙල කරන ලදි.

එසේම තිරසර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය අනුව පළාත් සංවර්ධනයට අදාළ තිරසර සංවර්ධන අරමුණු පහත පරිදි හඳුනාගෙන ඇති අතර එම අරමුණු වසර 2030 වනවිට ළඟා කර ගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී අවධානය යොමු කර ඇත.

| | | |
|---|---|---|
| SDG 01 | - | සියළුම ආකාරයේ දරිද්‍රතාව තුරන් කිරීම. |
| SDG 02 | - | සියළුම ආකාරයේ කුසගින්න හා මන්දපෝෂණය තුරන් කිරීම. |
| SDG 03 | - | ඒඩ්ස් රෝගය, ක්ෂය රෝගය, මැලේරියාව හා අනෙකුත් වසංගත රෝග තුරන්කරමින් සෞඛ්‍ය හා යහපැවැත්ම සහතික කිරීම. |
| SDG 04 | - | සියළුම ගැහැණු හා පිරිමි ළමුන් නිදහස්, ප්‍රාථමික හා ද්වීතියික පාසැල් අධ්‍යාපනය සම්පූර්ණ කරන බවට තහවුරු කිරීම. |
| SDG 06 | - | සුරක්ෂිත පානීය ජලය ලබා ගැනීමට අදාළ විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම. |
| SDG 07 | - | දැරිය හැකි විදුලිය සඳහා විශ්ව ප්‍රවේශය තහවුරු කිරීම. |
| SDG 08 | - | අවම ආදායම් කාණ්ඩවලට අයත් ආදායම් උපයන්නන් බලගැන්වීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදනය හා ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ භාවය වැනි කරුණු නොසලකා සමාජයේ සියළු දෙනාම ඇතුළත් වන පරිදි ආදායම් ප්‍රවර්ධනය සහතික කරලීම. |
| SDG 15 | - | වනාන්තර, තෙත් බිම්, වියළි ඉඩම් සහ කඳු යන භෞමික පරිසර පද්ධතීන් කඩිනමින් සංරක්ෂණය හා ස්ථාපනය කිරීම. |
| SDG 16 | - | සියල්ලන් සඳහා යුක්තිය හිමිකර ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීම. |

## මුදල් හා ආදායම් දෙපාර්තමේන්තුව

පළාත් සභා මූල්‍ය රීති අධ්‍යනය හා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අධ්‍යනය හා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීම, පළාත් සභා ප්‍රඥප්ති යටතේ පිහිටුවන ලද ආයතනවල මූල්‍ය කටයුතු විධිමත් කිරීමට ප්‍රඥප්ති සකස් කිරීම හා භාණ්ඩාගාර චක්‍රලේඛ නිකුත් කිරීම වැනි කාර්යන් ප්‍රමුඛ කරගත් මුදල් දෙපාර්තමේන්තුව ද ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිශෝධනය, ආදායම් ගිණුම් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම වැනි කාර්යයන් ප්‍රධාන කරගත් ආදායම් දෙපාර්තමේන්තුව ද මේ යටතේ ක්‍රියාත්මක වේ.

## ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තියට අනුව පිහිටුවා ඇති පළාත් සභා අරමුදලට, පළාත් සභාව වෙත බලය පැවරී ඇති ප්‍රභවයන්ගෙන් එකතුවන සියලුම ආදායම්, මධ්‍යම රජය විසින් එකතුකර ප්‍රේෂණය කරනු ලබන බදු ආදායම් ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් පළාත් සභාවට ලබා දෙන ලද සියලුම ප්‍රදාන, ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් පළාත් සභාවට දෙන ලද සියලුම ණය මුදල් සහ පළාත් සභාවට ලැබෙන සියලු ලැබීම් සහ පළාත් සභා ආයතන වෙත අක්මුදල් නිකුත් කිරීම් සහ වෙනත් ගෙවීම් කළමනාකරණය කිරීම සිදු කරයි.

එමෙන්ම, පළාත් සභා අරමුදල සම්බන්ධව අවශ්‍ය නියමිත ගිණුම් පොත්පත් පවත්වාගෙන යාම, පළාත තුළ විධිමත් මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියන් පවත්වාගෙන යාමට අවශ්‍ය මග පෙන්වීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වෙත වරින් වර චක්‍රලේඛ නිකුත් කිරීම, උපදෙස් හා නියෝග නිකුත් කිරීම, වියදම් හා ආදායම් පිළිබඳ වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම ආදී ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබයි.

## දැක්ම

"ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක්, සංවර්ධිත පළාතක්"

## මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහි කිරීම සඳහා පළාතේ මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය, මූල්‍ය කටයුතු පිළිබඳ උපදේශනය, පළාතේ ගිණුම් පවත්වාගෙන යාම සහ ප්‍රසිද්ධ කිරීම, මූල්‍ය කළමනාකරණ තොරතුරු සැපයීම හා සියළු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් යුක්තව ගිණුම් ක්‍රම සංවර්ධනය කිරීම".

## දිගුකාලීන අරමුණු

- දීර්ඝකාලීන සංවර්ධන සැලසුම් හා ව්‍යාපෘති යෝජනා පදනම් කරගෙන සම්පත් වෙන් කිරීම.
- ගිණුම්කරණ කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන යෙදවුම් භාවිතය ඉහළ නැංවීම.
- මූල්‍ය කළමනාකරණය සඳහා වගවීම හා විනිවිදභාවය තහවුරු කිරීම තුලින් මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම.
- පළාත් සභා හා පළාත් පාලන ගිණුම් ඒකකවල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම.
- කාලීන හා ගුණාත්මක තීරණ ගැනීම සඳහා මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- මනා සම්බන්ධීකරණයක් තුළින් පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් කරනු ලබන ආයෝජනයන්හිදි එකම කාර්යය සඳහා දෙඅංශයෙන්ම සිදුවන ආයෝජන වැළැක්වීම.
- ගුණාත්මක හා යාවත්කාලීන වාර්තාකරණ ක්‍රමයක් ඇති කිරීම.
- වියදම් ප්‍රමුඛතා හා අග්‍රිම නිදහස් කිරීම සම්බන්ධ අඛණ්ඩ අවධානය.
- ප්‍රතිඵල පදනම් කරගත් ඇගයීමේ ක්‍රමයක් පිහිටුවීම.
- ගිණුම් ඒකකවල පරිගණකගත ගිණුම්කරණ මෘදුකාංග පද්ධති සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහය දීම.
- අයවැය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහය දීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් ආදායම් අයවැය ප්‍රතිපත්ති සහ ගිණුම් ප්‍රතිපත්ති සම්පාදනය හා සංවර්ධනය.
- පළාත් අරමුදල, අවිනිශ්චිත අවස්ථා අරමුදල සහ වෙනත් අරමුදල් පවත්වාගෙන යාම සහ සංවර්ධනය.
- මධ්‍යගත මූල්‍ය පාලනය, මූල්‍ය උපදෙස් ලබා දීම සහ මූල්‍ය කළමනාකරණ තොරතුරු ලබා දීම.
- පළාත් ආදායම් රැස් කිරීමේ කටයුතු නියාමනය සහ සංවර්ධනය.
- පළාතේ ක්‍රමවත් ගිණුම් ක්‍රමයක් පවත්වා ගැනීම සහ පළාතේ ගිණුම් ප්‍රසිද්ධ කිරීම.
- ගිණුම් ක්‍රම සංවර්ධනය.
- ප්‍රසම්පාදන කටයුතු නියාමනය හා සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලනය.

## 1.අයවැය දෙපාර්තමේන්තුව

- වාර්ෂික මුදල් ප්‍රකාශය පිළියෙල කිරීම
- විසර්ජන ප්‍රඥප්තිය පිළියෙල කිරීම
- පරිපූරක ඇස්තමේන්තු පිළිබඳ කටයුතු
- අයවැය කළමනාකරණය සහ පාලනය
- ප්‍රතිපාදන මාරු කිරීම
- සේවක සංඛ්‍යා තොරතුරු තබා ගැනීම හා පාලනය
- අයවැය දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය
- ඇස්තමේන්තු ලබා ගැනීම හා පරීක්ෂාව
- අයවැය හා සැලසුම් කමිටු
- පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් තීරණය කිරීම හා ප්‍රතිපාදන සැලසීම
- අයවැය සාකච්ඡා
- වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම
- අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කිරීම
- ජාතික ප්‍රතිපත්ති ප්‍රමුඛතා හා සැලසුම් තොරතුරු තබා ගැනීම
- පළාත් සභා සැලසුම්, අරමුණු, ඉලක්ක හා කාර්ය සාධන ලබා ගැනීම හා පවත්වා ගැනීම
- අතිරික්ත වියදම් හා අත්තිකාරම් ගිණුම් වල සීමා ඉක්මවීම ද අවම සීමා වලට ලඟා නොවීම පිළිබඳ කටයුතු
- අයවැය සීමා ඉක්මවීම හා සීමාවලට ලඟා නොවීම සඳහා අනාවැකි ලබා ගැනීම

## 2. මුදල් හා ආදායම් දෙපාර්තමේන්තුව

- ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම
- ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය
- ආදායම් ප්‍රගති කටයුතු
- ආදායම් වාර්තා පිළියෙල කිරීම
- ආදායම් දත්ත තබා ගැනීම හා විශ්ලේෂණය

- ආදායම් එකතු කිරීම
- ආදායම් ගිණුම් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම
- හිඟ ආදායම් ගිණුම්
- මූල්‍ය රීති පැනවීම හා සංශෝධනය
- මූල්‍ය අධීක්ෂණය
- පළාත් සභා දේපල පරිපාලනය
- විගණන විමසුම් ලේඛන පවත්වා ගැනීම හා ප්‍රගතිය
- විගණකාධිපතිගේ විගණන වාර්තා හා කෙටුම්පත් වාර්තා පිළිබඳ කටයුතු
- පළාත් ගිණුම් කාරක සභා කටයුතු
- පළාත් ගිණුම් කාරක සභා වාර්තා පිළිබඳ කටයුතු
- පළාත් සභාවෙන් බැහැර අරමුදල් පාලනය
- පළාත් සභා නිලධාරින්ගේ ඇප
- මූල්‍ය කටයුතු වල කාර්ය සාධනය හා කාර්යඵල ඇගයීම
- පළාත් සභා ආකෘතිපත්‍ර පාලනය හා නව ආකෘතිපත්‍ර හඳුන්වා දීම
- දීමනා පිළිබඳ කටයුතු
- විදේශාධාර හා ණය ප්‍රතිපාදන කටයුතු
- ණය ලබා ගැනීම හා ආපසු ගෙවීම
- බලය පැවරීම
- සමීක්ෂණ මණ්ඩල හා කපා හැරීම
- අලාභ, අත්හැරීම්, කපා හැරීම් හා වන්දි ගෙවීම
- දේපල අලෙවිය හා බැහැර කිරීම
- ගිණුම් ක්‍රම සංවර්ධනය
- විගණන විමසුම් පිළිබඳ කටයුතු සඳහා වූ විගණන විමසුම් ලේඛන පවත්වා ගැනීම
- අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කටයුතු

## 3.ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව

- පළාත් අරමුදලේ ගිණුම් තැබීම හා නියමිත හා අදාළ පොත් හා ගිණුම් පවත්වා ගැනීම.
- අග්‍රිම නිකුත් කිරීම හා පාලනය
- මාසික භාණ්ඩාගාර ගිණුම් වාර්තා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කිරීම හා පාලන කටයුතු
- සේප්පුවල අනු යතුරු තබා ගැනීම
- පළාත් සභාවේ සියලුම ගිණුම් පරිපාලනය සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම.
- පළාත් සභා අරමුදල් කළමනාකරණය හා අධීක්ෂණය
- විදේශාධාර ගිණුම්
- අග්‍රිම සීමා නියම කිරීම
- ගිණුම් ප්‍රසිද්ධ කිරීම
- ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම
- පළාත් හදිසි අවස්ථා අරමුදලේ කටයුතු
- ගිණුම් ඒකාබද්ධ කිරීම
- පළාත් සභා අරමුදලේ මුදල් පරිපාලනය
- අතිරික්ත මුදල් ආයෝජනය
- පළාත් සභාවේ සියළුම බැංකු ගිණුම් පාලනය හා අධීක්ෂණය
- ආදායමින් ආපසු ගෙවීම
- ප්‍රදාන ලබා ගැනීම
- සියලුම පොදු තැන්පතු ගිණුම් පාලනය හා අධීක්ෂණය
- සියලුම අත්තිකාරම් ගිණුම් පාලනය හා පරීක්ෂාව

## 4.පරිපාලන හා ගිණුම් අංශය

- දෛනික තැපැල බෙදීම හා බෙදා හැරීම
- පළාත් භාණ්ඩාගාරයේ සත්‍ය කාර්ය මණ්ඩලයේ ආයතනික හා පරිපාලන කටයුතු.
- පළාතේ සිටින ගණකාධිකාරීවරුන්ගේ ස්ථාන මාරුවීම් සඳහා නිර්දේශ සහ නවක නිලධාරීන් සඳහා නිර්දේශ ලබාදීම.
- පළාත් සභා අරමුදලට බැර විය යුතු ආදායම් ගිණුම්ගත කිරීම.
- ක්ෂය සංචිත අරමුදල පවත්වාගෙන යාම.
- වාහන පරිපාලන හා නඩත්තු කටයුතු.
- අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම
- පළාත් භාණ්ඩාගාරයේ සියලුම ගෙවීම් කටයුතු

- බැංකු සැසඳුම් පිළියෙල කිරීම
- ලෙජර් පොත් තුලනය සහ සැසඳීම
- තොග පොත් තුලනය හා සැසඳිම
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කමිටු පත්කිරීම
- භාණ්ඩ සමීක්ෂණ කටයුතු
- අවශ්‍ය වාර්තා ලබාගෙන භාණ්ඩ අපහරණය කිරීම
- රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සකස් කිරීම
- ගිණුම් සැසඳීම
- මූල්‍ය ප්‍රකාශන, අත්තිකාරම් ගිණුම සකස් කිරීම හා ඉදිරිපත් කිරීම
- විගණන විමසුම් වලට පිළිතුරු යැවීම
- පළාත් භාණ්ඩාගාරයේ ප්‍රසම්පාදන කටයුතු
- වැටුප් සකස් කිරීම/ වැටුප් ලෙජර නඩත්තුව/ වැටුප් ගෙවීම

## ප්‍රධාන උපාය මාර්ගයන්

01. මූල්‍ය කළමනාකරණය
02. වියදම් පාලනය
03. වත්කම් කළමනාකරණය.
04. තාක්ෂණ ක්‍රම භාවිතයෙන් ගිණුම්කරණ කටයුතු වැඩිදියුණු කිරීම

## අපගේ සාරධර්ම

**නායකත්වය** - සමාජීය හා වෘත්තීය වගකීම් සපුරාලමින් පළාත තුළ මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමේ නායකයා ලෙස කටයුතු කිරීම.

**යහපාලනය** - තීරණ ගැනීමේදී අරමුණුගතභාවය, වගවීම, විනිවිදභාවය, සාධාරණ සැලකිල්ල හා ප්‍රමුඛ පාලනය පිළිබිඹු කිරීම.

**ගුණාත්මකභාවය** - කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව ඉහළ නැංවීම තුළින් ගුණාත්මක සේවාවන් සැපයීම.

**විශේෂඥතාව** - පරිචයට අදාල ශිල්ප ක්‍රම, මූල්‍ය න්‍යායන් හා නවීන ගිණුම්කරණ ක්‍රමවේදයන් භාවිතය පිළිබඳ විශේෂ දැනුම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 32ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 24 කි. පුරප්පාඩු සංඛ්‍යාව 08 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | | |
| I. ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 0.97 | 0.97 | 0 | 100 |
| **එකතුව** | **0.97** | **0.97** | **0** | **100** |

## ආයතනික ප්‍රගතිය

2021 වර්ෂය තුල දී පහත සඳහන් අංශ සඳහා පුහුණු අවස්ථා ලබා දීම තුලින් කාර්යාක්ෂම හා ඵලදායී මානව සම්පත් ලඟා කර ගැනීමට පියවර ගෙන ඇත.

- නව CIGAS වැඩසටහන පිළිබඳව පුහුණු වැඩ සටහන.
- විශ්‍රාම වැටුප් සැකසීම පිළිබඳව පුහුණු වැඩ සටහන.
- අවශ්‍යතා තක්සේරුව හා අයවැය සැකසීම පිළිබඳ පුහුණු වැඩ සටහන.
- අත්තිකාරම් බී ගිණුම පුහුණු වැඩ සටහන.
- කාර්යාලීය විද්‍යුත් උපකරණ භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩ සටහන.
- වාහන නඩත්තුව පිළිබඳ පුහුණුව.
- කාර්යාල ක්‍රම හා සටහන් ලිවීම පිළිබඳ පුහුණු වැඩ සටහන.

## 2021 වර්ෂය තුල නිකුත් කරන ලද චක්‍රලේඛ නාමාවලිය

2021 වර්ෂය තුලදී පහත සඳහන් නව චක්‍රලේඛ නිකුත් කිරීම තුලින් පළාත තුල රාජ්‍ය මූල්‍ය පාලනය විධිමත් කිරීමට කටයුතු කරන ලදී.

| අනු අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ විස්තරය |
|---|---|---|---|
| 1 | 2021.01.01 | 2021/01 | වියදම් සඳහා බාලාධිකාරය පැවරීම සහ රාජ්‍ය වියදම් කළමණාකරණය 2021 |
| 2 | 2021.01.08 | 2021/02 | 2021 වර්ෂය තුළදී වැටුප් සහ වැටුප් අත්තිකාරම් ගෙවීම. |
| 3 | 2021.01.18 | 2021/03 | අග්‍රිම නිදහස් කිරීම හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම - 2021 |
| 4 | 2021.01.25 | 2021/04 | ආදායම් සහ වියදම් ඇස්තමේන්තු - 2020 |
| 5 | 2021.02.10 | 2021/05 | පළාත් සභාවට අයත් භාවිතයට ගත නොහැකි ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේ ක්‍රමවේදය. |
| 6 | 2021.03.15 | 2020/10(i) | දේශීය කර්මාන්තය දිරිගැන්වීමේ ප්‍රතිපත්තිය. |
| 7 | 2021.03.23 | 2021/06 | ප්‍රසම්පාදන සැළැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන. |
| 8 | 2021.04.05 | 2016/13(iii) | ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් වෙතින් ප්‍රසම්පාදනය කර ගැනීම. මිලියන 50 දක්වා |
| 9 | 2021.06.29 | 2015.06(iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාත් සභාවේ ප්‍රසම්පාදන කටයුතු වලට අදාළ මූල්‍ය රීති සංශෝධනය කිරීම. |
| 10 | 2021.07.06 | 2016/07(i) | මූලධන ස්වභාවයේ සංවර්ධන කාර්යන්ට අදාළව පරිපාලන වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම. |
| 11 | 2021.07.30 | 2021/07 | වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය. |
| 12 | 2021.07.20 | 2021/08 | ඉදි කිරීම් කොන්ත්‍රාත්වලදී රඳවා ගනු ලබන මුදල් නිදහස් කිරීම. |
| 13 | 2021.08.04 | 2021/05(I) | පළාත් සභාවට අයත් භාවිතයට ගත නොහැකි ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේ ක්‍රමවේදය. |
| 14 | 2021.10.12 | 2021/09 | ප්‍රසම්පාදන සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමය |
| 15 | 2021.11.04 | 2021/10 | 2021 වර්සයේ භාණ්ඩ හා වත්කම් සමීක්ෂණය. |
| 16 | 2021.11.16 | 2021/11 | 2021 මුදල් වර්ෂය සඳහා ගිණුම් පියවීම. |
| 17 | 2021.12.02 | 2021/07 (i) | වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය. |
| 18 | 2021012.10 | 2021/12 | අත්තිකාරම් ගිණුම් |
| 19 | 2021.12.10 | 2021/13 | ව්‍යවස්ථාපිත ආයතන වල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම 2021 |
| 20 | 2021.12.10 | 2021/14 | අරමුදල් ගිණුම් වල වාර්ෂික ගිණුම් ඉදිරිපත් කිරීම - 2021 |
| 21 | 2021/12/16 | 2021/15 | මූල්‍ය ප්‍රකාශන 2021 |
| 22 | 2021.12.15 | 2021/16 | 2022 වර්ෂය තුලදී වැටුප් හා අත්තිකාරම් ගෙවීම. |

## හඳුන්වා දී ඇති නව ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම්

- වත්කම් කළමනාකරණ මෘදුකාංගය (AMS) යාවත්කාලීනව පවත්වාගෙන යාමට මෙම වසර තුල ද කටයුතු කළ අතර ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා මඟ පෙන්වීම් විවිධ වැඩසටහන් හරහා ලබා දෙන ලදී. උතුරු මැද පළාත් සභාව සතු වත්කම් ලේඛන ගත කිරීම හා ගිණුම් තැබීම පහසු කිරීම සඳහා මෙම මෘදුකාංගය හඳුන්වා දුන් අතර ආයතන විසින් අත්පත් කර ගන්නා වත්කම් ලේඛන ගත කිරීමත්, එසේ අත්පත් කර ගත් වත්කම් විවිධ අංශ අතර බෙදා හැරීමටත්, වත්කම් අපහරණය කිරීමේදීත් අවශ්‍ය වාර්ථා ලබා ගැනීමටත් මෙම වැඩසටහන තුලින් පහසුකම් සැලසී ඇත. මෙමඟින් වත්කම් වාර්ථාකරණය කාර්යක්ෂම හා විධිමත් කිරීම, වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම, නිෂ්ක්‍රිය හා අභාවිත වත්කම් හඳුනා ගැනීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

- 2021 වර්ෂය සඳහා ද අඛණ්ඩව නව සිගාස් 7.2 වැඩසටහන් සහ වැටුප් සැකසීමේ වැඩසටහන් සංවිධානය කරමින් පළාත තුල අවශ්‍ය දැනුම ලබා දෙන ලදී.

- 2021 වර්ෂය තුලදී මුල් මාස අට සඳහා අතුරු සම්මත ගිණුම් මගින් ප්‍රතිපාදන ලබාදීම ද ඉතිරි මාස සඳහා විසර්ජන ප්‍රඥප්තිය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීම ද සිදු කරන ලද අතර පැවති COVID 19 වසංගත තත්වය හමුවේ විවිධ වූ ක්‍රමෝපායන් භාවිතා කරමින් පළාත් සභාවට අයත් අමාත්‍යංශ, දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත අයතන වල නිලධාරින් දැනුවත් කිරීම සිදු කරන ලදී.




ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන රාජ්‍ය අංශයේ හොඳම වාර්ෂික වාර්තාව තේරීමේ තරගාවලියේදී, 2019 වර්ෂයේ දිවයිනේ සියලුම පළාත් සභා අභිබවා විශිෂ්ඨතම වාර්ෂික වාර්තාවට හිමි රන් සම්මානය උතුරු මැද පළාත් සභාව 2021.12.29 දින දිනාගත් අවස්ථාව.

## කාර්ය සාධන දර්ශක ලබා කර ගැනීමේ ප්‍රගතිය

| අනු අංකය | ආයතනයේ අරමුණු | කාර්යසාධන දර්ශක | ලබා කර ගැනීමේ ප්‍රගතිය ( 2021) |
|---|---|---|---|
| | | **අයවැය දෙපාර්තමේන්තුව** | |
| 01 | පළාත තුල සියලුම ආයතනයන්හි ක්‍රමවත් අයවැය පාලනයක් සඳහා සහය වීම. | 10% කින් ප්‍රතිපාදන මාරු කිරීම් අවම කිරීම, ප්‍රශස්ථ ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇති කිරීම. | 60% කින් පමණ අඩුකර ගැනීමට හැකි වී ඇත |
| 02 | සියලු ආයතන සම්බන්ධීකරණයක් ඇති කිරීම. | 100% නිවැරදි කාර්ය මණ්ඩල දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම. | 100% නිවැරදි කර ගැනීමට හැකි වී ඇත |
| | | **ආදායම් හා මුදල් දෙපාර්තමේන්තුව** | |
| 03 | මනා මූල්‍ය පාලනයක් තුළින් මුදල් ප්‍රකාශය මඟින් වෙන් කරනු ලබන මුදල් උතුරු මැද පළාතේ ජනතාවගේ සුභ සිද්ධිය සඳහා යෙදෙවෙන බවට තහවුරු කිරීම. | ආයතන වලට යොමුවන විගණන විමසුම් ප්‍රමාණය 20% කින් අවම කිරීම. | 10% කින් පමණ අඩුකර ගැනීමට හැකි වී ඇත |
| | | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ අභියාචනා දුක්ගැනිවිලි 60% කින් අවම කිරීම. | 80% ක් අඩු කිරීමට හැකි වී ඇත. |
| | | පළාත් සභා සතු සියලු වත්කම් වලින් 50% ක් වත් ලේඛන ගත කිරීම. | 65% ක් පමණ වත්කම් ලේඛණගත කර ඇත. |
| | | පළාත් සභාව යටතේ ඇති ආයතන වලින් 80% ඊලඟ වර්ෂයේ මාර්තු 31 වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කිරීම. | 70%ක් පමණ අවසන් වීඇත. |
| 04 | පළාත් සභාවට ලැබිය යුතු ආදායම් පිළිබඳ මනා පාලනයක් තබා ගනිමින් සභාවට ලැබිය යුතු සියලු ආදායම් නිසි ලෙස එක් රැස් කර ගැනිම. | සියලු ආදායම් ශීර්ෂවල ඇස්තමේන්තුගත ආදායමෙන් 80%ක මට්ටමක්වත් අවම ලෙස එකතු කර ගැනීම. | 91% ක් පමණ මට්ටමකට ආදායම් එකතු කර ගැනීමට හැකි වී ඇත. |
| | | ආදායම් ගිණුම් හා සම්බන්ධ විගණන විමසුම් 20% කින් අඩු කර ගැනීම. | 20% ක් පමණ අඩුකර ගැනීමට හැකි වී ඇත |
| | | පළාත් සභාව වෙතින් ප්‍රාදේශිය සභා වෙත ප්‍රේශණය වන ආදායම් ඉල්ලීම් ලැබි මසක් ඇතුලත ඔවුන් වෙත ලබා දීම. | නියමිත දිනට ලබා දී ඇත. |
| | | **ගිණුම් හා ගෙවීම් දෙපාර්තමේන්තුව** | |
| 05 | උතුරු මැද පළාත් සභාව සඳහා තීරණ ගැනීමට අවශ්‍ය පාර්ශවයන් වෙත නිවැරදි සහ සත්‍ය තොරතුරු ලබා දීම. | පළාතේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික ගිණුම් සියල්ල නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීම. | 100% නියමිත දිනට ලබා දී ඇත. |
| | | ගිණුම්වල නොසැසදීම්, ගිණුම් දෝෂ 10% දක්වා අවම කිරීම. | 90% ක මට්ටමකට අවම කරගෙන ඇත |
| | | **පරිපාලන හා ගිණුම් අංශය** | |
| 06 | පළාත් භාණ්ඩාගාරයේ මූල්‍ය හා ආයතනික කටයුතු මනා කළමනාකාරිත්වයකින් යුක්තව පවත්වාගෙන යාම. | විගණන විමසුම 30%කින් අඩු කිරීම. | 25% කින් පමණ විගණන විමසුම් අඩු කරගෙන ඇත. |
| | | අයවැය ඇස්තමේන්තු කලට වේලාවට පිළියෙල කිරීම. | නියමිත දිනට පිළියෙල කර ඉදිරිපත් කරන ලදී |
| | | මූල්‍ය ප්‍රකශන නියමිත දිනට ඉදිරිපත් කිරීම. | නියමිත දිනට පිළියෙල කර ඉදිරිපත් කරන ලදී |

## දැක්ම කරා ලඟා වීමේ හා ප්‍රධාන අරමුණු ලඟා කර ගැනීමේ ප්‍රගතිය

උතුරු මැද පළාත සංවර්ධිත පළාතක් කිරීම උදෙසා පළාත් භාණ්ඩාගාරය විසින් මූල්‍ය ප්‍රතිපාදන සකසා ගත යුතුව ඇත. එහි දී රාජ්‍ය භාණ්ඩාගාරයෙන් සෘජුව ප්‍රතිපාදන ලබා ගැනීමට මැදිහත් වන්නාසේ ම විදේශීය අරමුදල්, විදේශීය ණය ආධාර සහ වෙනත් රේඛීය අමාත්‍යාංශ වෙතින් ලබාදෙන ප්‍රතිපාදනවල අතර මැදි වශයෙන් කටයුතු කිරීම පළාත් භාණ්ඩාගාරයේ කාර්යයභාරයයි.

## මූල්‍ය ප්‍රතිපාදන සාරාංශය

2021 වර්ෂයේ පළාතේ සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම හා ඒ වෙනුවෙන් වැයවන වියදම් වෙනුවෙන් සකසන ලද අයවැය ඇස්තමේන්තුවේ සාරාංශය.

| ලැබීම් | | මුදල (රු.මි) |
|---|---|---|
| 1 | රජයෙන් ලැබුණු ප්‍රදාන | |
| | I. සාමූහික ප්‍රදාන | 20,257.00 |
| | II. පළාත් සභා සංවර්ධන ප්‍රදාන | 570.00 |
| | III. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 2,850.00 |
| | IV. විදේශ සහයෝගිතා ව්‍යාපෘති | |
| | පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති | 230.00 |
| | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘති | 330.00 |
| | V රේඛීය අමාත්‍යාංශ ලැබීම් හා වෙනත් ලැබීම් | 1,400.00 |
| 2 | ආදායම් ලැබීම් | |
| | I. මධ්‍යම රජය විසින් මාරු කිරීමට අපේක්ෂිත ආදායම් | 700.00 |
| | II. පළාත තුලින් රැස් කරනු ලබන ආදායම් | 1,451.00 |
| | III.පළාත් පාලන ආයතන වෙත මාරු කිරීම | 500.00 |
| 3 | විවිධ අත්තිකාරම් ගිණුම් යටතේ අපේක්ෂිත ලැබීම් | 731.95 |
| | **එකතුව** | **29,019.95** |
| **වියදම්** | | |
| 1 | පුනරාවර්තන වියදම් | 22,720.98 |
| 2 | මූලධන වියදම් | 5,515.00 |
| 3 | අත්තිකාරම් ගිණුම් යටතේ වියදම් | 783.97 |
| | **එකතුව** | **29,019.95** |

## 2021 වර්ෂයේ උතුරු මැද පළාතේ මූල්‍ය විශ්ලේෂණය







## තිරසර සංවර්ධන අරමුණු

පළාත් භාණ්ඩාගාරය ලෙස ආර්ථිකයට හෝ සමාජයට සෘජුව ම දායක වන කාර්යයන් ඉටු කරනු නොලැබෙන නමුත් ආර්ථික හා සමාජීය වශයෙන් සෘජුව ම දායක වන රේඛීය කාර්යන් ඉටු කරනු ලබන සියලුම ආයතන (උදාහරණ ලෙස සෞඛ්‍ය , අධ්‍යාපන, කෘෂිකර්ම හා කර්මාන්ත යනාදී ) සඳහා සහයක සේවාවන් සපයන බැවින් නිෂ්චිත වූ තිරසර සංවර්ධන ඉලක්ක සෘජුවම හඳුනාගැනීම කළ නොහැක.

නමුත් රේඛීය ආයතන විසින් එම ආයතන වල තිරසර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීමට අවශ්‍ය මූල්‍ය කළමනාකරණමය සහය, පළාත් භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත.

ඒ අනුව පළාත් සභාවේ රේඛීය අධිකාරිය හිමි අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වලට අදාලව අයවැය පාලනය සඳහා පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ නිකුත් කිරීම, පළාත තුල ප්‍රසම්පාදන කටයුතු වලට අදාලව චක්‍රලේඛ නිකුත් කිරීම හා පළාතේ මුදල් වියදම් කිරීමට අදාලවන විධිවිධාන ඇතුලත් චක්‍රලේඛ නිකුත් කිරීම පළාත් භණ්ඩාගාරය විසින් සිදුකරනු ලබන හෙයින් ඒ තුලින් පළාතේ ජනතාවගේ දරිද්‍රතාවය අඩුකිරීම, නිෂ්පාදන වැඩි කිරීම, ආර්ථික වර්ධනය ඇති කිරීම, රාජ්‍ය වියදම් අඩුකිරීම, තිරසර පරිභෝජනය තහවුරු කිරීම ආදිය සඳහා පළාත් භාණ්ඩාගාරය විසින් දායකත්වය ලබා දෙනු ලබයි.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

නිලධාරීන් චක්‍රීය පදනමින් සේවයට සඳහා පැමිණීම, නිවසේ සිට රාජකාරී කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම වැනි කරුණු හේතුවෙන් ආයතනික වශයෙන් දුෂ්කරතා ඇති විය. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ උතුර මැද පළාත වශයෙන් කොවිඩ් 19 ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ක්‍රියාකාරීව මැදිහත් වීමට සිදු විය. මීට අමතරව COVID 19 ව්‍යාප්තිය සමග අපේක්ෂිත ආදායම් ලැබීමේ අඩුවිය. නියමිත කාල වකවානු වලදී, අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මට්ටමින් භාණ්ඩාගාරයට එවිය යුතු වාර්තා නියමිත දිනට

නොලැබිණි. සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතියට සාපේක්ෂව අක්මුදල් නොලැබිණි. පුනරාවර්තන වියදම් දැරීම අත්‍යාවශ්‍ය කාර්යන්ට පමණක් සීමා විය. 2021 වර්ෂයේ අග භාගයේ දී ද COVID 19 ව්‍යාප්තිය හේතුවෙන් ගිණුම් පියවීමට අදාල නිලධාරීන් ස්වයං නිරෝධායනයට යොමු කිරීම හා කාර්යාල පරිශ්‍ර විවෘත නොකිරීම වැනි අභියෝග හමුවේ 2021 වර්ෂය සඳහා වූ ගිණුම් පියවීමේ කටයුතු කිරීමට සිදු විය.

සමස්තයක් වශයෙන් ගත්විට ගෝලීය වසංගත තත්වයක් හමුවේ වුව ද 2021 වර්ෂය වෙනුවෙන් අයවැය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිමේ දී, මූල්‍ය වාර්තාකරණයේ දී හා මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලියේ දී පවතින සම්පත් කාර්යක්ෂමව හා ඵලදායීව ප්‍රශස්ථ ආකාරයට උපයෝජනය කිරීම මඟින් සාර්ථක ප්‍රතිඵල ලඟා කර ගැනිමට හැකිවිය.

## ආදායම් ඉපයිම

| ශිර්ෂය | ඇස්තමේන්තු වටිනාකම (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරිමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 10.02.05.04 මෝටර් රථ ලියා පදිංචි ගාස්තු | 100.00 | 64.90 | 65% |
| 10.02.07.00 මුද්දර ආදායම | 600.00 | 469.97 | 79% |
| 10.02.12.00 ජාතිය ගොඩ නැඟිමේ බද්ද | - | 95.22 | - |
| 10.03.07.09 වෙනත් බලපත්‍ර ගාස්තු | 0.010 | 0.001 | 11% |
| 20.02.01.01 නිවාස කුලී | 35.00 | 36.66 | 105% |
| 20.02.02.02 රජයේ නිලධාරීන්ගේ ණය සහ අත්තිකාරම් පොළී | 84.54 | 75.35 | 90% |
| 20.02.02.03 ආයෝජන පොළී | 75.00 | 132.14 | 177% |
| 20.03.02.99 විවිධ ලැබීම් | 150.00 | 92.22 | 62% |
| 20.06.02.00 භාවිතයට නොගන්නා ප්‍රාග්ධන වත්කම් විකිණීම | 4.70 | 3.59 | 77% |
| එකතුව | 1,049.25 | 884.36 | 85% |

# 5.3.පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් ආවරණය කරනු ලබන ප්‍රදේශයන්.




## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

උතුරු මැද පළාතේ සියලු අමාත්‍යාංශ හා අනෙකුත් ආයතන වලට අයත් ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු වලට අදාල ඉංජිනේරුමය කාර්යයන් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි. ගුණාත්මක හා ජනහිතකාමී ඉංජිනේරුමය ක්‍රියාවලියක් සහතික කරලනු වස් 1999 ජනවාරි මස 01 වන දින ආරම්භ කළ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ව්‍යුහයන්ගෙන් සමන්විත වේ.

1999 ජනවාරි මස 01 වන දින ආරම්භ කළ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ව්‍යුහයන්ගෙන් සමන්විත වේ.

01. ප්‍රධාන කාර්යාලය
02. අධ්‍යක්ෂ කාර්යාලය
03. තත්ව පාලන ඒකකය
04. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- අනුරාධපුර
05. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- මැදවච්චිය
06. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- මහඉලුප්පල්ලම
07. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- කැකිරාව
08. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- මින්නේරිය
09. ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය- පොළොන්නරුව

## ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

| අනු අංකය | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය | ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස |
|---|---|---|
| 01 | අනුරාධපුර | නැගෙනහිර නුවර ගම් පළාත |
| | | මධ්‍යම නුවර ගම් පළාත |
| | | තලාව |
| | | විලච්චිය |
| | | නොච්චියාගම |
| 02 | මැදවච්චිය | පදවිය |
| | | කැබිතිගොල්ලෑව |
| | | මැදවච්චිය |
| | | රඹෑව |
| | | හොරොව්පතාන |
| | | කහටගස්දිගිලිය |
| | | මිහින්තලේ |
| 03 | කැකිරාව | කැකිරාව |
| | | තිරප්පනේ |
| | | ගලෙන්බිඳුණුවැව |
| | | පළුගස්වැව |
| 04 | මහඉළුප්පල්ලම | රාජාංගනය |
| | | තඹුත්තේගම |
| | | ඉපලෝගම |
| | | ගල්නෑව |
| | | පලාගල |
| 05 | මින්නේරිය | මැදිරිගිරිය |
| | | හිඟුරක්ගොඩ |
| | | ඇළහැර |
| 06 | පොළොන්නරුව | තමන්කඩුව |
| | | ලංකාපුර |
| | | දිඹුලාගල |

### දැක්ම

"ගුණාත්මක හා ජනහිතකාමී ඉංජිනේරු ක්‍රියාවලියක්, සෞභාග්‍යමත් පළාතක්"

### මෙහෙවර

"ඉංජිනේරුමය කටයුතු නවීන තාක්ෂණය භාවිතයෙන්, සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිද භාවයකින් යුක්තව සංවර්ධනය කිරීම"

### දිගුකාලීන අරමුණු

1.තිරසාර පැවැත්මක් ඇති ඉදිකිරීම් පද්ධතියක් ඇති කිරීම උදෙසා තාක්ෂණ කාර්ය මණ්ඩල ශක්තිමත් කිරීම.

2.දිර්ඝකාලීන ප්‍රශස්ත ප්‍රතිඵලයක් ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණ ශක්‍යතාව ලබා ගැනීම හා පද්ධතීන් දියුණු කිරීම.

### කෙටිකාලීන අරමුණු

1. නිර්මාන හා සැලසුම් නිවින තත්ත්වයන්ට අනුව තිරසාර පැවැත්ම තහවුරු වන පරිදි පවත්වා ගැනිම.
2. ඉදිකිරීම් නිර්මාන හා ඇස්තමේන්තු ප්‍රසම්පාදන සැලසුමට අනුව නියමිත කාලයට ඉදිරිපත් කිරීම
3. විධිමත් තත්ත්ව පාලන ක්‍රියාවලියක් පවත්වා ගැනීම
4. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරුමය කටයුතු විධිමත්ව පවත්වා ගැනිම.
5. කාලීන දැනුමින් සන්නද්ධ කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම.

### ප්‍රධාන කාර්යයන්

1. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මූලික ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම.
2. නව ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
3. නව ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල ව්‍යුහගත සැලසුම්, විදුලි සැලසුම් හා ගොඩනැගිලි සේවා සැලසුම් සකස් කිරීම.
4. අලුත්වැඩියා, නවීකරණ හා නව ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල ඇස්තමේන්තු සැකසීම.
5. ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම.
6. ඉදිකිරීම් අධීක්ෂනය හා කොන්ත්‍රාත් කළමනාකරණය.
7. ඉදිකිරීම්වල තත්ත්ව පාලනය හා තත්ත්වය සහතික කිරීම.
8. ඉංජිනේරුමය උපදේශාත්මක සේවාවන් ලබාදීම.
9. උතුරු මැද පළාතේ ගොඩනැගිලි වාරිමාර්ග හා තත්ත්ව පාලන කටයුතුවලට අදාල මිල ගණන් සකස් කිරීම.
10. ඉංජිනේරු, තාක්ෂණ ශිල්පි, ප්‍රමාණ සමීක්ෂක, සැලසුම් ශිල්පි හා වැඩ පරිපාලක, ක්ෂේත්‍රවල ආධුනිකයන් සඳහා පුහුණුව ලබාදීම.

## ප්‍රධාන උපාය මාර්ගය

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යයන් සිදු කිරිම සඳහා විෂය පථයන් එක් එක් අංශය සඳහා විමධ්‍යගත කර එම අංග සඳහා ප්‍රධාන නිලධාරියෙකු පත් කර වගකිව යුතු නිලධාරියෙකු පත් කිරිම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 200ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 155කි. පුරප්පාඩු සංඛ්‍යාව 45 ක් වේ.

## මුලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2021 වර්ෂයේ වියදම | ඉතිරිය | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගොඩනැඟිලි සහ ඉදි කිරීම. | 4.0 | 3.99 | 0.002 | 99 |
| 2. යන්ත්‍ර සූත්‍ර සවි කිරිම හා උපකරණ | 2.5 | 2.34 | 0.16 | 94 |
| 3. වාහන | 0.5 | 0.42 | 0.08 | 84 |
| 4. වෙනත් මුලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරිම | 3.0 | 2.98 | 0.02 | 99 |
| **එකතුව** | **10** | **9.73** | **0.26** | **98** |

## 1. පළාත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කාර්යාලය

### සැලසුම් අංශය

උතුරු මැද පළාත්, පළාත තුළ ඉදිවන භෞතික ඉදිකිරිම් ගුණාත්මක හා ජනහිතකාමී ලෙස නවීන තාක්ෂණය භාවිතයෙන් ප්‍රශස්ත ලෙස සැලසුම් කිරිම හා ඉදිකිරිම් අධීක්ෂණය කිරිම පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සැලසුම් අංශයේ මූලික අරමුණු වේ.

පළාත් සභාව තුල පිහිටා ඇති සියලුම දෙපාර්තමේන්තුවල ඉදිකිරිම් අවශ්‍යතාවය පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධානී, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත ලැබීමෙන් පසු අපගේ කාර්යභාරය ආරම්භ වේ. සේවාදායකයාගේ අවශ්‍යතාවය නියෝජ්‍ය ප්රධාන ලේකම් (ඉංජිනේරු) විසින්, අධ්‍යක්ෂ (සැලසුම්) වෙත ලබාදීමෙන් පසු අදාල වාස්තු විද්‍යාඥයා වෙත යොමු කෙරේ.

මිනින්දෝරු සැලැස්ම සහ ඉල්ලීම් ලැයිස්තුව ලබාගැනීමෙන් අනතුරුව, වාස්තු විද්‍යාඥ ඉන් අනතුරුව සේවා දායකයාගේ ඉල්ලීම් ලැයිස්තුව අධ්‍යයනය කොට වාස්තු විද්‍යාත්මක අවකාශ ලැයිස්තුවක් නිර්මාණය කරන අතර, එය සැලසුම්කරණයේ මූලික අදියර වේ. පසුව අනුමත කරන ලද අවකාශ ලැයිස්තුව උපයෝගී කරගෙන යෝජිත බිමෙහි නිර්මිත පරිසරයක් බිහිකිරිම වාස්තු විද්‍යාඥයා මගින් කරන ලද ක්ෂේත්‍ර පරික්ෂණ එකක් හෝ කීහිපයක් මගින් සිදු කරයි. සංකල්පමය රූප තාත්වීකරණය කරමින් වාස්තු විද්‍යාඥයා විසින් සිදුකරනු ලබන මූලික සැලසුම් ඉනික්බිති සේවාදායකයාගේ අනුමැතිය සඳහා යොමුකරන අතර වාර කිහිපයක් කරන ලද සංශෝධන මගින් සේවාදායකයා තෘප්තිමත් වනතුරු සැලසුම් සංවර්ධනය කර අවසානයේ දී අනුමත වූ සැලසුම සබැඳි අනෙකුත් අංශ වන ව්‍යුහගත සැලසුම්/ විදුලි සැලසුම් හා ගොඩනැගිලි සේවා සැලසුම් වෙත යොමු කෙරේ.

වාස්තු විද්‍යාත්මක සැලසුම් නිමකිරීමෙන් අනතුරුව ගොඩනැගිල්ලක ව්‍යුහගත සැලසුම් සිදුකිරීම ආරම්භ වේ. මෙහිදී, ගොඩනැගිල්ලේ එක් එක් කොටසේ භාවිතය හා වාස්තු විද්‍යාත්මක අවකාශ පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් මූලික ව්‍යුහගත සැලසුම් සකස් කරදීම ප්‍රථමයෙන්ම සිදු කෙරේ.

මීට සමගාමීව ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිත භූමිය පරික්ෂා කර බලා, ගොඩනැගිල්ලේ විශාලත්වය හා මහල් ගණන අනුව සුදුසු පාංශු පරික්ෂාවක් සිදු කරගනු ලැබේ. මෙමගින් අදාල ගොඩනැගිල්ලට වඩාත්ම සුදුසු අත්තිවාරම් වර්ගයක් භූමියට ගැලපෙන අයුරින් යොදා ගැනීමේ අවකාශ සැලසේ. අනතුරුව, ගොඩනැගිල්ල මත යෙදෙන සියලුම බලයන් සැලකිල්ලට ගනිමින්, එහි ව්‍යුහයේ ක්‍රියාකාරිත්වය පරිගණක මෘදුකාංගයක් මගින් අධ්‍යයනය කරනු ලබන අතර, පසුව එක් එක් ව්‍යුහගත අංගයන් ගණනය කිරීම මගින් සැලසුම් කර නිමකරනු ලැබේ. මෙම ක්‍රියාවලිය ජාත්‍යන්තර සැලසුම් නිර්ණායන් වලට අනුකූලව ඉතාමත් ආරක්ෂිත, ස්ථායි හා ප්‍රශස්ත ලෙස සිදුකිරීම ව්‍යුහගත සැලසුම් අංශය මගින් සිදු කරයි.

වාස්තු විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කරන ලද සැලසුම්වලට අනුකූලව දළ විදුලි සැලසුම් සකස් කිරීම විදුලි ඉංජිනේරු විසින් ඉටුකරනු ලබයි. දළ විදුලි සැලසුම් හා ගොඩනැගිලි සේවා ඉංජිනේරු වෙතින් ලබාගන්නා ලද වායු සමීකරණ අවශ්‍යතාවය සලකා බලා ගණනය කිරීම් සිදුකොට ගොඩනැගිල්ලේ අවශ්‍යතාවයන් ප්‍රශස්ත ලෙස ඉටුකර ගැනීමට අදාල විදුලි පරිපථ සැලසුම් ඇඳීම විදුලි ඉංජිනේරුගේ කාර්යභාර්යන් අතර මුල් තැන ගනී. මෙහි දී විදුලි අනතුරු සිදු නොවන ලෙස හා සේවාදායකයා තෘප්තිමත් වන ලෙස සැලසුම් ඉදිරිපත් කිරීම ප්‍රධාන අවශ්‍යතාවයකි. ඉදිකිරීම් කටයුතු අතරතුර නිරික්ෂණ කටයුතු සිදුකිරීම හා අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකරනු ලැබේ. පරිපථ ඇඳීම සිදුකිරීමෙන් අනතුරුව පරිපථ සක්‍රිය කර නිවැරදි ලෙස හා අදාල සම්මතයන්ට අනුකූලව රැහැන් ඇදීමේ කර්තව්‍යය ඉටුකොට ඇතිදැයි පරික්ෂා කිරීම සිදුකරනු ලැබේ.

**ඉදිකිරීම් අංශය**

ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල ඇස්තමේන්තු සකස් කිරීම, ප්‍රසම්පාදන ලේඛන සකස් කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම, කොන්ත්‍රාත් පරිපාලනය වාර්ෂික මිල ලේඛනය සකස් කිරීම ඉදිකිරීම් අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

සැලසුම් අංශය මඟින් සකස් කරනු ලබන වාස්තු විද්‍යාත්මක අනුමත ව්‍යුහගත සැලසුම්වලට අනුකූලව, එම සැලසුම් අවසාන නිමවුමක් බවට පත්කිරීමට අවශ්‍ය සියලු අයිතමයන් හඳුනාගෙන එක් එක් අයිතමයන් සඳහා ප්‍රමාණ ගණනය කරනු ලැබේ. එම සියලු අයිතමයන් ඇතුලත්කර ඇස්තමේන්තු සකස් කරනු ලැබේ. ව්‍යාපෘති ඇස්තමේන්තු මිල ගණන් අනුව නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් ප්‍රසම්පාදන ලේඛන සකස් කරනු ලැබේ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය මෙහෙයවීම මඟින් සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම සිදුකරනු ලබයි. ඉදිකිරීම් ව්‍යාපෘතියකට අදාලව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගතවීමෙන් අනතුරුව ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු ඉටුකර ගැනීමට අදාල කොන්ත්‍රාත් පරිපාලනය අධීක්ෂනය කිරීම ප්‍රගතිය යාවත්කාලීන කිරීම හා අවශ්‍ය ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම ඉදිකිරීම් අංශය මඟින් ඉටුකරනු ලබයි.

උතුරු මැද පළාත තුල සියලු ඉදිකිරීම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කරනු ලබන වාර්ෂික මිල ලේඛනය සකස් කිරීම ඉදිකිරීම් අංශයේ ප්‍රධාන කාර්යයකි. අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික් මිල කමිටු වාර්තා පදනම් කරගනිමින් මූලික ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා වන මිල ගණන් තීරණය කරනු ලබයි. ඉදිකිරීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා පළාත තුල පිහිටි වෙළෙඳ හා නිෂ්පාදන ආයතන මෙන්ම දිවයිනේ අනෙකුත් නිෂ්පාදන ආයතන මෙහිදී මිල ගණන් කැඳවා සුදුසු මිල ගණන් තිරණය කරනු ලැබේ. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු, සිවිල් ඉංජිනේරුවරුන්, විදුලි ඉංජිනේරුවරුන්, ගොඩනැගිලි සේවා ඉංජිනේරුවරුන්, වාස්තු විද්‍යාඥවරුන්, ප්‍රමාණ සමික්ෂණවරුන්, තාක්ෂණ නිළධාරින්, සැලසුම් ශිල්පීන්ගේ සමන්විත කමිටුවක් මඟින් ඉහත මිල ගණන් සකස් කිරීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබයි.

## 2.ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල

පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය ප්‍රාදේශීය මට්ටමේදී ඉටුකරනු ලබන්නේ ප්‍රාදේශීය ඉංජිනේරුවරයාගේ මූලිකත්වයෙන් යුතු ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල මගිනි. ඇස්තමේන්තු සකස් කිරීම, ඉදිකිරීම් අධීක්ෂනය හා කොන්ත්‍රාත් පරිපාලනය ඉංජිනේරු නියෝජිත ලෙස ඉටුකරනු ලබන්නේ ප්‍රාදේශීය කාර්යාල මගිනි.

## 3.තත්ත්ව පාලන අංශය

උතුරු මැද පළාත තුල සිදුකරන ඉංජිනේරුමය කාර්යයන් වල ගුනාත්මකභාවය තහවුරු කිරීමේ අරමුණින් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කැකිරාව ඉදිකිරීම් ද්‍රව්‍ය පරික්ෂණාගාරය පිහිටුවා ඇත. මෙමගින් ඉදිකිරීම් කර්මාන්තයේදී භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයන්හි (පස්, වැලි, ගල්, සිමෙන්ති, යකඩ, ඇලුමිනියම්......) තත්වය පරික්ෂා කරන අතර, ඉදිකිරීම් කරගෙන යාමේදී හා ඉදිකිරීමෙන් පසු ඒවායේ තත්වය පරික්ෂා කිරීමද, මෙම ඒකකය විසින් සිදුකරනු ලබයි. වර්තමානය වන විට විවිධ ප්‍රමිතීන්ට අනුකූලව පහත සඳහන් පරික්ෂණ අප ආයතනයට සිදුකිරීමේ හැකියාව පවතී.

## 4.යාන්ත්‍රික ඉංජිනේරු අංශය

උතුරු මැද පළාත් සභාව යාන්ත්‍රික ඉංජිනේරුවරුන් දෙදෙනෙකුගේ සේවය මේ වන විට සක්‍රියව ලබා ගනු ලබයි.මින් එක් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුබද්ධිතවත්, අනෙක් යාන්ත්‍රික ඉංජිනේරුවරයා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවට අනුබද්ධිතවත් රාජකාරි කටයුතු සිදු කරනු ලබයි.

මෙම යාන්ත්‍රික ඉංජිනේරු කටයුතු යටතේ විශාල කාර්යභාර්යන් ප්‍රමාණයක් වාර්ෂිකව ඉටු කරනු ලබන බව පෙන්වා දෙන අතර, උතුරු මැද පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් මනාව අධික්ෂණය කිරිමටත්, එම කාර්යයන් ගුණාත්මකභාවයෙන් යුක්තව සිදු කර ගැනීමටත් මෙම ඉංජිනේරුමය අධික්ෂණය මනා පිටිවහලක් වේ. මෙම යාන්ත්‍රික ඉංජිනේරුමය කාර්යයන් විශාල පරාසයක් තුල පැතිරී පවතී.

### *අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු අංක - 09*

**සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරි ගැන්වීම.**




**9.4. 2030 වන විට යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ කර්මාන්ත තිරසර කිරීම සඳහා නව තාක්ෂණය මගින් සංවර්ධනය කිරීම, කර්මාන්ත ක්‍රියාවලියේදී සම්පත් කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම වැඩිදියුණු කිරීම සහ පිරිසිදු සහ පරිසරයට සුදුසු ගුණාත්මකභාවයෙන් ඉහළ තාක්ෂණයන් උපයෝගි කර ගැනීම.**

**9.5. විද්‍යාත්මක පර්යේෂණ වැඩි දියුණු කිරිම.**

### පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් සපයන සේවාවන්.

01. වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
02. ව්‍යුහගත සැලසුම් සකස් කිරීම.
03. ඇස්තමේන්තු සකස් කිරීම.
04. ප්‍රසම්පාදන කටයුතු.
05. කොන්ත්‍රාත් කළමනාකරණය.
06. තත්ත්ව සහතික ලබා දීම.
07. තාක්ෂණික නිලධාරීන් හා කොන්ත්‍රාත්කරුවන් සඳහා දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ සේවාදායක ආයතන**

01. පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
02. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
03. පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව
04. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
05. පළාත් සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව
06. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව
07. පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
08. පළාත් ආදායම් දෙපාර්තමේන්තුව
09. ප්‍රධාන ලේකම් කාර්යාලය
10. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
11. මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය
12. මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු
13. මණ්ඩල සහ සංස්ථා

**පළාතේ සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රමුඛ කාර්යයක් වන ඉදි කිරීම්වල ගුණත්වය ආරක්ෂා කිරිම සඳහා තත්ත්ව පාලන ඒකකයේ දායකත්වය**

තත්ත්ව පාලන ඒකකය මගින් පාංශු පරීක්ෂා, කොන්ක්‍රීට් පරීක්ෂා, සමස්ත (Aggregate) පරීක්ෂා, ඇළුමිණියම් පරීක්ෂාවන් හා අනෙකුත් පරීක්ෂණ සිදු කරනු ලබයි. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සභා, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ උපදේශක කාර්යංශය, පෞද්ගලික ආයතන හා උතුරු හා මධ්‍යම පළාතට අයත් ආයතන තත්ත්ව පාලන සේවා ලබා ගන්නා ආයතන අතර වේ. උතුරු මැද පළාත තුල සිදුකරන ඉංජිනේරුමය කාර්යයන් වල ගුණාත්මකභාවය තහවුරු කිරීමේ අරමුණින් පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කැකිරාව ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරය පිහිටුවා ඇත. මෙමගින් ඉදිකිරීම් කර්මාන්තයේදී භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයන්හි (පස්, වැලි, ගල්, සිමෙන්ති, යකඩ, ඇලුමිනියම්......) තත්වය පරීක්ෂා කරන අතර, ඉදිකිරීම් කරගෙන යාමේදී හා ඉදිකිරීමෙන් පසු ඒවායේ තත්වය පරීක්ෂා කිරීමද, මෙම ඒකකය විසින් සිදුකරනු ලබයි. වර්තමානය වන විට විවිධ ප්‍රමිතීන්ට අනුකූලව පහත සඳහන් පරීක්ෂණ අප ආයතනයට සිදුකිරීමේ හැකියාව පවතී.

සිදු කරනු ලබන විවිධ පරීක්ෂණ වර්ග වන්නේ Partical size distribution (Earth) , Partical size distribution (Metal, Sand, ABC),Field density test ,Consistency limits (LL,PL) ,Standard proctor compaction test ,Modified proctor compaction test ,California Bearing Ratio test, Compressive strength of interlock blocks ,Concrete cube test (Casted by laboratory staff), Concrete cube test (Casted by Consultant or Contractor),Compressive strength of cement blocks-without cappin ,Rebound hammer test(NDT)(for 0.09m2 area) ,Measurement of pipes & steel bars (per sample) ,Aggregate impact value ,Aggregate crushing value,Los Angeles Abrasion value ,Flakiness index (Including sieve analysis test) ,Elongation index (Including sieve analysis test) ,Compressive strength of bricks , Dimension & water absorption of bricks, Detailed Sectional Thickness of Zink Aluminum Sheet යනාදියයි.

කැකිරාව ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරය සැමවිටම සේවාලාභීන්ට පහසු, කාර්යක්ෂම, විශ්වාසනීය හා නිවැරදි වූ සේවාවක් ලබාදීමට ඇප කැප වූ ආයතනයකි. අප ආයතනයට පැමිණෙන සේවාලාභීන්ගේ ගෙවීම් කටයුතු පහසුව සඳහා ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවීම් සිදුකර අදාළ ලදුපත අප ආයතනය වෙත Viber, Whatsapp හෝ E-mail මඟින් යොමුකර ආයතනයට නොපැමිණ ගෙවීම් කිරීමේ පහසුව සලසා ඇත. එබැවින් ඉදිකිරීම් පරීක්ෂණාගාරය පළාත තුළ මෙන්ම පළාතින් පිටත ආයතන ද ආකර්ෂණය කරගැනීමේ හැකියාව ලැබී ඇත.

2020 වර්ෂයේදී පළාත් තත්ත්ව පාලන ඒකකය මගින් විවිධාකාර පරීක්ෂාවන් පහළොස්දහස් හාරසිය අනු තුනක් (15,493) ක් සිදුකර ඇති අතර ඒ තුළින් රු.මි 16.5ක ශුද්ධ ආදායමක් උපයන ලදී.

## තත්ත්ව පාලන ඒකකය මගින් සිදු කරන ලද කාර්යභාරය

| පරීක්ෂා වර්ගය | ප්‍රාදේශීය සභා | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | පෞද්ගලික ආයතන | එකතුව |
|---|---|---|---|---|---|
| අමුද්‍රව්‍ය පරීක්ෂාව (Meterial Testing) | 111 | - | 27 | 203 | 341 |
| ක්ෂේත්‍ර පරීක්ෂාව (Field Testing) | 1411 | 4 | 251 | 150 | 1816 |
| කොන්ක්‍රිට් පරීක්ෂාව (Concrete Testing) | 1551 | - | 400 | 1568 | 3519 |
| අන්තර් සම්බන්ධිත කුට්ටිගල් (Inter Lock) | 6245 | 7 | 448 | 377 | 7077 |
| සිමෙන්ති ගල් (Cement Block) | 70 | - | 22 | 54 | 146 |
| Mix Design | - | - | - | - | - |
| පරීක්ෂාව (Protector) | 53 | 5 | 19 | 35 | 122 |
| ගඩොල් (Bricks) | 4 | - | - | 129 | 133 |
| **මුළු එකතුව** | **9445** | **16** | **1167** | **133** | **15493** |

## අමාත්‍යාංශ 05ට අදාල ඉදි කිරීම්වල ප්‍රගතිය - 2021

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.මි) | ගිවිසුම්ගත මුදල (රු.මි) | මුළු වියදම (රු.මි) |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යාංශය | 17 | 15 | 48 | 29.7 | 19.2 |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 31 | 25 | 166 | 103.5 | - |
| සමුපකාර අමාත්‍යාංශය | 133 | 121 | 18.9 | 86.76 | 69.4 |
| වාරිමාර්ග අමාත්‍යාංශය | 10 | 10 | 50.2 | 9.3 | 4.2 |
| ප්‍රධාන ලේකම් කාර්යාලය | 31 | 26 | 36.47 | 20.9 | 22.38 |
| ආණ්ඩුකාර කාර්යාලය | 08 | 8 | 18.2 | 8.8 | 9.2 |
| මධ්‍යම රජයේ ව්‍යාපෘති | 50 | 45 | 16.34 | 18.98 | 14.3 |
| සෞඛ්‍ය අමාත්‍යාංශය | 262 | 250 | 2029.7 | 1043.44 | 294 |
| ආයුර්වේද දෙපාර්තමේන්තුව | 28 | 26 | 121.8 | 101.68 | 53.01 |
| පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව | 33 | 32 | 105.33 | 48.07 | 30.85 |
| සමාජ සුභසාධක දෙපාර්තමේන්තුව | 19 | 18 | 50.97 | 34.13 | 19.06 |
| **එකතුව** | **622** | **576** | **2661.91** | **1505.26** | **535.6** |

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ක්‍රියාකාරිත්වය

### යාන්ත්‍රික ඉංජිනේරු රාජකාරී පරාසය

1. පළාත් සභාව සතු සියලුම වාහන වල සිදු කරනු ලබන අලුත්වැඩියාවන්, සේවා සිදුකිරීම, ටයර් හා බැටරි අලුතින් යෙදීම සඳහා තාක්ෂණික නිර්දේශයන් ලබාදීම.
2. ඉහත සඳහන් කරන ලද නිර්දේශයන්ට අනුව එම කාර්යයන් නිසි ලෙස සිදුවනවා ද යන්න පිළිබඳව නිසි අධික්ෂණය කිරිමත්, මිල ගණන් කැඳවීමෙන් අනතුරුව එම මිල ගණන් පිළිබඳ නිර්දේශ ලබාදීම හා නිර්දේශිත කාර්යයන් අවසන් වූ පසු පරික්ෂා කර වාර්තා සැපයීම සිදු කිරීම.

3. යාන්ත්‍රික ඉංජිනේරු විෂය පථයට අයත් මිලදී ගැනීම්, වැඩි දියුණුකිරීම් හා නව ඉදිකිරීම් වලට අදාලව පිරිවිතර ලබාදීම, තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා ලබාදීම හා සාම්පල් පරීක්ෂාව සිදුකිරිම.
4. වාහන වල සිදුවන අනතුරු සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂණ සිදුකිරීම, ඇස්තමේන්තු සකස් කිරීම හා අනතුරු පරීක්ෂණ වාර්තා ලබාදීම.
5. වායු සමීකරණ යන්ත්‍ර, ජෙනරේටර් යන්ත්‍ර, වතුර පොම්ප, ශීතකරණ සහ අනෙකුත් යාන්ත්‍රික උපකරණ සේවාවන් සිදුකිරීම සහ නඩත්තු කටයුතු වෙනුවෙන් නිර්දේශ ලබාදීම හා අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
6. උපදේශන සේවාවන් ද අවශ්‍යතාව මත සිදුකිරීම.

## යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ ප්‍රධාන කාර්යයන්

| අ.අ | ප්‍රධාන කාර්යයන් | උප කාර්යයන් | දර්ශක |
|---|---|---|---|
| 01 | පළාත් සභාවේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ සහ කාර්යාලවලට අදාල වාහන හා යන්ත්‍ර උපකරණවල සිදු කරනු ලබන අළුත්වැඩියාවන්, සේවාවන් අධීක්ෂණය කිරීම හා නිර්දේශ ලබා දීම | ප්‍රධාන අළුත්වැඩියාවන්, සුළු අළුත්වැඩියාවන්, සේවාවන් (මුල් පරීක්ෂාව, විසන්ධි කළ පසු පරීක්ෂාව, අමතර කොටස් පරීක්ෂාව, පසු පරීක්ෂාව, මිල ගණන්පත් ඇගයීම හා වෙනත්) | වාර්තා ගණන |
| 02 | මිලදී ගැනීම්වලට අදාල පිරිවිතර සකස් කිරීම, තාක්ෂණ කමිටු වාර්තා සැකසීම | පිරිවිතර සකස් කිරීම, තාක්ෂණික ඇගයීම් වාර්තා සකස් කිරීම, පසු වාර්තා සකස් කිරීම | වාර්තා ගණන |
| 03 | වාහන හා යන්ත්‍ර උපකරණ අපහරණ කටයුතුවලට අදාල වාර්තා සැකසීම | පරීක්ෂාවන්, වෙළෙඳපොළ මිල සැසදීම, තක්සේරු කිරිම | වාර්තා ගණන |
| 04 | අනතුරු විශ්ලේශණය, ඇස්තමේන්තු වාර්තා සැකසීම | පරීක්ෂාවන්, ඇස්තමේන්තු වාර්තා සකස් කිරීම | වාර්තා ගණන |
| 05 | ඡායා පිටපත් යන්ත්‍ර, පරිගණක යන්ත්‍ර, වායු සමීකරණ යන්ත්‍ර ඇතුළු සියළුම ඉලෙක්ට්‍රොනික උපකරණ සේවා අළුත්වැඩියා සඳහා නිර්දේශ ලබා දීම | අධීක්ෂණය, මිල සැසදීම, නිර්දේශ ලබා දීම | වාර්තා ගණන |
| 06 | පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ නඩත්තු ඒකකයට අදාල උපකාරක සේවා ඒකකය සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම | ක්ෂේත්‍ර පරීක්ෂාව, ගැටළු සාකච්ඡා කිරීම, අවශ්‍ය උපදේශන ලබා දීම, වාර්තා සැකසීම | වාර්තා ගණන, වාචික උපදේශනය |
| 07 | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන් සඳහා අවශ්‍ය උපදේශන සේවාවන් සිදු කිරීම | නඩත්තු, අළුත්වැඩියා, මිලදී ගැනීම්, වෙනත් | වාර්තා ගණන, වාචික උපදේශනය, බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම් ගණන |
| 08 | අනෙකුත් යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණික වාර්තා සකස් කිරීම | තත්ත්ව වාර්තා, තාක්ෂණික වාර්තා, භාණ්ඩ අපහරණය, භාණ්ඩ සමීක්ෂණ, අනෙකුත් | වාර්තා ගණන |
| 09 | ගොඩනැගිලි සේවා ඉංජිනේරු සැලසුම් සැකසීම සහ අවශ්‍ය උපදේශන සේවාවන් සැපයීම | වායු සමීකරණ සැලසුම, උපකාරක සේවා සැලසුම, විදුලි සැලසුම | සැලසුම් වාර්තා, පරීක්ෂණ වාර්තා, පැවරීමේ පසු වාර්තා ගණන |
| 10 | ප්‍රසම්පාදන කමිටු රැස්වීම, සම්මුඛ පරීක්ෂණ, වෙනත් කමිටු/ රැස්වීම් | යාන්ත්‍රික ඉංජිනේරු කාර්යයන්වලට අදාලව උපදෙස් ලබා දීම | රැස්වීම් ගණන |

# 5.4.පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් යටතේ අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව උතුරු මැද පළාත් සභාවේ පරිපාලනය යටතට ගැනෙන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, උප දෙපාර්තමේන්තු හා පාසල් 813 ක්ද ඇතුළු සමස්ථ පළාත් සභාව යටතට ගැනෙන ආයතන 1273 ක් වෙනුවෙන් විගණන කටයුතු සිදුකරනු ලබයි.

## දැක්ම

"ඉහළම කාර්ය සාධනයකින් හා වගවීමකින් යුත් පළාත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතු කරන විශිෂ්ටතම අභ්‍යන්තර විගණන කොටස්කරු බවට පත් වීම."

## මෙහෙවර

"පළාත් සේවයේ සංවිධානවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම හා අවධානම අවම කිරීම මගින් අපේක්ෂිත කාර්ය සාධනය සාක්ෂාත් කරගැනීම සඳහා පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව ලෙස සහය සහ මාර්ගෝපදේශය සැපයීම."

## අරමුණු

- සමස්ත ප්‍රතිපාදන වැය කිරීම් විනිවිද භාවයෙන් යුක්තව සහ අවශ්‍ය ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට සියළු ආයතනවලට අවශ්‍ය මග පෙන්වීම හා උපකාර විම.
- පළාත් රාජ්‍ය සේවයේ ඵලදායිත්වය ඉහල නැංවීම සඳහා අභ්‍යන්තර විගණනයෙහි දායකත්වය ලබා දීම.
- විගණන කළමනාකරණ කමිටු මගින් ඉහල කළමනාකාරිත්වයෙහි අරමුණු ඉටුකරලීම සඳහා අවශ්‍ය සහය ලබා දීම.
- සංවර්ධන ව්‍යාපෘතීන්හි කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- විශේෂ විමර්ශන කටයුතු තුළින් පළාත් රාජ්‍ය අංශයේ සිදුවන හා සිදුවිය හැකි අක්‍රමිකතා අනාවරණය කිරීම හා එවැනි තත්වයන් හා සිදුවීම් වළක්වා ගැනීමට නිර්දේශයන් හා නිවාරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් රාජ්‍ය ආයතනවල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම උදෙසා එම ආයතනවල පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රම වේදය පරීක්ෂාකර එහි පවතින දුර්වලතාවයන් මගහරවාලීමට අවශ්‍ය උපදේශන හා මාර්ගෝපදේශන සේවා ලබා දීම.
- පළාත් රාජ්‍ය දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම නියෝජනය කිරීම හා අවශ්‍ය මග පෙන්වීම ලබා දීම.
- පළාත් රාජ්‍ය අමාත්‍යාංශවල හා අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම.
- පලාත් රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීම්වලට සහභාගිවීම හා අවශ්‍ය සහය ලබා දීම.
- පළාත් අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.
- පළාත් රාජ්‍ය ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සොයා බැලීම හා කළමනාකරණය වෙත අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දීම.
- විශේෂ විමර්ශන හා පරීක්ෂා කටයුතු සිදු කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාත් සභාවට අයත් සියලු ආයතන වලට ගොස් (වාර්ෂික සැලැස්මට අනුව) ස්ථානීය පරික්ෂාවන් කිරිම.
- ක්ෂේත්‍රයට ගොස් විමසුම් කිරිම.

- පුද්ගලයින් හා එක්ව ක්‍රියා කිරිම, සාකච්ඡා කිරිම, ප්‍රකාශ ලබා ගැනිම.
- ලැබෙන නියෝජන/ නියෝග අනුව ක්‍රියා කිරිම.
- සමුහ ක්‍රියාකාරකම්වලට සහභාගි වීම ( විද්‍යුත්පති රැස්වීම්වලට සහ සහභාගි වීම සහ පළාත් ගිණුම්කාරක සභාවට සහභාගි වීම).
- විගණන වාර්තා නිකුත් කිරිම.
- විනය කටයුතු සඳහා චෝදනා පත්‍ර කෙටුම්පත්කර අදාළ ආයතන වෙත ලබා දීම.
- විනය පරික්ෂණ/ නිතීමය කටයුතු වලට ඉදිරිපත් වීම.
  (අධිකරණ කටයුතු වලට සහය වීම).

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

උතුරු මැද පළාත තුළ පිහිටුවා ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/සංස්ථා සහ පළාත් සභාවට අයත් අනෙකුත් ආයතනවල කටයුතු තිරසර සංවර්ධන ඉලක්ක 17ට අනුව හා එහි අන්තර්ගත දර්ශනයන්ට




අනුව ළඟා කර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව අවධානය යොමු කරමින් එම අරමුණු ළඟාකර ගැනීම සඳහා පළාතේ සියළුම ආයතනවලට අවශ්‍ය සහය ලබා දීම සිදු කරනු ලබයි.

**විශේෂයෙන්ම 12-vii ඉලක්කයට ළඟා වීම සඳහා තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව පූර්ණ අවධානය යොමු කරමින් එම අරමුණු කරා ළඟා වීමට පළාතේ සියළුම ආයතන මෙහෙයවීම සිදු කරයි.**

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 38ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 33 කි. පුරප්පාඩු සංඛ්‍යාව 05 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගෘහ භාණ්ඩ හා කාර්යාලිය උපකරණ | 0.762 | 0.759 | 0.003 | 99 |
| 2. යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 0.037 | 0.037 | - | 100 |
| 5. වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 1.664 | 1.548 | 0.116 | 93 |
| එකතුව | **2.463** | **2.344** | **0.119** | **95** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

සෞභාග්‍ය දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව දූෂණයෙන් තොර කාර්යක්ෂම පාලනයක් පවත්වාගෙන යාම සඳහා පළා ත් සභා මට්ටමින් සියළුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු තුල විධිමත් විගණන ක්‍රියාවලියක් පවත්වාගෙන යාම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. තවද, එම ආයතන යටතේ හඳුනා ගන්නා වැරදි හා වංචා සම්බන්ධයෙන් විමර්ශන කාර්යයන් සිදු කිරීමද මෙම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රමුඛ කාර්යයක් ලෙස සිදු කරනු ලබයි. එසේම පළාත් සභාව යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත අධිකාරි හා මණ්ඩලද මෙම දෙපාර්තමේන්තුව මඟින් විගණනයට ලක් කරනු ලබයි.

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | පාදම 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 12 | 12.7 ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවන් අනුව තිරසාර මහජන ප්‍රතිසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම | පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්හි සියළුම පරිපාලන ඒකක පරීක්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීම. | වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අනුව විගණන වාර්තා නිකුත් කිරීම. | විගණන වාර්තා 270 ක් නිකුත් කිරීම. |
| | | පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන් නියෝජනය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම. | විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් පැවැත්වීම. | විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් 24 ක් පැවැත්වීම. |
| | | ගරු ආණ්ඩුකාරතුමාගේ/ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ/ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම. | පෙත්සම් මත විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම. | ගරු ආණ්ඩුකාරතුමා/ ප්‍රධාන අමාත්‍යවරයා/ ප්‍රධාන ලේකම්තුමා යොමු කරන විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම. |

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමවුම්) | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අනුව විගණන වාර්තා නිකුත් කිරීම. | | | 74% |
| විගණන හා කළමනාකරණ කමිටු රුස්වීම් පැවැත්වීම. | | | <50% |
| පෙත්සම් මත විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම. | | 80% | |

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

උතුරු මැද පළාත තුල පිහිටුවා ඇති අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ සංස්ථා සහ පළාත් සභාවට අයත් අනෙකුත් ආයතන වල කටයුතු තිරසර සංවර්ධන ඉලක්ක 17ට අනුව හා එහි අන්තර්ගත දර්ශනයන්ට අනුව ලඟා කර ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව අවධානය යොමු කරමින් එම අරමුණු ලඟාකර ගැනීම සඳහා පළාතේ සියළුම ආයතන වලට අවශ්‍ය සහය ලබා දීම සිදුකරනු ලබයි. විශේෂයෙන්ම 12-7 ඉලක්කයට ළඟා වීම සඳහා තිරසර රාජ්‍ය ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධව පූර්ණ අවධානය යොමුකරමින් එම අරමුණු කරා ළඟා වීමට පළාතේ සියළුම ආයතන මෙහෙයවීම සිදුකරනු ලබයි.

මෙම වර්ෂය තුල ඇතිවූ COVID-19 වසංගත තත්වය හේතුවෙන් වාර්ෂික සැළැස්මේ ඉලක්කයන් 100% සම්පූර්ණ කර ගැනීම දුෂ්කර කටයුත්තක්ව පැවති නමුත් අභ්‍යන්තර විගණන නිළධාරීන් 22ද සමඟින් මෙම වර්ෂය අවසන් කාර්තුව තුල පළාත් සභාවට අයත් සියලු ආයතනවල එදිනෙදා සිදු කරනු ලබන රාජකාරි විධිමත් හා නියමානුකූලව අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් මත සිදුවේදැයි විපරම් කර ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කිරීමට හැකි විය.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටු කළ කාර්යයන් | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 12- තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම | පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන්හි සියළුම පරිපාලන ඒකක පරීක්ෂාවට ලක්වන පරිදි විගණන හා විමර්ශන කටයුතු සිදු කිරීම. | වර්ෂයේ අනුමත විගණන සැලැස්ම අනුව විගණන වාර්තා නිකුත් කිරීම. | විගණන වාර්තා 270 ක් නිකුත් කිරීම. | | 74% | |
| | පළාත් සභාවේ අමාත්‍යාංශ 05 සහ අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතනයන් නියෝජනය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 24 ක් පැවැත්වීම. | 42% | | |
| | ගරු ආණ්ඩුකාරතුමාගේ/ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ/ ප්‍රධාන ලේකම්ගේ යොමු කිරීම මත විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම. | පෙත්සම් මත විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම. වරින් වර ගරු ආණ්ඩුකාරතුමා/ ප්‍රධාන අමාත්‍යතුමා/ප්‍රධාන ලේකම් විසින් අවස්ථානුකූලව යොමු කරන බැවින් වර්ෂය මුල ඇස්තමේන්තු කර නැත. | පෙත්සම් මත විශේෂ විමර්ශන කටයුතු 08 ක් සිදු කිරීම.<br>වර්ෂය අවසාන වනවිට අවසන් නොකළ ගොනු 02ක් තිබුණි. | | | 80% |

# 5.5.පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය

පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය යටතේ පවතින ආයතනයක් වේ. පළාතේ මානව සම්පත් සංවර්ධනය සඳහා කටයුතු කරනු ලබන ප්‍රධානතම ආයතනය වේ. එමගින් පළාත් රාජ්‍ය සේවයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීමේ ක්‍රියාවලිය සිදුකරනු ලැබේ. පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකය නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය හා පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය යන ප්‍රධාන අංශ වලින් සමන්විතවේ. කළමනාකරණ සංවර්ධන හා පුහුණු ඒකකයේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින මානව සම්පත්, මූල්‍ය සම්පත් හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිතා කරමින් වාර්ෂික පුහුණු සැලැස්ම හා බාහිර ආයතනවල ඉල්ලීම් අනුව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

## දැක්ම

"පරිපූර්ණ මහජන සේවකයෙක්, ගුණාත්මක රාජ්‍ය සේවයක්"

## මෙහෙවර

"ජාතික ප්‍රතිපත්තියට අනුගතව පළාතේ රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා ඉහළ නැංවීම, පුහුණු අවශ්‍යතා තක්සේරුව, කාර්ය සාධන නියාමනය සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවිධානය කරමින් ජනතාවාදී රාජ්‍ය සේවයක් බිහි කිරීමට අඛණ්ඩව දායකවීම."

## දිගුකාලීන අරමුණු

මනා මහජන සම්බන්ධතාවක් පවත්වන, නායකත්ව ගුණාංගයන්ගෙන් යුත් දැනුම, කුසලතාවය හා ධනාත්මක ආකල්පයෙන් හෙබි සමාජ පිළිගැනීමක් සහිත රාජ්‍ය නිලධාරියෙක් බිහි කිරීම.

## කෙටිකාලීන අරමුණු

- පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ විෂය දැනුම , කුසලතා , ආකල්ප වර්ධනය කිරීම.
- කාර්යාල පරිසරය සාරවත් වූ චර්යාවලින් පෝෂණය කිරීම.
- කාර්යක්ෂම වැඩ පරිසරයක් කාර්යාලය තුළ නිර්මාණය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය
- පුහුණු අවශ්‍යතා තක්සේරුව
- කාර්ය සාධන නියාමනය
- ආයතනික ධාරිතා සංවර්ධනය
- සෞභාග්‍යයේ ඉදිරි දැක්ම

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ප්‍රධාන පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම
- පුහුණු වැඩමුළු සැලසුම් කිරීම.
- පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම.
- පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ඇගයීම හා පසු විපරම.
- පුහුණු වැඩසටහන් සඳහා නවීන තාක්ෂණික උපකරණ භාවිත කිරීම.
- සුදුසුකම් ලත් ප්‍රවීණ දේශක මණ්ඩලයන්ගෙන් යුත් සම්පත්දායක සන්විතයක් පවත්වා ගැනීම.
- පහසුකම් සහිත පුහුණු ආයතනයක් පවත්වා ගෙන යාම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 37ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 32 කි. පුරප්පාඩු සංඛ්‍යාව 05 කි.

## මූලධන වියදම - 2021

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) |
|---|---|---|---|
| වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 1 | - | 1 |
| **එකතුව** | **1** | **-** | **1** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ.

- පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ මානව හැකියා , කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම.
- කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් තුළින් පළාතේ ජනතාවගේ ජන දිවිය නංවාලීම.
- සමාජ දැනුවත්භාවය තුළින් ආකල්ප වර්ධනයට හා සාරවත් සමාජයක් ගොඩනැගීම.
- මානව ගරුත්වයෙන් සලකන නිසි පිළිගැනීමක් ලබා දෙන , මනා විනයක් සහිත කාර්යක්ෂමතාවයකින් යුත් ආයතන ව්‍යුහයක් නිර්මාණය කිරීම
- රාජ්‍ය නිලධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණුවේ සිට අඛණ්ඩ අධ්‍යාපනය හා අදාළ පුහුණු ලබාදීම තුලින් රාජ්‍ය නිලධරයාගේ වගකීම, කාර්යක්ෂමතාව නංවාලීම.
- පුහුණුකරුවන් පුහුණු කිරීම තුළින් පළාතේ මානව සම්පත සංවර්ධනයට දායක වීම

## ශුදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය.

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| ➢ ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් සිටීම<br>➢ කල්වේලා ඇතිව පුහුණුව අවශ්‍යතාවය සැලසුම් කළහැකි වීම.<br>➢ ඉඩකඩ සහිත පර්ශ්‍රයක් පැවතීම.<br>➢ ශක්තිමත් නෛතික රාමුව.<br>➢ මූල්‍ය හැකියාව.<br>➢ ප්‍රමාණවත් සහ ප්‍රසන්න කාර්යාල පරිසරය.<br>➢ පුහුණුලාභීන්ට අදාළ බොහෝ පහසුකම් නොමිලේ සැපයීම. | ➢ පළාත් සභා සේවකයින් වන එකම කාණ්ඩායමක් පුහුණුව ලැබීම.<br>➢ පුහුණුව සඳහා වන සැසි වලදී සවිස්තරාත්මක දේශන සඳහා ප්‍රමාණවත් කාලයක් වෙන් කිරීමට නොහැකි වීම.<br>➢ ආයතනය සඳහාම වෙන්වූ ස්ථිර සම්පත්දායක මණ්ඩලයක් නොමැතිවීම.<br>➢ විශේෂිකරණය වූ කාර්යය මණ්ඩලයක් නොමැතිවීම.<br>➢ විදේශ පුහුණුවීම් සඳහා සුදුස්සන් සූදානම් කිරීමට පරිසරයක් නොමැතිවීම.<br>➢ පුහුණු මධ්‍යස්ථානයේ පිහිටීම නගරයට ආසන්න ස්ථානයක නොවීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| ➢ ප්‍රමාණවත් පුහුණුලාභීන් සිටීම.<br>➢ වෙනත් සුදුසු පුහුණු ආයතනයක් නොමැතිවීම.<br>➢ විශේෂ පුහුණු ව්‍යාපෘතියක් අනුමත වී තිබීම<br>➢ නිස්කලංක පරිසරයක් පැවතීම.<br>➢ පුහුණුලාභීන් පුහුණුවීම් සඳහා සහභාගී වීමට ඉතා කැමැත්තෙන් පසුවීම. | ➢ ප්‍රවීන සම්පත්දායක මණ්ඩලයක් නොමැති විම.<br>➢ පුහුණු ලාභීන්ගේ සෘණ ආකල්ප හේතුවෙන් පුහුණුවේ අත්‍යවශ්‍ය බව නොදැනීම.<br>➢ ඇතැම් ආයතන ප්‍රධානීන්ගේ සෘණ ආකල්ප.<br>➢ සුදුසු හා නවීන පුහුණු ක්‍රමවේද භාවිතා කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම.<br>➢ පුහුණු අවශ්‍යතා සම්පූර්ණයෙන් සපුරාලීමට ප්‍රමාණවත් සම්පත් නොමැතිවීම.<br>➢ ආයතන වල කාර්යභාරයන් හේතුවෙන් පුහුණු වලට සහභාගීවීමට පුහුණුලාභීන්ට අවස්ථාවන් නොලැබීම. |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අනුව අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 01 | පළාතේ අයවැය ලේඛණ නිවැරදිව සකස් කර නිසි වේලාවට මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම උදෙසා වූ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම | • පළාත් සභාවේ සියළුම ආයතන වල ගණකාධිකාරවරුන් පුහුණු කිරීම<br>• විෂය භාර නිලධාරීන් පුහුණු කිරීම | අයවැය ලේඛණ සැකසීමේදී සිදුවන නව වෙනස්කම් අනුව යමින් යාවත්කාලීණ වීම | මුදල් කොමිෂන් සභාව මගින් පළාත් සභාවට අදාළ අරමුදල් සැලසුම් කරගත් ආකාරයට කලට වේලාවට ලබා ගැනීම |
| 02 | පළාතේ ප්‍රසම්පාදන කටයුතු සඳහා සෘජුවම සම්බන්ධ වන අධීක්ෂණ මට්ටමේ නිලධාරීන් දැනුවත් කිරීම | • මාණ්ඩලික නිලධාරීන් සඳහාම විශේෂ වූ පුහුණු පාඨමාලා | අදාළ කාර්යය විධිමත්ව ඉටු කිරීම | 2021 වර්ෂයේදී විධිමත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයනට අනුව දෙපාර්තමේන්තු වල පුසම්පාදන කටයුතු ඉටු කර ගැනීමට හැකිවීම තුලින් කාර්ය සාධනය ඉහළ යාම |
| 03 | ඉංජිනේරු දෙපාර්තමේනතුවේ ඉල්ලීම මත එම ආයතනයේ තාක්ෂණ නිලධාරීන් හා තාක්ෂණික සහායකවරුන් සඳහා වූ ගෘහනිර්මාණ ශිල්පය සඳහා වූ පුහුණු වැඩසටහන | • තාක්ෂණික නිලධාරීන්<br>• තාක්ෂණ සහායකවන් (ඉංජිනේරු දෙපාර්තමේන්තුව) | ක්‍රියාවලි සාර්ථක කර ගැනීම | ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්ය සාධනය ඉහල යාම |
| 04 | පළාතේ නවක පත්වීම් ලද නිලධාරීන් සඳහා සේවාරම්භක පුහුණු ලබාදීම (පුහුණු වැඩසටහන් 03 ක්) | • සංවර්ධන නිලධාරීන්<br>• කළමනාකරණ සේවා නිලධාරීන් | රාජ්‍ය නිලධාරියා යනු කවරෙක්ද එහි අරමුණු, වැදගත්කම,පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම | රාජ්‍ය සේවකයා යනු කවරෙක්ද යන්න පිළිබඳව මනා වැටහීමකින් යුතු දැනුමෙන් සන්නද්ධ නිලධාරියෙක් බිහි කිරීම |
| 05 | කාර්යාලීය විද්‍යුත් උපකරණ පිළිබඳව දැනුම වර්ධනය කිරීම හා නොදන්නා නවීන විද්‍යුත් උපකරණ භාවිතය පිළිබඳව අවබෝධය ලබාදීම උදෙසා | • කාර්යාල කාර්ය සහායකවරුන්<br>• කාර්යාල කම්කරු නිලධාරීන් | වැඩ පහසු කර ගැනීම | තමාට අයත් වගකීම කලට වේලාවට ඉටු කිරීම පිළිබඳ දැනුම අවබෝධය ලබා දීම |
| 06 | පළාතේ සියළු කාර්යාල වල ගිණුම් කටයුතු නව වෙනස්වීම් අනුව යමින් කලට වේලාවට අදාළ තොරතුරු ලබාදීම | • ගණකාධිකාරවරුන්<br>• විෂය නිලධාරීන්<br>• භාණ්ඩාගාරයේ විෂය නිලධාරීන් | ක්‍රියාවලි සාර්ථක කර ගැනීම | පළාතේ සියළු කාර්යාල වල සහයෝගය ඇතිව පළාත සංවර්ධනය කරා ගෙන යාම |
| 07 | පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත ඉඩම් කළමනාකරණය සම්බන්ධ දැනුම ලබාදීම | • ඉඩම් නිලධාරීන්<br>• සංවර්ධන නිලධාරීන්<br>• විෂය භාර නිලධාරීන් | ගැටළු නිරාකරණය කර ගැනීම | ඉඩම් ගැටළු නිරාකරණය කර ගනිමින් මහජනතාවගේ ගැටළු වලට සාර්ථකව විසඳුම් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම |
| 08 | පළාතේ පරිගණක භාවිතය තුලින් කාර්යක්ෂම ප්‍රතිඵලදායී නවීන තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ යමින් සංවර්ධනය කරා ගෙන යාම | • සංවර්ධන නිලධාරීන්<br>• කළ.සේවා නිලධාරීන් | පළාත් සංවර්ධනය | නවීන තාක්ෂණය අනුව යමින් පළාතට වැඩි යමක් කිරීමේ හැකියාව වර්ධනය කිරීම |
| 09 | කාර්යාල නිලධාරීන්ගේ මනස සැහැල්ලු කිරීම තුළින් පුහුණු වැඩසටහන් සංවිධානය පහසු කර ගැනීම හා සංවර්ධනය කිරීම | • පුහුණු ආයතනයේ සියළුම නිලධාරීන් | පුද්ගල සංවර්ධන තුලින් පළාතේ සංවර්ධනය | දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනය උදෙසා |

| | | | | |
|---|---|---|---|---|
| 10 | රාජ්‍ය නිලධාරීන් අතින් සිදුවන දූෂණ, වංචා අවම කර ගැනීම | • පරිපාලන නිලධාරීන්<br>• සංවර්ධන නිලධාරීන්<br>• කළ.සේවා.නිලධාරී | රාජ්‍ය නිලධරයා යනු කවරෙක්ද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාදීම | පළාතේදූෂණ වංචා අවම කර ගැනීම |
| 11 | පුහුණුකරුවන් පුහුණු කරවීම | • මාණ්ඩලික නිලධාරීන්<br>• විධායක ඉංජිනේරුවරු | මානව සම්පත් සංවර්ධනය | දැනුමෙන් සන්නද්ධ පුහුණුකරුවන් පළාතට දායාද කිරීම තුළින් නිලධාරියාගේ මෙන්ම පළාතේද සංවර්ධනය |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | *ප්‍රධාන කාර්ය සාධක දර්ශකය (නිමැවුම) පුහුණු වැඩසටහෙන් නම* | ප්‍රමාණය (දින ගණන) | ප්‍රතිලාභීන් (සහභාගී වූ සංඛ්‍යාව) | මුළු වියදම |
|---|---|---|---|---|
| 01 | අවශ්‍යතා තක්සේරුව හා අයවැය ලේඛණ සැකසීම | 01 | 39 | 26,597.86 |
| 02 | කාර්යාල විද්‍යුත් උපකරණ භාවිතය | 02 | 25 | 35,136.75 |
| 03 | අන්තර්ජාලගත පුහුණු කළමනාකරණ පද්ධතිය යාවත්කාලීණ කිරීම පිළිබඳ පුහුණුව | 01 | 29 | 18,122.51 |
| 04 | නව සිගාස් පුහුණු වැඩසටහන (CIGAS) | 02 | 110 | 113,092.69 |
| 05 | ඉඩම් කළමනාකරණය පිළිබඳ පුහුණුව | 02 | 20 | 21,926.40 |
| 06 | ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම | 02 | 41 | 42,149.87 |
| 07 | REVIT Architecture Training Programme | 04 | 19 | 56,984.66 |
| 08 | පරිගණක දත්ත පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 31 | 45,013.58 |
| 09 | ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 39 | 100,494.83 |
| 10 | ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 84 | 122,043.87 |
| 11 | ප්‍රසම්පාදන ලියවිලි සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 102 | 141,748.13 |
| 12 | Safety in Construction Sites Training Programme | 01 | 24 | 15,274.84 |
| 13 | සාමාන්‍ය බඳු දැනුම වර්ධනය | 02 | 22 | 30,768.54 |
| 14 | උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා පරිගණක පුහුණුව | 03 | 34 | 68,552.56 |
| 15 | භාණ්ඩ සමීක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | 27 | 29,153.89 |
| 16 | පරිගණක මෘදුකාංග හා දෘඩාංග පිළිබඳ පුහුණුව | 02 | 32 | 34,153.24 |
| 17 | නවක කළමනාකරණ සේවා නිලධාරී ප්‍රාරම්භක පුහුණුව | 03 | 29 | 40,912.54 |
| 18 | නවක උපාධිධාරීප්‍රාරම්භක පුහුණුව | 03 | 49 | 67,479.64 |
| 19 | වාහන පාලනය පිළිබඳ පුහුණුව | 02 | 85 | 98,094.94 |
| 20 | Training, Development & Improve the Performance of MDTU staff | 02 | 22 | 25,225.54 |
| 21 | මූලික විමර්ශන හා විනය පරීක්ෂණ පැවැත්වීම | 03 | 30 | 42,486.15 |
| 22 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ආධුනික නිලධාරීන් සඳහා ප්‍රාරම්භක පුහුණුව | 10 | 20 | 90,641.99 |
| 23 | පුහුණු මොඩියුල සැකසීම (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) | | | 1,000,000.00 |
| | එකතුව | 56 | 1005 | 2,266,055.00 |

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

2021 වර්ෂයේ රටේ පැවති වසංගත තත්වය හේතුවෙන් සංවිධානය කළ පුහුණු වැඩසටහන් තාවකාලිකව අවලංගු කිරීමට සිදු විය. විශේෂයෙන්ම පුහුණු වැඩසටහන් සංවිධානයේදී නිලධාරී පිරිස් ඒකරාශී කිරීම සෞඛ්‍යාරක්ෂිත සිදු කිරීම හේතුවෙන් මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගතය සඳහා ක්‍රියාකාරීව සහභාගී වීමේ බාධා ඇති විය.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමැවුම) | වර්ෂය තුළ සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| පුහුණු වැඩසටහන් 60 ක් පැවැත්වීමට සැලසුම් කිරීම | - | - | 50% ට අඩු |

## අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ හැඳින්වීමක්

රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා පළාතේ ජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීමට දායකත්වය දක්වන අවංක,මිත්‍රශීලී ,කාර්යක්ෂම හා ඵලදායී ලෙස කටයුතු කරන මහජන සේවකයෙක් බිහි කිරීම හා සේවාලාභීන්ට මානව ගරුත්වයෙන් සලකන ඔවුන්ට නිසි පිළිගැනීමක් ලබාදෙන මනා විනයක් සහිත අල්ලසට හා බලයට යටත් නොවූ කාර්යක්ෂමතාවයකින් යුත් රාජ්‍ය නිලධාරියෙක් බිහි කිරීම.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉල්ක්ක | එම ඉලක්කය ළඟාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුළ ඉටු කළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75% - 100% |
| 1. රාජ්‍ය ප්‍රතිපත්ති නිවැරදි ලෙස ක්‍රියාත්මක කරමින් පළාතේ ජනතාවගේ ජීවන තත්වය නගාසිටුවීමට දායකත්වය දක්වන අවංක,මිත්‍රශීලී ,කාර්යක්ෂම හා ඵලදායී ලෙස කටයුතු කරන මහජන සේවකයෙක් බිහි කිරීම | උක්ත කාර්ය භාරය ඉටු කිරීම සඳහා පරිපූර්ණ රාජ්‍ය සේවයක් බිහි කිරීමට රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම | වසංගත තත්වය මධ්‍යයේ පුහුණු වැඩසටහන් 23 ක් පැවැත්වීම | 0%-49% | | |

## පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මහජනතාව වෙත ලබාදුන් සේවාවන්

| අනු අංකය | ලබාදුන් සේවාව | ක්‍රියාත්මක කරන ලද ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | සහය දැක්වූ ආයතන |
|---|---|---|---|---|
| 01 | පවත්වන ලද සෑම පුහුණු වැඩසටහනකදීම වසංගත රෝගය සම්බන්ධයෙන් සෞඛ්‍යාරක්ෂිත ක්‍රියා මාර්ග ගැනීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම | පළාත් කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනය | පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ සියළු නිලධාරීන් | පළාත් රාජ්‍ය නිලධාරීන් |

## COVID 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදි සංවර්ධන ඉලක්ක සාධනයේ දි මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒ වෙනුවෙන් සක්‍රීයව සහයෝගය ලබා දෙන්නා වූ ආයතනයක් වන බැවින් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පුහුණු වැඩසටහන් 60 ක් පැවැත්වීමට සැලසුම් කළ අතර කොවිඩ් වසංගතය හා ඒ ආශ්‍රිතව පැන නැගුණු සමාජ හා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කරගත නොහැකි වුවද සෞඛ්‍ය අංශ මගින් ලබාදුන් උපදෙස් හා මාර්ගෝපදේශයන්ට අනුගතව පුහුණු වැඩසටහන් වලට සහභාගීවන්නන් සීමා කර පුහුණු වැඩසටහන් 23 ක් තුළින් පුහුණුලාභීන් 1005 ක් සඳහා පුහුණුවීම් ලබාදීමට කටයුතු කර ඇත.

# 5.6.පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු.

1991 වර්ෂයේ ජනවාරි මස දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත වූ උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ආරම්භයේ දී පළාත් ආදායම් කොමසාරිස්, නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස්වරුන්ට අමතරව තක්සේරුකරු,බදු නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ද ඇතුළුව නිලධාරි මණ්ඩලය 08 දෙනෙකුගෙන් සමන්විත විය. ක්‍රමානුකූලව වර්ධනය වූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව 1992 වර්ෂයේ ආයතන හා ගිණුම් අංශ පිහිටුවන ලදි. 2003 වර්ෂයේ දී පොළොන්නරුව පළාත් ආදායම් දිස්ත්‍රික් කාර්යාලය පිහිටුවා ඒ සඳහා නිලධාරීන් බඳවා ගන්නා ලදි. දැනට පළාතේ ප්‍රශස්ත බදු රැස් කරන්නා වශයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව නවතම පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කරමින් හා නිලධාරීන් පුහුණු කිරීම මඟින් බදු රැස්කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කර පළාතේ සංවර්ධනයට විශාල මෙහෙයක් ඉටු කරයි.

## දැක්ම

"ප්‍රශස්ත ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලියක්, සංවර්ධිත පළාතක්."

## මෙහෙවර

"සංවර්ධිත පළාතක් බිහිකිරීම සඳහා බදු හා ගාස්තු රැස් කිරීම, බදු හා ගාස්තු ගෙවන්නන්ගේ ආකල්ප සහ අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය, අදාල පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම."

## දිගු කාලීන අරමුණු

- සියළු බදු හා ගාස්තු ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම.
- ස්වේච්ඡා බදු අනුකූලතාව වර්ධනය.

## කෙටිකාලීන අරමුණු

- උතුරු මැද පළාත් සභාව විසින් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත, වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් එක් එක් ආදායම් ප්‍රභවයන් සඳහා ඇස්තමේන්තු කර ඇති ආදායම්, හැකි උපරිමයෙන් රැස් කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- බදු හා ගාස්තු පැනවීම හා අයකිරීම.
- රැස් කරනු ලබන ආදායම මාසිකව වාර්තාකර පළාත් භාණ්ඩාගාරය වෙත මාරු කිරීම.
- අධිකරණ දඩ හා මුද්දර ගාස්තු වශයෙන් රැස්කරන ආදායම පළාත් පාලන ආයතනවලට බෙදාහැරීම සඳහා නිර්දේශ ලබාදීම.
- උකස් ගන්නන්ගේ ව්‍යාපාර නියාමනය කිරීම හා ගාස්තු අය කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- බදු හා ගාස්තු ගෙවන්නන්ගෙන් හා විවිධ ආයතන වලින් තොරතුරු කැඳවීම.
- බදු හා ගාස්තු ගෙවන්නන් කැඳවා සම්මුඛ සාකච්ඡා තුළින් පෙර බදු හා ගාස්තු අය කිරීම.
- බදු/ ගාස්තු ගෙවන්නන් හා නොතාරිස්වරුන් දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.
- හිඟ බදු හා ඌණ මුද්දර ගාස්තු අය කිරීම.
  - I. චංචල හා නිශ්චල දේපළ තහනම් කිරීම.
  - II.බැංකු ගිණුම් තහනම් කිරීම.
  - III.නඩුපැවරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 52ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 38 කි. පුරප්පාඩු සංඛ්‍යාව 14 ක් වේ.

## අංශය තුළින් ඉටුකර ගැනීමට අපේක්ෂිත තිරසර සංවර්ධන අරමුණු හා සම්බන්ධ ක්‍රියාකාරකම්

**01.**සියළු බදු හා ගාස්තු රැස් කිරීම, ඉහළ නැංවීම මඟින් පළාතේ සංවර්ධනය.




**02.**නොතාරිස්වරුන් දැනුවත් කිරීම තුළින් නිසි කලට රජයේ බදු ආදායම් රැස්කර දීම.

**03.**බදු පැනවීමේ හා රැස් කිරීමේ සියළු ක්‍රියාවලීන් පරිගණක පද්ධතියක් තුළින් විධිමත් කිරීම මඟින්, වඩාත් නිවැරදිව හා කාර්යක්ෂමව බදු රැස්කර ආදායම් ඉහළ නැංවීම.

04.ඉඩම් ඔප්පුවල වටිනාකම් පිළිබඳව මතය ලබා ගැනීමේ ක්‍රියාදාමය වර්ධනය කිරීම තුළින්, කාර්යක්ෂමව, විධිමත්ව, බදු ආදායම් කඩිනමින් රැස් කර දීම.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි.) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. වාහන | 0.45 | 0.410045 | 0.039955 | 91% |
| 2. වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 0.817 | 0.749144 | 0.067856 | 91.7% |
| **එකතුව** | **1.267** | **1.159189** | **0.107811** | **91.5%** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

1. සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති අනුව යමින් මහජනතාවට හිරිහැරයක් නොවන පරිදි බදු හා ගාස්තු අය කිරීම සඳහා කාර්ය මණ්ඩලය පෙළඹවීම.
2. ප්‍රශස්ත ආදායම් රැස් කිරීමේ ක්‍රියාවලියේ දී නව ක්‍රමෝපායන් තුළින් ආදායම වර්ධනය කිරීම.
3. ආදායම් එකතු කිරීම, පරිපාලනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති පරිගණක ක්‍රමවේදය යටතේ නිළධාරීන්ට වැඩිදුරටත් පුහුණුව ලබා දීම.
4. බදු ආදායම් රැස් කිරීම විනිවිධභාවයෙන් යුක්තව හා මහජනතාව දැනුවත් කිරීම මඟින් ඉටු කිරීම සඳහා දේපළ පැවරීම මත මුද්දර ගාස්තු අය කිරීමේ දී **මතය ලබා ගැනීමේ** ක්‍රමවේදය සඳහා මහජනතාව පෙළඹවීම.
5. දැනට ස්ථාපිත කර ඇති පරිගණක වැඩසටහන තව දුරටත් වැඩිදියුණු කිරීම.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| **ආයතනයේ කාර්ය සාධන දර්ශක** | **වර්ෂය තුළ සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස** | | |
|---|---|---|---|
| | **100%-90%** | **75% - 89%** | **50% - 74%** |
| පළාත් සභාවේ ආදායමෙන් රැස් කරන ලද බදු හා ගාස්තු ප්‍රමාණය | 106 % | | |
| 2021.12.31 දක්වා රැස් කළ තොරතුරු වලින් ඉපැයූ ආදායම් ප්‍රමාණය | 94.79 % | | |
| පළාත් සභාවේ අය වැයට කරන ලද දායකත්වය | 106 % | | |

## අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්

2021 වර්ෂය සඳහා මුදල් ප්‍රකාශය අනුව පළාත් සභාවේ ඇස්තමේන්තු මුළු ආදායම රු.මි.2651 කි.ඉන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුව රැස් කළ යුතු වූ ආදායම වූයේ (ඇස්තමේන්තු) රු.මි.587.5 කි.දෙපාර්තමේන්තුව රැස් කරන ආදායම් ප්‍රභවයන් වලින් සමහර ආදායම් ඉලක්ක කරා ළඟා විය නොහැකි වුවද සමස්ත ආදායම රු.මි.623.32 ක් රැස් කිරීමට හැකි විය.ඒ අනුව පළාත් සභාවේ මුළු ආදායමින් දෙපාර්තමේන්තුව රැස් කරන ලද ආදායම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස 106% කි.

2021 වර්ශයේ රැස්කරන ලද තොරතුරු වලින් රැස් කිරීමට අපේක්ෂිත ආදායම වූයේ රු.මි.16කි.එම වර්ෂයේ තොරතුරු මත රැස් කරන ලද බදු ආදායම රු.මි. 15.16කි. ඒ අනුව සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස 94.79 % කි.

2021 වර්ෂයේ පළාත් සභාවේ මුළු ප්‍රතිශෝධිත වියදම් ඇස්තමේන්තුව රු.මි.30,508 පළාත් සභාවේ අයවැය සඳහා මෙම දෙපාර්තමේන්තුව කළ යුතු අපේක්ෂිත දායකත්වය රු.මි.587.5කි. සත්‍ය වශයෙන්ම 2021 වර්ෂයේ පළාත් සභාවේ වියදම සඳහා දැක්වූ දායකත්වය රු.මි.623.3කි. ඒ අනුව සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස 106% කි.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2020 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2020 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50%- 74% | 75% - 100% |
| අරමුණු 10<br>රටවල් තුළ සහ ඒවා අතර අසමානතා වය අඩු කිරීම. | බදු හා ගාස්තු රැස් කිරීම සංවර්ධනය | වෙළඳපල වටිනාකමට ඔප්පු ලිවීමට පෙළඹවීම හා වටිනාකම් පිළිබඳව තක්සේරුකරුවන්ගේ මතය ලබා ගැනීමට දැනුවත් කිරීම. | නිළධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් හා GIS පුහුණු පාඨමාලා පැවැත්වීම. | | | 100% |
| | අනෙකුත් රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය සංවර්ධනය | ආදායම් එකතු කිරීම පරිපාලනය කිරීම සඳහා පරිගණක ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. | නිළධාරීන් පුහුණු කර, පරිගණක ක්‍රමවේදයේ පැවති අඩුපාඩු සකස් කර යාවත්කාලීන කිරීම. | | | 100% |
| | පළාත් සභා අරමුදලට දක්වන දායකත්වය වර්ධනය කිරීම | 1.දේපළ සඳහා මතය ලබාදීම තුළින් වෙළඳපල වටිනාකමට ඔප්පු ලිවීම.<br>2. රාජ්‍ය ආයතන මගින් තොරතුරු ලබා ගැනීම හා ඒ අනුව බදු අය කිරීම.<br>3. සුරාබදු හා අධිකරණ දඩ ලැබීම් පිළිබඳ විමර්ෂණය කිරීම තුළින් එම ආදායම් රැස් කිරීම විධිමත් කිරීම. | 1.දේපළ සඳහා මතය ලබා දීම කඩිනම් කිරීම.<br>2.රැස් කළ තොරතුරු අනුව නව ලිපිගොනු විවෘත කිරීම හා ඒ අනුව බදු අය කිරීම.<br>3. I. NC 100 රිසිට්පත් විගණනය කිරීම.<br>II.ලැබිය යුතු සුරා බදු ආදායම පිළිබඳව තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් කැඳවීම. | | | 100% |

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය.

2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට බෙහෙවින් බලපාන ලදී. වර්ෂයේ සැලකියයුතු කාලයක් ඇඳිරි නීතිය පැනවීමත්, ඉන්පසු කාර්ය මණ්ඩලය 50%ක් කැඳවීමත්, බැංකු කටයුතු අඩාල වීමත් සියළු ආදායම් රැස් කිරීමට අහිතකර ලෙස බලපාන ලදි. වසංගත තත්වය හේතුවෙන් සංචාරක හෝටල් වසා දමන ලද අතර ඒ හේතුවෙන් සුරා බදු බලපත්‍ර ගාස්තු ආදායම සපුරා ගැනීමට නොහැකි විය.එම ආදායම් සපුරා ඇත්තේ 70.5% කි.

අධිකරණ වසා දැමීම, නොතාරිස් කාර්යාල වසා දැමීම, බැංකු කටයුතු අඩපණ වීම හේතුවෙන් ඔප්පු ලිවීම සිදු නොවූවද ඉලක්ක ආදායමින් 108.5%ක් සම්පූර්ණ කර ගත හැකි විය. කෙසේ වුවද අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු ආදායම 48% කින් සම්පූර්ණ කර ඇත. පිරිවැටුම් බදු ආදායම් ඉලක්කයෙන් සපුරා ගත හැකි වූයේ 24% ක් පමණි.

උකස් ව්‍යාපාර බලපත්‍ර වර්ෂය ආරඹයේදීම ලබා ගත්තද එම ආදායම 50.7%ක් ලෙස රැස් කර ඇත. ඖෂධ හා රසායන බද්ද වර්ෂයට එක් වතාවක් පමණක් අයකරන බලපත්‍ර ගාස්තුවකි.කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වුවද ෆාමසි හා ඖෂධ ශාලා විවෘතව පැවති අතර ඒ හේතුවෙන් එම ආදායම 87.96% ක් ලෙස රැස් කිරීමට හැකි විය.

වසංගත තත්වය ඛනිජ ද්‍රව්‍ය ව්‍යාපාරයට බෙහෙවින් බලපාන ලදී. එනම් සේවකයින් නොපැමිණීම, කාලයක් ව්‍යාපාර වසා තිබීම පුපුරණ ද්‍රව්‍ය මිලදී ගැනීමට නොහැකි වීම යන හේතු මත එම ව්‍යාපාරයේ පිරිවැටුම අඩු විය.ඒ හේතුවෙන් එම ආදායම රැස් කළ හැකි වූයේ 95% ක් පමණි. ඇඳිරිනීතිය පැවති කාලයේ අධිකරණ වසා දැමුවද ඉන් අනතුරුව නොකඩවා අධිකරණ ක්‍රියාත්මක වීම හේතුවෙන් එම ආදායමේ වාර්ෂික ඇස්තමේන්තුව ඉක්මවා රැස් කිරීමට හැකිව තිබේ.එනම් උසාවි දඩ ආදායම් රැස් කිරීම 114%කි.

ඒ අනුව 2021 වර්ෂයේ සමස්ථ ආදායම් ඉලක්කය රු.මි.587.5ක් වූ අතර සත්‍ය ආදායම රු.මි. 623.3කි. එනම් සත්‍ය ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය 106 % කි.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේ දී සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

කොවිඩ් 19 වසංගතය නිසා 2021 වර්ෂයේ වරින් වර ඇඳිරි නීතිය පැනවීමත් හා ඉන් පසු කාර්ය මණ්ඩලය 50% කැඳවීමත් හේතුවෙන් ආදායම් රැස් කිරීමට බාධා මතු විය. නිළධාරීන්ට ක්ෂේත්‍ර රාජකාරි වලට යාමට නොහැකි වීමහේතුවෙන් හිඟබදු අය කිරීමට නොහැකි වීම හා නව ව්‍යාපාර හඳුනා ගැනීමට නොහැකි වීම මත එම බදු ආදායම් ඉලක්ක කරා ලඟා වීමට නොහැකි විය. බැංකු කටයුතු අඩාල වීම සිදුවුවද ඔප්පු ලිවීමේ කටයුතු තරමක් දුරට පැවතීම හේතුවෙන් මුද්දර ගාස්තු ආදායමට එහි බලපෑමක් ඇති නොවුනි. හෝටල් වසා දැමීම නිසා සුරා බදු බලපත්‍ර අළුත් නොකිරීම එම ආදායම පහල යාමට හේතු විය. ඛනිජ, ව්‍යාපාරය අක්‍රීය වීම හේතුවෙන් එම ආදායම ඉලක්කයට යා නොහැකි විය. අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු, ඖෂධ හා රසායන බද්ද හා උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ආදායම් වාර්ෂික බලපත්‍ර මත අය වන බදු දෙපාර්තමේන්තුවේ බලපෑමකින් තොරව රැස් කරන ආදායමකි. එනමුත් කොවිඩ් වසංගතය එහි ආදායම කෙරෙහි බලපෑමක් සිදුව ඇති බැවින් එහි අදායම අපේක්ෂිත මට්ටමට වඩා අඩුවිය. වර්ෂය පුරා උසාවි දඩ ආදායම් කෙරෙහි කොරෝනා වසංගතය බලපෑමක් කළද කොරෝනා වසංගතය මධ්‍යයේ වුවද අධිකරණ ක්‍රියාත්මක වීම මත උසාවි දඩ ආදායම වැඩි විය.

## ආදායම ඉපයීම

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 10-02-04-05 | මත්පැන් බලපත්‍ර ගාස්තු | 65 | 45.85 | 70.5% |
| 10-02-07-01 | දේපල පැවරීම මත මුද්දර ගාස්තු | 175 | 189.946 | 108.5% |
| 10-02-07-02 | අධිකරණ ලියවිලි මත මුද්දර ගාස්තු | 9.5 | 4.572 | 48% |
| 10-02-09-00 | පිරිවැටුම් බද්ද | 0.5 | 0.121 | 24% |
| 10-03-07-10 | උකස් ව්‍යාපාර බලපත්‍ර ගාස්තු | 1.5 | 0.761 | 50.7% |
| 20-03-02-27 | ඖෂධ හා රසායන බද්ද | 1.8 | 1.583 | 87.96% |
| 20-03-02-30 | ඛණිජ බද්ද | 9.2 | 8.775 | 95% |
| 20-03-03-01 | උසාවි දඩ | 325 | 371.716 | 114% |
| **එකතුව** | | **587.5** | **623.325** | 106% |

# 06.ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදි කිරිම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරන ලද පළාත් සභා ක්‍රමයට අදාළව පළාත් සභා සඳහා සමගාමී ලැයිස්තුව හා පළාත් සභා ලැයිස්තුව මගින් බලතල පැවරී ඇත. මෙසේ වරින්වර දේශපාලන නායකත්වය මෙන්ම අමාත්‍යාංශ විෂයයන්ද වෙනස් වෙමින් මෙම අමාත්‍යාංශය යටතේ ඉටුකිරීම සඳහා පැවරී ඇති විෂයන් වශයෙන් පළාතේ නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික යන විෂයන්ට අදාළ කටයුතු මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීමයි. උතුරු මැද පළාතේ ජනතාවගේ ජීවනෝපාය මාර්ගයන්ට සෘජුවම සහ වක්‍රව බලපාන සේවාවන් සපයමින් පළාතේ ජන ජීවිතයට ඉතා සමීපව ක්‍රියාත්මක වන අමාත්‍යාංශය බවට මෙම අමාත්‍යාංශය පත්ව තිබේ. ප්‍රධාන අමාත්‍යාංශය මඟින් ඉටු කිරීමට පැවරී ඇති විෂයයන් වශයෙන් පළාතේ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික යන විෂයයන්ට අදාල කටයුතු මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහන් කළ හැක. ප්‍රධාන අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු 3 ක් හා ව්‍යවස්ථාපිත ආයතන 3 ක් ක්‍රියාත්මක වේ. ඒ අනුව

1. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
2. පළාත් පාලන දෙපාර්තමේන්තුව,
3. පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව

යන දෙපාර්තමේන්තු හා

1. සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය,
2. පුස්තකාල සේවා මණ්ඩලය,
3. මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය

යන ව්‍යවස්ථාපිත ආයතන මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ඉහත ආයතනයන්හි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැලසුම්, මුදල්, ආයතන, අධ්‍යාපන හා ප්‍රසම්පාදන කටයුතු යන අංශ කිහිපයකට බෙදී අමාත්‍යාංශය කටයුතු කරනු ලැබේ.

## දැක්ම හා මෙහෙවර

**මෙහෙවර**

" සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව පළාත් පාලනය, පළාත් මාර්ග, ග්‍රාමීය යටිතල පහසුකම්,විකල්ප බලශක්ති,ජනමාධ්‍ය හා සන්නිවේදනය, පුස්තකාල, මුද්‍රණ හා තාක්ෂණික සේවා, ජනතා සුභසාධනය හා සවිබල ගැන්වීම, සංචාරක, අධ්‍යාපනය, සංස්කෘතික, මුල් ළමාවිය අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරීම සහ පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රවර්ධනය කිරීම

**දැක්ම**

යහපත් සමාජයක්, සෞභාග්‍යමත් පළාතක්

## දිගුකාලීන අරමුණු

- අධ්‍යාපන සංවර්ධනය තුළින් ගුණාත්මකභාවයෙන් යුක්තව පළාතේ දරුවන් සඳහා ඵලදායි සේවාවක් සැපයීම සඳහා යෝග්‍ය වූ ආයතන ලෙස නියාමනය කිරීම.
- උතුරු මැද පළාත තුළ දේශිය විදේශිය සංචාරක කර්මාන්තය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය කිරිම.
- උතුරු මැද පළාතේ පරිසර හිතකාමී විකල්ප බලශක්ති ක්‍රමවේදයක් ලෙස සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන සූර්ය විථි ලාම්පු හා සූර්ය පැනල් මඟින් ජාතික විදුලිබල පද්ධතියට විදුලිය ලබා දිම.
- පූර්ව ළමා විය අවධියේ දී ලබා ගත යුතු කුසලතා ලබා දීම හා ඔප් නැංවීම හා පාසල් අධ්‍යාපනයට හුරු කිරීම.
- ග්‍රාමිය ජනතාවගේ ජිවන තත්ත්වය ඉහළ නැංවිම සඳහා ග්‍රාමිය ප්‍රදේශවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම.
- ජිවනෝපාය සංවර්ධනය තුළින් උතුරු මැද ජනතාවගේ ආර්ථික හා සමාජිය තත්ත්වය ඉහළ නැංවිම.
- උතුරු මැද පළාතේ තොරතුරු තාක්ෂණය ප්‍රචලිත කිරිම හා පුස්තකාල සේවා සංවර්ධනය.
- උතුරු මැද පළාතේ පොදු මහජනතාවට ගුණාත්මක භාවයෙන් ඉහළ පළාත් පාලන සේවාවක් ලබා දීම, සහතික කිරීම සඳහා එම ආයතන නියාමනය කිරිම.
- උතුරුමැද පළාතේ සංස්කෘතික අංගයන් හා කලා ශිල්ප ප්‍රවර්ධනය.

## කෙටිකාලීන අරමුණු

- පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම හා විධිමත් සංවර්ධනයක් තුළින් ජනතාවගේ දෛනික කටයුතු පහසු කිරීම.
- ජනතාවගේ සමාජ සංවර්ධනය ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා අධ්‍යාපන සංවර්ධනය තහවුරු කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සම්පතක් ලෙස සලකා ඒකාබද්ධ සංවර්ධනයට වැඩි දායකත්වයක් ලබාගත හැකිවන පරිදි තරුණ සංවර්ධන වැඩසටහන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- මාර්ග පද්ධතිය විධිමත්ව හා සංවිධානාත්මකව වැඩි දියුණු කිරිම තුළින් ජනතාවගේ කාර්යයන් පහසු කිරීම හා පළාත තුළ ඒකාබද්ධ සංවර්ධනයට ඉඩකඩ සැකසීම.
- රටේ ජීවනාලිය බඳු ළමා පරපුරේ අනාගතය ශක්තිමත් කිරීම සඳහා පූර්ව ළමා සංවර්ධන මධ්‍යස්ථාන නගා සිටුවීම.
- පළාත් සාම්ප්‍රදායික සංස්කෘතික සාරධර්ම ආරක්ෂාකර ගැනීම හා වර්තමාන පරම්පරාව ඒ පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක හැකියාවන් වර්ධනය කිරීම.
- අධික විදුලි අවශ්‍යතාවයන්ට පිළියම් වශයෙන් විකල්ප බලශක්ති ක්‍රම හඳුන්වාදීම.
- සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරිම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සංචාරක ගම්මාන ඇති කිරීම සඳහා පහසුකම් සැලසීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

- නීතිය හා සාමය පවත්වා ගැනීමට පළාත් සභාව සියළු ආරක්ෂක අංශ ඒකාබද්ධව ක්‍රියාත්මක වීම.
- පළාත් පාලනය ආයතන පරිපාලනය කිරීම හා මූල්‍ය පාලනය සඳහා මාසික, ත්‍රෛයිමාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- පළාතේ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- දරුවන්ගේ අධ්‍යාපන කටයුතු යහපත් පරිසරයක සිට සාර්ථකව ක්‍රමවත් ලෙස ලබා දිම සඳහා ආයතනයේ ගොඩනැගිලි සංවර්ධනය කිරිම.
- ගුණාත්මක සංචාරක කර්මාන්තයක් තුළින් දේශිය ආදායම ඉහළ නැංවිම.
- බලශක්ති සඳහා වැයවන මුදල් අවම කිරිම.
- පූර්ව ළමා විය සංවර්ධනය සඳහා නිලධාරින් වෙනුවෙන් විධිමත් පුහුණුවක් ලබා දිම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- පළාත තුල පුස්තකාල සේවාව සංවර්ධනය සඳහා අවශ්‍ය භෞතික පහසුකම් සංවර්ධනය හා තොරතුරු තාක්ෂණ සංවර්ධනය
- ග්‍රාමීය ජනතාවගේ ආදායම් තත්ත්වය ඉහල නැංවීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

**පවත්වන ලද සිසු වැඩසටහන් සංඛ්‍යාව** - වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අදාලව සිසු කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන්(ක්‍රියාකාරීව ප්‍රීතිමත්වෙමු වැඩසටහන) 09ක් හා සිසු සාධනය ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් පාදක සිසු වැඩමුළු 48ක් ලෙස ඉලක්ක ගත නිමැවුමක් සඳහන් කර ඇත. වාර්ෂික සැලැස්ම යටතේ හඳුණාගත් වැඩසටහන් පැවැති තත්වය යටතේ වෙනස් කරමින් ප්‍රධාන ක්‍රියාකාරකම් 08ක් යටතේ ක්‍රියාකාරකම් 48ක් සිදු කරන ලදී.

**පෙරහුරු පරීක්ෂණ සංඛ්‍යාව** - 2021 ක්‍රියාකාරී සැලැස්ම යටතේ වාර්ෂික නිමැවුම ලෙස ප්‍රශ්න පත්‍ර 05ක් ලබා දීම ට සැලසුම් කළද ප්‍රශ්න පත්‍ර කට්ටල 08ක්, පෙරහුරු පරීක්ෂණයක් පවත්වන ලදී. ඒ අනුව වාර්ෂික නිමැවුම 09කි.

**ප්‍රාථමික විෂයය නිළධාරීන් සඳහා පවත්වන ලද වැඩසටහන් ගණන** - මේ යටතේ 2021 ක්‍රියාකාරී සැලැස්ම යටතේ වාර්ෂික නිමැයුම වැඩසටහන් 25ක් හඳුණාගෙන ඇත. මේ සඳහා සැලසුම් කළ පරිදි වැඩසටහන් සිදු කළ නොහැකි වුව ද මාර්ගගතව කළ හැකි වැඩසටහන් 6ක් සිදුකරණ ලදී.

**03.** මානව සම්පත් සංවර්ධනය (යහපාලනය හා සේවා)

**පුහුණු කරන ලද සංඛ්‍යාව** - 2021 ක්‍රියාකාරී සැලැස්ම යටතේ වාර්ෂික නිමැවුම 1390ක් වශයෙන් හඳුණාගෙන ඇත. වාර්ෂික සැලැස්ම යටතේ සඳහන් කළ වැඩසටහන් පැවැති තත්වය යටතේ සංශෝධනය කරමින් කඩිනමින් හඳුණාගත් අවශ්‍යතා වෙනුවෙන් 200 දෙනෙකු පුහුණු කර ඇත.

**04. ඉගෙනුම් සහාය සඳහා නියාමන දර්ශක සැකසීම /අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කරගත් සංවර්ධන රැස්වීම්**

**මුද්‍රණය කරන ලද දිනපොත් හා ක්ෂේත්‍ර පොත් හා අධ්‍යාපන ලිත් සංඛ්‍යාව -** මුද්‍රණය කර නැත.

**පවත්වන ලද රැස්වීම් -** ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කර ගත් රැස්වීම් හා ප්‍රගති සමාලෝචන රැස්වීම් මේ යටතේ පැවැත්වීමට සැලසුම් කර වාර්ෂික නිමැයුම වශයෙන් වැඩසටහන් 54ක් හඳුණාගෙන තිබිණි. පැවැති තත්වය හමුවේ මාර්ගගත සංවර්ධන රැස්වීම් පවත්වන ලදී.

**05. 13 වසරක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

**පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව -** 13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ 13න් වසරක අධ්‍යාපන වැඩසටහන හා සම්බන්ධ ගුරුභවතුන් හා සිසුන් ඉලක්ක කර වැඩසටහන් පැවැත්වීම සඳහා 2021 වර්ෂයේ වාර්ෂික සැලැස්ම යටතේ හඳුණා ගෙන තිබිණි. නමුත් පැවැති කොවිඩ් තත්වය යටතේ වැඩසටහන් සිදු කිරීම කළ නොහැකි විය.

**06. ගුරු සිසු ඇගයීම**

**ඇගයීම්ලාභීන් සංඛ්‍යාව -** ගුරු සිසු ඇගයීම් උත්සවය පැවැත්වීම - පළාත් උත්සවය ( 2020 වර්ෂයේ ජාතික විභාග ප්‍රතිඵලවලින් /විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින්/ විවිධ විෂයයන්හි සමස්ත ලංකා මට්ටමේ තරඟවලින් විශිෂ්ට කුසලතා දැක්වූ දරුවන්, ගුරුවරු ) පැවැති කොවිඩ් තත්වය යටතේ ඇගයීම් උත්සවය සංවිධානය කළ නොහැකි විය.

**07. ද්විතියික අධ්‍යාපනය - ගුරු හා සිසු නිපුණතා සංවර්ධනය**

**පවත්වන ලද ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව -** මේ යටතේ ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඉලක්ක කර ගනිමින් විෂයයන් 28ක් හරහා ඒ ඒ විෂයයන්හි ශිෂ්‍ය සාධනය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව දැනුම යාවත්කාලීන කිරීම, විෂය නව ප්‍රවණතා හඳුන්වා දීම පිළිබඳ සැලසුම් කළ ගුරු පුහුණු වැඩසටහන් 42ක් සැලසුම් කරන ලදී. පැවැති තත්ව යටතේ සැලසුම් කළ වැඩසටහන් සිදු කළ නොහැකි වූ අතර හඳුණා ගන්නා ලද නව අවශ්‍යතා යටතේ මාර්ගගතව කළ හැකි වැඩසටහන් සිදු කරන ලදී. සිදුකරන ලද වැඩසටහන් ගණන 25කි.

**පවත්වන ලද සිසු කඳවුරු හා සම්මන්ත්‍රණ සංඛ්‍යාව -** මේ යටතේ ද්විතියික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධන ඉලක්ක කර ගනිමින් විෂයයන් 28ක් ඔස්සේ වැඩසටහන් සැලසුම් කරන ලදී. පැවැති තත්වය යටතේ සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි වුවද දුරස්ථ අධ්‍යාපන උපක්‍රම අනුගමනය කළ හැකි වැඩසටහන් හඳුණාගනිමින ක්‍රියාත්මක කරන ලදී . 2021 වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ වැඩසටහන් 477ක් සැලසුම් කළ තිබුණ ද වැඩසටහන් 286ක් පමණ සිදු කරන ලදී.

**08. ක්‍රීඩා සංවර්ධනය**

**පවත්වන ලද සිසු පුහුණු කඳවුරු සංඛ්‍යාව හා තරඟ සංඛ්‍යාව -** මේ යටතේ හඳුණාගත් ක්‍රීඩා සංවර්ධනය සඳහා ක්‍රීඩා සංචිත තෝරා ගනිමින් එම සංචිත සිසුන් පුහුණු කිරීමේ කඳවුරු හා ජාතික පාසල් ක්‍රීඩා වැඩසටහනට සමගාමීව කොට්ඨාස ,කලාප, පළාත් ක්‍රීඩා තරග පැවැත්වීම, පුහුණු කිරීම් හා වර්ණ ප්‍රධාන උත්සවයන් සැලසුම් කර තිබිණි. නමුත් පැවැති තත්වය හමුවේ සෞඛ්‍ය නිර්දේශ වලට අනුගත වෙමින් ක්‍රිඩා පැවැත්වීම කළ නොහැකි බැවින් ජාතික මට්ටමින් ම ක්‍රීඩා පැවැත්වීම අත්හිටවන ලදී.

**09. සැලසුම් හා පර්යේෂණ**

**සකසන ලද අධ්‍යාපන සංවර්ධන සැලැස්ම -** මේ යටතේ කලාප පළාත් ඒකාබද්ධ 2021 – 2025 පස් අවුරුදු මානව සම්පත් සංවර්ධන සැලැස්ම හා 2021 වාර්ෂික සැලැස්ම සකස් කිරීම සිදු කරන ලදී. කලාප 08 සඳහා කලාප මට්ටමින් හා එම සැලසුම් ඒකාබද්ධ කරමින් පළාත් සැලසුමත් සංවර්ධනය කරන ලදී.

**පර්යේෂණ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී වූ සංඛ්‍යාව -** මේ යටතේ ගුණාත්මක සංවර්ධනය ඉලක්ක කර ගනිමින් කාර්යය මූල පර්යේෂණ පළාත තුළ ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව 90 දෙනෙකු පුහුණු කිරීමට සැලසුම් කළ තිබිණ ද පැවැති තත්වය යටතේ 60 දෙනෙකු සඳහා මූලික පුහුණුව ලබා දෙන ලදී.

**පර්යේෂණ සඳහා සිසුන් යොමු කිරීම සඳහා සිදු කරන ලද වැඩසටහන් සඳහා සහභාගී වූ සිසුන් සංඛ්‍යාව -** මේ යටතේ පාසල් සිසුන් අනාගත පර්යේෂකයන් ලෙස පුහුණු කිරීම අරමුණ කරගනිමින් දිනපොත් ආශ්‍රිත ක්‍රියාකාරකම් පාදක පර්යේෂන ක්‍රියාවලිය සඳහා පුහුණු කිරීමේ වැඩසටහන 2021 වර්ෂය සඳහා හඳුණා ගන්නා ලදී. 2021 වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම යටතේ සැලසුම් කළ වාර්ෂික නිමැවුම සිසුන් 150ක් වුවත් සිසුන් 221ක් සඳහා පළමු අදියරේ පුහුණුව ලබා දෙන ලදී.

**10. සිසු සාධන මට්ටම ඉහළ දැමීම**

**පවත්වන ලද වාර විභාග හෝ පෙරහුරු පරීක්ෂණ සංඛ්‍යාව -** මේ යටතේ සිසුන්ගේ සාධන මට්ටම් ඉහළ නැංවීම සඳහා වූ අනාවරණයන් සඳහා දෙවන හා තෙවන වාර විභාග පැවැත්වීම, පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම 2021 වර්ෂය සඳහා හඳුණාගන්නා ලද ක්‍රියාකාරකම් විය. පැවැති තත්වය යටතේ පාසල් පද්ධතිය වසා දමා තිබූ බැවින් 3 – 13 ශ්‍රේණි සඳහා විධිමත් ලෙස සැලසුම් කළ වාර පරීක්ෂණ පැවැත්විය නොහැකි විය. නමුත් ජාතික විභාග ඉලක්ක කරමින් 13 හා 11 ශ්‍රේණි සිසුන් සඳහා පෙරහුරු පරීක්ෂණ 2බැගින් ක්‍රියාත්මක කරන ලදී.

**11. පාසල්වල ප්‍රාථමික හා ද්විතියික අංශවල සෞඛ්‍ය ප්‍රවර්ධනය -**

**පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව -** මේ යටතේ නිලධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්ය මණ්ඩල පුහුණු , සෞඛ්‍ය කඳවුරු, පෝෂණ වැඩසටහන්, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 2021 වර්ෂය සඳහා සැලසුම් කර තිබිණි. නමුත් පැවැති තත්වය යටතේ පාසල් වසා දමා තිබූ බැවින් සැලසුම් කළ වැඩසටහන් වලින් පෝෂණ වැඩසටහන පිළිබඳ දැණුවත් කිරීමේ වැඩසටහන් පමණක් පැවැත්විය හැකි විය. පාසල් ක්‍රියාත්මක වූ දිනවල පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් 694 හි පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක විය.

**12. පාසල් නඟා සිටුවීමේ වැඩසටහන බලවන්ත කිරීම -**

**පවත්වන ලද පාසල් විධායක කමිටු, කළමනාකරණ කමිටු දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව -** පාසල් විධායක කමිටු, කළමනාකරණ කමිටු දැනුවත් කිරීමේ වැඩසටහන් 30ක් සැලසුම් කරන ලද අතර වැඩසටහන් 03ක් පමණක් සිදු කළ හැකි විය.

**මේ යටතේ සැලසුම් කළ විදුහල්පතිවරු දැනුවත් කිරීම, පාසල් කාර්ය මණ්ඩල දැනුවත් කිරීම, දෙමව්පියන් දැනුවත් කිරීම සඳහා වූ වැඩසටහන් පැවැති තත්වය යටතේ ක්‍රියාත්මක කළ නොහැකි විය.**

**13. පළාත්, ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා සිසුන් ඉදිරිපත් කිරීම -**

**පවත්වන ලද කොට්ඨාස /කලාප/පළාත් තරඟ සංඛ්‍යාව -** මේ යටතේ ජාතික මට්ටමින් විෂයානුබද්ධව පැවැත්වෙන ජාතික තරග හා ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරග වලට සමගාමීව කොට්ඨාස,කලාප, පළාත් තරග හා තරග පුහුණු හා ජාතික මට්ටමේ වැඩසටහන් සඳහා සහභාගිවීමේ වැඩසටහන් සැලසුම් කරන ලදී. පැවැති කොවිඩ් තත්වය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තරග පැවැත්වීම අත්හිටුවීම හමුවේ වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි විය.

**14. විශේෂ අධ්‍යාපන ගුරු හා සිසු නිපුණතා සංවර්ධනය -**

විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා විශේෂ අවශ්‍යතා සහිත සිසුන් ඉලක්ක කරගත් වැඩසටහන් හා එම සිසුන් සඳහා ඉගැන්වීමේ නිරත ගුරු භවතුන් පුහුණු කිරීමේ වැඩසටහන් මේ යටතේ සැලසුම් කරන ලදී. නමුත් පැවැති තත්වය යටතේ සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි විය.

**15. නොවිධිමත් අධ්‍යාපනය**

**ගුරු පුහුණු - ඇද හැලීමට ආසන්න දරුවන් හඳුනා ගැනීම, දෙමාපියන් දැනුවත් කිරීම පිළිබඳ ගුරු පුහුණු, පාසල් හැර ගිය සිසුන් වෘත්තීය පුහුණුවලට යොමු කිරීම සඳහා ගුරු පුහුණු -** පැවැති තත්වය යටතේ සැලසුම් කළ ක්‍රියාකාරකම් කළ නොහැකි වූ අතර පාසල් හැර ගිය අය වෙනුවෙන් මැහුම් පාඨමාලා 6ක් පමණක් ක්‍රියාත්මක කළ හැකි විය.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණයට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලගාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 04. පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. | | | | | | |
| 4.1. ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵලලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනය සඳහා යොමු කිරීම | 4.1.1 ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ, කියවීම හා ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු සහා පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය අවම මට්ටමකට ගෙන ඒම. (5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි අගයක් ගන්නා සිසු ප්‍රතිශතය 70%) | නුපුහුණු ප්‍රාථමික ගුරු පුහුණු<br><br>ගුරුභවතුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන්<br><br>සිසු කුසලතා ඉහළ නැංවීමේ වැඩසටහන්<br><br>4,5 ශ්‍රේණි ශිෂ්‍යත්ව පෙරහුරු පරීක්ෂණ<br><br>නිළධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් | නුපුහුණු උපාධිධාරී ප්‍රාථමික ගුරුභවතුන් පුහුණු කිරීම)<br><br>4 ශ්‍රේණීය අනාවරණ පිළිබඳව ප්‍රාථමික ගුරුභවතුන් පුහුණු කිරීම<br><br>අදිති ශිෂ්‍යත්ව පෙර පුහුණු වැඩසටහන<br><br>3- ශ්‍රේණිය ගණිතය,මව්බසසහ පරිසරය ආශ්‍රිත සිසු ක්‍රියාකාරකම් සඳහා පුහුණු වැඩමුළුව<br><br>තෙවන ශ්‍රේණිය සිසුන්ගේ සාක්ෂරතාවය පිළිබද මූලික අධ්‍යනය සඳහා ගුරු පුහුණුව<br><br>ප්‍රාථමික විෂයය ඉගැන්වීම සඳහා පාසල් සඳහා අනුයුක්ත කළ අභ්‍යසලාභී උපාධිධාරීන් දිශාභිමුඛ කිරීමේ වැඩසටහන<br><br>බහුතල ඉගෙනුම පිළිබද ගුරුභවතුන් පාසල් පාදකව දැණුවත් කිරීම<br><br>මාර්ගගත ඉගැන්වීම පිළිබඳව ප්‍රාථමික ගුරුභවතුන් දැනුවත් කිරීම.<br><br>රජරට ගුරුගෙදර ඉගෙනුම් සත්කාරක වැඩසටහන - සිංහල,පරිසරය, ගණිතය (3,4,5 ශ්‍රේණි සඳහා)<br><br>රජරට ගුරුගෙදර ඉගෙනුම් සත්කාරක වැඩසටහන - වාචික ඉංග්‍රිසි (1,2,3,4,5 ශ්‍රේණි සඳහා)<br><br>සිසු ඉගෙනුම් ආධාරක ක්‍රියාකාරකම් පාදක ග්‍රන්ථ ලබා දීම.<br>(1,2,3,4,5 ශ්‍රේණි සඳහා)<br><br>1-5 ශ්‍රේණිවල සිසුන් සඳහා නිවෙස් පාදක ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් පත්‍රිකා ලබා දීම<br><br>පහට පහක් ප්‍රශ්න පත්‍ර සංග්‍රහය<br><br>ප්‍රතිප්රබෝධා ප්‍රශ්න පත්‍ර කට්ටල 08ක් ලබා දීම<br>මාර්ගගත සම්මන්ත්‍රණ<br><br>ප්‍රගති සමලොචන රැස්වීම<br><br>රජරට ගුරු ගෙදර අන්තර්ගතයන් සකස් කිරීම සම්බන්ධ මාර්ගගත දැණුවත් කිරීම.<br><br>ප්‍රතිප්‍රබෝධා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ මාර්ගගත දැණුවත් කිරීම.<br>අභ්‍යසලාභී උපාධිධාරීන් දිශාභිමුඛ කිරීමේ | | 69% | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 4.1.2 ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම, අවම මට්ටමක සහිත පිරිමි හා ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය අවම මට්ටමකට ගෙනඒම - (අ.පො.ස.- සා/පෙළ සිංහල සමත් ප්‍රතිශතය ඉහල නැංවීම ) 91 % ඉහල නැංවීම | සිංහල විෂයය ඉලක්ක කරගත් ගුරු සිසු සංවර්ධන වැඩසටහන් | වැඩසටහන පිළිබද මාර්ගෝපදේශය පිළිබද කලාප නිළධාරීන් මාර්ගගතව දැණුවත් කිරීම.<br><br>2022 වර්ෂයේ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් දැණුවත් කිරීමේ මාර්ගගත වැඩසටහන<br><br>සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය පිළිබද දැණුවත් කිරීමේ මාර්ගගත වැඩසටහන<br><br>සම්මිශ්‍රිත අධ්‍යාපනය හා ඉගෙනුම් උපක්‍රම පිළිබදව දැණුවත් කිරීමේ මාර්ගගත වැඩසටහන<br>නිදහසේ කියවා ලියමු අ.පො.ස.(සා.පෙළ) උපකාරක ග්‍රන්ථය ලබා දීම<br><br>අ.පො.ස.(සාපෙළ) විභාගය ඉලක්ක කර ගනිමින් විෂයය ඒකකයන් සදහා මාර්ග ගත සම්මන්ත්‍රණ පැවැත්වීම.<br><br>රජරට ගුරු ගෙදර හරහා සිංහල විෂයය සම්මන්ත්‍රණ පැවැත්වීම | | | 100% |
| | 4.1.3 ද්විතියික ශ්‍රේණි අවසානයේ ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත පිරිමි හා ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය - (අ.පො.ස. - සා.පෙළගණිත විෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 70% | ගණිතය විෂයය ඉලක්ක කරගත් ගුරු සිසු සංවර්ධන වැඩසටහන් | අ.පො.ස (සා.පෙළ) විභාගය ඉලක්ක කර ගනිමින් පෙරහුරු ප්‍රශ්න පත්‍ර කට්ටල දෙකක් ලබා දීම.<br><br>තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ඉගැන්වීම සිදු කිරීම සම්බන්ධයෙන් ගුරුභවතුන් පුහුණු කිරීම.<br><br>11 ශ්‍රේණියේ සිසුන් සදහා දෛනික පුනරීක්ෂණ අභ්‍යාස පොතක් ලබා දීම.<br><br>රජරට ගුරුගෙදර රේඩියෝ වැඩසටහන හරහා ගණිත පාඩම් විකාශය කිරීම.<br><br>යූ ටියුබ් වීඩියෝ පාඩම් සකස් කර දීම.<br><br>Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සදහා ගණිත පාඩම් ඉගැන්වීම. (6 – 11 ශ්‍රේණි සදහා)<br><br>නිවෙස් පාදක ඉගෙනුම් කට්ටල ලබා දීම<br><br>ස්වයං ඉගෙනුම් පත්‍රිකා ලබා දීම<br><br>සිසුන් සදහා පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම.<br><br>පුනරීක්ෂණ කදවුරු පැවැත්වීම.<br><br>මාර්ගගත පරීක්ෂණ පැවැත්වීම<br><br>ගණිතය විෂයය පෙර ඉගෙනුම් කාර්යය පත්‍රිකා සකස් කිරීම සම්බන්ධ ගුරු පුහුණුව<br><br>මාර්ගගත ඉගැන්වීම සම්බන්ධයෙන් ගුරු පුහුණුව<br><br>ගණිත ඉගෙනුම් ක්‍රියාකාරකම් කට්ටල සකස් කිරීම සම්බන්ධ සම්පත්දායක පුහුණුව | | | 90% |

හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ඉතිරි කොටස ............................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණයට ලඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 4.3. සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මකවශයෙන් ඉහළ සහ දැරියහැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතියික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | 4.3.1 අ.පො.ස.(උසස් පෙළ) විද්‍යාව හා තාක්ෂණවේද්‍ය විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 35% | විද්‍යාව , ගණිතය, තොරතුරු තාක්ෂණය විෂයය ඉලක්ක කරගත් ගුරු/ සිසු වැඩසටහන්. | විද්‍යාව, ගණිතය, තොරතුරු තාක්ෂණ විෂයය සඳහා විෂයය නිර්දේශ ආවරණය , පුනරීක්ෂණ කාර්යය පහසු කිරීමේ ග්‍රන්ථ සකස් කර ලබා දීම.<br>ගණිතය, විද්‍යාව, තොරතුරු තාක්ෂණය විෂයය සඳහා මාර්ගගත ශිෂ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම.<br>රජරට ගුරුගෙදර ගුවන් විදුලි පාඩම් විකාශනය<br>Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සඳහා ඉගැන්වීම.<br>ස්වයං ඉගෙනුම් කට්ටල ලබා දීම<br>නිවෙස් පාදක ඉගෙනුම් කට්ටල ලබා දීම<br>මාර්ගගත පරීක්ෂන පැවැත්වීම.<br>යූ ටියුබ් පාඩම් විකාශය කිරීම.<br>පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම<br>ගණිතය විෂයය සඳහා ප්‍රතිපෝෂණ කඳවුරු පැවැත්වීම.<br>මාර්ගගත ඉගැන්වීම් පිළිබඳ ගුරු පුහුණු වැඩසටහන්. | | | 91% |
| | | අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල ගුණාත්මකව ඉහළ දැමීමේ වැඩසටහන් | ගණිතය විෂයය පෙර ඉගෙනුම් කාර්යය පත්‍රිකා සකස් කිරීම සම්බන්ධ ගුරු පුහුණුව.<br>සා.පෙළ ඉලක්ක කර සියළු විෂයයන් සඳහා රජරට ගුරු ගෙදර ගුවන්විදුලි වැඩසටහන් විකාශය කිරීම<br>නිවෙස් පාදක ඉගෙනුම් මෙවලම් ලබා දීම.<br>ස්වයං ඉගෙනුම් පත්‍රිකා ලබා දීම.<br>යූ ටියුබ් පාඩම් විකාශය කිරීම.<br>පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම | | | |
| | | උසස් පෙළ විද්‍යාව විෂයය ධාරාවේ ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු/ සිසු වැඩසටහන් | මාර්ගගත පරීක්ෂන පැවැත්වීම.<br>Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සඳහා ඉගැන්වීම.<br>Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.<br>ප්‍රායෝගික පරීක්ෂණ ඇතුලත් වීඩියෝ පාඩම් ලබා දීම. | | 70% | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | උසස් පෙළ තාක්ෂණවේද ය විෂයය ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු/සිසු වැඩසටහන් | පෙරහුරු පරීක්ෂණ දෙකක් පැවැත්වීම. | | | |
| | 4.3.2 අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 30% | අ.පො.ස.(සා. පෙළ) වානිජ හා ගිණුම් විෂයය ප්‍රතිඵල ඉහළ නැංවීම<br>උසස් පෙළ වාණිජ විෂයය ධාරාවේ ප්‍රතිඵල ඉහළ නැංවීම | Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.<br>පෙරහුරු පරීක්ෂණ දෙකක් පැවැත්වීම.<br>Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.<br>පෙරහුරු පරීක්ෂණ දෙකක් පැවැත්වීම.<br>Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.<br>පෙරහුරු පරීක්ෂණ දෙකක් පැවැත්වීම. | 37% | | |
| | 4.3.3 අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගීත්වය අඩු කිරීමේ වැඩසටහන්. 35% | අ.පො.ස.(සා. පෙළ) ප්‍රතිඵල ගුණාත්මකව ඉහළ දැමීමේ වැඩසටහන් | මහ බැංකුව අනුග්‍රහයෙන් සිසුන් සඳහා ආර්ථික විද්‍යා විෂයය සම්මන්ත්‍රණ මාර්ගගත ක්‍රමවේදයට පැවැත්වීම.<br>සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදෙශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>සා.පෙළ ඉලක්ක කර සියළු විෂයයන් සඳහා රජරට ගුරු ගෙදර ගුවන්විදුලි වැඩසටහන් විකාශය කිරීම<br>නිවෙස් පාදක ඉගෙනුම් මෙවලම් ලබා දීම. | 35% | | |
| | 4.3.4. 13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන | 13න් වසරක අධ්‍යාපනය ඉලක්ක කරගත් ගුරු/සිසු සංවර්ධන වැඩසටහන් | ස්වයං ඉගෙනුම් පත්‍රිකා ලබා දීම.<br>යූ ටියුබ් පාඩම් විකාශය කිරීම.<br>පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම<br>මාර්ගගත පරීක්ෂන පැවැත්වීම. | | | |
| | 4.3.5 පාසල් හැරයන්නන් සඳහා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | පාසල් හැරයන්නන් සඳහා දිගුකාලීන වෘත්තීය පාඨමාලා ක්‍රියාත්මක කිරීම | Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සඳහා ඉගැන්වීම<br>පැවැති කොවිඩ් තත්වය හමුවේ වැඩසටහන් සිදුකළ නොහැකි විය. | | | |

හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ඉතිරි කොටස .............................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණයට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලගාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 4.4. අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහවැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම. | 4.4.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුත් සිසුන් ප්‍රමාණය වර්ධනය කිරීම 10-11 ශ්‍රේණි සිසුන් - 16000 12-13 ශ්‍රේණි සිසුන් - 4500 | තොරතුරු තාක්ෂණ විෂයය ඉලක්ක කරගත් ගුරු/සිසු සංවර්ධන වැඩසටහන් | තොරතුරු තාක්ෂණ විෂයය හඳුන්වා දීමේ මාර්ගගත වැඩසටහන්<br>තොරතුරු තාක්ෂණ විෂයය සඳහා විෂයය නිර්දේශ ආවරණ ග්‍රන්ථ ලබා දීම<br>මාර්ගගත සම්මන්ත්‍රණ පැවැත්වීම<br>රජරට ගුරුගෙදර රේඩියෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | | | 93% |
| 4.5. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳපවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින් සඳහා සියළු මට්ටමේඅධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම. | 4.5.1 කුසලතා සංවර්ධනය වූ විශේෂ අධ්‍යාපන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ දැමීම | විශේෂ අධ්‍යාපන ගුරු/සිසු සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | පැවැති කොවිඩ් තත්වය හමුවේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | 0% | | |
| | 4.5.2පෝෂණ වැඩසටහන් (උදෑසන ආහාර හා කිරි) ක්‍රියාත්මක කිරීම. | පාසල් වල උදෑසන පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම | පෝෂණ වැඩසටහන පිළිබඳ දැණුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම<br>පාසල් වල පෝෂණ වැඩසටහන් පැවැත්වීම<br>සෞඛ්‍ය සමාජ පිහිටුවීම පිළිබඳ පාසල් ප්‍රධානීන් දැණුවත් කිරීම | 100<br>1%<br>1% | | |
| | 4.5.3 සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වයන් වැඩි දියුණු කිරීම තහවුරුකිරීම | නිළධාරී, විදුහල්පති හා අනධ්‍යයන කාර්යය මණ්ඩල පුහුණු<br>සෞඛ්‍ය කඳවුරු පැවැත්වීම | මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම<br>මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම<br>උපදේශණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අත්පොත් සකස් කිරීම | 3%<br>30% | | |
| | .4.5.4. ශිෂ්‍ය උපදේශනය ශක්තිමත් කිරීම | උපදේශණ විෂයය ගුරු/සිසු වැඩසටහන් | උපදේශනාත්මක කුඩා වීඩියෝ පට සකස් කර යූ ටියුබ් නාලිකා මගින් එකතු කිරීම | | | |

හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ඉතිරි කොටස ............................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණයට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 4.6. සියලු ම තරුණයින් හා කාන්තා හා පිරිමිවැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන් කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම. | 4.6.1 අවම සාක්ෂරතාව ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (අ.පො.ස. - සා/පෙළ සිංහල විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය) | සිංහල විෂයය ප්‍රතිඵල ඉලක්ක කරගත් ගුරු/සිසු වැඩසටහන් | නිදහසේ කියවා ලියමු<br>අ.පො.ස.(සා.පෙළ) උපකාරක ග්‍රන්ථය ලබා දීම<br>අ.පො.ස.(සාපෙළ) විභාගය ඉලක්ක කර ගනිමින් විෂයය ඒකකයන් සඳහා මාර්ග ගත සම්මන්ත්‍රණ පැවැත්වීම.<br>රජරට ගුරු ගෙදර හරහා සිංහල විෂයය සම්මන්ත්‍රණ පැවැත්වීම<br>අ.පො.ස (සා.පෙළ) විභාගය ඉලක්ක කර ගනිමින් පෙරහුරු ප්‍රශ්න පත්‍ර කට්ටල දෙකක් ලබා දීම. | | | 100% |
| | 4.6.2 සංඛ්‍යාමය කාර්ය කුසලතාවය සහිත ශිෂ්‍ය ප්‍රතිශතය (අ.පො.ස. - සා/පෙළ ගණිත විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය 68%) | ගණිත විෂයය ඉලක්ක කරගත් ගුරු/සිසු වැඩසටහන් පැවැත්වීම. | තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ඉගැන්වීම සිදු කිරීම සම්බන්ධයෙන් ගුරුභවතුන් පුහුණු කිරීම.<br>11 ශ්‍රේණියේ සිසුන් සඳහා දෛනික පුනරීක්ෂණ අභ්‍යාස පොතක් ලබා දීම.<br>රජරට ගුරුගෙදර රේඩියෝ වැඩසටහන හරහා ගණිත පාඩම් විකාශය කිරීම.<br>යූ ටියුබ් වීඩියෝ පාඩම් සකස් කර ලබා දීම.<br>Zoom තාක්ෂණය ඔස්සේ සිසුන් සඳහා ගණිත පාඩම් ඉගැන්වීම. (6 – 11 ශ්‍රේණි සඳහා)<br>නිවෙස් පාදක ඉගෙනුම් කට්ටල ලබා දීම<br>ස්වයං ඉගෙනුම් පත්‍රිකා ලබා දීම<br>සිසුන් සඳහා පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම.<br>පුනරීක්ෂණ කඳවුරු පැවැත්වීම.<br>මාර්ගගත පරීක්ෂණ පැවැත්වීම<br>ගණිතය විෂයය පෙර ඉගෙනුම් කාර්යය පත්‍රිකා සකස් කිරීම සම්බන්ධ ගුරු පුහුණුව<br>මාර්ගගත ඉගැන්වීම සම්බන්ධයෙන් ගුරු පුහුණුව<br>ගණිත ඉගෙනුම් ක්‍රියාකාරකම් කට්ටල සකස් කිරීම සම්බන්ධ සම්පත්දායක පුහුණුව | | | 98% |

හදුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ඉතිරි කොටස .............................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණයට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලගාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 4.7. තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානවහිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීයපුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හා තිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම | 4.7.1 සියළු විෂයයන් සඳහා ගුරුභවතුන් ගේ නිපුණතා සංවර්ධනය - පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව 44 | සියළු විෂයයන් සඳහා ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | තාක්ෂණය භාවිතා කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීම සම්බන්ධයෙන් වූ ගුරු පුහුණු.<br><br>ගණිතය විෂයය පෙර ඉගෙනුම් කාර්යය පත්‍රිකා සකස් කිරීම සම්බන්ධ ගුරු පුහුණුව<br><br>ගණිත ඉගෙනුම් ක්‍රියාකාරකම් කට්ටල සකස් කිරීම සම්බන්ධ සම්පත්දායක පුහුණුව | 40% | | |
| | 4.7.2 සියළුම විෂයයන් සඳහා පවත්වනලද සිසු පුහුණු සංඛ්‍යාව - 477 | සියළු විෂයයන් සඳහා සිසු පාදක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ගණිතය විෂයය පෙර ඉගෙනුම් කාර්යය පත්‍රිකා සකස් කිරීම සම්බන්ධ ගුරු පුහුණුව<br><br>6 – 11 ශ්‍රේණි ඉලක්ක කර ගනිමින් රජරට සේවය හරහා රජරට ගුරුගෙදර අධ්‍යාපනික වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br><br>11 ශ්‍රේණිය සඳහා සියළු සිසුන්ට සියළු විෂයයන්ට අදාලව ඉගෙනුම් ආධාරක පොත් ලබා දීම.<br><br>මාර්ගගත ක්‍රම භාවිතා කරමින් උසස් පෙළ සඳහා ශිෂ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම.<br><br>යූ ටියුබ් නාලිකා හරහා වීඩියෝ පාඩම් විකාශනය<br><br>6-9 ශ්‍රේණි සිසුන් සඳහා ස්වයං ඉගෙනුම් පත්‍රිකා ලබා දීම. | | 70% | |
| | 4.7.3 ශිෂ්‍ය ඇගයීම් පැවැත්වීම (වාර විභාග) – 3 – 13 ශ්‍රේණි සඳහා සියලු ප්‍රශ්න පත්‍ර ලබාදීම ප්‍රශ්න පත්‍ර -570 | 3 -13 ශ්‍රේණි සිසුන් සඳහා දෙවන හා තෙවන වාර පරීක්ෂණ පැවැත්වීම | 6-9 ශ්‍රේණි සිසුන් සඳහා නිවෙස් පාදක ඉගෙනුම් මෙවලම් ලබා දීම.<br><br>සිසුන් සඳහා මාර්ගගත පරීක්ෂණ පැවැත්වීම.<br><br>5 ශ්‍රේණිය සඳහා ප්‍රතිප්‍රබෝධා ප්‍රශ්න පත්‍ර කට්ටල 08ක් ලබා දීම.<br><br>13 ශ්‍රේණිය සඳහා පෙරහුරු පරීක්ෂණ දෙකක් පැවැත්වීම.<br><br>11 ශ්‍රේණිය සඳහා පෙරහුරු පරීක්ෂණ දෙකක් පැවැත්වීම. | | | 80% |

හදුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ඉතිරි කොටස ............................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණයට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලගාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 4.8. ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවයපිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායිඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම. | 4.8.1 බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව - 813 | පළාතේ පාසල් සඳහා බාහිර මාර්ගෝපදේශ වැඩසටහන පැවැත්වීම | පාසල් බාහිර මාර්ගෝපදේශ වැඩසටහන | 30% | | |
| 4.10.සංවර්ධනය වෙමින් පවතින, විශේෂයෙන්ම අවම වශයෙන්සංවර්ධිත රටවල හා කුඩා දූපත් ප්‍රාන්තවල ගුරු පුහුණුව සඳහා ජාත්‍යාන්තරසහයෝගීතාව ලබාගෙන සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතු ලෙස වැඩිකිරීම. | 4.10.1 පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන් සිදු කරන පාසල්සංඛ්‍යාව - 817 | පාසල් පාදක ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | මාර්ගගත ක්‍රමයට ඉගෙනුම් ඉගැන්වීම සිදු කිරීම සම්බන්ධ ගුරු පුහුණු. | 35% | | |

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

**01. ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහගුණාත්මක භාවයෙන් ඉහළ ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා යොමු කිරීම.**

මෙම ගෝලීය අරමුණට ලගා වීම සඳහා ආයතනය විසින් සැලසුම් කළ ඉලක්ක අතරින් පළමු ඉලක්කය වන ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ, කියවීම හා ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත ගැහැණු සහා පිරිමි ළමුන්ගේ ප්‍රතිශතය අවම මට්ටමකට ගෙන ඒම. (5 ශ්‍රේණි ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 100 ට වැඩි අගයක් ගන්නා සිසු ප්‍රතිශතය) මේ සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව කලාප අධ්‍යාපන කාර්යාල හා එක්ව ප්‍රාථමික අධ්‍යාපනයේ නිරත ගුරුභවතුන් හා සිසුන් ඉලක්ක කර ගනිමින් වැඩසටහන්, පෙරහුරු පරීක්ෂණ, ප්‍රාථමික විෂයය නිළධාරීන් සඳහා වූ වැඩසටහන් සැලසුම් කර තිබිණි. අනපේක්ෂිත ලෙස ගෝලීය වශයෙන් පැතිර ගිය කොවිඩ් 19 වසංගත තත්වය යටතේ පාසල් පද්ධතිය වසා දැමීම හේතුවෙන් 2021 වාර්ෂික සැලැස්ම යටතේ සකස් කළ වැඩසටහන් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නව තත්වය යටතේ හදුණාගත අවශ්‍යතා මත දුරස්ථ ඉගෙනුම් උපක්‍රම යොදා ගනිමින් ප්‍රාථමික සිසුන්ගේ සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා වැඩසටහන්

දියත් කරන ලදී.( සිදු කරන ලද වැඩසටහන් 5.1 යටතේ ඇතුලත් කර ඇත) එසේම ගුරුභවතුන් සඳහා ද මාර්ගගතව හා භෞතික වශයෙන් නව තත්වය යටතේ අවශ්‍යතා හඳුණාගනිමින් වැඩසටහන් සිදු කරන ලදී. මෙහිදී ඉලක්කය සපුරා ගැනීමේ කාර්යය සාධනය 69%කි. කාර්යය සාධනය සපුරා ගැනීම 69% වුවත් 2021 වර්ෂයේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් උතුරු මැද පළාත දිවයිනෙන් 5වෙනි ස්ථානය ලබා ගැනීම ජයග්‍රහණයකි.

දෙවන ඉලක්කය වශයෙන් ද්විතියික ශ්‍රේණි අවසානයේ කියවීම, අවම මට්ටමක සහිත පිරිමි හා ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය අවම මට්ටමකට ගෙනඒම - (අ.පො.ස.- සා/පෙළ සිංහල සමත් ප්‍රතිශතය ඉහල නැංවීම ) 90 % ඉහල නැංවීම හඳුණාගන්නා ලදී. 2020 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව සිංහල විෂයය සමත් ප්‍රතිශතය 90.3කි . එය පළාතක් වශයෙන් ලබා ගත් ජයග්‍රහණයකි. එසේම තෙවන ඉලක්කය වශයෙන් ද්විතියික ශ්‍රේණි අවසානයේ ගණිතමය කුසලතා අවම මට්ටමක සහිත පිරිමි හා ගැහැණු ළමුන්ගේ ප්‍රතිශතය -(අ.පො.ස. - සා.පෙළගණිතවිෂයයට සාමාන්‍ය සාමාර්ථ ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය) 70% දක්වා ඉහළ නැංවීම හඳුණාගන්නා ලදී. 2020 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල අනුව ගණිතය විෂයය සමත් ප්‍රතිශතය 68.47කි. ඉලක්කය සාධනය කර ගැනීම 100%කින් සපුරා ගැනීමට නොහැකි වුවද 2019 වර්ෂට සාපේක්ෂව 1%ක වර්ධනයක් අත්පත්කර ගෙන ඇත. මෙම ජයග්‍රහන ලබා ගැනීම සඳහා කලාප හා පළාත් ඒකාබද්ධව සැලසුම් කළ ක්‍රියාකාරකම් ඒ අයුරින්ම පැවැති ගෝලීය වසංගත තත්වය යටතේ කළ නොහැකි වූ නමුත් මාර්ගගතව හා දුරස්ථව කළ හැකි ක්‍රියාකාරකම් හඳුණාගෙන ක්‍රියාත්මක කරන ලදී. (සිදු කරන ලද වැඩසටහන් 5.1 යටතේ ඇතුලත් කර ඇත)

**02. සියලුම කාන්තාවන්ට හා පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ දැරියහැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත් තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය සඳහා සමාන ප්‍රවේශයක් සහතික කිරීම.**

මේ සඳහා ආතනික වශයෙන් හඳුණාගන්නා ලද ඉලක්ක

- අ.පො.ස.(උසස් පෙළ) විද්‍යාව හා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. 35% දක්වා
- අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම. – 30% දක්වා
- අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගීත්වය අඩු කිරීම. – 35% දක්වා
- 13න් වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- පාසල් හැරයන්නන් සඳහා නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

උසස් පෙළ විද්‍යා විෂයය ධාරාව හා තාක්ෂණවේදය විෂයයධාරාව සහභාගිත්ව අනුපාතය උතුරු මැද පළාත තුළ 32%ක අගයක් ගනී. ඉලක්කය සාධනය කර ගැනීම 91%කි. මෙම කාර්යය සාධනය අත්පත් කර ගැනීම සඳහා , විද්‍යාව , ගණිතය, තොරතුරු තාක්ෂණය විෂයය ඉලක්ක කරගත් ගුරු/ සිසු වැඩසටහන්., අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල ගුණාත්මකව ඉහළ දැමීමේ වැඩසටහන්, උසස් පෙළ විද්‍යාව විෂයය ධාරාවේ ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු/ සිසු වැඩසටහන්, උසස් පෙළ තාක්ෂණවේදය විෂයය ප්‍රතිඵල ඉහළ නැංවීමේ ගුරු/සිසු වැඩසටහන් 2021 වර්ෂය සඳහා හඳුණාගෙන තිබිණි. ඒ යටතේ සැලසුම් කළ ක්‍රියාකාරකම් පැවැති තත්වය යටතේ ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ නොහැකි වුවත් පැවැති තත්වය යටතේ මාර්ගගතය හා දුරස්ථව කළ හැකි ක්‍රියාකාරකම් හඳුණාගෙන ක්‍රියාත්මක කරන ලදී. අ.පො.ස.(උසස් පෙළ) වාණිජ විෂය ධාරාව සඳහා සහභාගීත්වය ඉහළ නැංවීම 30% දක්වා ඉහළ නැංවීමේ ඉලක්කය පසුරා ගැනීම 37%කි. එනම් වාණිජ විෂයය ශිෂ්‍ය සහභාගිතව අනුපාතය 11%කි.

තෙවන ඉලක්කය අ.පො.ස.(උසස් පෙළ) කලා විෂය ධාරාව සඳහා සහභාගීත්වය 35% දක්වා අඩු කිරිම. උතුරු මැද පළාත තුල මෙම සහභාගිත්ව අනුපාතය 51%කි. කලා විෂයය ධාරාව ශිෂ්‍ය සහභාගිත්ව අඩු කිරීම සඳහා අනෙකුත් විෂයය ධාරාවන්හි සහභාගිත්වය වැඩි කිරීම ඉලක්ක කරගත් වැඩසටහන් සැලසුම් කළ අතර පැවැති තත්වය යටතේ සිදු කළ හැකි ක්‍රියාකාරකම් හඳුණාගෙන ක්‍රියාත්මක කරන ලදී. (සිදු කරන ලද වැඩසටහන් 5.1 යටතේ ඇතුලත් කර ඇත)

**03. අභිමානවත් රැකියාවන් සහ ව්‍යවසායකත්වයක් සඳහාතාක්ෂණික හා වෘත්තිය සුදුසුකම් වලින් යුත් අවශ්‍ය කුසලතා ලබා සිටින තරුණයින් සහවැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීම.**

මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයෙන් යුත් සිසුන්ප්‍රමාණය වර්ධනය කිරීම හඳුණාගෙන ඇත. 10-11 ශ්‍රේණි සිසුන් - 26150 දක්වා හා 12-13 ශ්‍රේණි සිසුන් - 9576 දක්වා. ඒ් අනුව 6 -9 ශ්‍රේණිවල සියළුම සිසුන් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීම සිදු කරයි. ඒසේම 9 ශ්‍රේණියේ දී විෂයය හඳුණ්වා දීමේ වැඩසටහන් තුලින් 10 හා 11 ශ්‍රේණිවල දී තොරතුරු තික්ෂණ විෂයය හදාරණ සිසුන් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා වැඩසටහන් සැලසුම් කර ඇත. 11 ශ්‍රේණියේ අ.පො. (සා.පෙළ) තොරතුරු තාක්ෂණ විෂයය ප්‍රතිඵල ඉහළ නැංවීම තුලින් උසස් පෙළ සඳහා තොරතුරු තාක්ෂණ විෂයය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා කටයුතු කර ඇත. උතුරු මැද පළාත තුල අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා තොරතුරු තාක්ෂණ විෂයය හදාරණ ශිෂ්‍ය ප්‍රතිශතය 31%කි. 10 හා 11 ශ්‍රේණිවල දී විෂයය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව 15000කි. කාර්යය සාධනය අත්පත් කර ගැනීම 57%කි. 12 හා 13 ශ්‍රේණි වලදී තොරතුරු තාක්ෂණ විෂයය හදාරණ ශිෂ්‍ය සංඛ්‍යාව 3562කි. කාර්යය සාධනය 37%කි. මෙම කාර්යය සාධනය සඳහා ගෝලීය වශයෙන් කොවිඩ් 19 වසංගතය නිසා අධ්‍යාපන පද්ධතියට ඇති වූ බලපෑම මෙන්ම තොරතරු තාක්ෂණ ගුරුභවතුන්ගේ හිගය (6/2021 අනුව තොරතුරු තාක්ෂණ ගුරුභවතුන්ගේ හිගය 77කි) පාසල් වල භෞතික සම්පත්වල ඌණතාවය ද බලපා ඇත.

**04. අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පවත්නා වෙනස්කම් තුරන් කිරීම සහ ආබාධිත පුද්ගලයින්, ආදිවාසීන්සහ අවදානමට ලක්විය හැකි අවස්ථාවන්හි සිටින ළමුන් ඇතුළු අවදානම් සහිත පුද්ගලයින්සඳහා සියළු මට්ටමේ අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව සඳහා සමාන ප්‍රවේශයක් සහතිකකිරිම.**

මේ සඳහා විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් හඳුනා විශේෂ අධ්‍යාපන ඒකකවලට යොමු කිරීම එම ගුරුවරු පුහුණු කිරීම, විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ කුසලතා සංවර්ධනය සඳහා වැඩසටහන් දියත් කෙරේ. සියලු පාසල්වල පෝෂණ වැඩසටහන ක්‍රියාත්මකවන අතර (උදෑසන ආහාරය හා කිරි ලබා දීම) ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබාදේ. ඊට අමතරව සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්ව වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සෞඛ්‍ය කඳවුරු පවත්වනු ලබයි. ඊට අමරතව වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් දියත් කරයි. මේ සඳහා 2021 වර්ෂය සඳහා වූ වාර්ෂික සැලැස්මේ සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර පාසල් පැවැත්වූ දින වලදී පාසල් 695ක පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක වූ අතර උපදේශණය සඳහා උපදේශණාත්මක වීඩියෝ පට සකස් කර බෙදා හරින ලද අතර රජරට සේවය හරහා ද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. නමුත් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා මාර්ගගත වැඩසටහන් උචිත නොවන බැවින් ඒම වැඩසටහන් පැවැති තතිවය යටතේ ක්‍රියාතමක කළ නොහැකි විය.

**05. සියලු ම තරුණයින් හා කාන්තා හාපිරිමි වැඩිහිටි පුද්ගලයින්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අකුරු හැකියාව සහ ගණන්කිරීමේ හැකියාව අත් කර ගන්නා බවට සහතික වීම.**

මෙහි දර්ශකය වන්නේ යම් වයස් කාණ්ඩයකට අදාළ අවම සාක්ෂරතා හා සංඛ්‍යාමය කාර්ය කුසලතාවයක් අත්කරගෙන සිටින සංඛ්‍යාව වේ. ඒ අනුව සිංහල හා ගණිත විෂයය සංවර්ධනය සඳහා ගුරු හා සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් හඳුණාගන්නා ලද අතර පැවැති තතවය යටතේ මාර්ගගත දුරස්ථ අධ්‍යාපන වැඩසටහන් හඳුණාගෙන ක්‍රියාත්මක කරන ලදී.

**06. තිරසර සංවර්ධනය සහ තිරසර ජීවන රටාවන්, මානවහිමිකම්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, සාමය හා අවිහිංසාවාදී සංස්කෘතිය, ගෝලීයපුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය අගය කිරීම හාතිරසර සංවර්ධනය සඳහා සංස්කෘතියේ දායකත්වය ප්‍රවර්ධනය කිරීම.**

මේ යටතේ ගෝලය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා මානව හිමිකම් (ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා විෂය මාලා , ගුරු අධ්‍යාපනය හා ශිෂ්‍ය ඇගයීම් යන සියලු මට්ටම්වල තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම යන දර්ශකය ළඟා කර ගැනීම සඳහා සියලුම විෂයයන්වල සංවර්ධනය උදෙසා ගුරු සිසු නිපුණතා සංවර්ධන වැඩසටහන් දියත් කර ඇත. ශිෂ්‍ය ඇගයීම් සඳහා පාසල් මට්ටමින් පාසල් පාදක තක්සේරුකරණය සහ වාර විභාග පැවැත්වේ මේ සඳහා ගුණාත්මක ප්‍රශ්න පත්‍ර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සපයනු ලබයි.

**07. ළමයින්, ආබාධිතභාවය සහ ස්ත්‍රී පුරුෂ භාවයපිළිබඳ සැලකිලිමත් වන අධ්‍යාපන පහසුකම් සහ සැමට ආරක්ෂිත, අවිහිංසාවාදී, ඵලදායිඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම.**

මෙහි ඵලදායි ඉගෙනුම් පරිසරයක් ගොඩ නැඟිම සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කලාප අධ්‍යාපන කාර්යාලය ඒකාබද්ධව සියලුම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් හඳුන්වාදෙන ලද ප්‍රමිති පදනම් කරගෙන බාහිර මාර්ගෝපදේශ වැඩසටහන ක්‍රියාත්මක කර ප්‍රගති සමාලෝචන හා වාර්තා පාසල්වලට ලබාදී අවශ්‍ය ප්‍රතිපෝෂණ සිදුකරයි. මේ සඳහා ප්‍රතිපාදන වැය කිරීමක් නොමැති අතර සියලු පාසල්වල සිසුන් ප්‍රතිලාභීන් වේ.

**08. සංවර්ධනය වෙමින් පවතින, විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධිත රටවල හා කුඩා දූපත් ප්‍රාන්තවල ගුරු පුහුණුවසඳහා ජාත්‍යාන්තර සහයෝගීතාව ලබාගෙන සුදුසුකම්ලත් ගුරුවරුන්ගේ සැපයුම සැලකිය යුතුලෙස වැඩිකිරිම.**

මෙහිදි පාසල් මට්ටමින් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා පාසල් පාදක වෘත්තිය ගුරු සංවර්ධන වැඩසටහන් සියලු පාසල්වල ක්‍රියාත්මක කෙරේ. මේ පිළිබඳව සියලුම විදුහල්පතිවරු, සියලුම නිලධාරින් හා ගුරුවරුන් දැනුවත් කිරීම් සිදු කර ඇත. ඒ අනුව පාසල් පාදකව ගුරුවරුන්ගේ වෘත්තිය සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍ය ගුරු සංවර්ධනය පාසල් මට්ටමේදී සිදු කරනු ලබයි.

**තිරසර සංවර්ධන අරමුණු වලට අදාල කාර්යය සාධනය උපයා ගැනීමේ දී ආයතනය සතු වූ ශක්තීන්, අවස්ථා හා තර්ජන**

- කාර්යය සඳහා කැපවූ කාර්යය මණ්ඩලය
- නිසි මගපෙන්වීමක් සහිත නායකත්වය
- වෙනස් වීම් සඳහා ක්ෂණිකව ප්‍රතිචාර දක්වන අධ්‍යයන කාර්යය මණ්ඩල.
- නව දැක්මක් හා වෙනස් වීම් සඳහා ප්‍රතිචාර දක්වන ලද විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන්, ගුරුභවතුන්
- අපේක්ෂා සහිත දෙමාපියන්
- සහය දැක්වීම මා මග පෙන්වීම සඳහා කැපවූ පළාත් සභික ආයතන හා ප්‍රධානීන්
- පහසුකම් හා මග පෙන්වීම සඳහා කැපවූ රේඛීය ආමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශය

**තර්ජන -**

- ගෝලීය වශයෙන් ඇති වූ කොවිඩ් 19 වසංගත තත්වය යටතේ අධ්‍යාපන පද්ධතියට ඇති වූ බලපෑම් හේතුවෙන් 2021 වර්ෂය සඳහා නියමිත දින ගණන පාසල් නොපැවැත්වීම. (2021 වර්ෂයේ පාසල් පැවැත්වූ මුළු දින ගණන දින 91කි)
- 2020 වර්ෂයේ ද ගෝලීය වසංගත තත්වය හමුවේ පාසල් නොපැවැත්වීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා නියමිත විෂයය නිර්දේශය ආවරණය නොවූ බැවින් 2021 වර්ෂයේ විෂයය නිර්දේශය ආවරණය කරමින් අවශ්‍ය කාර්යය සාධනය ලබා ගැනීමේ දුෂ්කරතාවය
- සෞඛ්‍ය නිර්දේශ ක්‍රියාත්මක වීම හේතුවෙන් කාර්යය සාධනය උපයා ගැනීම සඳහා වූ ගුරු ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකි වීම.
- ප්‍රායෝගිකව ක්‍රියාකාරකම් පාදකව සංකල්ප සාධනය කළ යුතු විෂයයන් සඳහා දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේද අනුගමනය කිරීමේ දුෂ්කරතාවය.
- ප්‍රාථමික අවධියේ සිසුන් සඳහා දුරස්ථ අධ්‍යාපන උපක්‍රම ඵලදායී නොවීම
- මාර්ගගත වැඩසටහන් සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුමෙහි ගැටළු සහිත ගුරුභවතුන්
- සංඥා පහසුකම් වල දුර්වලතා.
- සිසුන් සඳහා උපකරණවල හිගය.
- දෙපාර්තමේන්තු හා කලාප මට්ටමින් ද මාර්ගගත ඉගැන්වීම සඳහා අවශ්‍ය උපකරණවල හිගතාවය
- විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා දුරස්ථ අධ්‍යාපන උපක්‍රම නොගැලපීම.
- නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් හරහා ලබා දෙන වෘත්තීය පුහුණුව මාර්ගගතව ලබා දීමේ ගැටළු

## විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය

| ව්‍යාපෘතිය | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැය කළ මුදල (රු.මි) |
|---|---|---|---|---|
| තාක්ෂණ අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | OFID (ඔස්ත්‍රියාව) | නැ.නු.ප<br>ගලෙන්බිඳුනුවැව<br>මැදිරිගිරිය | 3086<br>1562<br>2273 | මි.135 |
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) | ලෝක බැංකුව | උතුරු මැද පළාතේ සියලුම අධ්‍යාපන කලාපවල (කලාප 08 යි) | - | මි.171.73 |

## සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන

අනුරාධපුර කලාපය

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලගාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| ඉංග්‍රිසි භාෂා ශිෂ්‍ය සාධන මට්ටම ඉහල නැංවිම | ග්‍රාමීය පාසල්වල සිසුන් සඳහා ඉලක්කගත ඉංග්‍රිසි භාෂා ප්‍රතිකර්ම වැඩසටහන් පැවැත්වීම - පාසල් 50 | 1.265 | 1.265 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | ඉංග්‍රීසි භාෂා කියවන සහ ක්‍රියාකාරකම් පොත් සැපයීම | 1.190 | 1.068 | පාසල් 50 | පාසල් 50 | 100% |

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| ගණිත විෂය ප්‍රවර්ධනය සඳහා විශේෂ ගණිත සංවර්ධන වැඩසටහන | පාසල් 50ක් සඳහා ඉගෙනුම් අධාරක පොත් සකස් කිරීම සහ සැපයීම. | 0.759 | 0.749 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | පාසල්වල ගණිතමය පරිසරය ගොඩනහා 2021 ඉලක්කගත පාසල් 1 ක් සඳහා ප්‍රාථමික හා ද්විතීයික ගණිත ඉගෙනුම් කට්ටල හා අල්මාරි ලබාදීම. | 0.270 | 0.220 | පාසල් 1 | පාසල් 1 | 100% |
| | 2021 ඉලක්ක මත පාසල් 1ක් සඳහා පරිගණක 1 බැගින් සපයා දීම | 0.140 | 0.140 | පාසල් 1 | පාසල් 1 | 100% |
| | පළාත් ගණිත සම්පත් සහ පුහුණු මධ්‍යස්ථානය (MRTC) සඳහා තාක්ෂණික හා ලී බඩු උපකරණ මිලදී ගැනීම | 7.000 | 6.440 | අංගසම්පූර්ණ පුහුණු ඒකකයක් | පළාතේ සියළුම ගුරුභවතුන් සහ දරුවන් | 100% |
| | පළාත් ගණිතමය සම්පත් සහ පුහුණු මධ්‍යස්ථානය (MRTC) ඉදිකිරීම | 24.520 | 4.072 | අංගසම්පූර්ණ පුහුණු ඒකකයක් | පළාතේ සියළුම ගුරුභවතුන් සහ දරුවන් | - |

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | සම්පත් දායකයන්ගේ සහය ඇතිව වෘත්තීය පොළක් සංවිධානය කිරිම සඳහා වැඩසටහනක් පැවැත්වීම | 0.025 | - | වැඩසටහන් 5 | පාසල් 5 | - |
| | 9 ශ්‍රේණියේ සහ 11 ශ්‍රේණියේ සිසුන්ගේ මනෝවිද්‍යාත්මක සහ උනන්දුව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා වැඩසටහන් සකස් කිරීම 1AB, 1C සහ 2 වර්ගයේ සියලුම පාසල් | 0.013 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | පාසල් 18 | - |
| | Covid 19 වසංගතය යටතේ සිසුන්ට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට උපකාර කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම | 0.025 | 0.008 | ගැටළු අවම දරුවන් පිරිසක් | පාසල් 137 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන අනුරාධපුර කලාපය ඉතිරි කොටස.................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම පිළිබඳ මාර්ගගත ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සම්පත් පුද්ගල වැඩමුළුවක් පැවැත්වීම | 0.020 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන TOT සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීම | 0.038 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | පළාත් වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය ප්‍රතිසංස්කරණය කිරීම | 2.000 | 2.000 | අංගසම්පූර්ණ පුහුණු ඒකකයක් | පළාතේ සියළුම ගුරුභවතුන් සහ දරුවන් | 100% |
| | 1AB, 1C පාසල් සහ 2 වර්ගයේ පාසල් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරුන්ගේ වාර්ෂික සැලැස්ම සහ අත්පොත මුද්‍රණය කිරීම | 0.056 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | ඇගයීම් ආකෘති පත්‍ර සකස් කිරීම සහ වැඩසටහන් පිළිබඳ වාර්තා සකස් කිරීම | 0.020 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | කලාප 1 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන අනුරාධපුර කලාපය ඉතිරි කොටස.................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලගාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| පාසැල් පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය | පාසල් 6 ක හා පළාත් කාර්යාලයේ ගුරු සංවර්ධන ඒකක පිහිටුවීම සඳහා (SBPTD) සෑම පාසලකටම එක් පරිගණකයක් සහ අමතර උපකරණ දීම | 1.620 | 1.620 | අංගසම්පූර්ණ පරිශ්‍රයක් | පාසල් 6 | 100% |
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන සංවර්ධනය සඳහා ඉලක්කගත පාසල් 9ක් සඳහා ඉගෙනුම් අධාරක සකස් කිරිම,පොත් මුද්‍රණය සහ සැපයීම | 0.027 | 0.027 | වැඩසටහන් 1 | පාසල් 9 | 100% |
| | පාසල් 9 ක විශේෂ අධ්‍යාපන ඒකක ප්‍රතිසංස්කරණය කිරීම. | 6.000 | 2.810 | පහසුනම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 3 | - |
| | පාසල් 2 විශේෂ අධ්‍යාපන ඒකකවල පවතින සුළු අළුත්වැඩියා | 0.400 | 0.400 | පහසුනම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 2 | 100% |
| | විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර ලබාදීම. | 0.083 | 0.083 | දරුවන් සඳහා පහසුකම් සැපයීම | පාසල් 9 | 90% |
| | අලුතින් පිහිටුවන ලද විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ දීම | 0.180 | 1.080 | පහසුනම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 9 | 100% |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන අනුරාධපුර කලාපය ඉතිරි කොටස.................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම්ව ල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලඟාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| මානව සම්පත් සංවර්ධනය | පාසල් නායකත්ව කළමනාකරණය සඳහා ජාතික නිපුණතා රාමුව යටතේ විදුහල්පති මූලික පුහුණු වැඩසටහන | 0.250 | - | පුහුණු කරන ලද විදුහල්පතිවරුන් | විදුහල්පතිවරු 25 | - |
| භෞතික සම්පත් සංවර්ධනය | පාසල් 4 ක පන්ති කාමර අළුත්වැඩියා කිරිම | 7.000 | 6.910 | පහසුනම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 4 | - |
| | පාසල් 9 ක් සඳහා පරිගණක හා උපාංග සපයා දීම | 7.626 | 7.626 | පහසුනම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 9 | 100% |
| | පාසල් 12 ක් සඳහා ස්මාර් බෝඩ් සපයා දීම | 4.311 | 4.311 | පහසුනම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 12 | 100% |
| | පළාත් කාර්යාලයේ විෂයය ඒකක සඳහා පරිගණක හා උපාංග සපයා ගැනීම | 2.300 | 2.300 | පහසුකම් සහිත කළමනාකරණ ඒකක | ඒකක 7 | 100% |
| **මුළු එකතුව** | | **67.14** | **43.13** | | | |

කැකිරාව කලාපය

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| ඉංග්‍රිසි භාෂා ශිෂ්‍ය සාධන මට්ටම ඉහල නැංවිම | ග්‍රාමීය පාසල්වල සිසුන් සඳහා ඉලක්කගත ඉංග්‍රිසි භාෂා ප්‍රතිකර්ම වැඩසටහන් පැවැත්වීම - පාසල් 50 | 1.265 | 1.265 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | ඉංග්‍රීසි භාෂා කියවන සහ ක්‍රියාකාරකම් පොත් සැපයීම | 1.190 | 1.068 | පාසල් 50 | පාසල් 50 | 100% |
| ගණිත විෂය ප්‍රවර්ධනය සඳහා විශේෂ ගණිත සංවර්ධන වැඩසටහන | පාසල් 50ක් සඳහා ඉගෙනුම් අධාරක පොත් සකස් කිරීම සහ සැපයීම. | 0.759 | 0.749 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | පාසල්වල ගණිතමය පරිසරය ගොඩනහා 2021 ඉලක්කගත පාසල් 5 ක් සඳහා ප්‍රාථමික හා ද්විතීයික ගණිත ඉගෙනුම් කට්ටල හා අල්මාරි ලබාදීම. | 0.270 | 0.220 | පාසල් 1 | පාසල් 1 | 100% |
| | 2021 ඉලක්ක මත පාසල් 5ක් සඳහා පරිගණක 1 බැගින් සපයා දීම | 0.140 | 0.140 | පාසල් 1 | පාසල් 1 | 100% |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන කැකිරාව කලාපය ඉතිරි කොටස.................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලඟාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | සම්පත් දායකයන්ගේ සහය ඇතිව වෘත්තීය පොළක් සංවිධානය කිරිම සඳහා වැඩසටහනක් පැවැත්වීම | 0.025 | - | වැඩසටහන් 1 | පාසල් 5 | - |
| | 9 ශ්‍රේණියේ සහ 11 ශ්‍රේණියේ සිසුන්ගේ මනෝවිද්‍යාත්මක සහ උනන්දුව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා වැඩසටහන් සකස් කිරීම 1AB, 1C සහ 2 වර්ගයේ සියලුම පාසල් | 0.013 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | පාසල් 140 | - |
| | Covid 19 වසංගතය යටතේ සිසුන්ට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට උපකාර කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම | 0.025 | 0.008 | ගැටළු අවම දරුවන් පිරිසක් | පාසල් 130 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම පිළිබඳ මාර්ගගත ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සම්පත් පුද්ගල වැඩමුළුවක් පැවැත්වීම | 0.020 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන කැකිරාව කලාපය ඉතිරි කොටස.................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලඟාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන TOT සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීම | 0.038 | | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | පාසල් 6 වෘත්තීය මාර්ගෝපදේශ ඒකක සඳහා උපකරණ සැපයීම | 1.500 | 1.500 | අංගසම්පූර්ණ පරිශ්‍රයක් | පාසල් 6 | 100% |
| | 1AB, 1C පාසල් සහ 2 වර්ගයේ පාසල් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරුන්ගේ වාර්ෂික සැලැස්ම සහ අත්පොත මුද්‍රණය කිරීම | 0.056 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | ඇගයීම් ආකෘති පත්‍ර සකස් කිරීම සහ වැඩසටහන් පිළිබඳ වාර්තා සකස් කිරීම | 0.020 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | කලාප 1 | - |
| පාසැල් පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය | පාසල් 5 ක හා පළාත් කාර්යාලයේ ගුරු සංවර්ධන ඒකක පිහිටුවීම සඳහා (SBPTD) සෑම පාසලකටම එක් පරිගණකයක් සහ අමතර උපකරණ දීම | 1.350 | 1.350 | අංගසම්පූර්ණ පරිශ්‍රයක් | පාසල් 5 | 100% |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන කැකිරාව කලාපය ඉතිරි කොටස.................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන සංවර්ධනය සඳහා ඉලක්කගත පාසල් 6 ක් සඳහා ඉගෙනුම් අධාරක සකස් කිරිම,පොත් මුද්‍රණය සහ සැපයීම | 0.027 | 0.027 | වැඩසටහන් 1 | පාසල් 6 | 100% |
| | පාසල් 1 ක විශේෂ අධ්‍යාපන ඒකක ප්‍රතිසංස්කරණය කිරීම. | 2.000 | - | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 1 | - |
| | පාසල් 3 විශේෂ අධ්‍යාපන ඒකකවල පවතින සුළු අළුත්වැඩියා | 0.600 | 0.600 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 3 | 100% |
| | විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර ලබාදීම. | 0.056 | 0.056 | දරුවන් සඳහා පහසුකම් සැපයීම | පාසල් 6 | 90% |
| | අලුතින් පිහිටුවන ලද විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ ලබාදීම | 0.144 | 0.144 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 6 | 100% |
| මානව සම්පත් සංවර්ධනය | පාසල් නායකත්ව කළමනාකරණය සඳහා ජාතික නිපුණතා රාමුව යටතේ විදුහල්පති මූලික පුහුණු වැඩසටහන | 0.250 | | පුහුණු කරන ලද විදුහල්පතිවරු | විදුහල්පතිවරු 25 | - |
| භෞතික සම්පත් සංවර්ධනය | පාසල් 3 ක පන්ති කාමර අළුත්වැඩියා කිරිම | 6.000 | 4.000 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 3 | |
| | පාසල් 5 ක් සඳහා පරිගණක හා උපාංග සපයා දීම | 4.236 | 4.236 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 5 | 100% |
| | පාසල් 12 ක් සඳහා ස්මාර් බෝඩ් සපයා දීම | 4.311 | 4.311 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 12 | 100% |
| **මුළු එකතුව** | | **24.29** | **19.67** | | | |

තඹුත්තේගම කලාපය

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලගාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| ඉංග්‍රිසි භාෂා ශිෂ්‍ය සාධන මට්ටම ඉහල නැංවීම | ග්‍රාමීය පාසල්වල සිසුන් සඳහා ඉලක්කගත ඉංග්‍රිසි භාෂා ප්‍රතිකර්ම වැඩසටහන් පැවැත්වීම - පාසල් 50 | 1.265 | 1.265 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | ඉංග්‍රීසි භාෂා කියවන සහ ක්‍රියාකාරකම් පොත් සැපයීම | 1.190 | 1.068 | පාසල් 50 | පාසල් 50 | 100% |
| ගණිත විෂය ප්‍රවර්ධනය සඳහා විශේෂ ගණිත සංවර්ධන වැඩසටහන | පාසල් 50 ක් සඳහා ඉගෙනුම් අධාරක පොත් සකස් කිරීම සහ සැපයීම. | 0.759 | 0.749 | පාසල් 50 | පාසල් 50 | 100% |
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | සම්පත් දායකයන්ගේ සහය ඇතිව වෘත්තීය පොළක් සංවිධානය කිරිම සඳහා වැඩසටහනක් පැවැත්වීම | 0.025 | - | වැඩසටහන් 1 | පාසල් 5 | - |
| | 9 ශ්‍රේණියේ සහ 11 ශ්‍රේණියේ සිසුන්ගේ මනෝවිද්‍යාත්මක සහ උනන්දුව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා වැඩසටහන් සකස් කිරීම 1AB, 1C සහ 2 වර්ගයේ සියලුම පාසල් | 0.013 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | පාසල් 18 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන තමුත්තේගම කලාපය ඉතිරි කොටස..................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගාකරගත් ඉලක්කයන් |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | Covid 19 වසංගතය යටතේ සිසුන්ට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට උපකාර කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම | 0.025 | 0.008 | ගැටළු අවම දරුවන් පිරිසක් | පාසල් 72 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම පිළිබඳ මාර්ගගත ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සම්පත් පුද්ගල වැඩමුළුවක් පැවැත්වීම | 0.020 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන TOT සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීම | 0.038 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | 1AB, 1C පාසල් සහ 2 වර්ගයේ පාසල් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරුන්ගේ වාර්ෂික සැලැස්ම සහ අත්පොත මුද්‍රණය කිරීම | 0.056 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | ඇගයීම් ආකෘති පත්‍ර සකස් කිරීම සහ වැඩසටහන් පිළිබඳ වාර්තා සකස් කිරීම | 0.020 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | කලාප 1 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන තඹුත්තේගම කලාපය ඉතිරි කොටස.................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| පාසැල් පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය | පාසල් 20 ක හා පළාත් කාර්යාලයේ ගුරු සංවර්ධන ඒකක පිහිටුවීම සඳහා (SBPTD) සෑම පාසලකටම එක් පරිගණකයක් සහ අමතර උපකරණ දීම | 0.270 | 0.270 | අංගසම්පූර්ණ පරිශ්‍රයක් | පාසල් 1 | 100% |
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන සංවර්ධනය සඳහා ඉලක්කගත පාසල් 9 ක් සඳහා ඉගෙනුම් අධාරක සකස් කිරිම,පොත් මුද්‍රණය සහ සැපයීම | 0.040 | 0.040 | වැඩසටහන් 1 | පාසල් 9 | 100% |
| | පාසල් 3 ක විශේෂ අධ්‍යාපන ඒකක ප්‍රතිසංස්කරණය කිරීම. | 6.000 | 0.200 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 3 | - |
| | පාසල් 1 විශේෂ අධ්‍යාපන ඒකකවල පවතින සුළු අළුත්වැඩියා | 0.200 | 0.200 | | පාසල් 1 | 100% |
| | විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර දීම. | 0.083 | 0.083 | දරුවන් සඳහා පහසුකම් සැපයීම | පාසල් 9 | 90% |
| | අලුතින් පිහිටුවන ලද විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ දීම | 0.216 | 0.216 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 9 | 100% |
| මානව සම්පත් සංවර්ධනය | පාසල් නායකත්ව කළමනාකරණය සඳහා ජාතික නිපුණතා රාමුව යටතේ විදුහල්පති මූලික පුහුණු වැඩසටහන | 0.250 | - | පුහුණු කරන ලද විදුහල්පතිවරු | විදුහල්පතිව රු 25 | - |
| භෞතික සම්පත් සංවර්ධනය | පාසල් 3 ක පන්ති කාමර අළුත්වැඩියා කිරිම | 6.000 | 4.000 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 3 | |
| | පාසල් 4 ක් සඳහා පරිගණක හා උපාංග සපයා දීම | 3.389 | 3.389 | | පාසල් 4 | 100% |
| | පාසල් 7 ක් සඳහා ස්මාර් බෝඩ් සපයා දීම | 2.514 | 2.514 | | පාසල් 7 | 100% |
| **මුළු එකතුව** | | **22.37** | **14.00** | | **-** | **-** |

ගලෙන්බිඳුනුවැව කලාපය

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලඟා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| ඉංග්‍රිසි භාෂා ශිෂ්‍ය සාධන මට්ටම ඉහල නැංවිම | ග්‍රාමීය පාසල්වල සිසුන් සඳහා ඉලක්කගත ඉංග්‍රිසි භාෂා ප්‍රතිකර්ම වැඩසටහන් පැවැත්වීම - පාසල් 50 | 1.265 | 1.265 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | ඉංග්‍රීසි භාෂා කියවන සහ ක්‍රියාකාරකම් පොත් සැපයීම | 1.190 | 1.068 | පාසල් 50 | පාසල් 50 | 100% |
| ගණිත විෂය ප්‍රවර්ධනය සඳහා විශේෂ ගණිත සංවර්ධන වැඩසටහන | පාසල් 50 ක් සඳහා ඉගෙනුම් අධාරක පොත් සකස් කිරීම සහ සැපයීම. | 0.759 | 0.749 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | පාසල්වල ගණිතමය පරිසරය ගොඩනගා 2021 ඉලක්කගත පාසල් 5 ක් සඳහා ප්‍රාථමික හා ද්විතීයික ගණිත ඉගෙනුම් කට්ටල හා අල්මාරි ලබාදීම. | 0.270 | 0.220 | පාසල් 1 | පාසල් 1 | 100% |
| | 2021 ඉලක්ක මත පාසල් 5ක් සඳහා පරිගණක 1 බැගින් සපයා දීම | 0.140 | 0.140 | පාසල් 1 | පාසල් 1 | 100% |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන ගලෙන්බිඳුනුවැව කලාපය ඉතිරි කොටස................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලගා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | සම්පත් දායකයන්ගේ සහය ඇතිව වෘත්තීය පොළක් සංවිධානය කිරිම සඳහා වැඩසටහනක් පැවැත්වීම | 0.025 | - | වැඩසටහන් 1 | පාසල් 5 | - |
| | 9 ශ්‍රේණියේ සහ 11 ශ්‍රේණියේ සිසුන්ගේ මනෝවිද්‍යාත්මක සහ උනන්දුව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා වැඩසටහන් සකස් කිරීම 1AB, 1C සහ 2 වර්ගයේ සියලුම පාසල් | 0.013 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | පාසල් 18 | - |
| | Covid 19 වසංගතය යටතේ සිසුන්ට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට උපකාර කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන ගුරු මාර්ගෝපදේශ සැකසීම | 0.025 | 0.008 | ගැටළු අවම දරුවන් පිරිසක් | පාසල් 95 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම පිළිබඳ මාර්ගගත ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සම්පත් පුද්ගල වැඩමුළුවක් පැවැත්වීම | 0.020 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන TOT සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීම | 0.038 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| පාසැල් පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය | පාසල් 4 ක හා පළාත් කාර්යාලයේ ගුරු සංවර්ධන ඒකක පිහිටුවීම සඳහා (SBPTD) සෑම පාසලකටම එක් පරිගණකයක් සහ අමතර උපකරණ ලබාදීම | 1.080 | 1.080 | අංගසම්පූර්ණ පරිශ්‍රයක් | පාසල් 4 | 100% |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන ගලෙන්බිඳුනුවැව කලාපය ඉතිරි කොටස................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලඟා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන සංවර්ධනය සඳහා ඉලක්කගත පාසල් 4ක් සඳහා ඉගෙනුම් අධාරක සකස් කිරිම,පොත් මුද්‍රණය සහ සැපයීම | 0.018 | 0.018 | වැඩසටහන් 1 | පාසල් 4 | 100% |
| | පාසල් 1 ක විශේෂ අධ්‍යාපන ඒකක ප්‍රතිසංස්කරණය කිරීම. | 2.000 | 1.860 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 1 | 100% |
| | පාසල් 1 විශේෂ අධ්‍යාපන ඒකකවල පවතින සුළු අළුත්වැඩියා | 0.200 | 0.200 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 1 | 100% |
| | විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර ලබාදීම. | 0.037 | 0.037 | දරුවන් සඳහා පහසුකම් සැපයීම | පාසල් 4 | 90% |
| | අලුතින් පිහිටුවන ලද විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ ලබාදීම | 0.096 | 0.096 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 4 | 100% |
| මානව සම්පත් සංවර්ධනය | පාසල් නායකත්ව කළමනාකරණය සඳහා ජාතික නිපුණතා රාමුව යටතේ විදුහල්පති මූලික පුහුණු වැඩසටහන | 0.250 | - | පුහුණු කරන ලද විදුහල්පතිවරු | විදුහල්පතිවරු 25 | - |
| භෞතික සම්පත් සංවර්ධනය | පාසල් 1 ක පන්ති කාමර අළුත්වැඩියා කිරිම | 2.000 | 1.860 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 1 | 100% |
| | පාසල් 5 ක් සඳහා පරිගණක හා උපාංග සපයා දීම | 4.236 | 4.236 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 5 | 100% |
| | පාසල් 8 ක් සඳහා ස්මාර් බෝඩ් සපයා දීම | 2.874 | 2.874 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 8 | 100% |
| මුළු එකතුව | | **16.61** | **15.71** | | | |

පොලොන්නරුව කලාපය

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| ඉංග්‍රිසි භාෂා ශිෂ්‍ය සාධන මට්ටම ඉහල නැංවීම | ග්‍රාමීය පාසල්වල සිසුන් සඳහා ඉලක්කගත ඉංග්‍රිසි භාෂා ප්‍රතිකර්ම වැඩසටහන් පැවැත්වීම - පාසල් 50 | 1.265 | 1.265 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | ඉංග්‍රිසි භාෂා කියවන සහ ක්‍රියාකාරකම් පොත් සැපයීම | 1.190 | 1.068 | පාසල් 50 | පාසල් 50 | 100% |
| ගණිත විෂය ප්‍රවර්ධනය සඳහා විශේෂ ගණිත සංවර්ධන වැඩසටහන | පාසල් 50 ක් සඳහා ඉගෙනුම් අධාරක පොත් සකස් කිරීම සහ සැපයීම. | 0.759 | 0.749 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | පාසල්වල ගණිතමය පරිසරය ගොඩනගා 2021 ඉලක්කගත පාසල් 5 ක් සඳහා ප්‍රාථමික හා ද්විතියික ගණිත ඉගෙනුම් කට්ටල හා අල්මාරි ලබාදීම. | 0.270 | 0.270 | පාසල් 1 | පාසල් 1 | 100% |
| | 2021 ඉලක්ක මත පාසල් 5ක් සඳහා පරිගණක 1 බැගින් සපයා දීම | 0.140 | 0.140 | පාසල් 1 | පාසල් 1 | 100% |
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | සම්පත් දායකයන්ගේ සහය ඇතිව වෘත්තීය පොළක් සංවිධානය කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම | 0.025 | - | වැඩසටහන් 1 | පාසල් 5 | - |
| | 9 ශ්‍රේණියේ සහ 11 ශ්‍රේණියේ සිසුන්ගේ මනෝවිද්‍යාත්මක සහ උනන්දුව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා වැඩසටහන් සකස් කිරීම 1AB, 1C සහ 2 වර්ගයේ සියලුම පාසල් | 0.013 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | පාසල් 18 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන පොළොන්නරුව කලාපය ඉතිරි කොටස................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලඟා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | Covid 19 වසංගතය යටතේ සිසුන්ට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට උපකාර කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම | 0.025 | 0.008 | ගැටළු අවම දරුවන් පිරිසක් | පාසල් 53 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම පිළිබඳ මාර්ගගත ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සම්පත් පුද්ගල වැඩමුළුවක් පැවැත්වීම | 0.020 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන TOT සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීම | 0.038 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | 1AB, 1C පාසල් සහ 2 වර්ගයේ පාසල් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරුන්ගේ වාර්ෂික සැලැස්ම සහ අත්පොත මුද්‍රණය කිරීම | 0.056 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | ඇගයීම් ආකෘති පත්‍ර සකස් කිරීම සහ වැඩසටහන් පිළිබඳ වාර්තා සකස් කිරිම | 0.020 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | කලාප 1 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන පොලොන්නරුව කලාපය ඉතිරි කොටස................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලගා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන සංවර්ධනය සඳහා ඉලක්කගත පාසල් 4ක් සඳහා ඉගෙනුම් අධාරක සකස් කිරිම,පොත් මුද්‍රණය සහ සැපයීම | 0.018 | 0.018 | වැඩසටහන් 1 | පාසල් 4 | 100% |
| | පාසල් 1 ක විශේෂ අධ්‍යාපන ඒකක ප්‍රතිසංස්කරණය කිරීම. | 2.000 | 1.860 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 1 | 100% |
| | විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර ලබාදීම. | 0.037 | 0.037 | දරුවන් සඳහා පහසුකම් සැපයීම | පාසල් 4 | 90% |
| | අලුතින් පිහිටුවන ලද විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ ලබාදීම | 0.080 | 0.080 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 4 | 100% |
| මානව සම්පත් සංවර්ධනය | පාසල් නායකත්ව කළමනාකරණය සඳහා ජාතික නිපුණතා රාමුව යටතේ විදුහල්පති මූලික පුහුණු වැඩසටහන | 0.250 | | පුහුණු කරන ලද විදුහල්පතිව රුන් | විදුහල්පති වරු 25 | - |
| භෞතික සම්පත් සංවර්ධනය | පාසල් 6 ක පන්ති කාමර අළුත්වැඩියා කිරිම | 12.000 | 10.000 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 6 | - |
| | පාසල් 4 ක් සඳහා පරිගණක හා උපාංග සපයා දීම | 3.389 | 3.389 | | පාසල් 4 | 100% |
| | පාසල් 7 ක් සඳහා ස්මාර් බෝඩ් සපයා දීම | 2.514 | 2.514 | | පාසල් 7 | 100% |
| මුළු එකතුව | | **24.11** | **21.40** | | | |

හිඟුරක්ගොඩ කලාපය

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරක මවල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලඟාකර ගත් ඉලක්කය |
|---|---|---|---|---|---|---|
| ඉංග්‍රිසි භාෂා ශිෂ්‍ය සාධන මට්ටම ඉහල නැංවිම | ග්‍රාමීය පාසල්වල සිසුන් සඳහා ඉලක්කගත ඉංග්‍රිසි භාෂා ප්‍රතිකර්ම වැඩසටහන් පැවැත්වීම - පාසල් 50 | 1.265 | 1.265 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | ඉංග්‍රීසි භාෂා කියවන සහ ක්‍රියාකාරකම් පොත් සැපයීම | 1.190 | 1.068 | පාසල් 50 | පාසල් 50 | 100% |
| ගණිත විෂය ප්‍රවර්ධනය සඳහා විශේෂ ගණිත සංවර්ධන වැඩසටහන | පාසල් 50 ක් සඳහා ඉගෙනුම් අධාරක පොත් සකස් කිරීම සහ සැපයීම. | 0.759 | 0.749 | පාසල් 50 | පාසල් 50 | 100% |
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | සම්පත් දායකයන්ගේ සහය ඇතිව වෘත්තීය පොළක් සංවිධානය කිරිම සඳහා වැඩසටහනක් පැවැත්වීම | 0.025 | - | වැඩසටහන් 1 | පාසල් 5 | - |
| | 9 ශ්‍රේණියේ සහ 11 ශ්‍රේණියේ සිසුන්ගේ මනෝවිද්‍යාත්මක සහ උනන්දුව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා වැඩසටහන් සකස් කිරීම 1AB, 1C සහ 2 වර්ගයේ සියලුම පාසල් | 0.013 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | පාසල් 140 | - |
| | Covid 19 වසංගතය යටතේ සිසුන්ට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට උපකාර කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම | 0.025 | 0.008 | ගැටළු අවම දරුවන් පිරිසක් | පාසල් 813 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන හිඟුරක්ගොඩ කලාපය ඉතිරි කොටස................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලගාකර ගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | Covid 19 වසංගතය යටතේ සිසුන්ට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට උපකාර කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන ගුරු මාර්ගෝපදේශ සැකසීම | 0.025 | 0.008 | ගැටළු අවම දරුවන් පිරිසක් | පාසල් 813 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම පිළිබඳ මාර්ගගත ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සම්පත් පුද්ගල වැඩමුළුවක් පැවැත්වීම | 0.020 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන TOT සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීම | 0.038 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | 1AB, 1C පාසල් සහ 2 වර්ගයේ පාසල් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරුන්ගේ වාර්ෂික සැලැස්ම සහ අත්පොත මුද්‍රණය කිරීම | 0.056 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | ඇගයීම් ආකෘති පත්‍ර සකස් කිරීම සහ වැඩසටහන් පිළිබඳ වාර්තා සකස් කිරීම | 0.020 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | කලාප 1 | - |
| පාසැල් පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය | පාසල් 2 ක හා පළාත් කාර්යාලයේ ගුරු සංවර්ධන ඒකක පිහිටුවීම සඳහා (SBPTD) සෑම පාසලකටම එක් පරිගණකයක් සහ අමතර උපකරණ ලබාදීම | 0.540 | 0.540 | අංගසම්පූර්ණ පරිශ්‍රයක් | පාසල් 2 | 100% |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන හිඟුරක්ගොඩ කලාපය ඉතිරි කොටස.................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභීන් හා ප්‍රතිලාභ | ලඟා කරගත් ඉලක්ක |
|---|---|---|---|---|---|---|
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන සංවර්ධනය සඳහා ඉලක්කගත පාසල් 9ක් සඳහා ඉගෙනුම් අධාරක සකස් කිරිම,පොත් මුද්‍රණය සහ සැපයීම | 0.040 | 0.040 | වැඩසටහන් 1 | පාසල් 9 | 100% |
| | විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර ලබාදීම. | 0.083 | 0.083 | දරුවන් සඳහා පහසුකම් සැපයීම | පාසල් 9 | 90% |
| | අලුතින් පිහිටුවන ලද විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ ලබාදීම | 0.216 | 0.216 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 9 | 100% |
| මානව සම්පත් සංවර්ධනය | පාසල් නායකත්ව කළමනාකරණය සඳහා ජාතික නිපුණතා රාමුව යටතේ විදුහල්පති මූලික පුහුණු වැඩසටහන | 0.250 | - | පුහුණු කරන ලද විදුහල්පතිවරු න් | විදුහල්පති වරු 25 | - |
| භෞතික සම්පත් සංවර්ධනය | පාසල් 4 ක පන්ති කාමර අළුත්වැඩියා කිරිම | 8.000 | 7.770 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 4 | - |
| | පාසල් 5 ක් සඳහා පරිගණක හා උපාංග සපයා දීම | 4.236 | 4.236 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 5 | 100% |
| | පාසල් 7 ක් සඳහා ස්මාර් බෝඩ් සපයා දීම | 2.514 | 2.514 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 7 | 100% |
| **මුළු එකතුව** | | **19.29** | **18.49** | | | |

දිඹුලාගල කලාපය

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරක මවල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලඟාකර ගත් ඉලක්කය |
|---|---|---|---|---|---|---|
| ඉංග්‍රිසි භාෂා ශිෂ්‍ය සාධන මට්ටම ඉහල නැංවිම | ග්‍රාමීය පාසල්වල සිසුන් සඳහා ඉලක්කගත ඉංග්‍රිසි භාෂා ප්‍රතිකර්ම වැඩසටහන් පැවැත්වීම - පාසල් 50 | 1.265 | 1.265 | පාසල් 50 | පාසල් 50 | 100% |
| | ඉංග්‍රීසි භාෂා කියවන සහ ක්‍රියාකාරකම් පොත් සැපයීම | 1.190 | 1.068 | පාසල් 50 | පාසල් 50 | 100% |
| ගණිත විෂය ප්‍රවර්ධනය සඳහා විශේෂ ගණිත සංවර්ධන වැඩසටහන | පාසල් 50 ක් සඳහා ඉගෙනුම් අධාරක පොත් සකස් කිරීම සහ සැපයීම. | 0.759 | 0.749 | පාසල් 50 | පාසල් 50 | 100% |
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | සම්පත් දායකයන්ගේ සහය ඇතිව වෘත්තීය පොළක් සංවිධානය කිරිම සඳහා වැඩසටහනක් පැවැත්වීම | 0.025 | - | වැඩසටහන් 1 | පාසල් 5 | - |
| | 9 ශ්‍රේණියේ සහ 11 ශ්‍රේණියේ සිසුන්ගේ මනෝවිද්‍යාත්මක සහ උනන්දුව පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහා වැඩසටහන් සකස් කිරීම 1AB, 1C සහ 2 වර්ගයේ සියලුම පාසල් | 0.013 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | පාසල් 140 | - |
| | Covid 19 වසංගතය යටතේ සිසුන්ට, ගුරුවරුන්ට සහ දෙමාපියන්ට උපකාර කිරීම සඳහා වෘත්තීය මාර්ගෝපදේශ උපදේශන ගුරු මාර්ගෝපදේශ සකස් කිරීම | 0.025 | 0.008 | ගැටළු අවම දරුවන් පිරිසක් | පාසල් 813 | - |

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන හිඟුරක්ගොඩ කලාපය ඉතිරි කොටස................

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලඟාකර ගත් ඉලක්කය |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපනික උපදේශන ලබා දීමෙන් කාර්ය සාධනය ඉහළ නැංවීමට ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් සවිබල ගැන්වීම | වෘත්තීය මාර්ගෝපදේශනයේ වැදගත්කම පිළිබඳ මාර්ගගත ප්‍රධාන දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කිරීම සඳහා සම්පත් පුද්ගල වැඩමුළුවක් පැවැත්වීම | 0.020 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශන TOT සඳහා ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහනක් පැවැත්වීම | 0.038 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | 1AB, 1C පාසල් සහ 2 වර්ගයේ පාසල් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ගුරුවරුන්ගේ වාර්ෂික සැලැස්ම සහ අත්පොත මුද්‍රණය කිරීම | 0.056 | - | වැඩසටහන් 1 | කලාප 1 | - |
| | ඇගයීම් ආකෘති පත්‍ර සකස් කිරීම සහ වැඩසටහන් පිළිබඳ වාර්තා සකස් කිරීම | 0.020 | - | දරුවන්ගේ සාධන මට්ටම පිළිබඳ වාර්තාව | කලාප 1 | - |
| පාසැල් පදනම් කරගත් වෘත්තීය ගුරු සංවර්ධනය | පාසල් 3 ක හා පළාත් කාර්යාලයේ ගුරු සංවර්ධන ඒකක පිහිටුවීම සඳහා (SBPTD) සෑම පාසලකටම එක් පරිගණකයක් සහ අමතර උපකරණ ලබාදීම | 0.810 | 0.810 | අංගසම්පූර්ණ පරිශ්‍රයක් | පාසල් 3 | 100% |
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන සංවර්ධනය සඳහා ඉලක්කගත පාසල් 3ක් සඳහා ඉගෙනුම් අධාරක සකස් කිරීම,පොත් මුද්‍රණය සහ සැපයීම | 0.013 | 0.013 | වැඩසටහන් 1 | පාසල් 3 | 100% |

| ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | වෙන් කළ මුදල රු.මි. | වැය වූ මුදල රු.මි. | ව්‍යාපෘති ක්‍රියාකාරක මවල නිමැවුම | ප්‍රතිලාභින් හා ප්‍රතිලාභ | ලඟාකර ගත් ඉලක්කය |
|---|---|---|---|---|---|---|
| විශේෂ අධ්‍යාපන | විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා ඇස් කණ්ණාඩි සහ ශ්‍රවණාධාර ලබාදීම. | 0.028 | 0.028 | දරුවන් සඳහා පහසුකම් සැපයීම | පාසල් 3 | 90% |
| | අලුතින් පිහිටුවන ලද විශේෂ අධ්‍යාපන ඒකක සඳහා උපකරණ ලබාදීම | 0.072 | 0.072 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 3 | 100% |
| මානව සම්පත් සංවර්ධනය | පාසල් නායකත්ව කළමනාකරණය සඳහා ජාතික නිපුණතා රාමුව යටතේ විදුහල්පති මූලික පුහුණු වැඩසටහන | 0.250 | - | පුහුණු කරන ලද විදුහල්පති වරු | විදුහල්පති වරු 25 | - |
| ද්විතීයික පාසල් සඳහා මූලික ඉගෙනුම් අවකාශයන් ඉදිකිරීම සහ සංවර්ධනය කිරීම. | පාසල් 1 ක 100x20 නව පන්තිකාමර ගොඩනැගිලි ඉදිකිරිම | 10.000 | - | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 1 | - |
| භෞතික සම්පත් සංවර්ධනය | පාසල් 4 ක පන්ති කාමර අළුත්වැඩියා කිරිම | 8.000 | 8.000 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 4 | 100% |
| | පාසල් 6 ක් සඳහා පරිගණක හා උපාංග සපයා දීම | 5.084 | 5.084 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 6 | 100% |
| | පාසල් 10 ක් සඳහා ස්මාර් බෝඩ් සපයා දීම | 3.592 | 3.592 | පහසුකම් සහිත ඉගෙනුම් පරිශ්‍ර | පාසල් 10 | 100% |
| මුළු එකතුව | | **31.26** | **20.69** | | | |

## වෙනත් රේඛිය අමාත්‍යංශ,දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුනු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි) | වැයකළ (රු.මි) | භෞතික (%) | මූල්‍ය | |
| 01 | තඹුත්තේගම ජාතික පාසලට පුටු 150ක් ලබා ගැනීමට | භෞතික සම්පත් ලබාගැනීම | 6,456 | 3,380 | 52 | 52 | පාසලට අවශ්‍ය පුටු ලැබීම |

## පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මහජනතාව වෙත ලබා දුන් සේවාවන්

| අනු අංකය | ලබා දුන් සේවය | ක්‍රියාකත්මක කරන ලද ආයතනය | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| 01 | රජරට ගුරු ගෙදර අධ්‍යාපනික සත්කාරක වැඩසටහන | දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය හා එක්ව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | උතුරු මැද පළාතේ සියළු දරුවන් , දෙමාපියන් |
| 02 | අධ්‍යාපන පරිපාලන සේවා විභාග අත්වැල | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | උතුරු මද පළාතේ විභාගය සඳහා අයදුම් කළ සියළු ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් |

## කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේ දී සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2021 වර්ෂයේ සැලසුම් කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක නොවීම නිසා සිසු සාධන මට්ටම ඉහල නැංවීමේ වැඩසටහන යටතේ කාර්ය පත්‍රිකා සකස් කිරීම පහත පරිදි සිදු කරන ලදි.

උතුරු මැද පළාතට අයත් අනුරාධපුර හා පොළොන්නරු යන දිස්ත්‍රික් දෙකෙහි අධයාපන කලාප 08ක් තුළ අධයාපන කොට්ඨාස 30ක පාසල් 813ක් විසිරි පවති. මෙම පාසල් 813 අතුරින් පාසල් 419ක් අ.පො.ස (සා.පෙළ) පංති පැවැත්වේ. 2021 වර්ෂයේ උතුරු මැද පළාතේ අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 20435ක් වන අතර, අධයාපන ගුණාත්මක සංවර්ධනය සඳහා පළාත් අධයාපන දෙපාර්තමේන්තුවෙ විසින් අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සකස් කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීම අනපේක්ෂිත ලෙස සමස්ත ශ්‍රිලංකාව මුහුණ දුන් කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ සියළු පාසල් වරින් වර වසා දමන ලදි. පාසල් වසා දමා ඇති කාලය තුළ සියළු පාසල් තුල විවිධ මට්ටමින් විෂය කරුණු ආවරණය කිරීමට වැඩසටහන් දියත් කරන ලදි. උදාහරණ ලෙස පළාත් දෙපාර්තමේන්තුව හා විවිධ පාසල් මඟින් පවත්වා ගෙන යන වෙබ් අඩවි (WEBSITES), පාසල් ගුරුවරුන් සමඟ පවත්වාගෙන යන whatsapp groups, google classroom,  online පාඩම් හා පැවරුම් පත් ගොනු සිසුන්ට ලබාදීම වැනි විවිධ ක්‍රම භාවිතා කරමින් පවති.නමුත් මේ සියළු ක්‍රම මඟින් සමස්ත සිසුන් ට ප්‍රතිලාභ සමාන ලෙස ලැබි නැත.එයට හේතුව සෑම අධ්‍යාපන කලාපයකම පවතින භූගෝලීය විෂමතා හා සමාජයීය විෂමතා අනුව එක් එක් පාසල්වල භෞතික හා මානව සම්පත් විෂමතා පැවතීම මෙන්ම පාසලට ප්‍රවේශවන දරුවන්ගේ සමාජයීය හා ආර්ථික පසුබිම අනුව දරුවන් අතරද, විවිධත්වයක් පැවතීම වේ. එබැවින් නැවත පාසල් ආරම්භ කල පසු , අතපසු වූ ඉගෙනුම් කාලය කඩිනමින් ආවරණය කිරීම මඟින් අ.පො.ස(සා.පෙළ) සඳහා 2021 වර්ෂයේ ඉරිපත්වන සියළු සිසුන්හට හා ගුරුවරුන් හට පහසුවක් වන සේ සියළු හර විෂයයන් සඳහා උපකාරක ඉගෙනුම් මෙවලම්මෙවලම් සම්පාදනය කර,මුද්‍රණය කර ලබා දෙන ලදි. ඊට අමතරව බාණ්ඩ විෂයයන් සඳහාද උපකාරක ඉගෙනුම් මෙවලම් සකස් කර සිඩි තැටි මඟින් පාසල්වලට ලබා දී ඇත. එසේම රජරට ගුරු ගෙදර හරහා අධ්‍යාපනික වැඩසටහන් සිසුන් සඳහා විකාශය කරන ලදී. තව ද ජාතික විභාග ඉලක්ක කර ගනිමින්  රජරට සේවය සමඟ අනුබද්ධ වි  දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය අනුව ප්‍රතිඵල ඉහල නැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කරන ලදී.

# 6.3.පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව

| පළාතේ කලායතන පිහිටීම | |
|---|---|
| කලායතනය | සංඛ්‍යාව |
| නර්තන | 137 |
| සංගීත | 10 |
| නාට්‍ය | 12 |

**ආගමික සිද්ධස්ථාන**

| ආගමික සිද්ධස්ථාන | සංඛ්‍යාව |
|---|---|
| පන්සල් | 1662 |
| කෝවිල් | 42 |
| මුස්ලිම් පල්ලි | 1980 |
| කතෝලික දේවස්ථාන | 47 |
| පිරිවෙන් | 57 |
| දහම් පාසල් | 978 |

## දැක්ම

**"සංස්කෘතිකාංග ගරු කරන සාරධර්ම සපිරි සමාජයක්, සෞභාග්‍යවත් පළාතක්".**

## මෙහෙවර

**" දැහැමි කලාකාමී හා අභිමානවත් සමාජයක් බිහි කිරීම සඳහා සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව දහම් අධ්‍යාපනය නංවාලීම, උසස් කලා නිර්මාණකරණය හා රසවින්දනය දිරිගැන්වීම, අතීත සංස්කෘතික උරුමයන් හා ශිල්ප සංරක්ෂණය සහ කලාකරුවන්ගේ කුසලතා ඔප් නැංවීම".**

## දිගු කාලීන අරමුණු

- ❖ අත්‍යවශ්‍ය භෞතික සම්පත් සහිත දැහැමි පාසල් පද්ධතියක් සහ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත් දහම් පාසල් ප්‍රජාවක්.
- ❖ දක්ෂ කලාකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීමට කාර්යක්ෂම ක්‍රමවේදයක් සකස් කිරීම.
- ❖ උසස් කලා නිර්මාණ බිහි කිරීම සඳහා දායක වීම.
- ❖ පළාතේ සංස්කෘතිකාංග අඛණ්ඩව පවත්වාගෙන යාමට විධිමත් ක්‍රමවේදයක්.
- ❖ ඉහළ ධාරිතාවයකින් යුත් කලායතන පද්ධතියක් හා කලාකරුවන් පිරිසක්.
- ❖ උසස් රසාස්වාදනය ප්‍රචලිත කිරීම.

## කෙටි කාලීන අරමුණු

- ❖ කාර්යක්ෂම ආයතන පද්ධතියක් දෙපාර්තමේන්තුව තුල ඇති කිරීම.
- ❖ නර්තන කලාව, ලේඛන කලාව, සංගීත හා රංග කලාව වැනි සංස්කෘතික අංගයන් ප්‍රවර්ධනයට කටයුතු සැලසීම.
- ❖ පළාතේ කලාකරුවන්ගේ හැකියාවන් හඳුනා ගැනීම හා ඇගයීමට ලක් කිරීම.
- ❖ පළාතේ ආගමික පුනර්ජීවය වෙනුවෙන් සංවර්ධන කාර්යයන් ඉටු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- දහම් අධ්‍යාපනය නංවාලීම.
- උසස් කලා නිර්මාණ බිහි කිරීම සංවර්ධනය.
- උසස් රසාස්වාදය ප්‍රචලිත කිරීම.
- අතීත සංස්කෘතික උරුමයන් හා කලා ශිල්ප සංරක්ෂණය.
- කලාකරුවන්ගේ කුසලතා නංවාලීම.
- ආයතනික ධාරිතා සංවර්ධනය.
- යහපාලන කටයුතු සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩමුළු පැවැත්වීම.
- ❖ කලා උළෙල හා එයට සමගාමී ක්‍රියාකාරකම්.
- ❖ සංස්කෘතිකාංග සංරක්ෂණය සිදු කිරීම.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ සංවර්ධන ආධාර (දහම් පාසල්, කලායතනාධාර, ආගමික සිද්ධස්ථාන)

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 19ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 18 කි.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 0.58 | 0.47 | 0.11 | 81 |
| යන්ත්‍ර සූත්‍ර හා සවිකිරීම | 0.41 | 0.41 | - | 100 |
| වෙනත් මූලධන වත්කම් හා පුනරාවර්ථන හා වැඩි දියුණු කිරීම | 15 | 13.36 | 16.43 | 89 |
| **එකතුව** | **16** | **14.24** | **17.54** | **90** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

සංස්කෘතික වටිනාකම් සුරක්ෂිත කරමින් අනාගත පරපුර උදෙසා නොබෙදූ දේශයක් සාමූහික ජාතියක් ලෙසින් ලෝකය ඉදිරියේ පෙනී සිටීමට ලාංකීය ජාතියක් වශයෙන් ලෝකය ඉදිරියේ පෙනී සිටීමට ලාංකීය අභිමානය සුරක්ෂිත කරන සංස්කෘතික දායාදයන් සංරක්ෂණය කරන සුරක්ෂිත අනාගතයක් නිර්මානය කිරීමයි. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

- සාම්ප්‍රදායික සංස්කෘතික සංරක්ෂණය සඳහා වැඩ කටයුතු සිදු කිරීම.
- සංස්කෘතික උරුමයන් අනාගත පරපුර උදෙසා දායාද කිරීම.
- නිවහල් චින්තනයක් සහිත නිර්මාණශීලි පරපුරක් බිහි කිරීම.
- රස වින්දනයෙන් ඉහල පරපුරක් බිහි කිරිම සඳහා කලා ප්‍රසංග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- දේශීය මෙන්ම විදේශීය සංස්කෘතින්ගේ ආභාෂය ලබා ගනිමින් සංස්කෘතික හුවමාරුව මගින් සංහිදියාව ඇති කිරීම.
- ආගමික වටිනාකම් ආරක්ෂා කරමින් අනාගත පරපුරට එම උරුමයන් රැක ගැනීම සඳහා ආකල්ප මෙන්ම භෞතික සංවර්ධන ඇති කිරීම.

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • දෙපාර්තමේන්තුවක් බවට පත්ව තිබීම<br>• කාර්යක්ෂම හා නිර්මාණශිලී කාර්ය මණ්ඩලයක් සිටීම<br>• දක්ෂ පළාත් නර්තන හා සංගීත කණ්ඩායමක් පැවැතීම<br>• පළාතේ සංස්කෘතික උත්සව, ජාතික උත්සව, ආගමික උත්සව සඳහා ශිල්පීන් ලබා දීමේ හැකියාව පැවැතීම<br>• කලායතන සමඟ පවතින සම්බන්ධතා ජාලය<br>• පළාත් සභාවේ සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් ලැබෙන සහයෝගය | • මෙම පළාතේ ශිල්පීන්ටඅනෙකුත් පළාත්වල ශිල්පීන් සමඟ අත්දැකීම් ලබා ගැනීමට නොහැකිවීම<br>• සංවර්ධන කටයුතු පළාත පුරා සමානව විහිදී නොයාම |
| **අවස්ථා** | **තර්ජන** |
| • ශක්තිමත් පදනමක් සහිත කලායතන බිහි වීම<br>• නවීන සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණයේ දියුණුව<br>• සංචාරක කර්මාන්තයේ වර්ධනය | • කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා මහජනතාව ඒකරාශී කිරීමට නොහැකි වීම<br>• පළාතේ ඉතා දුෂ්කර ප්‍රදේශවල දහම් පාසල් හා ආගමික සිද්ධස්ථාන විශාල සංඛ්‍යාවක් පැවතුනද, එම දහම් පාසල් හා ආගමික සිද්ධස්ථාන සංවර්ධන සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම<br>• කලායතන ලියාපදිංචි කිරීමේදී මතුවන ගැටළු |

## මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම්) | පාදම (Basline) 2015 | ඉලක්කය 2021 |
|---|---|---|---|---|
| 1. සංස්කෘතික උරුමයන් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය හා සංරක්ෂණය | 1.1 ජන කථා ජනප්‍රවාද ආදී විවිධ සංස්කෘතික අංග එකතු කිරීම හා මුද්‍රණය | සුභාෂණ සංස්කෘතික සඟරාව මුද්‍රණය කිරීම | 600 | 800 |
| | 1.2 දේශීය ප්‍රජාවගේ සංස්කෘතික හා කලාත්මක සිද්ධි එකතු කිරීම හා වාර්තා කිරීම | මහජනතාව වෙනුවෙන් කලා ප්‍රසංග පැවැත්වීම | 0 | 10 |
| 2. සංස්කෘතික හා ඓතිහාසික උරුමයන්, ආගමික ඇදහිලි හා සෞන්දර්යාත්මක වටිනාකම් ඉදිරියට ගෙන යාම | 2.1 කලා ශිල්ප, හස්ත කර්මාන්ත,නැටුම් සංගීත, සිනමා ආදී ක්ෂේත්‍ර ඉගැන්වීම හා ඉදිරියට ගෙන යාම | 2021 උතුරු මැද කලා උළෙල පැවැත්වීම | 01 | 01 |
| | 2.2 සාම්ප්‍රදායික හා ආගමික උත්සව සැමරීම | ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම | 01 | 01 |
| 3.ධාරිතා සංවර්ධනය | 3.1 සංස්කෘතික සංවිධානවල ආයතනික සංවර්ධනය | කලායතන ආධාර ලබාදීම | 50 | 100 |
| | 3.2 රාජ්‍ය ආයතනවල වල ධාරිතා සංවර්ධනය | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 5 | 10 |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යය සාධන දර්ශක වල ඉලක්ක ලඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනිම 2021 |
|---|---|---|---|---|
| 1. සංස්කෘතික උරුමයන් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය හා සංරක්ෂණය | 1.1 ජන කථා ජනප්‍රවාද ආදී විවිධ සංස්කෘතික අංග එකතු කිරීම හා මුද්‍රණය | සුභාෂණ සංස්කෘතික සඟරාව මුද්‍රණය කිරීම | 2021 වසරේ සුභාෂණ සංස්කෘතික සඟරාවේ පිටපත් 800 ක් මුද්‍රණය කිරීම | 2021 වසරේ සුභාෂණ සඟරාවේ පිටපත් 800 ක් මුද්‍රණය කර පළාතේ පාසල් 600 කට සහ රාජ්‍ය ආයතන සහ පුස්තකාල අතර බෙදා හරින ලදී. |
| | 1.2 දේශීය ප්‍රජාවගේ සංස්කෘතික හා කලාත්මක සිද්ධි එකතු කිරීම හා වාර්තා කිරීම | මහජනතාව වෙනුවෙන් කලා ප්‍රසංග පැවැත්වීම | මහජනතාව වෙනුවෙන් කලා ප්‍රසංග 10 ක් පැවැත්වීම | 2021 වර්ෂයේ කොවිඩ් 19 වසංගතය පැවැතීම මත මහජනතාව ඒකරාශී කිරීමට නොහැකි වීම මත කලා ප්‍රසංග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |
| 2. සංස්කෘතික හා ඓතිහාසික උරුමයන්, ආගමික ඇදහිලි හා සෞන්දර්යාත්මක වටිනාකම් ඉදිරියට ගෙන යාම | 2.1 කලා ශිල්ප, හස්ත කර්මාන්ත,නැටුම් සංගීත, සිනමා ආදී ක්ෂේත්‍ර ඉගැන්වීම හා ඉදිරියට ගෙන යාම | 2021 උතුරු මැද කලා උළෙල පැවැත්වීම | 32 වන උතුරු මැද කලා උළෙල පැවැත්වීම | 2021. 12.25 වන දින අනුරාධපුර මධ්‍ය විද්‍යාලීය රංග ශාලාවේදී උතුරු මැද කලා උළෙල උත්කර්ෂවත් ලෙස පැවැත්විය. අවසන් උත්සවය සඳහා ශිල්පීන් දහසකට අධික පිරිසක් සහභාගී විය. තරග අංශ සඳහා තරග කරුවන් 3000 කට අධික පිරිසක් සහභාගී විය. |
| | 2.2 සාම්ප්‍රදායික හා ආගමික උත්සව සැමරීම | ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම | අනුරාධපුර ඓතිහාසික දළදා පෙරහැර පැවැත්වීම | 2021 වර්ෂයේ ජූලි මාසයේදී සෞඛ්‍ය ආරක්ෂිත නීති අනුගමනය කරමින් එක් දිනක් පමනක් පෙරහැර පැවැත්විය. |
| 3. ධාරිතා සංවර්ධනය | 3.1 සංස්කෘතික සංවිධානවල ආයතනික සංවර්ධනය | කලායතන ආධාර ලබාදීම | කලායතන 100 ක් සඳහා අධාර ලබා දීම | උතුරු මැද පළාතේ පවතින ආර්ථික අපහසුතා සහිත කලායතන වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කලායතන 100 ක් සඳහා මූල්‍යමය ආධාර ලබා දීම. |
| | 3.2 රාජ්‍ය සංවිධාන වල ධාරිතා සංවර්ධනය | කාර්යාල උපකරණ මිලදී ගැනීම | පරිගණක මිලදී ගැනීම | දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පරිගණක 03 ක් සහ මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගන්නා ලදී. |

## ප්‍රධාන කාර්යය සාධන දර්ශක ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්යය සාධන දර්ශකය (නිමවුම්) | ඉලක්කය | ළඟා වීම | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු. මි.) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| 01 | සහරාව සඳහා ලැබෙන ලිපි ප්‍රමාණය | ලිපි 100 | 100% | උතුරු මැද පළාතේ ලේඛකයන්ගෙන් ලිපි ලබාගෙන සුභාෂණ සහරාව මුද්‍රණය | 0.18 | උතුරු මැද පළාතේ සියළුම ජනතාව |
| 02 | ජාතික තලයට ප්‍රවිශ්ය වන ශිල්පීන් සංඛ්‍යාව | 15 | 100% | 32 වන උතුරු මැද කලා උළෙල | 4.63 | |
| 03 | කලායතනවලින් බිහිවන නව නිර්මාණ සංඛ්‍යාව | 100 | 100% | කලායතන ධාරිතා සංවර්ධනය | 5.0 | |
| 04 | ප්‍රාදේශීය මට්ටමින් බිහිවන නිර්මාණ සංඛ්‍යාව | 450 | 100% | ප්‍රාදේශීය සංස්කෘතික උළෙල ක්‍රියාත්මක කිරීම | 3.80 | |
| 05 | දෙපාර්තමේන්තුව මිලදී ගත් කාර්යාල උපකරණ සංඛ්‍යාව | 05 | 100% | ආයතනික ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය | 0.88 | සංස්කෘතික දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන් 20 දෙනෙකු |

## උතුරුමැද කළා උළෙල 2021









## සුභාෂණ සඟරාව මුද්‍රණය



## කලායතන ආධාර

ප්‍රතිභා ප්‍රභා කලායතනය -





වන්දන කලායතනය - පලාගල

රසදූලා කලායතනය -තිරප්පනේ





ස්වර්ණ රංග කලායතනය - ඉපලෝගම



පන්සිළු සංගීත කලායතනය - කැකිරාව

## මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මේ අන්තර් ගත කළ ආකාරයට එහි ඉලක්ක කර ළඟා වීම

මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මට අනුව උතුරු මැද පළාතේ අංකුර කලා කරුවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීමේ අරමුණින් හා එම ශිල්පීන්ට ජාතික තලයට ප්‍රවිශ්ය වීමට හැකියාව ලබා දීම හා ජාතික තලයේ ශිල්පීන්ගෙන් දැනුම ලබා ගැනීමේ අරමුණින් කලා උළෙල සෑම වර්ෂයකම පැවැත්වීමට අපේක්ෂා කල අතර මේ දක්වා අඛණ්ඩව කලා උළෙල පවත්වා ඇත. සාම්ප්‍රදායික කලා කරුවන් දිරි ගැන්වීම සඳහා හා එම කලායතනවල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ අරමුණින් කලායතන ආධාර සෑම වර්ෂයකම ලබා දීම අපේක්ෂාව විය. ඒ අනුව මේ දක්වා අඛණ්ඩව සෑම වර්ෂයකම කලායතන ආධාර ලබා දීම සිදු විය.

උතුරු මැද පළාතේ ගම් දනව් පුරා විසිරී සිටින ලේඛකයන්ගේ හැකියාව පළාත පුරා ප්‍රදර්ශනය කිරීම සඳහා සුභාෂණ සඟරාව මුද්‍රණය කර පළාත පුරා නොමිලේ බෙදා හැරීම සිදු විය. මෙමගින් පළාතේ සාමාන්‍ය ජනතාවගේ කියවීමේ රුචිය වර්ධනය කර ගැනීමේ හැකියාව වැඩි කිරීම අපේක්ෂාව විය.

උතුරු මැද පළාතේ දහම් පාසල් සිසුන්ගේ භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා සෑම වර්ෂයකම ආර්ථික අපහසුතා සහිත දහම් පාසල් සඳහා ආධාර ලබා දීම අඛණ්ඩව සිදු විය. උතුරු මැද පළාතේ පවතින දුෂ්කර ආගමික සිද්ධස්ථාන සඳහා මූල්‍ය ආධාර අඛණ්ඩව ලබා දීම මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මේ අරමුණක් විය. උතුරු මැද පළාතේ ජනතාවගේ ආගමික නැඹුරුව තුලින් අධ්‍යාත්මික ගුණ දහම් වර්ධනය වීම මෙහි අරමුණක් විය. මේ අනුව දෙපාර්තමේන්තුව මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මේ අන්තර් ගත කල ඉලක්ක සපුරා ගෙන ඇත.

## ආයතනයේ කාර්යය සාධන දර්ශකය - ක්‍රියාකිරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්යය සාධන දර්ශකය | වර්ෂය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| කලා උළෙලට ඉදිරිපත් වන තරග කරුවන් සංඛ්‍යාව | √ | | |
| ආධාර ලබාදෙන තරග කරුවන් සංඛ්‍යාව | √ | | |
| සඟරාව සඳහා ලැබෙන ලිපි සංඛ්‍යාව | √ | | |

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යය සාධනය

සියල්ලන් සඳහා පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන තිරසර සංවර්ධන අරමුණ ඉටු කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව නර්තන හා සංගීත කණ්ඩායම පුහුණු කිරීම සිදු කරන ලදී. නර්තන කණ්ඩායමේ ශිල්පීන් 20 දෙනෙකු සහ සංගීත කණ්ඩායමේ ශිල්පීන් 15 දෙනෙකු දෛනිකව පුහුණු වීම් සිදු කරනු ලබයි. 2021 වර්ෂයේ වර්ෂයේ නවක ශිල්පීන් 10 දෙනෙකු නර්තන හා සංගීත කණ්ඩායමට බඳවා ගන්නා ලදී. එසේම සෑම වර්ෂයක් පාසාම විශ්ව විද්‍යාල අධ්‍යාපනයට සිසුන් යොමුවේ. එසේම පුහුණුව අවසන් කරන ලද සිසුන්, පාසල් සිසුන් සඳහා එම දැනුම ලබා දීමද සිදු කරයි. නර්තන හා සංගීත කණ්ඩායම පවත්වාගෙන යාම මඟින් එම ශිල්පීන් ආර්ථික අතින් ශක්තිමත් වීම සිදු වනු ඇත. එසේම පුහුණුව තුලින් ඔවුන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීමට ද අවස්ථාව සැලසේ. ප්‍රදේශයේ පවත්වන සියළු රාජ්‍ය උත්සව සඳහා මෙම නර්තන හා සංගීත කණ්ඩායම දායකත්වය ලබා දේ. දෙපාර්තමේන්තුව සතුව දක්ෂතා සහිත නර්තන උපදේශකයෙක් සහ සංගීත උපදේශකයෙක් සේවයේ යෙදීම දෙපාර්තමේන්තුට ශක්තියක් විය. එසේම නර්තන හා සංගීත උපකරණ දෙපාර්තමේන්තුව සතුවීම ශක්තියක් විය. 2021 වර්ෂයේ පැවැති කොවිඩ් වසංගත තතත්වය නිසා ජනයා ඒකරාශී කිරීමේ සීමා කිරීම් ඇති කිරීම හා පෞද්ගලික ප්‍රවාහනයේ ගැටළු මතු වීම ආදිය නිසා පුහුණු ශිල්පීන්ට දෛනිකව පුහුණුවීම් සඳහා සහභාගී වීමට නොහැකි වීම දෙපාර්තමේන්තුවට අභියෝගයක් විය.

එසේම සංස්කෘතික උරුමයන් රැක ගැනීම සඳහා පාරම්පරික කලා ප්‍රවර්ධනය අරමුණු කරගෙන පාරම්පරික කලායතන ඇතුළු කලායතන 100 ක් සඳහා මූල්‍ය ආධාර ලබා දීම සිදුවිය. මෙම මුදල් මඟින් කලායතන සඳහා අවශ්‍ය නර්තන හා සංගීත උපකරණ මිලදී ගැනීම, ඇඳුම් ආයිත්තම් මිලදී ගැනීම, කලායතන පවත්වාගෙන යන ස්ථාන අළුත් වැඩියා කිරීම සිදුවිය. මෙමඟින් කලායතන වල ඉගෙනුම ලබන ශිල්පීන්ගේ ඉගෙනුම් හැකියාවන් වර්ධනය වීම සිදු වේ. කලායතනවල ධාරිතා සංවර්ධනය වීම තුලින් නව පුහුණු වීම් අවස්ථා ඇතිවේ. මෙමගින් ග්‍රාමීය ප්‍රදේශවල සිසුන්ට තම හැකියාවන් වැඩි දියුණු කිරීමට අවස්ථාව උදා වේ. මේ අනුව සංස්කෘතික උරුමයන් රැක ගැනීමට හා පාරම්පරික කලා ප්‍රවර්ධනයට දෙපාර්තමේන්තුව දායක වී ඇත. සංස්කෘතික දෙපාර්තමේන්තුව වාර්ෂිකව මුද්‍රණය කරනු ලබන සුභාෂණ සඟරාව මෙවරත් සාර්ථකව මුද්‍රණව කර පළාත පුරා බෙදා හැරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. මෙමගින් උතුරු මැද පළාත පුරා විසිරී සිටින ලේඛකයන් දිරි ගැන්වීම සිදුවේ. එසේම ඔවුන්ගේ නිර්මාණ සඳහා මුද්‍රණ අනුග්‍රහය ලබා දීම සිදුවේ. මෙම සඟරාව උතුරු මැද පළාත පුරා බෙදා හැරීම සිදු කරන බැවින්, නිර්මාණ ප්‍රචලිත වීම සිදු වනු ඇත. සියලු සංස්කෘතික සහ ස්වභාවික උරුමයන් රැකගැනීම හා

ආරක්ෂාව සහ සංරක්ෂණය යන අරමුණ ට සමගාමීව දෙපාර්තමේන්තුව 2021 උතුරු මැද කලා උළෙල ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. ප්‍රාදේශීය සභා මඟින් අයදුම්පත් කැඳවා තරග පැවැත්වීම සිදුවිය. මෙම ජයග්‍රාහකයන් මඟින් පළාත් කලා උළෙල පැවැත්වීම සිදුවිය. මේ සඳහා උතුරු මැද පළාතේ තරග කරුවන් 3000 කට අධික පිරිසක් සහභාගී විය. මෙම තරග ඉසව් සඳහා සාම්ප්‍රදායික නර්තන තරඟ, ශාස්ත්‍රීය ගායනා හා වාදන තරඟ, මූර්ති, කැටයම් ගොක් කලා තරග ආදී සාම්ප්‍රදායික අංශ පැවැත්විය. එමඟින් සාම්ප්‍රදායික සංස්කෘතික උරුමයන් මතු පරපුර වෙත රැගෙන යාමේ අරමුණ ඉටු කර ගත හැකි විය. 2021 වසරේ සාර්ථක කලා උළෙලක් පැවැත්වීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

## හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% -74% | 75% - 100% |
| සියල්ලන් සඳහා පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය පූර්ණ ඵලදායී යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම | නර්තන හා සංගීත ශිල්පීන් පුහුණු කිරීම | රාජ්‍ය නර්තන හා සංගීත කණ්ඩායම පුහුණු කිරීම | රාජ්‍ය නර්තන කණ්ඩායමේ ශිල්පීන් 30 දෙනකු හා රාජ්‍ය සංගීත කණ්ඩායමේ ශිල්පීන් 20 දෙනෙකු දෛනිකව පුහුණු කිරීම | | | √ |
| නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | කලාකරුවන් 100 දෙනෙකු සඳහා ආධාර ලබා දීම | කලායතන ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | උතුරු මැද පළාතේ ක්‍රියාකාරී කලායතන 100 ක් සඳහා ඔවුන්ගේ භෞතික අවශ්‍යතා සම්පූර්න කිරීම සඳහා රු. 50000.00 බැගින් මූල්‍ය ආධාර ලබා දීම | | | √ |
| | කලාකරුවන් ට තරග අවස්ථා ඇති කිරීම | කලා උළෙල ව්‍යාපෘතිය සහ සරසවි සංහිද ප්‍රාදේශීය සංස්කෘතික උළෙල ක්‍රියාත්මක කිරීම | ප්‍රාදේශීය සභා මට්ටමින් නැටුම්,සංගීත, සාහිත්‍ය, ගොක් කොළ මූර්ති තරඟ පවත්වා එම ජයග්‍රාහකයන් සහ නව තරඟ කරුවන්ගේ සහභාගීත්වයෙන් පළාත් කලා උළෙලේ තරග පවත්වා අවසන් උත්සවය උත්කර්ෂවත් අයුරින් පැවැත්වීම | | | √ |
| | පාඨක දැනුම වර්ධනය කිරීම | සුභාෂණ සඟරාව | උතුරු මැද පළාතේ පාඨකයන්ට උසස් රසවින්දනයක් ලබා දීම සඳහා පළාතේ ලේඛකයන්ගේ ලිපි ඇතුළත් කරමින් සුභාෂණ සඟරාවේ පිටපත් 800 ක් මුද්‍රණය කිරීම හා පළාතේ පාසල් ප්‍රා දේශීය පුස්තකාල හා රාජ්‍ය ආයතනවලට බෙදා හැරීම | | | √ |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

සංස්කෘතික කටයුතු බොහෝවිට සාමුහික ලෙස ක්‍රියාත්මක වේ. කොවිඩ් වසංගතය හේතුවෙන් සාමුහික කාර්යන් සිදු කිරීමේ දුෂ්කරතා මතුවිය. රජය විසින් කොවිඩ් වසංගතය පාලනය කිරීම සඳහා විවිධ අවස්ථාවලදී නීති රීති පැනවූ බැවින් ශිල්පීන් ඒකරාශී කිරීමට දෙපාර්තමේන්තුවට හැකියාවක් නොලැබුණි. රජය විසින් සංචරණ සීමා විවිධ අවස්ථාවලදී පැනවූ බැවින් කලා ශිල්පීන් ඒකරාශී කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි විය.

2021 වර්ෂයේ යෝජිත ව්‍යාපෘති කිහිපයක් අත්හිටු වීමට සිදු විය. දෙපාර්තමේන්තුව සාම්ප්‍රදායික කලා කරුවන් දිරි ගැන්වීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කලද, රටේ පැවැති ආර්ථික අර්බුදය හමුවේ එවැනි සාම්ප්‍රදායික නිර්මාණ කරුවන් සොයා ගැනීම දෙපාර්තමේන්තුවට අභියෝගයක් විය. මෙහිදී දෙපාර්තමේන්තු නිලධාරීන්ට මහජනතාව මුණ ගැසීමට සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුව නොහැකි විය. එම නිර්මාකරුවන්ට තම නිර්මාණ නිෂ්පාදනය කිරීමට ප්‍රමාණවත් අමුද්‍රව්‍ය සපයා ගැනීමට නොහැකි වී ඇත. මෙම සාම්ප්‍රදායික නිර්මාණ වැඩි වශයෙන් අලෙවි කරන්නේ විදේශ සංචාරකයන් ඉලක්ක කරගෙනය. සංචාරක කර්මාන්තය බිඳ වැටීම මත එම නිෂ්පාදන අලෙවි කර ගැනීමට නොහැකි විය. එවැනි දුෂ්කරතා නිසා දෙපාර්තමේන්තු නිලධාරීන්ට නිර්මාණකරුවන්ගේ නිෂ්පාදන තහවුරු කර ගැනීමට නොහැකි විය. ඉහත සඳහන් කල ගැටළු නිසා මෙම ව්‍යාපෘතිය අත්හිටුවීමට දෙපාර්තමේන්තුවට සිදු විය.

කලා ප්‍රසංග ව්‍යාපෘතියේ ඉලක්ක ගත කණ්ඩායම පාසල් සිසුන් හා සාමාන්‍ය මහජනතාවයි. සාමාන්‍ය ජනතාව ඒකරාශී කිරීමට රජයෙන් අවසර හිමි නොවීය. පාසල් නොපැවැත්වීම නිසා සිසුන් ඒකරාශී කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි විය. එසේම කලා කරුවන් මහජනතාව අතරට පැමිණීමට අවකාශයක් නොමැති විය. එමනිසා කලා ප්‍රසංග ව්‍යාපෘතියද 2021 වසරේ ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි විය. කලා උළෙළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදි අභියෝග රැසකට මුහුණ දීමට දෙපාර්තමේන්තුවට සිදුවිය. 2021 වර්ෂයේ වැඩි කාල සීමාවක් පාසල් හා රාජ්‍ය ආයතන වසා තැබීම නිසා ප්‍රචාරණයේදී බාධා ඇති විය. ප්‍රචාරණය අවහිර වීම නිසා කිහිප අවස්ථාවකදීම තරග සඳහා අයදුම්පත් ඉදිරිපත් කල යුතු කාල සීමාව සංශෝධනය කිරීමට සිදු විය. ප්‍රචාරණ කටයුතු සඳහා විද්‍යුත් තැපැල් හා දුරකථන බොහෝ විට භාවිතා කරන ලදී. තරග පැවැත්වීමට සිදු වූයේ කොවිඩ් මර්ගෝපදේශයන් අනුගමනය කරමින් වේ. එහිදී එක් දිනක පැවැත්විය හැකි තරග අංශ සීමිත විය. එම නිසා තරග පැවැත්වීමට වැඩි කාලයක් වැය කිරීමට සිදු විය. තරග කාණ්ඩ අනුව දින කිහිපයක් පැවැත්විය. එබැවින් නියමිකාලවකවානු තුල ව්‍යාපෘතිවල සාක්ෂාත් කරගතයුතු අගයන් වලට පැමිණීමේ දුෂ්කරතා වලට දෙපාර්තමේන්තුවක් ලෙස මුහුණ දීමට සිදු විය.

සුභාෂණ සඟරාව මුද්‍රණය කිරීමේදී ගැටළු වලට මුහුණ දීමට සිදුවිය. මහජනතාව ආර්ථික අතින් හා සෞඛ්‍ය තත්ත්වයෙන් දුර්වල වීම නිසා නිර්මාණ කරනයේ යෙදෙන පිරිස සීමිත විය. එම නිසා වෙනත් වර්ෂවලට සාපේක්ෂව ලිපි ලැබීම අඩු විය. තැපැල් සේවය නිසි අකාරයෙන් ක්‍රියාත්මක නොවීම නිසා ලිපි ලැබීම ප්‍රමාද විය. ලිපි ලබා ගැනීම වැඩි වශයෙන් සිදු වූයේ විද්‍යුත් ක්‍රම වේද හරහා වේ. සඟරාව මුද්‍රනය කිරීමේදීද මුද්‍රණ ආයතන වසා තැබීම නිසා දුෂ්කරතා ඇතිවිය. එසේම මුද්‍රණ ආයතන වලට ලිපි ද්‍රව්‍ය සපයා ගැනීමට දුෂ්කර විය. එම දුෂ්කරතා හමුවේ වුවද සාර්ථකව සඟරාව මුද්‍රණය කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය.

එහෙත් පැවැති තත්තවයන් කළමනාකරණය කර ගනිමින් ක්‍රියාත්මක කරන සීමිත ව්‍යාපෘතින්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% ඉලක්කය දක්වා ගෙන ඒමට දෙපාර්තමේන්තුවක් ලෙස හැකියව ලැබිණි.

# 6.4. සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු :

1990 අංක 11 දරණ උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය පිහිටුවීම පිළිබඳ වූ ප්‍රඥප්තියට අනුකූලව උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පරිපාලනය වන්නාවූ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස හැඳින්විය හැකිය. 1990 මැයි මස 01 දින එවකට හිටපු පළාත් ප්‍රධාන අමාත්‍යය පී. ඩී මහින්ද සෝම මහතා විසින් ග්‍රාමීය මාර්ග සංවර්ධන කටයුතු සඳහා මෙම ආයතනය ආරම්භ කර ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වැඩපළක් ලෙස නැවත මෙම පරිශ්‍රය පළාත් සභාව වෙත පවරා ගනිමින් අනතුරුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය නමින් ස්ථාපිත කරන ලදි. ආරම්භයේදී මෙම ආයතනය මගින් පළාතේ කෘෂිකාර්මික, වාරිමාර්ග, මහාමාර්ග ඉදිකිරීම්, ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු කිරීම වාහන සහ යන්ත්‍ර/සූත්‍ර අළුත්වැඩියාව හා සේවා කිරීම මෙන්ම පළාතේ මුල් පෙලේ මුද්‍රණාලයක්ද මෙම ආයතනය සතුව ඇත. ඒ අනුව ගුණාත්මකභාවයෙන් සහ කාර්යක්ෂම ලෙස අඩු පිරිවැයක් යටතේ අවශ්‍ය මුද්‍රණ ඇණවුම් ලබාදීමේ හැකියාවක් ආයතනය සතුව ඇත.

වර්ෂ 2017 අවසාන භාගයේදී එවක පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ පේශල ජයරත්න බංඩාර මැතිතුමාගේ සංකල්පය අනුව ආරම්භ කරන ලද උතුරු මැද පළාත් සභා ආරක්ෂක ඒකකයද මෙම ආයතනය හරහා ක්‍රියාත්මක වේ. මේ වනවිට රැකියා විරහිත තරුණ තරුණියන් සියයකට ආසන්න ප්‍රමාණයක් සේවා නියුක්තව සිටි. එයද පළාතේ සේවා වියුක්තියට විසඳුමක් හා ජනතාවගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට පිටුවහලක් ලෙස හැඳින්විය හැකිය.

## දැක්ම

"උතුරු මැද පළාත් සභාවේ ඉලක්කගත අරමුණ හා අපේක්ෂාවන් සපුරා ගැනීම සඳහා සහයවන ප්‍රමුඛ ආයතනයක් බවට පත් වීම හා පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත් වීම".

## මෙහෙවර

"ඉදිකිරීම් කටයුතු සඳහා යන්ත්‍රෝපකරණ කුලී පදනම මත සැපයීම, යන්ත්‍ර වාහන අළුත්වැඩියා කටයුතු, සේවා කටයුතු සිදුකිරීම, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හී මුද්‍රණ කටයුතු සහ වෙනත් විශේෂ ව්‍යාපෘති සඳහා සක්‍රියව දායකවීම සහ යම් නිර්මාණ කටයුක්තක් හෝ සේවා සැපයීමක් උපරිම ඵලදායිතාවයෙන් හා කාර්යක්ෂමව සිදුකිරීමේ අභිලාශය පෙරදැරිව උතුරු මැද පළාතේ ජනතාවගේ ආර්ථික අභිවෘද්ධිය සඳහා සක්‍රියව දායක වීම".

## දිගුකාලීන අරමුණු හා කෙටිකාලීන අරමුණු

- ❖ උතුරු මැද පළාත් සභාවට අරමුදල් සපයන මූලාශ්‍රයක් බවට පත් වීම සඳහා කටයුතු කිරීම.
- ❖ පළාත් සභාවට බහුවිධ සේවාවන් සපයන ආයතනයක් බවට පත් කිරීමේ අරමුණින් මුද්‍රණ, යාන්ත්‍රික හා සේවා අංශයන්ගෙන් ලබා දෙන සේවාවන් පුළුල් කිරීම තුළින් උතුරු මැද පළාත තුළ ප්‍රමුඛතම සේවා සපයන ආයතනයට පත්වීම
- ❖ විවිධ අංශ කෙරෙහි වෙන්වෙන් වශයෙන් වූ පරිපූර්ණ දැනුම හා කුසලතාවයෙන් උසස් මානව සම්පතක් බිහි කිරීම තුළින් පළාතේ හදිසි ඕනෑම අවශ්‍යතාවයකදී දායක වීමට හැකිවන අයුරින් කටයුතු කිරීම.
- ❖ නවීන තාක්ෂණය හා කාර්යක්ෂමතාවයකින් ඉහළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහිත ආයතනයක් බවට පත්වීම තුළින් පළාත් සංවර්ධනයට දායක වීම.
- ❖ රජය විසින් ක්‍රියාත්මක කරන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම සඳහා එමගින් රජය විසින් අපේක්ෂා කරන අරමුණු ළඟා කිරීම සඳහා සක්‍රීයව දායකවන ආයතනයක් බවට පත් වීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ යාන්ත්‍රික, මුද්‍රණ හා සේවා අංශයන් සංවර්ධනය කිරීම සඳහා නව යන්ත්‍ර සූත්‍ර මිලට ගැනීම.
- ❖ සියළුම ඉදි කිරීම් හා යාන්ත්‍රික කටයුතු නිසි ප්‍රමිතියට හා කලට වේලාවට සිදු කර ගැනීම.
- ❖ පෞද්ගලික අංශය හා තරඟ කිරීමට හැකිවන පරිදි මුද්‍රණ අංශය සංවර්ධනය කිරීම.
- ❖ යන්ත්‍ර වාහන කුලී පදනම මත ලබාදීම තුළින් ආදායම් තත්වය වර්ධනය කිරීමට කටයුතු කිරීම.
- ❖ වාහන සේවා අංශ මගින් අවම මිලට කඩිනම් සේවය.

## ප්‍රධාන කාර්යයන්

- ❖ රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි මුද්‍රණ කටයුතු සිදු කිරීම.
- ❖ වාහන අළුත්වැඩියා හා සේවා කටයුතු.
- ❖ ටයර් සේවා කටයුතු සිදු කිරීම.
- ❖ උතුරු මැද පළාත තුළ විශේෂ ව්‍යාපෘති සඳහා දායක වීම.
- ❖ යන්ත්‍ර කුලී පදනම මත ලබා දිම.
- ❖ පළාත් සභාවට හා අනුයුක්ත රාජ්‍ය ආයතනයන්ට ආරක්ෂක හා සනීපාරක්ෂක සේවා සැපයීම.
- ❖ ආපදා කටයුතුවලදී ජංගම සේවාවන් පැවැත්වීම.
- ❖ ප්‍රායෝගික පුහුණු හා උපදේශන කටයුතු සපයමින් සම්පත්දායකයෙකු ලෙස කටයුතු කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මුද්‍රණ අංශය මගින් කරනු ලබන සියළුම මුද්‍රණ කටයුතු සඳහා නිසි ප්‍රමිතියට අනුව නියමිත වේලාවට ලබා දීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර උපයෝගී කර ගැනීම.
- ❖ යන්ත්‍ර/වාහන කුලියට දීමෙන් ලැබෙන ආදායම් වැඩිකර ගැනීම සඳහා වැඩි වශයෙන් රාජ්‍ය හා පුද්ගලික අංශයන් වෙත යන්ත්‍ර/වාහන සැපයීම අරමුණකි.
- ❖ වාහන සේවා අංශය මගින් අවම මිලට කඩිනමින් සේවාවන් ලබා දීම.
- ❖ ආයතනයේ පළපුරුදු කාර්යක්ෂම කාර්මිකයින් ලවා වාහන අළුත්වැඩියා කිරීම සඳහා නවීන යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම.
- ❖ සියළුම ඉදි කිරීම් හා වෙනත් ව්‍යාපෘති කටයුතු නිසි ප්‍රමිතියට අනුව කලට වේලාවට සිදුකර ගැනීම.
- ❖ ඉහත ප්‍රධාන කාර්යයන්වලට අදාලව දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනවල අනුග්‍රහය ලබා ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යාංශයේ සහාය ලබා ගැනීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 58ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 55 කි. පුරප්පාඩු සංඛ්‍යාව 03 ක් වේ.

## දිගුකාලීන හා කෙටිකාලීන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රධාන කාර්යයන් හා සම්බන්ධ ව්‍යාපෘති

### මුද්‍රණ අංශය

| අනු අංකය | ව්‍යාපෘතිය/ වැඩසටහන | ප්‍රධාන ක්‍රියාකාරකම | අපේක්ෂිත ප්‍රතිඵල | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| 01 | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | නිවෙස් පාදක ඉගෙනුම් පත්‍රිකා 1ශ්‍රේණිය සිට 5 ශ්‍රේණිය දක්වා මුද්‍රණය කිරිම.<br><br>ප්‍රති ප්‍රබෝද්‍ා1ශ්‍රේණියේ කාර්යය පත්‍රිකා මුද්‍රණය කිරිම<br><br>2ශ්‍රේණිය ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය<br><br>4 ශ්‍රේණිය ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය<br><br>ප්‍රති ප්‍රබෝද්‍ාඅත් පොත් මුද්‍රණය<br><br>ගණිතය කාර්යය පත්‍රකා කට්ටල මුද්‍රණය<br><br>9 හා 11 ශ්‍රේණියේ ස්වයං අධ්‍යන පත්‍රකා මුද්‍රණය | උතුරුමැද පළාත් පාසල් දරුවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහල නැංවීමට හා විමර්ශනය කිරිම. | උ මැ ප සියලුම පාසල් ළමුන්ගේ ප්‍රාථමික හා ද්වීතික අධ්‍යාපනය ඉහළ නැංවීම. |
| 02 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | මාසික දීමනා කාඩ් පත් හා අයදුම් පත් මුද්‍රණය | උ මැ ප වෙසෙන අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම | අදාල බල ප්‍රදේශය තුල සේවාවන් ලබන පාර්ශවය |
| 03 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | අත් පත්‍රිකා පොත් මුද්‍රණය | සත්ත්ව නිෂ්පාදන මඟින් උපරිම ප්‍රයෝජන ලබා ගැනිම | උ මැප සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත රැකියාවන්හි නිරත වුවන් |

**සේවා අංශය**

වර්ෂ 2021 දී සේවා අංශය ඉහල ප්‍රගතියක් ලගා කරගෙන තිබෙන අතර ආයතනය විසින් විශාල ආයෝජනයක්ද ඒ වෙනුවෙන් සිදු කර තිබේ.

| වර්ශය | සේවා කල වාහන ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|
| 2020 | 352 | 6.13 |
| 2021 | 585 | 12.31 |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේ දී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2021 වර්ෂයේ දී ගෝලීය ප්‍රශ්නයක්ව පැවති කොවිඩ් - 19 වසංගතය හමුවේ ආර්ථිකයන් මත දිගුකාලීන අහිතකර බලපෑම් එල්ල වුවද ඇතැම් අංශයන් සඳහා එම බලපෑම් හිතකර විය. එනම් අප ආයතනයේ මුද්‍රණ අංශයේ ක්‍රියාකාරීත්වය පැවති වාතාවරණය හමුවේ අර්ධ ක්‍රියාකාරී වූ අතර යාන්ත්‍රික අංශයේ ක්‍රියාකාරීත්වය පූර්ණ සක්‍රීය විය. මන්ද වසනය හමුවේ සෞඛ්‍ය සේවා රාජකාරි අත්‍යවශය වූ අතර එම වාහන අලුත්වැඩියා හා සේවා කිරිම වාර ගණන වැඩි වීම මත අපගේ යාන්ත්‍රික අංශයේ ආදායම් තත්ත්වය පෙර වර්ෂයට සාපේක්ෂව දෙගුණ විය.

ආයතනයේ ක්‍රියාත්මක වන අනෙකුත් අංශයන් සාමාන්‍ය පරිදි ඉල්ලක සපුරාගනිමින් ඉදිරියට ගමන් කලද 2021 වර්ෂයේදී ඉලක්කගත මුද්‍රණාල ආදායම සත්‍ය ආදායමට වඩා පහත වැටුණි. ඒ සඳහා බලපෑ ප්‍රධානතම හේතුව වුයේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මධ්‍යවාර විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය අහිමි වීම මතය. එම අහිමි වීම මත ආයතනයහට අහිමි වූ සමස්ථ ආදායම ලක්ෂ 400ක් පමණ විය. එම අහිමිවීම හමුවේ මුද්‍රණාලය ඉලක්කගත ආදායම සපුරාගත නොහැකි තත්ත්වයකට පත්විය.

2021 වර්ෂයේ සමස්ථ මුල්‍ය සමාලෝචනය පිළිබඳ අවධානය යොමු කරන කල මුද්‍රණාලය හැර අනෙක් සියලුම අංශ තම ඉලක්කයන් සම්පූර්ණ කළ අතර ඉන් යාන්ත්‍රික හා සේවා අංශය ඉතා හොඳ කාර්යය සාධනයක් පෙන්වා ඇත.

# 6.5.මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

## මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳව සැකෙවින්...

ළමා අවධිය, මානව සම්පත පසු කරනු ලබන සොඳුරුතම අවධියයි. ඒ සොඳුරු අවධිය පසු කරන කිසිවෙකුත් එම කාලය නිදහසේ භුක්ති වින්දේ ද හෝ භුක්ති විඳින්නට ඉඩ සලසා දෙන්නේ ද යන්න මහත් ගැටළුවකි. ළමා පරපුරට, වර්තමානය වනවිට අතීතයට වඩා සංකීර්ණ වූත්, හුදකලා වූත්, ජීවිතයක් ගත කිරීමට සිදු වී තිබේ. මීට දශක 5කට පෙර දෙමාපිය වැඩිහිටි ආදරය, කරුණාව, පිළිගැනීම සුරක්ෂිතතාව, ඇගයීම, ප්‍රශංසාව ඇතිව තම නිවසේ හා අවට පරිසරයේ වැඩෙමින් සුන්දර ජීවිතයක් ගත කළ දරුවාගේ සමස්ත සංවර්ධනය සඳහා සුවදායි පරිසරයක් ගොඩනැගුණේ නිතැතිනි.

වැඩිහිටි ජීවන රටාව අවිවේකි වන වර්තමානයේදී දරුවා තම සියළු අයිතිවාසිකම් අහිමි වූ හුදකලාවේ අවධිය වන අ.වු 03-05 කාලයේදී හුදකලා පවුල් පරිසරයෙන් මිදි පෙර පාසල වෙත පිවිස, සම වයස් කණ්ඩායම් සමග සමාජානුයෝජනය වී තම ජීවිතයට අලුත් අත්දැකීම් එක්කර ගනි. මෙම ජීවන රටාවට අවතීර්ණවත්ම දරුවා පෙර පාසල් ගුරුවරිය සමග සමීප වී දරුවා සොයන ආදරය, කරුණාව, පිළිගැනීම, ප්‍රශංසාව ඇයගෙන් ලබා ගැනීමට උනන්දු වේ.

දරුවාගේ කායික හා මානසික ක්‍රියාකාරීත්වය වර්ධනය සඳහා පෙර පාසල් ගුරුවරුන්ගේ ආකල්ප හා ධාරිතා සංවර්ධනය සඳහාත්, දෙමාපිය ආකල්ප වැඩි දියුණු කිරීම සඳහාත් දරුවාගේ ඉගෙනුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට භෞතික සම්පත් සංවර්ධනය සඳහාත්, මේවන විට ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ 13 වන සංශෝධනය 09 වැනි උපලේඛනයේ 01 වන ලැයිස්තුවේ 03 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභාවට බලතල පැවරීමේ විධිවිධානවලට අනුකූලව උතුරු මැද පළාත තුළ විධිමත් හා යහපත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධනය කිරීම පිණිස පෙර පාසල් පිහිටුවීම හා අනුසාංගික කාරණා සඳහා විධිවිධාන සැලසීම පිණිස ප්‍රඥප්තියක් පිහිටුවා ඇත. එය අංක 04 දරණ උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යනුවෙන් හඳුන්වන ලදී.

එය උතුරු මැද පළාත් සභාව විසින් සම්මත කර 2004 පෙබරවාරි මස 19 වන දින උතුරු මැද පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

උතුරු මැද පළාතේ ස්ථාපිත කර ඇති මුල් ළමාවිය ප්‍රඥප්තියට අනුව පෙර පාසල් පද්ධතිය ගොඩනැගීම සඳහා මේ වන විට උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබා දුන් ප්‍රතිපාදන වලින් ගුරු පුහුණු වැඩසටහන් සඳහා ද වැය කර ඇත. සැම දරුවෙකුම සුවිශේෂි වන අතර, සමාන වටිනාකමකින් යුක්ත වේ. දරුවාට ආවේණික වේගයකින් සංවර්ධනය වන අතර, හැකියාවන්ගෙන් හා දක්ෂතාවයන්ගෙන් යුක්ත වේ. උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් සමඟ එක්ව ළමා සංවර්ධනයට බලපාන පවුල, ප්‍රජාව හා සංස්කෘතිය යන සාධක හා බැඳුනු සන්දර්භයක් තුළ පෙර පාසල් දරුවන්ගේ සංවර්ධනය උදෙසා සමෝධානිත ඉගෙනුමක් ලබා දෙනු ලැබේ. දරුවන්ගේ සංවර්ධනය උදෙසා දරුවන්ට සැලසෙන රැකවරණය ප්‍රමුඛ කොට සලකන අතර, දෙමාපියන්, පෙර පාසල් ගුරුවරුන් හා ප්‍රජාව මේ පිළිබඳව වඩා සැලකිලිමත් විය යුතු ය.

පෙර පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා කායික සංවර්ධනය, සමාජීය හා චිත්තවේග සංවර්ධනය, ප්‍රජනන හැකියා සංවර්ධනය හා භාෂාව හා මුල් කාලීන සාක්ෂරතාවය ප්‍රමුඛ කොට ගත් ඉගෙනුම් ඵලවලට

අදාල නිපුණතාවයන් හෙබි පුංචි දරුවන් තම දැනුම, ආකල්ප, කුසලතා, දියුණුකර ගනිමින් අනාගතය කරා පියනඟනු දැකීම මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අභිප්‍රාය වේ.





උතුරු මැද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය මෙම පළාතේ මුල් ළමාවියෙහි පසුවන දරුවන්ගේ අනාගතය වෙනුවෙන් පෙර පාසල් නියාමනයේ යෙදෙන ආයතනයකි.

දරුවෙකුගේ ජීවිතයේ මුල් ළමාවිය අවධිය දරුවාගේ මොළයේ වර්ධනය සඳහා ඉතාමත් තීරණාත්මක අවධියයි. එම කාලය දරුවාගේ බුද්ධිමය ක්‍රියාකාරීත්වයෙන් ගුණාත්මක බව තීරණය කරන, බාහිර අත්දැකීම්වලට දරුවෙකු වඩාත් සංවේදී කරන, දරුවාගේ භාෂා සංවර්ධනය, සමාජානුයෝජනය හා පෞර්ෂය ගොඩනැඟීම ආදිය හා සම්බන්ධ ඉතා වැදගත් සංවර්ධන කාර්යයන් මේ අවධියේ දී දරුවා තුළ සිදු වේ. උතුරු මැද පළාත් මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් සමඟ එක්ව ළමා සංවර්ධනයට බලපාන පවුල, ප්‍රජාව හා සංස්කෘතිය යන සාධක හා බැඳුනු සන්දර්භයක් තුළ පෙර පාසල් දරුවන්ගේ සංවර්ධනය උදෙසා සමෝධානිත ඉගෙනුමක් ලබා දෙනු ලැබේ.

මුල් ළමාවියට අදාළ සංවර්ධන කාර්යයන් ඉටු කර ගැනීමට, ඊට ශක්තිය සපයන පරිසරයක් තිබිය යුතු ය. එම පරිසරය පෙර පාසල් තුළින් ගොඩනැගෙන අතර, විධිමත් ලෙස අවුරුදු 3 – 5 අතර දරුවෙකු සංවර්ධනයකර ගැනීමට පෙර පාසල් ශක්තිමත්කර සුදුසු ගුරුවරුන් පත්කරලීම මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ අරමුණයි. අධිකාරියේ දැක්මට අනුව "සතුටින් පිරි නිපුණතාවන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කර ගැනීමට" මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පෙර පාසල් අධීක්ෂණය හා නියාමනය ඔස්සේ කටයුතු කරනු ලබයි.

## දැක්ම

“සතුටින් පිරි නිපුණතාවයන්ගෙන් හෙබි සදාචාර සම්පන්න පෙර පාසල් දරුවන් උතුරු මැද පළාත තුළ බිහි කිරීම”.

## මෙහෙවර

“උතුරු මැද පළාත තුළ විවිධත්වයෙන් යුතු, මනා ක්‍රියාකාරීත්වයෙන් හෙබි, නිසඟ කුසලතාවයෙන් යුත්, සෞන්දර්යාත්මක හැඟීමෙන් පිරිපුන්, සාරධර්ම සපිරි, පෙර පාසල් දරු පරපුරක් බිහි කිරීම සඳහා මධ්‍යම රජයේ හා පළාත් සභාවේ මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ද සම්බන්ධ කරගනිමින් 2003 අංක 04 දරණ ප්‍රඥප්තියට අනුකූලව වැඩසටහන් සම්පාදනය, සම්බන්ධීකරණය හා ඵලදායි ලෙස මෙහෙයවීම පිළිබඳව පළාතේ කේන්ද්‍රීය ආයතනයක් ලෙස කැපවීමෙන් කටයුතු කිරීම”.

## දිගුකාලීන අරමුණු

- ❖ ගුණාත්මක සේවා සපයන පෙර පාසල් ගුරු පද්ධතියක් ඇති කිරීම.
- ❖ පූර්ව ළමාවිය සංවර්ධනය පිළිබඳව මනා දැනුමක් සහිත සමාජයක් ඇති කිරීම.
- ❖ සෞභාග්‍යයේ දැක්ම තුළින් ගුණාත්මක සේවාවක් සපයන ආයතනයක් බවට මුල් ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය පත් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ❖ ළමා සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.
- ❖ ළමා ආරක්ෂණය පිළිබඳ දෙමාපියන් මනාව දැනුවත් කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ උතුරු මැද පළාතේ පූර්ව ළමා අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මග පෙන්වීම.
- ❖ ගුණාත්මක, නිපුණතාවන්ගෙන් හෙබි දරු පරපුරක් බිහි කිරීම.
- ❖ පෙර පාසල් ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් නියමයන් පැනවීම.
- ❖ පෙර පාසල් ගුරුවරියන් පුහුණු කිරීම හා පුහුණුව ලැබූ අයට සහතික පත්‍ර ලබා දීම.
- ❖ පෙර පාසල් දරුවන්ගේ පෞද්ගලික ස්වස්ථතාවය හා පෝෂණය ඇති කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මානව සම්පත් සංවර්ධනයට අදාළ සැලසුම් ක්‍රියාත්මක කිරීම.
- ❖ අධිකාරියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා අදාළ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම.
- ❖ රාජ්‍ය නොවන ආයතන හා සංවිධානවල සහාය, අනුග්‍රහය ලබා ගැනීම.

## මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ අරමුණු

- ❖ උතුරු මැද පළාත තුළ පෙර පාසල් පිහිටුවීම.
- ❖ ලියාපදිංචිය, ශිෂ්‍යයින් ඇතුළත්කර ගැනීම, ගුරුවරුන් බඳවා ගැනීම සඳහා.
- ❖ නිර්ණායක සැකසීම පෙර පාසල් පිහිටුවීම හා ඒවායේ ව්‍යාපෘති පිළිබඳව කටයුතු කිරිම.
- ❖ ඉහත අරමුණු සියල්ල හෝ ඉන් කිසිවක් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ හිතකර විය හැකි වෙනත් සියළු ක්‍රියා කිරීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්




| තිරසර සංවර්ධන අරමුණු | ක්‍රියාකාරකම |
|---|---|
| නිරෝගී ජීවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරිම | පෝෂණය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම<br>ස්වස්ථතාවය පිළිබඳව දෙමාපියන් දැනුවත් කිරීම |
| පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරිම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනිමේ අවස්ථා සැලසිම | පෙර පාසල් පාලිකාවන් සඳහා විවිධ පුහුණු<br>යටිතල පහසුකම් සංවර්ධනය කිරීම |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 40ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 29 කි. පුරප්පාඩු සංඛ්‍යාව 11 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි) | 2021 වර්ෂයේ වියදම ( රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය |
|---|---|---|---|---|
| 1.වෙනත් මූලධන වත්කම් පුනරාවර්ථන හා වැඩිදියුණු කිරීම | 29.00 | 12.73 | 16.27 | 16.27 |
| එකතුව | 29.00 | 12.73 | 16.27 | 16.27 |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග.

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියේ සිව්වන කොටසේ සඳහන් "මව්තුරුලෙන් ගුරුමව් සෙවනට" යටතේ මෙම අධිකාරිය විසින් පහත සඳහන් කටයුතු කර ඇත.

- උතුරු මැද පලාතේ සෑම ග්‍රාම සේවා කොට්ඨාශයකම පෙර පාසැල් එකක් හෝ ආරම්භකර පවත්වාගෙන යනු ලබයි.
- මෙම අධිකාරිය විසින් සකස් කර ඇති වාර්ෂික නිශ්චිත කාල සටහනක් හා එක් විෂයය නිර්දේශයක් යටතේ සියළුම පෙර පාසැල් විසින් ඒකාකාරී ලෙස අධ්‍යයන කටයුතු කරනු ලබයි. එසේම තෝරාගත් පෙර පාසැල් කීපයක මූලික අවශ්‍යතා ඉටුකිරීමට කටයුතු කර ඇති අතර, සියළුම පෙර පාසැල් සඳහා බුද්ධිවර්ධන ළමා උපකරණ සපයාදීමට කටයුතු කර ඇත.
- පෙර පාසැල් ඩිප්ලෝමා පාඨමාලා පවත්වා සියළුම පෙර පාසැල් ගුරුවරියන් සඳහා පෙර පාසැල් ඩිප්ලෝමා සහතිකයක් ලබාදීමට කටයුතු කර ඇත.

**ශුද්‍ධ අත විශ්ලේශණය තුළින් අංශය පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය**

| | |
|---|---|
| **ශක්තීන්**<br>➢ නෛතික රාමුවක ආරක්ෂණය.<br>➢ අධිකාරියට අනුයුක්ත නිලධාරී මණ්ඩලයක් සිටීම.<br>➢ කාර්යාලයේ ප්‍රමාණවත් භෞතික සම්පත් තිබීම.<br>➢ විෂය නිර්දේශයක් තිබීම.<br>➢ ප්‍රමාණවත් දත්ත හා තොරතුරු පැවතීම.<br>➢ ශක්තිමත් අන්තර්පුද්ගල සම්බන්ධතා. | **දුර්වලතා**<br>➢ කාර්ය මණ්ඩලයේ දැනුමේ සීමාකම්.<br>➢ ක්ෂේත්‍රයේ දැනුවත් කිරීම්වලට ප්‍රමාණවත් තාක්ෂණික උපාංග නොමැති වීම.<br>➢ දත්ත යාවත්කාලීන කෙරෙන විධිමත් ක්‍රමවේදයක් නොමැතිකම. |
| **අවස්ථා**<br>➢ රාජ්‍ය අනුග්‍රහය.<br>➢ රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතන දක්වන සහයෝගය.<br>➢ අනෙකුත් අදාල රාජ්‍ය ආයතන සහ නිලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය.<br>➢ සමහර රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලික ආයතන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම.<br>➢ පුහුණුකරුවන්ගෙන් ලැබෙන සහය. | **තර්ජන**<br>➢ සුදුසුකම් නොමැති පුද්ගලයින් පෙර පාසල් ගුරුවරුන් ලෙස කටයුතු කිරීම.<br>➢ කාර්යාලයේ ප්‍රමාණවත් ඉඩකඩක් නොතිබීම.<br>➢ මුල් ළමාවිය සංවර්ධන අංශයේ කටයුතු කරන අනෙකුත් ආයතන නිසි පරිදි අධිකාරිය සමඟ සම්බන්ධ නොවීම.<br>➢ පෙර පාසල් අධීක්ෂණය කිරීමට යෑමේදී ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිවීම.<br>➢ අධිකාරියේ ලියාපදිංචි නොවූ පෙර පාසල්වල ක්‍රියාකාරිත්වය.<br>➢ අනුමත කාර්ය මණ්ඩලය බඳවා නොගැනීම.<br>➢ දැනට සිටින අනුයුක්ත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු නොපිරවීම.<br>➢ අධිකාරියට පෙර පාසල් ගුරු පුහුණු මධ්‍යස්ථාන නොමැතිකම.<br>➢ ප්‍රමාණවත් වාර්ෂික මුදල් ප්‍රතිපාදන වෙන් නොකිරීම.<br>➢ පෙර පාසල් ගුරුවරුන්ගේ දුර්වල ආකල්ප<br>➢ සමාජය පෙර පාසල් ගුරුවරුන් කෙරෙහි දක්වන ආකල්ප.<br>➢ පෙර පාසල් ගුරුවරුන් වරින් වර ක්ෂේත්‍රයට ඇතුළුවීම හා හැරයාම.<br>➢ පෙර පාසල් ගුරුවරුන්ට වැටුපක් නොගෙවීම නිසා අධිකාරියට තම බලතල පාවිච්චි කිරීමට නොහැකිවීම.<br>➢ පෙර පාසල් ගුරුවරුන් සමඟ සංනිවේදනය දුෂ්කර වීම. |

**මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

එමෙන්ම ගොවි කාන්තාවන් දායක කර ගනිමින් කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, හෙළ බොජුන් වැඩසටහන, ආහාර තාක්ෂණික වැඩසටහන් මගින් විවිධ නිෂ්පාදන මූලික කරගනිමින් කෘෂි ව්‍යවසායයින් බිහිකිරිම සඳහා දායකත්වය ලබාදී ඇත. උදාහරණ ලෙස සහල් පිටි නිෂ්පාදන වැඩසටහන්, ධාන්‍ය ආශ්‍රිත නිෂ්පාදන, පළතුරු ආශ්‍රිත නිෂ්පාදන, මෙන්ම මල් වගාව මගින් ආදායම් උත්පාදනය කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැණුම ලබාදෙයි. තවද තරුණ ගොවීන් සඳහා ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරයි. ගෙවතු වගා වැඩසටහන් මගින් පවුලේ පෝෂණය, ආර්ථිකය මෙන්ම පවුලේ සහයෝගිතාව වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර ගෙවතු නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථාව සලසාදීම සඳහා “පාරිබෝගික සෞඛ්‍ය ගොවියාගේ වත්කම” යන ආදර්ශ පාඨය මුල් කරගනිමින් “farm market” මගින් කෘෂි රසායන අවම කාබනික නිෂ්පාදන පාරිභෝගික ජනතාවට ලබාදීම සඳහා කටයුතු කර ඇත.

එමෙන්ම ප්‍රදේශයේ වගාවන්ට අවශ්‍ය කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැණුම හා කුසලතාවයන් වැඩිදියුණු කර ගැනීම සඳහා මෙන්ම එම නිෂ්පාදිත කොම්පෝස්ට් අළෙවි කර ගැනීම සඳහා අවශ්‍ය සහය ලබාදීම මගින් විදේශ විනිමය ඉතිරිකර ගැනීමට දායකත්වයක් ලබාදීම සිදු කරයි. ඉහත කරුණු වලට අමතරව පළතුරු වගා වපසරිය වැඩි කිරිම සඳහාත් , තිබෙන වගාවන්හි ඵලදායිතාව ඉහළ දැම්මටත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. (උදා: කප්පාදු වැඩසටහන්,රෝග හා පළිබෝධ පාලන වැඩසටහන් හඳුන්වා දිය හැක.)

තවද කෘෂි රසායන අවභාවිතය අවම කිරිමට අවශ්‍ය නීතිමය සහය ලබාදීමත් පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම උපායන් ක්‍රියාත්මක කිරිමට අවශ්‍යය තාක්ෂණික සහය ලබාදීමත් මගින් පරිසර හිතකාමී වගා වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

උතුරු මැද පළාත තුළ වෙසෙන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය ගොවිතැන වන අතර ඔවුන්ගේ හදවතට සමීප වෙමින් නව තාක්ෂණික දැනුම ලබා දීමටත් ක්ෂේත්‍ර අධීක්ෂණයත් හා පුහුණු

වැඩසටහන් මඟින් ගොවි ජනතාවට අවශ්‍ය සහය නිරතුරුව ලබා දීමටත් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හැමවිටම කටයුතු කරයි. එමෙන්ම පෞද්ගලික, රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සහය ලබා ගනිමින් උතුරු මැද පළාතේ ගොවි ජනතාවගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනභිභවනීය සේවයක් අද මෙන්ම හෙටත් සිදු කරනු ලබයි. ඒ අනුව ඉහත කාර්යයන් පහසු කිරීම සඳහා උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පහත ආකාරයට උප කාර්යාල වලට බෙදා වෙන්කර ඇත.

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|---|
| පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 01 | - |
| නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම (ව්‍යාපෘති) කාර්යාලය | 01 | - |
| සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - මහඉලුප්පල්ලම | 01 | - |
| සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කලාප) කාර්යාල | 04 | 01 |
| කෘෂිකර්ම උපදේශක කාර්යාල | 32 | 05 |
| පළාත්බද පර්යේෂණ ආයතනය | 01 | - |
| පාංශු පරීක්ෂණාගාරය | 01 | - |

මූලාශ්‍රය:-පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## දැක්ම

“තෘප්තිමත් හා සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් සහිත සමෘද්ධිමත් පළාතක් බිහි කිරීම”.

## මෙහෙවර

“නව යෝග්‍ය කෘෂිකාර්මික තාක්ෂණය හා කෘෂිකාර්මික යටිතල පහසුකම් භාවිතයෙන් ආහාර සුරක්ෂිතතාව හා පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය, වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර සියළුම පාර්ශවකරුවන්ගේ මනා සහයෝගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම”.

## දිගුකාලීන අරමුණු

- ❖ වී, අතිරේක බෝග, අල බෝග, එළවළු හා වෙනත් ආහාර බෝග සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්ති හා පළාත් කෘෂිකර්ම අවශ්‍යතාවයන් හා ප්‍රමුඛතාවයන් මත පිහිටා විශිෂ්ට පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් ඉහළ කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් සාක්ෂාත් කර ගැනීම.
- ❖ පළාත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් තුළින් ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම, දිළිඳුකම පිටු දැකීම හා ජාතික ආහාර සුරක්ෂිතතාව හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය මගින් ගුණාත්මක හා ආරක්ෂාකාරී ආහාර නිෂ්පාදනය, පරිසර හිතකාමී කෘෂිකර්මාන්තයක් ළඟාකර ගැනීම.
- ❖ ජලය හා පස සංරක්ෂණය කර ගනිමින්, වෙනස් වන සමාජ, ආර්ථික හා කාලගුණික ප්‍රවණතාවයකට අනුකූලවන සේ සැකසු වැඩසටහන් තුළින් තිරසාර කෘෂිකාර්මික ක්‍රමෝපායන් ළඟාකර ගැනීම.
- ❖ උසස් ගුණත්වයෙන් යුතු බීජ හා රෝපණ ද්‍රව්‍ය පළාත තුළ සුලභ කිරීම.
- ❖ දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගත් කෘෂිකර්මාන්තයට අවශ්‍ය සංවර්ධන වැඩසටහන් දියත් කිරීම තුළින් පළාතේ ගොවි ජනතාවගේ කෘෂි ව්‍යවසාය හැකියාවන් වර්ධනය කිරීම තුළින් තෘප්තිමත් ගොවි ජනතාවක් බිහි කිරීම.

## කෙටිකාලීන අරමුණු

| |
|---|
| ❖ නව හා යෝග්‍ය කෘෂි තාක්ෂණය උතුරු මැද පළාත තුළ ප්‍රචලිත කිරිම |
| ❖ ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය |
| ❖ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරිම. |
| ❖ පරිසර හිතකාමි කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය. |
| ❖ වාණිජ කෘෂිකර්මාන්තය හා කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධනය. |
| ❖ කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය. |

## ප්‍රධාන කාර්යයන්

- ✓ යහපත් ව්‍යාප්ති සේවාවක් සැපයීම සඳහා ගොවිජනතාවට නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් ඔවුන්ගේ දැනුම, ආකල්ප, කුසලතාවයන් වර්ධනය කිරිම.
- ✓ ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා සුලභතාවය ඇති කිරිම.
- ✓ පැළෑටි සංරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත, පළිබෝධනාශක පාලන පනත, බීජ පනත වැනි පනත් ක්‍රියාත්මක කිරිම.
- ✓ මහඉළුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් ක්ෂේත්‍ර පුහුණු හා ප්‍රායෝගික සේවාස්ථ පුහුණු ගොවීන් හා නිලධාරීන් වෙත ලබා දීම.
- ✓ පළාත තුළ පරිසර හිතකාමී යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රමවේදයන් ප්‍රචලිත කිරිම.
- ✓ රටේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරිම මගින් ආහාර ද්‍රව්‍ය ආනයනය අඩු කිරිම.
- ✓ පළාත තුළ කෘෂිකර්මය මත පදනම් වූ කර්මාන්ත හා ව්‍යවසායකයින් හඳුනාගෙන වැඩි දියුණු කිරිම.
- ✓ ගොවීන්ගේ කෘෂි තාක්ෂණික ගැටළු හඳුනාගෙන පර්යේෂණ ආයතනයන් වෙත යොමු කිරිම.
- ✓ කෘෂිකර්මයට අදාල දත්ත හා තොරතුරු ජාලයක් හා තොරතුරු කේන්ද්‍රයක් පවත්වා ගැනීම තුළින් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව සහ වෙනත් රාජ්‍ය ආයතනයන් මෙන්ම තොරතුරු දැන ගැනිමේ අදාල අය වෙත තොරතුරු ලබා දීම.
- ✓ කෘෂිකර්ම අමාත්‍යාංශය හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම

## ප්‍රධාන උපාය මාර්ගයන්

01.වී සහ අතිරේක බෝග සඳහා නව තාක්ෂණය හඳුන්වා දීමට බෝග ආදර්ශණ සහ ක්‍රම, ආදර්ශන ක්‍රියාත්මක කිරිම.

02.පරිසර හිතකාමී කෘෂිකර්මය සඳහා ඒකාබද්ධ පාලන ක්‍රම හා යහපත් කෘෂි පිළිවෙත් අනුගමනය කරන වැඩසටහන් කිරිම.

03.අස්වනු වැඩි කිරිම සඳහා බෝගවලට ඒකාබද්ධ පැළෑටි පෝෂණ ආදර්ශණ ක්‍රියාත්මක කිරිම හා වී සඳහා පැරිෂුට් තාක්ෂණය හඳුන්වා දීම වැනි නව උචිත තාක්ෂණයන් හඳුන්වා දිම.

04.වී සහ අතිරේක බෝගවල ගුණාත්මක බීජ සුලභ කිරිම සඳහා බීජ නිෂ්පාදන යාය පිහිටුවීම හා බීජ පනත ක්‍රියාත්මක කිරිම.

05.කෘෂි නිෂ්පාදන ක්‍රමවත්ව අලෙවි කිරීම සඳහා වැඩසටහන් සැකසිම

06.නව කෘෂි ව්‍යවසායකයින් බිහි කිරිම සඳහා ගොවි කාන්තා හා තරුණ ගොවි සමාජ පිහිටු විම හා කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

07.පාංශු සංරක්ෂණය දිරිමත් කිරිම සඳහා පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරිම.

08.පළිබෝධ පාලන නියාමනය සඳහා පළිබෝධ පාලන පනත ක්‍රියාත්මක කිරිම.

09.කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ යාන්ත්‍රීකරණය හඳුන්වා දිම තුළින් ඵලදායිතාව ඉහළ නැංවිම.

## කාර්යය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 382ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 273 කි. පුරප්පාඩු සංඛ්‍යාව 109 ක් වේ.

## මූලධන වියදම්

| වියදම් ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1.ගොඩනැගිලි සහ ඉදි කිරීම්. | 5.0 | 4.31 | 0.69 | 86 |
| 2.යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 1.0 | - | 1.0 | 0 |
| 3.වාහන | 1.5 | 0.82 | 0.68 | 54 |
| 4.වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 2.4 | 2.39 | 0.01 | 99 |
| 5.නිම නොකළ ඉදි කිරීම් | 104.6 | 99.42 | 5.18 | 95 |
| එකතුව | 114.5 | 106.94 | 7.56 | 93 |

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ

1. සෞභාග්‍ය දැක්ම අනුව වියළි මිරිස්, බඩ ඉරිගු, සෝයා, මුං, හා කව්පි ලොකු ළූණු හා අල වැනි බෝග නිෂ්පාදනය කිරිම සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරිම. එමගින් උක්ත භාණ්ඩ ආනයනය කිරිමට වැයවන ඩො. මි. 500 කට අධික විදේශ විනිමය අප රටේ ගොවීන්ගේ ආදායම බවට පත්කිරිම.
2. නවීන තාක්ෂණ දැනුම, වගා ක්‍රම වේද පිළිබඳ දැනුම සෑම ගොවියෙකුටම ලබාදීමට පියවර ගැනීම.
3. කුඩා භූමි ප්‍රෙද්ශයක අඩු නිෂ්පාදන පිරිවැයක් ,උසස් තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් වැඩි ගුණාත්මකතාවයකින් යුත් ඉහළ අස්වැන්නක් ලබාගැනීමට හැකි ක්‍රමවේද හඳුන්වාදීම.
4. ජලය ළමනාකරණය සඳහා බිංදු ජල සම්පාදන පද්ධති වැනි නවීන ක්‍රම හඳුන්වාදීම.
5. ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය.
6. පටක රෝපණ හා බද්ධ කිරීමේ ක්‍රමවේදයන් මගින් ඉහළ ප්‍රවේණික ලක්ෂණයන්ගෙන් යුත් වැඩි ඵලදාවක් සහිත රෝපණ ද්‍රව්‍යය මහා පරිමාණයෙන් නිෂ්පාදනය කිරීම.

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

| ශක්තීන් | දුර්වලතා |
| --- | --- |
| • පළාත තුළ පුළුල්ව ව්‍යාප්ත වූ වාරි පද්ධතියක් පැවතීම.<br>• වී හා අතිරේක බෝග සඳහා සුදුසු දේශගුණික තත්වයන් පැවතීම.<br>• මහඉලුප්පල්ලම පර්යේෂණායතනය හා අනෙකුත් සහය කෘෂිකර්ම ආයතන පැවතීම. | • කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා සුදුසු වෙළෙඳපළ ජාලයක් නොමැතිවීම හා අතරමැදියන් බහුල වීම.<br>• කෘෂිකාර්මික කටයුතු සඳහා නව තාක්ෂණ ක්‍රම භාවිතය අඩු වීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| • රසායනික පොහොර හා කෘෂි රසායන හිඟය නිසා ඇති වූ නිෂ්පාදකතාව පහළ යාම මත කෘෂි නිෂ්පාදන සඳහා වූ ඉල්ලුම ඉහල යාම.<br>• කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වැඩි පිරිසක් නැඹුරු වීම.<br>• පෞද්ගලික අංශය, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මඟින් කෘෂිකාර්මික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>• කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය ඉඩම් පළාත තුළ බහුල වීම. | • රසායනික පොහොර තහනම් කිරීම නිසා පොහොර හිඟවීම හා මිල ඉහළ යාම.<br>• කොවිඩ් 19 වසංගතය නිසා රට මාස කිහිපයක් lockdown තත්වයේ පැවතීම.<br>• කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාවය අඩු වීම හා පාංශු ඛාදනය ඉහළ යාම.<br>• වර්තමානයේ ආර්ථික අර්බුධය හේතුවෙන් ගොවීන් තුළ ප්‍රාග්ධන යෙදවුම් අඩු විම.<br>• කෘෂිකාර්මික යෙදවුම්වල මිල ඉහළ යාම.<br>• වන අලි හා වෙනත් වන සතුන්ගේ හානි ඉහළ යාම. |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

සංරචකය 01: නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාවය වැඩිදියුණු කිරීම

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | පාදම 2015 | ඉලක්කය 2021 |
|---|---|---|---|---|
| 01 | (i) ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය | (i) නිෂ්පාදය කරන ලද ගුණාත්මක බිත්තර වී ප්‍රමාණය (බුසල්) | 28,000 | 37,000 |
| | | (ii) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක කව්පි බීජ ප්‍රමාණය (Kg) | 42,000 | 50,750 |
| | | (iii) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක උඳු බීජ ප්‍රමාණය (Kg) | 25,000 | 43,750 |
| | | (iv) ෂ්පාදනය කරනු ලබන ගුණාත්මක මුං බීජ ප්‍රමාණය (Kg) | 20,000 | 28,000 |
| | | (v) ෂ්පාදනය කරනු ලබන ගුණාත්මක ලොකු ළූණු බීජ ප්‍රමාණය (Kg) | 800 | 900 |
| | (ii) නව තාක්ෂණය හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම | (i) වී වගාවේ ඵලදායිතා යාය වැඩසටහනේ අක්කර 01 සඳහා ලබාගන්නා ලද සාමාන්‍ය අස්වැන්න (අක්කරයට බුසල්) | 120 | 135 |
| | (iii) බෝග විවිධාංගීකරණය හා බෝග කලාපීයකරණය | (i) ලොකු ළූණු වගාවේ වැඩි අස්වනු තාක්ෂණ පැකේජය මගින් අක්කරයකට අපේක්ෂා කරන අස්වැන්න (Mt) | 10 | 12 |
| | | (ii) නිෂ්පාදනය කරන ලද කව්පි ප්‍රමාණය (Kg) | 35,000 | 40,000 |
| | | (iii) නිෂ්පාදනය කරන ලද උඳු ප්‍රමාණය (Kg) | 16,000 | 18,000 |
| | | (iv) නිෂ්පාදනය කරන ලද කුරක්කන් ප්‍රමාණය (Kg) | 32,000 | 42,000 |
| | | (v) නිෂ්පාදනය කරන ලද රටකජු ප්‍රමාණය (Kg) | 26,000 | 32,000 |
| | | (vi) නිෂ්පාදනය කරන ලද මුං ප්‍රමාණය (Kg) | 10,000 | 12,000 |
| | | (vii) පිහිටුවන ලද පැෂන් වගාව (අක්කර) | - | 20 |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය. | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01 | (i) ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය | (i) නිෂ්පාදය කරන ලද ගුණාත්මක බිත්තර වී ප්‍රමාණය (බුසල්) | 37,000 | 32,000 |
| | | (ii) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක කව්පි බීජ ප්‍රමාණය (Kg) | 50,750 | 49,910 |
| | | (iii) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක උඳු බීජ ප්‍රමාණය (Kg) | 43,750 | 23,400 |
| | | (iv) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක මුං බීජ ප්‍රමාණය (Kg) | 28,000 | 25,900 |
| | | (v) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක ලොකු ළූණු බීජ ප්‍රමාණය (Kg) | 900 | 850 |
| | (ii) නව තාක්ෂණය හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම | (i) වී වගාවේ ඵලදායිතා යාය වැඩසටහනේ අක්කර 01 සඳහා ලබාගන්නා ලද සාමාන්‍ය අස්වැන්න (අක්කරයට බුසල්) | 135 | 100 |
| | (iii) බෝග විවිධාංගීකරණය හා බෝග කලාපීයකරණය | (i) ලොකු ළූණු වගාවේ වැඩි අස්වනු තාක්ෂණ පැකේජය මගින් අක්කරයකට අපේක්ෂා කරන අස්වැන්න (Mt) | 12 | 10 |
| | | (ii) නිෂ්පාදනය කරන ලද කව්පි ප්‍රමාණය (Kg) | 40,000 | 36,000 |
| | | (iii) නිෂ්පාදනය කරන ලද උඳු ප්‍රමාණය (Kg) | 18,000 | 19,000 |
| | | (iv) නිෂ්පාදනය කරන ලද කුරක්කන් ප්‍රමාණය (Kg) | 42,000 | 41,400 |
| | | (v) නිෂ්පාදනය කරන ලද රටකජු ප්‍රමාණය (Kg) | 32,000 | 24,000 |
| | | (vi) නිෂ්පාදනය කරන ලද මුං ප්‍රමාණය (Kg) | 12,000 | 10,400 |
| | | (vii) පිහිටුවන ලද පැෂන් වගාව (අක්කර) | 20 | 20 |

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අ. අං | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්කය | ළඟාවීම | | | |
| 01 | (i) නිෂ්පාදය කරන ලද ගුණාත්මක බිත්තර වී ප්‍රමාණය (බුසල්) | 37,000 | 32,000 | (i) අක්කර 01 බිත්තර වී නිෂ්පාදන ගොවිපොල පිහිටුවීම | 1.2 | 555 |
| | | | | (ii) ස්වයං බිත්තර වී වගාව සඳහා බීජ පැකට් ලබාදීම | 0.6 | 1,479 |
| | (ii) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක කව්පි බීජ ප්‍රමාණය (Kg) | 50,750 | 49,910 | (i) කව්පි අක්කර 1/2 බීජ නිෂ්පාදන ඒකක පිහිටුවීම | 0.061 | 40 |
| | | | | (ii) කව්පි ස්වයං බීජ 1 Kg පැකට් නොමිලේ ලබා දීම | 0.264 | 436 |
| | (iii) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක උඳු බීජ ප්‍රමාණය (Kg) | 43,750 | 23,400 | (i) උඳු අක්කර 1/2 බීජ නිෂ්පාදන ඒකක පිහිටුවීම | 0.096 | 40 |
| | | | | (ii) උඳු ස්වයං බීජ 1 Kg පැකට් නොමිලේ ලබා දීම | 0.372 | 398 |
| | (iv) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක මුං බීජ ප්‍රමාණය (Kg) | 28,000 | 25,900 | (i) මුං ස්වයං බීජ 1 Kg පැකට් නොමිලේ ලබා දීම | 0.24 | 346 |
| | (v) නිෂ්පාදනය කරනු ලබන ගුණාත්මක ලොකු ළූණු බීජ ප්‍රමාණය (Kg) | 900 | 850 | (i) 50% ගොවි දායකත්වය යටතේ ලොකු ළූණු මව් බල්බ හා පොලිතීන් ලබාදීම | | 301 |
| | (vi) වී වගාවේ ඵලාදායිතා යාය වැඩසටහනේ අක්කර 01 සඳහා ලබාගන්නා ලද සාමාන්‍ය අස්වැන්න (අක්කරයට බුසල්) | 135 | 100 | (i) අක්කර 10 වී වගා ඵලදායිතාව නැංවීමේ යාය වැඩසටහන | 1.17 | 108 |
| | (vii) ලොකු ළූණු වගාවේ වැඩි අස්වනු තාක්ෂණ පැකේජය මඟින් අක්කරයකට අපේක්ෂා කරන අස්වැන්න (Mt) | 12 | 10 | (i) ලොකු ළූණු වගාවේ තාක්ෂණ පැකේජය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අක්කර 1/2 කට රු.5,000.00 ක දීමනාවක් ගෙවීම | 2.02 | 200 |
| | (viii) නිෂ්පාදනය කරන ලද කව්පි ප්‍රමාණය | 40,000 | 36,000 | (i) කව්පි අස්වනු වැඩි කිරීමේ යාය පිහිටුවීම | 0.42 | 215 |
| | (ix) නිෂ්පාදනය කරන ලද උඳු ප්‍රමාණය | 18,000 | 19,000 | (i) උඳු අස්වනු වැඩි කිරීමේ යාය පිහිටුවීම | 0.23147 | 94 |
| | (x) නිෂ්පාදනය කරන ලද කුරක්කන් ප්‍රමාණය | 42,000 | 41,400 | (i) කුරක්කන් අස්වනු වැඩි කිරීමේ යාය පිහිටුවීම | 0.12194 | 207 |
| | (xi) නිෂ්පාදනය කරන ලද රටකජු ප්‍රමාණය | 32,000 | 24,000 | (i) රටකජු අස්වනු වැඩි කිරීමේ යාය පිහිටුවීම | 0.312 | 88 |
| | (xii) නිෂ්පාදනය කරන ලද මුං ප්‍රමාණය | 12,000 | 10,400 | (i) මුං අස්වනු වැඩි කිරීමේ යාය පිහිටුවීම | 0.1215 | 50 |
| | (xiii) පිහිටුවන ලද පැෂන් වගාව (අක්කර) | 20 | 20 | (i) අක්කර 1/4 පැෂන් වගා ආදර්ශන පිහිටුවීම | 0.398464 | 12 |

කව්පි වගාව - ස්වයං බීජ නිෂ්පාදනය

රටකජු ස්වයං බීජ නිෂ්පාදනය






කුරක්කන් ස්වයං බීජ නිෂ්පාදනය

ලොකු ළූණු ස්වයං බීජ නිෂ්පාදනය






සෞභාග්‍යා කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන

බිත්තර වී නිෂ්පාදනය






ඵලදායිතා ප්‍රවර්ධන යාය - වී වගාව

ඉපනැල්ලේ මුං වගාව






## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කල ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධක දර්ශක | 2021 ඉලක්කය | 2021 ප්‍රගතිය | ප්‍රගතියට ලඟා නොවීමට හේතු |
|---|---|---|---|---|---|
| 01 | ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම | 1.නිෂ්පාදනය කරන ලද ගුණාත්මක බිත්තර වී ප්‍රමාණය (බුසල්) | 60,000 | 32,000 | 2021 වර්ෂය සඳහා ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් |
| | | 2.නිෂ්පාදනය කරන ලද ගුණාත්මක අතිරේක ආහාර බෝග බීජ ප්‍රමාණය (Kg) | 150,000 | 100,060 | |
| | | 3.රජයේ පැළ තවාන මඟින් නිෂ්පාදනය කරන ලද ගුණාත්මක පළතුරු පැළ ප්‍රමාණය | 300,000 | 77,000.00 | |
| 02 | නව තාක්ෂණය හඳුන්වා දීම හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම | 1.GAP යටතේ ලියාපදිංචි වී ඇති ගොවිපල් ප්‍රමාණය | 250 | 240 | |
| 03 | බෝග විවිධාංගීකරණය හා බෝග කලාපීකරණය | 1.වගා කරන ලද අතිරේක ආහාර බෝග ප්‍රමාණය(හෙක්) | 1000 | 300 | |
| | | 2.සංවර්ධනය කරන ලද ගෙවතු සංඛ්‍යාව (සපිරි ගෙවත්තක්) | 100 | 400 | |
| 04 | පාංශු හා ජල සංරක්ෂණය | 1.පාංශු හා ජල සංරක්ෂණය කරන ලද භූමි ප්‍රමාණය (ha) | 500 | 200 | |

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| 1.නිෂ්පාදනය කරන ලද ගුණාත්මක බිත්තර වී ප්‍රමාණය (බුසල්) | ✓ | | |
| 2. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක කව්පි බීජ ප්‍රමාණය (Kg) | ✓ | | |
| 3. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක උඳු බීජ ප්‍රමාණය (Kg) | | | ✓ |
| 4. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක මුං බීජ ප්‍රමාණය (Kg) | | ✓ | |
| 5. නිෂ්පාදනය කරන ලද ගුණාත්මක ලොකු ළූණු බීජ ප්‍රමාණය (Kg) | ✓ | | |
| 6. නිෂ්පාදනය කරන ලද අතිරේක බෝග ප්‍රමාණය (Kg) | | | |
| කව්පි | ✓ | | |
| උඳු | ✓ | | |
| කුරක්කන් | ✓ | | |
| රටකජු | | ✓ | |
| මුං | | ✓ | |
| 7.වී වගාවේ ඵලදායි යාය වැඩසටහනේ අක්කර 01 සඳහා ලබා ගන්නා ලද සාමාන්‍ය අස්වැන්න | ✓ | | |

ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය සඳහා රුපියල් මිලියන 1.8 මුදලක් වෙන්වූ අතර ඉලක්ක කල අක්කර 450 න් (37 000 Kg) අක්කර 396 ක් (32 000 Kg) ප්‍රගතිය ලෙස ලබාගත හැකි විය.

ගුණාත්මක අතිරේක බෝග බීජ නිෂ්පාදනය සඳහා රුපියල් මිලියන 4.0 වෙන්වී තිබූ අතර කව්පි බීජ නිෂ්පාදනය සඳහා අක්කර 145 (50 750 Kg) ඉලක්ක කර ප්‍රගතිය ලෙස අක්කර 142 (49 910 Kg) ද උඳු බීජ නිෂ්පාදනය සඳහා අක්කර 125 (43 750 Kg) ඉලක්ක කර ප්‍රගතිය ලෙස අක්කර 117 වගා කලද අස්වැන්න ලෙස ලබාගත හැකිවූයේ 23 400 Kg ක් පමණි. එය අපේක්ෂිත අස්වැන්නෙන් 53% කි. එයට හේතු වශයෙන් යල කන්නයේ උඳු බෝගය සඳහා වෛරස් ආසාදනය වීමත් වෛරස් රෝග වාහකයන් පාලනයට අවශ්‍ය කෘෂි රසායන නොමැති වීමත් පෙන්වා දිය හැක. තවද මුං බීජ නිෂ්පාදනය සඳහා අක්කර 80 (28 000 Kg) ඉලක්ක කර තිබූ අතර ප්‍රගතිය ලෙස අක්කර 74 (25 900 Kg) ලබාගන්නා ලදි. ගුණාත්මක ලොකුළූණු බීජ නිෂ්පාදනය සඳහා මව් බල්බ 9000.00 Kg 50% ගොවි දායකත්වය මත පළාත් නිෂ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ලබාදීමට ඉලක්ක කර තිබූ අතර එමගින් ලොකුළූණු සත්‍ය බීජ 850.00 Kg නිෂ්පාදනය කරන ලදි.

බීජ නිෂ්පාදනයට අමතරව අතිරේක බෝග වැඩි අස්වනු යාය වැඩසටහන සඳහා රුපියල් මිලියන 1.7 ක් වෙන්ව තිබූ අතර කව්පි අක්කර 100 (40 000 Kg) ඉලක්ක කර අක්කර 90 (36 000 Kg ) ක්ද උඳු අක්කර 45 (18 000 Kg )ක් ඉලක් කලද ප්‍රගතිය ලෙස අක්කර 50 (19 000 Kg) ලබාගන්නා ලදි. මෙහිදි රසායනික පොහොර හා කෘෂි රසායන හිඟතාව මත බඩ ඉරිඟු වගා වපසරිය අඩුවීම මත උඳු වගා වපසරිය වැඩිවී ඇත. කුරක්කන් අක්කර 140 (42 000 Kg) ඉලක්ක කර අක්කර 138 (41 400 Kg) ක ප්‍රගතියක් ලබා ඇත. රටකජු අක්කර 40 (32 000) ඉලක්ක කර අක්කර 30ක(24 000) ක් ද, මුං

වගාව අක්කර 30 (12000 Kg) ඉලක්ක කර අක්කර 26 (10 400 Kg)ක ප්‍රගතියක් ලගාකරගැනීමට හැකි වී ඇත. නව තාක්ෂණය හඳුන්වා දීම  යන වැඩසටහන යටතේ වී වගාවේ ඵලදායි යාය වැඩසටහන සඳහා රු. මි.1ක් වෙන් කර තිබූ අතර ඒ යටතේ අක්කර 80ක වගාවක් පිහිටුවන ලදී. ඒ මගින් අක්කරයක් සඳහා ලබාගන්නා සාමාන්‍ය අස්වැන්න අක්කරයට බුසල් 135 ඉලක්ක කර අතර ප්‍රගතිය ලෙස අක්කරයට බුසල් 100ක් ලබාගන්නා ලදි.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලගාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය % | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0-49 | 50-74 | 75-100 |
| 2.1 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් ළදරුවන්ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවධානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී,පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකිවීම තහවුරු කිරීම. | 2.1 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන්ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකිවීම තහවුරු කිරීම. | අක්කර 01 බිත්තර වී ගොවිපල් පිහිටුවීම | බිත්තර වී ගොවිපල් පිහිටු වීම අක්කර 348 | | | √ |
| | | ස්වයං බිත්තර වී නිෂ්පාදනය | ස්වයං බිත්තර වී නිෂ්පාදනය සඳහා 2 Kg පැකට් 1479 ක් ලබා දීම. | | | √ |
| | | අතිරේක ආහාර බෝග ස්වයං බීජ නිෂ්පාදනය | කව්පි 1Kg පැකට් 436 ක් ලබාදීම | | | √ |
| | | | උඳු 01 Kg පැකට් 398 ක් ලබාදීම | | | √ |
| | | | මුං 01 Kg පැකට් 346 ක් ලබාදීම | | | √ |
| | | | කුරක්කං 01 Kg පැකට් 397 ක් ලබාදීම | | | √ |
| | | | රටකජු 05 Kg පැකට් 198 ක් ලබාදීම | | | √ |
| | | | තල 250 g පැකට් 93 ක් ලබාදීම | | | √ |
| | | අතිරේක ආහාර බෝග අක්කර 1/2 බීජ නිෂ්පාදන ඒකක පිහිටුවීම | උඳු අක්කර 77 | | | √ |
| | | | කව්පි අක්කර 99 | | | √ |
| | | | මුං අක්කර 39 | | | √ |
| | | ලොකු ළූණු සත්‍ය බීජ නිෂ්පාදන වැඩසටහන | ලොකු ළූණු මව් බල්බ 9,000 Kg හා පොලිතින් 1,900 Kg ලබාදීම | | | √ |
| | | අතිරේක ආහාර බෝග අස්වනු වැඩිකිරීමේ යාය | කවුපි අක්. 90 පිහිටුවීම | | | √ |
| | | | උඳු අක්. 50 පිහිටුවීම | | | √ |
| | | | කුරක්කන් අක්. 138 පිහිටුවීම | | | √ |
| | | | රටකජු අක්. 30 පිහිටුවීම | | | √ |
| | | | මිරිස් අක්. 111 පිහිටුවීම | | | √ |
| | | | මුං අක්. 26 පිහිටුවීම | | | √ |
| | | | ලොකු ළූණු වැඩි අස්වනු තාක්ෂණ පැකේජය ක්‍රියාත්මක කිරීම - අක්. 200 | | | √ |
| | | වී වගාවේ ඵලදායිතාවය නැංවීම සඳහා තාක්ෂණ පැකේජය ක්‍රියාත්මක කිරීම | අක්කර 80 | | | √ |
| | | පලතුරු උයන් පිහිටුවීමේ වැඩසටහන | පැෂන් වගාවේ අක්කර 1/4 ආදර්ශන 12 ක් පිහිටුවීම | | | √ |

## විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය

| ව්‍යාපෘතිය | සංරචකය | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අදාල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය | ප්‍රතිලාභින් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|---|---|
| දේශගුණ සුහුරු කෘෂි වාරි ව්‍යාපෘතිය CSAIP | 1.නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාවය වැඩිදියුණු කිරිම (ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය) .ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය, නව තාක්ෂණය හා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් හඳුන්වාදීම, බෝග විවිධාංගීකරණය) | කාබනික පොහොර නිෂ්පාදනය | හොරොව්පොතාන<br>කහටගස්දිගිලිය<br>ගලෙන්බිඳුනුවැව<br>මහවිලච්චිය<br>නොච්චියාගම<br><br>හිගුරක්ගොඩ | 4935 | 80.00 mn |
| | | ඒකාබද්ද පළිබෝධ පාලන වැඩසටහන | හොරොව්පොතාන<br>කහටගස්දිගිලිය<br>ගලෙන්බිඳුනුවැව<br>මහවිලච්චිය<br>නොච්චියාගම<br>හිගුරක්ගොඩ | 139 | 2.00 mn |
| | 2.අලවිකරණය හා තාක්ෂණ සංවර්ධනය | බී ඇණු සත්‍ය බීජ නිෂ්පාදනය | හොරොව්පොතාන<br>කහටගස්දිගිලිය<br>ගලෙන්බිඳුනුවැව<br>හිගුරක්ගොඩ | 200 | 30.00 |
| | 3.කෘෂිකර්මාන්ත ප්‍රවර්ධනය | රටකජු පොකුරු ගම්මාන | හොරොව්පොතාන | 150 | 5.00 |

වී වගා පැරෂුට් ආදර්ශනය





වී වගාවේ නිෂ්පාදකතාව ඉහළ දැමීම





කොම්පෝස්ට් නිෂ්පාදනය




## ඵලවළු වගාවේ ඒකාබද්ධ පළිබෝධ පාලනය





## පාංශු සංරක්ෂණ වැටි දැමීම





## බී ළූණු සත්‍ය බීජ නිෂ්පාදනය





## රේඛිය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අං. | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසු වන අරමුණු | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටි කාලීන/දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කල (රු.මි.) | වැය කල (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) | |
| සෞභාග්‍යා කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන | | | | | | | |
| 01 | බඩ ඉරිඟු වගාව | බඩ ඉරිඟු වගාවේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම | 42.368 | 30.19186 | 100 | 71.2 | අස්වැන්න වැඩි වීම පාංශු සංරක්ෂණය |
| 02 | මුං වගාව | මුං වගාවේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම | 8.845 | 6.7378925 | 70 | 76 | අවම යෙදවුම් වලින් අස්වැන්න හා අමතර ආදායමක් ලැබීම |
| 03. | උඳු වගාව | උඳු වගාවේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැවීම | 6.4219 | 5.655138 | 100 | 88 | උඳු නිෂ්පාදනය වැඩි වීම වගා කාර්යක්ෂමතාවය වැඩි වීම |
| 04. | මිරිස් වගාව | මිරිස් වගාවේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම | 119.272 | 4.325614 | 49 | 3.6 | මිරිස් නිෂ්පාදනය වැඩි වීම වියළි මිරිස් නිෂ්පාදනයට ගොවීන් පෙළඹීම |
| 05. | කුරක්කන් වගාව | කුරක්කන් වගාවේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම | 0.1702 | 0.168504 | 100 | 99 | කුරක්කන් නිෂ්පාදනය වැඩි වීම හා ස්වයං පෝෂිත වීම |
| 06. | කව්පි වගාව | කව්පි වගාවේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැංවීම | 1.281 | 0.649635 | 90 | 50.7 | කව්පි නිෂ්පාදනය වැඩි වීම |
| 07. | ලොකු ළූණු වගාව | ලොකු ළූණු නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම | 26.171 | 9.281649 | 75 | 35.4 | ලොකු ළූණු බීජ නිෂ්පාදනය සඳහා බීජ අවශ්‍යතාවය 100% ක් සපුරා ගත හැකි වීම |
| 08. | වී වගාව | වී වගාවේ නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීම | 5.56596 | 4.520083 | 100 | 81 | 20%කින් අස්වැන්න වැඩි වීම |

## කෘෂිකාර්මික අංශයේ

## සංවර්ධනය උදෙසා අනාගත අපේක්ෂාවන් 2020 – 2030

**අරමුණ : සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම**

| ඉලක්කය | පාදක වර්ෂය - 2015 | සංධිස්ථාන 01 - 2020 | සංධිස්ථාන 02 - 2025 | සංධිස්ථාන 03 - 2030 |
|---|---|---|---|---|
| 1. 2030 වන විට වී වගාවේ ඵලදයීතාවය 5.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 4. 0 mt/Ha | 4.2 mt/Ha | 4.5 mt/Ha | 5.0 mt/Ha |
| 2. 2030 වන විට මුං වගාවේ ඵලදයීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 0 mt/Ha | 1.2 mt/Ha | 1.6 mt/Ha | 2.0 mt/Ha |
| 3. මුං වගා වපසරිය 2000 Ha දක්වා ඉහළ නැංවීම | 507 Ha | 750 Ha | 1250 Ha | 2000 Ha |
| 4. උඳු වගාවේ ඵලදයීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 1 mt/Ha | 1.3 mt/Ha | 1.6 mt/Ha | 2.0 mt/Ha |
| 5. 2030 වන විට කව්පි වගාවේ ඵලදයීතාවය 1.5 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 0 mt/Ha | 1.1 mt/Ha | 1.3 mt/Ha | 1.5 mt/Ha |
| 6. 2030 වන විට කව්පි වගා වපසරිය 1500 Ha දක්වා ඉහළ නැංවීම | 542 Ha | 750 Ha | 1000 Ha | 1500 Ha |
| 7. 2030 වන විට සෝයා වගාවේ ඵලදයීතාවය 2.0 mt/Ha දක්වා ඉහළ නැංවීම | 1. 5 mt/Ha | 1.6 mt/Ha | 1.8 mt/Ha | 2.0 mt/Ha |
| 8. 2030 වන විට සෝයා වගා වපසරිය 1500 Ha දක්වා ඉහළ නැංවීම | 109.5 Ha | 500 Ha | 1000 Ha | 1500 Ha |
| 9. 2030 වන විට කුරක්කන් වගාවේ ඵලදයීතාවය 1.8 mt/Ha දක්වා ඉහළ නැංවීම | 0.8 mt/Ha | 1.0 mt/Ha | 1.4 mt/Ha | 1.8mt/Ha |
| 10. 2030 වන විට රටකජු වගා වපසරිය 1000 Ha දක්වා ඉහළ නැංවීම | 227 Ha | 400 Ha | 700 Ha | 1000 Ha |
| 11. 2030 වන විට ලොකු ළූණු වගාවේ ඵලදයීතාවය 25 mt/Ha දක්වා ඉහළ නැංවීම | 16 mt/Ha | 18 mt/Ha | 20 mt/Ha | 25 mt/Ha |
| 12. 2030 වන විට ලොකු ළූණු වගාව 1500 Ha දක්වා ඉහළ නැංවීම | 1061 Ha (231 Ha / 2017) | 1000 Ha | 1250 Ha | 1500 Ha |
| 13. 2030 වන විට ඵලවළු හා පළතුරු වල පසු අස්වනු හානිය 30% දක්වා පහළ දැමීම | 40% | 38% | 35% | 30% |
| 14. 2030 වන විට 1000 Ha අඹ වගාවන් අවාරයේ ඵල උත්තේජනයට යොමු කිරීම | 10 Ha | 200 Ha | 500 Ha | 1000 Ha |
| 15. 2030 වන විට ඵල දරණ අඹ වගාවන්හි ඵලදායීතාවය නැංවීම සඳහා ගස් කප්පාදුව100% කිරීම | 10% | 30% | 60% | 100% |

| ඉලක්කය | පාදක වර්ෂය - 2015 | සංධිස්ථාන 01 - 2020 | සංධිස්ථාන 02 - 2025 | සංධිස්ථාන 03 - 2030 |
|---|---|---|---|---|
| 16. සෞඛ්‍ය ආරක්ෂිත කෘෂි නිෂ්පාදන සුලභ කිරීම සඳහා කෘෂිරසායන භාවිතය අවම කරමින් යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරමින් වගාකරන වගා වපසරිය 2030 වන විට 1200 Ha දක්වා ඉහළ නැංවීම | 20 Ha | 200 Ha | 700 Ha | 1200 Ha |
| 17. කාලගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා භූගත ජලමට්ටම ඉහළ නැංවීමට හා මතුපිට පස ආරක්ෂාකර ගැනීම සඳහා පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කරන වගා ඉඩම් ප්‍රමාණය 2030 වන විට 6000 Ha දක්වා ඉහළ නැංවීම | 60 Ha | 2000 Ha | 4000 Ha | 6000Ha |
| 18. උතුරු මැද පළාත තුළ පාරිභෝජනය සඳහා ගුණාත්මක හා සෞඛ්‍ය ආරක්ෂක ආහාර සුලබ කිරීම සඳහා දේශීය ආහාර අලෙවිසැල් හා GAP අලෙවිසැල් 40 ක් 2030 වනවිට ස්ථාපනය කිරීම | 0 | 20 | 30 | 40 |
| 19. පවුලේ පෝෂණය හා ආර්ථිකය ඉහළ නැංවීම සඳහා 2030 වන විට ගෙවතු ඒකක 25000 ක් තිරසාර ඒකකයක් ලෙස සංවර්ධනය කිරීම | - | 6000 | 16000 | 25000 |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

කොවිඩ් 19 වසංගත ත්වය හේතුවෙන් රට මාස කිහිපයක් Lockdown තත්වයේ පැවති අතර රජයේ සේවකයන් විටින් විට රාජකාරි සඳහා ගෙන්වීමද 50% දක්වා අඩුකරන ලදි. තවද වරින්වර නිළධාරින් කොරෝනා රෝගයට ගොදුරු වීම හා නිරෝධායනය වීමද සිදුවිය.

මෙය ආයතනයේ අරමුණු සඳහා ලගාවීමට බලපෑම් ඇතිකල අතර මෙය අවම කිරීම සඳහා නිවසේ සිට රාජකාරි කටයුතු සිදුකිරීමට ඔවුනට භාරදීම, තාක්ෂණ ක්‍රම යොදාගනිමින් (Whats App, Zoom) ඔවුන් දැනුවත් කිරිම හා රාජකාරී ඉටුකරවාගැනීම සිදුකරන ලදි.

තවද ක්ෂේත්‍රයේ රාජකාරි සිදුකිරිමේදි ගොවීන් රැස්කරවා පුහුණු පැවැත්වීම ගැටළුකාරි විය. එබැවින් තනිව ගොවීන් හමුවීමටද , හැකිසෑම විටම දුරකථනයෙන් ගොවීන් දැනුවත් කිරිමද සිදුකරන ලදි.

## ආදායම් ඉපයීම

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 62102 | 4.00 | 4.61 | 115.25 |

# 7.2.පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත පශු සම්පත් අංශයෙන් සංවර්ධන කිරිමට පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යක් ඉටු කරනු ලබයි. සත්ත්ව පාලනයේ නියැලෙන ගොවීන්ට සේවය ලබා දිම පිණිස පශු වෛද්‍ය කාර්යාල 29 ක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටුවා ඇති අතර අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාලයක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කය සඳහා නියෝජ්‍ය පළාත් අධ්‍යක්ෂ කාර්යාලයක් පිහිටුවා ඇත. සත්ත්ව අභිජනනය, සත්ත්ව සෞඛ්‍ය හා සත්ත්ව පාලන ව්‍යාප්ති සේවාව පවත්වාගෙන යෑමේ ප්‍රධාන කාර්යයන් මෙම දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලැබේ. සත්ත්ව සෞඛ්‍ය සේවය යටතේ රෝග මර්දන කටයුතු හා ප්‍රතිකාර කටයුතු ඉටු කෙරේ.

කෘතිම සිංචන ප්‍රවර්ධනය ප්‍රධාන කොට සත්ත්ව අභිජනනය මගින් උසස් ආරයේ කිරි ගවයින් බෝ කර ගැනිම හා වැස්සි පැටවුන් රැක බලා ගැනිමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ. නිෂ්පාදනය හා ඵලදායිතාවය ඉහළ නැංවිම පිණිස සත්ත්ව පාලන ව්‍යාප්ති සේවා පවත්වා ගෙන යන අතර, කිරි ගොවිපල සංවර්ධනය, එළු ගොවිපල සංවර්ධනය, නිදැලි කුකුළු ව්‍යාපෘති, අගය එකතු කිරිම, ගොවි පුහුණු හා ධාරිතා සංවර්ධන කටයුතු සඳහා 2022 වර්ෂයේ මුලධන හා රේඛිය අමාත්‍යාංශ අයෝජන යෙදවිමට සැලසුම් කර ඇත.

**සත්ත්ව ගහනය හා ගොවිපල් පිළිබඳ තොරතුරු - අනුරාධපුර දිස්ත්‍රික්කය**
**2017 – 2020**

| වර්ගය | අනුරාධපුර දිස්ත්‍රික්කය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොවිපල් සංඛ්‍යාව | | | | සතුන් සංඛ්‍යාව | | | |
| | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| එළ ගව | 27,225 | 28,602 | 28,729 | 29,589 | 126,118 | 130,530 | 128,301 | 137,839 |
| මී ගව | 1,581 | 1,275 | 1,514 | 1,588 | 32,783 | 36,517 | 36,512 | 41,010 |
| එළු | 1,700 | 1,734 | 1,666 | 2,202 | 29,168 | 35,266 | 36,057 | 42,088 |
| සූකර | 253 | 288 | 267 | 321 | 11,351 | 11,377 | 11,089 | 13,516 |
| කුකුළු | 14,599 | 14,171 | 17,602 | 17,819 | 3,047,614 | 1,454,472 | 659,565 | 629,720 |
| **එකතුව** | **45,358** | **46,070** | **49,778** | **51,519** | **3,247,034** | **1,668,162** | **871,524** | **864,173** |

මුලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## සත්ත්ව ගහනය හා ගොවිපල් පිළිබඳ තොරතුරු - පොළොන්නරුව දිස්ත්‍රික්කය 2017 – 2020

| වර්ගය | පොළොන්නරුව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ගොවිපල් සංඛ්‍යාව | | | | සතුන් සංඛ්‍යාව | | | |
| | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| එළ ගව | 13,445 | 12,642 | 11,347 | 11,016 | 71,390 | 81,093 | 64,805 | 62,610 |
| මී ගව | 938 | 796 | 855 | 654 | 21,603 | 25,428 | 26,507 | 32,562 |
| එළු | 1,129 | 953 | 1,163 | 967 | 13,813 | 17,273 | 19,089 | 23,399 |
| සූකර | 90 | 90 | 143 | 135 | 4,931 | 5,016 | 3,866 | 2,597 |
| කුකුළු | 6,953 | 5,033 | 6,136 | 6,187 | 3,469,278 | 3,306,281 | 646,545 | 627,168 |
| **එකතුව** | **22,555** | **19,514** | **19,644** | **18,959** | **3,581,015** | **3,435,091** | **760,812** | **748,336** |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාතේ සත්ත්ව ගොවිපළ සංඛ්‍යාව 2017-2020

| වර්ගය | සත්ත්ව ගොවිපල සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 |
| එළ ගව | 40,670 | 41,244 | 40,076 | 40,605 |
| මී ගව | 2,519 | 2,071 | 2,369 | 2,242 |
| එළු | 2,829 | 2,687 | 2,829 | 3,169 |
| සූකර | 343 | 378 | 410 | 456 |
| කුකුළු | 21,552 | 19,204 | 23,738 | 24,006 |
| **එකතුව** | **69,930** | **67,602** | **69,422** | **70,478** |




මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාතේ සත්ත්ව සංඛ්‍යාව 2017-2020

| වර්ගය | සත්ත්ව සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 |
| එළ ගව | 197,508 | 211,623 | 193,106 | 200,449 |
| මී ගව | 54,386 | 61,945 | 63,019 | 73,572 |
| එළු | 42,981 | 52,539 | 55,146 | 65,487 |
| සූකර | 16,282 | 16,393 | 14,955 | 16,113 |
| කුකුළු | 6,516,892 | 4,760,753 | 1,306,110 | 1,256,888 |
| **එකතුව** | **6830066** | **5105271** | **1,632,336** | **1,612,509** |

මූලාශ්‍රය: පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව




## වාර්ෂික කිරි නිෂ්පාදනය 2017-2020

| දිස්ත්‍රික්කය | කිරි ලීටර් (මිලියන) | | | | සුළු පරිමාණ සැකසුම්කරුවන් | | | | අගය එකතු කළ කිරි ප්‍රමාණය (ලීටර් මිලියන) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| අනුරාධපුර | 34.6 | 34.18 | 32.93 | 40.13 | 80 | 128 | 101 | 86 | 1.9 | 2.44 | 2.48 | 2.19 |
| පො/නරුව | 14.6 | 9.96 | 12.14 | 13.51 | 20 | 39 | 39 | 28 | 1.6 | 1.96 | 1.09 | 1.05 |
| **එකතුව** | **49.2** | **44.14** | **45.07** | **53.64** | **100** | **167** | **140** | **114** | **3.5** | **4.4** | **3.57** | **3.24** |

මූලාශ්‍රය:- පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## මස් සහ බිත්තර නිෂ්පාදනය 2017 - 2020

| විස්තරය | අනුරාධපුර(මෙ.ටො) | | | | පොළොන්නරුව (මෙ.ටො) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2019 | 2020 | 2017 | 2018 | 2019 | 2020 |
| ගව මස් | 1486.44 | 1,796.35 | 1,798.45 | 1,311.72 | 333.00 | 334.00 | 131.69 | 271.53 |
| එළු මස් | 17.54 | 22.94 | 31.24 | 32.61 | 0.00 | 0.00 | 0 | 0 |
| ඌරු මස් | 199.26 | 76.40 | 98.86 | 130.37 | 0.00 | 0.00 | 19 | 25 |
| කුකුළු මස් | 4,241.81 | 1,302.30 | 2818.06 | 3,503.52 | 5,889.00 | 6,623.60 | 12,755.70 | 317.45 |
| **එකතුව** | **5,945.05** | **3,179.99** | **4,746.61** | **4,978.22** | **6,222.00** | **6,957.60** | **613.98** | **17,653.00** |
| බිත්තර (මිලියන) | 25.53 | 23.98 | 30.44 | 28.5 | 16.04 | 16.62 | 8.1 | 10.19 |

මූලාශ්‍රය:- පළාත් සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## පළාතේ පශු වෛද්‍ය කාර්යාලය (29) අනුරාධපුර දිස්ත්‍රික්කය (22) පොළොන්නරුව දිස්ත්‍රික්කය (07)

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

| | |
|---|---|
| නැගෙනහිර නුවරගම් පළාත | නාච්චාදූව |
| රඹෑව | තලාව |
| මැදවච්චිය | තඹුත්තේගම |
| කැබිතිගොල්ලෑව | නොච්චියාගම |
| පදවිය | රාජාංගනය |
| මිහින්තලේ | ඉපලෝගම |
| කහටගස්දිගිලිය | පලාගල |
| හොරොව්පොතාන | ගල්නෑව |
| තිරප්පනේ | මධ්‍යම නුවරගම් පළාත |
| කැකිරාව | විලච්චිය |
| ගලෙන්බිඳුණුවැව | පලුගස්වැව |

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

| | |
|---|---|
| පොළොන්නරුව | ලංකාපුර |
| මින්නේරිය | මැදිරිගිරිය |
| බකමූණ | වැලිකන්ද |
| අරංගල | |

## දැක්ම

" නිරෝගී හා ඵලදායී පශු සම්පතක්, ඉසුරුමත් ප්‍රජාවක් "

## මෙහෙවර

" පශු සම්පත්, සත්ත්ව නිෂ්පාදන හා එහි ඵලදායිතාවය, වෙළඳපොල සහ ඒ ආශ්‍රිත පරිසර ආරක්ෂාව සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම ".

## දිගු කාලීන අරමුණු

දේශීය කිරි නිෂ්පාදනයට උතුරු මැද පළාතේ 2016 වසරෙහි පැවති දායකත්වය වන 10% 2021 වසර වනවිට 20% දක්වා ඉහළ නැංවීම.

## කෙටි කාලීන අරමුණු

- ගොවිපළ සතුන්ගේ සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීම.- සතුන්ගේ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම.- සත්ත්ව පාලනය ප්‍රචලිත කිරීම.- සත්ව නිෂ්පාදන සඳහා වියදම අවම කිරීම.

## ප්‍රධාන කාර්යයන්



## ප්‍රධාන උපාය මාර්ගයන්

ප්‍රශස්ත සත්ත්ව සෞඛ්‍ය සේවාවක් ලබා දීම තුළින් සත්ත්ව සෞඛ්‍ය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීමත්, ආරය උසස් කිරීම මගින් නිෂ්පාදන ධාරිතා වර්ධනය කර ගැනීමත් සහ තාක්ෂණ ප්‍රචාරණය මගින් උචිත නිෂ්පාදන ක්‍රමවේද ප්‍රචලිත කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 339ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 247 කි. පුරප්පාඩු සංඛ්‍යාව 90 ක් වන අතර එක් අයෙකු අතිරික්ත වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය ( රු.මි.) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|
| 1.යන්ත්‍ර සූත්‍ර සවි කිරිම හා උපකරණ | 10.53 | 10.53 | 100 |
| 2.වාහන | 0.56 | 0.56 | 100 |
| 3.වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණුකිරිම | 2.08 | 2.08 | 100 |
| 4.යටිතල පහසුකම් වත්කම් | 0.48 | 0.48 | 100 |
| 5.අස්පෘෂ්‍ය වත්කම් | 2.76 | 2.76 | 100 |
| **එකතුව** | **16.41** | **16.41** | **100** |

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධන හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

ජාතික කිරි අවශ්‍යතාවයෙන් තවමත් නිෂ්පාදනය සිදුකරනු ලබන්නේ 40% අඩු ප්‍රමාණයක්වන බැවින්, ඉදිරි දශකය තුල රටට අවශ්‍ය දියර කිරි නිෂ්පාදනය ඉහල නැංවිම සඳහා පියවර ගෙන ඇත.

ප්‍රදේශයට සුදුසු ගව වර්ග හඳුන්වාදිම, කිරිඑකතු කිරිමේ ක්‍රම වේදය පුළුල් කිරිම, පිරිසිදු කිරි නිෂ්පාදනය, හා කිරි නිෂ්පාදනය ඉහල නැංවිම සඳහා ගුණාත්මයෙන් යුතු තෘණ වර්ග වගාකිරිම හා තෘණ සංරක්ෂණය වැනි වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. මෙයට අමතරව මහා පරිමාණ, මධ්‍ය පරිමාණ, කුඩාපරිමාණ කිරි ගොවිපල ඇති කිරිම හා ඒ සඳහා පහසුකම් සැළසිම සිදුකර ඇත. මස් සහ බිත්තර කර්මාන්තය නඟා සිටුවිම සඳහා එළු ගොවිපල, සූකර ගොවිපල සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. කුකුළු පාලනය ප්‍රචලිත කිරිම සඳහා නිදැළි කුකුළු පාලනය ගොවින් වෙත ප්‍රචලිත කිරිමට නොමිලේ මාසයක් වයසැති කිකිළි පැටවුන් ලබා දිමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. එය සාර්ථකව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • සිටින නිලධාරීන් දැනුම හා කුසලතා සපිරි වීම<br>• භෞතික සම්පත් සතුවීම (යම් පමණකින් හෝ)<br>• රාජ්‍ය අනුග්‍රහය හා පහසුකම් ගොවි සමිති හා සත්ත්ව නිෂ්පාදන සමුපකාර සමිති සඳහා ලබා දීම<br>• නවීන තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා තරුණ ප්‍රජාවක් ක්ෂේත්‍රයේ සිටීම | • නිලධාරින්ගේ දැනුම යාවත්කාලීන නොවීම<br>• ගොවින් වෙත නොගැලපෙන තාක්ෂණය හඳුන්වා දීම<br>• ව්‍යාපෘතිවලින් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ පිළිබඳ අඩු අවධානය<br>• සේවා අවස්ථා සැපයීම සඳහා කුසලතා සපිරි නිලධාරි හිඟය<br>• දත්ත එකතු කිරීමේ ක්‍රමවේදයේ දුර්වලතා<br>• ප්‍රවාහන පහසුකම් නොතිබීම ග්‍රාමීය හා දුෂ්කර පළාත් වල සේවාව ලබාදීමේ අපහසුතාව |
| **අවස්ථා** | **තර්ජන** |
| • සත්ත්ව පාලනය සම්බන්ධව ග්‍රාමීය ජනතාවගේ දැඩි කැමැත්තක් පැවතීම<br>• කිරි පිටි පරිභෝජනයට වඩා දියර කිරි පරිභෝජනය සඳහා පාරිභොගිකයාගේ ඉල්ලුම වැඩි වීම<br>• වෙනස්වන රාජ්‍ය ප්‍රතිපත්ති - කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම<br>• කෘෂිකාර්මාන්තයේ අවිනිශ්චිතභාවය නිසා සත්ත්ව පාලනයට ගොවීන් යොමු වීමේ නැඹුරුතාවය වැඩි වීම<br>• පෞද්ගලික අංශයේ අනුග්‍රහය ලැබීම<br>• නීතියේ රැකවරණය<br>• මාධ්‍ය පහසුකම් හා සන්නිවේදන පහසුකම් පැවතීම | • හදිසි මුල්‍ය අවශ්‍යතා සඳහා සතුන් විකිණීම<br>• කාර්ය මණ්ඩල හිඟය<br>• සේවාව වැඩි දියුණු කර ගැනීම සඳහා තිබෙන අවස්ථා සීමිත වීම<br>• සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභියාට 50% මුල දායකත්වයක් දැරීමට සිදුවීම<br>• මහජන සෞඛ්‍ය සහ පාරිසරික අධිකාරියේ අනවශ්‍ය මැදිහත්වීම<br>• ක්ෂේත්‍ර රාජකාරි කටයුතු වල යෙදීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොතිබීම<br>• සත්ත්ව ආහාර හා උපකරණ වල මිල ඉහල යෑම<br>• ඉඩම් හිඟය<br>• නීති හා අණපනත් වල ගැටළු සහිත බව<br>• අවිධිමත් සතුන් ප්‍රවාහණය<br>• උසස් නිෂ්පාදනයක් සහිත සතුන් අවසරයකින් තොරව ඝාතනය කිරීම<br>• පුහුණු කම්කරු ශ්‍රමය අවම වීම<br>• පවතින රාජ්‍ය ප්‍රතිපත්ති අනුව අතහැර දමන ලද නිෂ්පාදනය අඩු සතුන් හා අමතර පිරිමි සතුන් රැකබලා ගැනීමේ දුෂ්කරතාවය |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

| අනු අංකය | සංරචකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය( නිමැවුම්) | පාදම (Baseline) 2016 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|---|
| 01. | නිෂ්පාදන හා ඵලදායිතා සංවර්ධනය | 1.1.කිරි නිෂ්පාදන සංවර්ධනය<br>1.2.බිත්තර නිෂ්පාදන සංර්ධනය | කිරි නිෂ්පාදනය<br>බිත්තර නිෂ්පාදනය | 35.57<br>37.82 | 59<br>70 |
| 02. | සත්ත්ව පාලනයට අදාල අලෙවි කටයුතු, අගය එකතු කිරිම සහ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් | 2.1.ගුණාත්මක කිරි නිෂ්පාදනය සඳහා තාක්ෂණික මඟ පෙන්විම | පරික්ෂා කරන ලද කිරි සාම්පල ප්‍රමාණය | - | 300 |
| 03. | පශු මහජන සෞඛ්‍ය කටයුතු ප්‍රවර්ධනය | 3.1.සතුන්ගෙන් මිනිසාට වැළදෙන රෝග පාලනය | පරික්ෂාකරනලද රුධිර සාම්පල ප්‍රමාණය | - | 1,000 |
| 04. | රාජ්‍ය ආයතනික හා නිලධාරි ධාරිතා සංවර්ධනය | 4.1.ආයතනික ධාරිතා සංවර්ධනය<br>4.2. රාජ්‍ය ආයතනික ධාරිතා සංවර්ධනය | පුහුණු කරන ලද ගොවින් සහ නිලධාරින් සංඛ්‍යාව | 1,500 | 3,000 |

## එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟා කර ගැනිම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ( නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනිම |
|---|---|---|---|---|
| 01. | කිරි නිෂ්පාදන සංවර්ධනය | කිරි නිෂ්පාදනය | 59 ලිටර් මිලියන | ලිටර් මිලියන 59 |
| 02. | එළු මස් නිෂ්පාදන සංවර්ධනය | මස් නිෂ්පාදනය | 32 මෙ.ටො | 40 මෙ.ටො |
| 03. | බිත්තර නිෂ්පාදන සංවර්ධනය | බිත්තර නිෂ්පාදනය | බිත්තර මිලියන 70 | බිත්තර මිලියන136.66 |

## ප්‍රධාන කාර්ය සාධන දර්ශක ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

අනුරාධපුර දිස්ත්‍රික්කය

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළගා වීම | | | |
| 01 | කිරි නිෂ්පාදනය | 55 | 51 | වාණිජ මට්ටම දක්වා කිරි ගොවිපළ සංවර්ධනය | 9.61 | 51 |
| | | 193 | 217 | කුඩාපරිමාණ කිරි ගොවිපල සංවර්ධනය | 16.09 | 217 |
| | | 07 | 07 | මධ්‍ය පරිමාණ කිරිගොවිපල සංවර්ධනය | 0.69 | |
| | | 64 | 52 | ස්වාභාවික අභිජනන ප්‍රවර්ධනය | 1.50 | 52 |
| | | 199,277 ( සතුන් සංඛ්‍යාව) | 152,035 ( සතුන් සංඛ්‍යාව) | එළ හා මී ගව සතුන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම | 1.46 | 152,035 (සතුන් සංඛ්‍යාව) |
| | | 15 | 15 | කෘතිම සිංචන ජාලය වැඩිදියුණු කිරිම | 0.9 | 15 |
| | | 275 | 209 | ගොවිපල සඳහා තාක්ෂණික දායකත්වය ලබාදිම ( ජංගම සායන) | 0.42 | ජංගම සායන 209 |
| 02. | මස් නිෂ්පාදනය | 07 | 07 | එළු ගොවිපල සංවර්ධනය | 1.41 | 07 |
| 03. | බිත්තර නිෂ්පාදනය | 3,023 | 3,023 | නිදැලි කුකුල් පාලනය ප්‍රචලිත කිරිම | 12.09 | 3,023 |
| 04. | ගුණාත්මක කිරි නිෂ්පාදනය සඳහා තාක්ෂණික මඟ පෙන්වීම | 300 | 300 | බුරුළු ප්‍රදාහය පාලනය සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දිම | 2.06 | 300 |
| 05. | සතුන්ගෙන් මිනිසාට වැළදෙන රෝග පාලනය | 300 | 300 | සත්ත්ව ආහාර තුල පවතින හානිකර රසායනික ද්‍රවය හඳුනා ගැනිම | 0.3 | සාම්පල 300 |
| 06. | ආයතනික ධාරිතා සංවර්ධනය රාජ්‍ය ආයතනික ධාරිතා සංවර්ධනය | 550 | 550 | ගොවිපුහුණුව සහ පුහුණු මොඩියුල සැකසිම | 0.55 | 550 |
| | | 24 | 24 | ගොවින් සවිබල ගැන්විම | 0.29 | සමිති24 |
| | | 01 | 01 | තිරප්පනේ සත්ත්ව ගොවිපලේ නිල නිවාස අළුත්වැඩියාව | 0.49 | 01 |
| | | | | කෘතිම සිංචන සේවාව වැඩි දියුණු කිරිම | 5.10 | |
| | | 01 | 01 | ගල්නෑව පශු වෛද්‍යකාර්යාලයේ වැට මායිම් ඉදිකිරිම | | 01 |
| | | 01 | 01 | තිරප්පනේ සත්ත්ව ගොවිපලේ වැට මායිම් ඉදිකිරිම | 1.34 | 01 |
| | | - | - | යන්ත්‍රූපකරණ මිලදි ගැනිම (ෆොටෝකොපි/ මල්ටිමීඩියා/ තෘණ කැබිලි කිරිමේ යන්ත්‍ර/ තෘණ කපන යන්ත්‍ර) | 1.00 | - |
| | | - | - | කාර්යාලිය උපකරණ හා ගෘහභාණ්ඩ මිලදි ගැනිම | 7.59 | - |
| | | - | - | තොරතුරු කළමණාකරණ පද්ධතිය වැඩිදියුණුකිරිම | 2.77 | - |
| | | - | - | ගොවිපල තොරතුරු රැස්කිරිම, පුහුණු ව | 0.33 | - |
| | | 02 | 02 | තිරප්පනේ සත්ත්ව ගොවිපලේ මී ගව අභිජනන ඒකකය සඳහා පට්ටි වස්සන් හා දෙනුන් මිලදි ගැනිම | - | 02 |
| | | 01 | 01 | තිරප්පනේ සත්ත්ව ගොවිපලේ අක්-05 ක තෘණ වගාව සහ ජල සම්පාදන පද්ධතිය ස්ථාපනය | 0.48 | 01 |
| | | - | 225 | නිලධාරි ධාරිතා සංවර්ධනය | 0.22 | 225 |
| | | 35 | 32 | තිරසර ගොවිපල ප්‍රවර්ධනය කිරිමේ ව්‍යාපෘතිය | 3.58 | 32 |

පොළොන්නරුව දිස්ත්‍රික්කය

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි.) | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා වීම | | | |
| 01. | කිරි නිෂ්පාදනය | 16 | 17 | වාණිජ මට්ටම දක්වා කිරි ගොවිපළ සංවර්ධනය | 3.02 | 17 |
| | | 44 | 46 | කුඩාපරිමාණ කිරි ගොවිපල සංවර්ධනය | 3.90 | 46 |
| | | 26 | 24 | ස්වාභාවික අභිජනන ප්‍රවර්ධනය - | 0.78 | 24 |
| | | 89,277 | 50,439 | එළ හා මී ගව සතුන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම - | 0.91 | 50,439 (සතුන් සංඛ්‍යාව) |
| | | 10 | 15 | කෘතිම සිංචන ජාලය වැඩිදියුණු කිරිම | 0.11 | 15 |
| | | 125 | 99 | ගොවිපල සඳහා තාක්ෂණික දායකත්වය ලබාදිම( ජංගම සායන) | 0.23 | සායන99 |
| 02. | මස් නිෂ්පාදනය | 03 | 03 | එළු ගොවිපල සංවර්ධනය | 0.47 | 03 |
| 03. | බිත්තර නිෂ්පාදනය | | | නිදැලි කුකුල් පාලනය ප්‍රචලිත කිරීම | 5.71 | |
| 04. | ගුණාත්මක කිරි නිෂ්පාදනය සඳහා තාක්ෂණික මඟ පෙන්වීම | 200 | 250 | ගොවිපුහුණුව සහ පුහුණු මොඩියුල සැකසිම | 0.07 | 250 |
| 05. | සතුන්ගෙන් මිනිසාට වැළදෙන රෝග පාලනය | 84 | 84 | බුරුළු ප්‍රදාහය පාලනය සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගය ලබා දිම | 0.69 | 84 |
| 06. | ආයතනික ධාරිතා සංවර්ධනය රාජ්‍ය ආයතනික ධාරිතා සංවර්ධනය | 25 | 36 | ගොවින් ඇගයිම හා අභිප්‍රේරණය | 0.03 | 36 |
| | | 08 | 08 | ගොවින් සවිබල ගැන්විම | 0.22 | සමිති 08 |
| | | 150 | 150 | සත්ත්ව ආහාර තුල පවතින හානිකර රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනිම | 0.10 | සාම්පල 150 |
| | | 01 | 01 | පශු වෛද්‍යකාර්යාල අළුත් වැඩියාව | 1.39 | 01 |
| | | 01 | 01 | පශු වෛද්‍යකාර්යාල අළුත් වැඩියාව | 0.39 | 01 |
| | | - | - | කෘතිම සිංචන සේවාව වැඩි දියුණු කිරිම - ( ගවශුක්‍ර මිලදි ගැනිම) | 1.98 | - |
| | | 01 | 01 | පොළොන්නරුව පශු වෛද්‍යකාර්යාලයේ වැට මායිම් සකස්කිරිම | 0.75 | - |
| | | - | - | නිලධාරි ධාරිතා සංවර්ධනය | 0.02 | - |

පළාත් සභා සංවර්ධන ප්‍රදාන

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම ( රු.මි.) |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා වීම | | |
| 01 | ආයතනික ධාරිතා සංවර්ධනය රාජ්‍ය ආයතනික ධාරිතා සංවර්ධනය | - | - | ප්‍රසන්න කාර්යාල වැඩ පරිසරයක් නිර්මාණය කිරිම-ගෘහභාණ්ඩ හා කාර්යාලිය උපකරණ ලබාදිම | 1.94 |
| | | 02 | 02 | නිලධාරින්ගේ ගමන් පහසුකම් වැඩිදියුණු කිරිම සඳහා යතුරු පැදි ලබාදිම - තිරප්පනේ සත්ත්ව ගොවිපල සඳහා ටේලර් 02ක් මිලදි ගැනිම | 0.56 |
| | | - | - | ගමන් පහසුකම් වැඩි දියුණු කිරිම - වාහන අළුත් වැඩියාව | 0.55 |



කෘතිම සිංචන සේවා ප්‍රවර්ධනය - ගල්නෑව



කුඩා පරිමාණ කිරි ගොවිපල සංවර්ධනය - ගල්නෑව



වාණිජ පරිමාණ කිරි ගොවිපල සංවර්ධනය - ගල්නෑව



මධ්‍ය පරිමාණ කිරි ගොවිපල- රාජාංගනය



තෘණ වගාව - ගල්නෑව



නිදැලි කුකුළු පාලන ගොවිපලක්- ගල්නෑව



එළ හා මී ගව සතුන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම



තිරසාර ගොවිපල සංවර්ධනය



ක්ෂේත්‍ර පුහුණු වැඩ සටහනක්



නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම

## තිරප්පනේ ගොවිපල සංවර්ධනය



බඩ ඉරිඟු වගාව/ ජල සම්පාදන පද්ධති සංවර්ධනය



ග්ලිසිඩියා /තෘණ වගාව



එළු අභිජනන ඒකකය



කුකුළු සංවර්ධන ඒකකය

## මධ්‍යකාලින සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කල ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම

2021 මූල්‍ය වර්ෂයතුල පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා පළාත් සභා සංවර්ධන ප්‍රදාන සඳහා රු.මි 113 ක් වෙන්ව තිබුණු අතර රු මි.94.18ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීමට ගැනීමට හැකි විය.පසු ගිය වසර කිහිපයක ප්‍රගතිය සැලකීමේදී ඉහල ප්‍රගතියක් අප දෙපාර්තමේන්තුව ලබා කරගෙන ඇත.නිෂ්පාදන හා ඵලදායිතාවය ඉහලනැංවීම ප්‍රධාන කාර්යයක් වන බැවින්, ඒ සඳහා කිරි නිෂ්පාදනය සංවර්ධනය,මස් නිෂ්පාදනය සංවර්ධනය,බිත්තර නිෂ්පාදනය සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ඉලක්ක පසු ගිය වර්ෂවලට වඩා සාර්ථක ලෙස සපුරා ගත හැකි විය.

i. **කිරි නිෂ්පාදන සංවර්ධනය -** 2021 වර්ෂයේ උතුරු මැද පළාතේ කිරි නිෂ්පාදනය ලිටර් මිලියන 59 දක්වා වැඩිකිරීම අපගේ ඉලක්කය වී තිබුණි. එම ඉලක්කය සාර්ථක ලෙස සපුරා ගැනීමට හැකිවී ඇත. එම ඉලක්ක සපුරාලීම සඳහා වානිජ මට්ටමේ සහ කුඩා පරිමාණ කිරි ගොවිපල සංවර්ධනය, සත්ත්ව පෝෂණ සම්පත් වැඩි දියුණු කිරීම, වසංගත රෝග මර්ධනය, කෘතිම සිංචන ප්‍රවර්ධනය යන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. තවද උතුරු මැද පළාතේ සියළුම සත්ත්ව සංවර්ධන උපදේශකවරුන් කිරිගොවිපල 200ක් සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. පසුගිය වසර කිහිපයක කිරි නිෂ්පාදනය වැඩිවීම පහත සඳහන් ප්‍රස්තාර ආශ්‍රයෙන් දක්වා ඇත. එයට අමතරව කිරි නිෂ්පාදනය වැඩිවීම සඳහා සෘජුවම දායකවූ ව්‍යාපෘතිවල ප්‍රගතියද ඉදිරිපත් කර ඇත.










මූලාශ්‍රය -දෙපාර්තමේන්තු සංඛ්‍යා ලේඛන

ii. **බිත්තර නිෂ්පාදනය** - බිත්තර නිෂ්පාදනය මිලියන 70 දක්වා වැඩිකිරිම අපගේ ඉලක්කය විය. ඒ සඳහා නිදැළි කුකුළු පාලනය ගොවින් අතර ප්‍රචලිත කිරිම මුල්කරගෙන මෙම ව්‍යාපෘතිය උතුරු මැද පළාත තුල ක්‍රියාත්මක කර ඇත.මූලිකව මාසයක් වයසැති කිකිළි පැටවුන් 10 බැගින් ප්‍රතිලාභින් වෙත ලබා දී නිදැලි කුකුලු පාලනය සඳහා ඔවුන් යොමු කරගන්නා අතර, පසුකාලිනව මොවුන් දිර්ඝ කාලිනව කුකුළු පාලනයට යොමු විම තුලින් ඉහල බිත්තර නිෂ්පාදන අගයක් ලබා ගැනිමට හැකියාවක් ලැබෙනු ඇත. මිට අමතරව පවුලේ ප්‍රෝටින අවශ්‍යතාවය සපුරා ගැනිමට හා නිරෝගි දරුපරම්පරාවක් බිහිකිරිමට හැකියාව ලැබි ඇත.

iii. **මස් නිෂ්පාදනය** - එළු ගොවිපල සංවර්ධනය, තුලින් අභිජනන සතුන් සඳහා වන ඉල්ලුම හා මස් සඳහා වෙළඳපොළ ඉල්ලුම සැපයිමට හැකිවනු ඇත. එළු පාලනය සඳහා කාන්තා දායකත්වය පහසුවෙන් ලබාගත හැකි බැවින්, කාන්තාවන්ද සත්ත්ව පාලනයට යොමු කරගැනිමට හැකියාව ලැබි ඇත.

iv. **සතුන්ගෙන් මිනිසාට වැළදෙන රෝග පාලනය** - මෙම ව්‍යාපෘතිය තුලින් Salmonellosis, Leptospirosis, Brucellosis, Tuberculosis රෝග කාරකයින් හදුනා ගැනිම සඳහා සාම්පල පරික්ෂාවට ලක් කර .රෝගකාරකයින් හදුනා ගැනිමට කටයුතු කරන ලදි. මෙම ව්‍යාපෘතිය සිදුකරන ලද හදුනාගත් පශු වෛද්‍ය කොට්ඨාශ තුල බෝවන රෝග වලින් තොර සත්ත්ව නිෂ්පාදන ඇති බවට තහවරුවක් ලබා ගැනිමට හැකිවිය.

v. **ගුණාත්මක වෙළඳපොල හා වෙළඳපොල සම්බන්ධතා සංවර්ධනය - බුරුළු ප්‍රදාහය පාලනය-** මේ සඳහා ප්‍රතිලාභින් වෙත පරික්ෂණ උපකරණ කට්ටල ලබාදිම සහ ඒ සඳහා පුහුණු කිරිම සිදු කරන ලදි.

vi. **විපල සඳහා තාක්ෂණික දායකත්වය ලබාදිම( ජංගම සායන)** පශු වෛද්‍ය කොට්ටාශ 29 තුල ජංගම සායන 308ක් පවත්වා ඇත. මේ යටතේ ගොවිපල් ලියාපදිංචිය, සතුන් ගේ කණ් සළකුණු කිරිම,සත්ත්ව ප්‍රතිකාර සේවාව, සත්ත්ව අභිජනනය,සත්ත්ව පෝෂණය, උපදේශණ සේවාව සත්ත්ව ගොවිපල් වෙත ගොස් සිදුකරන ලදි.

vii. **එළ හා මී ගව සතුන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම** - මේ යටතේ වසංගත රෝග නිවාරණය සඳහා සතුන් එන්නත්කිරිම සිදු කරන ලදි. සියළුම පශු වෛද්‍ය කොට්ඨාශ ආවරණය වන පරිදි සතුන් 202,474 ක් කුර හා මුඛ රෝග පාලනය සඳහා එන්නත් කරන ලදි.

viii. **තිරසාර ගොවිපල සංවර්ධනය** - කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රචලිත කිරිමේ අරමුණින් මැදවච්චිය,ම.නු.ප.රඹෑව,නාච්චාදුව පශු වෛද්‍ය කොට්ඨාශ වල ප්‍රතිලාභින් සඳහා එළ ගවයින් 34ක් ලබා දෙන ලදි.

ix. **ආයතනික සංවර්ධන** - ,ගෘහභාණ්ඩ මිළදි ගැනිම - පශු වෛද්‍ය කාර්යාප සඳහා අවශ්‍ය කාර්යාලිය උපකරණ හා ගාහ භාණ්ඩ ලබාදිමට කටයුතු කර ඇත.

x. **රාජ්‍ය ආයතන ධාරිතා සංවර්ධනය -**

- ගොවි පුහුණුව, නිලධාරි පුහුණුව, ගොවින් සචිබල ගැන්විම, ගොවින් අභිප්‍රේරනය, පශු වෛද්‍ය කාර්යාල, නිල නිවාස අළුත්වැඩියා -ලංකාපුර,මැදිරිගිරිය පශු වෛද්‍ය කාර්යාල, අළුත්වැඩියාකරන ලද අතර,ගල්නෑව, පොළොන්නරුව වැටමායිම් ඉදිකරන ලදී.
- **ගොවි පුහුණුව** -සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ගොවින් 1,425ක් සඳහා නව තාක්ෂණික දැනුම ලබා දිම අරමුණින් පුහුණු වැඩ සටහන් පවත්වන ලදි.

- **නිලධාරි පුහුණුව -** දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරින් සඳහා පුහුණුව ලබා දෙන ලදි.නව තාක්ෂණික දැනුම ලබා දීම, දැනුම යාවත්කාලීන කිරීම මෙහි අරමුණ විය

  .

- **ගොවින් සවිබල ගැන්වීම -** උතුරු මැද පළාතේ පශු වෛද්‍ය කොට්ඨාශ 29 ආවරණය වන පරිදි පිහිටුවා තිබූ සත්ත්ව නිෂ්පාදන ගොවි සමුපකාර සමිති වඩාත් ශක්තිමත් කිරීම සඳහා ශාඛා සමිති ජාලයක් ස්ථාපිත කරන ලද අතර, සත්ත්ව නිෂ්පාදන ගොවි සමුපකාර සමිති වල සාමාජික ප්‍රවර්ධනය සහ යාවත්කාලික කිරීම සඳහා සාමාජික ඉල්ලුම් පත්‍ර,ලදුපත්,ගෙවීම් වව්චර්, අතුරු ව්‍යවස්ථා, සාමාජික පාස්පොත් මුද්‍රණය කර බෙදාදීම සිදුකරන ලදි.

xi. **තොරතුරු කළමණාකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම -** දත්ත පද්ධති සැකසීම හා ස්ථාපිත කිරීමේ පුහුණු වැඩ සටහන් පවත්වා ඇති අතර, මේ සඳහා අධීක්ෂණය හා උපදේශණ සේවාව ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයෙන් ලබාගෙන ඇත.

xii. **තිරප්පනේ සත්ත්ව ගොවිපල සංවර්ධනය-** තිරප්පනේ සත්ත්ව ගොවිපලේ මී ගව අභිජනන ඒකකය සඳහා පට්ටි වස්සන් හා දෙනුන් මිලදී ගැනීම, අක්-05 ක තෘණ වගාව සහ ජල සම්පාදන පද්ධතිය ස්ථාපනය, සත්ත්ව ගොවිපලේ වැට මායිම් ඉදිකිරීම යන සංවර්ධන කටයුතු සිදුකරන ලදි.

මෙම ක්‍රියාකාරකම් යටතේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා තෝරා ගන්නා ලද ප්‍රතිලාභීන් උතුරු මැද පළාත් සත්ව නිෂ්පාදන සමුපාකාර සමිතියේ සාමාජිකත්වය ලබා. ගත යුතුය.සාමාජිකත්වය ලබා ගැනීම හා ගිවිසුම් ගත කිරීමෙන් අතර මඟදී ව්‍යාපෘතිය හැරයෑමේ අවදානම අවම කර ගැනීම බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් ගොවිපල නිෂ්පාදනය ඉහල නංවා නිෂ්පාදන වියදම අවම මට්ටමක පවත්වා ගැනීමෙන් ප්‍රතිලාභී දෛනික ආදායම වැඩිකිරීම තුලින් ගෘහ ආර්ථිකය දියුණු වීමත්,ග්‍රාමීය මට්ටමේ මුදල් සංසරණය ඉහල යාමත් සිදුවේ. එමගින් ග්‍රාමීය වශයෙන් ජීවන මට්ටමේ සංවර්ධනය අපේක්ෂා කරයි. සමස්තයක් ලෙස පළාත් මට්ටමේ නිෂ්පාදනය ඉහල යාමෙන්, ජාතික නිෂ්පාදනයට දායක වීමෙන් ජාතික ආර්ථික වර්ධනයට දායක වීම සිදුවේ.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50% -74% |
| 1.කිරි නිෂ්පාදනය | 100% | | |
| 2.බිත්තර නිෂ්පාදනය | 100% | | |
| 3.මස් නිෂ්පාදනය | 100% | | |

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු ( SDG) සපුරා ගැනිමේ කාර්ය සාධනය

2030 වන විට ගෝලිය තිරසර සංවර්ධනය ඉලක්කයන් වෙත ලඟාවිම සඳහා හඳුනා ගන්නා ලද නව ප්‍රවේශයන් සාක්ෂාත් කරගැනිමට යාමේදි ආයතනයේ කිරි නිෂ්පාදන,බිත්තර නිෂ්පාදන,මස් නිෂ්පාදන සංවර්ධනය අපේක්ෂික නිමැවුම 100% විය. අප සතුව ග්‍රහණය කර ගැනිම සඳහා තරුණ ප්‍රජාවක් සිටිම අදාල ඉලක්කය සපුරාලිමට හේතු විය. මෙයට අමතරව ග්‍රාමීය ජනතාවගේ ජිවන රටාව තුල කිරිගව කර්මාන්තයට දැඩි කැමැත්තක් තිබිම, දියර කිරි පර්භෝජනය ප්‍රචලිත විම,වෙනස් වන රාජ්‍ය ප්‍රතිපත්ති, පෞද්ගලික අංශයේ මැදිහත් විම,මාධ්‍ය හා සන්නිවේදන පහසුකම් තිබිම ජයග්‍රහණයට හේතු විය.

| අදාල ප්‍රධාන ගෝලිය අරමුණු | ගෝලිය අරමුණට ලඟාවිම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනිමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 02.සාගින්න නැතිකර, ආහාර සුරක්ෂිතතාව ය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරිම | කිරි නිෂ්පාදනය (ලිටර් මිලියන)<br><br>මස් නිෂ්පාදනය (මෙ.ටො.)<br><br>බිත්තර නිෂ්පාදනය (මිලියන) | i.වානිජ මට්ටමෙ කිරි ගොවිපල සංවර්ධනය<br>ii.මධ්‍ය පරිමාණ කිරි ගොවිපල සංවර්ධනය<br>iii.කුඩා පරිමාණ කිරි ගොවිපල සංවර්ධනය,<br>iv.ස්වභාවික අභිජනනය ප්‍රවර්ධනය<br>v.කෘතිම සිංචන ජාලය වැඩිදියුණු කිරිම<br>vi.කෘතිම සිංචන සේවාව වැඩි දියුණු කිරිම<br>vii. එළු ගොවිපල සංවර්ධනය<br>viii.නිදැලි කුකුල් පාලනය ප්‍රචලිත කිරීම | i.උසස් ආරයේ සතුන් මිලදි ගැනිම<br>iiගවගාල් ඉදිකිරිම/ නවිකරනය<br>iii.සත්ත්ව පෝෂණය වැඩි දියුණු කිරිම<br>iv.කෘතිම සිංචන පුහුණුව ලබා දිම<br>v.සතුනගේ ආරය උසස් කිරිම,<br>vi.අභිජනන සතුන් ලබාදිම<br>vi.එළු නිවාස සංවර්ධනය<br>vii.මාසයක් වයසැති කිකිළි පැටවුන් ලබා දිම | | | 75%-100% |
| 03.නිරෝගි ජිවිත සහතික කර සැම වයසකම සිටින සියල්ලන්ගේ ම සුභ සාධනය ප්‍රවර්ධනය කිරිම | සතුන් මඟින් මිනිසාට බෝවන රෝග හඳුනා ගැනිම | i. ආහාර තුල පවතින හානිකර රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනිම<br>ii.බුරුළු ප්‍රදාහය පාලනය | සාම්පල පරික්ෂාවට ලක් කර රෝගකාරකයින් හඳුනා ගැනිම | | | 75%-100% |

මෙම වර්ෂය තුල ආයතනය ලබා ඇති විශේෂ ජයග්‍රහනය ලෙස උතුරු මැද පලාතේ කිරි නිෂ්පාදනය ලංකාවේ අනෙකුත් පළාත් හා සැසදිමේදි තුන්වැනි ස්ථාණය බවට පත්ව ඇත.ජාතික කිරි අවශ්‍යතාවයෙන් 15% දායකත්වය අප විසින් ලබා දි ඇත. රට තුල පැවති අයහපත් වාතාවරනය තුල 15% දායතකත්වය තුල රැදි සිටිමට සිදුවිය. මෙම සාර්ථකත්වය ලඟාකර ගැනිමේදි පහත සඳහන් අභියෝග වලට මුහුණ දිමට සිදුවිය.

- කිරි ගව පාලනයේදි සතුන්ගේ පෝෂණ අවශ්‍යතාවය ඉටුකිරිමට ප්‍රමාණවත් තෘණ බිම් නොමැති කම හා වියළි කාලයේ සතුන්ගේ පෝෂණ අවශ්‍යතා ඉටු කිරිමට නොහැකි වීම.
- වර්තමානයේ කිරි අලෙවිය සඳහා ඇති ගැටළු සහ අගය එකතු කල නිෂ්පාදන වල වෙළඳ පොල තරඟකාරිත්වයට මුහුණදිමේදි ඇතිවන ගැටළු.
- වරින් වර ප්‍රදේශයේ පැතිර යන සතුන්ගේ වසංගත රෝග තත්ත්වයන්.
- පාරිසරික ගැටළු
- අවිධිමත් ගව ප්‍රවාහනය
- පුහුණු නිලධාරින් ගේ හිඟකම සහ ක්ෂේත්‍ර කටයුතු වල නිරතවිමට ප්‍රවාහන පහසුකම් ලබා ගැනිමේදි සිදුවන අපහසුතා.
- කොවිඩ් වසංගත තත්ත්වය
- ගව සාන්ද්‍ර ආහාර වල මිල අධික විම හා ආහාර හිඟවිම

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හමුවන අරමුණු | මුදල | | ප්‍රගතිය | | ලැබුණු දිගු කාලින කෙටිකාලින ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | භෞතික | මුල්‍ය (%) | |
| 01. | දියර කිරි ප්‍රචලිත කිරීමේ වැඩසටහන | i. කිරි සැකසුම් මධ්‍යස්ථාන ඇති කිරීම හා කිරි සැකසුම් මධ්‍යස්ථාන නවීකරණ කටයුතු කිරීම.<br>ii. දියර කිරි නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් ලබා දීම තුළින් කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන.<br>iii. පිරිසිදු එළකිරි නිෂ්පාදනය කිරීම, ගොවිපළ පිරිසිදුව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම. | 6.86 | 4.87 | 83 | 80 | i.ප්‍රමිතියෙන් යුතු කිරි නිෂ්පාදන වෙළඳ පොලට නිකුත් කිරිම<br><br>ii.පවුලේ ආර්ථිකය ශක්තිමත් විම |
| 02. | අභිජනන ගොවිපළ පිහිටුවීම | i.තිරප්පනේ සත්ත්ව ගොවිපළ අභිජනන ගොවිපළක් ලෙස සංවර්ධනය කිරීම.<br>ii. ක්ෂේත්‍ර අභිජනන ගොවිපළ පිහිටුවීම (එළ ගව, මීගව, එළු). | 14.00 | 13.80 | 96 | 99 | අභිජනන සතුන් ගොවිපල් වෙත නිකුත් කිරිම |

වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස.....................

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හමුවන අරමුණු | මුදල | | ප්‍රගතිය | | ලැබුණු දිගු කාලින කෙටිකාලින ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන්කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | භෞතික | මූල්‍ය (%) | |
| 03. | සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ ඇති කිරීම | i. නොමිළේ මසක් වයසැති කිකිළි පැටවුන් ලබාදීම.<br>ii. සුළු පරිමාණ මස් සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම.<br>iii. සාන්ද්‍ර ආහාර සැපයීම (කි.ග්‍රෑ.)<br>iv. සුළු පරිමාණ කුකුල් ආහාර මිශ්‍රණාගාර පිහිටුවීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම. | 5.89 | 5.42 | 98 | 92 | i.පවුලේ ප්‍රෝටින අවශ්‍යතාවය සපුරා ගැනිම<br>ii.නිරෝගි දරුපරම්පරාවක් බිහිකිරිමට හැකියාව ලැබිම. |
| 04. | සූකර කර්මාන්තය නගා සිටුවීම | i. සූකර ගාල වැඩි දියුණු කිරීම හා අපද්‍රව්‍ය කළමනාකරණය. | 3.00 | 2.65 | 95 | 89 | i.මස් පරිභෝජනය වැඩිවිම<br>ii.පරිසර දූෂණය අවම කිරිම |
| 05. | කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපළ කළමනාකරණය තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම | i. හේබෙලර් යන්ත්‍ර සැපයීම.<br>ii. ආහාර සැකසුම් යන්ත්‍ර සැපයීම.<br>iii. තෘණ කැපීමේ යන්ත්‍ර සැපයීම.<br>iv. තෘණ සහ පෝෂ ශාක වගාව සඳහා ජල පහසුකම් ලබාදීම - විසුරුම් ජල පද්ධති ස්ථාපිත කිරීම. (හෙක්ටයාර්)<br>v. තෘණ භූමි සංවර්ධනය - විදුලි වැට ඉදි කිරීම. (ඒකක)<br>vi. සයිලේජ් නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබාදීම.<br>vii. සත්ත්ව අභිජනන වැඩසටහන - පුං ගවයන් ලබාදීම.<br>viii. කෘතිම සිංචනයෙන්/ස්වභාවික අභිජනනයෙන් උපන් වසු පැටවුන් ඇතිදැඩි කිරිම.<br>ix.කෘතිම සිංචනයෙන් උපන් වැස්සි පැටවුන් ඇතිදැඩි කිරිම.<br>x.ගව කණ් සළකුණු කිරීම.<br>xi. කෘතිම සිංචන යෙදවුම් ලබාදීම. (ගව ශුක්‍ර) | 50.02 | 30.64 | 71 | 61 | i.සතුන්ගේ පෝෂණ අවශ්‍යතා සැපයිම<br>ii.කිරි නිෂ්පාදනය ඉහල යෑම |
| | | එකතුව | 103.52 | 78.83 | - | 77 | |

## 01.දියර කිරි ප්‍රචලිත කිරීමේ වැඩසටහන





නොච්චියාගම පශු වෛද්‍ය කාර්යාලය



## 02. අභිජනන ගොවිපළ පිහිටුවීම



තිරප්පනේ සත්ත්ව ගොවිපළ අභිජනන ගොවිපළක් ලෙස සංවර්ධනය කිරීම



එළු අභිජනන ගොවිපල - ම.නු.ප



නොච්චියාගම මී ගව අභිජනන ගොවිපල

## 03.සූකර කර්මාන්තය නඟා සිටුවීම





## 04.සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ ඇති කිරීම



## 05.කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවිපළ කළමනාකරණය තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම



තෘණ සහ පෝෂ ශාක වගාව සඳහා ජල පහසුකම් ලබාදීම - විසුරුම් ජල පද්ධති ස්ථාපිත කිරීම - ම.ත.ස



තෘණ භූමි සංවර්ධනය - විදුලි වැට ඉදි කිරීම - තිරප්පනේ

### පවතින කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ පළාතේ මහජනතාව වෙත ලබා දුන් සේවාවන්

| අනු අංකය | ලබා දුන් සේවාවන් | ක්‍රියාත්මක කරන ලද ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | සහය දැක්වූ ආයතන |
|---|---|---|---|---|
| 01. | මාසයක් වයසැති කිකිළි පැටවුන් ලබාදීම | සියළුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුල | 1,355 | පශු සම්පත් අමාත්‍යාංශය |

### Covid 19 ගෝලිය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

ව්‍යාපෘති සඳහා තෝරාගන්නා ලද ප්‍රතිලාභීන් ව්‍යාපෘති වලින් ඉවත්වීම හේතුවෙන් අදාල ඉලක්ක සපුරා ගැනිම අපහසු වීම හා නව ප්‍රතිලාභීන් තෝරාගැනිම සඳහා අමතර කාලයක් වැය කිරිමට සිදුවිය. එමෙන්ම සුළු පරිමාණ කිරි නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන්නන්ගේ කිරි නිෂ්පාදන අලෙවි කර ගැනිමට නොහැකිවිම නිසා සුළු පරිමාණ කිරි නිෂ්පාදකයින්ගේ කර්මාන්ත (මුදවපු කිරි, යෝගට්, අයිස්ක්‍රිම්) වැසී යන ලදී. තවද බිත්තර නිෂ්පාදකයින්ගේ බිත්තර අලෙවි කිරිමට නොහැකිවිම හා අඩු මුදලකට බිත්තර අලෙවි කිරිමට සිදුවිය. සාන්ද්‍ර ආහාර වල මිල ඉහලයෑම හා වෙළඳපළේ සාන්ද්‍ර ආහාර නොමැතිවිම නිසා කුකුළු පාලනයෙන් ගොවින් ඉවත්විය. Covid වසංගත තත්ත්වය හමුවේ ජනතාව ඒකරාශි කළ නොහැකි බැවින් පුහුණු වැඩ සටහන්, ක්ෂේත්‍ර ආදර්ශණ පැවැත්විම සිමා සහිත විය. ගොවින් හමුවිමද දුෂ්කර විය. එලෙසම ආර්ථික අපහසුතා හේතුවෙන් සතුන් අලෙවි කිරිමට ගොවින් පෙළඹිණි. සත්ත්ව පාලනයට අවශ්‍ය යන්ත්‍ර උපකරණ, ආහාර හා ඖෂධ මිලදි ගැනිමට වෙළඳපොළේ නොමැතිවිම හා මිල අධික විම ද ප්‍රබල ගැටළුවක් විය.

මෙම කරුණු නිසා නව ප්‍රතිලාභින් තෝරා ගැනිමට කටයුතු කරන ලදී. තවද Zoom තාක්ෂණය මඟින් පශු වෛද්‍ය නිලධාරින් හා සත්ත්ව සංවර්ධන උපදේශකවරු සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්විම හා අදාල උපදෙස් ලබාදිම සිදු කෙරුණි. සාන්ද්‍ර ආහර වෙනුවට විකල්ප ආහාර භාවිතයට ගොවින් යොමු විය.

2021 වර්ෂයේ වාර්ෂික කිරි නිෂ්පාදනය ලිටර් මිලියන 59 ක් වූ බැවින්, එය 2026 වර්ෂය වන විට ලිටර් මිලියන 97 දක්වා වැඩිකිරිම ප්‍රධාන අරමුණ වි ඇත. මස් නිෂ්පාදනය යටතේ අප රටේ පවතින සංස්කෘතික කරුණු පදනම් කරගෙන ගව මස් නිෂ්පාදනය ප්‍රවර්ධනය සඳහා අප දෙපාර්තමේන්තුව කටයුතු සිදු නොකරන අතර, එළු , සූකර.කුකුළු මස් ප්‍රවර්ධනය සඳහා කටයුතු සිදුකිරිම හා සත්ත්ව පාලනය ප්‍රචලිත කිරිම සඳහා නවින තාක්ෂණික දැනුම ලබා දිම පෙරදැරි කරගෙන, ගොවින් සඳහා පුහුණු වැඩ සටහන්, ක්ෂේත්‍ර චාරිකා, ක්ෂේත්‍ර දින පැවැත්විම. තව දුරටත් තරුණ ප්‍රජාව සත්ත්ව පාලනයට යොමු කිරිම සඳහා සත්ත්ව පාලන ප්‍රදර්ශන පැවැත්විම වැනි ක්‍රියාකාරකම් සිදුකිරිමට කටයුතු කිරිම සෙසු අරමුණු වේ. මෙම කටයුතු සාර්ථක කර ගැනිම සඳහා අනිවාර්යයෙන් දෙපාර්තමේන්තුවේ පවතින නිලධාරි හිඟය ප්‍රවාහන පහසුකම් නොමැතිවිමේ ගැටළු නිරාකරණය කර ගැනිමට ප්‍රධාන වශයෙන් කටයුතු සිදුකල යුතුය.

# 08. සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය.

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

### අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා පැවරී ඇති ප්‍රධාන විෂයයන්

- පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය
- පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව
- පළාත් සමාජසේවා දෙපාර්තමේන්තුව
- පළාත් පරිවාස දෙපාර්තමේන්තුව
- පරිසර විෂය හා සම්බන්ධ සංවර්ධන කටයුතු
- පළාත් සභා කටයුතු

## දැක්ම

"සුව සම්පන්න හා සුරක්ෂිත ප්‍රජාවක්, සමෘද්ධිමත් පළාතක්".

## මෙහෙවර

"සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර හා පළාත් සභා කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම".

## අරමුණු

### දිගු කාලීන අරමුණු.

- ඵලදායි සේවාවක් සැපයීම සඳහා ප්‍රශස්ත ආයතනික පද්ධතියක් ඇති කිරීම තුළින් ගුණාත්මක සෞඛ්‍ය
- සේවාවක් ඇති කිරීම, සේවාලාභීන් තුළ ප්‍රචලිත දේශීය වෛද්‍ය ක්‍රමයක් තිබීම, සමාජ සුබසාධනය සවිබල ගැන්වීම තුළින් රැකවරණය ලැබිය යුත්තන් සවිබල ගැන්වීම හා ළමාරක්ෂක සේවා විධිමත් කිරීම තුළින් ළමුන්ගේ රැකවරණය ශක්තිමත් කිරීම.
- අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අයත් සියළු දෙපාර්තමේන්තු කාර්යයන් නියාමනය, ප්‍රතිපත්ති සම්පාදනය, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය, මෙහෙයවීම හා සම්බන්ධීකරණය.
- පරිසර විෂය යටතේ නිරෝගි දිවියක් උදෙසා යහපත් ස්වභාවික පරිසරයක් ඇති කිරීම පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- පරිසර දූෂණය අවම කිරීම හා පරිසර සංරක්ෂණයට දායක වෙමින් අනාගත පරපුර සඳහා සුවදායි පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම.

### කෙටි කාලීන අරමුණු

- ගුණාත්මක සෞඛ්‍ය සේවයක් ඇති කිරීම.
- දේශීය වෛද්‍ය ක්‍රමය වඩාත් ප්‍රචලිත කිරීම.
- පළාතට අවශ්‍ය දේශීය නිමි ඖෂධ පළාත තුළම නිපදවීම.
- ළමා අපචාරවලට ලක්වූවන් රැකගැනීම හා පුනරුත්ථාපනය කිරීම.
- ළමා අපචාර පිළිබඳ ප්‍රජාව සහ පාසල් දරුවන් දැනුවත් කිරීම.
- ආබාධ සහිත වූවන් නගාසිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- අසරණ පවුල් නඟාසිටුවීමට කටයුතු කිරීම.
- මානසික හා කායික වශයෙන් නිරෝගී ශක්ති සම්පන්න ප්‍රජාවක් බිහි කිරීම.
- නගර හා උප නගරවල පරිසර සංරක්ෂණය හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ස්වභාඋයන් මහජන පරිහරණයට සුදුසු පරිදි වැඩිදියුණු කිරීම.
- පිරිසිදු පානීය ජලය මහජනතාවට ලබාදීම හා උල්පත් සංරක්ෂණය.
- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් පරිසරය ආරක්ෂා කිරීමට නැඹුරු කිරීම.
- සියළු සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචනය.

## ප්‍රධාන කාර්යයන්

- අමාත්‍යාංශයට අයත් සියළුම දෙපාර්තමේන්තු කළමනාකරණය හා සංවර්ධනය
- පරිසර කටයුතු සංවර්ධනය
- අමාත්‍යාංශීය ආයතනික ධාරිතා සංවර්ධනය

## ප්‍රධාන උපාය මාර්ගයන්

- පළාත් සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩිකිරීම.
- පළාත තුළ දේශීය වෛද්‍ය ක්‍රමය වඩාත් ප්‍රචලිත කිරීම
- පළාතට අවශ්‍යතාවයට සරිලන පරිදි දේශීය නිමි ඖෂධ පළාත තුළම නිපදවීම.
- ළමා අපචාරවලට ලක්වුවන් රැකගැනීම හා පුනරුත්ථාපනය කිරීම.
- ළමා අපචාර පිළිබඳ ප්‍රජාව සහ පාසල් දරුවන් දැනුවත් කිරීම.
- ආබාධ සහිත වුවන් නඟා සිටුවීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විවිධ ආධාර ක්‍රම මගින් අසරණ පවුල් නඟාසිටුවීමට කටයුතු කිරීම.
- මානසික හා කායික වශයෙන් නිරෝගී මෙන්ම ශක්ති සම්පන්න ප්‍රජාවක් බිහි කිරීම.
- නගර හා උප නගරවල පරිසර සංරක්ෂණය හා අලංකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- මහජන පරිහරණයට සුදුසු පරිදි ස්වභාඋයන් වැඩිදියුණු කිරීම.
- පිරිසිදු පානීය ජලය මහජනතාවට ලබා දීම හා උල්පත් සංරක්ෂණය.
- පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් පරිසරය ආරක්ෂා කිරීමට නැඹුරු කිරීම.
- සියළු සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති සමාලෝචනය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 52 ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 42 කි. පුරප්පාඩු සංඛ්‍යාව 11 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා ප්‍රතිපත්තිමය ගමන් මග

- සෞඛ්‍ය සේවාවන් සැපයීම සඳහා ප්‍රමිතීන් හා මාර්ග උපදේශ සකස් කිරිම
- සම්පත් වෙන් කිරිම කළමණාකරණය, අධීක්ෂණය හා ඇගයීම
- සැලසුම්කරණය හා පද්ධති සංවර්ධනය
- සේවා ආයතන නියාමනය හා අධීක්ෂණය
- මානව සම්පත් සංවර්ධනය
- පාරිසරික සංවේදී කලාප ආරක්ෂණය
- වන වගා ඇති කිරිම හා වනාන්තර සංරක්ෂණය
- පාසල් ආශ්‍රිත  දැනුවත් කිරිමේ වැඩසටහන්
- වැව් රක්ෂිත හා පෝෂක ප්‍රදේශ සුරකීම

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

ආයතනය තුළ අභ්‍යන්තර හා බාහිර යන විශ්ලේශණය කිරීම සඳහා යොදාගනු ලබන ශිල්ප ක්‍රමයක් ලෙස ශදුඅත විශ්ලේශණය පෙන්වා දිය හැකිය. අභ්‍යන්තර හා බාහිර පරිසරයන් තුළ පවතින ශක්තීන්,දුරවලතා,අවස්ථා,තර්ජන නිශ්චිතව හඳුනාගැනීම සඳහා සිදුකරන ලබන ඇඟයීම් ක්‍රමයකි. ආයතනය තුල පරමාරථ තහවුරු කර ගැනීමේදී ඊට බලපාන අභ්‍යන්තර හා බාහිර යන පරිසරයන් තුළ පවතින යහපත් හො අයහපත් සාධක හඳුනාගැනීමටද ශදුඅත විශ්ලේශණය වැදගත් වේ. අභ්‍යන්තර පරිසරය තුළ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීමද බාහිර පරිසරයේ අවසථා හා තර්ජන වලට මුහුණ දීම ඇඟයීම සඳහා ශදුඅත විශ්ලේශණය යොදා ගනු ලබයි.

අන්තර් සම්බන්ධතා ගොඩනැගිය හැකි කාර්ය මණ්ඩලයක් ආයතනය තුළ සිටින බැවින් අනෙකුත් අදාළ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින් ක්‍රියාකිරීමට හැකිවීම. පළාතේ පරිසර සංරක්ෂණය සම්බන්ධව ක්‍රියා කරන අනෙකුත් ආයතන සමඟ පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් දක්වන උනන්දුව හා මැදිහත් වීම ඉතා වැදගත් වේ.ගංඟා දෝනි සහ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා පළාතේ දායකත්වය සඳහා වන මැදිහත් වීම හඳුනා ගැනීම ඒ සඳහා ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම දැනුවත් කිරීම මඟින් එම වැඩසටහන් පළාත තුළ වඩා ඵලදායීව ක්‍රියාත්මක කිරීම.

| **ශක්තීන්** | **දුර්වලතා** |
| --- | --- |
| • ආයතනය සතු වූ විශේෂ හැකියාවන් වල බල අධිකාරිය හා ශක්තීන්.<br>• හොඳ නායකත්වය.<br>• නිළධාරීන්ගේ අත්දැකීම හා පලපුරුද්ද දක්ෂතා සහිත පුද්ගලයන්<br>• සම්පත් ප්‍රශස්ත මට්ටමින් පැවතීම.<br>• විධිමත් සංවිධාන ව්‍යුහය.<br>• නව තාක්ෂණය යොදා ගැනීම.<br>• අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමේ පහසුව.<br>• පුහුණු හා නුපුහුණු ශ්‍රමය ලබා ගැනීමේ පහසුව.<br>• සුදුසු ස්ථානය හා පිහිටීම. | • තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම ප්‍රමාණවත් පරිදි නොමැති වීම.<br>• විධිමත් දත්ත පද්ධතියක් සකස් කළ යුතුවීම.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් වර්ධනය කරගත යුතු වීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| • අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු වලින් ලබා ගතහැකි සේවාව මගින් උතුරු මැද පළාත තුල සේවාව සැපයීමේ පහසු වීම.<br>• සෞඛ්‍ය,ආයුර්වේද,පරිවාස හා සමාජසේවා දෙපාර්තමේන්තු වල බිම් මට්ටම දක්වා විධිමත් හා ක්‍රියාත්මක ආයතනික ව්‍යුහයක් පැවතීම.<br>• විදේශාධාර ව්‍යාපෘති මඟින් අමතර ප්‍රතිපාදන අඛණ්ඩව ලබා ගත හැකි වීම.<br>• සෞඛ්‍ය කටයුතු සඳහා මධ්‍යම ආණ්ඩුවේ සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ප්‍රතිපාදන හා තාක්ෂණික දැනුම සහ අවශ්‍ය පුහුණු අඛණ්ඩව ලබා ගැනීමට හැකි වීම.<br>• ආයුර්වේද දෙපාර්තමේන්තුවේපරිවාස හා ළමා රක්ෂක සේවා හා සමාජ සේවා කටයුතු සඳහා එම ආයතන වලට අදාල මධ්‍යම ආණ්ඩුවේ සහය ඇතිව අවශ්‍ය ප්‍රමාණ ආධාර ලබා ගැනීමට හැකි වීම.<br>• විදේශ ශිෂ්‍යත්ව ලබාගැනීමට ඇති ඉඩප්‍රස්ථා. | • කොවිඩ් වසංගතය වැනි වසංගත තත්වයන් සහ හදිසි ස්වාභාවික විපත් ආපදාවන් අත්විදීමට සිදුවීම.<br>• වෛද්‍ය සැපයුම් සේවාවන් (ඖෂධ හා උපකරණ)මධ්‍යම ආණ්ඩුව සහ විදේශ රටවල් මත යැපීමට සිදුවී.<br>• ඖෂධ වල අඛණ්ඩ මිල ඉහල යාම.<br>• දෙපාර්තමේන්තු වලට අදාල උපකරණ උපාංග මිල අසාමාන්‍ය ලෙස ඉහල යාම.<br>• බෝ නොවන රෝග පාලනයේදී බෝ නොවන රෝග පාලනය සඳහා වන ප්‍රජාවගේ දායකත්වය ඉතා අඩු මට්ටමක පැවතීම.<br>• පරිසර වැඩසටහන් වලදී දියුණුකරණ ලද පාරිසරික ස්ථාන නඩත්තු කිරීම සඳහා ප්‍රජාව යන අනෙකුත් ආයතන වල දායකත්වයන් අවම වීම. |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | ඉලක්ක 2021 |
|---|---|---|---|
| 01. පරිසරික සංවර්ධනය | වන ගහණය වැඩිකිරීම | නිර්මාණය කරන ලද ස්වභා උයන් ගණන/<br>සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණ ගණන -<br>• හොරොව්පොතාන නගර උද්‍යානය ස්ථාපිත කිරීම<br>• පොළොන්නරුව ලක්ෂ උයන විජයබාපුර දිය මං පාලම අසල පරිසර උද්‍යානය ස්ථාපිත කිරීම<br>• මිහින්තලේ දොරමඩලාව මරදන්කුලම පරිසර උද්‍යානය ස්ථාපිත කිරීම<br>• කැකිරාව නීකිනියාව වැව ආශ්‍රිතව ස්වභාවික පරිසර උද්‍යාන ස්ථාපිත කිරීම | 4 |
| | පරිසරික සංරක්ෂණ වැඩසටහන් | සංවේදී පරිසර කළාප සංරක්ෂණය සහ ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම -<br>• වැව් රක්ෂිත හා වැව් ආශ්‍රිත පරිසරයන්හි රෝපනය කිරීම<br>• ක්‍රියාත්මක කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්<br>• ශාක රෝපනය සඳහා තෝරා ගන්නා ලද වැව් රක්ෂිත<br>• ආවරණය කරන ලද භූමි ප්‍රමාණය (අක්කර) | 4 |
| 02. ආයතනික සංවර්ධනය | වැඩ ධාරිතා සංවර්ධනය (Working Capacity Enhancement) | • නිවාස අලුත්වැඩියා කිරීම<br>• වාහන අලුත්වැඩියා කිරීම<br>• කාර්යාල උපකරණ මිලදී ගැනීම<br>• කාර්යාලය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම | 4 |
| 03. ධාරිතා සංවර්ධනය | ඵලදායිතාව වැඩිදියුණු කිරීම (Productivity Enhancement) | කාර්ය මණ්ඩලය සඳහා අභිප්‍රේරණ හා සඵලත්වය පිළිබඳව පැවැත් වූ වැඩසටහන් ගණන | 2 |

**එකිනෙක සංරචක සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | ඉලක්ක | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01 පාරිසරික සංවර්ධනය | වන ආවරණය වැඩිකිරීම(Enhancement Of Forest Cover) | නිර්මාණය කරන ලද ස්වභා උයන් ගණන/<br>සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණ ගණන -<br>• හොරොව්පොතාන නගර උද්‍යානය ස්ථාපිත කිරිම<br>• පොළොන්නරුව ලක්ෂ උයන විජයබාපුර දිය මං පාලම අසල පරිසර උද්‍යානය ස්ථාපිත කිරීම<br>• මිහින්තලේ දොරමඩලාව මරදන්කුලම පරිසර උද්‍යානය ස්ථාපිත කිරීම<br>• කැකිරාව නීකිනියාව වැව ආශ්‍රිතව ස්වභාවික පරිසර උද්‍යාන ස්ථාපිත කිරීම | 4 | 4 |
| | පාරිසරික සංරක්ෂණ වැඩසටහන් (Environmental Conservation Programs) | සංවේදී පරිසර කළාප සංරක්ෂණය සහ ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ගණන<br>• වැව් රක්ෂිත හා වැව් ආශ්‍රිත පරිසරයන්හි රෝපනය කිරීම<br>• ක්‍රියාත්මක කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්<br>• ශාක රෝපනය සඳහා තෝරා ගන්නා ලද වැව් රක්ෂිත<br>• ආවරණය කරන ලද භූමි ප්‍රමාණය (අක්කර) | 4 | 4 |
| 02. ආයතනික සංවර්ධනය | වැඩ ධාරිතා සංවර්ධනය (Working Capacity Enhancement) | සිදු කරන ලද ආයතනික අලුත්වැඩියාවන් ගණන<br>• නිවාස අලුත්වැඩියා කිරීම<br>• වාහන අලුත්වැඩියා කිරීම<br>• කාර්යාල උපකරණ මිලදී ගැනීම<br>• කාර්යාලය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම | 4 | 4 |
| 03. ධාරිතා සංවර්ධනය | ඵලදායිතාව වැඩිදියුණු කිරීම (Productivity Enhancement) | කාර්ය මණ්ඩලය සඳහා අභිප්‍රේරණ හා සඵලත්වය පිළිබඳ පැවැත් වූ වැඩසටහන් ගණන | 2 | 2 |

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංක | ප්‍රධාන කාර්ය දර්ශකය | ප්‍රමාණය | | ව්‍යාපෘතිය / ක්‍රියාකාරකම | ප්‍රවර්ථන මාසයට සමුච්චිත වියදම රු : | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ලගාවීම | | | |
| 1. | සේවය ලබා ගන්නා ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 250 | 250 | ගලෙන්බිදුණුවැව අංක 45,ගලපිටගල හෙළ වෙද ගෙදර ඉදි කරමින් පවතින ගොඩනැගිල්ලේ වැඩ නිම කර ගැනීම | 0.6 | 250 |
| 2. | අලුත්වැඩියා කරන ලද නිල නිවාස ගණන | 1 | 1 | නිල නිවාස අලුත්වැඩියා කිරීම | 0.58 | 1 |
| 3. | අලුත්වැඩියා කරන ලද වාහන ගණන | - | - | වාහන අලුත්වැඩියා කිරීම | - | - |
| 4. | මිලදී ගන්නා ලද කාර්යාල උපකරණ මිලදී ගැනීම | 14 | 14 | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 0.32 | 42 |
| 5. | මිලදී ගන්නා ලද කාර්යාල උපකරණ මිලදී ගැනීම | 3 | 3 | කාර්යාලය සඳහා යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම | 0.35 | 42 |
| 6. | ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ගණන | 2 | 2 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 0.03 | 42 |
| 7. | නිර්මාණය කරන ලද ස්වභා උයන් ගණන සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණ ගණන | 4 | 4 | හොරොව්පොතාන නගර උද්‍යානය ස්ථාපිත කිරිම<br>පොළොන්නරුව ලක්ෂ උයන විජයබාපුර දිය මං පාලම අසල පරිසර උද්‍යානය ස්ථාපිත කිරීම<br>මිහින්තලේ දොරමඩලාව මරදන්කුලම පරිසර උද්‍යානය ස්ථාපිත කිරීම<br>පණ්ඩුලගම ගම්උදා භූමියේ පිහිටි උයන ස්වභාවික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම. | 7.5 | අසීමිතයි |
| 8. | වැව් රක්ෂිත හා වැව් ආශ්‍රිත පරිසරයන්හි රෝපනය කරන ලද ශාක ප්‍රමාණය<br>ක්‍රියාත්මක කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ගණන<br>ශාක රෝපනය සඳහා තෝරා ගන්නා ලද වැව් රක්ෂිත ගණන<br>ආවරණය කරන ලද භූමි ප්‍රමාණය(අක්කර) | 5000 | 5000 | සංවේදී පරිසර කළාප සංරක්ෂණය සහ ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 0.13 | - |

**1.** උතුරු මැද පළාතේ පරිසර සංවේදී ස්ථාන ආශ්‍රිතව වන ගහනය ඉහල නැංවීම.

උතුරු මැද පළාත එල්ලංගා පද්ධති රාශියකින් සමන්විත වන අතර කුඩා මධ්‍ය පරිමාණ හා විශාල වැව් හා ඒ ආශ්‍රිත වාරි පද්ධතියකින් සමන්විත වියළි කලාපීය දේශගුණ රටාවක් සහිත ප්‍රදේශයක් වන බැවින් ද වර්ෂයෙහි වැඩි කාලයක් වැසි රහිත දේශගුණ තත්වයක් පවතින බැවින්ද යථෝක්ත වාරි පද්ධති සංරක්ෂණය හා ප්‍රවර්ධනය අත්‍යවශ්‍ය කරුණකි. ඒ අනුව පළාතේ ප්‍රධානම පරිසර සංවේදී කලාපයන් ලෙස ජල පෝෂක ප්‍රදේශ හඳුනා ගෙන ඇත. යථෝක්ත පරිදි වැව් සහ අමුණු 4000 කට ආසන්න ප්‍රමාණයක් පවතින බැවින් ජල සංරක්ෂණය , අරපිරිමැසුම් භාවිතය ,පානීය ජලය සැපයීම මෙන්ම කෘෂිකාර්මික භෝග වගාව තීව්‍ර කිරිමෙහිලා ප්‍රමුඛ සාධකයක් වේ. එසේද වුවත් ජනග්‍රහනය වැඩිවීමත් සමඟ මෙම සංවේදී පරිසර කලාප ආශ්‍රිත පරිසරය විනාශ බවට පත්වීම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී.එබැවින් මෙම සංවේදී කලාපවල යෝග්‍ය ශාක රෝපණය මඟින් සංරක්ෂණය කිරීම ඒකාබද්ධ ප්‍රවේශයක් ඔස්සේ ක්‍රියාත්මක කර ඇත.

උදා :- තිරප්පනේ වගායක්කුලම වැව

කැකිරාව නිකිනියාව වැව

මල්වතු ඔය, යාන් ඔය, කලා ඔය, මෝදර ගං ආරු සහ මහවැලි ගඟ පළාතට සුවිශේෂී ජල ප්‍රභවයන් වශයෙන් හඳුනාගෙන ඇති අතර නාගරීකරණය සහ ජනග්‍රහණය වර්ධනය වීමත් සමඟ මෙම ගංගා ආශ්‍රිත ගංගා ද්‍රෝණි විවිධ හේතූන් මත හායනයට මෙන්ම ඒ ආශිත ජලය වේගයෙන් දූෂණය වෙමින් පවතී.මෙම තත්වය මත මෙම ජල ප්‍රභවයන් මඟින් පෝෂණය වන අනෙකුත් වැව් සහ අමුණු ක්‍රමයෙන් දූෂණය වෙමින් පවතී.එමෙන්ම විවිධ හේතු මත සිදු වන පරිසර හානි නිසා ඉවුරු දැඩි ලෙස ඛාදනය වෙමින් පවතී.එබැවින් එම ගැටලු අවම කිරීම සඳහා පරිසර අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සුරකිමු ගංගා වැඩසටහනට අදාළව ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සමඟ කටයුතු කිරීම . මැදිහත් වීම ,ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

උදා :- මල්වතු ඔය ආශ්‍රිත සංවේදී පරිසර කලාප හඳුනා ගැනීම හා ඒ ආශ්‍රිත සුදුසු ශාක රෝපණය කිරිම

සෝමාවතී ජල ගැලුම් නිම්නය

**2.** පාරිසරික සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා පාසල් ළමුන් හා ප්‍රජාව බලගැන්වීම හා ඔවුන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය කිරිම.

තෝරා ගත් නාගරික හා අර්ධ නාගරික ස්ථානවල ස්වභාවික උද්‍යාන 4ක් ස්ථාපිත කිරීම.මෙම උද්‍යාන ඉදිරි වසර 2ක තුළ රෝපණය කිරීමට ශාක වර්ධනය වී අනෙකුත් පහසුකම් සැපයීමත් සමඟ පරිසරය විඳිමින් මානසික සෞඛ්‍ය වර්ධනය කර ගැනීමේ පරිසර හිතකාමී විවේක ස්ථාන ලෙස භාවිතයට ගැනීමට හැකිවනු ඇත.

**3.** පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පවතින ශක්තීන් ,අවස්ථා සහ අභියෝග.

පාරිසරික අවබෝධය සහිත අන්තර් සම්බන්ධතා ගොඩනැගිය හැකි කාර්ය මණ්ඩලයක් ආයතනය තුළ සිටින බැවින් පළාත් පාලන ආයතන සහ මධ්‍යම පරිසර අධිකාරිය සහ අනෙකුත් අදාළ ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යමින් ක්‍රියාකිරීමට හැකිවීම. පළාතේ පරිසර සංරක්ෂණය සම්බන්ධව ක්‍රියා කරන අනෙකුත් ආයතන සමඟ පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් දක්වන උනන්දුව හා මැදිහත් වීම ඉතා වැදගත් වේ.

උදා : - පළාත් පාලන ආයතන , ප්‍රාදේශීය ලේකම් කාර්යාල ,මධ්‍යම පරිසර අධිකාරිය

ගංගා ද්‍රෝණි සහ ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා පළාතේ දායකත්වය සඳහා වන මැදිහත් වීම හඳුනා ගැනීම ඒ සඳහා ප්‍රජාවගේ දායකත්වය ලබා ගැනීම දැනුවත් කිරීම මඟින් එම වැඩසටහන් පළාත තුළ වඩා ඵලදායීව ක්‍රියාත්මක කිරීම.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයට විශේෂිත කාර්යය සාධන දර්ශක | අපේක්ෂිත නිමැවුමෙන් (Expected output) ලඟාකර ගත් සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| පළාත තුළ නාගරික හා අර්ධ නාගරික තුරු පියස සඳහා උද්‍යාන ස්ථාපිත කරන ලද සංඛ්‍යාව | √ | | |
| සංවේදී පරිසර කළාප සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද ස්ථාන සංඛ්‍යාව හා රෝපනය කරන ලද පැළ සංඛ්‍යාව | √ | | |
| "සුරකිමු ගංගා" ජාතික වැඩපිළිවෙලට සමගාමීව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව හා ගංගා ආශ්‍රිතව රෝපනය කරන ලද පැළ සංඛ්‍යාව | √ | | |
| කාර්ය මණ්ඩල අභිප්‍රේරණය හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරිම ක්‍රියාත්මක කල වැඩසටහන් ගණන | √ | | |

## අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්

- පළාත තුළ නාගරික හා අර්ධ නාගරික තුරු වියන් සහිත ස්වභාවික උද්‍යාන ස්ථාපිත කිරීම සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය සභාවල මැදිහත්වීමද සමඟින් අමාත්‍යාංශය මඟින් සුදුසු ස්ථාන 04 ක් හඳුනා ගැනීමෙන් අනතුරුව ,පළාත් පාලන දෙපාර්තමේන්තුව හරහා අදාල ප්‍රාදේශීය සභා මඟින් ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන ලදී. එසේ ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන ලද ස්වභාවික උද්‍යාන 04 න් දෙකක කටයුතු අවසන්ව මහජනතාවගේ භාවිතය සඳහා මේ වන විට ඉඩහසර ලබා දී ඇත. වැඩ නිම නොවූ උද්‍යාන දෙකෙහි වැඩි දියුණු කළ යුතු අංශ හඳුනාගෙන ඉදිරියේදී තව දුරටත් සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සැලසීමෙන් අනතුරුව මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා අවස්ථාව ලබා දීමට අපේක්ෂා කෙරේ.

- ප්‍රමාද වී තිබූ කාර්ය මණ්ඩල උසස්වීම් ක්‍රමවත් වැඩපිළිවෙළක් යටතේ ලබා දීමට කටයුතු කිරීම තුළින් සේවක අභිප්‍රේරණයක් ඇති කිරීමට හැකියාව ලැබී ඇත.
- නිලධාරීන් ඒකාකාරි රාජ්‍ය සේවයෙන් මුදවා කාර්යක්ෂමතාවය ඉහල නැන්වීම සඳහා දැනුවත් කිරීමේ හා ආකල්පමය වෙනසක් ඇති කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කොවිඩ් වසංගත තත්වය ඇතුළු පළාත තුළ පැතිර යන බෝවන රෝග තත්වයන් හා වකුගඩු රෝග ආදී බෝ නොවන රෝග තත්වයන් පාලනය කිරීම සඳහා කොවිඩ් 19 ආසාදන පාලන කමිටු හා සෞඛ්‍ය කමිටු පළාත් සභාව හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව පැවැත්වීම තුළින් එම රෝග පැතිර යෑම වැලැක්වීමට කටයුතු කිරීම. එසේම මහජනතාව දැනුවත් කිරීම සහ පූර්ණ එන්නත්කරණය සඳහා මහජනතාව පෙළඹවීම.
- අමාත්‍යාංශය විෂය පථයට අදාලව ක්‍රියාත්මක කළ හැකි නව ව්‍යාපෘති හඳුනා ගැනීම හා ඒවායින් සුදුසුම ව්‍යාපෘති ක්‍රියාවට නැන්වීමත්,අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයට අයත් සියළු දෙපාර්තමේන්තුවලට අදාළ සංවර්ධන ව්‍යාපෘති නිරීක්ෂණය කිරීමත් තුලින් ඒවායේ ගැටළු සහගත තත්වයන් මගහරවා ගැනීමට හැකියාව ලැබුණි.
- අමාත්‍යාංශයේ මෙන්ම දෙපාර්තමේන්තුවලද ඉදිරි වර්ෂය සඳහා සංවර්ධන අවශ්‍යතා තක්සේරු වාර්තා සකස් කරනු ලබන අතර ලැබෙන ප්‍රතිපාදන සීමාව අනුව වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබයි. එසේම මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මද පිළියෙළ කර එයට අනුව වාර්ෂික සංවර්ධන සැලැස්මේ වැඩසටහන් තීරණය කරනු ලබන අතර එම සැලසුම් සකස් කර නිසි පරිදි ඉදිරිපත් කර ඇත .
- 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරකම් සැලැස්ම ,ප්‍රසම්පාදන සැලැස්ම ,අක්මුදල් සැලැස්ම ,වියදම් සැලැස්ම අදාළ දර්ශකයන් හා ඉලක්කයන් හඳුනා ගෙන සකස් කරන ලද අතර අමාත්‍යාංශයට අදාළ අනෙකුත් දෙපාර්තමේන්තුවල මෙම සැලසුම් සකස් කිරීම සඳහා නිසි මඟ පෙන්වීමක් සහ ප්‍රතිපෝෂණයක් ලබා දෙමින් එහි කටයුතු මනා සම්බන්ධීකරණයකින් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇත.
- යතෝක්ථ දර්ශක හා ඊට අදාළ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ව්‍යාපෘති සම්පාදනය මෙහෙයුම් කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගිණුම්කරණ මෙහෙයුම් පද්ධතිය ,වත්කම් කළමණාකරණ පද්ධතිය පවත්වාගෙන යෑම ,තොරතුරු තාක්ෂණය පිළිබඳ ආයතනයේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය කරන මේ සඳහා ඔවුන්ගේ ධාරිතාවය ඉහළ නැංවීමට කටයුතු කර ඇත.

## තිරසර සංවර්ධන අරමුණු ( SDG) ලඟාකර ගැනීමේ කාර්යය සාධනය

තිරසාර සංවර්ධන අරමුණු පාදක කරගෙන සකස් කරන ලද ඉලක්ක හා දර්ශක මඟින් උතුරු මැද පළාත සඳහා සුවිශේෂීව හඳුනා ගන්නා ලද, 2021 සංවර්ධන කාර්ය වැඩසටහන ශක්තිමත් සමාජ සංවර්ධනයක් සහතික කිරීම සහ වඩා නිරෝගිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම මඟින් සංවර්ධනයේ තිරසාර බව තහවුරු කිරීමට 2021 වර්ෂයේ දැක්වූ දායකත්වය එම වර්ෂයේ කොවිඩ් වසංගත තත්වය පැවතුණද එම ඉලක්ක සපුරා ගැනීමට හැකි විය.

තවද, මෙම කොවිඩ් වසංගත තත්වය මධ්‍යයේ පළාතේ රැකවරණය අවශ්‍ය වැඩිහිටියන්ගේ ආරක්ෂාව සහතික කිරීම හා ඔවුන් රැකබලා ගැනීම, අනාථ අත්හල අසරණභාවයට පත් වූ ළමුන්ගේ ආරක්ෂාව හා රැකවරණය සැළසීම ඔවුන් සමාජගත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව හා පරිවාස දෙපාර්තමේන්තුව ලැබූ ජයග්‍රහණයකි.

පළාතේ 85 ක් බටහිර සෞඛ්‍ය ආයතන හා 47 ක් වන ආයුර්වේද රෝහල් හා මධ්‍යස්ථාන මඟින් රෝග නිවාරණ හා සත්කාරක සේවය අඛණ්ඩව ලබා දෙමින් කොවිඩ් වසංගත තත්වයෙන් පීඩාවට පත් වූ ප්‍රජාව සඳහා ප්‍රතිකාරක සේවාවන් නිරෝධායන ක්‍රියාවලින් අඛණ්ඩව පවත්වාගෙන යෑම හා එන්නත්කරණය ඉහළ මට්ටමකට ගෙන ඒමට කටයුතු කිරීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම අමාත්‍යාංශයේ අනෙකුත් දෙපාර්තමේන්තු ඒකාබද්ධව සිදු කරනු ලැබ ඇත.

තවද ප්‍රතිපාදන සීමාවීම් මධ්‍යයේ වුවද පරිසර ආරක්ෂණ හා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් තිරසාර පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා විවිධ පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

මේ අතර ආයතනය ලැබූ ජයග්‍රහණයන් සැකෙවින් පහත පරිදි වේ.

1. කොවිඩ් වසංගත තත්වය පාලනය කිරීම සඳහා අන්තර් පාර්ශවීය මනා සම්බන්ධතාවයකින් කටයුතු කිරීම.
   i. වයස අවුරුදු 60ට වැඩි පුද්ගලයන් ගෙන් 95% ක ප්‍රතිශතයකට පළමු මාත්‍රාවද, 90% කට දෙවන මාත්‍රාවද, 70% කට තුන්වන මාත්‍රාවද එන්නත් කරන ලදි.
   ii. වයස අවුරුදු 16-19 අතර වයස් කාණ්ඩයේ පුද්ගලයන්ගෙන් 90%ක ප්‍රතිශතයකට පලමු මාත්‍රාවද ,40% කට දෙවන මාත්‍රාවද ලබා දෙන ලදි.
   iii. වයස අවුරුදු 12 -15 අතර වයස් කාණ්ඩයේ පුද්ගලයන්ගෙන් 80%කට පලමු මාත්‍රාව ලබාදෙන ලදි.
   iv. ප්‍රතිකාර මධ්‍යස්ථාන 10ක් මඟින් වෙන්කර ප්‍රතිකාර පහසුකම් සැපයීම මෙන්ම එම ප්‍රතිකාර මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම පවත්වාගෙන යාම.
   v. කොවිඩ් වසංගත තත්වය පාලනය කිරීම සඳහා ප්‍රජාව පදනම් කරගත් ශක්තිමත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් ප්‍රතිශක්තිකරණය වර්ධනය කිරීම යහපත් සෞඛ්‍ය පුරුදු ජනතාව තුළ ස්ථාපිත කිරීම.
   vi. ප්‍රතිශක්තීකරණය වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ආයුර්වේද ඖෂධ ප්‍රජාව වෙත බෙදා හැරීම සහ දැනුවත් කිරීම.
   vii. පළාතේ දැඩි සත්කාර ඒකකවල (HDU) පහසුකම් වැඩිදියුණු කිරීම හා දැඩි සත්කාර ඒකකවල ධාරිතාව වැඩිකිරීම.

2. ප්‍රාදේශීය රෝහල් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන නවීකරණය කිරීම, වැඩිදියුණු කිරීම හා එහි පහසුකම් ඉහළ නැංවීම මඟින් ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රතිකාරක හා නිවාරණ කටයුතු වර්ධනය කිරීම.
3. ප්‍රාථමික සෞඛ්‍ය (PSSP) සේවාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය හා ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය (ADB) යටතේ පර්යන්ත රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන වැඩිදියුණු කිරීම මඟින් සෞඛ්‍ය සේවාව සඳහා සම ප්‍රවේශයක් සහතික කිරීම සඳහා සහය වීම.
4. බෝ නොවන රෝග ව්‍යාප්තිය සඳහා අවදානම් සාධක අවම කිරීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම.
   ආහාර හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීම. ශාරීරික ව්‍යායාම සඳහා පෙළඹීම සුව දිවි සායන 50 ක් ක්‍රියාත්මක කිරීම.

බෝ නොවන රෝගවලට අවධානමක් සහිත පුද්ගලයන් හඳුනා ගනීම සඳහා පූර්ණ හඳුනා ගැනීමේ පරීක්ෂණ කිරීම හා අවදානම් සහිත කණ්ඩායම් දැනුවත් කිරීම.

5. මාතෘ හා ළමා සායන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා අවශ්‍ය උපදේශනය දැනුවත් කිරීම මඟින් දරුවන්ගේ පෝෂණ තත්වය ඉහළ නැන්වීම සඳහා කටයුතු කිරීම.
6. තඹුත්තේගම, මැදවච්චිය, කැබිතිගොල්ලෑව, පදවිය, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ මූලික රෝහල්වල පවතින රුධිර කාන්දුකරණ ඒකක සඳහා නව පිරිපහදු ස්ථාපිත කිරීම හා අවශ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම මඟින් එම ඒකකවල ධාරිතාව ඉහළ නැංවීම.
7. ග්‍රාමීය මට්ටමේ සායන මධ්‍යස්ථාන 35ක් නවීකරණය වැඩි දියුණු කිරීම මඟින් විවිධ සායන කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
8. වෛද්‍යවරුන් හා විශේෂඥ වෛද්‍යවරුන්ගේ හා අනෙකුත් කාර්ය මණ්ඩල සඳහා නිල නිවාස ලබා දිම මඟින් ප්‍රජාව සඳහා ප්‍රතිකාර කටයුතු අඛණ්ඩව ලබා දීමට හැකිවීම.
9. සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ප්‍රමාද වී පැවති උසස්වීම් 200ක් ද සේවය ස්ථිර කිරීම් 300ක් ද ලබා දීම මඟින් සෞඛ්‍ය සේවකයන්ගේ තෘප්තිමත්භාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.
10. ආයුර්වේද ප්‍රතිකාරක සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම හා රෝගීන් 50,000කට ප්‍රතිකාර සේවාව ලබා දීම මෙන්ම සමබර ජීවන රටාවක් සඳහා උපදේශනය ලබා දීම.
11. පළාතේ ඖෂධ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා තෙල්හිරියාව ඖෂධ නිෂ්පාදනාගාරය මඟින් 100,000Kg ක ඖෂධ නිෂ්පාදනය කිරීම හා ඒවා රෝහල් වෙත බෙදා හැරීම.
12. අනුරාධපුර ආයුර්වේද රෝහලේ ගෙවීම් ප්‍රතිකාරක සේවාව පවත්වාගෙන යෑම මඟින් රු.1,867,750/- කින් රජයේ ආදායම ඉහළ නැංවීම.
13. ප්‍රාදේශීය රෝහල්වල අත්‍යාවශයෙන්ම හඳුනා ගනු ලැබූ අවශ්‍යතාවයන් සපුරාලීම මඟින් එම රෝහල් 10ක භෞතික පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කිරීම.
14. පාරම්පරික වෛද්‍යවරුන් සඳහා අවශ්‍ය පුහුණුව හා ඔවුන්ගේ ප්‍රතිකාර සේවාවන් බාධාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහා මූල්‍යමය ආධාර ලබා දිම.
15. පැවති කොවිඩ් වසංගත තත්වය යටතේ වැඩිහිටියන් 314ක් සඳහා රැකවරණය සැළසීම අවශ්‍ය ප්‍රතිකාර කටයුතු සිදු කිරීම තුළින් වැඩිහිටි ජනගහනය ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම.
16. ප්‍රතිලාභීන් සඳහා රෝගාධාර, වැඩිහිටි ආධාර, වකුගඩු ආධාර ප්‍රතිලාභීන් 2500 සඳහා ලබාදීම හා කොවිඩ් වසංගත තත්වය යටතේ වෙනත් ප්‍රදානයන් ලබා දීම.
17. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා ආයතනගතව සියළු පහසුකම් ලබාදෙමින් ඔවුන්ගේ වෘත්තීය පුහුණු අවශ්‍යතා ලබා දීම.
18. අනාථ,අත්හල,අසරණ ළමුන් 435ක් රැකබලා ගැනීම, ඔවුන්ගේ නෛතික ප්‍රශ්නවලට සහායදීම, අධ්‍යාපන පහසුකම් සැපයීම, වෘත්ති පුහුණු ලබා දීම හා සමාජගත කිරීම.
19. ළමා නිවාසවල අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සපුරාලීම මඟින් ළමුන් සඳහා ගුණාත්මක සේවාවන් ලබා දීම.





පළාත තුල නාගරික සහ අර්ධ නාගරික තුරුවියන් සහිත ස්වභාවික උද්‍යාන ස්ථාපිත කිරීම.








සංවේදී පරිසර කළාප සංරක්ෂණය සහ ප්‍රවර්ධනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම







## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්ක ලඟාකර ගැනීමට ආයතනය අරමුණ කළ සැළසුම් | 2021.12.31 දිනට ඉලක්ක කරා ලඟා වීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| ගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය,තිරසර වනාන්තර කළමණාකරණය,කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම ප්‍රතිස්ථාපනය කර ප්‍රවර්ධනය කිරීම භූමි හායනය නැවැත්වීම සහ ප්‍රතිර්ත්‍යානය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම. | භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නාවූ සේවාවන් විශේෂ වනාන්තර කඳු හා වියලි බිම් අන්තර් ජාතික ගිවිසුම් වලට අනුකූල වන පරිදි සංරක්ෂණය නැවත නගා සිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරිම . | උතුරු මැද පළාත තුල පවතින වන ගහනය ඉහල නැංවීම සඳහා හඳුනාගත් ස්ථාන වල රුක් රෝපනය<br>• නාගරික හා අර්ධ නාගරික ස්ථානවල ස්වභාවික උද්‍යාන 4ක් ස්ථාපිත කිරීම<br>• සංවේදී පරිසර කළාප සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද ස්ථාන සංඛ්‍යාව හා රෝපනය | | | √ |
| | 2030 වන විට සියළුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමණාකරණය කිරිම ප්‍රවර්ධනය, වන විනාශය නැවැත්වීම,විනාශයට පත්වූ වනාන්තර යථාතත්වයට පත්කිරිම සහ ජගත් මට්ටමින් වන රෝපනය හා නැවත වන වගාව වර්ධනය කිරිම | උතුරු මැද පළාතේ ප්‍රජාව සතුව පවතින පාරිසරික දැනුම ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය | | | √ |
| | 2030 වන විට කාන්තාරීකරණය තුරන් කිරිම, කාන්තාරීකරණය,නියඟය සහ ගංවතුර නිසා බලපෑමට ලක්වූ ඉඩම් සහ පස නැවත යතාතත්වයට පත් කිරිම තහවුරු කිරිම. | තිරසර පාරිසරික සංරක්ෂණය හා ප්‍රවර්ධනය | | | √ |
| | 2030 වන විට තිරසර සංවර්ධනය සඳහා අතවශ්‍යා ප්‍රතිලාභ ගෙන දීමට ඒවායේ ධාරිතාව ඉහල නැංවීම සඳහා ජෛව විවිධත්වයද සමගින් කඳුකර පරිසර පද්ධති සංරක්ෂණය කිරිම. | | | | √ |

පවතින කොවිඩ් වසංගතය තත්වය හමුවේ පළාතේ මහජනතාව වෙත ලබා දුන් සේවාවන්

| අනු අංකය | ලබා දුන් සේවාවන් | ක්‍රියාත්මක කරන ලද ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | සහය දැක්වූ ආයතන |
|---|---|---|---|---|
| 01 | ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් සති 2 කට වරක් කොවිඩ් රෝග පාලන කමිටුව සහ පළාත් සෞඛ්‍ය කමිටුව මේ සම්බන්ධ විවිධ පාර්ශව කරුවන්ගේ සහභාගීත්වයෙන් පවත්වා අවශ්‍ය උපදෙස් තීන්දු තීරණ ගැනීම හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කරදීම සිදුකිරීම. | පළාත් සභාව | පළාතේ ජනගහනය | • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>• පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>• සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය<br>• ශ්‍රී ලංකා යුධ හමුදාව<br>• පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>• අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• ශ්‍රී ලංකා පොලීසිය<br>• පළාත් සමූපකාර දෙපාර්තමේන්තුව<br>• නගර සභාව<br>• අනෙකුත් අත්‍යාවශ්‍ය සේවා ලබන ආයතන |
| 02 | අන්තර් ප්‍රතිකාරක මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම හා අන්තර් ප්‍රතිකාර කටයුතු සිදු කිරීම | කැබිතිගොල්ලෑව ගල්කිරියාගම | රෝගීන් 6000 | • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>• පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>• සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය<br>• ශ්‍රී ලංකා යුධ හමුදාව<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• ශ්‍රී ලංකා පොලීසිය<br>• ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩල |
| 03 | රෝහල තුල සහ නිවාස තුල කොවිඩ් රෝගය සඳහා ප්‍රතිකාර කටයුතු සැපයීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම | තඹුත්තේගම, කැකිරාව, තම්මැන්නාව, ගලෙන්බිඳුනුවැව, මෙත්සිරිසෙවන සහ හිඟුරක්ගොඩ, වැලිකන්ද, මනම්පිටිය යන රෝහල් | රෝගීන් 60000 | • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>• පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>• සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය<br>• ශ්‍රී ලංකා යුධ හමුදාව<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• ශ්‍රී ලංකා පොලීසිය<br>ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩල |
| 04 | එන්නත්කරණය සිදු කිරීම අවු: 20 ට වැඩි පුද්ගලයන් 90% කට එන්නත් මාත්‍රා දෙකම ලබා දෙන අතර එන්නත් මාත්‍රා තුනම ලබා ගත් ප්‍රතිශතය 70% කි. අවු: 16 – 19 පාසැල් ළමුන් සඳහා පළමු මාත්‍රාව 90% , අවු 12 - 15 පාසල් ළමුන් සඳහා පළමු මාත්‍රාව 80% ලබා දෙන ලදී. ඒ අනුව , සමස්ත එන්නත් කරණයේ ඉහල ප්‍රතිශතයක් වාර්තා කිරීම සඳහා සහය ලබා දීම | පළාත තුල පිහිටි එන්නත් කරණ මධ්‍යස්ථාන | පළාත තුල ජනගහනය 90% ආසන්නව | • දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>• පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව<br>• සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය<br>• ශ්‍රී ලංකා යුධ හමුදාව<br>• පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>• අධ්‍යාපන දෙපාර්තමේන්තුව<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>• ශ්‍රී ලංකා පොලීසිය<br>• පළාත් සමූපකාර දෙපාර්තමේන්තුව<br>• නගර සභාව<br>• අනෙකුත් අත්‍යාවශ්‍ය සේවා ලබන ආයතන |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2021 වර්ෂයේදී මුහුන පෑමට සිදුවූ කොවිඩ් වසංගතය හේතුවෙන් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය ලෙස ඉතා වැදගත් කාරය භාරයක් කිරිමට සිදුවිය. කෝවිඩ් වසංගතය ජය ගැනීම උදෙසා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව හා එක්ව පළාතේ සියළු රෝහල් සඟදහා පහසුකම් සැපයිම කළමනාකරනය, අධීක්ෂණය හා සම්බන්ධීකරණය පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සිදු කරන ලදී. මේවන විට මෙත්සිරි සෙවන, කැබිතිගොල්ලෑව හා නොච්චියාගම රෝහල් කොවිඩ් ප්‍රතිකාර මද්‍යස්ථාන ලෙස පවත්වාගෙන යන අතර එහි කටයුතු නියාමනය සඳහා අවශ්‍ය සහයද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය දෙනු ලබයි.

පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අමාත්‍යාංශයට අයත් සියලු දෙපාර්තමේන්තුවල කාර්යයන් නියාමනය, ප්‍රතිපත්ති සම්පාදනය, අධීක්ෂණය, ප්‍රගති සමාලෝචනය, මෙහෙයවීම හා සම්බන්ධීකරණය යන කාර්යයන් ඉටු කිරීමේදී ඉහල කාර්ය සාධනයක් අප විසින් අත්පත් කරගෙන ඇති අතර දෙපාර්තමේන්තු වල කාර්ය සාධන ඉලක්ක සාධනීය ලෙස ඉටු කර තිබීම මගින් එය තව දුරටත් තහවුරු වේ.

ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකුව යන ආයතන වල මූල්‍ය ප්‍රතිපාදන මත 2020 වර්ෂයේදී ක්‍රියාත්මක වූ සහ 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ සෞඛ්‍ය ආංශික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හා සැලසුම් කරණයේදී මෙම අමාත්‍යාංශයේ දායකත්වය ඉතා ඉහල අගයක් ගත් අතර එම හේතුන් නිසාම එම වැඩසටහන් 2021 වර්ෂය තුලදී සාර්ථකව නිම කිරීමට අදාළ දෙපාර්තමේන්තු වලට හැකියාවක් ලැබිණි. පළාත් ආයුර්වේද, සමාජසේවා හා පරිවාස යන දෙපාර්තමේන්තු වල ඵලදායීතාවය ඉහල නංවාලීම සඳහාද මෙම අමාත්‍යාංශයේ දායකත්වය අප විසින් ලබාදුන් අතර එම දෙපාර්තමේන්තුවලද කාර්ය සාධනය ඉහල නංවාලමින් ප්‍රශස්ත මහජන සේවාවක් 2021 වර්ෂයේදී ලබා දීමට ඔවුන් හට හැකියාවක් ලැබී ඇති බව එම දෙපාර්තමේන්තුවල සංවර්ධන ඉලක්ක පරික්ෂා කර බැලීමේදී පැහැදිලි වේ. ඒ අනුව 2021 වර්ෂයේදී ලබාගත් අත්දැකීම් උපයෝගී කරගෙන 2022 වර්ෂය සඳහා ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

# 8.1.පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත තුල රෝග නිවාරණ , ප්‍රතිකාර, සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ පුනරුත්ථාපන සේවා මඟින් සතුට හා සෞභාග්‍ය ලබාදීමට සෞඛ්‍ය කාර්යයන් හා වැඩසටහන් මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පාලනය සිදු කිරීමේ වගකීමට බැඳී සිටින උතුරු මැද පළාත් පළාත් සභාවට අයත් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වනු ලබන සංවිධානමය ව්‍යුහය පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවයි.

මෙහිදී දිස්ත්‍රික් මට්ටමින් සේවාවන් සැපයීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ අනුරාධපුර ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ පොළොන්නරුව ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය පිහිටුවා ඇත. මෙම දෙපාර්තමේන්තුව මඟින් පාසල් ප්‍රජාව, පූර්ව ළමාවිය සංවර්ධන ප්‍රජාව, අබාධ සහිත දරුවන් රැකබලා ගන්නා ප්‍රජාව, වැඩිහිටි සමාජ ප්‍රජාව, මානසික සහන සෞඛ්‍ය ප්‍රවර්ධන මධ්‍යස්ථාන, ආහාර සෞඛ්‍ය හා පරිහරණ සුරක්ෂිතතාව සම්බන්ධ මධ්‍යස්ථාන හා පෞද්ගලික වෛද්‍ය සේවා මධ්‍යස්ථාන නියාමනය වන අනෙකුත් ආයතන ව

**පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන පද්ධතිය**

| ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල | 01 | - | 01 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 01 | 01 | 02 |
| සෞඛ්‍ය නිලධාරී කාර්යාලය | 22 | 08 | 30 |
| මූලික රෝහල් | 06 | 03 | 09 |
| ප්‍රාදේශීය රෝහල් (ඒ ශ්‍රේණිය) | 01 | 00 | 01 |
| ප්‍රාදේශීය රෝහල් (බී ශ්‍රේණිය) | 10 | 05 | 15 |
| ප්‍රාදේශීය රෝහල් (සී ශ්‍රේණිය) | 22 | 03 | 25 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාරක ඒකක | 21 | 16 | 37 |
| ක්ෂය රෝග මර්ධන සායන මධ්‍යස්ථාන | 01 | 01 | 02 |
| ලිංගාශ්‍රිත බෝවන රෝග නිවාරණ ඒකක | 01 | 01 | 02 |
| වාහන සේවා මධ්‍යස්ථාන | 01 | - | 01 |
| පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පුහුණු ඒකකය | 01 | - | 01 |
| **එකතුව** | **87** | 38 | **125** |

ඒ ශ්‍රේණිය - ඇඳන් 100ට අඩු බී ශ්‍රේණිය - ඇඳන් 50-100 සී ශ්‍රේණිය - ඇඳන් 50ට අඩු

**මහජන සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාස - 110**

**පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී කොට්ඨාස - 44**

### පළාතේ මහජනතාව සඳහා සපයනු ලබන සේවාවන්

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|
| බාහිර රෝගීන් | අනුරාධපුර | 2,645,417 | 2,635,718 | 2,224,028 | 2,213,126 | 2946311 | 2185465 |
| | පොළොන්නරුව | 856,179 | 880,498 | 854,620 | 893,141 | 954569 | 954569 |
| | එකතුව | 3,501,596 | 3,516,216 | 3,078,648 | 3,106,267 | 3900880 | 3140034 |
| නේවාසික රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 183,981 | 180,066 | 172,567 | 186,322 | 183156 | 164521 |
| | පොළොන්නරුව | 64,373 | 61,995 | 59,372 | 62,361 | 39706 | 39706 |
| | එකතුව | 248,354 | 242,061 | 231,939 | 248,683 | 222862 | 204227 |
| සායනික ප්‍රතිකාර සේවා රෝගීන් සංඛ්‍යාව | අනුරාධපුර | 474,629 | 534,822 | 473,558 | 2,399,448 | 664377 | 542655 |
| | පොළොන්නරුව | 179,101 | 227,110 | 227,032 | 955,502 | 244914 | 244914 |
| එකතුව | | 653,730 | 761,932 | 700,590 | 3,354,950 | 909291 | 787569 |

### නිවාරණ සෞඛ්‍ය සේවාවන් සැපයීම

| | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂක කොට්ඨාශ | 72 | 38 | 110 |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් | 61 | 29 | 90 |
| පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාශ | 298 | 148 | 446 |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් | 236 | 128 | 364 |
| ග්‍රාමීය සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන | 194 | 107 | 301 |

## පළාතේ සෞඛ්‍ය දර්ශක 2014 – 2020

| විස්තරය | දිස්ත්‍රික්කය | 2014 | 2015 | 2016 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතය (සජීවී උපත්1000 ට) | අනුරාධපුර | 10.9 | 16.7 | 16.7 | 16.7 | 7.9 | 7.9 |
| | පොළොන්නරුව | 9.2 | 11.6 | 7.5 | 7.5 | 10.1 | 10.1 |
| මාතෘ මරණ අනුපාතය (සජීවී උපත්1000 ට) | අනුරාධපුර | 28.4 | 47.7 | 32.0 | 32 | 25.8 | 33.7 |
| | පොළොන්නරුව | 27.4 | 28.4 | 28.0 | 28 | 13.3 | 13.3 |
| දළ උපත් අනුපාතය (පුද්ගලයින් 1000 ට) | අනුරාධපුර | 17.8 | 17.3 | * | - | - | - |
| | පොළොන්නරුව | 17.7 | 16.9 | * | - | - | - |
| දළ මරණ අනුපාතය ( පුද්ගලයින් 1000 ට) | අනුරාධපුර | 5.5 | 5.8 | * | - | - | - |
| | පොළොන්නරුව | 5.5 | 5.2 | * | - | - | - |
| මන්දපෝෂණ තත්වය(වයස 05ට අඩු - අඩු බර) | අනුරාධපුර | - | - | - | - | 22.2 | 15.3 |
| | පොළොන්නරුව | - | - | - | - | 16.6 | 16.6 |

## දැක්ම

" නීරෝගිමත් ජනතාවක් සමෘද්ධිමත් පළාතක් "

## මෙහෙවර

"නිවාරණ සහ රෝග නිවාරණ සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම, සමාජ බලමුලු ගැන්වීම සහ සවිබල ගැන්වීම, අන්තර් ආංශික සම්බන්ධීකරණය සහ පර්යේෂණ සංවර්ධනය සාධාරණ හා සමානාත්මක ආකාරයකින් ප්‍රජාවට සපයන සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න සහ ධනවත් ප්‍රජාවක් නිර්මාණය කිරීම.".

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාතේ සෞඛ්‍ය ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- උතුරු මැද පළාතට සුවිශේෂ වූ සෞඛ්‍ය ගැටළු වන වකුගඩු රෝග, වසවිස ශරීරගතවීම සහ පිළිකා රෝග තත්ත්වයන් අවම කිරීම.
- ප්‍රාදේශීය රෝහල් මගින් ගුණාත්මක ප්‍රතිකාර සේවාවක් ලබාදීම සහ පළාතේ මූලික රෝහල් අංග සම්පූර්ණ පහසුකම් සහිත රෝහල් ලෙස වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රජා දායකත්වය සහ අන්තර් පාර්ශවීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම.
- ආයතනික ධාරිතා වර්ධනය
- උතුරු මැද පළාතේ රෝග වලක්වා ගැනීමේ සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනය.

## කෙටි කාලීන අරමුණු

- ගෝලීය සෞඛ්‍ය ආවරණයක් ලබාදීම.
- වාර්ෂිකව වෙන් වන ප්‍රතිපාදනයන් කාර්යක්ෂම ලෙස ආයෝජනය කිරීම.
- ප්‍රමුඛතාවය මත හදුනාගත් ඉලක්කගත වැඩසටහන් කාලානුරූපව ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය.
- වකුගඩු රෝග හා බෝ නොවන රෝග කළමනාකරණයේදී හදුනාගත් රෝහල් සඳහා අවශ්‍ය පහසුකම් ලබාදීම.
- වසවිස ශරීරගතවීම් සහ පිළිකා තත්ත්වයන් කළමනාකරණය ඉලක්ක සහගත ලෙස ක්‍රියාත්මක *කිරීම.*
- හදිසි ආපදා තත්වයන් ඇති වීමේදි අවශ්‍ය වන සෞඛ්‍ය සේවාව කළමණාකරණය කිරීම.
- තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ කාර්යක්ෂම කිරීම.
- පෝෂිත පරපුරක් බිහිකිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

1. රෝග පූර්ව හඳුනා ගැනීමේ සේවා.
2. රෝග ප්‍රතිකාර සේවාව.
3. රෝග නිවාරණ සේවාව.
4. පර්යේෂණ සඳහා දායකත්වය.
5. නවක සෞඛ්‍ය කාර්ය මණ්ඩල පුහුණු.
6. අඛණ්ඩ කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය.
7. පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමනය.
8. ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරීම.
9. නිවාරණ සේවා වැඩිදියුණු කිරීම.
10. සංවිධානාත්මක සහ කළමණාකරණ සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- Covid 19 වසංගත රෝග තත්වයට අදාල ජාතික මාර්ගෝපදේශයන් හා වැඩසටහන් පළාත තුල ක්‍රියාත්මක කිරීම.
- ප්‍රම්පාදන ක්‍රියාවලිය විධිමත්ව ක්‍රියාත්මක කොට අධීක්ෂණය කිරීම.
- පුහුණු වැඩසටහන් දත්ත පද්ධතියක් මගින් යාවත්කාලීන කිරීම.
- කාර්ය මණ්ඩල තොරතුරු හා පෞද්ගලික ලිපිගොනු, වැටුප් වර්ධක, පත්වීම් සම්බන්ධයෙන් ඉලක්ක සහගත ලෙස කළමනාකරණය සිදු කිරීම.
- පුහුණුකරුවන් පුහුණු කිරීම්, දැනුවත් කිරීම් සහ දැනුවත් කිරීම් වැඩසටහන් ගුණාත්මක ලෙස සිදු කිරීම.
- සෞඛ්‍ය ආයතන ආයෝජනයේදී ප්‍රතිකාර සේවා සඳහා ප්‍රමුඛතාවය ලබා දීම.
- ප්‍රදේශයේ ඇති සෞඛ්‍ය ආයතන අදාල ශ්‍රේණියට අනුව සියළු පහසුකම් ලබා දිය හැකි සෞඛ්‍ය ආයතන ලෙස ක්‍රියාත්මක කිරීම.
- පළාත තුළ ක්‍රියාත්මක වන පර්යේෂණ හා සමීක්ෂණ, පළාත් පර්යේෂණ හා සමාලෝචන කමිටුව මගින් නියාමනය කිරීම.

## අංශය නියෝජනය කරන
## තිරසර සංවර්ධන අරමුණු යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්

**03**

**නීරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම**

3 GOOD HEALTH AND WELL-BEING

- මාතෘ හා ළමා මරණ අවම කිරීම
- සරම්ප ප්‍රතිශක්තිකරණ ආවරණය වැඩිකිරීම
- දිළිඳුකම හේතුකරගෙන ළමා වියේදී ඇතිවන අයහපත් සංකූලතා අවම කිරීම
- එච්.අයි.වී සහ මැලේරියා රෝගීන්ගේ ව්‍යාප්තිය අවමකිරීම
- වකුගඩු රෝග ව්‍යාප්තිය අවම කිරීම සහ රෝගීන් කල්තබා හඳුනාගෙන ප්‍රතිකාර සිදුකිරීම,
- සියදිවි නසාගැනීම් සහ ස්වයංහානි කරගැනීමට තැත් කිරීම් අවම කිරීම
- මාතෘ හා ළමා මන්ද පෝෂණ තත්ත්වය අවම කිරීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 5187ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 4147 කි. පුරප්පාඩු සංඛ්‍යාව 1040ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| වාහන | 654.32 | 654.32 | - | 100 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 861.37 | 861.37 | - | 100 |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 193.58 | 193.58 | - | 100 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 674.32 | 674.32 | - | 100 |
| ඉඩම් අත්පත් කර ගැනීම | 989.90 | 989.90 | - | 100 |
| **එකතුව** | 3,373.49 | 3,373.49 | - | 100 |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

**සෞභාග්‍ය දැක්ම**

- සෑම දිස්ත්‍රික්කයම තෝරාගත් රෝහලක් දැනට කොළඹ ජාතික රෝහල මෙන් සියලු වෛද්‍ය ප්‍රතිකාර, ශල්‍යාගාර පහසුකම් සහ රසායනාගාර පහසුකම් වලින් යුත් අංග සම්පූර්ණ රෝහලක් බවට පත් කෙරේ.
- දිවයිනපුරා ඇති අනෙකුත් සෑම රෝහලක්ම අවශ්‍ය වෛද්‍යවරුන්, හෙද කාර්යමණ්ඩල, රසායනවේදී සහ අනෙකුත් සේවයන්, බෙහෙත් සහ නවීන රසායනාගාර පහසුකම් වලින් අංග සම්පූර්ණ කිරීමට කටයුතු කෙරේ. සියලුම බාහිර රෝගී ප්‍රතිකාර සේවා මෙම රෝහල් වලට පවරනු ලැබේ. එම රෝහල් මඟින් අදාළ රෝගීන් නියමිත රෝහල් වෙත යොමු කිරීමේ ක්‍රමවේදයක් ස්ථාපනය කෙරේ.
- රෝහල් වල දැනට ඇති තදබදය අඩු කිරීම සඳහා විවිධ විශේෂඥ වෛද්‍ය උපදෙස් මත රෝගී ප්‍රතිකාර සේවාවන් නවීකරණය කර ක්‍රියාත්මක කෙරේ.
- රෝහල් වල සියලු අලුත්වැඩියා කටයුතු හා නඩත්තු කිරීම් ප්‍රමාදයකින් තොරව පවත්වාගෙන යාම, නේවාසික රෝගීන් සඳහා අවශ්‍ය අඳන් හා අනෙකුත් පහසුකම් හිඟයකින් තොරව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් ජනතාවට වගකියන යාන්ත්‍රණයක් සකස් කෙරේ.
- සියලුම රජයේ සහ පෞද්ගලික රෝහල් සහ රසායනාගාර ශීඝ්‍ර තත්ත්ව සහතික ප්‍රමිතවලට අනුව පවත්වාගෙන යාම අනිවාර්ය කිරීම මඟින් රෝගීන්ට සහ කාර්යමණ්ඩල වලට සෞඛ්‍යාරක්ෂිත පරිසරයක් ඇති කෙරේ.
- සියලු රෝහල් , බෙහෙත් ශාලා සහ රසායනාගාර නියාමනය සඳහා "නියාමනය අධිකාරියක" ස්ථාපනය කර ජනතාවගේ සෞඛ්‍ය සේවාවන් පිළිගත් ප්‍රමිතීන් තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියාමන පරිසරයක් ඇති කෙරේ.
- අත්‍යාවශ්‍ය ඖෂධවල අවම ආරක්ෂක තොග මට්ටම් පවත්වා ගැනීම අනිවාර්ය කිරීම මඟින් හිඟයකින් තොරව ඖෂධ ඇතුළු සියලු භාණ්ඩ රෝහල් වලට සැපයීම සහතික කෙරේ.
- බෝ වන රෝග මර්දනයේ දී සෞඛ්‍ය අමාත්‍යාංශයට අමතරව සියලුම පළාත් පාලන හා ප්‍රාදේශීය පරිපාලන ඒකක සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කෙරේ.
- කායික සෞඛ්‍ය මෙන්ම මානසික සෞඛ්‍යද යහපත්ව පවත්වාගෙන යාම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන නොමිලේ සේවය ලබා ගත හැකි ජංගම දුරකථන සේවාවක්ද සහිත අන්තර්ජාල මනෝ උපදේශන සේවාවක් සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ආරම්භ කෙරේ.
- ප්‍රජා සෞඛ්‍ය නිලධාරින්, හෙදියන් හා නිලධාරීන්ට නව තාක්ෂණික උපකරණ හා පහසුකම් ලබා දීම මඟින් වඩාත් පහසුවෙන් සේවාව සැපයීමට හැකි වාතාවරණයක් සකස් කෙරේ.
- හෙදි පුහුණු පාසල්වල තත්ත්වය උපාධියක් දක්වා උසස් කිරීමට කෙරේ.
- සමාජය තුළ සීග්‍රව ව්‍යාප්ත වෙමින් යන දුම්පානය සහ මත්පැන් පානය දුරලීම සහ මත් ද්‍රව්‍ය භාවිතය මුලිනුපුටා දැමීමේ ව්‍යාප්තියක් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රඥප්තියට අනුව සැකසීමට කටයුතු කෙරේ.

## ශදුඅත විශ්ලේශනය තුළින් අංශය පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය




| | |
|---|---|
| **ශක්තීන්**<br>**1.** සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් එක්ව **whatsapp group** එකක් සාදා එමගින් අවම වශයෙන් මාසිකව **Covid** පිළිබඳ දැනුම යාවත් කාලීන කරන ලදී.<br>**2.** එමගින් **PPE Kit, PCR, RAT** පරීක්ෂණ පිලිබද ගැටළු නිරාකරනය කර ගන්නා ලදී.<br>**3.** **Covid** රෝගීන් සඳහා නිවසේදී ප්‍රතිකාර, අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන, ප්‍රතිකාර මධ්‍යස්ථාන, දැඩිසත්කාර ඒකක පිහිටුවන ලදී.<br>**4.** ඔක්සිජන් අවශ්‍යතාවය ඇති රෝගීන්ට ඒ සඳහා ඇඳන් 80ක් සඳහා **wall** ඔක්සිජන් සපයන ලදී.<br>**5.** **Covid** රෝගීන් සඳහා පළාත තුල ඇදන් 1500කට අධික ප්‍රමාණයක් ස්ථාපිත කරන ලදී.<br>**6.** **Covid** එන්නත්කරණ ක්‍රියාවලිය අවු.**30**ට වැඩි අය සඳහා **90%** වැඩි ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇත.<br>**7.** **Zoom** තාක්ෂණය ඔස්සේ රාජ්‍ය ආයතන සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්විණි. | **දුර්වලතා**<br>**1.** කාර්ය මණ්ඩලයද **Covid** වසංගතයට ගොදුරු වීමෙන් අපහසුතා ඇතිවුණි.<br>**2.** එම නිසා නිවසේදී ප්‍රතිකාර ගන්නා රෝගීන්ට යම් අපහසුතාවයන් ඇති විය.<br>**3.** ඇදිරි නීතිය පැනවීමත් සමඟ රෝගීන් රෝහල් වෙත යැවීමට බාධා ඇති විය.<br>**4.** රෝගී වූ අවස්ථාවේදී නියමිත අවස්ථාවේදී ප්‍රතිකාර සඳහා රෝහල් වෙත යොමු නොවීමෙන් සංකූලතා ඇතිවුණි.<br>**5.** **Covid** පසු අවධිවලදී එන්නත්කරණය සඳහා ගර්භනී මවුවරුන් ඇතුලු තරුණ ප්‍රජාව මැලිකමක් දක්වන ලදී. |
| **අවස්ථා**<br>**1.** **Covid** රෝගීන් ප්‍රවාහනයට **1990** ගිලන් රථ සේවාව භාවිතයට ඉඩ ලැබුණි.<br>**2.** අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටවීමේදී ශ්‍රී ලංකා යුද හමුදාව සහය වන ලදී.<br>**3.** පළාත් ආණ්ඩුකාරතුමා සමඟ එක්ව **Covid** කමිටුවක් පිහිටුවා එමගින් **Covid** රෝගීන් පිළිබද දැනුවත් වී ප්‍රශ්න නිරාකරණය කරන ලදී.<br>**4.** එන්නත්කරන හා අනෙකුත් සෞඛ්‍ය අවශ්‍යතා සඳහා පළාත් සභාවේ අනෙකුත් අමාත්‍යාංශ වල වාහන භාවිතා කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.<br>**5.** එන්නත්කරණය මගින් රෝගීන් ව්‍යාප්තිය සහ සංකූලතාවය ඇති වීම පාලනය කරන ලදී. | **තර්ජන**<br>**1.** මහජනතාව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය නොකිරීම රෝගීන් ව්‍යාප්තිය සිදු වීමට බලපාන ලදී.<br>**2.** පළාත් අතර සංචරණය සීමා නොවීමෙන් හා නිසි ආකාරව නිරෝධායනයට යොමු නොවීමෙන් රෝග පාලනයට බාධා ඇති විය.<br>**3.** එන්නත්කරනය පිළිබද දුර්මත ඇති වීම සහ එන්නත්කරනයට බිය වීම. |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | 2030 වන විට ආයතනයේ ඉලක්කය | 2021 වර්ෂයේ ආයතනයේ ඉලක්කය | 2021 වර්ෂයේ නිමැවුම (වර්ෂය තුල ලඟා කරගත් ප්‍රමාණය) | වර්ෂය තුල සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස % | 2022 වර්ෂයේ ඉලක්කය (සංඛ්‍යාත්මකව) |
|---|---|---|---|---|---|---|
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.1 2030 වන විට ලෝකයේ මාතෘ මරණ අනුපාතිකය සජීවී උපත් 100,000ට 70 දක්වා අඩු කිරීම | 1. මාතෘ මරණ අනුපාතය | 30 | 67.9 (A)<br>98.1 (P) | 44%<br>31% | 30 |
| | | 2. පුහුණුව ලත් සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහාය ඇතිව සිදුවූ ළදරු උපත් ප්‍රමාණය | 12895 (A)<br>6180 (P) | 12892(A)<br>6170 (P) | 99%<br>99% | 100% |
| | 3.2 සියලුම රටවල්වල නවජාත මරණ අනුපාතිකය සජීවී උපත් 1000ට 12 දක්වා සහ අවුරුදු පහට අඩු ළමා මරණ සජීවී උපත් 1000ට අවම වශයෙන් 25 දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අලුත උපන් සහ වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම | 1. වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ මරණ අනුපාතය | 8 | 10.6 (A)<br>12.2 (P) | 75%<br>65% | **8** |
| | | 2. බිළිඳු මරණ අනුපාතය | 6.6 | 7.1 (A)<br>7 (P) | 93%<br>94% | 6.6 |

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | 2030 වන විට ආයතනයේ ඉලක්කය | 2021 වර්ෂයේ ආයතනයේ ඉලක්කය | 2021 වර්ෂයේ නිමැවුම (වර්ෂය තුල ලඟා කරගත් ප්‍රමාණය) | වර්ෂය තුල සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස % | 2022 වර්ෂයේ ඉලක්කය (සංඛ්‍යාත්මකව) |
|---|---|---|---|---|---|---|
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.3 2030 වන විට ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියා ඇතුළු නොතකා හැර ඇති සර්ම කලාපීය වසංගත, හෙපටයිටිස්, ජලය මගින් ඇතිවන රෝග සහ අනෙකුත් බෝවන රෝග තුරන් කිරීම | 1. ස්ත්‍රීපුරුෂ භාවය, වයස සහ ප්‍රධාන ජනගහනයන්ට අදාළව HIV ආසාධිත නොවූ පුද්ගලයන් 1000කට අලුතින් HIV ආසාධිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව | 0.13 | 0.01 (A)<br>(10)<br>0.01 (P)<br>(08) | 99%<br>99% | <0.01 |
| | | 2. ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට සිටින ක්ෂය රෝගීන් සංඛ්‍යාව | 64 | 18 (A)<br>(173)<br>16 (P)<br>(76) | 99%<br>99% | <15 |
| | | 3. ජනගහනයේ පුද්ගලයන් 1000කට මැලේරියා රෝගීන් සංඛ්‍යාව | 0 | 0.001(A)<br>(1)<br>0.002(P)<br>(1) | 99%<br>99% | රෝගීන් තුරන් කිරීම |
| | | 4. ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින හෙපටයිටිස් B රෝගීන් සංඛ්‍යාව | - | - | - | - |
| | | 5. ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින මී උන රෝගීන් පුද්ගලයින් සංඛ්‍යාව | 3 | 1.9 (A)<br>(191)<br>2 (P)<br>(92) | 98%<br>98% | <1 |
| | | 6. ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටිනඩෙංගු රෝගීන් සංඛ්‍යාව | 5 | 3.35 (A)<br>(321)<br>2.34 (P)<br>(108) | 95%<br>96% | <2 |
| | | 7. ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින ලාදුරු රෝගීන් සංඛ්‍යාව | 0.01 | 0.67 (A)<br>(65)<br>0.5 (P)<br>(24) | 99%<br>99% | 0.01 |
| | | 8. පුද්ගලයන් 10000කට සිටිනලිෂ්මනයිසිස් රෝගීන් සංඛ්‍යාව | 0.05 | 2.69 (A)<br>(258)<br>7.7 (P)<br>(356) | 97%<br>92% | 0.05 |
| | | 9. ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින ජලභීතිකාව රෝගීන් සංඛ්‍යාව | - | 0 | 100% | රෝගීන් තුරන් කර තබා ගැනීම |

මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ඉතිරි කොටස...................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | 2030 වන විට ආයතනයේ ඉලක්කය | 2021 වර්ෂයේ ආයතනයේ ඉලක්කය | 2021 වර්ෂයේ නිමැවුම (වර්ෂය තුල ලඟා කරගත් ප්‍රමාණය) | වර්ෂය තුල සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස % | 2022 වර්ෂයේ ඉලක්කය (සංඛ්‍යාත්මකව) |
|---|---|---|---|---|---|---|
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.4 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | 1. ජනගහනයේ පුද්ගලයන් 1000කට දියවැඩියා රෝගීන් සංඛ්‍යාව | 85 | 150 (A)<br>112 (P) | 56%<br>75% | 85<br>85 |
| | | 2. ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින අධිරුධිර පීඩනයෙන් යුත් පුද්ගලයින් සංඛ්‍යාව | 4350 | 2190 (A)<br>2113 (P) | 100%<br>100% | 2000<br>2000 |
| | | 3. ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින හෘදරෝගී පුද්ගලයින් සංඛ්‍යාව | 220 | 548 (A)<br>177 (P) | 40%<br>100% | 300<br>150 |
| | | 4. ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින වකුගඩු රෝගීන් සංඛ්‍යාව | 220 | 380 (A)<br>512 (P) | 57%<br>42% | 300<br>400 |
| | | 5. නීරක්තිය,ස්ථූලතාවය,අධිරුධිර පීඩනය වැනි රෝග හේතුවෙන් මියයන ගර්භණී මවුවරුන් ප්‍රමාණය | - | 0(A)<br>0(P) | 100%<br>100% | - |
| | 3.5 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම | 1. මධ්‍යසාර භාවිතාකරන්නන් % | - | 27% (A)<br>12% (P) | - | - |
| | | 2. දුම්කොළ දුම් පානය කරන්නන් හා දුම්කොළ හපන පුද්ගලයින් ගණන (අවු:35ත් 70ත් අතර) | 18% | 10.5%(A)<br>7.3% (P) | 100%<br>100% | 8%<br>5% |
| | 3.8 මූල්‍යමය අවදානයට පත්වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වි යදමකින් ලබා ගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලු දෙනාටම ලබා ගත හැකි වීම. | 1. එක් මාතෘ සායනකට සම්බන්ධවන මව්වරුන්ගේ සාමාන්‍ය | - | 36 | 100% | <40 |
| | | 2. එක් ළදරු සායයනකට සම්බන්ධවන ළදරුවන්ගේ සාමාන්‍ය | - | 42 | - | - |

මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ඉතිරි කොටස..................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සදහා ආයතනය සැලසුම් කල ඉලක්ක | 2030 වන විට ආයතනයේ ඉලක්කය | 2021 වර්ෂයේ ආයතනයේ ඉලක්කය | 2021 වර්ෂයේ නිමැවුම (වර්ෂය තුල ලඟා කරගත් ප්‍රමාණය) | වර්ෂය තුල සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස % | 2022 වර්ෂයේ ඉලක්කය (සංඛ්‍යාත්මකව) |
|---|---|---|---|---|---|---|
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.c විශේශයෙන්ම අවම වශයෙන් දියුණු වූ රටවල සහ කුඩා දිවයින් රාජ්‍යයන්හි සෞඛ්‍ය සේවාවන් වෙනුවෙන් වෙන් කරන මුදල් සහ සෞඛ්‍ය කාර්‍යමණ්ඩල බඳවා ගැනීම සංවර්ධනය කිරීම, පුහුණු කිරීම සහ පවත්වාගෙන යාම සැලකිය යුතු මට්ටමකින් වැඩි කිරීම | 1. පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනිය මගින් ආවරණය වන යෝග්‍යතා පවුල් ගණන | 550 | 751 | 73% | 650 |
| | | 2. එක් වෛද්‍යවරයෙකුගෙන් සේවය ලබන රෝගීන් ගණන | 600 | 1332 | 45% | 1000 |
| | | 3. එක් හෙදියකගෙන් ආවරණය වන රෝගීන් ගණන | 500 | 584 | 85% | 500 |
| | | 4. එක් විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් සේවය ලබන රෝගීන් ගනන | 3800 | 8856 | 42% | 7000 |
| | | 5. ජනගහනයෙන් 1000 කට ඇති රෝහල් ඇදන් ගනන | - | 4.7(P)<br>4523<br><br>4(P)<br>1831 | 0.5%<br><br>0.5% | 06<br><br>06 |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්ය සාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශක (නිමැවුම) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01 | මාතෘ හා ළමා සායන මධ්‍යස්ථාන ඉදිකිරීම හා අලුත්වැඩියාව | මාතෘ මරණ අනුපාතිකය | සායන මධ්‍යස්ථාන 37 | 80% |
| | | අවු:05ට අඩු ළමා මරණ අනුපාතය | | |
| | | බිළිඳු මරණ අනුපාතය | | |
| 02 | මූලික රෝහල් වල පහසුකම් වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියාව | පුහුණුවලත් සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහය ඇතිව සිදුවූ ළදරු උපත් ප්‍රමාණය | රෝහල් 08 | 80% |
| | | ජනගහනයේ පුද්ගලයන් 1000කට දියවැඩියා රෝගීන් සංඛ්‍යාව | | |
| | | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින ජලභීතිකාව රෝගීන් සංඛ්‍යාව | | |
| | | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින අධිරුධිර පීඩනයෙන් යුත් පුද්ගලයින් සංඛ්‍යාව | | |
| | | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින වකුගඩු රෝගීන් සංඛ්‍යාව | | |
| | | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින හෘදරෝගී පුද්ගලයින් සංඛ්‍යාව | | |
| 03 | ප්‍රාදේශීය රෝහල් සහ වැඩිදියුණු කිරීම | ජනගහනයේ පුද්ගලයන් 1000කට දියවැඩියා රෝගීන් සංඛ්‍යාව | ප්‍රාදේශිය රෝහල් 21 | 85% |
| | | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින අධිරුධිර පීඩනයෙන් යුත් පුද්ගලයින් සංඛ්‍යාව | | |
| | | එක් මාතෘ සායනකට සම්බන්ධවන මව්වරුන්ගේ සාමාන්‍ය | | |
| 04 | ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය වැඩිදියුණු කිරීම | ජනගහනයේ පුද්ගලයන් 1000කට දියවැඩියා රෝගීන් සංඛ්‍යාව | ප්‍රා.වෛ.ස 15 | 75% |
| | | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින අධිරුධිර පීඩනයෙන් යුත් පුද්ගලයින් සංඛ්‍යාව | | |
| | | එක් ළදරු සායයනකට සම්බන්ධවන ළදරුවන්ගේ සාමාන්‍ය | | |

## ප්‍රධාන කාර්යසාධන දර්ශක ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

### PSDG ව්‍යාපෘතිය

| අනු අංක | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාතිය ප්‍රමාණය | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 01. | ඉදිකිරීම් | 41 | 138.81 | ගණනය කල නොහැක |
| | ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කිරීම් | 33 | 85.46 | |
| | මිලදී ගැනීම් | 14 | 27.49 | |

### PSSP ව්‍යාපෘතිය

| අනු අංක | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාතිය ප්‍රමාණය | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 02. | ඉදිකිරීම් | 13 | 190.20 | ගණනය කල නොහැක |
| | ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කිරීම් | 23 | 57.52 | |
| | මිලදී ගැනීම් | 12 | 61.86 | |
| | වැඩසටහන් | 12 | 11.65 | |

### RHD ව්‍යාපෘතිය

| අනු අංක | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාතිය ප්‍රමාණය | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|
| 03. | ඉදිකිරීම් | 26 | 85.76 | ගණනය කල නොහැක |
| | ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කිරීම් | 101 | 213.77 | |
| | මිලදී ගැනීම් | 24 | 221.22 | |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම.

| මූල්‍ය ප්‍රභවය | අනුරාධපුර | | පොළොන්නරුව | | පළාත් කාර්යාලය | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම |
| PSDG | 260 | 167.9 | 145 | 55.4 | 28.3 | 28.3 |
| PSSP | 190 | 183.7 | 90 | 84.8 | 53 | 53 |
| RHDP | 499 | 248.6 | 248 | 78.3 | - | 193.8 |
| PCDG | - | - | - | - | 7.2 | 7.2 |
| **මුළු එකතුව** | **949** | **600.2** | **483** | **218.5** | **74** | **-** |

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| මාතෘ මරණ අනුපාතය | | | ✔ |
| ළදරු මරණ අනුපාතය | | ✔ | |
| මන්ද පෝෂණ තත්වය ( වයස 5 ට අඩු - අඩු බර ) | ✔ | | |
| වර්ෂයට අදාලව අනුමත කල ව්‍යාපෘති අතුරින් ක්‍රියාත්මක කල ව්‍යාපෘති වල අනුපාතය | ✔ | | |
| බෝවන හා බෝනොවන රෝග පාලනය කිරිමේ අනුපාතය | | ✔ | |
| වර්ෂය තුල ඉලක්කගත විගණන විමසුම් අවම කිරිමේ අනුපාතය | | | ✔ |
| වකුගඩු රෝග නිවාරණය කිරිමේ අනුපාතය | | ✔ | |
| පුහුණු වැඩසටහන් තුළින් සේවක අභිප්‍රරණය කිරිමේ අනුපාතය | | | ✔ |
| වර්ෂය තුළ ලද ලිපිගොනු අතුරින් යාවත්කාලීන කරන ලද ලිපිගොනු වල අනුපාතයක් ලෙස | | ✔ | |
| වර්ෂය තුළ සේවා කිරිමට පැමිණි වාහන වලින් නියමිත දිනට සේවා කර ඇති වාහන ප්‍රමාණයේ අනුපාතය | | ✔ | |
| මුළු වාහන ගණනින් දැනට ධාවන තත්වයේ පවතින වාහන වල අනුපාතය | | | ✔ |
| වර්ෂය තුළ දී ලද ප්‍රතිපාදන ප්‍රමාණයෙන් වර්ෂය අවසානයේ දී වියදම් කල ප්‍රමාණයේ අනුපාතය | | ✔ | |
| වර්ෂය තුළ සෞඛ්‍ය ආයතන වලින් වාර්තාගත වන විදුලිය සම්බන්ධ දෝෂ අතුරින් නිරාකරණය කළ දෝෂ වල අනුපාතය | | ✔ | |

## අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්

- උතුරු මැද පලාත තුල මාතෘ මරණ අනුපාතය වැඩි වීමට හේතු සාධක ලෙස පැවතුන කොවිඩ් වසංගතය හමුවේ ගැබිනි මවුවරුන් කොවිඩ් ආසදනය වීම, සායන වලට පැමිණීමෙ අපහසුතා ඇති වීම, සංකූලතා වලට ගොදුරුවීම යනාදීය දැක්විය හැක.
- ළදරු මරණ අනුපාතිකය වැඩිවීමට හේතු සාධක ලෙස කොවිඩ් වසංගතයට ගොදුරු වීම, කොවිඩ් පාලන එන්නත්කරණය ළදරුවන්ට ලබා නොදීම, ළදරුවන්ට වැලඳෙන වෙනත් රෝගයන් වලට ප්‍රතිකාර ගැනීම සඳහා කොවිඩ් වසංගතය හමුවේ රෝහල් වලට යොමු විමේ ප්‍රමාණය අඩුවීම.
- 2021 වර්ෂයේ දි පැවතුන කොවිඩ් වසංගත තත්වය හමුවේ එය පාලනය කිරිම සඳහා අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන,ප්‍රතිකාර මධ්‍යස්ථාන,අධි සත්කාර ඒකක ආරම්භ කිරිමට පියවර ගැණිනි.එසේම එන්නත්කරණය සෞඛ්‍ය මාර්ගෝපදේෂ අනුගමනය කරමින් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මඟින් කොවිඩ් 19 රෝගී තත්වය පාලනය කිරිමට කටයුතු කෙරිණි.
- පැවතුන වසංගත තත්වය හමුවේ වුවද වකුගඩු රෝගීන් හඳුනා ගැනිමේ පූර්වසායන,බෝනොවන රෝග පිළිබඳව දැනුවත් කිරිමේ වැඩසටහන් ද පැවැත්විණි
- සියලුම රුධිර කාන්දුකරණ ඒකක ක්‍රියාකාරි මට්ටමේ පවත්වාගනිමින් රෝගීන්ට අවශ්‍ය සත්කාර සේවාවන් සැපයීම.
- ඉදිකිරිම් හා මිළ දී ගැනීම් අංශ වල කටයුතු ද දුෂ්කරතා මධ්‍යයේ සිදුකිරිම තුළින් පළාත තුළ ප්‍රශස්ථ ප්‍රගතියක් ළඟාකරගැනීමට හැකිවිය.
- සෞඛ්‍ය සේවාව අත්‍යවශ්‍ය සේවාවක් බැවින් ආයතන වල දෛනික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන ලදි.
- ගර්භණී හා ළමා අංශය වලට වැඩි අවධානයක් යොමුකරමින් කොවිඩ් වසංගතයෙන් ඔවුන් ආරක්ෂා කිරිම සඳහා නොව්වියාගම ග්‍රාමීය රෝහල වෙන් කිරිම.
- අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවමින් ඇඳන් 1500 කට අධික ප්‍රමාණයක් කොවිඩ් රෝගීන් සඳහා වෙන් කිරිම.
- කොඩිඩ් වසංගතය මර්ධනය කිරිම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව පැවැති වාහන සීමා සහිත බැවින් පළාත් අමාත්‍යාංශයෙන් තාවකාලිකව වාහන ලබාගෙන අඛණ්ඩ සේවාවක් සපයන ලදි.
- උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ මුලිකත්වයෙන් කොවිඩ් කමිටු පවත්වමින් කොවිඩ් මර්ධනයට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශයන් ලබාදෙන ලදි.
- සුනඛ ව්‍යන්ධිකරණ වැඩසටහන් සිදු කිරීමට ලැබුනු ප්‍රතිපාදන අවම වීම සිදු කල වැඩසටහන් ප්‍රමාණය අඩුවිමට හේතු විය.

**හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු**

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය සැලසුම් කල දර්ශක | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.1 2030 වන විට ලෝකයේ මාතෘ මරණ අනුපාතිකය සජීවී උපත් 100,000ට 70 දක්වා අඩු කිරීම | 1. මාතෘ මරණ අනුපාතය<br>2පුහුණුව ලත් සෞඛ්‍ය කාර්ය මණ්ඩල සහාය ඇතිව අඩු බර ළදරු උපත් ප්‍රමාණය | | | | ✔<br>✔ |
| | 3.2 සියලුම රටවල්වල නවජාත මරණ අනුපාතිකය සජීවී උපත් 1000ට 12 දක්වා සහ අවුරුදු පහට අඩු ළමා මරණ සජීවී උපත් 1000ට අවම වශයෙන් 25 දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අලුත උපන් සහ වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම | 1 වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ මරණ අනුපාතය<br>2 බිළිඳු මරණ අනුපාතය | | | | ✔<br>✔ |

හදුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ඉතිරි කොටස ..........................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය සැලසුම් කල දර්ශක | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% -74% | 75% - 100% |
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.3 2030 වන විට ඒඩ්ස්, ක්ෂය රෝගය, මැලේරියා ඇතුළු නොතකා හැර ඇති සර්ම කලාපීය වසංගත, හෙපටයිටිස්, ජලය මගින් ඇතිවන රෝග සහ අනෙකුත් බෝවන රෝග තුරන් කිරීම | 1 ස්ත්‍රීපුරුෂ භාවය, වයස සහ ප්‍රධාන ජනගහනයන්ට අදාළව HIV ආසාධිත පුද්ගලයන් 1000කට අලුතින් HIV ආසාධිත පුද්ගලයන්ගේ සංඛ්‍යාව | | | | ✔ |
| | | 2 ජනගහනයෙන් පුද්ගලයන් ලක්ෂයකට සිටින ක්ෂය රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |
| | | 3 ජනගහනයේ පුද්ගලයන් 1000කට මැලේරියා රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |
| | | 4 ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින හෙපටයිටිස් B රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |
| | | 5 ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින මී උන රෝගීන් පුද්ගලයින් සංඛ්‍යාව | | | | ✔ |
| | | 6 ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටිනඩෙංගු රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |
| | | 7 ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින ලාදුරු රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |
| | | 8 ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින ලිෂ්මනයිසිස් රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |
| | | 9 ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින ජලභීතිකාව රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |

හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ඉතිරි කොටස ...........................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය සැලසුම් කල දර්ශක | | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 0% - 49% | 50% -74% | 75% - 100% |
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.4 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වළක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම | 1 | හෘද නාල ආශ්‍රිත රෝග, පිළිකා, දියවැඩියාව හෝ නිදන්ගත ස්වසන රෝග හේතුවෙන් මියයන ප්‍රමාණය | | | | ✔ |
| | | 2 | ජනගහනයේ පුද්ගලයන් 1000කට දියවැඩියා රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |
| | | 3 | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින අධිරුධිර පීඩනයෙන් යුත් පුද්ගලයින් සංඛ්‍යාව | | | | ✔ |
| | | 4 | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින හෘදරෝගී පුද්ගලයින් සංඛ්‍යාව | | | | ✔ |
| | | 5 | සියදිවිනසා ගැනීම් හේතුවෙන් මියයන ප්‍රමාණය | | | | ✔ |
| | | 6 | ජනගහනයේ පුද්ගලයන් 10000කට සිටින වකුගඩු රෝගීන් සංඛ්‍යාව | | | | ✔ |
| | | 7 | නීරක්තිය, ස්ථුලතාවය, අධිරුධිර පීඩනය වැනි රෝග හේතුවෙන් මියයන ගර්භණී මවුවරුන් ප්‍රමාණය | | | | ✔ |
| | | 8 | සතුන් සපාකෑම හා මාර්ග අනතුරු හේතුවෙන් මියයන පුද්ගලයින් සංඛ්‍යාව | | | | ✔ |

හදුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ඉතිරි කොටස ..........................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය සැලසුම් කල දර්ශක | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% -74% | 75% - 100% |
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.5 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම | 1 මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් හටගන්නා ආබාධ තත්ත්වය සඳහා ප්‍රතිකාරමය පහසුකම් ලබාගත් ගණන | | | | ✔ |
| | | 2 මධ්‍යසාර භාවිතාකරන්නන් % | | | | ✔ |
| | | 3 මත්ද්‍රව්‍ය පුනරුත්තාපන මධ්‍යස්ථානවල සේවය ලබාගත් ගණන | | | | ✔ |
| | | 4 මත්ද්‍රව්‍ය උපදේශන මධ්‍යස්ථාන මගින් සේවය ලබාගත් ගණන | | | ✔ | |
| | | 5 මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ශාරීරිකව අක්‍රිය වන පුද්ගලයින් ගණන | | | | |
| | | 6 දුම්කොළ දුම් පානය කරන්නන් හා දුම්කොළ හපන පුද්ගලයින් ගණන | | | | ✔ |
| | 3.8 මූල්‍යමය අවදානයට පත්වීම සඳහා ආරක්ෂණය ද ඇතුළත්ව ආරක්ෂාකාරී, ඵලදායී, ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු වි යදමකින් ලබා ගත හැකි ඖෂධ, එන්නත් හා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවන් සියලු දෙනාටම ලබා ගත ඇකි වීම ඇතුළුව විශ්වීය මට්ටමින් සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි වීම | 1 එක් මාතෘ සායයනකට සම්බන්ධවන මව්වරුන්ගේ සාමාන්‍ය | | | | ✔ |
| | | 2 එක් ළදරු සායයනකට සම්බන්ධවන ළදරුවන්ගේ සාමාන්‍ය | | | | ✔ |
| | | 3 සමස්ත පවුලේ වියදමෙන් නැතහොත් ආදායමෙන් වැඩි පංගුවක් සෞඛ්‍ය වෙනුවෙන් දරණ ජනගහනයේ ප්‍රමාණය. | | | ✔ | |

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය සැලසුම් කල දර්ශක | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% -74% | 75% - 100% |
| යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම | 3.c විශේශයෙන්ම අවම වශයෙන් දියුණු වූ රටවල සහ කුඩා දිවයින් රාජ්‍යයන්හි සෞඛ්‍ය සේවාවන් වෙනුවෙන් වෙන් කරන මුදල් සහ සෞඛ්‍ය කායීමණ්ඩල බඳවා ගැනීම සංවර්ධනය කිරීම, පුහුණු කිරීම සහ පවත්වාගෙන යාම සැලකිය යුතු මට්ටමකින් වැඩි කිරීම | 1 සෞඛ්‍ය සේවක සණත්වය සහ ව්‍යාප්තිය. | | | | ✔ |
| | | 2 පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිනිය මගින් ආවරණයවන පවුල් ගනන | | | | ✔ |
| | | 3 එක් වෛද්‍යවරයෙකු ගෙන් සේවය ලබන රෝගීන් ගණන | | | ✔ | |
| | | 4 එක් හෙදියකගෙන් ආවරණය වන රෝගීන් ගණන | | | ✔ | |
| | | 5 එක් විශේෂඥ වෛද්‍යවරයෙකු ගෙන් සේවය ලබන රෝගීන් ගනන | | | ✔ | |
| | | 6 ජනගහනයෙන් 1000 කට ඇති රෝහල් ඇඳන් ගනන | | | ✔ | |
| | | 7 ජනතාවගෙන් 1000 කට පවතින එක් එක් සායන ගනන | | | ✔ | |
| | | 8 අන්තර්ජාතික සෞඛ්‍ය නියමයන් සඳහා වන ධාරිතාව සහ හදිසි සෞඛ්‍ය අවස්ථාවක් සඳහා වන සූදානම. | | | ✔ | |

## තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ආයතනය මුහුණ දුන් අභියෝග

1. සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ගොඩනැගිලි අමුද්‍රව්‍ය වල හිඟකම (ටයිල්,සිමෙන්ති)
2. 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂය තුල වරින් වර අමුද්‍රව්‍ය මිල ගණන් විචලනයට ලක් වීම.
3. Covid 19 වසංගත තත්වය හමුවේ මානව සම්පත භාවිතා කිරීමේදී ඇති වූ අපහසුතා වලින් සංවර්ධන කටයුතු වලට බාධා ඇති වීම.
4. 2021 වර්ෂයේ දි මුහුණ දුන් කොවිඩ් 19 වසංගත රෝග තත්වය කළමණාකරනය කිරිම සඳහා විවිධ අවස්ථාවන්හි වාර්ෂික ප්‍රතිපාදන සංශෝධනයට ලක් කිරීමට සිදු වීම.
5. සෞඛ්‍ය කාර්ය මණ්ඩල කොවිඩ් 19 වසංගත පාලනය, එන්නත්කරණය වැනි කටයුතු සඳහා වැඩි වශයෙන් යොමු කිරිම නිසා සාමාන්‍ය සායන කටයුතු අංග සම්පූර්ණ ලෙස කිරීමට බාධා ඇති විය.
6. එමෙන්ම බෝ නොවන, වකුගඩු නව රෝගීන් හඳුනා ගැනීමට පැවැත්වූ ජංගම සායන අඩු කිරීමට සිදු විය.

## විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය

| ව්‍යාපෘතිය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| පලුගස්වැව MOH කාර්යාලය වැඩිදියුණු කිරීම | පලුගස්වැව | | 0.84 |
| ගල්නෑව DH හි සායන පහසුකම් සහ මාතෘ අංශය සඳහා පැරණි මාතෘ වාට්ටුව ප්‍රතිසංස්කරණය කිරීම | ගල්නෑව | | 0.98 |
| BH පදවියේ මාතෘ වාට්ටුව ප්‍රතිසංස්කරණය කිරීම | පදවිය | | 1.86 |
| භූමි අලංකරණය තඹුත්තේගම BH | තඹුත්තේගම | | 1.89 |
| රාජාංගනය යායේ 05 කම්කරු කාමරය ප්‍රතිසංස්කරණය කිරීම | රාජාංගනය | | 6.86 |
| DH ගල්නෑව MOIC නිල නිවාස අලුත්වැඩියා කිරීම | ගල්නෑව | | 7.11 |
| BH කහටගස්දිගිලිය X කිරණ ඒකකය සඳහා සායන කාමරයේ නවීකරණය කිරීමේ | කහටගස්දිගිලිය | ගණනය කල නොහැක | 3.52 |
| X කිරණ ඒකකය සඳහා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම | මැදවච්චිය | | 3.53 |
| මාතෘ වාට්ටුව අලුත්වැඩියා කිරීම | තලාව | | 3.28 |
| දන්ත වෛද්‍ය ඒකකය අලුත්වැඩියා කිරීම | හොරොව්පොතාන | | 1.80 |
| මාතෘ වාට්ටුව අලුත්වැඩියා කිරීම | මරදන්කඩවල | | 4.55 |
| දන්ත වෛද්‍ය ඒකකය වැඩිදියුණු කිරීම | - | | 1.65 |
| වෛද්‍ය රසායනාගාරය සඳහා කාමරය ප්‍රතිසංස්කරණය කිරීම | මිහින්තලේ | | 0.75 |
| PSSP රෝහල් නාම පුවරු මුද්‍රණය කිරීම (2020 දී තෝරාගත් රෝහල) | සියලුම | | 0.39 |
| ඖෂධ ගබඩා සහ ETU සඳහා AC යන්ත්‍රකරණය මිලදී ගැනීම සහ ස්ථාපනය කිරීම | | | 2.19 |
| නල ළිං සවි කිරීම - DH තලාව, DH කටියාව | - | | - |

විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය ඉතිරි කොටස.....................

| ව්‍යාපෘතිය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| රෝහල් සඳහා ජාලකරණ උපකරණ මිලදී ගැනීම | සියලුම | ගණනය කල නොහැක | 5.47 |
| ඉන්ටර්කොම් පද්ධතිය මිලදී ගැනීම සහ ස්ථාපනය කිරීම | | | 6.46 |
| ඖෂධ ගබඩා සඳහා රාක්ක මිලදී ගැනීම | | | 1.50 |
| මූලික රෝහල් සඳහා රාක්ක මිලදී ගැනීම | | | 1.00 |
| සියලුම අංශ සඳහා වෛද්‍ය නොවන, සාමාන්‍ය සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම. | | | 5.00 |
| PSSP තෝරාගත් රෝහල් සඳහා තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම | | | 5.50 |
| සියලුම අංශ සඳහා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම. | | | 13.98 |
| සියලුම අංශ සඳහා දන්ත උපකරණ මිලදී ගැනීම. | | | 5.0 |
| කාර්යාල සහ ගෘහස්ත යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | | | 1.04 |
| මාතෘ වාට්ටුව සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා සේදුම් කාමරයක් ඉදිකිරීම | පදවිය | | 4.11 |
| බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ල ඉදිකිරීම | තලාව | | 32.18 |
| x කිරණ ඒකකයක් ඉදිකිරීම | කැකිරාව | | 2.05 |
| දන්ත වෛද්‍ය ඒකකය සහ රසායනාගාරය ඉදිකිරීම | තලාව | | 1.63 |
| රෝගී භෝජනාගාරය ඉදිකිරීම | නාච්චදූව | | - |
| නල ළිං සවි කිරීම - DH.මහවිලච්චිය, DH.තන්තිරිමලේ,DH.තලාව,DH.කටියාව | - | | 2.03 |
| කලාවැව DH.හි ජල ටැංකිය ඉදිකිරීම | - | | 1.72 |
| PSSP තෝරාගත් රෝහල් සඳහා PMR මුද්‍රණය කිරීම | සියලුම | | 1.66 |
| රෝගී හිතකාමී සේවාව සඳහා නව්‍ය ක්‍රියාකාරකම් | | | 0.52 |
| PSSP ක්‍රියාකාරකම් සහ තත්ත්ව අධීක්ෂණය අධීක්ෂණය සහ ඇගයීම | | | 0.83 |
| දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වීම, සමාලෝචනය, පුහුණුව, IEC matarial මුද්‍රණය කිරීම, නාභිගත කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම (සියලු ඒකක) | | | 4.25 |
| සියලුම සැලසුම් සඳහා මුද්‍රණ ද්‍රව්‍ය | | | 1.68 |
| පලුගස්වැව MOH කාර්යාලය වැඩිදියුණු කිරීම | - | | 0.91 |
| නව MOH ගොඩනැගිල්ල ඉදිකිරීම | තඹුත්තේගම | | 10.0 |
| MOH නිල නිවාස ඉදිකිරීම | තඹුත්තේගම | | 3.43 |
| නව MOH ගොඩනැගිල්ල ඉදිකිරීම. MOH කාර්යාලයේ පළමු මහල | තිරප්පනේ | | 11.66 |
| MOH නාච්චදූව නව MOH ගොඩනැගිල්ල ඉදිකිරීම (පළමු අදියර) | සියලුම | | 12.09 |

විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය ඉතිරි කොටස.....................

| ව්‍යාපෘතිය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| කටියාව 01 - MOH තලාව නව MCH සායන ගොඩනැගිල්ල ඉදිකිරීම | - | ගණනය කල නොහැක | 0.62 |
| පලුගස්වැව - MOH ඉපලෝගම නව MCH සායන ගොඩනැගිල්ල ඉදිකිරීම | - | | - |
| පහළගල්කන්දේගම - MOH මැදවච්චියේ නව MCH සායන මධ්‍යස්ථාන ඉදිකිරීම | - | | 4.08 |
| හොරොව්පොතාන - සිංහල වලහාවිද්දවැව නව MCH සායන මධ්‍යස්ථාන ඉදිකිරීම | - | | 1.00 |
| MOH මිහින්තලේ සායනය සඳහා පොරොත්තු ප්‍රදේශය වැඩිදියුණු කිරීම | - | | 1.00 |
| PDHS NCP RDHS අනුරාධපුර ශේෂ කටයුතු සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම | NPE | | 50.00 |
| පුහුණු වැඩසටහන් පැවැත්වීම | - | | 0.21 |
| වැඩසටහන් නිරීක්ෂණ සැසි පැවැත්වීම | - | | 0.20 |
| PDHS RDHS ගොඩනැගිල්ල සඳහා ගෘහභාණ්ඩ මිලදී ගැනීම | - | | - |
| PDHS කාර්යාලයේ ඒකක සඳහා උපකරණ සැපයීම | - | | 2.60 |
| PDHS කාර්යාලය සඳහා කාර්යාලීය ගෘහභාණ්ඩ මිලදී ගැනීම | - | | 0.005 |
| DH අත්තනකඩවල පිරිමි සහ කාන්තා වාට්ටුව අලුත්වැඩියා කිරීම (අදියර 1) | ඇලහැර | | 5.23 |
| DH ගල්අමුණ ළමා වාට්ටුව අලුත්වැඩියා කිරීම | ලංකාපුර | | 2.52 |
| DH ගල්අමුණ ප්‍රවේශ මංසන්ධියේ මාතෘ හා කම්කරු කාමරය ප්‍රතිසංස්කරණය කිරීම | | | 3.09 |
| DH පුලස්තිගම කාන්තා වාට්ටුව අලුත්වැඩියා කිරීම | | | 2.37 |
| අත්තනකඩවල DH. මාතෘ වාට්ටුව අලුත්වැඩියා කිරීම | ඇලහැර | | 1.60 |
| ජයන්තිපුර පුනරුත්ථාපන රෝහලේ සායන පහසුකම් වැඩිදියුණු කිරීම | හිඟුරක්ගොඩ | | 0.50 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කාර්යාල උපකරණ මිලදී ගැනීම | සියලුම අංශය | | 3.32 |
| සියලුම BHs සහ RDHS කාර්යාලයේ ආරක්ෂණ උපකරණ මිලදී ගැනීම | | | 1.00 |
| RDHS කාර්යාලයේ HE-DOC (සෞඛ්‍ය හදිසි ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානය) සඳහා උපකරණ මිලදී ගැනීම | | | 1.96 |
| ගල්පර ජල කාණු පද්ධතිය BH වැලිකන්ද ස්ථාපිත කිරීම | වැලිකන්ද | | 1.14 |
| PBU BH මැදිරිගිරියේ ඉදිකිරීම (අදියර 01) | මැදිරිගිරිය | | 40.83 |

විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය ඉතිරි කොටස.....................

| ව්‍යාපෘතිය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රතිලාභීන් ගණන | වැයකළ මුදල (රු.මි) |
|---|---|---|---|
| DH දියබෙදුම ප්‍රදේශයේ බාහිර රෝගී අංශය, ETU, ඖෂධ ගබඩා සහ පරිපාලක ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම. (අදියර 1)" | ඇලහැර | ගණනය කල නොහැක | - |
| DH ජයන්තිපුර වාට්ටු සංකීර්ණය ඉදිකිරීම (අදියර 1) | හිඟුරක්ගොඩ | | 10.07 |
| DH ගල්අමුණෙහි ETU, සායන, ඖෂධ ගබඩා ඉදිකිරීම | ලංකාපුර | | - |
| DH ජයන්තිපුර ඖෂධ ගබඩාව ඉදිකිරීම | හිඟුරක්ගොඩ | | 0.49 |
| සියලුම කොට්ඨාශවල මාතෘ හා ළමා සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන පැවැත්වීම | සියලුම අංශය | | 0.05 |
| NCD වැළැක්වීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම | | | 0.05 |
| බෝවන රෝග වැළැක්වීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම | | | 0.05 |
| මුඛ සෞඛ්‍ය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම - පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම අංශය | | | 0.01 |
| ලීෂ්මේනියාසිස් රෝග නිවාරණය සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම | | | 0.02 |
| තත්ත්ව කළමනාකරණයේ වැඩසටහන් පැවැත්වීම | | | 0.03 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මානසික සෞඛ්‍ය සියලුම අංශයේ වැඩසටහන් පැවැත්වීම | | | 0.01 |
| මැලේරියා වැළැක්වීමේ වැඩසටහන් පැවැත්වීම - පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම අංශය | | | 0.02 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආහාර සුරක්ෂිතතාව -සියලු අංශය සඳහා වැඩසටහන් පැවැත්වීම | | | 0.01 |
| සෞඛ්‍ය ප්‍රවර්ධන කටයුතු පැවැත්වීම, සමාලෝචන රැස්වීම සහ ධාරිතා වර්ධන වැඩසටහන - පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම අංශය | | | 0.59 |
| සෞඛ්‍ය ප්‍රවර්ධනය, අධ්‍යාපනය, නිවාරණය සඳහා IEC ද්‍රව්‍ය මත මුද්‍රණය කිරීම - පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම අංශය | | | 1.80 |
| ජලභීතිකා රෝග පාලන ඒකකයේ වැඩසටහන් පැවැත්වීම | | | 0.05 |
| BH හිඟුරක්ගොඩ 500KVA Generator මිලදී ගැනීම | හිඟුරක්ගොඩ | | 5.08 |
| SLESP (වෛද්‍ය උපකරණ) වලට අනුකූලව උපකරණ මිලදී ගැනීම | සියලුම අංශය | | 2.91 |

**රේඛීය අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදනමත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය**

| අනු අංක | ව්‍යාපෘතිය | අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කල | වැය කල | භෞතික | මූල්‍ය | |
| 1 | දෙමුන්නෑව සායන මධ්‍යස්ථානයේ අත්‍යවශ්‍ය පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම | මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම | 1.71 | 1.75 | 100% | 100% | 1. මාතෘ හා ළමා සෞඛ්‍ය වැඩිදියුණු වීම<br>2. මාතෘ මරණ අනුපාතය<br>3. ළදරු මරණ අනුපාතය<br>4. මන්ද පෝෂණ තත්වය ( වයස 5 ට අඩු - අඩු බර ) |
| 2 | පහළහල්මිල්ලෑව සායන මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම | | 1.91 | 1.91 | | | |
| 3 | උණගස්වැව සායන මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම | | 1.78 | 2.08 | | | |
| 4 | කුරුන්දන්කුලම සායන මධ්‍යස්ථානයේ අත්‍යවශ්‍ය පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම | | 1.76 | 1.79 | | | |
| 5 | තුප්පිටියාව සායන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම | | 1.75 | 1.87 | | | |
| 6 | මීමින්නාවල සායන මධ්‍යස්ථානයේ අත්‍යාවශ්‍ය පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම | | 1.74 | 1.89 | | | |
| 7 | කලංකුට්ටියේ සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම | | 1.62 | 1.70 | | | |
| 8 | හබරත්තෑව සායන මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම | | 1.62 | 1.76 | | | |
| 9 | දුටුවැව සායන මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම | | 1.74 | 1.80 | | | |
| 10 | රඹකැපුවැව සායන මධ්‍යස්ථානයේ අත්‍යවශ්‍ය පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම | | 1.76 | 1.80 | | | |

## පවතින කොවිඩ් වසංගතය තත්ත්වය හමුවේ පළාතේ මහජනතාව වෙත ලබා දුන් සේවාවන්



1. Covid 19 වසංගත තත්වය පාලනය කරගැනීම.
   - Covid රෝගී දත්ත වාර්තාගත කර ඉදිරිපත් කිරීම.
   - Covid පාලන එන්නත් කරන වැඩසටහන පළාත තුල සාර්ථකව ක්‍රියාත්මක කිරීම.
   - අවු:30ට වැඩි ජනතාවට පළමු සහ දෙවන මාත්‍රාව 100% එන්නත්කරන ආවරණයක් ලබා දීම.
   - ඔක්සිජන් අවශතාව ඇති රෝගීන්ට රෝහල් 06 ක ඇඳන් 80කට වැඩි ප්‍රමාණයක් ස්ථාපිත කිරීම. (කැකිරාව, තඹුත්තේගම, හිඟුරක්ගොඩ, අරලගංවිල, බකමූණ, මැදිරිගිරිය)
   - අන්තර් කාලීන ප්‍රතිකාර මධ්‍යස්ථාන පිහිටුවීම. (වහමල්ගොල්ලෑව, ගල්කිරියාගම, ගුරු අභ්‍යාස විද්‍යාලය ගල්ලෑල්ල)



වහමල්ගොල්ලෑව කොවිඩ් මධ්‍යස්ථානය

- ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
- රෝහල් වල පහසුකම් වැඩිදියුණු කිරීම. (තන්තිරිමලේ, තම්මැන්නාව, නොච්චියාගම, කැබිතිගොල්ලෑව, වැලිකන්ද, මනම්පිටිය, හිඟුරක්ගොඩ)
- Zoom තාක්ෂණය ඔස්සේ Covid වසංගත තත්වය පාලනය සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## ආදායම් ඉපයීම

| ශීර්ෂය | ආදායම |
|---|---|
| පෞද්ගලික වෛද්‍ය සහතික නිකුත් කිරීම | 673,569.57 |

# 8.2. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

| අනුරාධපුර දිස්ත්‍රික්කය<br>ආයුර්වේද රෝහල් - 04 | පොළොන්නරුව දිස්ත්‍රික්කය<br>ආයුර්වේද රෝහල් - 05 |
|---|---|
| අනුරාධපුර | මින්නේරිය |
| තඹුත්තේගම | වැලිකන්ද |
| ගාලදිවුල්වැව | මනම්පිටිය |
| පදවිය | සිරිපුර |
| | ඇලහැර |

මධ්‍යම බෙහෙත් ශාලා - 30

| අනුරාධපුර දිස්ත්‍රික්කය - 21 | පොළොන්නරුව දිස්ත්‍රික්කය - 09 |
|---|---|
| නොච්චියාගම | තමන්කඩුව |
| පලුගස්වැව | දියසෙන්පුර |
| ගල්නෑව | මැදිරිගිරිය |
| තලාව | අරලගංවිල |
| මිහින්තලය | අත්තනකඩවල |
| කැකිරාව | ගල් අමුණ |
| රාජාංගනය | ලංකාපුර |
| රඹෑව | නවසේනපුර |
| මැදවච්චිය | ජයසිරිපුර |
| ඉපලෝගම | |
| ඇඳගල | |
| තිරප්පනේ | |
| කැබිතිගොල්ලෑව | |
| තන්තිරිමලේ | |
| හොරොව්පොතාන | |
| ගලෙන්බිඳුණුවැව | |
| කහටගස්දිගිලිය | |
| නාච්චාදූව | |
| පලාගල | |
| විලච්චිය | |




| වර්ගය | අ/පුර | පො/ නරුව | එකතුව |
|---|---|---|---|
| පළාත් රෝහල් | 01 | - | 01 |
| මූලික රෝහල් | - | 01 | 01 |
| ග්‍රාමීය රෝහල් | 03 | 04 | 07 |
| මධ්‍යම බෙහෙත් ශාලා | 21 | 09 | 30 |
| ආයුර්වේද මධ්‍යස්ථාන | 05 | - | 05 |
| ඖෂධ නිෂ්පාදනාගාර | 01 | - | 01 |
| **එකතුව** | **31** | **14** | **45** |

## දැක්ම

“සොබාදහමට අනුකූල වූ නිරෝගිමත් ජනතාවක්, සමෘද්ධිමත් පළාතක්.

## මෙහෙවර

“ ආයුර්වේද දර්ශනය අර්ථවත් ලෙස උපයෝගී කර ගනිමින් රෝග නිවාරණ හා ප්‍රතිකාර හා පර්යේෂණ සේවා වැඩිදියුණු කිරීම, පාරම්පරික වෛද්‍ය ක්‍රමය හා ඖෂධීය ශාක වගාව සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීම, විනිවිදභාවයෙන් හා ආයුර්වේද සේවාවේ හා අනෙකුත් පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් යුතුව ක්‍රියාවට නැංවීම.”

## දිගුකාලීන අරමුණු

- ආයුර්වේද දර්ශනය තුළින් පළාත තුළ නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ආයුර්වේද ප්‍රතිකාර භාවිතයෙන් රෝග සුව කිරීම.
- ස්වභාවධර්මයට අනුකූලව අතුරු ආබාධවලින් තොර ප්‍රතිකාර පද්ධතියක් ඇති කිරීම.
- පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම මඟින් නිරෝගීමත් ජනතාවක් බිහි කිරීම.
- ඖෂධ වගාව කිරීම තුළින් ඖෂධ හිඟය මගහරවා ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක ඖෂධ රෝගීන් වෙත ලබා දීම.
- ස්වභාවධර්මය සුරැකීම.

## කෙටි කාලීන අරමුණු

- ආයුර්වේද දර්ශනය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ආයුර්වේද ජීවන දර්ශනයට ජනතාව හුරු පුරුදු කිරීම.
- අතුරු ආබාධවලින් තොරව නිට්ටාවටම රෝග සුව කිරීම.
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම මධ්‍යම බෙහෙත් ශාලාවක් ඇති කිරීම.
- පාරම්පරික වෛද්‍යවරුන් සංරක්ෂණ සභාව වෙත යොමුකර ඔවුන්ගේ දත්ත ලේඛණගත කිරීම.
- ඔසු උයන් දහයක් පළාත තුළ ඇති කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- රෝග නිවාරණ සත්කාර සංවර්ධනය.
- රෝග ප්‍රතිකාර සේවාව සංවර්ධනය.
- පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය සහ ප්‍රවර්ධනය.
- ඖෂධීය ශාක වගාව සහ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය.
- ආයතනික ධාරිතා සංවර්ධනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

### 01.රෝග නිවාරණ

ආදර්ශ ගම්මාන ඇති කිරීම, ප්‍රවර්ධන සමාජ ඇති කිරීම, පාසල් සෞඛ්‍යදාන ඒකක ඇති කිරීම, පෙර පාසල් පෝෂණ වැඩසටහන් ඇති කිරීම, රාජ්‍ය ආයතන දැනුවත් කිරීම, ජංගම සායන පැවැත්වීම.

### 02. රෝග ප්‍රතිකාර

සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකටම ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක්, සෑම රෝහලකම ආයුර්වේද විවිධ සායන ආරම්භ කිරීම. සෑම රෝහලක්ම හා මධ්‍යම බෙහෙත් ශාලවකම බෝ නොවන රෝග සායන පැවැත්වීම.

### 03. ඖෂධ

ඔසු ගොවින් ඇති කිරීම, පළාත් ඖෂධ නිෂ්පාදනාගාරය වැඩි දියුණු කිරීම, රෝහල් ආශ්‍රිතව ඔසු උයන් 07 ක් අරම්භ කිරීම.

## තිරසර සංවර්ධන අරමුණු අංක 03

**යටතේ දක්වා ඇති නීරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීම සඳහා භාවිතා කළ ප්‍රධාන කාර්යයන්.**

පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය තුලින් එම වෛද්‍ය ක්‍රමය රැක ගැනිම.

රෝගී සත්කාර සේවය සංවර්ධනයෙන් ප්‍රතිකාරවල සාර්ථකත්වය ඉහළ දමමින් සෞඛ්‍ය ක්ශේත්‍රය නගා සිටුවීම




රෝග නිවාරණය සම්බන්ධයෙන් මැදිහත් වී උතුරු මැද පළාත තුල නිරෝගී ජනතාවක් ඇති කිරීම සඳහා ඉහළම දායකත්වය සැපයීම

ඖෂධ වගාව හා නිශ්පාදනය තුළින් ඖෂධ හිඟය අවම කර ප්‍රමිතියෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබාදීම

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 647ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 474කි. පුරප්පාඩු සංඛ්‍යාව 173 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 79 | 52 | 27 | 66% |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 2.5 | 2.5 | - | 100% |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 5 | 5 | - | 100% |
| වෙනත් මූලධන වත්කම් පුනුරුත්ථපනය හා වැඩිදියුණු කිරීම | 26 | 18 | 8 | 69% |
| **එකතුව** | 112.5 | 77.5 | 35 | 69% |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

1. රෝගී සත්කාර සේවය සංවර්ධනයෙන් ප්‍රතිකාර වල ගුණාත්මක බව හා සඵල්‍යතාවය වර්ධනය කරමින් ප්‍රජාව වෙත සෞඛ්‍ය සේවා සැපයීමේ ප්‍රමුඛ කාර්යභාරය ඉටු කිරීම.

2. රෝග නිවාරණය සම්බන්ධයෙන් වසංගත තත්ත්වයන් යටතේ පවා සෞභාග්‍යයේ දැක්මට අනුකූලව උතුරු මැද පළාත තුළ නිරෝගිමත් ජනතාවක් ඇති කිරීම සඳහා ඉහළම දායකත්වයක් සපයන ප්‍රජා සෞඛ්‍ය සේවාවක් පැවතීම.

3. ඖෂධ වගාව හා නිශ්පාදනය තුලින් ඖෂධ හිඟය අවම කර ප්‍රමිතියෙන් යුත් ඖෂධ රෝගීන්ට ලබාදීම.

4. පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය තුලින් එම වෛද්‍ය ක්‍රමය රැක ගැනිම.

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව ලෙස තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ආයතන කිහිපයක්ම ඵලදායිතා සම්මාන දිනා ගන්නා ලදි.

උදාහරණයක් ලෙස පළාත් ආයුර්වේද රෝහල ආයතනික වශයෙන් දෙවනි ස්ථානයත් තඹුත්තේගම ග්‍රාමීය ආයුර්වේද රෝහල, තෙල්හිරියාව ඖෂධ නිෂ්පාදනාගාරය, මැදවච්චිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව වැනි ආයතන කුසලතා සම්මාන ලබා ගන්නා ලදි. මෙම සම්මාන ලබා ගැනීමේදී ඒ ඒ ආයතන වල පැවති කණ්ඩායම් හැඟීමත් නිර්මානශීලි බවත් කාර්යක්ෂමතාව කැපවීම හා ආයතනික හැඟීමත් අධිෂ්ඨානයත් ශක්තීන් ලෙස හඳුනා ගත හැක. එමෙන්ම මෙම ජයග්‍රහනයන් ලබා ගැනීමේදී මුල්‍යමය ශක්තිමත් භාවය හා කාර්යමණ්ඩලයේ හිඟකම අභියෝග ලෙස හඳුන්වා දිය හැක.

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අනුව අදාළ සංරචක අනුව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක

01.සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. (02)

02.නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම. (03)

| අනු අංකය | උප සංරචක | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1 | රෝහල් සේවා වැඩිදියුණු කිරීම (තත්ත්වය, ආරක්ෂාව සහ සාධාරණත්වය) | වසරේ රෝගීන්ගේ ගණන | 448,740 | මින්නේරිය පංචකාරාම ඒකකයක් සෑදීම. |
| 2 | විමර්ශන සේවා තත්ත්වය වැඩිදියුණු කිරීම | වසර තුළ රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව | 61 | පළාත් ආයුර්වේද කොමසාරිස් සහකාර කොමසාරිස් සහ අනුරාධපුර රෝහලේ අධ්‍යක්ෂ යන තනතුරු සඳහා නිල නිවාස ඉදිකිරීම. |
| | | | | පළාත් ආයුර්වේද රෝහල් දෙමහල් නිල නිවාස (AB) ඉදිකිරීම |
| 3 | උපකරණ සැපයීම. | වසරේ රෝගීන්ගේ ගණන හා කාර්ය මණ්ඩලය | 0% | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ |
| 4 | ඖෂධ නිෂ්පාදනය සහ තත්ත්ව පාලනය | ඖෂධ නිෂ්පාදනයේ ප්‍රමාණය | 2000kg | ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර හා ක්‍රියාවලියේ අඛණ්ඩ බව |
| 5 | සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | වසරක වැඩසටහන් ගණන | 150 | ගුරුවරුන් සහ සිසුන් සඳහා ආයුර්වේද පාසල් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| | | | | ආදර්ශ ගම්මාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| | | | | ඔසු උයන සහ ඔසු ගොවි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | උප සංරචක | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමවුම) | ඉලක්ක 2021 | ඉලක්ක සපුරා ගැනීම. |
|---|---|---|---|---|
| 1 | රෝහල් සේවා වැඩිදියුණු කිරීම (තත්ත්වය, ආරක්ෂාව සහ සාධාරණත්වය) - | වසරේ රෝගීන් ගණන | බාහිර - 320,000 නේවාසික -5000 | මින්නේරිය පංචකාර්ම ඒකකයක් සෑදීම. |
| 2 | විමර්ශන සේවා තත්ත්ව වැඩිදියුණු කිරීම | වසර තුළ රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව | 180 | පළාත් ආයුර්වේද රෝහල් දෙමහල් නිල නිවාස (AB නිවාස 12) ඉදිකිරීම. (නිවාස 8ක් අවසන්) |
| 3 | උපකරණ සැපයීම | වසරේ රෝගීන් ගණන | 80% | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ සපයා ගැනීම. |
| 4 | ඖෂධ නිෂ්පාදනය සහ තත්ත්ව පාලනය | ඖෂධ නිෂ්පාදනයේ ප්‍රමාණය | 15000Kg | ඖෂධ නිෂ්පාදන යන්ත්‍ර හා ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි විය. |
| 5 | සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් | වසරක වැඩසටහන් ගණන | 400 | පවත්නා වසංගත තත්ත්වය හමුවේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් මඟින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |

**ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ලඟා වීම. | | | |
| 1 | වසරේ රෝගීන්ගේ ගණන | බාහිර - 320,000 නේවාසික - 5,000 | බාහිර - 314,967 නේවාසික - 3,656 | ආයුර්වේද රෝහල් ගොඩනැගිලි පුළුල් කිරීම. | 7 | 318,623 |
| 2 | වසර තුළ රෝහල්වල සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව | 180 | අනුමත-167 සේවයේ නියුතු-156 | නිල නිවාස ඉදිකිරීම | 123 | වෛද්‍ය නිලධාරී 08 ක් සහ පවුලේ සාමාජික |
| 3 | වසරේ රෝගීන්ගේ ගණන | 80% | 72% | රෝහල් උපකරණ මිලදී ගැනීම | 4 | 318,623 |
| 4 | ඖෂධ නිෂ්පාදනයේ ප්‍රමාණය | 15,000Kg | දළ වශයෙන් 13,800kg | ඖෂධ නිෂ්පාදන ඒකකය වැඩිදියුණු කිරීම. | 4 | බාහිර - 314,967 නේවාසික - 3,656 |
| 5 | වසරක වැඩසටහන් ගණන | 400 | නිෂ්චිතව ගණනය කළ නොහැක | දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 12 | 31,464 |

2021 වර්ෂයට අදාලව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළ භෞතික සංවර්ධනයට අදාල කටයුතු සිදු කෙරුණි.

1. දේශීය හා විදේශිකයන් සඳහා ඉදිකරන ලද මින්නේරිය පංචකර්ම මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය සකස් කිරීම





2. පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා අනුරාධපුර පළාත් ආයුර්වේද රෝහල වටා තාප්පය ඉදිකිරීම.





**3.**

තෙමහල් වෛද්‍ය නිල නිවාස A හි තෙවන මහල ඉදිකිරීම

තෙමහල් වෛද්‍ය නිල නිවාස B හි තෙවන මහල ඉදිකිරීම




4. නවසේනපුර ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා ඉදිකිරීම



5. කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස තඹුත්තේගම ග්‍රාමීය ආයුර්වේද රෝහල නවීකරණය කිරීම





6. කහටගස්දිගිලිය ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව වටා වැටක් ඉදි කිරිම





7. හොරොව්පතාන ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව අළුත්වැඩියා කිරිම





## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය | ක්‍රියාකාරකම | නිමවුම් දර්ශකය | | ප්‍රතිඵල දර්ශකය | |
|---|---|---|---|---|---|
| | | ක්‍රියාවලියේ නිවුම (process output) | වැඩසටහන් නිමවුම් දර්ශකය | ප්‍රතිඵල දර්ශකය (outcome index) | බලපෑම් දර්ශකය (impact index) |
| රෝගී සත්කාර සේවය සංවර්ධනය | නවසේනපුර ආ.මධ්‍යම බෙහෙත් ශාලාවේ බාහිරාංශය ඉදිකිරිම.<br><br>මනම්පිටිය බාහිර අංශය අලුත්වැඩියාව. | නවසේනපුර ආ.මධ්‍යම බෙහෙත් ශාලාවේ බාහිරාංශය ඉදිවිම.<br><br>මනම්පිටිය බාහිර අංශය අලුත්වැඩියාව. | රෝගී ප්‍රතිකාර සේවාව සංවර්ධනය | රෝගී සත්කාර සේවය සංවර්ධනය<br><br>ප්‍රතිකාර ලබා දුන් රෝගී සංඛ්‍යාව. | රෝගී ප්‍රතිකාර සේවාව සංවර්ධනය<br><br>ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු විම. |
| ප්‍රමිතියෙන් යුත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය | පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිකිරිම.<br>ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට යන්ත්‍ර සූත්‍ර මිළදී ගැනිම | පළාත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට අරිෂ්ඨ ආසව සංධාන අංශයක් ඉදිවිම ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයට යන්ත්‍ර සූත්‍ර මිළදී ගැනිම. | ප්‍රමිතියෙන් යුත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය | ප්‍රමිතියෙන් යුත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය | ප්‍රමිතියෙන් යුත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය |
| බෝ වන හා බෝ නොවන රෝග වළක්වා ගැනීම.<br><br>රෝග නිවාරණ සේවාව සංවර්ධනය | බෝ වන හා බෝ නොවන රෝග සඳහා උපදේශනය හා ප්‍රතිකාර සේවය<br><br>ඔසු උයන් සංවර්ධනය | බෝ වන හා බෝ නොවන රෝග සඳහා උපදේශනය හා ප්‍රතිකාර සේවය<br><br>සංවර්ධිත ඔසු උයන | උපදේශනය වැඩසටහන් හා ප්‍රතිකාර සේවය<br><br>ඖෂධ නිශ්පාදනයට අවශ්‍ය වියළි ඖෂධ සපයා ගැනිම | උපදේශනය හා ප්‍රතිකාර ලබා දුන් ප්‍රතිලාභීන්<br><br>වියළි ඖෂධ හිඟය අවම කිරිම | උපදේශනය හා ප්‍රතිකාර ලබා දුන් ප්‍රතිලාභීන්<br><br>වියළි ඖෂධ හිඟය අවම විම |
| උපකරණ සැපයිම | රෝහල් සඳහා වෛද්‍ය උපකරණ සැපයීම. | ප්‍රමිතියෙන් යුත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය | උපකරණ සැපයිම | රෝගීන්ට සත්කාර කිරිම පහසුවිම | ගුණාත්මක සත්කාර සේවයක් ලැබිම |
| ධාරිතා සංවර්ධනය | තෙමහල් වෛද්‍ය නිල නිවාස සංකිර්ණ දෙකක් ඉදි කිරිම කිරිම.<br>අනුරාධපුර පළාත් රෝහලේ ඇතුලත මාර්ග පද්ධතිය සැකස් කිරිම | වෛද්‍ය නිළ නිළ නිවාස 04 ක් ඉදිවිම.<br>නවිකරණය කරන ලද දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල | වෛද්‍ය නිළ නිළ නිවාස 04 ක් ඉදිවිම.<br>නවිකරණය කරන ලද දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල | රෝහලතුල සේවය කරන වෛද්‍යවරුන් ට නිළ නිවාස පහසුකම් සැලසිම | රෝගී සත්කාරය පැය විසි හතර තුලම සිදු කිරිමට හැකිවිම |

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| රෝගී සත්කාර සේවය සංවර්ධනය. | | | |
| ප්‍රමිතියෙන් යුත් ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය. | | | |
| බෝ වන හා බෝ නොවන රෝග වළක්වා ගැනීම. | | | |
| රෝග නිවාරණ සේවාව සංවර්ධනය. | | | ✓ |
| උපකරණ සැපයිම. | | ✓ | |
| ධාරිතා සංවර්ධනය. | | | ✓ |

## හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතන සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්ක ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම්. | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශකය අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 01.සාගින්න නැති කර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම. | ගර්භනී ළමා හා තරුණ ප්‍රජාවගේ පෝෂණීය ආහාර රටාවන් ඇති කිරීම | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය වරු හරහා ගර්භනී ළමා හා තරුණ ප්‍රජාවගේ පෝෂණය සම්බන්ධ දැනුවත් කිරීම. | ප්‍රා.ලේ.කො.29 ම ආවරණය වන පරිදි මාසිකව ගර්භනී ළමා හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. තරුණ ප්‍රජාවගේ පෝෂණය හා කායික සුවතාව පවත්වාගෙන යාම සඳහා වැඩසටහන් කිරීම. | | √ | |
| | ගෘහ ආර්ථික ආහාර නිෂ්පාදනයක් ඇති කිරීම. | පවුල් ඒකකට අවශ්‍ය වන පෝෂණීය ආහාර තමන්ම ස්වභාවිකව ලබා ගැනීමට හා සකස් කර භාවිතයට ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැන්වීම. | ප්‍රා.ලේ.කො. මට්ටමින් එක් වෛද්‍ය වරයෙකු විසින් නිවාස 100ක් ආවරණය වන පරිදි වගාවන් ඇති කිරීමට එළවළු බීජ හා දේශීය සහල් වර්ග ලබා දීම. | | √ | |
| | පවුල් ඒකක තුළ ගුණාත්මක හා පෝෂණීය ආහාර වේල් පිළියෙල කර ගැනීමට දිරි | දේශීය පැරණි ආහාර සංස්කරණ ක්‍රම නැවත හඳුන්වා දෙමින් ඒවා සැකසීමට ගෘහනිය දැනුවත් කිරීම හා පුහුණු කිරීම. | දේශීය ආහාර සංස්කරණ ක්‍රමවේද ප්‍රයෝගිකව පුහුණු කිරීම සඳහා වැඩසටහන් සිදු කාරීම. | | √ | |
| | තිරසාර ගෙවතු වගාවන් ඇති කිරීම. | ගෘහ ආර්ථික කළමනාකරණය සඳහාත් පෝෂණීය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහාත් ගෙවතු වගාවන් ඇති කිරීමට දැනුවත් කිරීම හා යටිතල පහසුකම් ලබාදීම. | ගෙවතු වගාවන් සඳහා ජල කළමනාකරණ පහසුකම් ලබා දීමත් බෝග වගාවන් සඳහා උපකරණ ලබා දීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | √ | |

| 02. නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම. | | | | | |
|---|---|---|---|---|---|
| ආයතන මට්ටමින් පවතින පුරප්පාඩු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | දේශීය සපයා ගත ගුණාත්මක බවින් වැඩි ඖෂධ වර්ග වලට ප්‍රජාව හුරු කිරීම. | මධ්‍යසාර හා අන්තරාය ඖෂධ භාවිතය අවම කිරීම. | බෝ නොවන රෝග වළක්වා ගැනීමට සහ යහපත් සෞඛ්‍ය දින චර්යාවන් පුහුණු කිරීම මගින් ප්‍රජාවගේ පරමායුෂ මට්ටම ඉහල දැමීම. | පළාත තුළ බෝ වන හා බෝ නොවන රෝග ප්‍රතිශතය අඩු කිරීම. | පළාතේ ගර්භනී පෝෂණ ඌණතාවයන් හා ගර්භනී කාලයේ ශරීරික සෞඛ්‍ය තත්ත්වය විධිමත්ව පවත්වා ගැනීම. |
| ආයතනික මට්ටමින් කාර්ය මණ්ඩල අවශ්‍යතාවයන් හඳුනාගෙන බලධාරීන් දැනුවත් කිරීම. | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය වරුන් හරහා ප්‍රජාව වෙත දේශීය අත්බෙහෙත් ක්‍රම හඳුන්වා දීම. | මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා උපදේශන ලබා දීම හා පෝෂණීය ආහාර සඳහා හුරු කිරීම. | බෝ වන හා බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා ප්‍රා.ලේ.කො. මට්ටමින් වැඩසටහන් සිදු කිරීම. | ගර්භනී ශරීරික සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| අමාත්‍යාංශයට පවතින පුරප්පාඩු අවශ්‍යතාව පිළිබඳ දැනුම් දීම. | දේශීය අත්බෙහෙත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීම. | ප්‍රා.ලේ.කො. මට්ටමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම. | රාජ්‍ය ආයතන වලට ගොස් උපදෙස් ලබා දීම හා ඖෂධ ලබා දීම. | කොරොනා වසන්ගත තත්ත්වය හේතුවෙන් නිවෙස් වලට ගොස් සෞඛ්‍ය තත්ත්වයන් සොයා බැලීම හා ඖෂධ ලබා දීමේ කටයුතු සිදු කිරීම. | ප්‍රා.ලේ.කො. මට්ටමින් මාසිකව ගර්භනී සායන පැවැත්වීම. |
| | | | | | |
| | √ | √ | √ | √ | √ |
| √ | | | | | |

## පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මහජනතාව වෙත ලබා දුන් සේවාවන්

| අනු අංකය | ලබා දුන් සේවාවන් | ක්‍රියාත්මක කරන ලද ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | සහය දැක්වූ ආයතන |
|---|---|---|---|---|
| 1 | ප්‍රතිශක්ති කරණ ඖෂධ ලබා දීම. | උ.මැ.ප. සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 31,464 | පොලිසිය ඇතුළු සියලුම රාජ්‍ය ආයතන බැංකු හා මූල්‍ය ආයතන |
| 2 | කොවිඩ් මර්ධන උපදේශන සේවා ලබා දීම | උ.මැ.ප. සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස | 31,464 | පොලිසිය ඇතුළු සියලුම රාජ්‍ය ආයතන බැංකු හා මූල්‍ය ආයතන |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2021 වර්ෂයේදී කෙරෝනා වසංගත තත්ත්වය තව දුරටත් පැවති බැවින් සෞඛ්‍ය සේවය සම්බන්ධ ආයතනයක් ලෙස වර්ෂය පුරාම මෙම වසංගත තත්වයට මුහුණ දෙමින් අපගේ සේවාවන් පවත්වාගෙන යාමට සැලසුම් සකස් කරන ලදි. ඒ අනුව ආයතනික පරිපාලන කටයුතු, සංවර්ධන කටයුතු, රෝහල් සෞඛ්‍ය සේවා පවත්වාගෙන යාම හා ප්‍රජා සෞඛ්‍ය නිවාරණ කටයුතු යන ක්ෂේත්‍රයන් හතරම මනා සැලසුමකට අනුව ඉදිරියට පවත්වාගෙන යාම තුළින් දෙපාර්තමේන්තුවේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාත්මක විමේදී බොහෝ ගැටළු වලට මුහුණ දීමට සිදු විය.
ආයතන පරිපාලන කටයුතු සම්බන්ධයෙන් මුහුණ දුන් ප්‍රධානම දුෂ්කරතාව ලෙස කාර්ය මණ්ඩලය සේවා මුර ක්‍රමයට සේවයට කැඳවීම මඟින් ආයතනයේ කාර්යක්ෂමතාව ඒ අයුරින්ම පවත්වාගෙන යාම හා සෞඛ්‍ය ආරක්ෂිත කාර්ය මණ්ඩලයක් මඟින් සේවය ලබා ගැනීම පෙන්වා දිය හැක.

එමෙන්ම රාජ්‍ය සේවයේ විවිධ කාර්යයන් ඉටු කිරීමේදී ඒ ඒ විෂයන්ට හා කාර්යභාරයන්ට අදාළව ප්‍රමාණවත් මානව සම්පතක් පැවතීම අත්‍යවශ්‍ය නමුත් අප දෙපාර්තමේන්තුවේ මානව සම්පතේ හිඟ තාවයක් පවතින බැවින් සෞඛ්‍ය සේවයට අනුබද්ධ ආයතනයක් ලෙස ප්‍රජාව වෙත අඛන්ඩව සේවාව සැපයීම සඳහා රෝහල් හා අනෙකුත් ආයතන වල ඒ ඒ වෘත්තීන් වලට අදාල කටයුතු නියමිත පරිදි පවත්වාගෙන යාමට මානව සම්පතේ හිඟය මේ කාලයේදී තීරණාත්මක සාධකයක් බවට පත් විය.
එනමුත් ආයතනික වශයෙන් 75% ක පමණ සංවර්ධන ප්‍රගතියක් ලඟා කර ගැනීමට හැකි වූ අතර ඉදිරි වසර වලදී පෙර ඇති වූ ගැටළු වලින් ලැබූ අත්දැකීම් තුලින් වඩාත් ශක්තිමත්ව මුහුණ දී ක්‍රියාත්මක වීමට මේ වන විටත් කටයුතු කරමින් සිටී.
තවද කොරොනා වසන්ගත තත්වයත් සමඟ බටහිර රෝහල් වලට මෙන්ම ආයුර්වේද රෝහල් වලටද පැමිණෙන බාහිර අංශ රෝගීන් සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු වූවත් අපගේ වෛද්‍යවරුන්ගේ හා රෝහල් කාර්ය මණ්ඩල වල අඛණ්ඩ සේවය පවත්වා ගෙනයනු ලැබිණි.බොහෝ බටහිර රෝහල් කොරොනා මධ්‍යස්ථාන බවට පත් කර තිබූ අවස්ථාවන් වලදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්

බිහි වී තිබූ අති විශාල රෝහල් පද්ධතියක් ලෙස දෛනිකව අප වෙත පැමිණෙන අනිකුත් විවිධ රෝගාබාධ සහිත සියළු රෝගීන්ට අඛන්ඩව ප්‍රතිකාර ලබා දීම සිදු විය.

කොරොනා වසංගත තත්ත්වය හමුවේ විශාල කාර්ය භාරයක් ඉටු කරනු ලැබුයේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය වරුන් විසිනි. මහ ජනතාව එක් රුස් කර උපදේශන සේවා පවත්වා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම නොහැකි වීමත්, පැමිණ ප්‍රතිකාර ලබා ගැනීමටත් ඇති දුෂ්කරතාවත් නිසාවෙන් එවකට නියෝජ්‍ය කොමසාරිස් ලෙස කටයුතු කළ වර්ථමාන කොමසාරිස් තුමා විසින් කොරොනා මෙහෙයුම් මධ්‍යස්ථානයක් ලෙස පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළ ඒකකයක් පිහිටුවා ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන්ගේ මනා දායකත්වයකින් යුතුව සුවිසාල මෙහෙවරක් ඉටු කරන ලදි. ඒ යටතේ මෙහෙයුම් මධ්‍යස්ථානය තුළ ක්ෂණික ඇමතුම් අංකයක් හදුන්වා දුන් අතර එයින් පළාතේ සියලුම කොරොනා අසාදිත රෝගින්ගේ තොරතුරු ලබා ගැණුන අතර මෙහෙයුම් මධ්‍යස්ථාන හරහා අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඒ ඒ වසම්වල රාජකාරි භාර ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය වරුන් හරහා එම රෝගින්ගේ නිවසටම ඖෂධ ලබා දීම සිදු කරණු ලැබිණි.
සමහර ඖෂධ දේශීය වශයෙන් සපයා ගත නොහැකි අතර ඉන්දියාව වැනි රටවලින් පවා ආනයනිකව ලබා ගැනීමට ද නොහැකි තත්ත්වයක් තුළ උවද රෝහල් වල වියලි ඖෂධ සැපයුම හා ඖෂධ නිෂ්පාදනය යනාදියද අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිණි. තවද ප්‍රතිශක්තිකරණ වර්ධනයටත්, කොරොනා රෝගයේ පසු උපද්‍රවයන් සඳහාත් යෝග්‍ය වන පරිදි වෛද්‍ය නියමයන්ට අනුව ඖෂධ නිෂ්පාදනය කරමින් රෝහල් වලට පැමිණෙන රෝගීන්ට ලබා දෙන ලදි.

2021 වර්ෂයට අදාල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු පවත්වාගෙන යාම අප ආයතනයට මෙන්ම බොහෝ රාජ්‍ය ආයතනවලට ගැටළුවක්ව පැවතුන බව අප දන්නා කරුණකි. ගොඩනැගිලි ද්‍රව්‍ය සපයා ගැනීම, කොන්ත්‍රාත්කරුවන්ගේ සේවය කාල රාමුවකට අනුව ලබා ගැනීම, නිසි පරිදි බිල්පත් පියවීම යනාදිය සඳහා බොහෝ ගැටළු පැන නැගුණි.

ඒ අනුව මෙම ගැටළු වලට මුහුණ දෙමින් ආයතනික වශයෙන් අපගේ රෝහල් වල කාර්ය මණ්ඩල වලට නියමිත කාලයේදී වැටුප් ගෙවීම යටිතල පහසුකම් ලබා දීම බිල්පත් පියවීම සුළු මුදල් පියවීම නඩත්තු හා අලුත් වැඩියා කටයුතු මෙන්ම මිලදී ගැනීම් ප්‍රසම්පාදන කටයුතු ඖෂධ සැපයීම යන ආදී සියලු කාර්යන් ඒ අයුරින්ම සිදු කර ගැනීමට හැකි වී තිබේ.

# 8.3.පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

ළමා පරපුර යනු රටක ඉදිරි සංවර්ධන කාර්යයේ හා සමාජීය අභිවෘද්ධියේ මූලික සාධකයක් ලෙස හැඳින්විය හැකිය. එබැවින් ළමා පරපුර හා බැඳුණු යහපත් හෝ අහයපත් යම් කිසි ක්‍රියාදාමයක් වෙතත් ඒ පිළිබඳව අවධානය යොමු කිරීම වැඩිහිටි අප කාගෙත් යුතුකමකි. පිළිගත් සාරධර්ම, සිරිත් විරිත් හා සම්මතයන් අනුවත්, පනවාගත් නීතිරීති අනුවත් කටයුතු කිරීම සියලු සමාජයන්හී අපේක්ෂාවයි. අපේක්ෂාවන් සපිරුණු සමාජයක ජීවත්වීම පුද්ගල පැතුමයි. සමාජයේ පුද්ගලයන්ගේ අන්‍යොන්‍ය ක්‍රියාකාරිත්වයත් එක් එක් පුද්ගලයාගේ ක්‍රියාකාරිත්වයත් සමාජයම කෙරෙහි සෘජුව මෙන්ම පෞද්ගලික බලපෑමක් ඇති කරයි. එබැවින්, ක්‍රියාකාරකම්වල කළමනාකරණයක් පැවැතීම අවශ්‍ය වේ. එම නිසා සමස්ථ සමාජයෙහි වගකිව යුත්තෝ එම තත්වයන් කළමනාකරණය කරනු ලබන්නෝ වෙති. මෙම දෙපාර්තමේන්තුවේද එවැනි වගකීම් දරණ දෙපාර්තමේන්තුවක් වන අතර ළමාරක්ෂක විෂයට අදාල කාර්ය භාර්ය මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

පුද්ගලයාගේ හැසිරීම ඒ ඒ සමාජ ක්‍රමයට අනුගතව ක්‍රියාත්මක නොවන අවස්ථාවන්වලදී එකී චර්යාවන් සමාජ හිතකර ආකාරයෙන් සකස් කිරීමට සහ සමාජ හිතකාමී චර්යාවන් වැඩිදියුණු කිරීම සඳහා එම විධි ක්‍රම භාවිතයට ගෙන ඇත. වරදකරුවන් ප්‍රජාව තුළම රඳවා සමාජ ප්‍රත්‍යෙක වැඩ න්‍යාය සහ භාවිතය තුළින් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රමවේදයක් වශයෙන් පරිවාස සේවාව ආරම්භ වී ඇත.

තිති ගරුක ප්‍රජාවක් සුරක්ෂිත ළමා පරපුරක් පළාත තුල බිහිකිරීමේ මූලික පරමාර්ථය ඇතිව පිහිටුවන ලද උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව තම අරමුණු හා කාර්ය භාර්ය තිරසර සංවර්ධන අරමුණු හා බද්ධ කොට ගනිමින් එම අරමුණු ඉටුකරගැනීම සඳහා සුවිශාල කාර්ය භාර්යක් පළාත තුළ ඉටු කරනු ලබයි.

ඉතා සංකීර්ණ මෙන්ම සංවේදී විෂය කාර්ය භාරයක් සහිත මෙම දෙපාර්තමේන්තු කාර්ය පරාසය ජනතාව තුලට සමීප කරනුවස් උතුරු මැද පළාත තුල පිහිටි අධිකරණ කලාප 06 තුල පරිවාස කාර්යාල පිහිටුවමින්, තම සේවාව පළාත පුරා ක්‍රියාත්මක කරමින්, ජනතාව වෙත ඵලදායි සේවාවක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරමින් සිටී. පළාත පුරා පිහිටුවා ඇති ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රමාණය 18 ක් වන අතර, දෙපාර්තමේන්තු කළමණාකාරීත්වය යටතේ ආයතන 08 ක් හා ස්වෙච්ඡා සංවිධාන කළමනාකාරීත්වය යටතේ ආයතන 08 වශයෙන් වේ .

පවුල තුල අනාරක්ෂිත වන දරුවාගේ සිට නිතියේ රැහැනට හසුවන බාල වයස්කාර දරුවා දක්වා වූ සියලු දරුවන් අවධානමෙන් මුදවාගෙන සමාජයට වැඩදායි යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත කිරීම හා නිවාස ගත වීමට හේතුවන කාරනා හඳුනාගෙන එම හේතු සඳහා සාර්ථක විසඳුම් ලබාදීම මෙම දෙපාර්තමේන්තු ප්‍රමුඛ කාර්ය අතර වේ.

පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය පෙර පැවතියේ බන්ධනාගාරය හා සමාජසේවා දෙපාර්තමේන්තුව යටතේය. දිනපතා සීඝ්‍රයෙන් වර්ධනය වන පරිවාස හා ළමාරක්ෂක කටයුතු සාර්ථකව ඉටු කරලීමට වෙනමම දෙපාර්තමේන්තුවක අවශ්‍යතාවය උද්ගත විය. මෙම අඩුපාඩු පිළිබඳව එවකට පැවති සාපරාධී අධිකරණ කොමිෂමේ විශේෂ අවධානය යොමු විය. එහි නිර්දේශයන්හි බලපෑම ගැන සලකා බැලීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යාපන හා අධිකරණ යන අමාත්‍යාංශ එක්ව ඒ සඳහා වන සාකච්ඡාවක් 1951 වසර අවසානයේ පවත්වන ලදි. එහිදී ළමා ආරක්ෂක සේවාවන් ක්‍රියාත්මක කිරීමට වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට එකඟතාවයකට එළඹිණි. මෙම එකඟතාවයේ ප්‍රතිඵලයක් ලෙස ලන්ඩන් නගරයේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරියෙකු වන සිරිල් හැම්ලි මහතා ඉහත යොජනාව පරික්ෂා කර බැලීමට පත් කර ශ්‍රී ලංකාවට එවන ලදි. ඔහු විසින් 1952 දී ඉදිරිපත් කරන ලද ලියවිල්ලක ළමයින් සඳහා වූ දෙපාර්තමේන්තු ස්ථාපිත කිරීමට සම්බන්ධව යෝජනා සලකා බලා 1956 ඔක්තෝබර් 01 දින ජාත්‍යන්තර දිනයේදී ළමා ආරක්ෂක / සුභ සාධන දෙපාර්තමේන්තුව යනුවෙන් වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට කටයුතු කරන ලදි. ඒ අනුව පරිවාස සේවාවද බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් ඉවත් කර ළමා ආරක්ෂක / සුභ සාධන සේවා දෙපාර්මේන්තුව එකතු කර 1956 ඔක්තෝබර් 01 දින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලදි. ළමා ආරක්ෂණ සේවාව සමඟ පරිවාස සේවාව සම්බන්ධ කිරීමට ප්‍රධාන සාධකයක් වූයේ හැමිලින් මහතාගේ යෝජනාවන්ය.

මේ අයුරින් ආරම්භ කළ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 1988 වසරේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය දක්වාම මධ්‍යම රජයේ කොමසාරිස්වරයෙකු යටතේ සහකාර කොමසාරිස් කාර්යාල බල ප්‍රදේශ මට්ටමින් පත් කරන ලද සහකාර කොමසාරිස්වරුන් යටතේ පරිවාස කාර්යාල හරහා තම සේවාවන් ජනතාව වෙත ලගා කරවීම සිදු විය. පළාත් සභා පරිපාලනය ආරම්භ වීමත් සමඟ පූර්ණ ලෙස විමධ්‍යගත විෂයක් ලෙස පත් වූ පරිවාස හා ළමාරක්ෂක විෂය පළාත් අමාත්‍යාංශයක් යටතේ පළාත් පරිවාස කොමසාරිස්වරයෙක් හරහා සිදු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවට අදාල සියලු කාර්යයන් ඉටු කිරීම සඳහා පහත ආඥාපනත් හා පනත් මගින් දෙපාර්තමේන්තුව වෙත බලය ලැබී ඇත.

- ❖ ආඥාපනත්
  - පරිවාස ආඥාපනත,
  - 1939 අංක 48 දරණ ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥාපනත
  - 1944 අංක 42 දරණ වරදකරුවන් පරිවාස භාරයට පත් කිරීමේ ආඥාපනත
  - නිවර්තන නිවාස, තරුණ වරදකරුවන්ගේ ආඥාපනත
  - 1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ආඥාපනත
  - 1927 දරන ප්‍රකාශන ආඥාපනත

- 1941 අංක 22 දරණ අනාථ නිවාස ආඥාපනත

❖ පනත්

- 1955 දණ්ඩ නීති සංග්‍රහය - 1995 - අංක 22
- 1999 අංක 32 දරණ පනත
- 1998 අංක 27 අධිකරණ සංවිධාන පනත
- 1907 අංක 05 දරණ රැඳවුම් පනත

❖ ප්‍රඥප්ති

- විශ්ව ළමා ප්‍රඥප්තිය
- උතුරු මැද පළාත් ළමාරක්ෂක සේවා අරමුදල පිළිබඳ ප්‍රඥප්තිය

ඒ අනුව වර්තමානයේදී දෙපාර්තමේන්තුවේ සේවාවන් පළාත පුරා ක්‍රියාත්මක කිරීමට අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක තුළ දෙපාර්තමේන්තුවට අයත් පරිපාලන ආයතන විහිදී ඇති ආකාරය පහත පරිදිවේ.

## පරිපාලන ආයතන

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| පරිවාස කාර්යාල | 04 | 02 | 06 |
| උපදේශන මධ්‍යස්ථාන | 01 | - | 01 |
| ළමා රැඳවුම් මධ්‍යස්ථාන | 02 | - | 02 |
| සහතික කළ පාසල් (ගැහැණු) | 01 | - | 01 |
| භාර ගැනීමේ නිවාස | 01 | - | 01 |
| ළමා නිවාස | 07 | 04 | 11 |
| පෙර පාසල් | 01 | - | 01 |

## පරිවාස කාර්යාල හා එම කාර්යාලවලට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

| අනු අංකය | පරිවාස කාර්යාලය | අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|---|
| 1 | අනුරාධපුර | නැ.නු.ප |
| | | ම.නු.ප |
| | | මහ විලච්චිය |
| | | නාච්චාදූව |
| | | මිහින්තලේ |
| | | තිරප්පනේ (අයත් පොලිස් බල ප්‍රදේශ අනුව) |
| | | ගලෙන්බිදුණු වැව |
| | | කහටගස්දිගිලිය |
| | | මැදවච්චිය |
| | | රඹෑව |
| 2 | තඹුත්තේගම | නොච්චියාගම |
| | | රාජාංගනය |
| | | තඹුත්තේගම |
| | | තලාව |
| | | ඉපලෝගම |
| 3 | කැකිරාව | ගල්නෑව |
| | | පලාගල |
| | | කැකිරාව |
| | | තිරප්පනේ (අයත් පොලිස් බල ප්‍රදේශ අනුව) |
| | | පලුගස්වැව |
| 4 | කැබිතිගොල්ලෑව | හොරොව්පොතාන |
| | | කැබිතිගොල්ලෑව |
| | | පදවිය |
| 5 | පොළොන්නරුව | තමන්කඩුව |
| | | ලංකාපුර |
| | | වැලිකන්ද |
| | | දිඹුලාගල |
| 6 | හිඟුරක්ගොඩ | හිඟුරක්ගොඩ |
| | | මැදිරිගිරිය |
| | | ඇළහැර |

## දෙපාර්තමේන්තු කළමනාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා සංවර්ධන මධ්‍යස්ථාන

01. අභය භාර ගැනීමේ ළමා නිවාසය
02. යෙහෙළි උපදේශන සේවා මධ්‍යස්ථානය
03. මඩාටුගම සහතික කළ පාසල
04. කාන්තා ළමා රැඳවුම
05. පිරිමි ළමා රැඳවුම
06. අවන්ති දේවි ළමා සංවර්ධන මධ්‍යස්ථානය
07. ධර්මපාල බෝසත් බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානය
08. ක්ෂේම සුරක්ෂා ළමා රැකවරණ මධ්‍යස්ථානය

## ස්වේච්ඡා සංවිධානවල කළමනාකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ළමා සංවර්ධන මධ්‍යස්ථාන

| අනුරාධපුර | පොළොන්නරුව |
|---|---|
| ප්‍රීති ළමා නිවාසය | පැරකුම් බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානය |
| අශෝක බාලක ළමා සංවර්ධන මධ්‍යස්ථානය | ශාන්ත ජෝශප් බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානය |
| සරණ සෙවණ ළමා සංවර්ධන මධ්‍යස්ථානය | ධර්මපාල බෝසත් බාලක ළමා සංවර්ධන මධ්‍යස්ථානය |
| මිත්‍ර ළමා සංවර්ධන මධ්‍යස්ථානය | |
| SOS ළමා සංවර්ධන මධ්‍යස්ථානය | |

## දැක්ම

"නීතිගරුක ප්‍රජාවක්, සුරක්ෂිත ළමා පරපුරක්".

## මෙහෙවර

"සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන්, විශෝධනය සහ ළමුන්ගේ සමස්ත අයිතීන් සුරකිමින් සියළු පාර්ශවයන්ගේ මනා සහභාගීත්වයෙන් විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම".

## දිගුකාලීන අරමුණු

01. දරුවාගේ පෝෂණය හා මානසිකව ඔහුට හෝ ඇයට විය හැකි යැයි හඳුනාගත් සියලු මානසික හා අහිතකර බලපෑම්වලින් මුදවා ගැනීම තුලින්, කායික හා මානසික නිරෝගී දරුපරපුරක් බිහිකිරීම හා ඒ හා සම්බන්ධයෙන් වන තිරසර සංවර්ධන අරමුණු හා අභිමතාර්ථ ඉටු කරගැනීම.

02. පරිවාස කාලයකට යටත්ව දෙපාර්තමේන්තු භාරයට පත්වන ළමා වැඩිහිටි ප්‍රජාව පුනුරුත්ථාපනය සඳහා නිසි ක්‍රමෙවිද හඳුනාගැනීම හා ක්ෂේත්‍රය තුල සිදුවිය හැකි යැයි හඳුනාගත් අවධානම් සහගත තත්ත්වයන් සඳහා ස්ථිර විසඳුම් ලබාදීම.

03. ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීම හා ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට සමාජය තුල පෙළඹවීමක් ඇති කිරීම.

04. දරුවන් නිවාස ගත වීමට බලපානු ලබන හේතු හඳුනාගැනීම හා ඒවාට සාර්ථක විසඳුම් ලබාදීම.

05. නිරෝගී අධ්‍යාපනයකට දරුවන් යොමුකිරීම.

06. පූර්ණ පෞරුෂයන් සතු විනය පද්ධතියක් දරුවා තුල ගොඩනැගෙන පරිදි දරුවන් කළමනාකරණය සඳහා දෙමාපියන් යොමුකිරීමට අවශ්‍ය උපදේශනය ලබාදීම.

07. දරුවන් අතර වන හානිකර මධ්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහා යොමුකිරීම තුලින් දරුවන් අතර මත් ද්‍රව්‍ය භාවිතය පළාත තුලින් තුරන් කිරීම.

08. නිසි උපෙද්ශනය හා මග පෙන්වීම තුලින් පවුල් ඒකකය ශක්තිමත් කිරීම හා දරුවා පවුල තුල සුරක්ෂිත කිරීම.

09. දරුවන් අතර ව්‍යාප්ත වන තාක්ෂණ අවභාවිතය වැලැක්වීම හා නවීන මාධ්‍ය හා තාක්ෂණය නිසි අයුරින් භාවිතයට යොමුකිරීම සඳහා දැනුවත් කිරීම.

10. විෂය ක්ෂේත්‍රයට අදාලව ක්ෂේත්‍රය තුල නිසි පරියේෂණ ක්‍රමවේද හරහා සාර්ථක විසඳුම් හඳුනා ගැනීම හා ක්‍රියාත්මත කිරීම තුලින් සමාජය වඩාත් විනය ගරුක හා නීතිගරුක ස්ථානයක් බවට පත් කිරීම.

11. නවීන තාක්ෂණය උපයෝගී කරගෙන දරුවන් සුරක්ෂිත කරගත හැකි ක්‍රමෙවිද කෙරෙහි යොමු වීම.

## කෙටිකාලීන අරමුණු

01.පරිවාස පරිලෝචනය හා පසුභාර යන විෂය ක්ෂේත්‍රවලට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම.

02.භාරය හා ආරක්ෂාව අහිමි වූ දරුවන් සඳහා රැකවරණය සැපයීම.

03.අධිකරණය මඟින් වරදකරුවන් වූ බාල වැඩිහිටි ප්‍රජාව විවෘත පරිසරයේ තබා විශෝධනය කිරීම.

04.අධිකරණයට තීන්දු ගැනීමට සහය වීම.

05.සුදුසු ක්‍රමවේදයක් යටතේ නිවාස ගත දරුවන් සමාජ ගත කිරීම.

06.අනාරක්ෂිත අවධානම් සහිත දරුවන් නිවාස ගත කිරීම.

07.සියලු දරුවන්ට සම අයිතීන් ලබාදීමට කටයුතු කිරීම.

08.ළමා අපයෝජනය හා අපචාරය අවම කිරීමට සමාජය දැනුවත් කිරීම.

09.අඩු ආදායම්ලාභී දරුවන් සහිත පවුල් සඳහා නිවාස ආධාර ස්වයං රැකියා ආධාර, පාසල් උපකරණ වෛද්‍ය ආධාර සැපයීම වැනි සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

10.බාල වයස්කාර ළමා මව්වරු සඳහා රැකවරණය සැලසීම.

11.දරුවන් සඳහා ඇති අධ්‍යාපනයේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

12.අවශ්‍ය අවස්ථාවලදී විවිධ පාර්ශව සඳහා උපදේශන සේවය ලබාදීම.

## ප්‍රධාන කාර්යයන්

01.පරිවාස, පරිලෝචන හා පසුභාර යන විෂය ක්ෂේත්‍රවලට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම.

02.ළමා අයිතිවාසිකම් පිළිබඳව සමාජය දැනුවත් කිරීම උදෙසා ආරක්ෂාව හා රැකවරණය පිළිබඳව වැඩසටහන් පැවැත්වීම, ළමා අයිතිවාසිකම් විෂිදී පවතින පරාසය, කඩ වූ විට එහි නීතිමය පැතකඩ පිළිබඳව සමාජය දැනුවත් කිරීම.

03.අපයෝජනය වලින් දරුවන් ආරක්ෂා කිරීම උදෙසා අපයෝජනය පිළිබඳව සමාජය දැනුවත් කිරීම, ආනාරක්ෂිත දරුවන් එම අවධානමින් මුදවාගැනීම සඳහා ක්ෂණික ක්‍රියාමාර්ගයක් ලෙස ආයතන ගත කිරීම හා සුදුසු පුද්ගල භාරකාරීත්වයට පත් කිරීම.

04.නිවාස ආනාරක්ෂිත වීම හේතු කොටගෙන අවධානමට ලක්වීම වැලැක්වීම සඳහා නිවාස ආධාර ලබාදීම.

05.අඩු ආදායම්ලාභී දරුවන් සහිත පවුල් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම.

06.ළමාරක්ෂක කමිටු බලගැන්වීම

07.දරුවන් අතර ව්‍යාප්ත වන හානිකර දායක මත් ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා දරුවන් හා දෙමාපියන් දැනුවත් කිරීම, මත් ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවීම මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ දරුවන් සඳහා පුනුරුත්ථාපන හා උපදේශනය ලබාදීම.

08.සියලුම දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සඳහා ක්ෂේත්‍රයේ සිටින අඩු ආදායම්ලාභී දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබාදීම, නිවාසගත වන දරුවන් සඳහා ප්‍රාථමික, ද්විතීක හා තෘතීක අධ්‍යාපනයට අවස්ථාව ලබා දීම.

09. පාසල් අධ්‍යාපනය නිම කල නිවාස ගත දරුවන් වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම හා වෘත්තීය අධ්‍යාපනයෙන් පසු රැකියා සඳහා යොමු කිරීම.

10.දරුවන් ආයතන ගත වීමට වඩා පවුලතුල සුරක්ෂිත වීම ඔහුගේ හෝ ඇයගේ මානසික සුවතාවයට හේතු වන බැවින්ද, නිවාස ගත වීම වැලැක්වීම සඳහා ද, අදාල පාර්ශව සඳහා සුදුසු උපදේශනය හා ආධාර ක්‍රම ක්‍රියාවට නැංවීම තුල දරුවා පවුල තුල සුරක්ෂිත කිරීමට පියවර ගැනීම.

11.අධිකරණ නියෝග මත පරිවාස භාරයට පත්වන ළමුන් හා වැඩිහිටියන්ගේ පසු විපරම් කටයුතු සිදුකිරීම හා අවශ්‍ය අවස්ථාවලදී, ඔවුන්ගේ ජීවිත සුරක්ෂිතතාවය සඳහා නිවාස ආධාර හා ස්වයං රැකියා ආධාර වැනි සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

12.දරුවන් කුලවද්දා දීමට අදාල කටයුතු සිදුකිරීම.

13.නීතියේ රැහැනට හසු වූ බාල වයස්කාර දරුවන් රැඳවුම් මධ්‍යස්ථානවලට යොමුකිරීම හා පුනුරුත්ථාපනය කාර්ය සිදු කිරීම.

14. නිවාස ගත දරුවන් සමාජගත කිරීම සඳහා සුදුසු ක්‍රමවේද හඳුනාගැනීම හා එම ක්‍රමවේද හරහා සාර්ථක ලෙස සමාජ ගත කිරීම.

15.නිවාස ගත වන දරුවන් සම්බන්ධයෙන් දෙමාපිය පාර්ශව නියෝජනය කරමින්, දරුවන් සම්බන්ධ සියලු කටයුතු ඉටුකිරීම. (ගැහැණු දරුවන් වැඩිහිටි දරුවන් බවට පත් වූ පසු හා විවාහ කටයුතු සිදු කර දීම)

16.දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පෝෂණ සහනාධාර ලබාදීම හා පවුල් ඒකකය දැනුවත් කිරීම.

17. දිවා සුරකුම් මධ්‍යස්ථානය අධීක්ෂණය හා පහසුකම් සැපයීම.

18.දරුවන්ගේ හැකියා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. (කලා හැකියා ප්‍රදර්ශනය හා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් වැනි වැඩසටහන් පැවැත්වීම)

19.ඉහත සියලු කාරණා සඳහා අවශ්‍ය වන මානව සම්පත දියුණු කිරීම සඳහා අවශ්‍ය උපදේශනය, පුහුණු අවස්ථා ඇති කිරීම, ආයතන අතර නිසි සම්බන්ධීකරණය හා කළමානාකරණය තුලින් සාර්ථක සේවයක් සැපයීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ළමා අපචාරවලට ලක් වුවන් සඳහා නිතියේ රැකවරණය ලබා දිම සඳහා ඉදිරිපත් වීම.
- ළමා අපචාරවලට ලක් වු දරුවන් සඳහා රැකවරණය ලබා දිම.
- ළමා අපචාර සම්බන්ධයෙන් පාසල් ළමුන් ප්‍රජාව දැනුවත් කිරිම.
- අඩු ආදායම්ලාභි දරුවන් සිටින පවුල්වල ආර්ථික මට්ටම නගා සිටුවීමට කටයුතු කිරිම.
- කායික හා මානසික වශයෙන් නිරෝගි ළමා ප්‍රජාවක් බිහි කිරිම.
- නිතියේ රැහැනට හසු වු බාල වයස්කාර දරුවන් හා වැඩිහිටි පිරිස පුනරුත්ථාපනය කිරිම.
- සංවර්ධන ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය.
- කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනයට අවශ්‍ය පියවර ගැනීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 186ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 117 කි. පුරප්පාඩු සංඛ්‍යාව 69ක් වේ.

## මූලධන වියදම්

| අනු අංක | වැය විෂයය/ වියදම් ප්‍රභවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය/ ඌනතාව (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|---|
| 1 | මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම. | 42.80 | 17.30 | 25.55 | 40 |
| 2 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | 20.50 | 4.49 | 15.96 | 22 |
| 3 | ප්‍රාග්ධන මාරු කිරීම්. | 15.10 | 8.28 | 6.81 | 55 |
| 4 | ධාරිතා සංවර්ධනය. | 0.50 | 0.49 | 0.02 | 99 |
| එකතුව | | **78.90** | 30.56 | 48.34 | 39 |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

- පළාතේ සියලු දරුවන්ට ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය අනුව හිමි විය යුතු වරප්‍රසාද හා අයිතිවාසිකම්වලට ඇති හිමිකම් ලබාදීම.
- පළාතේ වෙසෙන සියලුම දරුවන්ගේ මන්ද පෝෂණය ඉදිරි වසර 05 තුළ නිමා කිරීම සඳහා විශේෂ ළමා පෝෂණ වැඩසටහන් හඳුන්වා දීම.
- ළමා දරිද්‍රතාවය නිමා කිරීම සඳහා පළාත තුල විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාත තුල දරුවන් කායික දණ්ඩනයට,මානසික පීඩනයට ලිංගික සහ වෙනත් ආකාරයේ අපයෝජනයට, නීති විරෝධී වාණිජ කටයුතු සඳහා ළමයින් යොදා ගැනීමට ළමා ශ්‍රමිකයින් ලෙස භාවිතා කිරීම හා නොසලකා හැරීමට බඳුන් වීම මුළුමනින්ම තුරන් කිරීම.
- දිගින් දිගටම පමා වෙමින් පවතින දරුවන් සම්බන්ධ පළාතේ සියලු නඩු විසඳීමට කටයුතු කිරීම.
- කුමන හේතුවක් නිසා හෝ පළාතේ ළදරුවන් මහ මඟ දමා යාම, මරා දැමීම වැලැක්වීමට පියවර ගන්නා අතර දරුවන් දරුකමට හදාවඩා දීම සඳහා වූ සංකීර්ණ ක්‍රමවේදය සරල කිරීම.
- පළාතේ අඩු ආදයම්ලාභී සියලුම දරුවන්ට කැපකාර පවුල හඳුන්වාදීමේ පළාත් වැඩ පිළිවලක් සකස් කිරීම.
- විකල්ප රැකවරණ ක්‍රමවේද හඳුනා ගැනීම.
- ප්‍රමිතිගත ළමා නිවාස සැකසීම.
- දරුවන් අධිකරණයේ සිට ළමා නිවාස වෙත ප්‍රවාහනය කිරීම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට පැවරීමත් සමඟ පළාත තුළ පුවාහන ඒකකයක් සඳහා නිලධාරීන් ඇතුළුව වාහන පහසුකම් ලබා දීම.

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය ළඟා කරගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

### 1. ආගමික වැඩසටහන් පැවැත්වීම.



පරිවාස හා ළමා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන හා අධීක්ෂණය වන උතුරු මැද පළාත තුළ පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථාන 18 ක් වන අතර මේවායේ රැකවරණ ලබන දරු දැරියන් සංඛ්‍යාව 435 ක් පමණ වේ. දරුවකු හැදී වැඩීමට උචිත පරිසරය වනුයේ තමා ජීවත්වන ගෘහාශ්‍රිත පරිසරයක වුවද වර්තමානය වන විට පවුල් පරිසරය තුළ සිදු වන්නා වූ නොයෙක් ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් හා සමාජයේ ඇතැම් පුද්ගලයන් වෙතින් දරුවන්ට සිදුවන යම් යම් අකටයුතුකම් හා අසාධාරණයන් හේතුවෙන් අනාථ, අත්හල හා අසරණ දරුවන් ලෙස ආයතනගත වන්නට සිදුවී ඇත. එවිට ඔහුන් හැදී වැඩෙන පරිසරය මෙන්ම ළමා කාලයද ගෙවීයන්නේ ළමා නිවාස තුලය. මෙලෙස ආයතනගතව හැදී වැඩෙන දරුවන් තුළ පවත්නා මානසික් බිඳවැටීම්, මුරණ්ඩු ගති පැවතුම්, ප්‍රචණ්ඩකාරී බව, නොමනා හැසිරීම් රටාවන් හා හුදකලා බව ආදිය ඔවුන් තම ගෘහාශ්‍රිත ජීවිතය තුළ දී මුහුණ දුන් ගැටලු හා ජීවත් වූ සමාජ වට වටපිටාවෙන් ලැබූ අත්දැකීම් පාදක කොට ගෙන සිදු වූ සිදුවීමය. එම නිසා දරුවන් තුළ කායික හා මානසික පීඩනය අවම කිරීම අරමුණු කර ගනිමින් දරුවන් තුළ දයාව, කරුණාව, මෛත්‍රිය ඇති කිරීම හා සමාජය තුළ ජීවත් වන විටදී අන්‍යෝන්‍ය සහයෝගයෙන් ජීවත්වීම වැනි යහපත් ගුණාංග ඇති කිරීමේ අවශ්‍යතාවය නිරතුරුව පවතී. ඒ අනුව ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල හැදී වැඩෙන දරු දැරියන් යහපත් දරුවන් ලෙස සමාජගත කිරීම දෙපාර්තමේන්තුව සතු ප්‍රමුඛ කාර්යයකි.

ඒ අනුව කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ බාධා පැමිණියද එක් එක් ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල දරු දැරියන් 180 කගේ පමණ සහභාගිත්වයෙන් දාන සීල භාවනා වැඩසටහන් සෑම පොහෝ දිනකම ළමා සංවර්ධන මධ්‍යස්ථාන තුළ පවත්වන ලදී.

### 2.අධ්‍යාපනික හා වෘත්තීය කුසලතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.



නිවාසගත දරුවන් සඳහා අධ්‍යාපන අයිතිය ලබාදීමට අවශ්‍ය පහසුකම් සැපයීම දෙපාර්තමේන්තුව සතු ප්‍රමුඛ කාර්යයෙකි. ඒ අනුව කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ වර්ෂයේ වැඩි කාලයක් පාසල් නොපැවැත්වුණ බැවින්, පවතින තරගකාරී අධ්‍යාපන ක්‍රමයට මුහුණදීම සඳහා පාසල් විෂයය නිර්දේශය ආවරණය කිරීමට අවශ්‍ය තාක්ෂණික උපකරණ මෙන්ම දරුවා ලබන දැනුමට අමතරව උපකාරක පන්ති පැවැත්වීම මගින් තවදුරටත් විෂයානුබද්ධ දැනුම වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපයන ලදි. උපකාරකක පන්ති පැවැත්වීම සඳහා තෝරාගත් සුදුසුකම් ලත් පාසල් ගුරුවරු යොදවන ලදී.

තවද, පාසල් අධ්‍යාපන අවසන් කළ දරුවන් සඳහා අංශ කිහිපයක් යටතේ වෘත්තිය අධ්‍යාපනය ලබාදීමට කටයුතු කරනු ලැබේ. මැහුම් පාඨමාලා, පරිගණක පාඨමාලා, ජේෂකර්ම පාඨමාලා හා රූපලාවණ්‍ය පාඨමාලා ක්‍රියාත්මක කිරීම තුළින් දරුවන්ට සුදුසු වෘත්තීය පුහුණුවක් ලබා දීම, ඔවුන් පසු කලෙක සමාජගත වූ පසු එම අධ්‍යාපනය ආදායම් මාර්ගයක් සකස් කර ගැනීම සඳහා පිටුවහලක් වනු ඇත.

## 3.ස්වයං රැකියා ආධාර ලබා දීම.

සාර්ථකව වෘත්තීය පුහුණුව අවසන් කරන ලද නිවාසගත දරු දැරියන් සඳහා සහ ආරක්ෂාව හා රැකවරණය අවැසි දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් ඒකකයන්ගේ ආර්ථික මට්ටම නගා සිටුවීමටත් දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් අවශ්‍ය ස්වයං රැකියා ආධාර ලබා දීම.






## 4.හැකියා ප්‍රදර්ශන වැඩසටහන් පැවැත්වීම.

අනාථ, අත්හල, අසරණ දරුවන් මෙන්ම භාරය හා ආරක්ෂාව ඇවසි දරුවන් ද සමාජයේ විවිධ පුද්ගලයන්ගේ අකටයුතුකම් හා අසාධාරණයට ලක්වීම නිසා ද විවිධ විෂමාචාර කටයුතු හේතුවෙන් නීතියේ රැහැනට හසුවීම නිසා ද සමාජයේ විවිධ දරුවන්ට ආයතනගත රැකවරණයට යොමු වීමට සිදුවේ. දෙමාපිය රැකවරණය අහිමි වූ විට දරුවන් තුළ ඇතිවන ව්‍යාකූල මානසික මට්ටම මෙන්ම නව යොවුන් වියේදී ඇතිවන ප්‍රචණ්ඩකාරීත්වය, නොමනා හැසිරීම් තත්ත්වයන් එක්තරා දුරකට සමනය කළ හැකි සාර්ථක මාර්ගයක් ලෙස කලාව හඳුන්වා දිය හැකිය. එමෙන්ම කලා හැකියාවන් වර්ධනය කර ගැනීම අධ්‍යාපනයේද එක්තරා අංගයකි. ඒ සඳහා අවස්ථාව ලබා දීමෙන් එය ඇයගේ හෝ ඔහුගේ කායික හා මානසික සමතුලිතතාව පවත්වා ගැනීමට මහඟු අත් අත්වැලක් වේ.

නිවාසගත දරුවන් අධ්‍යාපන මෙන්ම විවිධ කලා කුසලතාවයන්ගෙන් ද යුක්ත දරුවන් බව විවිධ අවස්ථාවලදී තහවුරු කර ඇත. ඔවුන්ගේ හැකියාවන් සඳහා වේදිකාවක් තනා දීම අපගේ යුතුකමකි. වර්ෂ කිහිපයක් අඛණ්ඩව සංවිධානය කෙරුණු නිවාසගත දරුවන්ගේ හැකියා ප්‍රදර්ශන වැඩසටහන කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් 2021 වසරේ නොපැවැත්වූ අතර ළමා සංවර්ධන මධ්‍යස්ථාන මට්ටමින් ළමුන් 180 කගේ පමණ සහභාගිත්වයෙන් විවිධ වැඩසටහන් පැවැත්විණි. මෙහිදී එම දරුවන් දැක්වූ නිර්මාණශීලී දක්ෂතාවයන් ඔවුන්ගේ ආත්ම ශක්තිය හා ආත්ම අභිමානය සංවර්ධනය සඳහා හේතු වූ බව කිව යුතුය.





## 5.නිවාසගත දරුවන් විවාහය තුළින් සමාජගත කිරීම.

විවිධ ගැටළු වලට මැදි වූ දරුවන්, වින්දිත දරුවන් භාරය හා ආරක්ෂාව අවැසි දරුවන් වශයෙන් ආයතනගත රැකවරණය සඳහා යොමුවන දරුවන් නැවත හැකි ඉක්මනින් සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ සමාජගත කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය අතර වේ. එසේ සිදු කළ හැකි වනුයේ අදාල දරුවා භාර ගෙන ඔහුගේ හෝ ඇයගේ ආරක්ෂාව, රැකවරණය සැලසිය හැකි ඔහුට හෝ ඇයට ආදරය, කරුණාව, සෙනෙහස, හා රැකබලාගත හැකි ඔහුට හෝ ඇයට අධ්‍යාපනය, පෝෂණය ලබාදෙමින් අනාගත සුබසිද්ධිය සැලකිය හැකි බවට පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට සෑහීමකට පත්විය හැකි වැඩිහිටියෙක් දරුවා භාර ගැනීමට ඉදිරිපත් වන්නේ නම් පමණි. නමුත් ආයතනගත වන ළමුන් අතර ඇතමුන් හට මෙවැනි වූ පරිසරයක් සහිත වැඩිහිටියෙක් සොයාගත නොහැකි වන අවස්ථා ද පවතී. එවැනි අවස්ථාවලදී දරුවන් සංවර්ධන මධ්‍යස්ථාන තුළම වැඩිහිටි දරුවන් බවට පත්වේ.

එවැනි විටෙකදී වයස අවුරුදු 18 ඉක්මවන ගැහැණු දරුවන් සමාජගත කිරීමේ සාර්ථක ක්‍රමවේදයක් ලෙස හඳුනාගෙන ඇත්තේ සුදුසු සහකරුවෙකු සොයා විවාහ කර දීමේ ක්‍රමවේදයයි. මෙම කාර්යයේ දී දෙපාර්තමේන්තුව දෙමාපිය පාර්ශවය නියෝජනය කරමින් ඒ හා වන සියලු කාර්ය ඉටු කිරීමට කටයුතු කරයි.

ඒ අනුව, කැකිරාව සහතික කල පාසලේ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව ලැබූ දැරියන් තිදෙනෙකු විවාහය තුළින් සමාජ ගත කිරීමට කටයුතු කර ලදී.






**6.ළමාරක්ෂක අරමුදල ක්‍රියාත්මක කිරීම.**

කායික මානසික හා සදාචාරාත්මක වර්ධනයට අවශ්‍ය මූලික පහසුකම් නොමැති උතුරු මැද පළාතේ ළමුන්ගේ ආරක්ෂාව හා සුබසාධනය සඳහා යම් මුදලක් ලබා දීම සහ වෙනත් අයුරින් ආධාර කිරීම සඳහා 1995 දී පිහිටුවන ලද ළමා රක්ෂක සේවා අරමුදල මගින් පළාතේ පිහිටුවා ඇති පරිවාස කාර්යාල මගින් හඳුනාගනු ලැබූ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා ශිෂ්‍යාධාර, නිවාස ආධාර, පාසල් යාමට දුෂ්කරතාවක් ඇති ප්‍රදේශවල ගමන් කිරීමේ පහසුව තකා පාපැදි ආධාර ලබා දීම හා අධ්‍යාපන අධ්‍යාපන ආධාර සැපයීම සිදුකරනු ලබයි.




**7.පළාතේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා පාසල් උපකරණ කට්ටල බෙදා දීම.**

පළාතේ පිහිටුවා ඇති පරිවාස කාර්යාල මඟින් හඳුනාගත් අඩු ආදායම්ලාභී දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම සෑම වසරකම පාහේ අඛණ්ඩව සිදු කරයි. පරිවාස නිලධාරීන් විසින් සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂාවන්හි දී හඳුනාගත් දරුවන් 850 ක පමණ පිරිසකට මෙලෙස අධ්‍යාපන ආධාර ලබාදීම සිදුකරනු ලබයි.




**8.ළමා නිවාසවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම, ගොඩනැගිලි ඉදි කිරීම හා අළුත්වැඩියා කටයුතු කිරීම.**

පරිවාස හා ළමා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් 2021 වර්ෂයේ සංවර්ධන සැලස්මට අනුව පරිවාස හා ළමා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් පාලනය වන සහ අධීක්ෂණය වන ළමා නිවාස වල සිටින ළමුන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, මානසික සුවය වර්ධනය කිරීම සඳහා මූලධන සංවර්ධන ව්‍යාපෘති 37 ක් ක්‍රියාවට නංවන ලදී.

## 9.ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන්

| වැඩ සටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| සමාන්‍ය හැසිරීම හා විනය | 55 | දින 02 | පරිවාස දෙපාර්තමේන්තුව මඟින් (රු.) | දේශීය | කාර්යාලයක ක්‍රියා කල යුතු විනය පද්ධතිය පිළිබඳ දැනුම හා සාමාන්‍ය හැසිරීම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම |
| මූල්‍ය පාලනය හා ගිණුම් | 55 | දින 02 | | | මූල්‍ය කළමණාකරණය හා ගිණුම් සම්බන්ධ පිළිබඳ අවබෝධය |
| ආකල්ප සංවර්ධන වැඩසටහන | 55 | දින 02 | | | කාර්යාල කටයුතු ගුණාත්මකව හා ඵලදායී ලෙස පවත්වාගෙන යාමට ඉවහල් වන දැනුම ලබා ගැනීම |
| කාර්යාල ක්‍රම පිළිබඳ වැඩසටහන | 25 | දින 01 | | | ලිපි ගොනු සැකසීම හා ආයතන කටයුතු පිළිබඳ අවබෝධය |
| දරුවන්ගේ අධ්‍යාපන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩසටහන | 25 | දින 02 | | | දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම හා ඉගෙනුම් කටයුතු සඳහා කායික, මානසිකව හා චිත්තවේගීව දරුවා සූදානම් කිරීම. |
| වගකීම් හා කාර්යයභාරය හා ආඥාපනත් පිළිබඳ පුහුණු වැඩමුළුව | 35 | දින 02 | | | වගකීම් හා කාර්යයභාරය හා ආඥාපනත් පිළිබඳ දැනුම අවබෝධය ලබා ගැනීම. |
| අන්තර්ජාලගත පුහුණු කළමනාකරණ පද්ධතියක් පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 01 | කළමනාකරණ පුහුණු ආයතනය මඟින් | | අන්තර්ජාලය පිළිබඳ දැනුම |
| පළාත් සභාවේ හා දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් සහ අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ පුහුණු වැ සටහන | 01 | දින 02 | | | ඉඩම් කළමනාකරණය පිළිබඳ දැනුම |
| දීප ව්‍යාප්ත සේවාවන්හී නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන පුහුණු පාඨමාලාව | 01 | දින 02 | | | ප්‍රසම්පාදන පිළිබඳ දැනුම |
| පරිගණක මෘදුකාංග හා දෘඩාංග පුහුණු වැඩසටහන | 02 | දින 02 | | | පරිගණක මෘදුකාංග හා දෘඩාංග පිළිබඳ දැනුම |
| භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 02 | දින 03 | | | භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දැනුම |
| පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම හා මොඩියුල සකස් කිරීම | 01 | දින 06 | | | පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම හා මොඩියුල සකස් කිරීම පිළිබඳ දැනුම |
| ළමා ආරක්ෂාව පිළිබඳ ළමා වෙළඳාම හඳුනාගැනීම, වාර්තා කිරීමහා විමර්ෂණය කිරීම සම්බන්ධ පුහුණු වැඩසටහන | 04 | දින 01 | | | ළමා ආරක්ෂාව පිළිබඳ ළමා වෙළඳාම හඳුනාගැනීම, වාර්තා කිරීමහා විමර්ෂණය කිරීම පිළිබඳ දැනුම |
| උතුරු මැද පළාත් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ ප්‍රායෝගික පුහුණු වැඩමුළුව | 01 | දින 01 | | | නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම පිළිබඳ දැනුම |

දෙපාර්තමේන්තුව ඇතුළු පරිවාස කාර්යාල පද්ධතිය හා ළමා නිවාස පද්ධතිය අතර නිසි කළමනාකරණයක් මඟින් සාර්ථක සේවයක් පළාත තුළට සැපයීමට නම් මෙම දෙපිරිස අතර නිසි සම්බන්ධීකරණයක් තිබිය යුතුය. මෙම සම්බන්ධීකරණය පවත්වා ගෙන යාම සඳහා නිසි ක්‍රමවේදයක් ඇත. මෙම ක්‍රමවේදය සඳහා අවශ්‍ය දැනුම ලැබෙනුයේ නිවැරදි පුහුණුව මඟිනි.

දෙපාර්තමේන්තු නිලධාරීන්ට ළමා සංවර්ධන මධ්‍යස්ථාන කළමනාකරණ කටයුතු පිළිබඳ නිසි පුහුණුවක් තිබීම අවශ්‍ය වනවා සේම ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින නිලධාරීන්ටද ආයතන කටයුතු පිළිබඳව නිවැරදි පුහුණුවක් තිබිය යුතුය. එම අංශයන් කෙරෙහි අවධානය යොමු කරමින් ඉදිරියේදී මෙම දෙපිරිස අතර නිවැරදි සම්බන්ධීකරණයක් ඇති වන පරිදි නිලධාරීන් පුහුණු කිරීම තුළින් කාර්යක්ෂමතාවය වර්ධනය කර ගැනීමට පියවර ගත යුතුව ඇත.

එසේම ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින කාර්ය මණ්ඩලයට දරුවන්ගේ පාසල් අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය, කායික හා මානසික සෞඛ්‍ය වැනි වැදගත් අංශ පිළිබඳව අවශ්‍ය දැනුම ලබා දීමට හා අවශ්‍ය පුහුණු ලබාදීම කෙරෙහි යොමුවීම වැදගත් වේ.

එසේම සියලු කාර්ය මණ්ඩලය වැඩිදුර අධ්‍යාපනය හා පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම මඟින් දැනුවත් කාර්ය මණ්ඩලයක් බිහිකර ගැනීම ආයතනයේ ඵලදායීතාව වැඩි කරගැනීමට හේතුවක් වේ.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුළ සත්‍ය නිමවුම, අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| සමාජ විරෝධී ක්‍රියාවල නිරතවන දරුවන් රැඳවුම් නිවාසවලට යොමු කිරීම හා පුනුරුත්ථාපනයට අවශ්‍ය පියවර ගැනීම සඳහා පැමිණිලි සංඛ්‍යාවට අනුව ක්‍රියාත්මක වීමේ ප්‍රතිශතය | ✓ | - | - |
| නිවාස අනාරක්ෂත වීම හේතුකොටගෙන සිදුවන නිවාසගත වීම වැලැක්වීම සඳහා නිවාස ආධාර ලබා දීම හේතුවෙන් සුරක්ෂිත නිවාස හිමිකර ගත් දරුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | - | - | ✓ |
| නිවාසගත දරුවන්ගේ හා ක්ෂේත්‍රයේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සඳහා අධ්‍යාපන ආධාර ලැබූ දරුවන් සංඛ්‍යාවේ ප්‍රතිශතය | ✓ | - | |
| නිවාසගත දරුවන් අතරින් සාර්ථක ලෙස සමාජගත කරන ලද දරුවන් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | - | - | ✓ |
| නිවාසගත දරුවන්ගේ වෘත්තීය හා විෂයානුබද්ධ කුසලතා ඉහල දැමීම සඳහා වැඩසටහන් පැවැත්වීම මඟින් කුසලතාවයන් දියුණු කරගත් දරුවන් සංඛ්‍යාව | - | - | ✓ |
| පරිවාස විෂයට අදාලව යොමු වන වැඩිහිටි පාර්ශවයේ පුද්ගලයන් හා සම්බන්ධ පැමිණිලිවට ක්‍රියාත්මක වීම. | - | - | ✓ |

## ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | අබෑර්තු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 1 | 1 | - |
| ද්විතියික | 34 | 33 | 1 |
| තෘතියික | 76 | 40 | 36 |
| ප්‍රාථමික | 75 | 43 | 32 |

දෙපාර්තමේන්තුවක් ලෙස අප අරමුණු කරා යාමේදී හඳුනාගත් විශාල අභියෝගයක් ලෙස කාර්ය මණ්ඩල හිඟතාවය හඳුන්වා දිය හැකිය. අනුමත සේවක සංඛ්‍යාව ගළපා බලන විට තෘතීක හා ප්‍රාතමික යන අංශ වල පවතින දැඩි කාර්ය මණ්ඩල හිඟතාවය දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාවය කෙරෙහි විශාල ලෙස බලපෑම් ඇති කොට ඇත. තෘතීක කාර්ය මණ්ඩලය කෙසේ හෝ කළමනාකරණය කරගනිමින් ආයතන කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කලද, දැනට පවතින ප්‍රාථමික කාර්ය මණ්ඩලය කළමනාකරණ කර ගැනීමට නොහැකි වීම තුළ විශාල අර්බුදයන්ට මුහුණ දීමට සිදුව ඇත. එයට හේතුව වන්නේ සීමිත තෘතීක කාර්ය මණ්ඩලයක් ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල කාර්යන් ඉටු කිරීමයි. සේවක සංඛ්‍යාවේ පවතින හිඟතාවය හේතු කොටගෙන දරුවන් වෙනුවෙන් ඉටු කිරීමට ඇති එදිනෙදා කටයුතු (අධිකරණයට රැගෙනයාම, රෝහලට රැගෙන යාම, පාසලට රැගෙන යාම ආදී කටයුතු වලදී) ප්‍රමාණය වැඩිවීම මත නිලධාරියාට අදාළ සේවා චක්‍රයට වඩා වැඩි පැය ගණනක් දරුවන් සඳහා යෙදවීම මත ඇතිවන මානසික පීඩනය දරුවන්ගේ කටයුතු නිසි අයුරින් ඉටු කිරීමට බාධාවක් වී ඇත.

එසේම දරුවන් විශාල ප්‍රමාණයකගේ එදිනෙදා කටයුතු සීමිත පිරිසක් මගින් සිදු කිරීමේදී එක් එක් දරුවා කෙරෙහි දිය යුතු අවධානය ප්‍රමාණවත් නොවීම තුළ දරුවාගේ අධ්‍යාපන, සෞඛ්‍ය වැනි වැදගත් දේ පිළිබඳව වැඩි වශයෙන් අවධානය යොමු කිරීමට නොහැකි වී ඇත. දරුවාගේ ආරක්ෂාව හා රැකවරණය පිළිබඳව කාරණා වලදී ද එය එසේමය. එසේම අදාළ කාර්යයන් සඳහා සුදුසුකම් ලත් සේවකයන් නොමැතිවීම මත, අවශ්‍යතාවය මත නියමිත තනතුරේ සේවකයන් වෙනුවට වෙනත් තනතුරක සේවකයන් වෙනත් කාර්යයන් ඉටු කිරීම සඳහා යෙදවීමේදී හා වෙනත් භාහිර පුද්ගලයන් සම්බන්ධ කර ගැනීමේ දී දරුවන් සඳහා නිසි සේවාවක් සැපයීමට නොහැකි වීම හා නිසි වගකීමක් නොමැති වීම මත ඇතිවන ගැටළු වේ. එවැනි කටයුතු දරුවන්ගේ ආරක්ෂාවට ද යම් අවස්ථාවල දී තර්ජනයක් බවට පත්ව ඇත.

එසේම තම විෂයට අදාළ දැනුම වර්ධනය කර ගැනීම සඳහා පුහුණු අවස්ථා සඳහා යොමුවීමට හා වැඩිදුර අධ්‍යාපනයට යොමු වීමට කාර්යමණ්ඩල හිඟකම හේතු කොටගෙන කාලය නොලැබීම ද ඔවුන්ගෙන් ඵලදායි සේවාවක් ලබා ගැනීම සඳහා බාධාවක් වී ඇත. දරුවන් වෙනුවෙන් ඉටු කරන කාර්යයන් වලදී නිසි සුදුසුකම් ලත් ප්‍රමාණවත් පිරිසක් යෙදවීම දරුවන් වෙනුවෙන් ඉටු කරන කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වන බැවින්, ඉදිරි වර්ෂවලදී ඒ සඳහා අවධානය යොමු කරමින් කටයුතු කිරීමේ අවශ්‍යතාවය ඇත. මෙම තනතුරු බඳවා ගැනීමේ කටයුතු සඳහා අදාල අංශ මේ වන විට දැනුවත් කර ඇත. කෙසේ වුවද එම කටයුත්ත කාර්යක්ෂමතාවයකින් සිදුවීම, දෙපාර්තමේන්තුවට අදාළ අරමුණු අභිමතාර්ථ ඉටුකර ගැනීමට විශාල පිටිවහලක් වනු ඇත.

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

දෙපාර්තමේන්තුවක් ලෙස සිය කාර්ය ඉටු කිරිමේදී, එම කාර්ය භාරය නිසි ලෙස ඉටුවීද යන්න සුදුසු ක්‍රමවේදයක් යටතේ මැන බැලීම සුදුසු වේ. ඒ සඳහා වෙන් වෙන් වූ කාර්යන් සඳහා කාර්ය සාධන දර්ශක පැවතීම ඉතා වැදගත් වේ.

එබැවින්, දෙපාර්තමේන්තු විෂය ක්ෂේත්‍රයට අදාල තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ඉටුකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන 2021 වර්ෂය සඳහා වෙන් කර තිබුණද, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සියලු තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ඉටු කර ගැනීමට නොහැකි වුවත්, දරුවන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් වන අත්‍යාවශ්‍ය කරුණු කාරණා කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා වන අරමුණු සාර්ථකව ඉටු කර ගැනීමට වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන හා පුනරාවර්තන වියදම් දැරීම සඳහා වූ ප්‍රතිපාදන නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් අවශ්‍ය කටයුතු සිදු කිරීමට පරිවාස දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදි.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

1 සියලුතැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.

3 නිරෝගී ජීවිත සහතිකකර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම

- ඉහළ ගුණාත්මක ළමා සුභසාධනයක්
- ළමා රැකවරණය හා සුභසාධනය ඉහළ යාම

4 පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමට අවස්ථාව සැලසීම

- සමාජ විරෝධී ක්‍රියාවල යෙදෙන්නවුන් විශෝධනය
- පරිවාසගත ළමුන් අධ්‍යාපනයට යොමු කිරීම
- පරිවාසගත ළමුන් වෘත්තීය අධ්‍යාපනයට

5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියළු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම

- ළමුන්ගේ සමස්ත අයිතීන් සුරැකීම
- ළමා අපයෝජන හා අපචාර අවම කිරීම

16 තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකදීම පරිපූර්ණ ආයතන ගොඩනැගීම.

## හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු.

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුණට ලඟා වීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ලඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුළ ඉටුකළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| **අරමුණ අංක 01** - සියලුතැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම. | දරිද්‍රතාවයෙන් පෙලෙන දරුවන් සිටින පවුල්, නීතියේ රැහැනට හසු වූ බාල වයස්කාර දරුවන් සහිත පවුල්, අධිකරණ නියෝග මත පරිවාස භාරයට පත් වන බාල හා වැඩිහිටි ප්‍රජාව ස්ව ශක්තියෙන් නැගී සිටින පවුල් බවට පත්කිරීම හා සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම තුලින් එම ප්‍රජාව ස්ව ශක්තියෙන් නැගී සිටින විනය ගරුක නිරෝගී ප්‍රජාවක් බවට පත් කිරීම.<br>දරිද්‍රතාවය හේතු කොටගෙන සිදුවිය හැකි සියලු අනාරක්ෂිත වීම් හඳුනා ගැනීම හා ඒවාට විසඳුම් ලබාදීම තුලින් නිවාස ගත වීම වැලැක්වීම.<br>දරිද්‍රතාවය හේතු කොටගෙන ඇති විය හැකි දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණ සම්බන්ධ ගැටළු අවම කිරීම.<br>දරිද්‍රතාවය හේතු කොටගෙන නිවාස ගත වන දරුවන් නැවත සමාජ ගත කිරීම සඳහා සුදුසු භාරකාරීත්වයවයකට පත් කිරීම, කුලවද්දාදීම, නිවාස ආධාර, ස්වයං රැකියා ආධාර ලබාදීම, වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම හරහා රැකියාගත කිරීම, විවාහය තුලින් සමාජ ගත කිරීම වැනි ක්‍රම තුලින් සාර්ථක ලෙස සමාජ ගත කිරීම. | ස්වයං රැකියා ආධාර ලබා දීම, නිවාස ආධාර ලබා දීම, අධ්‍යාපන ආධාර ලබා දීම, ක්ෂේත්‍රය තුළ පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම, නිවාසගත දරුවන් සඳහා සුදුසු ක්‍රමවේදය හඳුනාගෙන නිවාසගත කිරීම. | නිවාස අනාරක්ෂිත වීම හේතුවෙන් දරුවන් නිවාසගත වීම වැලැක්වීම සඳහා නිවාස ආධාර ලබා දීම - 01, ස්වයං රැකියා ආධාර ලබා දීම - 15, අධ්‍යාපන ආධාර ලබා දීම - 02, වෘත්තීය අධ්‍යාපනයට යොමු කිරීම - 08, නිවාසගත දරුවන් සඳහා සුදුසු ක්‍රමවේදය හඳුනාගෙන නිවාසගත කිරීම - 04 | - | ✓ | - |
| **අරමුණ අංක 03** - නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය | ළමා අපචාර හා අපයෝජන සිදුවීම අවම කිරීම, දරුවන් අතර ව්‍යාප්ත වන හානිකර මධ්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම තුලින් මත් ද්‍රව්‍ය භාවිතය ප්‍රදේශයෙන් තුරන් කිරීම. | ලිංගික අපයෝජනය, ස්ත්‍රී දූෂණය, නීත්‍යානුකූල භාරකාරීත්වයෙන් අපහරණය කර ස්ත්‍රී දූෂණය කිරීම, කෲරත්වයට පත් කිරීම, භාරය හා ආරක්ෂාව, සොරකම, මත් ද්‍රව්‍ය භාවිතය හා විකිණීම, පහර දීම, ව්‍යාභිචාරය, පවුල් ආරවුල්, අඩු වයස් ගැබ් ගැනීම්, කූට්ටනය, කුල වැද්දුම යන කාරණා සම්බන්ධව මැදිහත් වීම හා අවශ්‍ය සේවාවන් ලබාදීම. | මැදිහත් වූ සිද්ධීන් ප්‍රමාණය ලිංගික අපයෝජනය - 111, ස්ත්‍රී දූෂණය - 127, නීත්‍යානුකූල භාරකාරීත්වයෙන් අපහරණය කර ස්ත්‍රී දූෂණය කිරීම - 134, කෲරත්වයට පත් කිරීම - 13, භාරය හා ආරක්ෂාව - 254, සොරකම - 37, මත් ද්‍රව්‍ය භාවිතය හා විකිණීම - 05, පහර දීම - 12, පවුල් ආරවුල් - 35, අඩු වයස් ගැබ්ගැනීම - 09, කුලවද්දා දීම - 111 | - | - | ✓ |

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුණට ළඟා වීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්කය | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුළ ඉටුකළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| **අරමුණ අංක 04** - පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීම් අවස්ථා සැලසීම. | සියලු දරුවන් සඳහා අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් නිවාසගත වන දරුවන් සඳහා ප්‍රාථමික, ද්විතීක, තෘතීක, උසස් අධ්‍යාපනය සඳහා අවස්ථාව ලබා දීම, ක්ෂේත්‍රයේ දරුවන් සඳහා අධ්‍යාපන අධාර ලබාදීම හා පාසල් අතහැර ගිය දරුවන් සඳහා නැවත පාසල් යැවීමට සඳහා කටයුතු කිරීම. | නිවාස ගත දරුවන් සඳහා වාර්ෂික අධ්‍යාපන චාරිකාව, විෂයන් සඳහා උපකාරක පංති පැවැත්වීම, වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම, හැකියා ප්‍රදර්ශන වැඩසටහන් පැවැත්වීම, පළාතේ අනෙකුත් දරුවන් සඳහා පාසල් උපකරණ බෙදාදීම, පාසල් ගමන් පහසුව සඳහා පා පැදි ලබාදීම, ළමා රක්ෂක අරමුදල මගින් අධ්‍යාපන ආධාර ලබාදීම. | විෂයන් සඳහා උපකාරක පංති පැවැත්වීම, වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම හා හැකියා ප්‍රදර්ශන වැඩසටහන් පැවැත්වීම තුළින් ප්‍රතිලාභ ලබා ගත් නිවාසගත දරුවන් - 435, පළාතේ අනෙකුත් දරුවන් සඳහා පාසල් උපකරණ බෙදාදීම් - 893, පාසල් ගමන් පහසුව සඳහා පා පැදි ලබාදීම් - 05, ළමා රක්ෂක අරමුදල මගින් අධ්‍යාපන ආධාර ලබාදීම් - 139 | - | - | ✓ |
| **අරමුණ අංක 05** - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | ගැහැණු ළමුන්ට එරෙහිව සිදුවන්නාවූ මානව කූට්ටනය ලිංගික හා වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුළත්ව ගැහැණු දරුවන්ට එරෙහිව සිදුවන සියලු ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම. | ගැහැණු දරුවන් විවාහය තුලින් සමාජ ගත කිරීම සඳහා කටයුතු කිරීම හා ගැහැණු දරුවන් වැඩිහිටි දරුවන් වූ පසු දෙමාපිය පාර්ශවය නියෝජනය කරමින් අවශ්‍යය කටයුතු ඉටු කිරීම. | නිවාසගත දැරියන් විවාහය තුළින් සමාජගත කිරීම් - 03 | ✓ | - | - |
| **අරමුණ අංක 16** - තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකදීම පරිපූර්ණ ආයතන ගොඩනැගීම. | නියෝජනය කරන සමාජ ස්ථරය තුලින් ඇති විය හැකි සියලු අහිතකර තත්ත්වයන් හඳුනා ගැනීම, විසඳුම් ලබා දීම, වැලැක්වීමට පියවර ගැනීම, නීතියේ රැකවරණය ලබා දීම, අදාල පාර්ෂව සඳහා ආයතන රැකවරණය ලබා දෙමින් ආයතනික මට්ටමින් ලබාදිය හැකි සියලු සේවාවන් ඵලදායී ලෙස ඉටු කිරීම. | හොඳම ළමා රැකවරණ මධ්‍යස්ථානය තේරීම. | ළමා රැකවරණ මධ්‍යස්ථාන 16 අතරින් හොඳම ළමා රැකවරණ මධ්‍යස්ථානය තේරීම.<br><br>* කොරෝනා 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම කාර්ය සිදු නොවුණි. | ✓ | - | - |

## රේඛීය අමාත්‍යාංශය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංක | ව්‍යාපෘතිය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වෙන් වූ ප්‍රතිපාදනය (රු) | 2021/12/31 දිනට වියදම (රු.) | 2021/12/31 වර්තමාන මූල්‍ය ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය (%) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 01 | සාලියපුර මිත්‍ර ළමා නිවාසයේ වැසිකළි පද්ධතිය අළුත්වැඩියා කිරීම. | ම.නු.ප | 396,000 | - | 0% | 30% | 28 |
| 02 | පැරකුම් ළමා නිවාසයේ වැසිකිළි පද්ධතිය ඉදි කිරීම. | තමන්කඩුව | 1,000,000 | 913,753.40 | 91% | 100% | 33 |
| 03 | නිවාසගත මහේෂිකා මධුමාලි දැරිය සමාජගත කිරීම සඳහා නිවසක් ඉදි කිරීම. | පදවිය | 500,000 | 200,000.00 | 40% | 70% | 06 |





## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේ දී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණදුන් ගැටළු හා දුෂ්කරතා

පැරණි සමාජ ක්‍රමයේ සිට වර්තමාන සමාජ ක්‍රමය දක්වා දරුවන්ගේ රැකවරණය, සිය පවුලේ ප්‍රධානතම වගකීම බවට පත්ව තිබුණ ද, එම වගකීම අද වන විට පවතින රජයේ ආයතන හා රාජ්‍ය නොවන ආයතන රැසකට බෙදී ගොස් ඇත. 2021 වර්ෂය තුල පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් "නීතිගරුක ප්‍රජාවක් සුරක්ෂිත ළමා පරපුරක් යන දැක්ම ලඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු සහ අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව වෙත මූලධන සහ පුනරාවර්තන වියදම් දැරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

එමෙන්ම, පෙර වර්ෂයේ මෙන්ම 2021 වර්ෂයේද ගෝලීය වශයෙන් මුහුණ දුන් කොවිඩ් 19 වසංගත තත්ත්වය රට තුළ උත්සන්නව පැවතුන බැවින් සමාජීය සහ ආර්ථික තත්ත්වයන් හේතු කොට ගෙන පළාත් සභාව සතු කාර්ය භාර්ය ඉටු කිරීමට පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට සිදුවීම විශාල අභියෝගයක් විය.

එහෙත් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සංවර්ධන වැඩසටහන් නිසියාකාරව සහ කාර්යක්ෂමව ඉටු කිරීමට ක්‍රියා කල ද, වෙළඳපොල තුළ භාණ්ඩ සහ අමුද්‍රව්‍ය වල මිළ සීඝ්‍ර ලෙස විචලනය වීම හා භාණ්ඩ සහ අමුද්‍රව්‍ය හිඟවීම, එම තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් වැඩ ව්‍යාපෘති ඉදිරියට කරගෙන යාමට මැලිකමක් දැක්වීම හා තැපැල් කටයුතු වරින් වර සැලකිය යුතු ලෙස ප්‍රමාද වීමේ හේතු කාරණා මත සංවර්ධන වැඩ ව්‍යාපෘති

කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට නොහැකි වුණද මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදන නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් 2021 වර්ෂයේ යෝජිත සංවර්ධන වැඩ ව්‍යාපෘති සඳහා සහ දරුවන් වෙනුවෙන් වූ අරමුණු සහ අභිමතාර්ථ සඳහා ඵලදායීව යෙදා ගනිමින් හා හැකි පමණ කාර්යන් ඉටු කිරීම තුළින් සැලසුම් කළ පරිදී දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යන්හී භෞතික ප්‍රගතිය 96% ක මට්ටමකට ගෙන ඒමට කටයුතු කරන ලදි.

එසේම වැඩ ව්‍යාපෘති කිහිපයක් 2022 වර්ෂයට අවිච්ඡේද වීම හා අතැති බිල්පත් තිබීම මත දෙපාර්තමේන්තුව සැලසුම් කළ පරිදී අවශ්‍ය මූල්‍ය ප්‍රගතිය ලඟාකර ගැනීමට නොහැකි වීම අප මුහුණ දුන් අභියෝගයකි.

ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත මූලධන ප්‍රතිපාදන රු.මි. 81 ක ප්‍රතිපාදනයක් ලබා දුන් අතර 2021 වර්ෂයේ මූලධන වියදම රු.මි. 30.6 ක් විය. ඒ අනුව අතැතිබිල් රු.මි. 33.4 ක් සහ අවිච්ඡේද වැඩ රු.මි. 9.09 ක් වීම හේතුවෙන් සමස්ථ මූලධන උපයෝජනය 39% කි. එමෙන්ම දෙපාර්තමේන්තුව වෙත පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන රු.මි. 121.2 ක ප්‍රතිපාදනයක් ලබා දුන් අතර 2021 වර්ෂයේ පුනරාවර්තන වියදම රු.මි. 116.8 ක් විය. ඒ අනුව සමස්ථ පුනරාවර්තන වියදම් උපයෝජනය 96% කි.

තවද, සමාජය සංකීර්ණතාවය හේතුකොටගෙන පවුල් තුළ ඇතිවන යම් යම් ගැටලුකාරී තත්ත්වයන් මත දරුවන් නිවාසගත කිරීමට සිදුවීම මත ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට යොමු වන දරුවන් වැඩි වීම මත එම ආයතන දරුවන් සඳහා ආකර්ෂණීය, ප්‍රියමනාප, ප්‍රසන්න ස්ථාන බවට පත් කිරීම සඳහා ප්‍රමිතිගත අයුරින් එම ස්ථාන වැඩිදියුණු කිරීම කළ යුතුව ඇත. 2018 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කරන ලද කිරිකෙටුවැව සහතික කළ පාසල සඳහා අවශ්‍ය වෘතීය උපදේශකයන් බඳවා ගෙන ඇති අතර එම ආයතනය ඉතාමත් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මිලදී ගැනීම් වලින් කොටසක් මේ වන විටත් සිදු කර ඇත.

තවද ළමා අපචාර වැඩි වශයෙන් වාර්තා වීමත් සමඟ ඒ සඳහා වන නඩු කටයුතු කාර්යක්ෂමව මෙහෙයවීම සඳහා පරිවාස කාර්යාල 03 ක් අළුතින් ඇති කිරීමේ අවශ්‍යතාවයද දැඩිව පවතී.

නිවාසගත දරුවන් නඩු කටයුතු සඳහා පළාතෙන් පිටතට රැගෙන යාම, වෙනත් විශේෂ රැකවරණ මධ්‍යස්ථාන වලට යොමු කිරීම, විවිධ අවස්ථාවලදී විවිධ අවශ්‍යතාවයන් සඳහා දරුවන් නිවාස වලින් පිටතට රැගෙන යාමේදී නිශ්චිත පිරිසක් සම්බන්ධ කරගත් වාහන ඒකකයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය යෝජනා ජාතික පරිවාස දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇත. ඒ සඳහා ඉදිරියේ දී අවධානය යොමු කර කටයුතු කිරීම වැදගත් වේ. එමෙන්ම ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල නඩත්තු කටයුතු සඳහා නිශ්චිත නඩත්තු ඒකකයක අවශ්‍යතාවයද දැඩිව පවතින බැවින් ඉදිරියේදී ඉතා කඩිනමින් එම අවශ්‍යතාවයද සපුරාගත යුතුව ඇත. තෘතියික හා ප්‍රාථමික කාර්ය මණ්ඩලයේ දැඩි හිඟතාවය දරුවන්ගේ කටයුතු ක්‍රමවත් පරිදි ඉටු කිරීමට බාධාවක් වන බැවින් ඉදිරියේ දී ඒ පිළිබඳව තවදුරටත් අවධානය යොමුකර එම බඳවා ගැනීම සඳහා වන ක්ෂණික ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

කෙසේ වුවද, දෙපාර්තමේන්තු විෂය ක්ෂේත්‍රයට අදාල තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් උපරිමයෙන් ප්‍රයෝජනයට ගනිමින් 2021 වර්ෂයේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා ලබා දුන් මූලධන හා පුනරාවර්තන සඳහා වූ ප්‍රතිපාදන, උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීව උපයෝජනය කරගනිමින් සාර්ථකව අරමුණු ලඟා කර ගැනීමට පරිවාස දෙපාර්තමේන්තුව කටයුතුකළ බව කිව යුතුය.

# 8.4.පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ ප්‍රතිපාදනයන්ට අනුව 1988.05.12 වන දින උතුරු මැද පළාත් සභාව ස්ථාපිත කිරීමෙන් අනතුරුව 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ පැවරුණු විධි විධානයන්ට යටත්ව පළාත් සභාවට පැවරුණු සමාජ සේවා විෂයට අදාළ රාජකාරී ඉටු කිරීම සඳහා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇත. මූලිකවම සාලියපුර රජයේ වැඩිහිටි නිවාසයේ කටයුතු මෙන්ම මහජනාධාර ගෙවීමෙන් ආරම්භ වන මෙම ආයතනයේ කටයුතු වර්තමානය වනවිට ඉතා පුළුල් පරාසයක් දක්වා ව්‍යාප්ත වී ඇත.

උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය අනුරාධපුරයේ පිහිටා ඇති අතර, ඒ යටතේ සෘජුව පාලනය වන ආයතන 03කි. එනම්, සාලියපුර ශාන්ති සෙවන වැඩිහිටි නිවාසය, බුල්නෑව සුපසන් විශ්‍රාමික වැඩිහිටි නිවාසය හා ගිරිතලේ අත්වැළ පුහුණු මධ්‍යස්ථාන යි.

එසේම ප්‍රාදේශීයව කටයුතු කිරීම සඳහා සමාජ සේවා නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 29 ම ආවරණය වන පරිදි යොදවා ඇත. තවද අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයකින් කටයුතු කරන මෙම දෙපාර්තමේන්තුව මධ්‍යම රජයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය, ආබාධ සහිත තැනැත්තන්ගේ මහ ලේකම් කාර්යාලය, සමාජ සේවා අමාත්‍යාංශය යන ආයතන සමඟ සමීපව කටයුතු කරනු ලබයි.

දෙපාර්තමේන්තුවට අයත් නමුත් රාජ්‍ය නොවන ආයතන මඟින් පවත්වාගෙන යන ආයතන පවතින අතර, එම ආයතන සඳහා යථායෝග්‍යාධාර හා වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර ලබාදීම සහ අධීක්ෂණය දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ. සාලියපුර සතුටු ළමා නිවාසය, නොච්චියාගම බුද්ධි ඌණතා සහිත ළමුන්ගේ විශේෂ පුහුණු පාසල, ඇලගමුව ආබාධ සහිත ළමුන් සඳහා වෘත්තීය පුහුණු ආයතනය, සේවාගම විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ වෘත්තීය පුහුණු ආයතනය, තලාව අක්ශි ආබාධ සහිත කාන්තාවන්ගේ ආයතනය, ඔළුකරද විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ රැකවරණ මධ්‍යස්ථානය ඒ අතර වේ.

තවද රාජ්‍ය නොවන ආයතන හෝ පාලක මණ්ඩලයකින් පාලනය වන පහත ආයතනද දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් කරන අතර, යථායෝග්‍යාධාරද ගෙවනු ලැබේ.

I. හිඟුරක්ගොඩ මිණිහිරි කාන්තා සුරැකුම් මධ්‍යස්ථානය.
II. අනුරාධපුර රීයෙන්සි අලගියවන්න අඳ බිහිරි විදුහල.
III. පොළොන්නරුව පැරකුම් වැඩිහිටි නිවාසය.

## දෙපාර්තමේන්තුව සතු ආයතන

| ආයතනය | අනුරාධපුර | පොළොන්නරුව | උ.මැ.ප |
|---|---|---|---|
| වැඩිහිටි නිවාස | 01 | 01 | 02 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ පුහුණු පාසැල් | 03 | 01 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ රැකවරණ මධ්‍යස්ථාන | 01 | - | 01 |
| සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන | - | 01 | 01 |

## නේවාසික පහසුකම් ලබාදිය හැකි සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

| ආයතනය | නේවාසික පහසුකම් දිය හැකි සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| වැඩිහිටි නිවාස | | ගැහැණු | පිරිමි | එකතුව |
| ශාන්ති සෙවණ වැඩිහිටි නිවාසය - සාලියපුර | 302 | 151 | 151 | 302 |
| සැදෑ සෙවණ විශ්‍රාමික වැඩිහිටි නිවාසය - බුල්නෑව | 05 | 02 | 12 | 04 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ පුහුණු පාසැල් | | | | |
| සතුට ළමා නිවාසය - සාලියපුර | 30 | 28 | - | 28 |
| ඇලගමුව වෘත්තීය පුහුණු ආයතනය | 30 | 11 | 11 | 22 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - සේවාගම | 50 | - | 38 | 38 |
| විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ගේ ආයතනය - නොච්චියාගම | 25 | - | 13 | 13 |
| **අනෙකුත් ආයතන** | | | | |
| ඔළුකරද රැකවරණ මධ්‍යස්ථානය | - | - | - | - |
| අත්වැල සංවර්ධන පුහුණු මධ්‍යස්ථානය | 12 | - | - | - |

## ආධාර ගෙවීම් පිළිබඳ විස්තර

| විස්තරය | අනුරාධපුර | | පොළොන්නරුව | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2016** | **2015** | **2016** | **2015** | **2016** |
| මහජන ආධාරලාභීන් | 23,750 | 23,338 | 4,876 | 28,626 | 28,626 | 27,958 |
| විශේෂ මහජනාධාර | 2,767 | 3,116 | 335 | 3,059 | 3,059 | 3,451 |
| රෝගාධාර | 1,688 | 419 | 113 | 2,306 | 2,306 | 532 |
| නිවුන්දරු ආධාර | 151 | 332 | 60 | 218 | 218 | 392 |
| විවිධ රෝග ආධාර | 3,322 | 2,949 | 168 | 3,520 | 3,520 | 3,117 |
| පූර්ණ ආබාධ ආධාර | 630 | 743 | 162 | 770 | 770 | 905 |
| පාසැල් ශිෂ්‍යාධාර | 3,507 | 4,286 | 1,172 | 4,598 | 4,598 | 5,458 |
| **එකතුව** | **35,815** | **35,183** | **6,630** | **43,086** | **43,086** | **41,813** |

## වැඩිහිටි ජනගහනය

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය | - | 21,919,000 |
| උතුරුමැද පළාතේ වැඩිහිටි ජනගහනය | - | 1,514,967 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | - | 1,019,323 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | - | 495,644 |

## දැක්ම

"සමාජ රැකවරණය අවශ්‍ය වූවන්ට සුරක්ෂිත ජීවිතයක්"

## මෙහෙවර

"පළාතේ ජීවත්වන දිළිඳු, ආබාධ සහිත, වැන්දඹුභාවයට පත් සහ ව්‍යසනයන්ට ලක්වූ අසරණ ජනතාවට සාධාරණ ක්‍රමවේදයක් සමගින් ආධාර හා මග පෙන්වීම්, අවශ්‍ය සහන සහ රැකවරණය සලසමින් ,ඔවුන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ සමාජයේ පිළිගත් පිරිසක් බවට පත් කිරීම."

## දිගුකාලීන අරමුණු

- සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් හෝ පවුල් ඒකක සඳහා සාමාජයීය වටිනාකමක් ගොඩනැගීම.
- රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සුරක්ෂිත කිරීම.
- වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ සමාජ සුභසාධනය ඉහළ මට්ටමක් දක්වා ළඟාකර ගැනීම.
- අයහපත් චර්යාවන්ගෙන් යුත් තරුණයින් යහපත් පුරවැසියන් බවට පත්කර රටේ සංවර්ධනයට දායකවන තරුණ ප්‍රජාවක් බිහි කරලීම.
- ප්‍රජාව ආපදා තත්වයෙන් සුරක්ෂිත කර ගැනීම.
- ප්‍රශස්ත මහජන සේවයක් ලබාදෙන රාජ්‍ය ආයතනයක් බවට පත්වීම.

## කෙටි කාලීන අරමුණු

- අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය වීම.
- අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකවල ජීවනෝපාය සංවර්ධනය දිරිමත් කිරීම.
- රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් සැලසීම.
- වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය ඉහළ නැංවීම පිළිබඳව දැනුවත් ප්‍රජාවක් බිහි කිරීම.
- වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා සංවිධාන ව්‍යුහය ශක්තිමත්ව පවත්වා ගෙන යාම.
- වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ දැනුම,කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම හා ඇගයීම.
- සමාජ විරෝධී ක්‍රියාකාරකම්වල නිරත හා දුරාචාරයන්වලට ඇබ්බැහි වූවන් එම චර්යාවන්ගෙන් වළක්වා ගැනීම සහ ඒ සඳහා යොමුවීම වැළක්වීම.
- ආපදා තත්වයන්ට පෙර සූදානම හා හදිසි ආපදා තත්වයන් ඇතිවීම වළක්වා ගැනීම පිළිබඳ දැනුවත් වූ ප්‍රජාවක් බිහිකිරීම.
- නවීන තාක්ෂණය හා පිළිගත් ක්‍රමවේද අනුගමනය කර දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාවය ඉහළ නැංවීම.
- දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ ආකල්ප හා ධාරිතාවය සංවර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ අඩු ආදායම්ලාභීන් සඳහා ක්ෂේත්‍ර රාශියක් යටතේ මූල්‍යාධාර ලබා දීම.
- ❖ අඩු ආදායම්ලාභීන් සඳහා උපකරණ ආධාර ලබා දීම.
- ❖ හඳුනාගත් විශේෂ අවස්ථාවලදී අවශ්‍ය මූල්‍යාධාර හා උපකරණ ලබා දීම.
- ❖ වැඩිහිටි නිවාස පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- ❖ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ආයතන හා රැකවරණ ආයතන පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- ❖ පළාතේ මහජනතාවට සහනයක් ලබාදිය හැකි වෙනත් ආයතන පිහිටුවීම, පවත්වා ගැනීම හා අධීක්ෂණය.
- ❖ වැඩිහිටි, විශේෂ අවස්ථා සහිත, ගෘහමූලික කාන්තා හා අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම සඳහා දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමේ හා ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.
- ❖ වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා නව සංවිධාන ආරම්භ කිරීම, රැස්වීම් කැඳවීම හා යටිතල පහසුකම් සැපයීම.
- ❖ මත් ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.
- ❖ වැඩිහිටි, විශේෂ අවස්ථා සහිත පුද්ගලයන් හා ගෘහමූලික කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සුභසාධනය ඉහළ නැංවීමට ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ❖ ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.
- ❖ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා ආකල්ප හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ දෙපාර්තමේන්තුවේ ආයතනික පරිපාලනය හා කළමණාකරණය.

## ප්‍රධාන සංවර්ධන උපාය මාර්ගයන්

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිත සියළුම ග්‍රාම නිලධාරි තුලාන්වල ජීවත්වන අඩු ආදායම්ලාභී, අන්ත අසරණ බවට පත්ව සිටින රෝගී පුද්ගලයින් සහ එම පවුල්, ආර්ථික හා වෙනත් හේතුන් මත විවිධ තර්ජනයන්ට, මානසික, කායික රැකවරණය අහිමිව සිටින වැඩිහිටි තැනැත්තන් පිළිබඳව, ආබාධ සහිත තත්ත්වය මත සාමාජයීය වරප්‍රසාද අහිමි වී සිටින පුද්ගලයින් පිළිබඳව දත්ත රැස් කරමින් එම පුද්ගල අවශ්‍යතාවයන් ඉටුකරලීම සඳහා සෘජු මැදිහත්වීම, අවශ්‍ය පරිදි මාසික සහනයන් සැලසීම සිදුකෙරේ.

- ❖ රැකවරණය අහිමිව විවිධ ස්ථානයන්වල අනාරක්ෂිතව සිටින සහ නිවෙස් තුළ අසරණව අනාරක්ෂිතව සිටින වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සඳහා රැකවරණය සපයමින් නිවාසගත කිරීමට හෝ පවුල තුළ මානසික, කායික ආරක්ෂාව සහිතව ජීවත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාදීමට මැදිහත් වීම.
- ❖ සමාජයීය වශයෙන් අවාසි සහගත පුද්ගලයින් සඳහා සමාජයීය වටිනාකමක් ලබාදීම අරමුණු කරගනිමින් ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා අවශ්‍ය කරන ආධාරක, උපකරණ ලබා දීම.
- ❖ එම පුද්ගලයින්ගේ සහ එම පවුල්වල ආර්ථික ගැටළු අවම කරමින් ජීවන උත්පාදනයන් සඳහා අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අවශ්‍ය පුහුණු සමඟ ස්වයං රැකියා අවස්ථා වෙත යොමු කරමින් එමගින් ආර්ථික වාසි ලබා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සිදු කිරීම.

- ස්වාමියා අහිමිවීම නිසා වැන්දඹුභාවයට හා අසරණභාවයට පත්වෙමින් තම දූ දරුවන් සමග ඔවුන්ගේ ආරක්ෂාව සම්බන්ධව වෙහෙසෙමින් ඔවුන්ගේ අධ්‍යාපනයන් සඳහා වෙහෙස වෙමින්, තම ආර්ථිකය ද ශක්තිමත් කරගැනීමට වෙර වීරිය දරන කාන්තාවන්ගේ අනාරක්ෂිත නිවාස සහ ආබාධිත, වැඩිහිටි තැනැත්තන්ගේ අනාරක්ෂිත නිවාස සකස් කරගැනීමට සුවසේ ජීවත්වීම සඳහා නිවාස ආධාර ලබාදීම.
- රෝගී පවුල්, වැන්දඹු සහ ආබාධ සහිත තත්ත්වයට පත්ව සිටින පවුල්වල මහත් දුෂ්කරතාවයෙන් යුතුව අධ්‍යාපනය ලබා දීමට වෙහෙසෙන මෙන්ම මහත් උනන්දුවෙන් අධ්‍යාපනය ලැබීමට වෙහෙසෙන දරුවන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා මාසිකව ශිෂ්‍යාධාර ලබාදෙමින් රටට ඵලදායී දරු පිරිසක් නිර්මාණය කිරීමට මැදිහත්වීම.
- විවිධ ඇබ්බැහිවීම් සහ සමාජ විරෝධී පුද්ගලයින් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගනිමින් ඔවුන් සඳහා කඳවුරුගත නේවාසික වැඩසටහන් පවත්වා පසුවිපරම් කරමින් ඔවුන් යහමාර්ගයට ගැනීම.
- පළාතේ ජීවත්වන මහජනතාව ප්‍රමුඛම සම්පත වශයෙන් සළකමින් පළාත සංවර්ධනය සඳහා කෙමෙන් ගමන් කිරීමේදී ඔවුන්ගේ දැනුම, කුසළතා හා ආකල්ප වැඩිදියුණු කිරිම අවශ්‍යම කරුණක් වශයෙන් සළකා විවිධ ක්ෂේත්‍රගත වැඩසටහන් පැවැත්වීමද තවත් එක් උපාය මාර්ගයකි.
- මහජන සේවාවන් සැපයීමේදී තවදුරටත් කාර්යක්ෂම රාජ්‍ය ආයතනයක් බවට දෙපාර්තමේන්තුව පත්කිරිමද උපාය මාර්ගයකි.

**අංශය සෘජුව හා වක්‍රව නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු හා ක්‍රියාකාරකම්**

| අංකය | තිරසර සංවර්ධන අරමුණ | අංකය | තිරසර සංවර්ධන අරමුණ |
|---|---|---|---|
| 1 NO POVERTY | සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම (1.1,1.3,1.4,1.5,1 අ) | 2 ZERO HUNGER | සාගින්න නැති කර,ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම(2.2.) |
| 4 QUALITY EDUCATION | පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගනීමේ අවස්ථාව සැලසීම.(4.5,4 අ) | 6 CLEAN WATER AND SANITATION | සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම(6.2) |
| 8 DECENT WORK AND ECONOMIC GROWTH | සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම(8.5,8.6) | 9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE | සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනයකර නව්‍යකරණය දිරිගැන්වීම(9.අ) |

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 173ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 117 කි. පුරප්පාඩු සංඛ්‍යාව 56 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජණය |
|---|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම් | 18.54 | 11.22 | 7.32 | 60% |
| ගොඩනැගිලි නවීකරණ | 17.45 | 16.02 | 1.43 | 92% |
| යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ මිලදීගැනීම් | 3.54 | 3.12 | 0.42 | 88% |
| වැඩසටහන් | 4.0 | 2.19 | 1.81 | 56% |
| **එකතුව** | **43.53** | **32.55** | **10.98** | **75%** |

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන්මග

I 2016 වර්ෂයේ සිට වසරක් පාසා අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක වශයෙන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් සඳහා දිරියට අත්වැලක් සමඟ සමාජ සවිබල ගැන්වීමේ තෙදිනක නේවාසික වැඩසටහන්ද පසුවිපරම් වැඩසටහන්ද එම වැඩසටහන්වලට සම්බන්ධ වූවන් ඒකරාශී කරමින් 2019 වර්ෂයේ දිස්ත්‍රික් සංවිධානද ආරම්භ කර ඇත.

| වර්ෂය | දිස්ත්‍රික් නේවාසික වැඩසටහන්වලට සහභාගී වූ පුද්ගල සංඛ්‍යාව | | පසුවිපරම් වැඩසටහන්වලට සම්බන්ධ වූ පුද්ගල සංඛ්‍යාව | | දිරියට අත්වැලක් සංචිතය සංවිධානය සඳහා සම්බන්ධ වූ පුද්ගල සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | අනුරාධපුර | පොළොන්නරුව | අනුරාධපුර | පොළොන්නරුව | අනුරාධපුර | පොළොන්නරුව |
| 2016 | 112 | - | 33 | - | - | - |
| 2017 | 107 | 71 | 50 | 44 | - | - |
| 2018 | 96 | 41 | 61 | 22 | - | - |
| 2019 | 128 | 49 | 66 | 28 | 242 | 190 |
| 2020 | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක නොකරන ලදි. | | | | | |
| 2021 | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ක්‍රියාත්මක නොකරන ලදි. | | | | | |

සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව මත්ද්‍රව්‍ය උවදුරෙන් ප්‍රජාව ගලවා ගැනීම සඳහා තවදුරටත් ඉහත වැඩසටහන්වලින් යහමගට ප්‍රවේශ වී සිටින පුද්ගලයන් සඳහා ජීවනෝපාය සංවර්ධනයට ස්වයං රැකියා ආධාර ලබා දීමද එම පවුල්වල දරුවන්ට පාසල් උපකරණ ලබා දීම සිදුකර ඇත. නමුත් 2020 වසර තුල මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන වෙන් නොවුන අතර 2021 වර්ෂයේ මෙම වැඩසටහන සඳහා ප්‍රතිපාදන අනුමත වුවද කොවිඩ් 19 වසංගතය මත ප්‍රජාව එක්රැස් කිරීමට නොහැකි වීම හේතුවෙන් ක්‍රියාත්මක නොකරන ලදි.

| වර්ෂය | ප්‍රතිලාභීන් ගණන | ලබා දී ඇති ස්වයං රැකියා ආධාර මුදල (රු.මි.) |
|---|---|---|
| 2016 | 57 | 1.14 |
| 2017 | 52 | 1.04 |
| 2018 | 48 | 0.96 |
| 2019 | - | - |
| 2020 | 29 | 0.58 |
| 2021 | 03 | 0.03 |

| වර්ෂය | ක්‍රියාත්මක කළ වැඩසටහන් ගණන | සංවිතය සංවිධානයට සහභාගී වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | පාසල් උපකරණ ලබාදුන් දරුවන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | | | අනුරාධපුර | පොළොන්නරුව |
| 2019 | 02 | 242 | 69 | 50 |

II සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ විශේෂ අවශ්‍යතා සහිත වූවන් කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කර ඇත. විවිධ ආබාධවලින් පෙළෙන පුද්ගලයන් සඳහා මෙම දෙපාර්තමේන්තුවෙන් 2021 වර්ෂයේ ලබා දුන් මූල්‍යාධාර පිළිබඳ තොරතුරු මාසික මූල්‍යාධාර ගෙවීම් යටතේ  මෙම වාර්තාව දක්වා ඇති අතර ඔවුන්ට සහන සැලසීම සඳහා ලබා දුන් උපකරණ ආධාර පිළිබඳ තොරතුරු උපකරණ ආධාර ලබා දීම යටතේ දක්වා ඇත. එමෙන්ම විශේෂ අවශ්‍යතා සහිත වූවන් සඳහා පිහිටුවා ඇති ආයතන වෙත කාර්තු වශයෙන් ලබා දෙන යථායෝග්‍යාධාර පිළිබඳව තොරතුරු "වැඩිහිටි නිවාස ,විශේෂ අවස්ථා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ආයතන හා රැකවරණ ආයතන පවත්වා ගැනීම හා අධීක්ෂණය" යටතේ දක්වා ඇත.තවද මෙම ආයතනවල නේවාසිකයන් සඳහා 2021 වර්ෂයේ සිංහල හා හින්දු අලුත් අවුරුද්දට ඇඳුම් මිල දී ගෙන ලබා දී ඇත.

III ගෞරවාන්විත ජ්‍යෙෂ්ඨ පුරවැසි සමාජයක් බිහි කිරීම සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ සුවිශේෂී අවධානයක් යොමු කර සඳහන් කර ඇත. විශේෂයෙන් මෙම දෙපාර්තමේන්තුව සතුව සාලියපුර වැඩිහිටි නිවාසය හා බුල්නෑව විශ්‍රාමික වැඩිහිටි නිවාසය ක්‍රියාත්මක වන අතර හවුහරණක් නොමැති වැඩිහිටියන් එම නිවාස තුළ නේවාසිකව සිටියි.

| වැඩිහිටි නිවාසය | නේවාසික සංඛ්‍යාව | 2021 වර්ෂයේ නඩත්තු සඳහා දරණ ලද වියදම (රු.මි.) | |
|---|---|---|---|
| | | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| සාලියපුර වැඩිහිටි නිවාසය | 297 | 33.33 | 22.87 |
| බුල්නෑව විශ්‍රාමික වැඩිහිටි  නිවාසය | 14 | 1.66 | 0.35 |

එමෙන්ම උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 ක ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩල ක්‍රියාත්මක වන අතර ඔවුන්ගේ සුභසාධනය තහවුරු කිරීම සඳහා 2019 ,2020 ,2021 වසර තුනෙහි  සිදු කරන ලද කාර්යයන්වල තොරතුරු පහතින් දැක්වේ. 2021 වසරේ කොවිඩ් වසංගත තත්ත්වය මත වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම තුළ එම කාර්යයන් බොහෝ දුරට සීමා කිරීම සිදු විය.

| වර්ෂය | වැඩිහිටි දින සැමරුම් වැඩසටහනට ලබා දෙන මුදල (රු.මි.) | වාර්ෂිකව වැඩිහිටි වන්දනා චාරිකාවලට ලබා දෙන ලද මුදල (රු.මි.) | වැඩිහිටි අවුරුදු උත්සව සඳහා ලබා දෙන මුදල (රු.මි.) | වැඩිහිටි චාරිකා සඳහා බස් රථ වෙන්කිරීම (රු.මි.) |
|---|---|---|---|---|
| **2019** | 1.02 | 2.90 | 1.23 | 0.43 |
| **2020** | 0.21 | 0.30 | - | 0.19 |
| **2021** | - | - | - | - |

IV සමාජ ආරක්ෂණ හා සුභසාධනය පිළිබඳව සෞභාග්‍යා දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ ඇතුළත් කර ඇත. අඩු ආදායම්ලාභීන්ට සෙත සැලසීම සඳහා ලබා දෙන ලද මාසික හා මාසික නොවන මූල්‍යාධාරවල තොරතුරු, ජීවත්වීම සඳහා අවශ්‍යා අවම පහසුකම් සහිත නිවාස අලුත්වැඩියාව සඳහා ලබා දෙන නිවාසාධාරවල තොරතුරුද, අඩු ආදායම්ලාභීන් වැඩි ආදායම්ලාභීන් බවට පත් කිරීමට ජීවනෝපාය සංවර්ධනය ලබා දෙන ලද ස්වයං රැකියා ආධාර පිළිබඳ තොරතුරුද මෙම වාර්තාවට මතු ඇතුලත් කර ඇත.

## අංශයේ පවත්නා තත්වය පිලිබඳ විග්‍රහය

අංශයේ අනිවාර්ය නියෝජිතායතන වන්නේ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව සහ ජාතික ආපදා කළමනාකරණ ඒකකයයි.

අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීම, දිළිඳු, ආබාධිත පුද්ගලයින්, ගෘහ මූලික කාන්තාවන් සහ විශේෂිත රෝග සඳහා සහන ලබා දීම, වැඩිහිටි, දිළිඳු, ආබාධිත පුද්ගලයින්ගේ සහ කඩාකප්පල් වූ පවුල් ඒකකවල සමාජ ගැටළු විසඳීම, ආපදාවන් සිදු නොවීම සඳහා අදාළ සමාජ කණ්ඩායම් වෙත වැඩසටහන් පැවැත්වීම, සමාජ ආරක්ෂය සඳහා වෙන් වූ ආයතන පිහිටුවීම සහ නඩත්තු කිරීම පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම් වේ.

දෙපාර්තමේන්තුව තම කාර්ය භාරය ඉටු කරන විට බොහෝ ගැටළු අවස්ථා මතුවේ. මානව හා භෞතික සම්පත්, මූල්‍ය අරමුදල් ශක්තීන් සහ පුහුණු කාර්ය මණ්ඩලය නොමැතිකම, කාර්ය මණ්ඩල ආකල්ප දුර්වලතා මේ අතර වේ. දෙපාර්තමේන්තුවට තර්ජන වන්නේ දේශපාලන ඇඟිලි ගැසීම්, වෙනත් රාජ්‍ය ආයතනවල සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය නොලැබීම වේ

පසුගිය වසරේ දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 1000 ක් පමණ වැය කර ඇත. පළාතේ පුද්ගලයින් 43800 ක් පමණ පිරිසකට විවිධ මූල්‍ය ආධාර යටතේ වැයකල මුදල රු.මිලියන 329.53කි කි. තවද, නිවාස ආධාර ලෙස පුද්ගලයන් 252 දෙනෙකු සඳහා රු. මිලියන 7.4 සහ ස්වයං රැකියා ආධාර ලෙස පුද්ගලයින් 273 දෙනෙකු සඳහා. රු. මිලියන 4.5 වැයකරන ලදී. එම වසරේම සාලියපුර සහ බුල්නෑව වැඩිහිටි නිවාසවල වැඩිහිටියෝ 311ක් හා වැඩිහිටි නිවාස නඩත්තුව සඳහා රු. මිලියන 35ක්ද . මීට අමතරව, දෙපාර්තමේන්තුව විසින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 05ක් සහ ආබාධිත පුද්ගලයින් සඳහා වූ විශේෂ පාසලක්, වැඩිහිටි නිවාස 01ක් අධීක්‍ෂණය කරන අතර නේවාසිකයන් සඳහා සඳහා රු. මිලියන 2.4 යථායෝග්‍යාධාර වශයෙන් ගෙවන ලදී. ආබාධිත පුද්ගලයින් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා අනුව විවිධ උපකරණ වර්ග 12 ක් පුද්ගලින් 921 ක් වෙත බෙදා දෙන ලදී.ඒ සඳහා වියදම රුපියල්. මිලියන 4.63කි. රුධිර කාන්දුකරණ වකුගඩු රෝගීන් 162 දෙනෙකුගේ (සාමාන්‍ය) ආහාර සඳහා වැය කර ඇති මුදල රු. මිලියන 3.28 කි. ඔවුන්ගේ ප්‍රවාහන ගාස්තු ලෙස රු. මිලියන 3.9 ක මුදලක් වැයකර ඇත. තවද, 2021 වසරට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබුන ප්‍රතිපාදන වලින් සංවර්ධන ව්‍යාපෘති 16ක් සිදු කර ඇති අතර වියදම රු. මිලියන 32.55 කි.

මහ බැංකු වාර්තාවට අනුව, 2020 වර්ෂයේ දී උතුරු මැද පළාතේ දරිද්‍රතා ප්‍රධාන ගණක දර්ශකය 3.3 ද, දුප්පත් නිවාස ප්‍රතිශතය 2.4 ද, දරිද්‍රතා පරතරය දර්ශකය 0.5 (2016) ද විය. මානව සංවර්ධන දර්ශකය 0.48 (2018) වූ අතර රටේ ආයු අපේක්ෂාව අවුරුදු 76.8 (2019) විය. මෙම සහ අනෙකුත් අදාළ දර්ශක ක්‍රමානුකූලව පළාතේ යහපත් මට්ටමකට පරිවර්තනය කිරීම දෙපාර්තමේන්තුව ඉලක්ක කරයි. එ් සඳහා හොඳම ස්වයං රැකියා අවස්ථා හඳුනා ගැනීම, පුද්ගලයන් පුහුණු කිරීම සහ ඔවුන් සඳහා

අරමුදල් වෙන් කිරීම සිදු කෙරේ. එමගින් අඩු ආදායම් ලාභී පුද්ගලයන්ගේ ආදායම වැඩි වූ විට, මෙම දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙන ඇතැම් මූල්‍ය සහ වෙනත් ආධාර අඩු කරගත හැක ඒ තුලින් දුප්පත්කම තුරන් කිරීම සඳහා පිටිවහලක් වනු ඇත හැකිය. මීට අමතරව, වැඩිහිටියන් සහ ආබාධිත පුද්ගලයන් සඳහා ප්‍රශස්ත මට්ටමේ සුබසාධන පහසුකම් ලබාදීමට දෙපාර්තමේන්තුව උත්සාහ කරයි.

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

**සංරචකය - 01.** දුප්පත්, ආබාධිත පුද්ගලයින්, අවශ්‍යතා ඇති කාන්තාවන් සහ නිශ්චිත රෝග සඳහා සහන ලබාදීම

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1.1 | දිළිඳු, ආබාධිත, අවශ්‍යතා ඇති කාන්තාවන් සහ නිශ්චිත රෝග සඳහා ආධාර සැපයීම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 45000 | 43000 |
| 1.2 | දිළිඳු පවුල්වල විශේෂ අවශ්‍යතා හා ගෘහ මූලික කාන්තා ස්වයං රැකියා කටයුතු සඳහා සහාය වීම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 300 | 400 |

**සංරචකය - 02.** වැඩිහිටි, දිළිඳු ආබාධිත පුද්ගලයින් සහ කඩාකප්පල් වූ පවුල් ඒකකවල සමාජ ගැටලු විසඳීම

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය(නිමවුම) | පාදම Baseline 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 2.1 | වැඩිහිටි හා අනාථ නිවාස සඳහා මූල්‍ය ආධාර සහ යටිතල පහසුකම් සැපයීම | වැඩිහිටි නිවාසවල සාමාන්‍ය නේවාසික වැඩිහිටි සංඛ්‍යාව | 290 | 311 |
| | | ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල සාමාන්‍ය නේවාසික පුද්ගල සංඛ්‍යාව | 100 | 147 |
| | | ආබාධිත රැඳවුම් මධ්‍යස්ථානවල සාමාන්‍ය නේවාසික පුද්ගල සංඛ්‍යාව | 15 | - |
| | | දිවා සුරැකුම් මධ්‍යස්ථාන භාවිතා කරන වැඩිහිටියන් සංඛ්‍යාව | 1000 | 1800 |
| 2.2 | ආබාධිත පුද්ගලයන් සඳහා උපකරණ ආධාර ලබාදීම | ආබාධිත පුද්ගලයන් අතර බෙදා දුන් ආබාධිත උපකරණ සංඛ්‍යාව | 2500 | 1700 |
| 2.3 | වැඩිහිටි,ආබාධිත දින සැමරුම් හා විවිධ උත්සව සංවිධානය කිරීම (ප්‍රා.ලේ.කොට්ඨාස මට්ටමින් ) | සංවිධාන කරන ලද උත්සව සංඛ්‍යාව | 250 | 300 |
| 2.4 | පවුල් ඒකක තුළ වැඩිහිටියන් හා ආබාධිතයන් රැකබලා ගැනීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | සංවිධාන කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | 30 | 30 |
| 2.5 | මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීම | සංවිධානය කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | 05 | 05 |
| | | සහභාගීවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 200 | 300 |

සංරචකය - 03.අධිකරණය විසින් යොමු කරන ලද පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 3.1 | අධිකරණය විසින් යොමු කරන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම | නවාතැන් සපයන ලද පුද්ගල සංඛ්‍යාව | - | 05 |
| 3.2 | මානව සම්පත් සංවර්ධනය | පවත්වන ලද වැඩසටහන් ගණන | 02 | 40 |

සංරචකය - 04. ආපදා කළමනාකරණ

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 4.1 | ආපදාව පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද වැඩසටහන් ගණන | - | 30 |
| 4.2 | ආපදා සම්බන්ධයෙන් හොඳ කළමනාකරණ පිළිවෙත් වර්ධනය කිරීම | පවත්වන ලද වැඩසටහන් ගණන | - | 30 |
| 4.3 | වන මෘගයන්ගෙන් සහ ස්වභාවික විපත්වලින් වන හානි සඳහා ආධාර සහ ආරක්ෂක පියවරයන් සැපයීම | ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 05 | 30 |

සංරචකය - 05. සැලසුම් සහ කළමනාකරණ ධාරිතා සංවර්ධනය

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 5.1 | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | ධාරිතා සංවර්ධන වැඩසටහන් ගණන | - | 2 |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ලඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | ඉලක්කය | ඉලක්කය සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01 | දිළිඳු, ආබාධිත, අවශ්‍යතා ඇති කාන්තාවන් සහ නිශ්චිත රෝග සඳහා ආධාර සැපයීම | මාසික මහජනාධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 43000 | 42716 |
| | | මාසික නොවන මහජන ආධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1700 | 1169 |
| 02 | දිළිඳු පවුල්වල ආබාධිත පුද්ගලයන්ගේ ස්වයං රැකියා කටයුතු සඳහා සහාය වීම | ස්වයං රැකියලාභී ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 400 | 273 |
| 03 | වැඩිහිටි හා ආබාධිත නිවාස සඳහා මූල්‍ය ආධාර සහ යටිතල පහසුකම් සැපයීම | වැඩිහිටි නිවාසවල සාමාන්‍ය නේවාසික වැඩිහිටි සංඛ්‍යාව | 315 | 311 |
| | | ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල සාමාන්‍ය නේවාසික පුද්ගල සංඛ්‍යාව | 150 | 147 |
| | | ආබාධිත රැඳවුම් මධ්‍යස්ථානවල සාමාන්‍ය නේවාසික පුද්ගල සංඛ්‍යාව | 15 | - |
| | | දිවා සුරැකුම් මධ්‍යස්ථාන භාවිතා කරන වැඩිහිටියන් සංඛ්‍යාව | 1,800 | 800 |
| 04 | ආබාධිත පුද්ගලයන් සඳහා උපකරණ ආධාර ලබාදීම | ආබාධිත පුද්ගලයන් අතර බෙදා දුන් ආබාධිත උපකරණ සංඛ්‍යාව | 1,700 | 921 |
| 05 | වැඩිහිටි,ආබාධිත දින සැමරුම් හා විවිධ උත්සව සංවිධානය කිරීම ( ප්‍රා.ලේ.කොට්ඨාස මට්ටමින් ) | සංවිධාන කරන ලද උත්සව සංඛ්‍යාව | 250 | - |
| 06 | පවුල් ඒකක තුළ වැඩිහිටියන් හා ආබාධිතයන් රැකබලා ගැනීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | සංවිධාන කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | 30 | 05 |
| 07 | මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීම | සංවිධානය කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | 05 | - |
| | | සහභාගීවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 300 | - |
| 08 | අධිකරණය විසින් යොමු කරන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම | නවාතැන් සපයන ලද පුද්ගල සංඛ්‍යව | - | - |
| 09 | මානව සම්පත් සංවර්ධනය | පවත්වන ලද වැඩසටහන් ගණන | - | - |
| 10 | ආපදාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද වැඩසටහන් ගණන | 20 | 05 |
| 11 | ආපදා සම්බන්ධයෙන් හොඳ කළමනාකරණ පිළිවෙත් වර්ධනය කිරීම | පවත්වන ලද වැඩසටහන් ගණන | 20 | 05 |
| 12 | වන මෘගයන්ගෙන් සහ ස්වභාවික විපත්වලින් වන හානි සඳහා ආධාර සහ ආරක්ෂක පියවරයන් සැපයීම | ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 15 | 06 |
| 13 | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | ධාරිතා සංවර්ධන වැඩසටහන් ගණන | 02 | - |

## ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ලඟාකර ගැනිම සඳහා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති

| අනු අංක | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ලඟාවීම | | | |
| 01 | මාසික මහජනාධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 43000 | 42716 | මාසික මූල්‍යාධාර ලබා දීම | 329.63 | 42716 |
| 02 | මාසික නොවන මහජන ආධාර ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1700 | 1169 | මාසික නොවන මූල්‍යාධාර ලබා දීම | 20.24 | 1169 |
| 03 | ස්වයං රැකියලාභී ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 400 | 128 | ස්වයං රැකියා කණ්ඩායම් ව්‍යාපෘති | 2.61 | 128 |
| | | | 95 | දිරිය ශක්ති ස්වයං රැකියා ව්‍යාපෘතිය | 1,91 | 95 |
| 04 | අලුත්වැඩියාව කරන ලද රුධිර කාන්දුකරණ රෝගීන්ගේ නිවාස සංඛ්‍යාව | 10 | 15 | සුව තිළිණ ව්‍යාපෘතිය | 1.5 | 15 |
| 05 | වැඩිදියුණු කරන ලද සමාජ සේවා අංශ සංඛ්‍යාව | 10 | 05 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජ සේවා අංශ වැඩිදියුණු කිරීම | 1.0 | 10000 |
| 06 | වැඩිහිටි නිවාස සඳහා ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව | 11 | 09 | සාලියපුර වැඩිහිටි නිවාසයේ අංක 02 දරණ නේවාසිකාගාරයේ වහලය අලුත්වැඩියා කිරීම | 2.56 | 297 |
| | | | | සාලියපුර වැඩිහිටි නිවාසයේ කෑම ශාලාව නවීකරණය | 6.49 | 297 |
| | | | | සාලියපුර වැඩිහිටි නිවාසයේ ලේඛනාගාරය ඇතුලුව කාර්යාලය නවීකරණය | 4.85 | 297 |
| | | | | සාලියපුර වැඩිහිටි නිවාසයේ තාප්පය පිළිසකර කිරීම | 0.56 | 297 |
| | | | | සාලියපුර වැඩිහිටි නිවාසය සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 0.35 | 297 |
| | | | | සාලියපුර වැඩිහිටි නිවාසයට දානය ලබා දෙන පුද්ගලයින්ට පිරිමි හා ගැහැණු වශයෙන් වැසිකිලි හා නාන ස්ථාන ඉදිකිරීම | 3.99 | 297 |
| | | | | සාලියපුර වැඩිහිටි නිවාසයේ ප්‍රධාන පිවිසුමට අයත් ඉදිකිරීම් | 2.9 | 297 |
| | | | | බුල්නෑව වැඩිහිටි නිවාසයේ ජෙනරේටරය සඳහා කාමරයක් ඉදිකිරීම | 0.28 | 14 |
| | | | | සාලියපුර වැඩිහිටි නිවාසයේ ජලය බැස යන කානු පද්ධතියක් ඉදිකිරීම | 1.75 | 300 |

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ලඟාකර ගැනිම සඳහා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස......................

| අනු අංක | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ලඟාවීම | | | |
| 07 | යථායෝග්‍යාධාර ලබාදෙන වැඩිහිටි සංඛ්‍යාව | 20 | 17 | යථායෝග්‍යාධාර ලබාදීම | 0.34 | 17 |
| 08 | ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල සාමාන්‍ය නේවාසික පුද්ගල සංඛ්‍යාව | 150 | 130 | සේවාගම ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ අත්‍යවශ්‍ය නවීකරණය කටයුතු | 0.54 | 38 |
| | | | | ගිරිතලේ අත්වැල පුහුණු මධ්‍යස්ථානයේ වැට ඉදි කිරිම හා කෑම ශාලාවට ජනෙල් සවි කිරීම | 0.8 | - |
| | | | | සේවාගම ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වැසිකිලි ඉදිකිරිම | 1.48 | 38 |
| 09 | යථායෝග්‍යාධාර ලබාදෙන ආබාධිත පුද්ගල සංඛ්‍යාව | 150 | 147 | යථායෝග්‍යාධාර ලබාදීම | 2.10 | 147 |
| 10 | ආබාධිත පුද්ගලයන් සඳහා උපකරණ ආධාර ලබාදීම | 1700 | 921 | ආබාධිත උපකරණ ලබාදීම | 4.63 | 921 |
| 11 | සංවිධානය කරන ලද වැඩිහිටි,ආබාධිත දින සැමරුම් හා විවිධ උත්සව සංවිධානය කිරීම | 250 | - | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | - | - |
| 12 | පවුල් ඒකක තුළ වැඩිහිටියන් හා ආබාධිතයන් රැකබලා ගැනීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 08 | 05 | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 0.136 | 05 |
| 13 | මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීම | 05 | - | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | - | - |
| 14 | අධිකරණය විසින් යොමු කරන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම | - | - | - | - | - |

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ලඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස...........

| අනු අංක | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ලඟාවීම | | | |
| 13 | මානව සම්පත් සංවර්ධනය | - | - | - | - | - |
| 14 | ආපදාව පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 08 | 05 | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | 0.136 | - |
| 15 | ආපදා සම්බන්ධයෙන් හොඳ කළමනාකරණ පිළිවෙත් වර්ධනය කිරීම | - | - | - | - | - |
| 16 | වන මෘගයන්ගෙන් සහ ස්වභාවික විපත්වලින් වන හානි සඳහා ආධාර සහ ආරක්ෂක පියවරයන් සැපයීම | 10 | 06 | ආධාර ලබාදුන් පුද්ගල සංඛ්‍යාව | 0.11 | 06 |
| 17 | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | 02 | - | පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව | - | - |

## 1.මහජනාධාර නැවත සමීක්ෂණ


නොච්චියාගම


තමන්කඩුව


කැකිරාව

## 2.ස්වයං රැකියා කණ්ඩායම් ව්‍යාපෘති







## 3.ස්වයං රැකියා පුහුණු වැඩසටහන් පැවැත්වීම




## 4.ආබාධිත උපකරණ ලබාදීම







## 5.වැඩිහිටි බල මණ්ඩල සංවිධාන රැස්වීම් පැවැත්වීම




## 6.ගෘහ මූලික කාන්තා බල මණ්ඩල සංවිධාන රැස්වීම් පැවැත්වීම




## 7.ආබාධිත සංවිධාන රැස්වීම් පැවැත්වීම




## 8.නිවාසාධාර






## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම

**සංරචකය - 01.** දුප්පත්, ආබාධිත පුද්ගලයින්, අවශ්‍යතා ඇති කාන්තාවන් සහ නිශ්චිත රෝග සඳහා සහන ලබාදීම

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | 2021 ළඟාවීම | ඉලක්කය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2022 | 2023 | 2024 | 2025 |
| 1.1 | දිළිඳු, ආබාධිත, අවශ්‍යතා ඇති කාන්තාවන් සහ නිශ්චිත රෝග සඳහා ආධාර සැපයීම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 45000 | 43879 | 44500 | 45000 | 45000 | 45000 |
| 1.2 | දිළිඳු පවුල්වල ආබාධිත පුද්ගලයන්ගේ ස්වයං රැකියා කටයුතු සඳහා සහාය වීම | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 300 | 273 | 300 | 750 | 800 | 800 |

**සංරචකය - 02.** වැඩිහිටි, දිළිඳු ආබාධිත පුද්ගලයින් සහ කඩාකප්පල් වූ පවුල් ඒකකවල සමාජ ගැටලු විසඳීම

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | 2021 ළඟාවීම | ඉලක්කය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2022 | 2023 | 2024 | 2025 |
| 2.1 | වැඩිහිටි හා අනාථ නිවාස සඳහා මූල්‍ය ආධාර සහ යටිතල පහසුකම් සැපයීම | වැඩිහිටි නිවාසවල සාමාන්‍ය නේවාසික වැඩිහිටි සංඛ්‍යාව | 290 | 311 | 325 | 350 | 375 | 400 |
| | | ආබාධිත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානවල සාමාන්‍ය නේවාසික පුද්ගල සංඛ්‍යාව | 100 | 147 | 150 | 150 | 175 | 175 |
| | | ආබාධිත රැඳවුම් මධ්‍යස්ථානවල සාමාන්‍ය නේවාසික පුද්ගල සංඛ්‍යාව | 15 | - | 15 | | 25 | 25 |
| | | දිවා සුරැකුම් මධ්‍යස්ථාන භාවිතා කරන වැඩිහිටියන් සංඛ්‍යාව | 1000 | - | 1500 | 1750 | 1750 | - |

මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ලඟාවීම ඉතිරි කොටස...........

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | 2021 ලඟාවීම | ඉලක්කය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2022 | 2023 | 2024 | 2025 |
| 2.2 | ආබාධිත පුද්ගලයන් සඳහා උපකරණ ආධාර ලබාදීම | ආබාධිත පුද්ගලයන් අතර බෙදා දුන් ආබාධිත උපකරණ සංඛ්‍යාව | 2500 | 1700 | 2000 | 3000 | 3500 | 3500 |
| 2.3 | වැඩිහිටි,ආබාධිත දින සැමරුම් හා විවිධ උත්සව සංවිධානය කිරීම ( ප්‍රා.ලේ. කොට්ඨාස මට්ටමින් ) | සංවිධාන කරන ලද උත්සව සංඛ්‍යාව | 250 | - | 250 | 300 | 300 | 300 |
| 2.4 | පවුල් ඒකක තුළ වැඩිහිටියන් හා ආබාධිතයන් රැකබලා ගැනීම සඳහා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | සංවිධාන කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | 30 | 05 | 20 | 30 | 30 | 30 |
| 2.5 | මත්පැන් හා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම වැළැක්වීම | සංවිධානය කරන ලද වැඩසටහන් සංඛ්‍යාව | 05 | - | 05 | 05 | 05 | 05 |
| | | සහභාගීවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 200 | - | 200 | 300 | 300 | 300 |

**සංරචකය - 03**.අධිකරණය විසින් යොමු කරන ලද පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම

| අනු අංක | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | 2021 ලඟාවීම | ඉලක්කය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2022 | 2023 | 2024 | 2025 |
| 3.1 | අධිකරණය විසින් යොමු කරන පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම | නවාතැන් සපයන ලද පුද්ගල සංඛ්‍යාව | - | 05 | 05 | 05 | 05 | 05 |
| 3.2 | මානව සම්පත් සංවර්ධනය | පවත්වන ලද වැඩසටහන් ගණන | 02 | - | 04 | 05 | 05 | 05 |

සංරචකය - 04. ආපදා කළමනාකරණ

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | 2021 ලභාවීම | ඉලක්කය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2022 | 2023 | 2024 | 2025 |
| 4.1 | ආපදාව පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | පවත්වන ලද වැඩසටහන් ගණන | - | 05 | 20 | 30 | 30 | 30 |
| 4.2 | ආපදා සම්බන්ධයෙන් හොඳ කළමනාකරණ පිළිවෙත් වර්ධනය කිරීම | පවත්වන ලද වැඩසටහන් ගණන | - | 05 | 20 | 30 | 30 | 30 |
| 4.3 | වන මෘගයන්ගෙන් සහ ස්වභාවික විපත්වලින් වන හානි සඳහා ආධාර සහ ආරක්ෂක පියවරයන් සැපයීම | ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 05 | 05 | 10 | 15 | 15 | 15 |

සංරචකය - 05. සැලසුම් සහ කළමනාකරණ ධාරිතා සංවර්ධනය

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම Baseline 2015 | 2021 ලභාවීම | ඉලක්කය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2022 | 2023 | 2024 | 2025 |
| 5.1 | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය | ධාරිතා සංවර්ධන වැඩසටහන් ගණන | 02 | - | 02 | 02 | 02 | 02 |

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකයන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සහාය ලබාදුන් පුද්ගල /පවුල් ඒකක සංඛ්‍යාව | ✓ | | |
| අඩු ආදායම්ලාභී පුද්ගලයන් හා පවුල් ඒකකවල ජීවනෝපාය සංවර්ධනය දිරිමත් කළ පවුල් සංඛ්‍යාව | ✓ | | |
| රැකවරණය අහිමි හෝ අහිමි වීමට ඉඩකඩ ඇති වැඩිහිටියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා නේවාසික පහසුකම් සලසා දුන් පුද්ගල සංඛ්‍යාව | ✓ | | |
| වැඩිහිටි සහ විශේෂ අවශ්‍යතා සහිත වූවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ සුභසාධනය ඉහල නැංවීම පිළිබඳව දැනුවත් ප්‍රජාවක් බිහිකිරීමට සිදුකරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව | | | ✓ |
| වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තා සංවිධාන ව්‍යුහය ශක්තිමත්ව පවත්වා ගෙන යාම සඳහා පවත්වන ලද රැස්වීම් හා වැඩසටහන් සංඛ්‍යාව | | | ✓ |
| වැඩිහිටි, විශේෂ අවශ්‍යතා සහිත හා ගෘහමූලික කාන්තාවන්ගේ දැනුම,කුසළතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම හා ඇගයීම සඳහා පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යව | | | ✓ |
| ආපදා තත්වයන්ට පෙර සූදානම හා හදිසි ආපදා තත්වයන් ඇතිවීම වළක්වා ගැනීම පිළිබඳ දැනුවත් වූ ප්‍රජාවක් බිහිකිරීම සඳහා සංවිධානය කළ වැඩසටහන් සංඛ්‍යාව | | | ✓ |

**සටහන :** ඉහත ඇතැම් දර්ශක 50% - 74% අතර ප්‍රතිශතයක් ලබා ගෙන ඇත්තේ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙනි.

## අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්

2021 වර්ෂයේ ආරම්භයේ දෙපාර්තමේන්තුව විසින් හඳුනා ගන්නා ලද ඉලක්කවලින් සැළකිය යුතු සංඛ්‍යාවක් සාක්ෂාත් කර ගැනීමට හැකි විම තුළ ඊට අදාළ කාර්යසාධන දර්ශකයන්ගේද 100%කට ආසන්න සාර්ථකත්වයක් අත්පත් කර ගැනීමට හැකි විය.ස්වයං රැකියා ආධාර , නිවාස ආධාර ඇතුළු මාසික හා මාසික නොවන මූල්‍යාධාර හා උපකරණ ආධාර ලබා දීමත් යටත් ආයතන අභියෝගයන් හමුවේ පවත්වාගෙන යාමට හැකිවීමත් ඊට හේතු විය.නමුත් පැවති කොවිඩ් 19 වසංගත තත්වය තුළ ප්‍රතිලාභීන් එක්රැස් කරමින් දෙපාර්තමේන්තුවෙන් හා ප්‍රාදේශය ලේකම් කොට්ඨාශවලින් සිදුකරන වැඩසටහන් පැවැත්වීමට නොහැකි වීම තුළ ඇතැම් කාර්යසාධන දර්ශකවල අඩු සාර්ථකත්වයක් දක්නට ලැබුණි. එවැනි තත්වයක් දෙපාර්තමේන්තුවට පාලනය කර ගත නොහැකි කාරණා බවද මෙහිලා සඳහන් කළ යුතුය.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතනය සැළසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනිමට ආයතනය අරමුණු කළ සැළසුම් | එම සැළසුම් වෙනුවෙන් 2021 වර්ෂය ඉටුකළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 00%-49% | 50%-74% | 75%-100% |
| 01 | 1.3 | මාසික මූල්‍යාධාර ලබාදීම | ප්‍රතිලාභීන් 42,716ක් සඳහා මාසික මූල්‍යාධාර ලබාදීම | - | - | ✓ |
| | | මාසික නොවන මූල්‍යාධාර ලබාදීම | විශේෂ තත්ව යටතේ 1163සඳහා මාසික නොවන මූල්‍යාධාර ලබාදීම | - | - | ✓ |
| | | ආබාධිත උපකරණ ලබාදීම | ප්‍රතිලාභීන් 921 ක්ආබාධිත උපකරණ ලබාදීම | - | - | ✓ |
| | 1. අ. | දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම | දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම වශයෙන් රු/මි.478ක් යෙදීම. | - | - | ✓ |
| | | දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් දැරීම | දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම වශයෙන් රු/මි 32.55ක් වැය කිරීම | - | - | ✓ |
| 03 | 3.3 | ක්ෂය රෝග ආධාර ලබාදීම | රෝගීන් 54ක් ක්ෂය රෝග ආධාර ලබාදීම | - | - | ✓ |
| | 3.5 | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සඳහා ආධාර ලබාදීම | මත්ද්‍රව්‍ය උවදුරෙන් වළක්වන ලද පුද්ගලයින් 29 දෙනෙකු සඳහා ස්වයං රැකියාධාර දීම | ✓ | - | |
| 04 | 4.5 | ශිෂ්‍යාධාර සඳහා ආධාර ලබාදීම | ශිෂ්‍යයන් 6505ක් සඳහා ශිෂ්‍යාධාර ලබාදීම | - | - | ✓ |
| | | සිසු දිරිය ආධාර දීම | ශිෂ්‍යයන් 162ක් සඳහා සිසු දිරිය ආධාර ලබාදීම | - | - | ✓ |
| | | යථායෝග්‍යාධාර ගෙවීම | පුද්ගලයින් 164ක් යථායෝග්යාධාර ගෙවීම | - | - | ✓ |
| | 4.අ. | ආබාධිත වෘත්තීය පුහුණු ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | ආබාධිත වෘත්තීය පුහුණු ආයතනවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු/මි 3.0ක් වැයකිරීම | - | - | ✓ |
| | | ආබාධිත දරුවන් සඳහා විශේෂ උපකරණ දීම | ආබාධිත දරුවන් සඳහා විශේෂ උපකරණ ලබාදීම | ✓ | - | |

හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ඉතිරි කොටස..................

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැළසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ළඟාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැළසුම් | එම සැළසුම් වෙනුවෙන් 2021 වර්ෂය ඉටුකළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 00%-49% | 50%-74% | 75%-100% |
| 08 | 8.5 | ස්වයං රැකියා ආධාර ලබාදීම | පවුල් 273ක් සඳහා ස්වයං රැකියා ආධාර ලබාදීම | - | - | ✓ |
| | 8.5 | ස්වයං රැකියා පුහුණු වැඩසටහන් පැවැත්වීම | ස්වයං රැකියා පුහුණු වැඩසටහන් 273ක් පැවැත්වීම | - | - | ✓ |
| 10 | 10.2 | මුලාසාධාර ලබාදිම | රු/මි. 329.66ක් විවිධ මුල්‍යාධාර ලබාදීම සඳහා වැයකිරීම | - | - | ✓ |
| | | ආබාධිත උපකරණ ආධාර ලබාදීම | ආබාධිත පුද්ගලයින් 921ක සඳහා උපකරණ ආධාර ලබාදීම | - | - | ✓ |
| | | දැනුම,කුසළතා හා ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | දැනුම,කුසළතා හා ආකල්ප සංවර්ධන වැඩසටහන් 05 ක් පැවැත්වීම | ✓ | - | - |
| 11 | 11.1 | නිවාසාධාර ලබාදිම | පවුල් 297ක් සඳහා නිවාසාධාර සඳහා ලබාදිම | - | - | ✓ |
| 16 | 16.6 | දෙපාර්තමේන්තුවේ එදිනෙදා පුණරාවර්තන වියදම් දැරීම | දෙපාර්තමේන්තුවේ එදිනෙදා පුණරාවර්තන වියදම් වශයෙන් රු/මි.469ක් වැය කිරිම | - | - | ✓ |
| | | දෙපාරතමේන්තුවේ ප්‍රාග්ධන වියදම් දැරීම | දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් වශයෙන් රු/මි. 32.55 | - | - | ✓ |

## තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ලත් ජයග්‍රහණ හා එම ජයග්‍රහණ ලබා ගැනීමට ආයතනය සතු වූ ශක්තීන් , අවස්ථා හා තර්ජන

- කොවිඩ් 19 ගෝලීය වසංගතය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් තැපැල් කාර්යාල හරහා ප්‍රතිලාභීන්ට ලබා දෙන මූල්‍යාධාර ගෙවීම 2021 ආරම්භයේ සිට පැවති කොවිඩ් 19 අවධානම් තත්ත්වය තුළ සිදු කිරීමට බාධාවක් ඇති විය. එහිදි සමාජ සේවා නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන් මඟින් අදාළ ප්‍රතිලාභීන්ට මූල්‍යාධාර ගෙවීම සිදු කිරීම හරහා එම අභියෝගය ජයගත හැකි විය.
- දෙපාර්තමේන්තුව මගින් සෘජුවම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් මහජනතාව වෙත ගොස් සිදු කරන දැනුම, කුසලතා හා ආකල්ප වැඩිදියුණු කිරීමේ වැඩසටහන්, ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්, මුළු මුනින්ම පාහේ සෞඛ්‍ය උපදෙස් මත අත්හිටුවීමට සිදු විය. නමුත් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කුඩා කණ්ඩායම් වශයෙන් එම වැඩසටහන් කිහිපයක් සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

- පැවති අවධානම් තත්ත්වය හා ප්‍රවාහන දුෂ්කරතාවය මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සේවයට කැඳවීමට නොහැකි වීම තුළ දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලන කටයුතු සිදු කිරීමට බාධා පැමිණියත් කණ්ඩායම් වශයෙන් සේවයට කැඳවමින් අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට හැකි විය.

- සාලියපුර වැඩිහිටි නිවාසය ඇතුළු අනිකුත් වැඩිහිටි නිවාස හා ආබාධිත ආයතනවල නේවාසිකයින් මෙම උවදුරෙන් ගලවා ගැනීම ප්‍රමුඛ කාර්යභාරයක් විය. සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් පිළිපදිමින්ද සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින්ද මෙම වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමෙන්ද අවධානම් පුද්ගලයින් හා සම්මුඛ වීම වැළැක්වීමෙන්ද නේවාසිකයන් හා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමෙන්ද මෙම උවදුරෙන් ඔවුන් හැකිතාක් ආරක්ෂා කිරිමට හැකි විය. තවද සාලියපුර වැඩිහිටි නිවාසයට වෛරසය ඇතුලු වුවද රෝගී තත්වය පාලනය කිරීම තුලින් මරණ සංඛ්‍යාව අවම කරගත හැකි විය. මේ සඳහා වැඩිහිටි නිවාස කාර්ය මණ්ඩලය ඉතාමත් කැපවීමෙන් වෙහෙසකර කාර්ය භාරයක් ඉටුකරන ලදී.

- යටත් ආයතනවල සැපයුම් ලබා ගැනීමේදි දුෂ්කරතා ඇති වුවත් සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය සැපයුම් ලබා ගැනීමට හැකි වු අතර අමතර තොග පවත්වා ගැනීමෙන් වැඩිහිටි නිවාසවලට අවශ්‍ය සැපයුම් බාධාවකින් තොරව ලබා ගැනීමට හැකි විය.

- නිවාසාධාර හා ස්වයං රැකියා ආධාර වැනි ක්ෂේත්‍ර නිරීක්ෂණය කර ලබා දෙන ආධාර නවීන තාක්ෂණ ක්‍රමවේද භාවිතා කරමින් සන්නිවේදන කිරීම නිසාද සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් ක්ෂේත්‍ර පරික්ෂාවන් සිදු කිරීම මඟින්ද එම අභියෝග ජයගත හැකි විය. නමුත් පසුගිය වසරවලට සාපේක්ෂව සුවිශේෂී ප්‍රගතියක් අත්පත්කර ගැනීමට නොහැකි විය.



## කොවිඩ් 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2021 වර්ෂය තුළ දෙපාර්තමේන්තුව මඟින් පළාතේ මහජනතාවට ලබා දෙන සේවාවන් කාර්යක්ෂමව හා ප්‍රමාදයකින් තොරව ලබා දීම සඳහා වර්ෂය ආරම්භයේදී ඉලක්කයන් හඳුනා ගැනීම හා එම ඉල්කකයන් අදාළ පාර්ශව වෙත ලබා දීම සිදු කෙරිණ. නමුත් 2020 වර්ෂයේ මෙන්ම මෙම වර්ෂයේද මුහුණදීමට සිදු වු කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ එම ඉලක්කයන් වෙත ළඟා වීමට බොහෝ අපහසුතා ඇති විය. විශේෂයෙන් ක්ෂේත්‍ර ගණනාවක් යටතේ ප්‍රතිලාභීන් 42,716 කට පමණ තැපැල් කාර්යාල හරහා ගෙවනු ලබන මාසික මහජනාධාර ගෙවීම රටේ පවතින කොවිඩ් තත්ත්වය හා සංචරණයන් සීමා කිරීම තුළ නිසි වේලාවට ලබා දීමට නොහැකි තත්ත්වයක් ඇති විය. කෙසේ නමුදු සමාජ සේවා නිලධාරින් හා ග්‍රාම නිලධාරින් මඟින් එම අවස්ථාවේ ප්‍රතිලාභින්ට එම මූල්‍යාධාර ගෙවීමට කටයුතු කෙරිණ. තවද නිවාස ආධාර ලබා දීමේදී අදාළ ක්ෂේත්‍ර පරික්ෂාවන් සිදු කිරිම හා ස්වයං රැකියා ආධාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදී ප්‍රතිලාභීන් එක්රැස් කර පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වාතාවරණයක් ඇති වුවත් 2021 වර්ෂය තුළ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ කැපවීම මත නිවාස ආධාර 297 ක පමණ සංඛ්‍යාවකුත් ස්වයං රැකියා ආධාර 273 ක සංඛ්‍යාවකුත් ලබා දීමට හැකියාව ලැබිණ.

දෙපාර්තමේන්තුව මඟින් මහජනතාවට ලබා දෙන සුවිශේෂි සහනයක් වනුයේ විවිධ ආබාධිත උපකරණ ලබා දීමයි. පැවැති තත්ත්වයන් තුළ පුද්ගලයින්ට දෙපාර්තමේන්තුවට පැමිණීමට නොහැකිවීම මත දෙපාර්තමේන්තුවෙන් සෘජුව නිකුත් කිරීම් සීමා වුවත් සුදුසුකම් සපුරනු ලැබූ සියලු අයදුම්පත් සඳහා දෙපාර්තමේන්තුවෙන් ආබාධිත උපකරණ නිකුත් කිරිමට හැකි වීමත් පුද්ගලයන්ට දෙපාර්තමේන්තුවට පැමිණ උපකරණ ලබා ගැනීමට නොහැකි වීමට පිළියමක් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංචිතයේ තබා ගනිමින් නිකුත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ආබාධිත උපකරණ ප්‍රවාහනය කර භාර දීමට හැකිවීමත් තුළ ප්‍රතිලාභීන්ට විශාල සහනයක් ඇති වූ බවට නිරික්ෂණය විය.

රෝදපුටු, ත්‍රයිසිකල්, ඇවිදින ආධාරක, වායු හා වතුර මෙට්ට ආදී වශයෙන් ආබාධිත උපකරණ 921 ක පමණ සංඛ්‍යාවක් මෙම ක්‍රියාවලිය හරහා බෙදා දීමට හැකි වූ අතර එමඟින් ප්‍රතිලාභීන්ට බෙදාදුන් ආබාධිත උපකරණවල වටිනාකම රු.මි. 4.63 කි. දෙපාර්තමේන්තුව මඟින් පළාතේ මහජනතාවට සිදු කරන තවත් සුවිශේෂි සේවාවක් වන්නේ වැඩිහිටි, ගෘහ මූලික කාන්තා, ආබාධ සහිත වුවන් හා අඩු ආදායම්ලාභී සඳහා ආධ්‍යාත්මික සංවර්ධන, ආකල්ප සංවර්ධන හා කුසලතා ඇගයීම් වැනි වැඩසටහන් පැවැත්වීමයි. පැවැති තත්ත්වයන් තුළ පිරිස් එක්රැස් කිරීමට නොහැකි වීම මත මෙම වැඩසටහන් සම්පූර්ණයෙන්ම පාහේ නතර කිරිමට සිදු වුවත් එවැනි වැඩසටහන් 05 ක් පැවැත්වීමට කටයුතු කළ අතර ඒ සඳහා සහභාගී වූ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව 365 කි. වැය කරන ලද මුදල රු.මි. 0.14 කි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කරන අවුරුදු උත්සව, ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් වැඩසටහන් 06ක් හා චාරිකා 06 ක ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරිමට හැකි වූ අතර ඒ සඳහා සහභාගී වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 245කි.

දෙපාර්තමේන්තුව සතුව වැඩිහිටි නිවාස 02 ක් හා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආබාධිත ආයතන 04 ක් ක්‍රියාත්මක වන අතර සැපයුම් බාධාවකින් තොරව ලබා දීමට සිදු වීමත් කායික හා මානසික වශයෙන් දුර්වල එවැනි පුද්ගලයින් කොවිඩ් 19 වසංගතයෙන් ආරක්ෂා කර ගැනීමත් ඔවුන්ට සේවාවන් සැපයීමත් ඒ සඳහා කාර්ය මණ්ඩලය සේවයට වාර්තා කිරීමත් පැවති තත්ත්වය තුළ මුහුණ දීමට සිදු වූ අභියෝගාත්මක කාරණා විය.

නේවාසික වැඩිහිටියන් 311 ක් පමණද ආබාධිත නේවාසිකයින් 147 ක් පමණකද ආරක්ෂා කර ගනිමින් ඔවුන්ට සපයන සේවාවන් නොඅඩුව ලබා දීමට හැකිවීම දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් වේ. තවද දෙපාර්තමේන්තුව හා යටත් ආයතනවල සේවය කරනු ලබන කාර්ය මණ්ඩලයද අවධානම් තත්ත්වයන්ට මුහුණු දෙමින් සේවය සඳහා හැකි උපරිමයෙන් වාර්තා කර සාමාන්‍ය රාජකාරි කටයුතු ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යැමට ඔවුන් ප්‍රශංසනීය සේවාවක් කල බවද මෙහිලා සඳහන් කළ යුතුය.

2021 වර්ෂය තුළ නව ව්‍යාපෘති 24ක් සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වශයෙන් රු.මි.45ක් හා පළාත් සභා සංවර්ධන ප්‍රදාන වශයෙන් රු.මි.1ක් ප්‍රාග්ධන මූල්‍ය ප්‍රතිපාදන වශයෙන් සලසා දුන්නද රටේ පැවැති කොවිඩ් වාතාවරණය හා වෙන්වූ ප්‍රතිපාදනය ඇතැම් ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් නොවීම මත ව්‍යාපාති 16ක් පමණක් ක්‍රියාත්මක කළ හැකි විය. ඒ අනුව වැඩිහිටි නිවාස නවීකරණය සඳහා රු.13,888,182/-ක්ද ආබාධිත රැඳවුම් නිවාස හා වෘත්තීය පුහුණු නිවාස නවීකරණය සඳහා රු.536,046/- ක්ද ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා රු. 587,706/- ක්ද ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සඳහා රු.2,761,530/-ක්ද යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම සඳහාරු. 353,479/- ක්ද වැඩිහිටි නිවාස ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රු.7,183,262/- ක් ද ආබාධිත රැඳවුම් හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රු. 2,281,546ක්ද යටිතල පහසුකම් වත්කම් සඳහා 1,754,842/-ක්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාජ සේවා අංශ වැඩිදියුණු කිරීම සඳහා 999,000/-ක්ද සනීපාරක්ෂක පහසුකම්, ආකල්ප හා ආර්ථික සංවර්ධන වැඩසටහන් සඳහා 2,193,293/- ක්ද වශයෙන් සමස්ත සංවර්ධන ව්‍යාපෘති සියල්ල සඳහා රු.32,548,888/-ක මුදලක් වැය කරමින් එක් ව්‍යාපෘතියක් පමණක් අවිච්ඡේද මට්ටමින් ඉතිරිවිය අනෙකුත් සියලු ව්‍යාපෘති සිදු කර අවසන් කරන ලද අතර සමස්ථයක් වශයෙන් එහි ප්‍රගතිය 93%කි.

එසේම එළඹෙන වර්ෂයේ පහත සඳහන් අරමුණු ක්‍රියත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- වැඩිහිටි නිවාස, ආබාධිත ළමා රැඳවුම් නිවාසවල ප්‍රමිතිය ඉහල නැංවීමට ප්‍රමිතිකරණ දර්ශක සකස් කිරීම.
- කාන්තා රැඳවුම් මධ්‍යස්ථානයක් ලෙස ඇලගමුව යොදා ගැනීම.
- ගිරිතලේ අත්වැල පුහුණු මධ්‍යස්ථානය හා ඔළුකරඳ ආයතනය ස්වයං රැකියා උත්පාදන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමට කටයුතු කිරිම.
- සාලියපුර වැඩිහිටි නිවාසය හා බුල්නැව වැඩිහිටි නිවාසය තුල හරිත කෘෂිකර්මය ප්‍රවලිත කිරිම.

# 09. ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

## ආයතන පිළිබඳ මූලික තොරතුරු

ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය පළාත් සභා පිහිටුවීමට පෙර මධ්‍යම රජයේ සමුපකාර අමාත්‍යාංශය යටතේ සමුපකාර අමාත්‍යවරයා යටතේ ප්‍රාදේශීය කාර්යාලයක් වශයෙන් පැවති අතර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව පළාත් සභා ආරම්භ කිරීමත් සමඟ උතුරු මැද පළාතේ සමුපකාර අමාත්‍යාංශය අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවන ලදී.

මෙම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වන්නේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවයි.

## පළාත් ව්‍යවස්ථාපිත ආයතන

ව්‍යවස්ථාපිත ආයතන ලෙස පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය, සමුපකාර සේවක කොමිෂන් සභාව යන ආයතන ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ වේ.

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

පළාත් සභා පිහිටුවීමට පෙර මධ්‍යම රජයේ සමුපකාර අමාත්‍යාංශය යටතේ සමුපකාර කොමසාරිස්වරයා යටතේ ප්‍රාදේශීය කාර්යාලයක් වශයෙන් පැවති අතර 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධාන අනුව පළාත් සභා ආරම්භ කිරීමත් සමග උතුරු මැද පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව ආරම්භකර අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙක සඳහා සහකාර කොමසාරිස් කාර්යාල දෙකක් ද ආරම්භකර පාලන කටයුතු සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුව මගින් සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් විනිවිදභාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට හා ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම.

## පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වෙනි පරිච්ඡේදය අනුව කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇත.ඒ හා සමාන බලතල අනුව පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවද පිහිටුවා ඇත. තවද, 1987 ට පෙර මධ්‍යම රජය යටතේ පැවති මෙම දෙපාර්තමේන්තු දෙක පළාත් සභා පිහිටුවීමෙන් පසුව පළාත් සභාව යටතට බලය පවරන ලදී. එසේ පළාත් සභා පිහිටුවීමෙන් පසුව 2003 වර්ෂයේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තු හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව එක්කොට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් මෙම දෙපාර්තමේන්තුව ස්ථාපනය කර ඇත.

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 02 න් සමන්විත වේ. මෙම දෙපාර්තමේන්තුව 1987 අංක 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අංක 42 පළාත් සභා ලැයිස්තුවේ 29.2 වගන්තිය යටතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. කෘෂිකර්ම හා සත්ත්ව පාලන අමාත්‍යාංශය වෙනම ඒකකයක් වශයෙන් පිහිටුවා තිබුණි.

මෙම දෙපාර්තමේන්තුව 1987 වර්ෂයේ සිට අනුරාධපුර කච්චේරි භූමිය සහ පොළොන්නරුව දිස්ත්‍රික් කච්චේරි භූමිය තුළ ආරම්භ වී අනුරාධපුර පළාත් කාර්යාලය වශයෙන් ද පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයක් වශයෙන් ද පිහිටුවිය.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 29 ක් ආවරණය වන පරිදි බල ප්‍රදේශය විශාල වීමත්, කාර්යය බහුල වීමත් නිසා 1989 ජුනි 01 වන දින වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත විය. පළාතේ ක්‍රීඩා පරිපාලනය හා සංවර්ධන කටයුතුවලට ශක්තිමත් දායකත්වයක් ලබා දීමේ අරමුණින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ සල්ගාදු ක්‍රීඩාංගන භූමියේ 2004 අප්‍රේල් 27 වන දින සිට නව පරිපාලන ගොඩනැගිල්ලක් ස්ථාපිත කරන ලදි. එතැන් සිට අද දක්වා පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව එම භූමියේ පිහිටා තිබේ.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වනුයේ උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හා සහජ දක්ෂතාවලින් හෙබි ග්‍රාමීය මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගනිමින් ඔවුනට මනා ක්‍රීඩා පුහුණුවක් ලබාදීම,හඳුනා ගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම හා යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ජාතික හා ජාත්‍යන්තරය ජය ගත හැකි ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් බිහි කිරිමයි.

## පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාතේ ලියාපදිංචිකර ඇති වාහන සඳහා පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් හෝ පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ආදායම් බලපත්‍රය ලබා ගැනීමට e-RL -1 වැඩ සටහන යටතේ කටයුතු කර ඇත. මෙය තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ලංකාවේ ඕනෑම පළාතකින් තම වාහනය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට හැකිවන පරිදි, වාහන ආදායම් බලපත්‍ර ලබාදීමේ මෘදුකාංගය වැඩිදියුණු කර ඇත.

2020 වසරේදී e-RL -11 අදියර ක්‍රියාත්මක කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය වසර හතරක ව්‍යාපෘතියක් ලෙස සැලසුම් කර ඇති අතර, දැනටමත් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත.

## සමූපකාර සේවක කොමිෂන් සභාව.

1994 අංක 09 දරණ ප්‍රඥප්තිය අනුව (NCP/PC/FC/4/4/ප්‍රඥප්තිය /2 හා 1996.01.19 දිනැති ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි) උතුරු මැද පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත. එම ප්‍රඥප්තියට අනුව රෙගුලාසි සකස් කර ගැසට් පත්‍රයේ පළ කරන තෙක් ,1972 අංක 12 දරණ සමූපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි අනුව කටයුතු කිරිමට උතුරු මැද පළාත් සමූපකාර අමාත්‍යාංශ ලේකම්ගේ 1994.10.03 දිනැති ලිපියෙන් ලබාදී ඇති අනුමැතිය අනුව මෙහි කටයුතු අරඹා ඇත. 1994 අංක 09 දරණ උතුරු මැද පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යටතේ වූ රෙගුලාසි 1273/8 – 2003/01/27 දින දරන විශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත.

## කර්මාන්ත සංවර්ධන අධිකාරිය.

2003 දෙසැම්බර් මස 11 වන දින 2003 අංක 2 දරණ උතුරු මැද පළාතේ කර්මාන්ත සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය මගින් ආරම්භ කරන ලදි. ඒ අනුව පළාතේ සියළුම නව කර්මාන්ත බිහි කිරිම සහ පවත්නා කර්මාන්තවල ප්‍රවර්ධනයක් ඇති කිරිම, මෙම අධිකාරියේ අරමුණ වේ.

## මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පළාත් සභාවලට ලැබී ඇති බලතල මත පළාත තුළ පොදු ප්‍රවාහන කටයුතු නියාමනය කිරීම සඳහා උතුරු මැද පළාත් සභාව මගින් 1994 අංක 8 දරණ ප්‍රඥප්තිය සම්පාදනය කර අනුමත කර ඇත. එසේ අනුමත කරන ලද ප්‍රඥප්තිය මගින් ලැබී ඇති බලය මත 2000.01.01 දින සිට උතුරු මැද පළාත් මගී ප්‍රවාහන අධිකාරිය ස්ථාපිත කර ඇත.එතැන් සිට ඉහත ප්‍රඥප්තියට අනුව පොදු මගී ප්‍රවාහන කටයුතු නියාමනය කරන ලදී. ඉහත ප්‍රඥප්තියේ යම් යම් අඩුපාඩුකම් පැවති හෙයින් 2014 පෙබරවාරි මස අංක 1850

දරණ අංක 03 දරණ සංශෝධිත ප්‍රඥප්තියක් ඇති කර ඒ තුළින් අධිකාරියේ, පාලන අධිකාරියේ පාලන ව්‍යුහයද මගී ප්‍රවාහනය යන්න වෙනස්කර භාණ්ඩ හා වෙනත් ප්‍රවාහන යනුවෙන් සංශෝධනය කර මේ දක්වා ක්‍රියාත්මක වේ.

මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය අරමුණ වනුයේ බස් රථ, ත්‍රී රෝද රථ ඇතුළු මගී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය, ආරක්ෂිත හා ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම, බස්නැවතුම්පල කළමනාකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය ආදී කරුණු ප්‍රධාන වන අතර එමගින් ජාතික ආර්ථිකයට මනා දායකත්වයක් ලබා දෙයි.

## ආදායම් බලපත්‍ර නිකුත් කරන ලද වාහන සංඛ්‍යාව

| වාහන | 2015 | 2016 | 2018 |
|---|---|---|---|
| යතුරු පැදි | 193,774 | 211,301 | 221618 |
| ත්‍රිවීල් | 56,413 | 58,961 | 55096 |
| බස් | 924 | 878 | 722 |
| ලොරි | 120,610 | 11,941 | 11343 |
| ද්වි කාර්ය වාහන | 21,174 | 23,602 | 23335 |
| විශේෂ කාර්ය වාහන | 18 | 62 | 02 |
| අවමංගල / ගිලන් රථ | 17 | 12 | 10 |
| කාර් | 16,181 | 18,454 | 19450 |
| මෝටර් කෝච් | 809 | 915 | 1030 |
| ඉඩම් වාහන | 9,443 | 10,871 | 8450 |
| ට්‍රේලර් | - | 329 | 2189 |
| **එකතුව** | **419,363** | **337,326** | **343245** |

## ප්‍රවාහන තොරතුරු - අනුරාධපුර දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොලවල් (14) | සංසරණය වන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණය වන මගීන් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| අනුරාධපුර (පැරණි) | 90 | 2,700 |
| අනුරාධපුර (නව) | 65 | 1,950 |
| අනුරාධපුර (දුර සේවා) | 175 | 5,250 |
| කැකිරාව | 50 | 1,500 |
| තඹුත්තේගම | 50 | 1,500 |
| ගල්නෑව | 30 | 900 |
| ගල්කිරියාගම | 9 | 200 |
| හොරොව්පොතාන | 30 | 900 |
| කහටගස්දිගිලිය | 19 | 570 |
| මිහින්තලේ | 70 | 1300 |
| මැදවච්චිය | 12 | 360 |
| කැබිතිගොල්ලෑව | 50 | 1,000 |
| නොච්චියාගම | 35 | 1,050 |
| ගලෙන්බිඳුණුවැව | 35 | 1,050 |
| **එකතුව** | **720** | **20,230** |

**උප බස් නැවතුම්පොළවල් - 13**

පොළොන්නරුව දිස්ත්‍රික්කය

| ප්‍රධාන බස් නැවතුම්පොළවල් (8) | සංසරණයවන බස් රථ ප්‍රමාණය (දිනකට) | සංසරණයවන මගින් ප්‍රමාණය (දිනකට) |
|---|---|---|
| හිඟුරක්ගොඩ | 69 | 2,700 |
| කදුරුවෙල | 220 | 6,600 |
| මැදිරිගිරිය | 16 | 480 |
| බකමූණ | 18 | 540 |
| වැලිකන්ද | 09 | 270 |
| සිරිපුර | 40 | 500 |
| මින්නේරිය | 105 | 950 |
| **එකතුව** | **477** | **12,040** |

උප බස් නැවතුම්පොළවල් - 09

## ලියාපදිංචි ප්‍රවාහන සේවා පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| 1 | මගී ප්‍රවාහන බස් රථ | 770 |
| 2 | පාසැල් ප්‍රවාහන බස් රථ | 14 |
| 3 | සිසු සැරිය බස් රථ | 98 |
| 4 | භාණ්ඩ ප්‍රවාහන රථ | 56 |
| 5 | ත්‍රී රෝද රථ | 1800 |
| 6 | කාර්යාල සේවා බස් රථ | 02 |

## දැක්ම

"අභිමානවත් සමාජයක්, ඉසුරුමත් පළාතක්."

## මෙහෙවර

"ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර වෙළෙඳ හා ආහාර සහ කර්මාන්ත අංශ සඳහා සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ආයතන නිසි පරිදි නියාමනය කිරීම".

## දිගුකාලීන අරමුණු

- මහජන සේවාවන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේ ආයතන පද්ධතියක් ඇති කිරීම.
- තෘප්තිමත් පාරිභෝගික හා වෙළඳ ප්‍රජාවක් ඇති කිරීම.
- පළාතේ තරුණ තරුණියන් සඳහා වෘත්තීමය රැකියා අවස්ථා ළඟා කර දීම හා ඔවුන්ගේ යහගුණ ආකල්ප සංවර්ධනය කිරීම.
- පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය තුළින් කර්මාන්තකරුවන්ගේ ආර්ථිකමය හැකියාවන් වර්ධනය හා ව්‍යාපාරික කටයුතු ප්‍රවර්ධනය කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ආහාර භාවිතයේ වැදගත්කම පිළිබඳ ජනතාව තුළ නිවැරදි මතයක් නිර්මාණය කිරීම.
- රැකියා විරහිතව සිටින තරුණ ප්‍රජාව සඳහා රැකියා ඉලක්ක කර ගනිමින් පළාතේ තරුණ ප්‍රජාව තුළ ගුණාත්මක ආකල්ප සංවර්ධනය කිරීම.
- ආහාර නිෂ්පාදකයින් හඳුනා ගැනීම හා අභිප්‍රේරණය කිරීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්

වෙළඳ ආහාර සහ යෞවන කටයුතු විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පළාත තුල සිදු කරනු ලබන ව්‍යාපෘති මගින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම.

ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ආයතනික කටයුතු මෙහෙය වීමෙන් සංවර්ධන ව්‍යාපෘතිවල අපේක්ෂිත අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම මගින් පළාතේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

## අංශය නියෝජනය කරන තිරසර සංවර්ධන අරමුණු

| දරිද්‍රතාවයෙන් තොරවීම | නීරෝගි බව සහ යහපැවැත්ම | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය | වගකීමෙන් යුතු පාරිභෝජනය සහ නිෂ්පාදනය |
|---|---|---|---|




## කාර්යය මණ්ඩල සංයුතිය - 2021

ආයතතයේ අනුමත සේවක සංඛ්‍යාව 37ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 32 කි. පුරප්පාඩු සංඛ්‍යාව 05 ක් වේ.

## මූලධන වියදම් - 2021

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජන (%) |
|---|---|---|---|---|
| 1.ගෘහ භාන්ඩ හා කාර්යාලීය උපකරණ | 1.91 | 1.91 | - | 100% |
| 2.යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 0.09 | 0.09 | - | 100% |
| **එකතුව** | **2.00** | **2.00** | **-** | **100%** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

1. ගුණ ගරුක විනයගරුක නීතිගරුක සමාජයක් -සමාජ ආරක්ෂණය සහ සුභසාධනය- සංවර්ධන ක්‍රියාවලියේ අතුරුඵලයක් ලෙස ඇතිවන සමාජ අසමානතාව හැදින්විය හැක්කේ පුද්ගල අනුබද්ධ ගැටළුවකට වඩා සමාජීය ගැටළුවක් ලෙසයි.ආර්ථික වශයෙන් රටක් කොතරම් සංවර්ධනයක් අත්පත් කර ගත්ත ද සමාජ අසමානතාව ඉහළ මට්ටමක පවතින්නේ නම් එහි අර්ථය එම රටේ විශාල පිරිසක් අසරණභාවයට සහ අනාරක්ෂිත තත්වයට පත් වී ඇති බවය.රජයක වගකිම ඒ සියළු දෙනා ආරක්ෂා කිරීමයි.

2. ජනතා කේන්ද්‍රීය ආර්ථිකය - පොදු ජන ජීවන සහන දිළිදු බව තුරන් කිරීම ඉලක්ක කර ගත් වැඩ පිළිවෙළක් ග්‍රාමීය හා නාගරික ආර්ථිකයන් තුළ ක්‍රියාත්මක වන විවධ ආර්ථික ක්ෂේත්‍රයන් සීඝ්‍රයෙන් දියුණු කිරීම මගින් ජීවනෝපාය මාර්ග බහුල කෙරේ.

## ශඳුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්වයන් පිළිබඳව විග්‍රහය.

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • මැටි භාණ්ඩ සඳහා වෙළෙඳපොළ ඉල්ලුම ඉහල යාම<br>• මාටි භාන්ඩවල පවත්නා සෞඛ්‍ය ආරක්ෂිත බව<br>• ප්‍රජා දායකත්වය 10% දක්වා අඩු වීම | • දැව සහ මැටි ලබා ගැනීමේ දී පවත්නා නීතිමය ගැටළු |
| **අවස්ථා** | **තර්ජන** |
| • ආදේශික ආනයනික භාණ්ඩ සඳහා සීමා පැනවීම | • වයඹ පළාතේ මැටි භාණ්ඩ මෙම පළාත තුළ අලෙවි කිරීම |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අනුව අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

### 01.වෙළඳ සහ ආහාර

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1.1 | මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන්ගේ ධාරිතා සංවර්ධනය | මැටි කර්මාන්ත කරුවන් ගණන<br>1.විදුලි සකපෝරු | - | 09 |
| | | 2. විදුලි මැටි අඹරන යන්ත්‍ර | - | 42 |

### 02.තරුණ කටයුතු

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1.1 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගැනීම | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගත් ප්‍රමාණය<br>1.කබඩ් | - | 14 |
| | | 2.ලැප්ටොප් | - | 03 |
| | | 3.ඩෙක්ස්ටොප් | - | 02 |
| | | 4.UPS | - | 18 |
| | | 5.PRINTERS | - | 09 |
| | | 6.බහු කාර්යය මුද්‍රන යන්ත්‍ර | - | 01 |
| 1.2 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගත් ප්‍රමාණය | | 01 |

## එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 1 | මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන්ගේ ධාරිතා සංවර්ධනය | මැටි කර්මාන්ත කරුවන් ගණන | 51 | 100% |
| 2 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගැනීම | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගත් ප්‍රමාණය | 47 | 100% |
| 3 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගත් ප්‍රමාණය | 01 | 100% |

## ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ළඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරණ ලද ව්‍යාපෘති | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්කය | ළඟා වීම | | | |
| 1 | මැටි කර්මාන්ත කරුවන් ගණන | 51 | 100% | මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන්ගේ ධාරිතා සංවර්ධනය | 2.96 | 51 |
| 2 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගත් ප්‍රමාණය | 47 | 100% | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගැනීම | 1.91 | 47 |
| 3 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගත් ප්‍රමාණය | 01 | 100% | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම | 0.08 | 01 |

## මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන් සඳහා නවීන උපකරන ලබා දීම (2021)

I. විදුලි සකපෝරු ලබා දීම -09



II. විදුලි මැටි අඹරන යන්ත්‍ර ලබා දීම -42



## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ළගාවීම

| අනු අංකය | ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් | වෙන් කල (රු.මි) | වැය කල (රු.මි) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|
| 01. | මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන්ගේ ධාරිතා සංවර්ධනය | 51 | 3.0 | 2.96 | 100% |
| 02. | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගැනීම | 47 | 1.91 | 1.91 | 100% |
| 03. | යන්ත්‍ර හා යන්තෝපකරණ මිල දී ගැනීම | 01 | 0.08 | 0.08 | 100% |

## ආයතනයේ කාර්ය සාධන දර්ශක- ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශකය (නිමවුම) | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%)ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| 01.මැටි ආශ්‍රිත කර්මාන්ත කරුවන් ප්‍රමාණය | 100% | | |
| 02.ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දී ගත් ප්‍රමාණය | 100% | | |
| 03.යන්ත්‍ර හා යන්තෝපකරණ මිල දී ගත් ප්‍රමාණය | 100% | | |

2021 වර්ෂයේ පළාතේ දේශීය කර්මාන්ත කරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් යටතේ මැටි ආශ්‍රිත නිෂ්පාදන සිදු කෙරෙන තිරප්පනය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පණ්ඩිත රඹෑව ගම්මානය, තලාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මැහිඇල්ලෑව ගම්මානය හා පොළොන්නරුව දිඹුලාගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයඉහළවැව යන ගම්මාන සඳහා විදුලි සකපෝරු 09 ,විදුලි මැටි අඹරන යන්ත්‍ර 42 ක් ලබා දෙන ලදී.

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

මැටි කර්මාන්ත කරුවන් සඳහා උපකරණ ලබා දීමේ දී සැලසුම් කල ව්‍යාපෘතිය සඳහා අනුමත ප්‍රතිපාදන සියල්ල ලබා දීම මහත් ශක්තියක් වූ අතර තෝරාගත් සියළු කර්මාන්තකරුවන් සාම්ප්‍රදායික උපකරණ මගින් සිය නිෂ්පාදන සිදුකරගෙන යාම මෙම ව්‍යාපෘතිය සඳහා හොද අවස්ථාවක් විය.

මෙහිදී එම උපකරණ මිල දී ගැනීම සඳහා මිල ගණන් ලබා ගැනීමේ දී අභියෝග රැසකට මුහුන දීමට සිදු විය.විශේෂයෙන් විදුලි උපකරණ හා යකඩ මිල ගණන් ඉහලයාම හේතුවෙන් නිෂ්පාදකයින් වෙනස් වන මිල ගණන් යටතේ මිල ගණන් ලබා දීමට ඉදිරිපත් නොවූ අතර නැවත මිල ගණන් කැදවීමට සිදු වූ අතර කෙසේ හෝ මෙහි දී තෝරාගත් ප්‍රතිලාභීන් සියල්ල සඳහා විදුලි සකපෝරු සහ මැටි අඹරන යන්ත්‍ර යලබා දීමට හැකිවීම අමාත්‍යංශය ලද ජයග්‍රහන ලෙස සලකමු.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 01.සියලු තැන්හි පවතින සෑම ආකාරයටම දුගී බව අවසන් කිරීම. | මැටි කර්මාන්තකරුවන් සඳහා මැටි ඇඹරුම් යන්ත්‍ර 42 ක් හා විදුලි සකපෝරු 09 ක් ලබාදීම | මැටි කර්මාන්තකරුවන් ගේ අවශ්‍යතා හඳුනාගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුව මැටි කර්මාන්තකරුවන් ගේ නිශ්පාදනය ඉහල දැමීම සඳහා නවීන තාක්ෂණික උපකරණ ලබා දීම. | ඉලක්ක කල පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කයේ පණ්ඩිත රඹෑව මැටි කර්මාන්ත ගම්මානය සඳහා මැටි ඇඹරුම් යන්ත්‍ර 42 ක් විදුලි සකපෝරු ලබා දීමට කටයුතු කිරීම හා පොලොන්නරු දිස්ත්‍රික්කයේ දිඹුලාගල ඉහලවැව ග්‍රාමය සඳහා විදුලි සකපෝරුවක් ලබා දීම. | - | - | 100% |
| 08.සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය | කාර්යාල නිළධාරීන්ගේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | අමාත්‍යාංශයේ සියලුම නිළධාරින් රාජකාරි ඉටුකිරීමට අවශ්‍ය ගෘහ හා කාර්යාල උපකරන අවශ්‍ය නිර්මාණය කර ඒ දැනුම ප්‍රසංපාදන මාර්ගෝපදේස අනුගමනය කරගනිමින් අදාල භාණ්ඩ හා උපකරණ ලබා දිමට කටයුතු කිරීම. | ඉලක්කගත කල පරිදි නිළධාරීන් සඳහා ගොනු රාක්ක, පරිගණක | - | - | 100% |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

කොවිඩ් 19 වසංගතය පැවතිය ද 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත තිබූ සංවර්ධන ව්‍යාපෘති නිශ්චිත කාල පරාසයක් තුළ අවසන් කිරීමට හැකි විය.

# 9.1.සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සේවා ජාලය

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| විවිධ සේවා | 17 | 09 | 26 |
| පාරිභෝගික සමිති | 02 | - | 02 |
| සමූපකාර බැංකු | 3 | - | 3 |
| කෘෂිකාර්මික | 1 | - | 1 |
| සත්ත්ව නිෂ්පාදන - කිරි | 3 | 1 | 4 |
| ධීවර | 2 | 4 | 6 |
| කර්මාන්ත | 1 | 1 | 2 |
| කම්කරු | - | 1 | 1 |
| තරුණ සේවා | - | 1 | 1 |
| සුභසාධන | - | 1 | 1 |
| වෙනත් ප්‍රාථමික | - | 1 | 1 |
| සේවක සංඛ්‍යාව | 711 | 606 | 1,317 |
| සාමාජික සංඛ්‍යාව | 166,706 | 130,773 | 297,479 |
| ඉන්ධනහල් | 7 | 11 | 18 |
| කෝප් සිටි | 14 | 13 | 27 |
| මිනි කෝප් සිටි | 49 | 38 | 87 |
| මෙගා කෝප් සිටි | 03 | 01 | 04 |
| ග්‍රාමීය බැංකු | 106 | 40 | 146 |
| සණස සංගම් | 70 | 43 | 113 |

## දෙපාර්තමේන්තු නියාමනය යටතේ පවතින ආයතන

| ආයතනය | ප්‍රමාණය |
|---|---|
| සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාල | 02 |
| මානව සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය | 01 |
| සමූපකාර ශ්‍රවණාගාරය | 01 |
| සී/ස විවිධ සේවා සමූපකාර සමිති | 26 |
| සී/ස කෘෂිකාර්මික සමූපකාර සමිති | 01 |
| සී/ස කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිති | 05 |
| සී/ස ධිවර සමූපකාර සමිති | 02 |
| සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමූපකාර සමිති | 111 |
| සී/ස පේෂ කර්මාන්ත සමූපකාර සමිති | 01 |
| සී/ස කර්මාන්ත සමූපකාර සමිති | 02 |
| දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල | 02 |
| පළාත් සමූපකාර සමිති සංගම් | 02 |
| ස.ණ.ස සංගම් | 01 |
| පාසල් සමූපකාර සමිති | 04 |

1930 වසරේ ආරම්භ වූ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 1988 පළාත් සභා විෂයක් වශයෙන් විමධ්‍ය ගත වී තිබුණි. උතුරු මැද පළාතේ අනුරාධපුර සහ පොළොන්නරුව වශයෙන් පරිපාලන දිස්ත්‍රික්ක 02 යටතේ සහකාර කොමසාරිස් කාර්යාල 02ක්ද, අංක 352, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර යන ස්ථානයේ උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටා ඇත. සමුපකාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 02 කි.

| ව්‍යවස්ථාපිත කටයුතු | කළමනාකරණ කාර්යන් |
| --- | --- |
| • සමිති ලියාපදිංචිය, ඒකාබද්ධ හා විබද්ධ කිරීම අතුරු ව්‍යවස්ථා සංශෝධනය, ප්‍රාදේශික කාරක සභා ඇතුළු නිළවරණ, මහ සභා, කාරක සභා කැඳවීම ලියාපදිංචි අවලංගු කිරීම, තීරක කටයුතු හා උසාවි බල ගැන්වීම, සමුපකාර සමිති විගණනය | • පාලක මණ්ඩල පත් කිරීම්, දේපල පිළිබඳ අනුමැතිය, ණය ආයෝජන අනුමැතිය, උපරිම ණය සීමා තීරණය, අයවැය ගිණුම්කරණ අධීක්ෂණය සාමාන්‍ය හා විශේෂ විභාග පැවැත්වීම, කළමනාකරණ උපදෙස් හා අධ්‍යාපනය ලබා දීම. |

විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමට පෙර සමුපකාර ග්‍රාමීය ජනතාවගේ මූලික අවශ්‍යතා සඳහා මැදිහත්කරුවකු වශයෙන් විශාල කර්යභාරයක් ඉටුකරමින් ජනතාවට සමීප වෙමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කරගෙන සිටි අතර, විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දීමෙන් පසු විවෘත වූ වෙළඳ ලෝකය තුළ එම ව්‍යාපාරයන් සමඟ තරඟ කිරීමට සිදුවීමෙන් වර්තමානයේ යම් තරමකින් පසුබෑමකට ලක්ව ඇත. එදා මෙදාතුර සමුපකාර ජාලය තුළ ලියාපදිංචි සමුපකාර සමිති සියල්ල අධීක්ෂණය හා නියාමනය මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලැබේ. වර්තමානයේ විවෘත වෙළඳපළ සමග තරඟ කරමින්, පාරිභෝගික ජනතාවට සහන සැලසීමටත් ගොවි ජනතාවට සහන සැලසීමේ අරමුණින් රජයේ මැදිහත් විම මත කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම, ගබඩා කිරිම හා නිමි ආහාර සැකසීමේ කාර්යයන්වල නියලෙමින් සිටින අතර, ඒ තුළින් නැවත සමුපකාර ව්‍යාපාර ශක්තිමත් කිරීමේ කර්තව්‍ය සඳහා සමුපකාර දෙපාර්තමේන්තුව දායකත්වය හා මඟපෙන්වීම සිදු කරනු ලැබේ.

## දැක්ම

"තිරසර සමුපකාර ව්‍යවසායක්, සෞභාග්‍යමත් සමාජයක්"

## මෙහෙවර

"සමුපකාර ක්‍රමය හා එම ජාලය ශක්තිමත් කිරීම සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන්, විනිවිදභාවයෙන් යුක්තව සහ සමුපකාර සංකල්පවලට, ප්‍රතිපත්තිවලට මුල්තැන දෙමින් සංවර්ධනය කිරීම."

## අරමුණු

**සමාජය තුළ සමුපකාර දර්ශනය පදනම් කරගත් ව්‍යවසායකත්ව ප්‍රචලිත කිරීම.**

- උතුරු මැද පළාතේ ජනතාව වෙත සමුපකාර දර්ශනය පදනම් කරගත් ව්‍යාවසාය ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා සානුබල සැපයීම පළාත් සභාව පිළිගත් සමුපකාර ප්‍රතිපත්ති හා සාරධර්ම ආරක්ෂා වන ආකාරයට පළාත තුල ලියාපදිංචි සමුපකාර සමිති සංවිධාන සංවර්ධන කාර්ය සඳහා දායක කර ගැනීම. සමාජයේ පොදු ආර්ථික සමාජීය සංස්කෘතික අවශ්‍යතා හා වුවමනා ඉටු කර ගැනීම සඳහා යොදා ගත හැකි හොඳම විකල්පය ලෙස සමුපකාර ව්‍යාවසාය ක්‍රමය ප්‍රචලිත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

**සමුපකාර ජාලය ශක්තිමත් කිරීම**

- පළාතේ සමුපකාර සමිති සතු ග්‍රාමීය බැංකු ශාඛා ජාලය විධිමත් කර ජනතාව වඩාත් සිත් ගන්නා සුළු ආකාරයට, විනිවිද භාවයකින් යුක්තව සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායයකින් දිරි ගැන්වීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට අපේක්ෂා කරන අතර 2020 වර්ෂය වන විට සියළු ග්‍රාමීය බැංකු පරිගණක ගත කිරීම අවසන් කිරීමට කටයුතු කිරීම හා එමඟින් පළාතේ සමුපකාර ව්‍යවසාය ක්‍රමය ප්‍රචලිත කිරීමට හා විශ්වාසනීය බව තහවුරු කිරීමට මහෝපකාරී වනවා ඇත.

**යහපාලන කටයුතු සංවර්ධනය.**

- උතුරු මැද පළාතේ සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථාව වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම.
- සමුපකාර සමිතිවල අධ්‍යක්ෂවරුන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම.
- සමුපකාර අරමුදල වියදම් කිරීම සඳහා රෙගුලාසි මාලාවක් යාවත්කාලීන කිරීම.
- කොමසාරිස්වරයා විසින් පත් කරන අධ්‍යක්ෂවරුන් සඳහා සුදුසුකම් නියම කිරීම.
- සමුපකාර සමිතිවල තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කිරීම සඳහා සෑම විවිධ සේවා සමුපකාර සමිතියක් සඳහාම තොරතුරු නිළධාරියෙකු පත්කිරීම.

## දිගුකාලීන අරමුණු

**දිගුකාලීන අරමුණු** → උතුරු මැද පළාත් සමුපකාර ව්‍යාපාර තුළින් පොදු මහජනතාවට ඵලදායී සේවාවක් සපයමින් තිරසර සංවර්ධනයට දායකත්වය සැපයීම.

## කෙටිකාලීන අරමුණු

උතුරු මැද පළාත් සමුපකාර ව්‍යාපාර තුලින් පොදු මහජනතාවට ඵලදායීතාවයක් සපයමින් තිරසාර සංවර්ධනයට දායකත්වය සැපයීම.

## ප්‍රධාන කාර්යයන්

- නව සමුපකාර සමිති පිහිටුවීම.
- සමුපකාර සමිති ප්‍රති සංවිධානය කිරීම.
- ග්‍රාමීය බැංකු පරිගණක ගත කිරීම.
- නවීන අලෙවිකරණ ක්‍රමවේදයන් හඳුන්වාදීම.
- සමුපකාර සමිති විගණනය කිරීම.
- සමුපකාර සමිති ප්‍රඥප්තිය සංශෝධනය කිරීම.
- ආරවුල් බේරුම්කරණය.
- යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

01. පළාතේ පාරිභෝගික ජනතාවට සහන මිලට ද්‍රව්‍ය සැපයීම.

02. පළාතේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් ඇති කිරීම මගින් ගොවීන්ට සහන සැලසීම.

03. පළාතේ ජනතාවට සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 178ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 105 කි. පුරප්පාඩු සංඛ්‍යාව 73ක් වේ.

## මූලධන වියදම් - 2021

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. යන්ත්‍ර සූත්‍ර සවි කිරීම හා උපකරණ | 1 | 1 | - | 100% |
| 2.වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම | 39.5 | 38.55 | 0.95 | 97% |
| **එකතුව** | 40.5 | 39.55 | 0.95 | 97% |

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තියමය ගමන් මග

1. ජනතා කේන්ද්‍රීය ආර්ථිකය - පොදු ජන ජීවන සහන

දිළිඳු බව තුරන් කිරීම ඉලක්ක කර ගත් වැඩ පිළිවෙළක් ග්‍රාමීය හා නාගරික ආර්ථිකයන් තුළ ක්‍රියාත්මක වන විවධ ආර්ථික ක්ෂේත්‍රයන් සීඝ්‍රයෙන් දියුණු කිරීම මගින් ජීවනෝපාය මාර්ග බහුල කෙරේ.

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය

| | |
|---|---|
| **ශක්තීන්**<br>➢ සහභාගීත්ව ප්‍රවේශය<br>➢ විවිධ අංශ පිළිබඳ දැනුම තිබීම<br>➢ උපායමාර්ගික පිහිටීම<br>➢ කැපවීමෙන් මහන්සියෙන් වැඩ කරන දක්ෂ දක්ෂ කාර්ය මණ්ඩලයක් සිටීම<br>➢ හොඳ පිලිගැනීමක්,ධනාත්මක ප්‍රතිරූපයක් හා පිලිගත් වෙළඳ නාමයක් තිබීම<br>➢ අත්දැකීම් ලත් දක්ෂ කාර්යමණ්ඩලයක් ඇත | **දුර්වලතා**<br>➢ මූල්‍ය හැකියාව සාපේක්ෂව අවම වීම<br>➢ තාක්ෂණික දැනුම සාපේක්ෂව අවම වීම<br>➢ තොරතුරු තාක්ෂණය සාපේක්ෂව අවම වීම<br>➢ කළමණාකරණ හැකියාව සාපේක්ෂව අවම වීම<br>➢ විවිධාංගීකරණය දුර්වල වීම<br>➢ අලෙවිකරණ සංකල්ප වල භාවිතය අවම වීම<br>➢ යටිතල පහසුකම් අවම වීම<br>➢ වංචා දූෂණ තිබීම |
| **අවස්ථා**<br>➢ පුළුල් කිරීම සඳහා භාවිතා නොකළ විශාල ප්‍රදේශයක් තිබීම<br>➢ විවිධාංගීකරණ අවස්ථා තිබීම<br>➢ සමුපකාර එකිනෙක සම්බන්ධ වීම<br>➢ සමුපකාර කෙරෙහි ඇති විශ්වාසය<br>➢ රජයේ සහයෝගය | **තර්ජන**<br>➢ විවිධ සේවා සමුපකාර සමිති වල ක්‍රියාකාරකම් සඳහා දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන් සෘජුවම බලපෑම් කිරීම<br>➢ රජයේ නීති රීති හා රෙගුලාසි<br>➢ පෞද්ගලික අංශයේ හා අනෙකුත් තරඟකාරී සමිති වල ක්‍රියාකාරකම් සෘජුවම බලපෑම් කිරීම<br>➢ තාක්ෂණය වෙනස් වීම<br>➢ මෙහෙයුම් ජාලය කුඩාවීම |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක

සංරචකය (component) 01 - Strengthening Co-operative societies to enhance service delivery - සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා සමුපකාර සමිති ශක්තිමත් කිරීම.

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1.1 | සමුපකාර සේවා සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම | ➢ සාමාජික සංඛ්‍යාව<br>➢ සමුපකාර සමිති වල ශුද්ධ ලාභය(මිලියන)<br>➢ සමුපකාර සමිති වල වාර්ෂික පිරිවැටුම(මිලියන)<br>➢ වැඩි වූ ආදායම<br>➢ පාරිභෝගික තෘප්තිය<br>➢ සේවක තෘප්තිය | 269981<br>43.46<br>7210.04 | 297900<br>52.81<br>8763.83 |

සංරචකය(component) 02 Capacity development for planning and management-සැලසුම් සහ කළමණාකරණය සඳහා ධාරිතා සංවර්ධනය

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 2.1 | සමුපකාර දෙපාර්තමේන්තුව | ➢ වාර්තා වල ගුණාත්මක බව<br>➢ සේවක කාර්ය සාධනය | 60%<br>60% | 80%<br>80% |

## එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය(නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 1.1 | සමුපකාර සේවා සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම | වාර්ෂික ආදායම් මට්ටම 10%කින් වැඩි කිරීම<br>සමුපකාර සේවකයන්ගේ අධ්‍යාපන මට්ටම 15%කින් වැඩි කිරීම | 10%<br>15% | 10%<br>15% |
| 2.1 | සමුපකාර දෙපාර්තමේන්තුව | කාර්යාල කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා 20% ක ධාරිතාවක් වර්ධනය කිරීම | 20% | 20% |

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟවීම | | | |
| 01 | වාර්ෂික ආදායම් මට්ටම 10%කින් වැඩි කිරීම | 10% | 10% | 1.තෝරාගත් සමුපකාර ප්‍රාදේශික නවීකරණය කිරීම | 29.84 | 100000 |
| | | | | 2.තෝරාගත් සමුපකාර ගබඩා නවීකරණය කිරීම | 7.20 | 80000 |
| | සමුපකාර සේවකයන්ගේ අධ්‍යාපන මට්ටම 15%කින් වැඩි කිරීම | 15% | 15% | 3.අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | 1.5 | 600 |
| 02. | කාර්යාල ක්‍රියාකාරකම් වල කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා 20% ක ධාරිතාවක් වර්ධනය කිරීම | 20% | 20% | කාර්යාල උපකරණ මිලදී ගැනීම | 1.00 | 105 |

සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට පෙර



සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමෙන් පසු



**සී/ස හුරුළුවැව වි.සේ.ස සමිතියට අයත් මරදන්කල්ල සමුපකාර ප්‍රාදේශීකය නවීකරණය කිරීමට පෙර**



**සී/ස හුරුළුවැව වි.සේ.ස සමිතියට අයත් මරදන්කල්ල සමුපකාර ප්‍රාදේශීකය නවීකරණය කිරීමෙන් පසු**



**සී/ස පොළොන්නරුව වි.සේ.ස සමිතියට අයත් ගල්ලැල්ල සමුපකාර ප්‍රාදේශීකය නවීකරණය කිරීමට පෙර**



**සී/ස පොළොන්නරුව වි.සේ.ස සමිතියට අයත් ගල්ලැල්ල සමුපකාර ප්‍රාදේශීකය නවීකරණය කිරීමෙන් පසු**



**සී/ස කවුඩුල්ල වි.සේ.ස සමිතියට අයත් කවුඩුල්ල සමුපකාර ප්‍රාදේශීකය නවීකරණය කිරීමෙන් පසු**



**සී/ස කවුඩුල්ල වි.සේ.ස සමිතියට අයත් කවුඩුල්ල සමුපකාර ප්‍රාදේශීකය නවීකරණය කිරීමට පෙර**



සී/ස හුරුළුවැව වි.සේ.ස සමිතියට අයත් කුරුන්දන්කුලම ගබඩාව නවීකරණය කිරීමට පෙර



සී/ස හුරුළුවැව වි.සේ.ස සමිතියට අයත් කුරුන්දන්කුලම ගබඩාව නවීකරණය කිරීමට පසු



## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම

- තෝරාගත් සමුපකාර ප්‍රාදේශික 26 ක් මිලියන 29.84 වැයකර නවීකරණය කිරීම.
- තෝරාගත් සමුපකාර ශාඛා 05 ක් මිලියන 7.2 ක් වැයකර නවීකරණය කිරීම.
- අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල ගොඩනැගිල්ල මිලියන 1.5 ක් වැයකර අළුත්වැඩියා කිරීම.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක-ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමැවුම්) | වර්ෂය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| 1. විගණන යාවත්කාලීන කිරීම | | 85% | |
| 2. විගණනයෙන් අනාවරණය වන ඌණතා ලේඛනය සමිති වෙත යැවීම | | | 60% |
| 3.තෝරා ගත් සමුපකාර ප්‍රාදේශික නවීකරණය | 100% | | |
| 4. තෝරා ගත් සමුපකාර ශාඛා නවීකරණය | 100% | | |
| 5.අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලයේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම | 100% | | |
| 6. නිළධාරීන්,සමුපකාර සේවකයන් හා සමුපකාර නායකයින් දැනුවත් කිරීම | | | 70% |
| 7. සංශෝධිත ප්‍රඥප්තිය කෙටුම්පත් කිරීම | 100% | | |
| 8. කෙටුම්පත අනුමත කර ගැනීම. | | | 50% |
| 9. තීරකකරණය මගින් ආරවුල් බේරුම්කරණය | 90% | | |
| 10. 59 වගන්තිය අනුව උසාවි බල ගැන්වීම | 100% | | |
| 11. අභියාචනා විභාග කිරීම | | 80% | |
| 12. පොත්පත් සහ විගණන යාවත්කාලීන කිරීම | | 82% | |
| 13. අක්‍රිය තත්වයේ පවතින පාසල්,ධීවර,කර්මාන්ත හා ස.ණ.ස.සමිති දැනුවත් කිරීම | | | 55% |
| 14. නව කාරක සභා පත්කර ක්‍රියාකාරි තත්වයට පත්කිරීම | 100% | | |
| 15. සත්ව නිෂ්පාදන සමුපකාර සමිති | | | 40% |
| 16. මහා වාරිමාර්ග හා මධ්‍ය වාරිමාර්ග කෘෂි නිෂ්පාදන අලෙවි සමුපකාර සමිති | | | |
| 17. ශ්‍රම ඵලදායිතා සමුපකාර සංවර්ධන සමිති | 100% | | |

## අත්පත් කරගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්

අනුරාධපුර දිස්ත්‍රික්කයේ විගණන 173 ක් හා තීරක තීන්දු ලබාදීම 499 ක් ලබා දී ඇති අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විගණන 103 ක් හා තීරක තීන්දු 555 ක් වශයෙන් මුළු විගණන 276 ක් හා තීරක තීන්දු 1054 ක් ලබාදීමට හැකියාව ලැබී ඇත.පොළොන්නරු දිස්ත්‍රික්කයේ සමුපකාර ප්‍රාදේශික 09 ක් හා ශාඛා 02 ක් ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමුපකාර ප්‍රාදේශික 17 ක් හා ශාඛා 03 ක් ද නවීකරණය කිරීමට හැකි විය.

## අංශය නියෝජනය වන තිරසාර සංවර්ධන අරමුණු(SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය

සමුපකාර ගබඩා, ප්‍රාදේශීක නවීකරණයේදී මෙන්ම කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී අභියෝග රැසකට මුහුන දීමට සිදු විය.විශේෂයෙන් සිමෙන්ති,යකඩ,ටයිල් හිඟවීම මත ඉදිකිරීම් ප්‍රමාදයන් සිදු වූ අතර කෙසේ හෝ මෙහි දී තෝරාගත් ප්‍රාදේශීක ගබඩා සියල්ල නවීකරණය කිරීමට හැකිවීම සමුපකාර දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහන ලෙස සැලකිය හැක.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2001 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වෙමින් පවත්නා සියළුම ආකාරයේ දරිද්‍රතාවයන් තුරන් කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සහ විශ්වාසය තැබිය හැකි ක්‍රමවේද සම්පාදනය කිරීම සඳහා වැඩි දියුණු කරන ලද සංවර්ධන සහයෝගිතාව ඇතුළු විවිධ වූ මූලාශ්‍රයන් මගින් සම්පත් ලබාදීම කැපී පෙනෙන ආකාරයෙන් වර්ධනය කිරීම | ඵලදායිත්වය වැඩි දියුණු කිරීම | දෙපාර්තමේන්තු නිළධාරින්ගේ සෞඛ්‍ය පහසුකම් ඉහල නැංවීම තුලින් සේවා කාර්යක්ෂමතාවය (සේවක තෘප්තිය ) ඇති කිරීම | - | - | 55% | - |
| | | දෙපාර්තමේන්තු නිළධාරින්ගේ සේවා කාර්යක්ෂමතාවය (සේවක තෘප්තිය ) ඇති කිරීම | - | - | - | 98% |
| | | දෙපාර්තමේන්තු නිළධාරින්ගේ ආරක්ෂාව සහතික කිරීම | - | 50% | - | - |
| 2021 වර්ෂයේ දී සමුපකාර ක්ෂේත්‍රයේ විගණන යාවත්කාලීන කිරීම හා සංවර්ධන කටයුතු මෙහෙයවීම | උතුරු මැද පළාත තුල දියුණු සමුපකාර සංවර්ධන ක්‍රමයක් බිහිවීම තුල රැකියා විසඳුමක් ලබාදීම | 2021වර්ෂය අවසාන වන විට උතුරු මැද පළාත තුල තාක්ෂණික දැනුමැති විගණන සමුපකාර සංවර්ධන නිලධාරින් බිහි කිරීම | සමුපකාර සංවර්ධන නිලධාරින් සඳහා විගණන තාක්ෂණය පිළිබඳ වැඩ සටහන | - | 60% | - |
| 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින්ගේ,විශේෂ යෙන්ම කාන්තාවන්ගේ,ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ ධිවරයින්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව සහ ආදායම,ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්,අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්,දැනුම,මූල්‍ය සේවා, වෙළඳපොල සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපල නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබාදීම මගින් දෙගුණ කිරීම. | ස්ත්‍රී පුරුෂ භාවය සහ ස්වදේශික මට්ටම අනුව සුළු පරිමාණ ආහාර නිශ්පාදකයන් ගේ සාමාන්‍ය ආදායම | සමුපකාර ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම | සමුපකාර ගබඩා හා ප්‍රාදේශික නවීකරණය කිරීම | - | - | 90% |

## තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ලද ජයග්‍රහණ එම ජයග්‍රහණ ලබා ගැනීමට ආයතනය සතු වූ ශක්තීන් හා අවස්ථාද එම ජයග්‍රහණ ලබා ගැනීමට ආයතනය මුහුණ දුන් අභියෝග ද එම ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූයේ නම් ඒ සඳහා බලපෑ දුර්වලතා හා තර්ජන

අනුරාධපුර දිස්ත්‍රික් සමුපකාර මණ්ඩලය අළුත්වැඩියා කිරීම,පොළොන්නරු දිස්ත්‍රික්කයේ සමුපකාර ප්‍රාදේශික 09 ක් හා ගබඩා 02 ක් ද අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමුපකාර ප්‍රාදේශික 17 ක් හා ගබඩා 03 ක් ද නවීකරණය කර ජනතා අයිතියට පත් කිරීම අනෙකුත් වර්ෂ වලට සාපේක්ෂව අප ලද විශාල ජයග්‍රහණයකි.

කොරෝනා තත්වය මත සේවක ප්‍රවාහන ගැටළු මතු වූ අතර,සිමෙන්ති,යකඩ,ටයිල් ,කම්බි වැනි ඉදිකිරීම් භාණ්ඩ හිඟ වීම නිසා ඉදිකිරීම් කටයුතු නොයෙක් වර නැවතීම හා ප්‍රමාද වීම. වැනි අභියෝග සමුපකාර ලේකම්තුමාගේ නිසි මඟ පෙන්වීම මත හා විවිධ සේවා සමුපකාර සමිති විසින්ම නවීකරණ කොන්ත්‍රාත් සිදු කිරීම, සමුපකාර සේවකයන්ගේ කාර්යක්ෂමතාවය වැනි දෙපාර්තමේන්තු ශක්තීන් නිසි ලෙස කළමණාකරණය තුලින් භාණ්ඩ හිඟයකින් තොරව බෙදා හැරීමේ යාන්ත්‍රණයට සමුපකාර ප්‍රාදේශික දායකත්වය ඉහල යෑමේ අවස්ථාව උපයෝගී කර ගනිමින් නවීකරණය කරන ලද ප්‍රාදේශික, ගබඩා සාර්ථකව ජනසතු කරන ලදී.

## වෙනත් රේඛිය අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණ කෙටිකාලීන/ දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කල (රු.මි.) | වැය කළ (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 01 | විජයපුර විවිත් මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම | සී/ස නුවරකලාවිය ජේෂ කාර්මිකයින් ගේ සමුපකාර සමිතියට අයත් විජයපුර විවිත් මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරීම | 0.15 | 0.15 | 100% | 100% | නවීකරණය වූ විජයපුර විවිත් මධ්‍යස්ථානය |

## පවතින කොවිඩ් වසංගත තත්ත්ව හමුවේ මහජනතාව වෙත ලබා දුන් සේවාවන්

| අනු අංක | ලබා දුන් සේවාවන් | ක්‍රියාත්මක කරන ලද ස්ථානය | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|
| 01 | අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම සඳහා නියාමන කටයුතු සිදු කිරීම | උතුරු මැද පළාත තුල සමුපකාර සමිති වලට අයත් බලප්‍රදේශය | 50000 |
| 02 | ජංගම රථ මඟින් නිවාස වෙත ඇනවුම් සඳහා භාණ්ඩ සැපයීම | සමිති බල ප්‍රදේශය | 9000 |
| 03 | නිරෝධායනය වූ සමිති සේවකයන්ට වියලි ආහාර මල්ලක් ලබා දීම | සමිති බල ප්‍රදේශය තුළ | 400 |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණු දුන් ගැටළු හා දුෂ්කරතා

රාජ්‍ය නිලධාරීන්ට හා කාර්ය මණ්ඩල වලට කොරෝනා වැලදීම නිසා රාජ්‍ය ආයතන වරින් වර වැසීම සිදු වු බැවින් ඉදිකිරීම් ඇස්තමේන්තු ලබා ගැනීමට ප්‍රමාද වීම සෘජුවම සංවර්ධන ව්‍යාපෘති ආරම්භය ප්‍රමාද කිරීමට හේතු වු අතර, සේවක නිරෝධායන ගැටළු, සේවක ප්‍රවාහන ගැටළු මත බලාපොරොත්තු වු පරිදි නියමිත දිනයන්හි ගිවිසුම් ගත වී ව්‍යාපෘති ආරම්භ කිරීමේ ගැටළු මතු වන ලදී. කොරෝනා තත්වය මත පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි බැවින් එම ව්‍යාපෘති අවලංගු කිරීමට සිදු වන ලදී. සිමෙන්ති, යකඩ, ටයිල්, කම්බි වැනි ඉදිකිරීම් භාණ්ඩ හිඟ වීම නිසා ඉදිකිරීම් කටයුතු නොයෙක් වර නැවතීම හා ප්‍රමාද වීම වැනි ගැටළු වලට මුහුණ පෑමට සිදු වු අතර සමුපකාර ලේකම්තුමාගේ නිසි මඟ පෙන්වීම මත හා විවිධ සේවා සමුපකාර සමිති සඳහා නවීකරණ කොන්ත්‍රාත්තු ප්‍රධානය කිරීම, කාර්යමණ්ඩල ප්‍රවාහනය සඳහා දෙපාර්තමේන්තුවෙන් පහසුකම් සැපයීම,අවම කාර්ය මණ්ඩලය මනා කළමණාකරණයෙන් යුතුව හා කාර්යක්ෂමව යෙදවීම තුලින් ප්‍රමාද වු ගිවිසුම් ගත වීම් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනමින් ආරම්භ කර වර්ෂ අවසානය වන විට සියළුම ඉදි කිරීම් හා මිලදී ගැනීම් ව්‍යාපෘති සාර්ථකව නිම කිරීමට හැකි විය.

# 9.2.පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

## කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පසුබිම.

උතුරු මැද පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයට දායකත්වය සැපයීමට උතුරු මැද පළාත සතුව 2003 වර්ෂයට පෙර පේෂකර්ම දෙපාර්තමේන්තුව හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යනුවෙන් ආයතන 02ක් පැවති අතර 2003 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව විසින් ගත් තීරණයක ප්‍රතිඵලයක් වශයෙන් ඉහත සඳහන් දෙපාර්තමේන්තු 02 ඒකාබද්ධ කොට පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් නව දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබී ය. ඉන් පසු එකී එක් එක් දෙපාර්තමේන්තු යටතේ පාලනය වූ සියලුම අංශයන්හී පාලනය, අධීක්ෂණය සහ විවිධ අංශයන් සඳහා පහසුකම් සැපයීම යනාදි කාර්යයන් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරන ලදි. නව ආයතනයේ ප්‍රධාන පරමාර්ථයන් කිහිපයකි.

එක් එක් ආයතනයේ නිෂ්පාදන අංශ කළමනාකරණය කිරීම මගින් උතුරු මැද පළාත් සභාවට සැලකිය යුතු ආදායමක් එකතු කිරීම හා එම ආයතනවල එක් එක් අංශ මගින් උතුරු මැද පළාතේ වෙසෙන තරුණ තරුණියන්හට වෘත්තීය පුහුණුව ලබාදීම ඒ අතර ප්‍රමුඛ පරමාර්ථයක් බවට පත්ව ඇත.

උතුරු මැද පළාත තුළ අපතේ යන ශ්‍රමය ඵලදායීව යොදවා ගනිමින් නිර්මාණශීලීව ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් සංවර්ධනය කරලීම, ස්වයං රැකියා අවස්ථා උදා කරලීම, දැනට ක්ෂත්‍රයේ සිටින කණ්ඩායම්වල තාක්ෂණික සහ ව්‍යවසායකත්ව හැකියාවන් ප්‍රවර්ධනය කිරීම නව ස්වයං රැකියා අවස්ථා සඳහා ඔවුන්ව යොමු කිරිමට අවශ්‍ය මූලික පදනම සැකසීම සහ සමාජීය සංවර්ධනය ඇති කරලීම සහ ඊට අවශ්‍ය සේවා සපයන්නෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. එමගින් හස්ත කර්මාන්ත, පේෂ කර්මාන්ත වඩු කර්මාන්ත යන ප්‍රධාන අංශ 03ක් යටතේ දේශීය දළ ජාතික නිෂ්පාදන කාර්යට උර දෙමින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා විවිධ කාර්යයන් රැසක් මෙම දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබයි.

මෙකී අරමුණු ඉටුකර ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන 41ක් සහ වඩු කර්මාන්ත මධ්‍යස්ථාන 10ක් පළාත පුරා ස්ථාපනය කර ඇත. මීට අමතරව ග්‍රාමීය මට්ටමේ කර්මාන්ත සහ හස්ත කර්මාන්ත අංශය නගාසිටුවීම සඳහා විවිධ පුහුණු වැඩසටහන් සහ නිෂ්පාදනයේ ගුණාත්මක බව වර්ධනය කිරිම සඳහා අවශ්‍ය තාක්ෂණ කුසලතා හා ප්‍රාග්ධන උපකරණ ලබා දීමෙන් ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමට කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මහගු කාර්ය භාරයක් ඉටු කරයි.

මෙම දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය පුරවැසියන්ට අමතරව රාජ්‍ය ආයතන හා ව්‍යාපාරික ප්‍රජාව සඳහා ද පහත සඳහන් සේවාවන් සපයමින් සිය කාර්යභාරය තව දුරටත් පුළුල් කර ඇත.

- ❖ ව්‍යාපාරිකයින්ට සිය නිෂ්පාදන කාර්යන් සඳහා අවශ්‍යවන වඩු කාර්මික නිෂ්පාදන ලබා දීම සහ වෘත්තීය පුහුණුවක් සහිත වඩු කාර්මිකයින් තම ව්‍යාපාර කටයුතු සඳහා නිෂ්පාදකයින් ලෙස යොදා ගැනීමට හැකි වන අවස්ථා විවර කරදීම.

- ❖ නව නිෂ්පාදන සඳහා පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කිරිමෙහිලා වාර්ෂිකව පවත්වනු ලබන ප්‍රදර්ශනවලදි ව්‍යාපාරික ප්‍රජාවට සහභාගි වීමේ අවස්ථා ලබා දීම.

| දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන ආයතන | | |
|---|---|---|
| අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන | - | 27 |
| පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන | - | 14 |
| අනුරාධපුර අලෙවි මධ්‍යස්ථාන | - | 03 |
| පොළොන්නරුව අලෙවි මධ්‍යස්ථාන | - | 01 |

**අනුරාධපුර පේෂකර්ම මධ්‍යස්ථාන - 27**

| | |
|---|---|
| නොච්චියාගම | පල්ලේකාගම |
| මුදිතාගම | වලච්චේගම |
| රළපනාව | මානෑව |
| පණ්ඩුලගම | කලාකරඹෑව |
| පෙරිමියන්කුලම | හිරිපිටියාගම |
| කටුකෑලියාව | නෙළුඹෑව |
| රුවන්ගම | කල්පේ |
| පුබ්බෝගම | 21 ජනපදය |
| මානේරුව | ගෝමරන්කල්ල |
| නෙළුම්පත්ගම | හුරුළු නිකවැව |
| රාජාංගනය | තිරප්පනේ |
| රඹෑව | මාමිනියාව |
| දෙමටගල | හුරිගස්වැව |
| නාමල්පුර | |

**පොළොන්නරුව පේෂකර්ම මධ්‍යස්ථාන - 14**

| | |
|---|---|
| පත්තිනි පෙදෙසගම | බුද්ධයාය |
| නෙළුම්විල | අතරගල්ලෑව |
| කඩවලවැව | අත්තනකඩවලවැව |
| බෝ අත්ත | අරලගන්විල |
| හිඟුරක්දමන | පැරකුම් |
| රජඇලගම | බැදිවැව |
| පුලතිසිගම | තල්පොත |

**අලෙවි මධ්‍යස්ථාන - 04**

කඩ පනහ - අනුරාධපුර
කච්චේරිය - අනුරාධපුර
තිරප්පනේ - අනුරාධපුර
රජ ඇලගම - පොළොන්නරුව

## අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්ක දෙකේ පිහිටි වඩු පාසල්

| අ.අ | වඩු පාසල | ස්ථානය |
|---|---|---|
| | අනුරාධපුර දිස්ත්‍රික්කය | |
| 1 | සෙලෙස්තිමඩුව යාන්ත්‍රික වඩු පාසල | නාච්චාදූව |
| 2 | කලාවැව යාන්ත්‍රික වඩු පාසල | ඉපලෝගම |
| 3 | නොච්චියාගම යාන්ත්‍රික වඩු පාසල | නොච්චියාගම |
| 4 | කැකිරාව යාන්ත්‍රික වඩු පාසල | කැකිරාව |
| 5 | ගලෙන්බිඳුණුවැව යාන්ත්‍රික වඩු පාසල | ගලෙන්බිඳුණුවැව |
| 6 | මානිංගමුව යාන්ත්‍රික වඩු පාසල | මානිංගමුව |
| 7 | ඒරියාගම දැව තාක්ෂණ උසස් පුහුණු ආයතනය | තලාව |
| | පොළොන්නරුව දිස්ත්‍රික්කය | |
| 8 | ඔරුබැදිසියඹලාව යාන්ත්‍රික වඩු පාසල | ඇලහැර |
| 9 | ගිරිපොකුණ යාන්ත්‍රික වඩු පාසල | දිඹුලාගල |
| 10 | මැදිරිගිරිය යාන්ත්‍රික වඩු පාසල | මැදිරිගිරිය |

## දැක්ම

"නිර්මාණශීලි කර්මාන්ත ප්‍රජාවක්, අභිමානවත් පළාතක්".

## මෙහෙවර

"කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත්, ආයෝජන, නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා, පර්යේෂණ හා සංවර්ධන, සියළු පාර්ශ්වකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව ප්‍රවර්ධනය කිරීම.

## දිගුකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නිෂ්පාදනය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම තුළින් ජාතික නිෂ්පාදනයට කරනු ලබන්නා වූ දායකත්වය ඉහළ නංවාලීම හා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවාලීම.

## කෙටිකාලීන අරමුණු

උතුරු මැද පළාතේ හස්ත කර්මාන්ත, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ශිල්පීන්හට රැකියා අවස්ථා සලසා දීම හා ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ජාතික ප්‍රමිති තත්ත්වයට නංවාලීම හා පවත්නා නිෂ්පාදන අලෙවි ආදායම් මට්ටම ඉහළ නැංවීම හා වැඩිකිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ❖ කර්මාන්ත ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය.
- ❖ කර්මාන්ත අංශයේ ආයෝජන ප්‍රවර්ධනය.
- ❖ නිෂ්පාදන හා වෙළඳපළ අවස්ථා සංවර්ධනය.
- ❖ පර්යේෂණ හා සංවර්ධනය.
- ❖ ආයතනික ධාරිතා සංවර්ධනය.
- ❖ යහපාලනය.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ හස්ත කර්මාන්තය, පේෂ කර්මාන්ත හා වඩු කර්මාන්ත යන අංශවල කර්මාන්තකරුවන් හා ශිල්පීන් සඳහා නව තාක්ෂණය පිළිබඳ පුහුණුව ලබා දීමෙන් ගුණාත්මක නිර්මාණ හා නිෂ්පාදන එළිදැක්වීමට කටයුතු කිරීම.
- ❖ ස්වයං රැකියාවන්ට යොමු කිරීමට අවශ්‍ය ප්‍රාග්ධන ආධාර ලබා දී අලෙවි පහසුකම් ද සලසා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම.

## කාර්ය මණ්ඩල තොරතුරු - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 139ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 112 කි. පුරප්පාඩු සංඛ්‍යාව 29 ක් වේ.

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ

<u>සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත</u>

**“ වඩු කර්මාන්තය, වේවැල් කර්මාන්තය,පන් කර්මාන්තය ආශ්‍රිතව පවතින අමු ද්‍රව්‍ය ගැටලුවට පිළියමක් ලෙස වගා සමුපකාර ක්‍රමයක් යටතේ ඌන භාවිත රජයේ ඉඩම්වල දිගු කාලීන බදු පදනමක් යටතේ එකී අමුද්‍රව්‍ය වගා කර ගැනීමට අවස්ථාව සහ දිරිගැන්වීම ලබා දෙනු ලැබේ.”**

1. පේෂකර්මාන්ත අංශය හා වඩු කර්මාන්ත අංශය සඳහා පුහුණු ශ්‍රමිකයන් බඳවා ගැනීම තුලින් ඵලදායී පුරවැසියෙක් - කුසලතා පූර්ණ මානව සම්පතක් රටට බිහි කිරීම
2. ග්‍රාමීය වශයෙන් ස්වයං රැකියා සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් රැකියා වෙළඳපොළ තුළ කාන්තා දායකත්වය ඉහළ නැංවීම
3. රටෙහි තිරසාර පැවැත්ම උදෙසා ද්විතීක අධ්‍යාපනය අවසන් කරන සිසුන් වඩු කර්මාන්තයට යොමු කිරීම උදෙසා අදාල මූලික දැනුම හා උපකරණ කට්ටල ලබාදීම
4. දේශීය ආර්ථිකය නංවාලීම උදෙසා දේශීය නිෂ්පාදන භාවිතය ප්‍රවර්ධනය
5. පරිසර හිතකාමී නිෂ්පාදන බිහි කිරීම හා ඒවා භාවිතයට මහජනයා දිරි ගැන්වීම

## අංශය පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

2021 වර්ෂයට ලැබුණු ප්‍රතිපාදනවලට අනුව සකස්කර දුන් පහසුකම් අනුව පේෂකර්ම මධ්‍යස්ථාන 32 ක්ද, වඩු මධ්‍යස්ථාන 06 ක් ද, නවීකරණය කිරීම හා යටිතල පහසුකම් සැපයීම කරන ලදී.කාර්යක්ෂමව වැඩකිරිමට සුදුසු වාතාවරණයක් සලසා දිම හේතුවෙන් හා වඩු කර්මාන්ත ශිල්පීන් සඳහා ප්‍රාග්ධන උපකරණ සැපයීම හේතුවෙන් විවිධ සම්මාන හා කුසලතා හිමිකර ගැනීමට හැකිවිය. මෙහිදී ඌන උපයෝජනයකින් තොරව එක් ව්‍යාපෘතියක් හැර අනිකුත් ව්‍යාපෘතින් 100%කින් නිම කිරීමට මෙම වර්ෂයේදී හැකිවිය. වඩු කර්මාන්ත අංශය පිළිබඳ සලකා බැලීමේදී උසස් පුහුණු පාඨමාලාව ආරම්භ කිරීම හරහා වඩු කර්මාන්තයට පිවිසෙන්නන් හට අත්වැලක් ලබා දීමට හැකි විය. තවද උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පාසල් ඩෙස් පුටු නිෂ්පාදනය මෙම දෙපාර්තමේන්තුවේ වඩු පාසල් හරහා සිදු කිරීම තුලින් පළාතෙහි මුදල් පළාත තුළම උපයෝජනය කිරිමටත් එමගින් පුහුණුලාභීන්ට හා කාර්මිකයන්ට හොඳ ආදායමක් උපයා ගැනීමටත් අවස්ථාව සැලසිනි. පෙර වර්ෂ සමඟ සසදා බැලිමේදි 2021 වර්ෂයේ වඩු කර්මාන්තයේ ඉහළ ප්‍රගතියක් කරා ළගා විමට හැකි විය.අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලැබුණු ප්‍රතිපාදන යටතේ පාසල් සඳහා අවශ්‍ය ඩෙස් පුටු විශාල සංඛ්‍යාවක් සාදා නිම කිරිමට එම වර්ෂය තුළ අපට හැකි විය.එහිදි ලැබුණු ආදායම රු.155,566,300.00කට ආසන්න ප්‍රමාණයකි.පේෂ කර්ම අංශයෙහි ද පසුගිය වර්ෂයට සාපේක්ෂව නිෂ්පාදන ප්‍රමාණය සහ අලෙවි ආදායම ඉහළ නංවා ගැනීමට හැකිවිය.

කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේදි මෙන්ම 2021 වර්ෂයේද රජරට විස්කම් ප්‍රදර්ශනය පැවැත්විමට නොහැකි විය.නමුත් 2020 වර්ෂයේ මෙන්ම මෙවරද නිර්මාණ භාර ගෙන පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධික්ෂණය යටතේ විස්කම් පියස ගොඩනැගිල්ල තුලදි එහි විනිශ්චය කටයුතු සිදු කරන ලදි. මෙහිදි පේෂ කර්මාන්ත සහ හස්ත කර්මාන්ත අංශවල තරඟ පවත්වන ලද අතර එම තරඟවලට අනුව 2021 වර්ෂයේ බතික්,අත්යන්ත්‍ර රෙදි හා දේශිය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය

අමාත්‍යාංශය මඟින් පවත්වන ලද අන්තර් පළාත් ජාතික අත්‍යන්ත්‍ර රෙදි පිළි තරඟයේදී 04වන ස්ථානය ලබා ගැනිමට අප දෙපාර්තමේන්තුවට හැකි විය. මෙයට අමතරව හස්ත කර්මාන්ත අංශයේද විශාල ජයග්‍රහණ රාශියක් ලබා ගැනිමට අවස්ථාව උදා විය. එහිදි

| | |
|---|---|
| රජත සම්මාන | 01 |
| ප්‍රථම ස්ථාන | 08 |
| දෙවන ස්ථාන | 05 |
| තෙවන ස්ථාන | 05 |
| කුසලතා | 24 |

ආදි වශයෙන් ජයග්‍රහණ හිමි විය.

මෙම සියලු ජයග්‍රහණ මෙන්ම ඉලක්ක කරා ළගා විමේදි මුහුණ දිමට සිදු වු අභියෝගද රැසකි.වර්තමාන මිල ගණන්වල සිදු වු වැඩි විම් හේතුවෙන් අමුද්‍රව්‍ය ලබා ගැනිමේදි විවිධ අපහසුතාවලට මුහුණ දිමට සිදු විය. තව ද බොහෝ කටයුතු කරගෙන යාමේදි අමු ද්‍රව්‍යවල හිඟතාවයද ගැටළුකාරි තත්ත්වයක් විය.

මෙයට අමතරව කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මුහුණ දිමට සිදු වු අභියෝගද රාශියකි. කොවිඩ් ආසාදිත විම හේතුවෙන් සේවකයින් කාර්යාලය වෙත පැමිනිමේ අඩුවක් දක්නට ලැබුණු අතර විවිධ කාර්යන් සඳහා සේවකයින් යොදවා ගැනිමේ අපහසුතා මතු විය. කාර්ය සාධනය කරා ළගා වීමේදි විවිධ ගැටළු හා අභියෝගවලට මුහුණ දුන්න ද පළාත් නිශ්චිත හා පළාත් සභා සංවර්ධන ප්‍රධාන යටතේ සමස්ත සම්පත් උපයෝජනයේ ප්‍රගතිය පිළිබඳව සැලකීමේදී ලබාදුන් ප්‍රතිපාදන මත ව්‍යාපෘති 52 ක් ක්‍රියාත්මක කරන ලද අතර සමස්ත මූල්‍ය ප්‍රගතිය 95% ක් හා භෞතික ප්‍රගතිය 95% කට ආසන්න විය. මුදල් රෙගුලාසි ආයතන සංග්‍රහ සහ කාර්ය පටිපාටික රීති අනුගමනය කරමින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක කරා ලඟා වූ වසරක් ලෙස මෙම වසර නම් කළ හැක.

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

**සංරචකය 01. වඩු කර්මාන්තය,පේෂ කර්මාන්තය සහ හස්ත කර්මාන්තය සංවර්ධනය කිරිම**

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | පාදම (2015) | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 09. සියලු දෙනාම අන්තර්ගත වන්නාවූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයිමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම | ගුණාත්මක බව වැඩි දියුණු කිරිම | අත්යන්ත්‍ර මධ්‍යස්ථානවල නිෂ්පාදනයේ වාර්ෂික ආදායම | - | 100% |
| | | වඩු පුහුණු මධ්‍යස්ථානවල නිෂ්පාදනයේ වාර්ෂික ආදායම | - | 100% |
| | | අත්යන්ත්‍ර මධ්‍යස්ථානවල නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරිම | - | 100% |
| | | වඩු මධ්‍යස්ථානවල නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරිම | - | 100% |
| | වෙළඳපළ සංවර්ධනය | අත්යන්ත්‍ර, හස්ත සහ වඩු කර්මාන්ත මධ්‍යස්ථානවල නවෝත්පාදන නිෂ්පාදන කිරිම | - | 100% |
| | | පාරිභෝගික ආකර්ෂණය වැඩිදියුණු කිරිම | - | 100% |

**සංරචකය 02. කුසලතා හා වෘත්තිය සංවර්ධනය**

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | පාදම (2015) | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 09. සියලු දෙනාම අන්තර්ගත වන්නාවූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම | වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන වෙළඳපොල ඉල්ලුම සපුරාලීම සඳහා වැඩි දියුණු කිරීම | වඩු මධ්‍යස්ථානවල පුහුණු කරනු ලබන පුහුණුකරුවන් සංඛ්‍යාව | - | 100% |
| | | වඩු මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාවය | - | 100% |
| | ව්‍යවසායකත්ව සංවර්ධනය | නව ව්‍යවසායකයින් සංඛයාව | - | 100% |
| | | පුහුණු ව්‍යවසායකයින් සංඛ්‍යාව | - | 100% |

**සංරචකය 03. සැලසුම් සහ කළමනාකරණ සංවර්ධනය**

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය(නිමැවුම්) | පාදම (2015) | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 09. සියලු දෙනාම අන්තර්ගත වන්නාවූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයිමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම. | රාජ්‍ය ආයතනවල ධාරිතා සංවර්ධනය | කාර්යාල කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරිම | - | 100% |
| | | කාර්යාලය සඳහා නව තාක්ෂණික භාවිතය වැඩි දියුණු කිරිම. | - | 100% |

## ඒකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යය සාධන දර්ශකවල ඉලක්ක ළඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ඉලක්ක | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01. | සෙලෙස්තිමඩුව වඩු පුහුණු මධ්‍යස්ථානය සඳහා නේවාසිකාගාරයක් ඉදි කිරීම | නේවාසිකාගාර ගොඩනැගිල්ල | 100% | 100% |
| 02 | පළාත් අධ්‍යක්ෂකගේ නිල නිවසේ වැට , ගේට්ටුව හා වහලය අළුත්වැඩියා කිරීම | වැට,ගේට්ටුව සහ වහලය | 100% | 100% |
| 03 | පොළොන්නරුව උප කාර්යාලය අළුත්වැඩියා කිරීම | කාර්යාල ගොඩනැගිල්ල | 100% | 100% |
| 04 | විස්කම් පියස ගොඩනැගිල්ලේ බිත්ත ආලේප කිරීම | විස්කම් පියස ගොඩනැගිල්ල | 100% | 100% |
| 05 | පේෂ කර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම | පේෂකර්ම මධ්‍යස්ථාන ගොඩනැගිල්ල | 100% | 100% |
| 06 | පේෂකර්ම මධ්‍යස්ථානවල විදුලි පද්ධති අළුත්වැඩියාව | විදුලි පද්ධතිය | 100% | 100% |
| 07 | වඩු පුහුණු මධ්‍යස්ථාන අළුත්වැඩියාව | වඩු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල | 100% | 100% |
| 08 | පේෂකර්ම මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය | පේෂකර්ම මධ්‍යස්ථානවල වැසිකිලි පද්ධතිය | 100% | 100% |
| 09 | වඩු පුහුණු මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය | වඩු මධ්‍යස්ථානවල වැසිකිලි පද්ධතිය | 100% | 100% |
| 10 | වඩු කර්මාන්ත අංශයේ පුහුණුලාභීන් වර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම හා උපකරණ සැපයීම | සපයනු ලැබු වඩු උපකරණ ප්‍රමාණය | 100% | 100% |
| 11 | වඩු කර්මාන්ත අංශය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම | මිලදී ගනු ලැබු වඩු උපකරණ ප්‍රමාණය | 100% | 100% |
| 12 | පේෂ කර්මාන්ත අංශය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම | මිලදී ගනු ලැබු යන්ත්‍ර ප්‍රමාණය | 100% | 100% |
| 13 | කාර්යාලය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | මිලදී ගනු ලැබු කාර්යාල උපකරණ ප්‍රමාණය | 100% | 100% |

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනිම සඳහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා විම | | | |
| 01 | 1.පේෂකර්ම මධ්‍යස්ථානවල විදුලි පද්ධති අළුත්වැඩියාව | 100% | 100% | 1.රජඇලගම පේෂකර්ම මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව |  0.27 | 45 |
| | | 100% | 100% | 2. හුරුළුනික වැව පේෂකර්ම මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව |  0.33 | 40 |
| | | 100% | 100% | 3.දෙමටගල පේෂකර්ම මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව | 0.24 | 30 |
| | | 100% | 100% | 4.ගෝමරන්කල්ල පේෂකර්ම මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව |  0.35 | 40 |
| 02. | වඩු පුහුණු මධ්‍යස්ථානවල විදුලි පද්ධති අළුත්වැඩියාව | 100% | 100% | 1.ඒරියාගම වඩු පුහුණු මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව |  0.66 | 70 |
| | | 100% | 100% | 2.කැකිරාව වඩු පුහුණු මධ්‍යස්ථානයේ විදුලි පද්ධතිය අළුත්වැඩියාව |  1.01 | 70 |

ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලබා කර ගැනිමට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ඉතිරි කොටස..

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා විම | | | |
| 03 | ජේෂකර්ම මධ්‍යස්ථාන බල යටතල පහසුකම් සංවර්ධනය කිරීම. | 100% | 100% | 1. රාජාංගනය ජේෂකර්ම මධ්‍යස්ථානයේ වැසිකිලි පහසුකම් සැකසිම | 0.56 | 30 |
| | | 100% | 100% | 2.හුරුළුනිකවැව ජේෂකර්ම මධ්‍යස්ථානයට නල ළිඳක් සැපයිම. | 0.22 | 30 |
| | | 100% | 100% | 3.මානේරුව ජේෂකර්ම මධ්‍යස්තානයට නල ළිඳක් සැපයිම. | 0.24 | 30 |
| | | 100% | 100% | 4.හුරුගස්වැව ජේෂකර්ම මධ්‍යස්ථානයට වැසිකිලි සහ ජල පහසුකම් සැපයිම. | 0.72 | 25 |
| | | 100% | 100% | 5.21 ජනපදය ජේෂකර්ම මධ්‍යස්ථානයේ වැට හා ගේට්ටුව සැකසීම | 0.56 | 20 |
| | | 100% | 100% | 6.කළාකරඹෑව ජේෂකර්ම මධ්‍යස්ථානයේ වැට හා ගේට්ටුව සැකසීම | 0.56 | 25 |
| | | 100% | 100% | 7. රජඇලගම ජේෂකර්ම මධ්‍යස්ථානයේ වැට හා ගේට්ටුව සැකසීම | 0.76 | 30 |
| | | 100% | 100% | 8.පෙරිමියන්කුලම ජේෂකර්ම මධ්‍යස්ථානයට ජල පහසුකම් සැපයීම | 0.10 | 25 |
| | | 100% | 100% | 9.රඹෑව ජේෂකර්ම මධ්‍යස්ථානය සඳහා ජල පහසුකම් සැපයීම | 0.29 | 45 |
| | | 100% | 100% | 10.රුවන්ගම ජේෂකර්ම මධ්‍යස්ථානයේ වැට හා ගේට්ටුව සැකසීම |  0.95 | 60 |
| | | 100% | 100% | 11.නෙළුම්විල ජේෂකර්ම මධ්‍යස්ථානයේ වැට හා ගේට්ටුව සැකසීම |  0.72 | 50 |

ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලබා කර ගැනිමට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ඉතිරි කොටස..

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා විම | | | |
| 04. | වඩු පුහුණු මධ්‍යස්ථාන සඳහා නේවාසිකාගාර ඉදි කිරීම | 100% | 100% | 1.සෙලෙස්තිමඩුව වඩු පුහුණු මධ්‍යස්ථානය සඳහා නේවාසිකාගාරයක් ඉදි කිරිම | 1.99 | 50 |
| 05. | නිල නිවෙස්වල වැට , ගේට්ටුව හා වහලය අළුත්වැඩියා කිරිම | 100% | 100% | 1.පළාත් අධ්‍යක්ෂකගේ නිල නිවසේ වැට , ගේට්ටුව හා වහලය අළුත්වැඩියා කිරිම. | 1.07 | 05 |
| 06. | කාර්යාල අළුත්වැඩියා කිරිම | 100% | 100% | 1.පොළොන්නරුව උප කාර්යාලය අළුත්වැඩියා කිරිම | 0.40 | 15 |
| 07. | කාර්යාල ගොඩනැගිලිවල තීන්ත ආලේප කිරිම | 100% | 100% | 1.විස්කම් පියස ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරිම | 1.80 | 150 |
| 08. | පේෂකර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරිම | 100% | 100% | 1.හිරිපිටියාගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 1.40 | 30 |
| | | 100% | 100% | 2.කඩවලවැව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 0.45 | 25 |
| | | 100% | 100% | 3.පුලතිසිගම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 0.69 | 20 |
| | | 100% | 100% | 4.පෙරිමියන්කුලම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 0.88 | 25 |
| | | 100% | 100% | 5.පෙරිමියන්කුලම පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 0.35 | 20 |
| | | 100% | 100% | 6.හිගුරක්දමන පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 1.02 | 65 |

ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනිමට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ඉතිරි කොටස..

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා විම | | | |
| 08. | පේෂකර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරිම | 100% | 100% | 7.රුවන්ගම පේෂකර්ම මධ්‍යස්ථානයේ වහලය සහ ගොඩනැගිලි අළුත්වැඩියා කිරිම | 1.81 | 65 |
| | | 100% | 100% | 8.අත්තනකඩවල පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 1.79 | 50 |
| | | 100% | 100% | 9.රළපනාව පේෂකර්ම මධ්‍යස්ථානයේ වහලය සහ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරිම | 1.85 | 60 |
| | | 100% | 55% | 10.කල්පේ පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 0.63 | 35 |
| | | 100% | 100% | 11.මාමිනියාව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 0.86 | 45 |
| | | 100% | 100% | 12.නෙළුම්විල පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 1.85 | 65 |
| | | 100% | 100% | 13.රඹෑව පේෂකර්ම මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 1.96 | 60 |
| | | 100% | 100% | 14.බැදිවැව පේෂකර්ම මධ්‍යස්ථානයේ මුරකුටිය අළුත්වැඩියා කිරිම | 0.47 | 20 |
| | | 100% | 100% | 15.අරලගංවිල පේෂකර්ම මධ්‍යස්ථානයේ මුරකුටිය අළුත්වැඩියා කිරිම | 0.68 | 40 |
| 09. | වඩු පුහුණු මධ්‍යස්ථාන අළුත්වැඩියාව | 100% | 100% | 1.කැකිරාව වඩු පුහුණු මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 2.02 | 60 |
| | | 100% | 100% | 2.ඔරුබැදිසියඹලාව වඩු පුහුණු මධ්‍යස්ථානය අළුත්වැඩියා කිරිම | 2.0 | 60 |

ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනිමට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ඉතිරි කොටස..

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි) | ප්‍රතිලාභින් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා විම | | | |
| 10. | වඩු පුහුණු මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය | 100% | 100% | 1.මැදිරිගිරිය වඩු මධ්‍යස්ථානය සඳහා වැට සැකසීම | 0.69 | 45 |
| 11. | පුහුණුලාභීන් වර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම හා උපකරණ සැපයීම. | 100% | 100% | වඩු කර්මාන්ත අංශයේ පුහුණුලාභීන් වර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම හා උපකරණ සැපයීම. | 1.00 | - |
| 12. | වඩු කර්මාන්ත අංශය සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 100% | 100% | 1.වඩු පුහුණු මධ්‍යස්ථාන සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 1.00 | 150 |
| | | 100% | 100% | 2.සෙලෙස්තිමඩුව වඩු පුහුණු මධ්‍යස්ථානයේ නේවාසිකාගාරය සඳහා ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම | 1.00 | 10 |
| 13. | වඩු පුහුණු මධ්‍යස්ථාන සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම | 100% | 100% | 1.වඩු පුහුණු මධ්‍යස්ථාන සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනිම | 5.80 | 150 |
| 14. | පේෂකර්ම අත්යන්ත්‍ර අළුත්වැඩියා කිරිම | 100% | 100% | 1.පේෂකර්ම අත්යන්ත්‍ර අළුත්වැඩියා කිරිම | 1.80 | 200 |
| 15. | පේෂකර්ම මධ්‍යස්ථානය සඳහා අත්යන්ත්‍ර හා උපාංග මිලදී ගැනීම | 100% | 100% | 1.පේෂකර්ම මධ්‍යස්ථානය සඳහා අත්යන්ත්‍ර හා උපාංග මිලදී ගැනීම | 3.93 | 200 |
| 16. | පේෂකර්ම අංශය සඳහා අලෙවි ප්‍රවර්ධන උපකරණ මිලදී ගැනීම | 100% | 100% | 1.පේෂකර්ම අංශය සඳහා අලෙවි ප්‍රවර්ධන උපකරණ මිලදී ගැනීම | 1.47 | 1800 |

## ආයතනයේ කාර්යය සාධන දර්ශක - ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්යය සාධන දර්ශකය | වර්ෂය තුළ සත්‍ය නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| සෙලෙස්තිමඩුව වඩු පුහුණු මධ්‍යස්ථානය සඳහා නේවාසිකාගාරයක් ඉදි කිරීම | √ | | |
| පළාත් අධ්‍යක්ෂකගේ නිල නිවසේ වැට, ගේට්ටුව හා වහලය අළුත්වැඩියා කිරීම | √ | | |
| පොළොන්නරුව උප කාර්යාලය අළුත්වැඩියා කිරීම | √ | | |
| විස්කම් පියස ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම | √ | | |
| පේෂ කර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම (රුවන්ගම, අත්තනකඩවල, රළපනාව, කල්පේ, හිරිපිටියාගම, මාමිණියාව, නෙළුම්විල, රඹෑව, බැදිවැව, අරලගංවිල, කඩවලවැව, පුලතිසිගම,පෙරිමියන්කුලම, තල්පොත) | √ | | |
| පේෂ කර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම( කල්පේ) | | | √ |
| පේෂකර්ම මධ්‍යස්ථානවල විදුලි පද්ධති අළුත්වැඩියාව ( රජඇලගම, හුරුළුනික වැව, දෙමටගල, ගෝමරන්කල්ල) | √ | | |
| වඩු පුහුණු මධ්‍යස්ථාන අළුත්වැඩියාව ( කැකිරාව, ඔරුබැදිසියඹලාව) | √ | | |
| වඩු පුහුණු මධ්‍යස්ථානවල විදුලි පද්ධති අළුත්වැඩියාව (ඒරියාගම, කැකිරාව) | √ | | |
| පේෂකර්ම මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය (රජඇලගම,රළපනාව,රාජාංගනය, හුරුළුනිකවැව,මානේරුව,හුරිගස්වැව,21ජනපදය, පෙරිමියන්කුලම,රඹෑව, රුවන්ගම, නෙළුම්විල,පැරකුම්, අතරගල්ලෑව, කළාකරඹෑව) | √ | | |
| වඩු පුහුණු මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය (මැදිරිගිරිය) | √ | | |
| වඩු කර්මාන්ත අංශයේ පුහුණුලාභීන් වර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම හා උපකරණ සැපයීම | √ | | |
| වඩු කර්මාන්ත අංශය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම | √ | | |
| පේෂ කර්මාන්ත අංශය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම | √ | | |
| කාර්යාලය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | √ | | |

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

ආයතනික අරමුණු කරා ළඟා වීමේ කාර්යය කාර්යක්ෂමව පවත්වාගෙන ගියද සඵලදායි ලෙස අපේක්ෂිත මට්ටමට පැමිණීම උදෙසා මානව සම්පත් හිඟය බලපා තිබේ.තවද පේෂකර්ම මධ්‍යස්ථාන සහ වඩු පුහුණු මධ්‍යස්ථාන දුර බැහැරව පිහිටා තිබීම හේතුවෙන් එක් ආයතනයක නිලධාරියෙකු තවත් ආයතනයක වැඩ ආවරණය කිරීම සඳහා යෙදවීම අපහසු කාර්යයක් වී ඇත.මෙයට අමතරව ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් පොලොන්නරුවේ උප කාර්යාලයේ රාජකාරි අධීක්ෂණය කිරීමේ කටයුතු ඉතා අපහසුය.

2021 වර්ෂය සඳහා පේෂකර්ම අංශයේ පුහුණු වැඩසටහන් සඳහා රු.500,000ක ප්‍රතිපාදන මුදලක් වෙන් වී තිබුනද එම වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් එම පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක නොවුනි.මෙයට අමතරව හස්ත කර්මාන්ත ශිල්පින් පුහුණු කිරීම සඳහා ද රු. 500,000ක ප්‍රතිපාදන මුදලක් වෙන්වී තිබුනද එම ව්‍යාපෘතියද කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අවලංගු විය.

## තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේදී ආයතනය මුහුණ දුන් අභියෝග

01. අනුමත වූ සංවර්ධන ව්‍යාපෘති අවලංගු වීම.

02. ඉදි කිරීම් හා අළුත්වැඩියා සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු ලබා ගැනීමට ප්‍රමාද වීම.

03. ප්‍රතිපාදන සීමා වීම නිසා ඇස්තමේන්තු සකස් කිරීමට අසීරු වීම.

04. රජයේ කාර්යාල වසා තැබීම හා සේවක සංඛ්‍යාව සීමා කිරීම හේතුවෙන් සැලසුම් අනුමත කිරීමේදී හා හැකියා සහතික ලබා ගැනීමේදී ප්‍රමාදයන් සිදු වීම.

05. පාරිභෝගිකයන්ගේ පැමිණීම අඩුවීම හේතුවෙන් අලෙවි ආදායම පහල යාම.

06. කාර්මිකාවන් මෙන්ම නිලධාරීන්ගේ සේවයට වාර්තා කිරීම අඩුවීම.

07. අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා හා ප්‍රමාද වීම මෙන්ම මිලෙහි සිදු වූ වැඩි වීම.

08. නියමිත කාල පරාසය තුලදී පාඨමාලා අවසන් කිරීමට නොහැකිවීමෙන් විභාග ආදිය නියමිත දිනයන්ට පැවැත්වීමට නොහැකි වීම.

09. වාර්ෂිකව පවත්වනු ලබන කර්මාන්ත ප්‍රදර්ශනය පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් අලෙවි ප්‍රවර්ධන කටයුතු අඩාලවීම.

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලඟා වීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්ක ලඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50%- 74% | 75%- 100% |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම | සියලු දෙනාම අන්තර්ගත වන්නාවූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්ත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම | 1.ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය හා නිෂ්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම. | 1.පේෂකර්ම මධ්‍යස්ථානවල විදුලි පද්ධති අළුත්වැඩියාව (රජඇලගම, රාජාංගනය, හුරුළුනික වැව, දෙමටගල, ගෝමරන්කල්ල) | | | √ |
| | | | 2.වඩු පුහුණු මධ්‍යස්ථානවල විදුලි පද්ධති අළුත්වැඩියාව (ඒරියාගම, කැකිරාව) | | | √ |
| | | | 3. පේෂකර්ම මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම. (රජඇලගම, රළපනාව, රාජාංගනය, හුරුළුනිකවැව, මානේරුව, හුරිගස්වැව, 21 ජනපදය, පෙරිමියන්කුලම, රඹෑව, රුවන්ගම, නෙළුම්විල, පැරකුම්, අතරගල්ලෑව, බුද්ධයාය, කළාකරඹෑව) | | | √ |
| | | | 4. වඩු පුහුණු මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම. (මැදිරිගිරිය)<br>5.වඩු කර්මාන්ත අංශය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම | | | √ |
| | විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කුඩා පරිමාණ කර්මාන්ත සහ වෙනත් ව්‍යවසායන් සඳහා මූල්‍ය සේවාවන් , ණය ලබා ගැනීමේ ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීම සහ එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොල දාමයන්ට ඒකාබද්ධ කිරීම. | සේවක කාර්යක්ෂමතාව වර්ධනය කිරීම හා පාරිභෝගික ආකර්ෂණය ඉහළ නැංවීම. | 1.පොළොන්නරුව උප කාර්යාලය අළුත්වැඩියා කිරීම. | | | √ |
| | | | 2.කාර්යාලය සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම. | | | √ |
| | | | 3.විස්කම් පියස ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම | | | √ |

හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු ඉතිරි කොටස.................

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුණට ලඟා වීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්ක ලඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 0% - 49% | 0% - 49% |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි ගැන්වීම | සංවර්ධනය වෙමින් පවත්නා රටවල දේශිය තාක්ෂණ සංවර්ධනය, පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහය ලබා දීම, එකිනෙකා අතර කර්මාන්ත වර්ගීකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය වාතාවරණයක් සැකසීම | 1. පේෂකර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියාව තුලින් එම මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම<br>2.පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කිරීම. | 1.පේෂ කර්මාන්ත අංශය සඳහා යන්ත්‍ර මිලදී ගැනීම.<br>2.පේෂ කර්ම මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරීම. (රුවන්ගම, අත්තනකඩවල, රළපනාව, කල්පේ, හිරිපිටියාගම, මාමිණියාව, නෙළුම්විල, රඹෑව, බෑදිවැව, අරලගංවිල, කඩවලවැව, පුලතිසිගම, පෙරිමියන්කුලම, තල්පොත) | | | √<br>√ |
| | | 2.වඩු මධ්‍යස්ථාන අළුත්වැඩියාව තුලින් එම මධ්‍යස්ථාන වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා පාරිභෝගික ආකර්ෂණය වර්ධනය කිරීම. | 1.වඩු පුහුණු මධ්‍යස්ථාන අළුත්වැඩියා කිරිම.<br>(කැකිරාව, ඔරුබෑදිසියඹලාව,ඒරියාගම) | | | √ |

# 9.3. කර්මාන්ත සංවර්ධන අධිකාරිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

2003 අංක 2 දරණ උතුරු මැද පළාත් ප්‍රඥප්ති ප්‍රකාරව මෙම ආයතනය ආරම්භ කර ඇත.

### දැක්ම

“උතුරු මැද පළාතේ හොඳම කර්මාන්ත ප්‍රවර්ධකයා වෙමින් තිරසාර සංවර්ධනයේ ප්‍රධානතම පහසුකම් සලසන්නා වීම”.

### මෙහෙවර

“උතුරු මැද පළාතේ සම්පත් ඵලදායි ලෙස යොදා ගනිමින් වෙළඳපොළ අභිමුඛ කාර්මීකරණයක් තුළින් අදාළ පාර්ශවකරුවන් සමඟ උතුරු මැද පළාතේ නව ව්‍යවසායකත්ව සංස්කෘතියක් බිහි කිරීම”.

### දිගුකාලීන අරමුණු

- පළාතේ කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය කිරීම.
- පළාතේ කර්මාන්ත ව්‍යාප්තිය හා නවීකරණය කිරීම.
- පළාතේ කර්මාන්ත විවිධාංගීකරණය හා දිරි ගැන්වීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම හා ඔවුන්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොළක් සොයා දීමට මැදිහත්වීම.

### කෙටිකාලීන අරමුණු

- පළාතේ නව කර්මාන්ත බිහි කිරීම සහ පවත්නා කර්මාන්තවල ප්‍රවර්ධනයක් ඇති කිරීම.
- පළාතේ නව සහ දැනට පවත්වාගෙන යනු ලබන කර්මාන්ත අධිකාරිය යටතේ ගාස්තු ප්‍රමාණයක් යටතේ ලියාපදිංචි කිරීම.
- පවතින සහ නව කර්මාන්ත සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන හා තාක්ෂණික පුහුණු පාඨමාලා පැවැත්වීම.
- පළාතේ කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම සඳහා සහන මිලකට උපකරණ ලබා දීම.
- පුහුණු කිරීම හා උපදේශන සේවා මගින් පළාතේ කර්මාන්ත ඒකකවල කළමනාකරණය වැඩි දියුණු කිරීම.
- තාක්ෂණික පැවරීම්, තාක්ෂණික තොරතුරු ලබා ගැනීම සහ බෙදා හැරීම යාවත්කාලීන කරන ලද තාක්ෂණය සහ නව තාක්ෂණය යනාදි සේවාවන් ව්‍යවසායකයින් වෙත ලබා දීම.
- කර්මාන්ත නිෂ්පාදනවල අලෙවිය පහසු කරනු වස් සම්මන්ත්‍රණ වැඩමුළු, දේශීය හා විදේශීය අලෙවි පොළවල් හා ප්‍රදර්ශන පැවැත්වීම.

### ප්‍රධාන කාර්යයන්

- ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික, ව්‍යවසායක පුහුණු හා මූල්‍ය පහසුකම්, තාක්ෂණික උපකරණ ලබාදීම.
- ව්‍යවසායක සංගම් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම.
- පළාතේ කර්මාන්තකරුවන් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිකර ගැනීම.
- කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා වෙළඳපොළ අවස්ථා හඳුන්වා දීම.
- සුළු පරිමාණ කර්මාන්තකරුවන් සඳහා සහන පොලී අනුපාතයක් යටතේ ණය ලබා දීම.

### ප්‍රධාන උපාය මාර්ගයන්

- යටිතල පහසුකම් සැලසීම.
- මූල්‍ය පහසුකම් සලසා දීම.
- ආකල්ප වර්ධනයට හා කුසලතා වර්ධනයට සුදුසු දේශකයන් යොදා ගැනීම.
- වෙළෙඳපොල අවස්ථා සලසා දීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 12ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 04 කි. පුරප්පාඩු සංඛ්‍යාව 08 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම් (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 0.1 | 0.1 | - | 100 |
| 2. යන්ත්‍ර සූත්‍ර සවිකිරීම | 0.3 | 0.28 | 0.02 | 94 |
| | 0.2 | 0.18 | 0.02 | 93 |
| උපකරණ | 1.17 | 0.87 | 0.3 | 74 |
| 4. වෙනත් මූලධන වත්කම් පුනරාවර්තනය හා වැඩිදියුණු කිරීම | 0.5* | 0.5 | - | 100 |
| **එකතුව** | **3.17** | **2.84** | **0.33** | 89 |

*** පළාත් සභාව යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය සැපයීම් කිරීම.**

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග.

01. උතුරු මැද පළාතේ ක්ෂුද්‍ර හා සුළුපරිමාණ ව්‍යවසායකයන් කේෂ්ත්‍රයේ රඳවා තැබීම සඳහා යටිතල පහසුකම් ලබාදීම.

02. ජාතික ආදායමට උතුරු මැද පළාත් කර්මාන්තකරුවන්ගේ දායකත්වය පවතින අවමභාවය වැඩිකිරීමට ප්‍රයත්නයන් දැරීම.

## ශඳුඅත විශ්ලේශණය තුළින් අංශයේ පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය.

| | |
|---|---|
| **ශක්තීන්**<br><br>1.2003 අංක 02 දරණ උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තිය යටතේ ස්ථාපනය කිරීමෙන් ලැබී ඇති නිතිමය බලය<br>2.සංවිධානයේ කළමණාකාරීත්වයට සහය වන කළමණාකරණ සහ උපදේශන මණ්ඩලය | **දුර්වලතා**<br><br>1. අනුමත කාර්ය මණ්ඩලය හෝ බඳවා ගැනීමට නොහැකි වීම.<br>2.නව ආදායම් උත්පාදන මාර්ග කරා යොමු වීමේ ප්‍රවණතාවය අඩුවීම.<br>3.ආයතනයේ අපේක්ෂිත වැඩසටහන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම.<br>4.2003 සම්මත කරන ලද මෙම ප්‍රඥප්තිය කාලානුරූපව සුදුසු වෙනස්කම් වලට භාජනය නොවීම. |
| **අවස්ථා**<br><br>1.උතුරු මැද පළාත් සභාවේ සහයෝගීතාව, දිරිගැන්වීම සහ මග පෙන්වීම.<br>2. කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා පළාතේ සුදුසු භෞතික හා මානව සම්පත් තිබීම.<br>3.පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයේ නිර්මාණශීලී පුද්ගලයින් සිටීම<br>4.පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රයේ පාරම්පරික දැනුමක් ඇති පුද්ගලයින් සීටීම.<br>5.රජයේ,රාජ්‍ය නොවන සහ කර්මාන්ත සංවර්ධනය සඳහා පිහිටුවා ඇති පුද්ගලික අංශයේ වෘත්තිය පුහුණු ආයතන පළාතේ ක්‍රියාත්මක වීම. | **තර්ජන**<br><br>1.පළාතේ දරිද්‍රතාවය.<br>2.අධිකාරියේ ප්‍රතිලාභ ලබා ගත් අය මෙන්ම බාහිර පාර්ශවකරුවන්ගේ ඇති ඍණාත්මක ආකල්ප .<br>3.කර්මාන්තකරුවන්ට රජයෙන් පනවා ඇති විවිධ අන පනත් යටතේ කටයුතු කිරීමේදී එම කාර්යයන් ඉක්මණින් ඉටු කර ගැනීමට ඇති අපහසුතාවය.<br>4.අධිකාරියට ප්‍රමාණවත් ඉඩක් සහිත කාර්යාලයක් නොමැතිකම.<br>5.අධිකාරියේ බාහිර පාර්ශවකරුවන්ගේ ඍණාත්මක ආකල්ප. |

## මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

**සංරචකය ( component ) 1. ක්ෂුද්‍ර / කුඩා කර්මාන්ත හා හස්ත කර්මාන්ත සංවර්ධනය**

**සංරචකය ( component ) 2. කුසලතා සහ වෘත්තීය සංවර්ධනය**

(ඉහත සංරචක 01 හා 02 සඳහා මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අනුව ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අපේක්ෂිත පරිදි තිරසර සංවර්ධන අරමුණු කරා ලඟා වීමට නොහැකි විය.)

**සංරචකය (component) 3. සැළසුම් හා කළමණාකරණය සංවර්ධනය කිරීම.**

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 01 | රාජ්‍ය ආයතන වල ධාරිතා සංවර්ධනය | 1. සියළුම ව්‍යාපෘති වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය | - | 60% |
| | | 2.ප්‍රමාණවත් ධාරිතා සංවර්ධනයක් ලබා ගත් නිළධාරීන් සංඛ්‍යාව | - | 5 |
| | | 3.සේවක නොපැමිණීමේ මට්ටම අඩු කිරීම. | - | 30% |

## එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්ය සාධන දර්ශක වල ඉලක්ක ලඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්)_ | ඉලක්ක | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01. | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිළදී ගැනීම. | උපකරණ සංඛ්‍යාව | 08 | 08 |
| 02. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම. | උපකරණ සංඛ්‍යාව | 04 | 04 |
| 03. | කාර්යාල අළුත්වැඩියා කිරීම. | කායීාල සංඛ්‍යාව | 01 | 01 |
| 04 | කර්මාන්ත සංවර්ධන අධිකාරි කාර්යාල ගොඩනැගිල්ල සඳහා වායු සමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීම | උපකරණ සංඛ්‍යාව | 05 | 05 |
| 05. | ලිපි කවර මිලදී ගෙන පළාත් සභාවට හා බාහිර ඉල්ලුම්කරුවන්ට සැපයීම. | ලිපි කවර ප්‍රමාණය | කවර - 189,300 | කවර - 189,300 |

## ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ලගා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | වියදම (රු.මි) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ලගාවීම | | | |
| 01 | උපකරණ සංඛ්‍යාව | 08 | 08 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිළදී ගැනීම | 186,500.00 | කාර්යාල කාර්ය මණ්ඩලය හා කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් සේවය ලබා ගැනීමට පැමිණෙන සියළුම ව්‍යවසායකයින් |
| | | 04 | 04 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම. | 282,000.00 | |
| | | 05 | 05 | කර්මාන්ත සංවර්ධන අධිකාරි කාර්යාල ගොඩනැගිල්ල සඳහා වායු සමීකරණ යන්ත්‍ර සපයා සවි කිරීම | 871,737.00 | |
| 02 | කාර්යාල සංඛ්‍යාව | 01 | 01 | කාර්යාල අළුත්වැඩියා කිරීම. | 10,08,811.00 | |
| 03 | ලිපි කවර ප්‍රමාණය | 189,300 | 189,300 | ලිපි කවර මිලදී ගෙන පළාත් සභාවට හා බාහිර ඉල්ලුම්කරුවන්ට සැපයීම | 500,000.00 | පළාත් සභාව සතු රාජ්‍ය ආයතන හා අනෙකුත් ලිපි කවර අවශ්‍යතාවය සපුරා ගන්නා රාජ්‍ය ආයතන |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ලගා වීම

ආයතනයේ ධාරිතා සංවර්ධනය 75% ක් පමණ දියුණු කර ගැනීමට හැකි වූ අතර, අපේක්ෂිත ප්‍රතිපාදන නොලැබීම සහ පැවති කොවිඩ් තත්වය හේතුවෙන් අනෙකුත් ඉලක්ක කරා ලගාවීම අපහසු විය.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමැවුම්) | වර්ශය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| 1.කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරිම වර්ග අඩි 1152 – (රු.1,008,844.11) | 100% | | |
| 2.ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දි ගැනිම (රු.186,500/-) | 100% | | |
| 3. පරිඝණක මිළ දි ගැනිම. (රු.282,000/-) | 100% | | |
| 4.පළාත්සභාව යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය සැපයිම් කිරිම- ලිපිකවර 189300 (රු.500,000/-) | 100% | | |
| 5. කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කාර්යාල ගොඩනැගිල්ල සඳහා වායු සමිකරණ යන්ත්‍ර සපයා සවිකිරිම - (රු.796,500/-) | 100% | | |

## අත්පත් කර ගන්නා ලද කාර්යය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්.

වසර 20 පසු ගොඩනැගිල්ල අලුත්වැඩියා කර ගැනීමට හැකි වීම සහ අත්‍යවශ්‍ය කාර්යාල උපකරන මිළදී ගැනීම මගින්, කාර්යාලයේ කටයුතු කාර්යක්ෂම වීම මෙන්ම ව්‍යවසායකයන්ට සේවය සැපයීමේදී වඩාත් ගුණාත්මක සේවාවක් සැපයීමට හැකියාවක් ලැබුණි. තවද පළාත් සභාව යටතේ ඇති ආයතන සඳහා ලිපි කවර සැපයිම මගින් ආයතනයේ ආදායම් උත්පාදනයට රුකුලක් ලැබුණි.

## හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුළ ඉටුකළ කාර්යය | එම දර්ශකය අනුව 2021 වර්ශය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50%- 74% | 75%- 100% |
| 1.සියලුම තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරිම. | ඵලදායිත්වය වැඩිදියුණු කිරිම | පළාත් සභා පුහුණුවීම් වලට යොමු කිරීම | පුහුණු වාර 6 කට නිලධාරීන් සහභාගි කිරිම | 49% | | |
| **5.**ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලගාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්විම. | කාන්තාවන් සහ ගැහැනු ළමුන් සේවා නියුක්ති තත්වය 5% කින් ඉහළ නැංවීම | සම්ප්‍රදායික කටයුතුවලින් බැහැර ව්‍යාපාර සඳහා යොමු කිරිම | සුළු කර්මාන්ත පුහුණු වැඩමුළු පැවැත්වීම, ණයකරුවන් 47 දෙනෙකු සඳහා රු.4,700,000/-ණය පහසුකම් ලබාදීම සහ මාර්ගෝපදේශන | | 70% | |
| 9.සවිමත් යටිතල පහසුකම් ගොඩනැගිම,පරිපූර්ණ සහ තිරසර කාර්මිකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්විම. | කාර්යාල සේවකයින්ගේ කාර්යක්ෂමතාවය 10% කින් වර්ධනය කිරීම මඟින් කර්මාන්තකරුවන් ගේ ඵලදායිතාවය 5% කින් ඉහළ නැංවීම | කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම සහ සුළුපරිමාණ කර්මාන්තකරුවන් සඳහා ණය ලබාදීම, | කාර්යාල ගොඩනැගිල්ල වර්ග අඩි 1152 – (රු.1,008,844.11) අළුත්වැඩියා කිරීම, ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිල දි ගැනිම (රු.186,500/-) පරිඝණක මිළ දි ගැනිම. (රු.282,000/-) පළාත්සභාව යටතේ ඇති ආයතන සඳහා අවශ්‍ය සැපයිම් කිරිම- ලිපිකවර 189300 (රු.500,000/-) කර්මාන්ත සංවර්ධන අධිකාරියේ කාර්යාල ගොඩනැගිල්ල සඳහා වායු සමිකරණ යන්ත්‍ර සපයා සවිකිරිම - (රු.796,500/-) | | | 75% |

## තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ආයතනය ලත් ජයග්‍රහණ එම ජයග්‍රහණ ලබාගැනීමට ආයතනය සතු වූ ශක්තීන් හා අවස්ථා එම ජයග්‍රහණ ලබාගැනීමේදී ආයතනය මුහුණ දුන් අභියෝග දුර්වලතා හා තර්ජන

තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක සපුරා ගැනීමේදී ආයතනයේ ධාරිතා සංවර්ධනය ඉහළ නැංවීම තුළින් වඩාත් ඵලදායී සේවාවක් ලබා දීමට හැකියාවක් ලැබුණු අතර ඒ සඳහා ආයතනයේ ශක්තීන් ලෙස කළමණාකරණ මණ්ඩලය, ප්‍රධාන අමාත්‍යාංශය මගින් ලබා දෙන සහයෝගීතාවය ඉමහත් ශක්තියක් විය. එහෙත් රටෙහි පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් හා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා අනෙකුත් ඉලක්ක කරා ලගා වීමට අපහසු විය.

## අදායම් ඉපයීම

| ශීර්ෂය | ඉලක්කය (රු.) | සත්‍ය ආදායම (රු.) | එකතු කිරීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම | රු.350,000.00 | රු.126,000.00 | 36% |
| සුළුපරිමාණ ණය පොලිය | රු.2,046,000.00 | රු.992,521.00 | 48% |
| සුළුපරිමාණ ණය ප්‍රමාද ගාස්තු | ඇස්තමේන්තු කර නැත | රු.844,008.00 | - |
| හට් සහ පුටු කුලියට ලබාදීම | රු.100,000.00 | රු.4050.00 | 4% |
| ලිපිද්‍රව්‍ය ගාස්තු | රු.150,000.00 | රු.98,500.00 | 65.66% |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේ සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

මෙම ආයතනයේ කටයුතු සෘජුවම මහජනතාව ඉලක්ක කරගෙන මෙහෙයවන ඒවා වන අතර, කොවිඩ් 19 වසංගතය නිසා පෙර වසර මෙන් මහජනතාව සමඟ උරෙන් උර ගැටෙමින් කටයුතු කළ නොහැකි වීම හේතුවෙන් ව්‍යවසායකයන්ට තාක්ෂණික පුහුණු සංවිධානය කිරීමට නොහැකි වූ අතර, ව්‍යවසායකයන්ගේ නිෂ්පාදනය අලෙවි කර ගැනීම සඳහා ප්‍රදර්ශණාත්මක් පොළවල් සංවිධානය කිරීම, ව්‍යවසායකයන් ලියාපදිංචි කර ගැනීම සාමාන්‍ය පරිදි සාර්ථකව කර ගත නොහැකි විය. කොවිඩ් වසංගතය පැවතියේ වුවද ආයතනික සංවර්ධන කටයුතු (ගොඩනැගිල්ල අළුත්වැඩියාව, නව වායු සමීකරණ පද්ධතියක් සවිකිරීම, උපකරණ මිළදී ගැනීම) අපේක්ෂිත පරිදිම සිදුකර ගත හැකි විය. එමෙන්ම සුළුපරිමාණ ණය අයකර ගැනීමේ දී ණයකරුවන් හමුනොවී දුරකථන මාර්ගයෙන්ම සම්බන්ධ කරගනිමින් මුල් කොවිඩ් තත්වය හේතුවෙන් අයකර ගැනීමට අපහසුව පැවති ණය වාරිකවලින් 80% ක් පමණ අයකරගැනීමට හැකි වීම පැවති තත්වය හා සසඳන කළ යම් ආකාරයක ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය.

# 9.4.මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

රටක ප්‍රවාහන ජාලය ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි ජීව රුධිරය බවට පත්වන අතර එය ආර්ථික, සමාජීය වශයෙන් මෙන්ම දේශපාලනික ඉරණමද තීරණය කරණ ප්‍රධාන සාධකයක් බවට පත්වී ඇත. ආර්ථික වශයෙන් මෙකී ක්ෂේත්‍රය අන් ක්ෂෙත්‍රයන්ට සාපේක්ෂව ඇති වැදගත්කම හේතුවෙන් මෙම විෂය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයට අදාල දැනුම රට වෙනුවෙන් තීන්දු තීරණ ගන්නා මගී ජනතාවට හා සමස්ථ ආර්ථික විචල්‍යයන් වෙත ඍජුව හා වක්‍රව යොමුවීම වැලැක්විය නොහැකි කරුණකි.

එබැවින්, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය ආරම්භ වීමෙන් පසු මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක කරන ලද පොදු ප්‍රවාහන සේවාවන් පළාත් සභා විෂය පථය යටතට ඇතුළත් කොට ඇත. ඒ අනුව ඒ ඒ පළාත් සභා විසින් ප්‍රඥප්ති අනුමත කරවා " පළාත ඇතුළත මෝටර් වාහන මඟින් පාරවල් ඔස්සේ මගීන් ගෙන යෑමේ සේවා සහ භාණ්ඩ ගෙනයාම විධිමත් කිරීම සහ පළාත් අතර මාර්ග ඔස්සේ ප්‍රවාහන සේවා සැලසීම" යන ව්‍යවස්ථාමය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා 1994 අංක 08 දරණ ප්‍රඥප්තිය මගින් උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවන ලදී. වර්තමානය වන විට උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් මහඟු කාර්යභාරයක් ඉටු කරයි. බස් රථ ඇතුලු මඟී ප්‍රවාහනය හා භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය, ආරක්ෂිත හා ගුණාත්මක මඟී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම, බස්නැවතුම්පළ කළමනාකරණය හා යටිතල පහසුකම් සංවර්ධනය ආදී කරුණු ප්‍රධාන වන අතර එමඟින් ජාතික ආර්ථිකයට සපයන දායකත්වය සුළුපටු නොවේ. නිදසුනක් ලෙස 2021 වර්ෂය අවසන් වන විට උතුරු මැද පළාත් මර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් උතුරු මැද පළාත තුල පමණක් බස් රථ 780ක් නියාමනය කරන අතර ,එම බස්රථ මාර්ග 193ක ධාවනය වන මුළු ගමන්වාර සංඛ්‍යාව 2475 කි. ත්‍රී රෝද රථ 6,829 ක් ද, පාසැල් ප්‍රවාහන රථ 40 ක් ද, සිසු සැරි බස් රථ 120 ක් ද අධිකාරියේ ලියාපදිංචි කොට පළාත් ප්‍රවාහන පද්ධතියට එකතු කොට ඇත.

උතුරු මැද පළත තුළ සංසරණය වන බස් රථ නියාමනය කිරීම සඳහා දිස්ත්‍රික්ක දෙකෙහි කාර්යාල දෙකක් පිහිටුවා ඇත. උතුරු මැද පළාතේ මාර්ග 250ක් පිහිටා ඇත. පළාත තුළ ප්‍රධාන බස් නැවතුම්පළ 20ක් හා උප බස්නැවතුම්පළවල් 21 ක් ස්ථාපිත කර ඇති අතර එහි නියුක්ත සේවක සංඛ්‍යාව අනුරාධපුර දිස්ත්‍රික්කයේ 50ක් හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 22ක් ද අනුරාධපුර ප්‍රධාන කාර්යාලයේ සේවක සංඛ්‍යාව 46ක් හා පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලයේ සේවක සංඛ්‍යාව 06කි. දෛනිකව ධාවනය වන ගමන් වාර සංඛ්‍යාව 6980ක් පමණ වන අතර මෙම පළාත තුළ ධාවනය වන බස් රථ වල සේවයේ නියුක්ත සේවක සංඛ්‍යාව 2800 ක් පමණ වේ.

රටේ සංවර්ධනයට, සමාජයේ දියුණුවට සහ පුරවැසියන්ගේ ගමනාගමන අවශ්‍යතා සාධාරණ වියදමකින් සහ අඩු අපහසුතා ඇතිව ඉටුකර ගැනීම ඇතුලු වෙනත් වැදගත් කටයුතු රාශියක් සඳහා මානාව සැලසුම් කර හොඳ නියාමනයක් යටතේ පවත්වාගෙන යන පෞද්ගලික පොදු මගී ප්‍රවාහන සේවාවකින් ලැබෙන සහය අති විශාලය. එසේම සැලසුමකින් හෝ පාලනයකින් තොරව පවත්වාගෙන යන පෞද්ගලික පොදු මගී ප්‍රවාහන සේවාවන් නිසා රටට විඳින්නට සිදුවන දුර්විපාකද අතිශය බැරුරුම්ය. එබඳු පසුබිමක් යටතේ ජනතාවාදී පොදු මගී ප්‍රවාහන බස්රථ සේවාවක් ලබා දීමට අවශ්‍ය කටයුතු මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය මගින් ක්‍රියාත්මක කර ඇත.

## දැක්ම

"කාර්යක්ෂම ජනතාවාදී ප්‍රවාහන සේවාවක්".

## මෙහෙවර

"මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා හා යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම හා නියාමනය කිරීම".

## දිගුකාලීන අරමුණු

ජාතික ප්‍රතිපත්තීන්ට අනුගතවෙමින් පළාත් සභාව විසින් පළාතේ ජනතාවගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික පරිපාලනමය හා සමාජ සුභසාධනමය කටයුතු අරමුණු කරගෙන සැලසුම් කරනු ලබන ප්‍රතිපත්තීන්ට අනුව පළාත් ප්‍රවාහන සේවා පද්ධතිය කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දීමත් හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

## කෙටිකාලීන අරමුණු

- පළාත් අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කරනු ලබන මාර්ගස්ථ මගීන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ, පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන බස්රථ සහ වෑන්රථ, මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවයේ යෙදෙන සියළුම රථ වාහන, කාර්යාල සහ ඇතළුම් සේවයේ යෙදෙන සියළුම රථ වාහන නියාමනය කිරීම සහ එකී සේවාවන්හී ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවනු වස් නව තාක්ෂණය පදනම් කරගත් කාර්යයන් කිරීම.

- කාර්යාලයේ සහ ක්ෂේත්‍රයේ කටයුතුවල සේවයේ නියැලී සිටින කාර්ය මණ්ඩලවල මෙන්ම අධිකාරිය මගින් නියාමනය කරනු ලබන විවිධ අංශවල ප්‍රවාහන සේවා සපයන කාර්ය මණ්ඩලයන්හී කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය වර්ධනය කරනු වස් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- මෙහෙයුම් හා නියාමන කටයුතු විධිමත් කරනුවස් නවීන තාක්ෂණය හඳුන්වා දීම.

- ආයතනයේ ආදායම් තත්වය ඉහළ නංවනුවස් නව ආදායම් උත්පාදන මාර්ග හඳුන්වා දීම හා පවත්නා ආදායම් මාර්ග පුළුල් කිරීම සහ විධිමත් කිරීම.

## ප්‍රධාන කාර්යයන් හා උපාය මාර්ග

### 01.මගී ඉල්ලුම අනුව මගී ප්‍රවාහන බස්රථ සඳහා නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)

♣ මගී ප්‍රවාහන බස් රථ සේවය සඳහා නව බලපත්‍ර නිකුත් කිරීමේදී මගී ඉල්ලුම හඳුනා ගැනීම, නියමිත ක්‍රමවේද අනුගමනය කොට නව මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සහ ධාවනයට සුදුසු බස්රථ ධාවනයට එකතු කිරීම.

♣ මගී සහ භාණ්ඩ සංසරණය සඳහා ප්‍රධාන මාර්ගයන්හි ප්‍රවාහන පහසුකම් යම් ඉහළ මට්ටමකට පවත්වන නිසා ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන පහසුකම් ඉහළ නැංවීම සඳහා වැඩි අවධානය යොමු කිරීම සහ ව්‍යවසායකයින් දිරිමත් කිරීම.

♣ නිත්‍ය නව බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රථම අත්හදා බැලීමේ පදනම මත තාවකාලික බලපත්‍ර නිකුත් කොට ව්‍යවසායක ආකර්ශනය ලබා ගැනීම හා ධාවන ගැටළු හඳුනා ගැනීම.

♣ අත්හදා බැලීමේ කාලසීමාව තුළ හෝ නිත්‍ය බලපත්‍ර නිකුත් කිරීමෙන් පසු ග්‍රාමීය මාර්ග පද්ධතියේ පවතින ගැටළු මගී ජනතාව මගින් ලබා ගැනීම

**02.මගී ඉල්ලුම අනුව පාසල් ළමුන් ප්‍රවාහනය සඳහා සිසු සැරි සහ පාසල් ප්‍රවාහන බස්රථ සඳහා මාර්ග බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ සිසු ඉල්ලුම අනුව (සමීක්ෂණය මගින් හා කේවල ඉල්ලීම් අනුව) නියමිත ක්‍රමවේද අනුගමනය කොට ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත සිසු සැරිය සේවාව සඳහා නිර්දේශ ඉදිරිපත් කොට සිසු සැරිය බස්රථ සේවයට එකතු කිරීම.

♣. බස්රථ අවශ්‍යතා ඇති මාර්ගයන්හි සිසු ප්‍රවාහන බස්රථ සේවයට එක් කිරීම (නියමිත ක්‍රමවේද අනුගමනය කොට බලපත්‍ර ලබා දීමෙන්)

**03. භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලොරි රථ හා වෙනත් රථ සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ පළාත තුළ සංසරණය වන භාණ්ඩ ප්‍රවාහන රථ (විවිධ ආර්ථික කටයුතු පදනම් කරගෙන) පිළිබඳ සමීක්ෂණයක් කොට නියමිත අවශ්‍යතා පෙන්වා දෙමින් බලපත්‍ර නිකුත් කිරීම.
♣ භාණ්ඩ ප්‍රවාහන රථ සඳහා නැවතුම් ස්ථාන ලකුණුකර දිම.(අදාල පාර්ශවයන්ගේ නිර්දේශ ලබාගෙන)
♣ ශ්‍රී ලංකා පොලීසියේ සහය ලබාගෙන බලපත්‍ර ලබාගනුවස් භාණ්ඩ ප්‍රවාහන කුලී රථකරුවන් අධිකාරිය වෙත පොළඹවා ගැනීම.
♣ විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් පවත්වා ලියාපදිංචිය ආකර්ශනය කරවීම.

**04. මගී ආවරණ ඉදිකිරීම සහ අබලන්වූ ස්ථාන ප්‍රතිසංස්කරණය.**

♣ පළාත පුරා සමීක්ෂණ කොට මගී ආවරණ ඉදි කිරීම සඳහා විවිධ ආයතන හා පුද්ගලයින් නැඹුරු කරවා ගැනීම.
♣ අබලන් මගී ආවරණ සුදුසු පරිදි නවීකරනය කිරීම.
♣ මගී ආවරණ ඉදි කිරීම මගින් මගී පහසුව සහ ආරක්ෂාව උපරිම අයුරින් සැලකිල්ලට ගැනීම.

**05. භාණ්ඩ හා මගි ප්‍රවාහනය සඳහා ත්‍රි රෝද රථ සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරිම. (ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ බලපත්‍ර රහිතව මගි ප්‍රවාහනයේ යෙදෙන ත්‍රි රෝද රථ හඳුනාගෙන අධිකාරියේ ලියාපදිංචි කරවාගෙන බලපත්‍ර නිකුත් කිරිම.
♣ නිශ්චිත ත්‍රිරෝද රථගාල් ස්ථාපිත කර දී ප්‍රවාහනයේ යෙදිමට අවසර ලබා දීම.
♣ ශ්‍රී ලංකා පොලිසියේ සහය ලබාගෙන බලපත්‍ර ලබා ගැනීමට පෙළඹවීම.
♣ අනවසර ත්‍රි රෝද රථකරුවන් නිතියේ රැහැනට හසුකරගෙන (ලියාපදිංචිය මගහරිමින් සිටින ලියාපදිංචියට නැඹුරු කරවා ගැනීම.
♣ ලියාපදිංචි ත්‍රි රෝද රථවල පමණක් ගමන් ගන්නා ලෙස මගි ජනතාව දැනුවත් කිරීම තුළින් නව ලියාපදිංචිය වැඩිකර ගැනීම.
♣ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන කේන්ද්‍ර කරගෙන ත්‍රි රෝද රථ ගාල් පිහිටුවා නව බලපත්‍ර ලබා ගැනීම සඳහා ත්‍රි රෝද රථකරුවන් ආකර්ශනය කර ගැනීම.
♣ ත්‍රි රෝද රථ පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය හා ඒකාබද්ධ වි කටයුතු කිරීම.
♣විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් කොට ලියාපදිංචිය ආකර්ශනය කරවීම.

**06.** **කාර්යාල සහ ඇඟළුම් සේවක ප්‍රවාහනය සඳහා නව ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම.**

**(ප්‍රධාන මාර්ග සහ ග්‍රාමීය මාර්ග)**

♣ ඇඟළුම් කර්මාන්ත සම්බන්ධව සමීක්ෂණයක් කොට ඒවායේ සේවකයින් ප්‍රවාහනය සඳහා යොමු වී ඇති බස්රථ හෝ වෑන් රථ හඳුනා ගැනීම, ලියාපදිංචි කිරීම.

♣ නියාමන අවශ්‍යතා හඳුන්වා දෙමින් ඇඟළුම් කර්මාන්ත සේවක ප්‍රවාහනයේ යෙදී සිටින්නන් දැනුවත් කිරීම.

♣ කාර්යාල සේවක ප්‍රවාහනයේ යෙදී සිටින්නන් ආයතනයේ ලියාපදිංචි කරවා ගැනීමට කටයුතු කිරීම.

♣ ලියාපදිංචි බස් රථයක හෝ වෑන් රථයක පමණක් ප්‍රවාහන පහසුකම් සලසා ගන්නා ලෙස කාර්යාල සේවයේ නියුත් වුවන් දැනුවත් කිරීම.

♣ කාර්යාල සේවකයින් හා ඇඟළුම් සේවකයින් ප්‍රවාහනය කරන රථ සඳහා නැවතුම් ස්ථාන ස්ථාපිත කරදීම.

♣ විවිධ පුහුණු හා ආකල්ප වර්ධන වැඩසටහන් පවත්වා ලියාපදිංචිය ආකර්ශනය කරවීම.

**07.** **සිසු ප්‍රවාහන බස්රථ සහ වෑන් රථ නියාමනය කාර්යක්ෂම කිරීම විධිමත් කිරීම සහ ගුණත්වය ඉහළ දැමීම.**

♣ සිසු ඉල්ලුමට සරිලන පරිදි මාර්ග හඳුනා ගැනීම හා ප්‍රමාණවත් බස්රථ යෙදවීම.

♣ විධිමත් ආරක්ෂිත ගුණාත්මක සේවාවක් ඇති කිරීම සඳහා බස් රථ හා වෑන් රථ, සේවක මණ්ඩලය, දෙමව්පියන් හා පාසැල් දරුවන් දැනුවත් කිරීම.

♣ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම, මාර්ග සමීක්ෂණ කිරීම, සිසුන්ගෙන් හා දෙමාපියන්ගෙන් අදහස් ලබා ගැනීම,පරීක්ෂා කිරීම.

♣ මාර්ග පරීක්ෂක නිලධාරීන් යොදවා පරීක්ෂා කිරීම.

**08.** **කොන්දොස්තර, රියදුරු මහතුන් හා බස්රථ හිමියන්ගේ දැනුම ආකල්ප වර්ධනය තුළින් ගුණාත්මක බව වැඩිදියුණු කිරීම.**

♣ බස්රථ සේවා ගනයන්හී සේවයේ නියුක්ත වුවන් සහ ත්‍රි රෝද රථ රියදුරන්ගේ ආකල්ප වර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම.

**09.** **ඒකාබද්ධ කාලසටහන් අනුව ධාවනය වන බස්රථවල කාර්යක්ෂමතාවය ගුණාත්මක අගය වැඩි කිරීම හා ආයතනගත කිරීම.**

♣ නව බලපත්‍ර නිකුත් කරන හා දැනටමත බලපත්‍ර නිකුත්කර ඇති මගී ප්‍රවාහන සිසු ප්‍රවාහන, භාණ්ඩ ප්‍රවාහන සහ වෙනත් ප්‍රවාහන සේවා නියාමනය කිරීම.
♣ මගී ප්‍රවාහන බස්රථ ඒකාබද්ධ කාල සටහනක් අනුව ධාවනයේ යෙදවීම
♣ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහා 40%ක්ද ප්‍රවාහන අධිකාරියේ බලපත්‍ර ලබන බස්රථ සඳහා 60%ක්ද වන පරිදි පළාතේ සියවම මාර්ග සඳහා කාලසටහන් සකස් කිරීම
♣ කාලසටහන් අනුව බස්රථ ධාවනයේ යෙදවීමේදී මාසිකව නිකුත් කරනු ලබන ලොග්පත්‍ර පිවිසුම්පත්‍ර සහ අතුරු ගමන්වාර අවසර පත්‍ර බස් නැවතුම්පලවල් තුලින් දෛනිකව අත්සන් කිරීමට යොමු කිරීම තුළින් බස්රථ අධීක්ෂණය කිරීම
♣ මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවලට ගැලපෙන පරිදි හා බස්රථ සන අතර පවතින්නා වූ ගැටළු හඳුනාගෙන මාර්ග සාකච්ඡා පැවැත්වීම.
♣ බස් රථ කාර්ය මණ්ඩලය විසින් නියාමන කොන්දේසි උල්ලංඝනය කරන අවස්ථාවන්හීදී දඩුවම්වලට යටත් කිරීම.
♣ මාර්ග පරීක්ෂකවරුන් මාර්ගයෙන් නියාමන කොන්දේසි නිරන්තර පරීක්ෂාවට ලක් කිරීම.
♣ සිසු ප්‍රවාහන බස්රථවල තත්වය, සේවය හා අනෙකුත් නියාමන අවශ්‍යතා වරින්වර පරීක්ෂාවට ලක් කිරීම.(මීට අමතරව ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් ද පරික්ෂා කරනු ලබයි)
♣ සිසු සැරිය බස්රථ සඳහා රජය විසින් ගෙවන ජනතාවගේ මුදල් අධිකාරියේ නිර්දේශ තුළින් පමණක් ගෙවීම.
♣ මගී ප්‍රවාහන ත්‍රි රෝද රථ,භාණ්ඩ ප්‍රවාහන රථ ලියාපදිංචි කළ පසු ස්ටිකර් අලවා එය අධිකාරියේ ලියාපදිංචි කළ වාහනයක් බව මහජනතාව මෙන්ම නිතිය ක්‍රියාත්මක කරන ආයතනවලට දන්වා සිටීම.
♣ සියළු ආකාරයේ බලපත්‍ර වාර්ෂිකව දීර්ඝ කිරීමට ලක්කොට නියාමනය තහවුරු කිරීම.

**10.** **භාණ්ඩ ප්‍රවාහන රථ නියාමනය කාර්යක්ෂම කිරීම, විධිමත් කිරීම සහ ගුණත්වය ඉහළ දැමීම.**

♣ පනතේ බලතල ප්‍රකාරව අධිකාරියේ ලියාපදිංචි කරවීම.
♣ විධිමත් රථගාල් ස්ථාපිත කරදීම.
♣ පොලීසිය හා එක්ව ආරක්ෂක වැඩසටහන් සංවිධානය කිරීම.
♣ මාර්ග පරීක්ෂක නිලධාරින් යොදවා පරීක්ෂා කිරීම.
♣ සමීක්ෂණ කිරීම.

**11.** **මගී ගැටළු හඳුනා ගැනීම හා විසඳුම් ලබා දීම.**

♣ පොදු ප්‍රවාහන පහසුකම් ලබා ගන්නා මහජනතාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීම සඳහා සෑම බස්නැවතුම්පල ස්ථානයක්ම පැමිණිලි පෙට්ටි සවිකිරිම.
♣ මහජනතාවට පැමිණිලි ඉදිරිපත් කිරිම සඳහා දුරකථන අංක ප්‍රසිද්ධ කිරීම.
♣ ජංගම පරීක්ෂණ වලදි මගී ජනතාවගෙන් ගැටළු ලබා ගැනීම.
♣ සියළු ගැටළු සඳහා කඩිනමින් විසඳුම් ලබා දී ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපනය කිරීම.

**12.** **බස්නැවතුම්පල ඉදිකිරීම, නවීකරණය සහ අළුත්වැඩියා කිරීම.**

♣ හඳුනාගත් ස්ථානවල සියළු පහසුකම්වලින් සමන්විත බස්නැවතුම්පල ඉදි කිරීම
♣ බස්නැවතුම්පල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරිම.
♣ පැරණි බස්නැවතුම්පලවල් නවීකරණය කිරිම හා අළුත්වැඩියා කිරිම.
♣ අලුතින් ඉදිකරන සහ දැනටමත් ඉදිකර ඇති බස්නැවතුම්පලවල් සඳහා තාක්ෂණය හඳුන්වා දීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 121 ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 136 කි.

## මූලධන වියදම්

| වියදම් ස්වාභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි ඉදිකිරීම්/ ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම | 25 | 2.68 | 22.32 | 11% |
| කාර්යාල උපකරණ (මිලදී ගැනීම්) | 1.0 | 0.17 | 0.83 | 17% |
| පුහුණු හා ධාර්තා සංවර්ධනය | 0.2 | - | 0.2 | 0% |
| **එකතුව** | **26.2** | **2.86** | **23.34** | **11%** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග.

1. සෞභාග්‍යයේ දැක්ම තුළින් "සුවපහසු ගමනක් පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක්" යන්න සාක්සාත් කරනු වස් උතුරු මැද පළාත තුළ පෞද්ගලික බස්රථ මගින් පොදු මගී ප්‍රවාහන සේවාව ගුණාත්මකව හා කාර්යක්ෂමව මගී ජනතාව වෙත ලබා දීමේ කටයුතු ක්‍රියාවට නැංවීම.
2. සෞභාග්‍යයේ දැක්ම තුළින් "යස ඉසුරින් පිරි රටක්" ගොඩනැගීමේ අරමුණින් යුතුව ග්‍රාමීය හඳුනාගත් ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම් සැලසීමට ප්‍රමුඛතාවය සකස් කිරීම සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
3. සෞභාග්‍යයේ දැක්ම තුළ ප්‍රවාහන සේවාව විධිමත් කිරීමේ කටයුත්තට උර දෙමින් මාර්ගවල පවතින දුර්වලතා හඳුනාගෙන වෙනත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධව කටයුතු කිරීම.
4. සෞභාග්‍යයේ දැක්ම තුළ "කඩිනම් නගර අලංකරණ හා කඩිනම් ප්‍රවාහන සේවාවක් සැපයීමේ අරමුණින් විශේෂයෙන්ම මාර්ග තදබදය අවම කිරීම සඳහා (විශේෂයේන්ම පාසල් වේලාවන් සහ කාර්යාල වේලාවන් පෙ.ව. 6 සිට 8 දක්වා, මධ්‍යහන 12 සිට ප.ව. 3 දක්වා, ප.ව. 4.30 සිට ප.ව.6 දක්වා කාලය තුළ)පෞද්ගලික වාහන මගින් නගරයට පැමිණීම වෙනුවට විශේෂ ප්‍රවාහන සේවාවක් එම කාලය තුළ නගර සේවාවක් ලෙස (City Service) ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සිදු කිරීම.
5. සෞභාග්‍යයේ දැක්ම තුළින් "සුවපහසු ගමනක් පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක්" යන්න සාක්සාත් කිරීම පිණිස උතුරු මැද පළාත තුළ පෞද්ගලික බස්රථ මගින් පොදු මගී ජනතාවගේ පහසුව උදෙසා දුරගමන්සේවා බස්රථ සඳහා (අන්තර් පළාත්) ටිකට් බුකින් ක්‍රමය ආරම්භ කිරීම.

## මෙහෙයුම් සමාලෝචනය

2020 වර්ෂයට සාපේක්ෂව ගත්කල 2021 වර්ෂයේදී ඉහළ සාපේක්ෂ ඵලදායීතාවයක් ළඟාකර ගැනීමට අපේක්ෂා කළද දැනට පවතින ලෝක වසංගතයක් වන කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ එය 100% ක ප්‍රතිශතයක් බවට පත්කර ගත නොහැකි වුවත් දැඩි අපහසුතා මධ්‍යයේ වුවද 65% කට වඩා වැඩි සාපේක්ෂ ඵලදායීතාවයක් කරා ළඟාවීමට හැකිවී ඇත. උතුරු මැද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිපාදන 2021 වර්ෂයේ රුපියල් මිලියන 25ක් වෙන් වුවද ,ව්‍යාපෘති සඳහා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සකස් කරන ලද ඇස්තමේන්තු වටිනාකමට වඩා වෙළඳපොළ මිළගණන් ඉහළ යෑම සහ අවශ්‍ය භාණ්ඩ හා උපකරන හිඟකම මත වැඩි වියදමක් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වැයවන බැවින් ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන මගින්වත් යෝජිත එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවද ගරු සභාපති තුමාගේ සහ සාමාන්‍යාධිකාරී තුමාගේ නොමසුරු උත්සාහයෙන් හා කැපවීමෙන් අනෙකුත් ව්‍යාපෘති සියල්ලම ක්‍රියාත්මක කර අපේක්ෂිත ඉලක්ක ළඟාකරගැනීමට හැකි වීම සතුටුදායක තත්ත්වයකි.

එමෙන්ම උතුරු මැද පළාත තුළ මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය මගින් නියාමනය කරණු ලබන සියළුම බස්නැවතුම්පළවල් 2021 වර්ෂය තුල ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව හා සුරක්ෂිතභාවය ආරක්ෂාවන පරිදි පිරිසිදු හා අලංකරණයෙන් යුතු බස්නැවතුම්පළවල් බවට පත් කිරීමට කටයුතු කිරීම විශේෂයෙන් සඳහන්කල යුතුය. එසේම ප්‍රධාන මාර්ග සහ අතුරු මාර්ගවල බස්රථ ධාවනය කිරීම මගින් ලෝක වසංගතයක් වූ කොරෝනා වසංගත තත්ත්වය අභිමුව වුවද මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතා බොහෝමයක් ඉටුකර දීමට හැකි විය.

එසේම ආයතනයේ අනාගතය වෙනුවෙන් ගුණාත්මක මගී ප්‍රවාහන සේවා සැපයීම සඳහා මගී පහසුකම් සංවර්ධනය කිරීම, මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම, බස්රථ සන අතර මගී හිතෛෂී ආකල්ප වර්ධනය කිරීම හා නීති බලාත්මක කිරීම වැනි උප අංග ක්‍රියාත්මක කිරීම මගින් 2021 වර්ෂය තුළ ජනතාවගේ සෞඛ්‍යාරක්ෂාව, සුරක්ෂිතභාවය ආරක්ෂාවන පරිදි සියලුම බස්නැවතුම්පළවල් පිරිසිදුව හා අලංකරනයෙන් යුතු බස්නැවතුම්පළවල් බවට පත් කිරීමට කටයුතු කිරීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. එසේම ප්‍රධාන මාර්ග සහ අතුරු මාර්ගවල බස්රථ ධාවනය කිරීම මගින් ලෝක වසංගතයක් වූ කොරෝනා වසංගත තත්ත්වය අභිමුව වුවද පොදු මගී ජනතාව වෙත කාර්යක්ෂම ජනතාවාදී ප්‍රවාහන සේවාවක් ලබා දීමට මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියට හැකි විය.

## ශදූඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

**ශක්තීන්**

1. ව්‍යවස්ථා බලතළ සහිතව පළාත් සභාව විසින් ප්‍රඥප්තිය අනුමත කරවා පිහිට වූ ආයතනයක් වීම.
2. ජාතින ගමනා ගමන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ සහ අධිකාරිය සතු ව්‍යවස්ථාපිත බලතල.
3. පළාත් සභාව තුළින් හා මධ්‍යම රජයෙන් අනුග්‍රහය ලැබීම.
4. පළාත් අධිතාරිය සතුව ක්ෂේත්‍රයේ අත්දැකීම් ලත් කාර්යය මණ්ඩලයක් සිටීම.
5. කාර්යක්ෂම හා ජනතාවාදී ප්‍රවාහන සේවාවක් මගී ජනතාව වෙනුවෙන් සැපයීම සඳහා අංග සම්පූර්ණ නව පරිපාලන ගොඩනැඟිල්ලක් හිමි වී තිබීම.
6. කාර්යක්ෂම කාර්යය මණ්ඩලයක් සිටිම මඟින් බස් රථ නියාමනය සඳහා පහසු වීම.
7. උසස් අධ්‍යාපනයකින් යුත් කාර්ය මණ්ඩලයක් සිටිම මඟින් ආයතන රාජකාරී කටයුතු කිරීම පහසු වීම.
8. මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා රථ, ත්‍රී රෝද රථ, පාසල් ප්‍රවාහන සේවා රථ, පළාත තුළ සංසරණය වීමේදී නියාමනය කිරීම සඳහා බල තල අධිකාරීයට පැවරී තිබීම.

**දුර්වලතා**

1. නූතන ප්‍රවාහන තාක්ෂණය සහිත තොරතුරු තාක්ෂණය භාවිතය අවම මට්ටමක පැවතීම.
2. බස්නැවතුම්පළවල්හි නියාමන කටයුතු හා පරිපාලනමය කටයුතු අධිකාරිය සතු වුවද භූමියේ අයිතිය නොමැතිකම නිසා අනවසර ඉදිකිරීම් වැළැක්වීම හෝ අනවසර වෙළඳුන්ගෙන් වන බාධා ඉවත් කිරීමට (නගර සභාව සහ පළාත් පාලන ආයතන මැදිහත්වීම සිදුවන නිසා) අධිකාරියට බලයක් නොමැතිකම නිසා මගී ආරක්ෂාව සහ සුවපහසුව ක්‍රමිකව හීන වීම.
3. බස් නැවකතුම්පළ පර්යන්ත පහසුකම් (භූමිය ඇතුළු) ලබා ගන්නා මගී ජනතාවගේ වර්ධනයට සාපේක්ෂව සනීපාරක්ෂක පහසුකම් වර්ධනය නොවීම
4. ප්‍රඥාප්තී ප්‍රකාරව බලතල පැවරී තිබුනද නියාමණයට යටත් ඇතැම් ක්ෂේත්‍ර මෝටර් රථ පනත හා බද්ධ නොවීම(උදා - ආදායම් බලපත්‍රයක් හෝ රක්ෂණාවරණයක් රහිතව ධාවනයේ යෙදෙන ත්‍රී රොද රථ කරුවෙකු හෝ භාණ්ඩ ප්‍රවාහන කරුවෙකුට දඩ පැවරීමකට හෝ අධිකරනය හමුවට පැමිණ වීමට පොළීසියට හැකි වුවත් උතුරු මැද පළාත් ප්‍රවාහන අධිකාරියේ ලියාපදිංචි නොකොට ධාවනය වන ඒකී වාහන සම්බන්ධයෙන් කටයුතු කිරීමට මෝටර් රථ පනතට අනුව පොළීසියට නොහැකි වීම නිසා ඒකී ක්ෂේත්‍ර වල රැකියාවේ නියුක්ත වන්නන් අධිකාරියේ පාලනයෙන් බැහැර වීම.
5. උතුරු මැද පළාත් ප්‍රවාහන අධිකාරියේ බස්නැවතුම්පළ වලට ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොමැතිකම.
6. ලංගම බස් රථ නියාමනය දුර්වල මට්ටමක පැවතීම.
7. කාර්යයමණ්ඩලයේ ඇතැම් සේවකයන් හට තාක්ෂණික දැනුම මඳ බව.
8. උතුරු මැද පළාත් ප්‍රවාහන අධිකාරියේ ප්‍රඥප්තිය හා ආයතනයේ ප්‍රධාන තනතුරු දේශපාලන අවශ්‍යතා මත කලින් කළ වෙනස් වීම්.

**අවස්ථා**

1. උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ ලියාපදිංචිය නොලබා ධාවනය වන ත්‍රී රෝද රථ, භාණ්ඩ ප්‍රවාහන රථ,කාර්යාල සේවක ප්‍රවාහන රථ සහ සංචාරකයින් ප්‍රවාහනය කරන රථ 90% කට වැඩි ප්‍රමාණයක් පළාත තුළ විසිර තිබීම.
2. උතුරු මැද පළාත තුළ මාර්ග පද්ධතිය යම් පැසසිය යුතු මට්ටමක පැවතිම.
3. මගී ඉල්ලුම අනුව ග්‍රාමීය ප්‍රදේශ වලට 10% - 20% මට්ටමකින් බස් රථ යෙදවීමේ අවස්ථාව පැවතීම.
4. සමාජ සත්කාරක සේවයේ යෙදෙන පුද්ගලයින් හා ආයතන යොදවා මගී ආවරණ ඉදිකරවා ගැනීමට ඇති හැකියාව.
5. ලංකා ගමනාගමන බස් රථ සහ පළාත් බස් රථ ඒකාබද්ධ කාල සටහනකට අනුව ධාවනයේ යෙදවීමට ඇති හැකියාව.
6. උතුරු මැද පළාතේ මගී ප්‍රවාහන සේවාව වර්ධනය කිරීම උදෙසා පෞද්ගලික බස් රථ හිමියන් ආයෝජනයට නැඹුරු කර වීමේ හැකියාව.
7. ගුණාත්මක,ආරක්ෂිත සහ කාර්යක්ෂම මගී ප්‍රවාහන සේවාවක් උදෙසා යොදා ගත හැකි තාක්ෂණික ආදර්ශයන් බොහෝ රට වලින් ලබා ගත හැකි වීම සහ ඊට අවැසි තාක්ෂණික ඥාණය හා උපදෙස් දේශීය විශ්ව විද්‍යාල පද්ධතියෙන් ලබා ගත හැකිවීම.
8. ගුණාත්මක, ආරක්ෂිත සහ කාර්යක්ෂම මගී ප්‍රවාහන සේවාවක් ස්ථාපිත කිරීම උදෙසා ඒකාබද්ධ අරමුදල් ව්‍යාපෘති ලබා ගැනීමේ හැකියාව.

**තර්ජන**

1. මගී ප්‍රවාහන සේවාවේ යෙදෙන වෙනත් ආයතන වල අයහපත් තරගකාරිත්වය නිසා පෞද්ගලික බස් රථ කර්මාන්තයේ නියැලෙන සේවා නියුක්තිකයින්ගේ විනය පාලනය කළ නොහැකි වීම.
2. මගී ඉල්ලුමේ අධ්‍යනයකින් තොරව ලංකා ගමනාගමන මණ්ඩලය විසින් නව බස් රථ ධාවනයට එක් කිරීම.
3. ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ බලපත්‍රලාභී බස් රථ වලින් පළාත් බස් රථ වලට හානී පැමිණ වීම සහ එකී බස් රථ පළාත තුළ නියාමන යාන්ත්‍රණයට හසු කර ගන්නා විට ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් බාධා පැමිණ වීම.
4. බස් රථ කර්මාන්තයේ නියාමනයට ජාතික වශයෙන් පිළිගත් පොදු යාන්ත්‍රණයක් නොමැතිකම නිසා දිනෙන් දින පොදු මගී ප්‍රවාහන සේවාවේ ගුනත්වය ආරක්ෂිත බව හා කාර්යක්ෂමතාවය පිරිහීම තුළින් මගී ජනතාව පොදු ප්‍රවාහන මාධ්‍යයෙන් දුරස් වීම.
5. නව නියාමන ක්‍රමවේද හඳුන්වා දීමේදී නියාමනයට බඳුන් වන ක්ෂේත්‍ර. වල සේවා නියුක්තිකයින්ගේ විරෝධ හා අප්‍රසාද එල්ල වීම.
6. බස් රථ ගාල්වල බස් රථ හැසිරවීමට සහ මහජනතාවට හිරිහැර වන ආකාරයට අනවසර ඉදිකිරීම සිදු කිරීම.

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

**සංරචකය (Component) 01 : ගුණාත්මක මගී සේවා සැපයීම** (ගුණාත්මක මගී ප්‍රවාහන සේවා සැපයීම සඳහා මගී පහසුකම් සංවර්ධනය කිරීම, මගී ආරක්ෂාව සහ සුවපහසුව ඉහළ නැංවීම, බස්රථ සහ අතර මගී හිතෛෂී ආකල්ප වර්ධනය කිරීම හා නීති බලාත්මක කිරීම වැනි උප අංග ක්‍රියාවට නන්වනු වස් යෝජනා කර ඇති ක්‍රියාකාරකම් තුළින් ප්‍රධාන කාර්යසාධන දර්ශකයන්හි අයිතමයන් මගින් අපේක්ෂා කරන අතර එම ක්‍රියාකාරකම් තුළින් තිරසර සංවර්ධනයේ අභිමතාර්ථ ලඟාකර අපේක්ෂා කෙරේ.

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1.1. | මගී පහසුකම් සංවර්ධනය කිරීම | 1. උප නගරවල සියලු පහසුකම්වලින් සමන්විත ඉදි කරන ලද බස්නැවතුම්පලවල් ගණන. | 22 | 02 |
| | | 2. ප්‍රධාන නගරවල සහ උප නගරවල නවීකරණය කරණ ලද බස්නැවතුම්පලවල් ගණන. | 20 | 05 |
| | | 3. භූමි කාපට් කරන ලද බස්නැවතුම්පලවල් ගණන. | 15 | 08 |
| | | 4. මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල ඉදි කරන ලද නව මගී ආවරන ගණන. | 1540 | 20 |
| | | 5. අලුත්වැඩියා කරන ලද අබලන් තත්වයේ පවත්නා මගී ආවරණ ගණන. | 1540 | 40 |
| | | 6. අධික මගී ඉල්ලුමක් පවතින දුර ගමන් සේවා බස්නැවතුම්පලවල්හි ඉදි කරන ලද ආරක්ෂිත මගී විවේකාගාර ගණන. | - | - |
| | | 7. සියලු යටිතල පහසුකම් වලින් සමන්විත ස්ථාපිත කරන ලද ආපනශාලා පහසුකම් සහිත දුර ගමන්සේවා බස් රථ නතරකරන ස්ථාන ගණන. | - | 02 |
| | | 8. අවිධිමත්ව ස්ථාපිත කර ඇති ත්‍රී රෝද රථගාල් හා භාණ්ඩ ප්‍රවාහන රථගාල් ඉවත්කොට විධිමත්ව ස්ථාපිතකරන ලද ත්‍රී රෝද රථගාල් හා භාණ්ඩ ප්රවාහන රථගාල් ගණන. | - | 65 |
| 1.2. | මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම | 1. සෑම ප්‍රධාන නගරයකම ප්‍රධාන බස්නැවතුම්පලවල්හි ඇති වැසිකිළි පද්ධති නූතන උපකරණ සහිතව වැඩිදියුණු කරන ලද ප්‍රමාණය. | 20 | 04 |
| | | 2. වැසිකිළි පහසුකම් රහිත බස්නැවතුම්පලවල්හි ස්ථාපිත කරන ලද වැසිකිළි පද්ධති ගණන. | - | 03 |
| | | 3. CCTV කැමරා පද්ධති සවි කරන ලද ප්‍රධාන බස්නැවතුම්පලවල් ගණන. | - | 04 |
| | | 4. CCTV කැමරා සහ GPS යන්ත්‍ර සවි කරන ලද බස්රථ ගණන. | - | 300 |
| | | 5. බස්රථ නිරීක්ෂණ කටයුතු සඳහා ස්ථාපිත කරන ලද තාක්ෂණික මෙහෙයුම් මැදිරි ගණන. | - | 02 |
| | | 6. අධික මගී ඉල්ලුමක් පවතින තෝරාගත් මාර්ගවල ආරම්භ කරන ලද සුඛෝපභෝගී බස්රථ සේවාවේ බස්රථ ගණන. | - | 02 |
| | | 7. ඩිජිටල් කාලසටහන් පුවරු සවි කරන ලද ප්‍රධාන බස්නැවතුම්පලවල් ගණන. | - | 02 |
| | | 8. මහජන ඇමතුම් පද්ධති ස්ථාපිත කරන ලද බස්නැවතුම්පලවල් ගණන. | - | 01 |
| | | 9. තාක්ෂණික උපකරණ හඳුන්වා දුන් වේලා සටහන් කුටි ගණන. | - | 02 |
| | | 10. ජංගම පරීක්ෂක කටයුතු සඳහා හඳුන්වා දුන් තාක්ෂණික උපකරණ ගණන. | - | 04 |
| | | 11. පවත්වක ලද මාර්ග සමීක්ෂණ ගණන. | - | 30 |
| | | 12. ටිකට් මැෂින් ක්‍රමය හඳුන්වා දෙන ලද බස්රථ ගණන. | - | 30% |
| | | 13. මගී ආරක්ෂාව උදෙසා ස්ථාපිත කරන ලද දැන්වීම්, ප්‍රචාරක පුවරු ගණන. | - | 10 |
| | | 14. මගී අයිතිවාසිකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා බෙදා දෙන ලද අත් පත්‍රිකා හා ස්ටිකර්ස් ප්‍රචාරක වැඩසටහන් ගණන. | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 1.2. | මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම | 15. ප්‍රධාන බස්නැවතුම්පලවල් වල, උප බස්නැවතුම්පලවල් වල ස්ථාපිත කරන ලද ස්වයංක්‍රීයව කාලය සටහන් ප්‍රදර්ශනය වන තාක්ෂණික උපකරණ ගණන. | - | 05 |
| | | 16. ලියාපදිංචි කරන ලද සිසු සැරිය බස්රථ ගණන. | 90 | 10 |
| | | 17. ලියාපදිංචි කරන ලද සිසු ප්‍රවාහන රථ ගණන. | - | 50 |
| | | 18. ලියාපදිංචි කරන ලද මගී ප්‍රවාහන ත්‍රී රෝද රථ ගණන. | 2450 | 4000 |
| | | 19. ලියාපදිංචි කරන ලද කාර්යාලීය සේවක ප්‍රවාහන රථ ගණන. | - | 10 |
| | | 20. මගී පැමිණිලි ගණන. | 600 | 100 |
| | | 21. පුළුල් කරන ලද වාර්ෂික ජංගම පරීක්ෂක වාර ගණන. | 240 | 350 |
| | | 22. ඉවත් කරන ලද බස්නැවතුම්පලවල්හි හඳුනාගත් අනවසර ඉදිකිරීම් සහිත වෙළෙදුන් ගණන. | - | 10% |
| | | 23. බස්රථ කාර්යමණ්ඩල සඳහා විවේකාගාර පහසුකම් ස්ථාපිත කරන ලද ප්‍රධාන බස්නැවතුම්පලවල් ගණන. | - | 02 |
| | | 24. පළාත පුරා ස්ථාපිත කරන ලද බස්නැවතුම් ස්ථාන පුවරු ගණන. | - | 75 |
| | | 25. මිලදී ගන්නා ලද ටිකට් බුකින් ක්‍රමය හඳුන්වා දීමට අදාල තාක්ෂණික උපකරණ ප්‍රමාණය. | - | 02 |
| 1.3 | බස්රථ සන අතර මගී හිතෛෂී ආකල්ප වර්ධනය කිරීම | 1. පවත්වන ලද කොන්දොස්තර පුහුණු වැඩමුළු ගණන. | - | 02 |
| | | 2. පවත්වන ලද රියදුරු පුහුණු වැඩමුළු ගණන. | - | 02 |
| | | 3. බස්රථ හිමියන් දැනුවත් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළු ගණන. | - | 01 |
| | | 4. පාසල් ප්‍රවාහන සේවකයින් දැනුවත් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළු ගණන. | - | 01 |
| | | 5. කාර්යාල/ඇහලුම්/භාණ්ඩ ප්‍රවාහන සේවා හිමියන් දැනුවත් කිරීම සඳහා පවත්වන ලද වැඩමුළු ගණන. | - | 01 |
| | | 6. හොඳම කොන්දොස්තර වරයා ,හොඳම රියදුරු සහ හොඳම බස්රථ හිමියා තේරීම සඳහා වූ වාර්ෂික සම්මාන උළෙලවල් ගණන. | - | 01 |
| | | 7. පිහිටුවන ලද පුහුණු රියදුරු/කොන්දොස්තරවරු සංචිතය. | - | 100 |
| 1.4 | නීති බලාත්මක කිරීම | 1. සකස් කරන ලද ප්‍රඥප්ති අඩුපාඩු ප්‍රමාණය. | - | - |
| | | 2. විධිමත් කරන ලද ගැසට් නිවේදන ප්‍රමාණය. | - | - |
| | | 3. විධිමත් කරණ ලද නීති බලාත්මක කිරීමේ ප්‍රඥප්ති ප්‍රමාණය. | - | 25% |

**සංරචකය (Component) 02 : ගුණාත්මක මගී සේවා සැපයීම** (ගුණාත්මක මගී ප්‍රවාහන සේවා සැපයීම සඳහා මගී ඉල්ලුම අනුව නව බස්රථ යෙදවිය හැකි ග්‍රාමීය මාර්ග හඳුන්වා දී එම මාර්ගවල බස්රථ ධාවනයේ යෙදවීම මගින් මගී ජනතාවගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීමත්, සිසුසැරිය බස්රථ සහ පාසල් ප්‍රවාහන රථ යෙදවීම මගින් ශාරීරික හා මානසික අපහසුතාවයකින් තොරව පාසල් දරුවන් නියමිත වේලාවට පාසැලට යාමටත් ආරක්ෂිතව නැවත නිවෙස්වලට ඒමටත් හැකි පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 2.1 | නව මාර්ග හඳුන්වා දීම | 1. මගී ඉල්ලුම අනුව නව බස්රථ යෙදවිය හඳුන්වා දෙන ලද ග්‍රාමීය මාර්ග ගණන. | 26 | 05 |
| | | 2. සිසු ඉල්ලුම අනුව නව සිසුසැරිය බස්රථ යෙදවිය හැකි හඳුන්වා දෙන ලද මාර්ග ගණන. | 90 | 10 |
| | | 3. සිසු ඉල්ලුම අනුව නව පාසල් ප්‍රවාහන රථ යෙදවිය හැකි හඳුන්වා දෙන ලද මාර්ග ගණන. | 15 | 50 |
| | | 4. කාර්යාල සේවක ඉල්ලුම අනුව නව කාර්යාල සේවක ප්‍රවාහන රථ යෙදවිය හැකි හඳුන්වා දෙන ලද මාර්ග ගනන. | - | 10 |

**සංරචකය (Component) 03 : ගුණාත්මක මගී සේවා සැපයීම** (ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා සේවකයින්ගේ ආකල්ප වර්ධනය කිරීම සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම රාජකාරී කටයුතු සඳහා ඉතාමත් වැදගත් වන බැවින් සියලුම කාර්ය මණ්ඩල සඳහා දේශන හා වැඩමුළු පැවැත්වීම සහ ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් කාර්යක්ෂම, ජනතාවාදී, ගුණාත්මක ප්‍රවාහන සේවාවක් සැපයීම අපේක්ෂා කෙරේ).

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 3.1 | රාජ්‍ය ආයතන වල ධාරිතා සංවර්ධනය | 1. සේවකයින්ගේ ආකල්ප වර්ධනය සඳහා පවත්වන ලද දේශන හා වැඩමුළු ගණන. | - | 03 |
| | | 2. පළාත් අධිකාරිවල සේවකයින් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා පවත්වන ලද වැඩසටහන් ගණන. | - | 01 |
| | | 3. කාර්ය මණ්ඩලයට ලබා දෙන ලද සේවස්ථ පුහුණු ගණන. | - | 01 |
| | | 4. 5S, SLIM හෝ වෙනත් ආකාරයේ පවත්වන ලද ඵලදායිතා වැඩසටහන් ගණන. | - | 02 |
| | | 5. පවත්වන ලද සේවක ප්‍රණාම උළෙලවල් ගණන. | - | 01 |
| | | 6. සේවකයින් අධ්‍යාපනයට යොමුකිරීම සඳහා පිරිනමණු ලබන අර්ධ/පූර්ණ ශිෂ්‍යත්ව ගණන. | - | 10 |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශකවල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01 | මගී පහසුකම් සංවර්ධනය කිරීම | කාපට් අතුරන ලද බස්නැවතුම්පල භූමි ගණන. | 08 | 03 |
| | | ප්‍රධාන නගරවල සහ උප නගරවල නවීකරණය සහ වැඩිදියුණු කරන ලද බස්නැවතුම්පලවල් ගණන. | 05 | 03 |
| | | අලුත්වැඩියා කරන ලද අබලන් තත්වයේ පවත්නා මගී ආවරණ ගණන. | 40 | 05 |
| | | මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල ඉදි කරන ලද නව මගී ආවරණ ගණන. | 20 | 05 |
| 02 | මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම | සෑම ප්‍රධාන නගරයකම ප්‍රධාන බස්නැවතුම්පලවල්හි නූතන උපකරණ සහිතව වැඩිදියුණු කරන ලද වැසිකිළි පද්ධති ගණන. | 04 | 02 |

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම රු.මි. | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟාවීම | | | |
| 01 | කාපට් අතුරන ලද බස්නැවතුම්පල භූමි ගණන. | 08 | 03 | 1. අනුරාධපුර නව බස්නැවතුම්පළ භූමිය තාර යොදා අලුත්වැඩියා කිරීම | 12 | 50,000 |
| | | | | 2. කහටගස්දිගිලිය බස්නැවතුම්පළ භූමිය තාර යොදා අලුත්වැඩියා කිරීම | | 1,500 |
| | | | | 3. ගල්කිරියාගම බස්නැවතුම්පළ කාපට් ඇතිරීම | | 1,000 |
| 02 | සෑම ප්‍රධාන නගරයකම ප්‍රධාන බස්නැවතුම්පල වල්හි නූතන උපකරණ සහිතව වැඩිදියුණු කරන ලද වැසිකිළි පද්ධති ගණන. | 04 | 02 | 1. අනුරාධපුර පැරණි බස්නැවතුම්පළ පොදු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම | | 30,000 |
| | | | | 2. අනුරාධපුර නව බස්නැවතුම්පළ පොදු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම | | 50,000 |
| 03 | ප්‍රධාන නගරවල සහ උප නගරවල නවීකරණය සහ වැඩිදියුණු කරන ලද බස්නැවතුම්පල වල් ගණන. | 05 | 03 | 1. කැකිරාව බස්නැවතුම්පළ ප්‍රතිසංස්කරණය කිරීම. | | 1,500 |
| | | | | 2. තඹුත්තේගම බස්නැවතුම්පළ වහලය සෑදීම | | 5000 |
| | | | | 3. තලාව බස්නැවතුම්පළ මගී පර්යන්තය අලුත්වැඩියා කිරීම. | | 2000 |
| 04 | අලුත්වැඩියා කරන ලද අබලන් තත්වයේ පවත්නා මගී ආවරණ ගණන. | 40 | 05 | 1. මගී ආවරණ අලුත්වැඩියා කිරීම | 01 | 1000 |
| 05 | මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල ඉදි කරන ලද නව මගී ආවරණ ගණන. | 20 | 05 | 1. අලුතෙන් මගී ආවරණ 05 ක් ඉදිකිරීම | 12 | 1000 |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගතකළ ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම

නූතන ලෝකයේ ජීවත්වන මිනිසාට නැතිවම බැරි සේවාවක් බවට පෞද්ගලික බස්රථ ප්‍රවාහන සේවාව පත්ව තිබේ. එම හේතුවෙන් මගී ජනතාව විශාල වශයෙන් බරපතල ගැටලු රැසකට මුහුණපා තිබේ. එනම් ප්‍රමාණවත් පොදු මගී ප්‍රවාහන පහසුකම් නොමැති වීම, ප්‍රවාහන වියදම් අධික වීම, මාර්ගවල රථවාහන තදබදය, දිනපතා ඉහළයන රථවාහන අනතුරු, පරිසර දූෂණය වැනි අපහසුතා හේතුවෙන් පෞද්ගලික බස්රථ සේවාව ලබාගනු ලබන මගී ජනතාවට මහත් අපහසුතා රැසකට මුහුණ දීමට සිදුව ඇති බැවින් උතුරු මැද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රතිපාදන යටතේ 2021 වර්ෂයේ සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා රුපියල් මිලියන 25 ක ප්‍රතිපාදන වෙන් විය.

2019 – 2021 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මධ්‍යකාලීන ආංශික සංවර්ධන සැලැස්මට අනුව 2021 වර්ෂයේදී වෙන් වූ ප්‍රතිපාදන මගින් ඉහළ ඉලක්කයක් ළඟාකර ගැනීමට අපේක්ෂා කළද, දැනට පවතින ලෝක වසංගතයක් වන කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ එය 100% ක ඉලක්කයක් කරා ළඟා වීමට නොහැකි වුවත් දැඩි අපහසුතා මධ්‍යයේ වුවද 65% කට වඩා වැඩි ඉලක්කයක් ළඟාකරගත හැකිවී ඇත. උතුරු මැද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිපාදන 2021 වර්ෂයේ රැපියල් මිලියන 25ක් වෙන් වුවද ,ව්‍යාපෘති සඳහා පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සකස් කරන ලද ඇස්තමේන්තු වටිනාකමට වඩා වෙළඳපොළ මිළගණන් ඉහළ යෑම සහ අවශ්‍ය භාණ්ඩ හා උපකරන හිගකම මත වැඩි වියදමක් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වැයවන බැවින් සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන මගින්වත් යෝජිත එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වුවද ගරු සභාපති තුමාගේ සහ සාමාන්‍යාධිකාරී තුමාගේ නොමසුරු උත්සාහයෙන් හා කැපවීමෙන් අනෙකුත් ව්‍යාපෘති සියල්ලම ක්‍රියාත්මක කර අපේක්ෂිත ඉලක්ක ලඟාකරගැනීමට හැකි වීම සතුටුදායක තත්ත්වයකි.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක. - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධක දර්ශක (නිමැවුම්) | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්සිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| 1. කාපට් අතුරන ලද බස්නැවතුම්පල භූමි ගණන.<br>• අනුරාධපුර නව බස්නැවතුම්පළ භූමිය තාර යොදා අලුත්වැඩියා කිරීම.<br>• කහටගස්දිගිලිය බස්නැවතුම්පළ භූමිය තාර යොදා අලුත්වැඩියා කිරීම.<br>• ගල්කිරියාගම බස්නැවතුම්පළ කාපට් ඇතිරීම. | 100% | – | – |
| 2. සෑම ප්‍රධාන නගරයකම ප්‍රධාන බස්නැවතුම්පලවල්හි නූතන උපකරණ සහිතව වැඩිදියුණු කරන ලද වැසිකිළි පද්ධති ගණන.<br>• අනුරාධපුර පැරණි බස්නැවතුම්පළ පොදු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම.<br>• අනුරාධපුර නව බස්නැවතුම්පළ පොදු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම. | 100% | – | – |
| 3. ප්‍රධාන නගරවල සහ උප නගරවල නවීකරණය සහ වැඩිදියුණු කරන ලද බස්නැවතුම්පලවල් ගණන<br>• කැකිරාව බස්නැවතුම්පළ ප්‍රතිසංස්කරණය කිරීම.<br>• තඹුත්තේගම බස්නැවතුම්පළ වහලය සෑදීම.<br>• තලාව බස්නැවතුම්පළ මගී පර්යන්තය අලුත්වැඩියා කිරීම. | 100% | – | – |
| 4. අලුත්වැඩියා කරන ලද අබලන් තත්වයේ පවත්නා මගී ආවරණ ගණන. | 100% | – | – |
| 5. මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල ඉදි කරන ලද නව මගී ආවරණ ගණන. | 100% | – | – |

2021 වර්ෂය තුළ රුපියල් මිලියන 25ක් උතුරු මැද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිපාදන වෙන් වූ අතර 2021 වර්ෂය සඳහා වාර්ෂික සංවර්ධන සැලැස්ම මගින් යෝජිත අනුමත ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සියල්ලම පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් සකස් කරන ලද ඇස්තමේන්තු වටිනාකමට වඩා පැවති වෙළඳපොළ මිළගණන්

ඉහළ යැම සහ අවශ්‍ය භාණ්ඩ හා උපකරන හිගකම මත වැඩි වියදමක් දරමින් අදාල ව්‍යාපෘති 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර ක්‍රියාත්මක කර අවසන් කිරීමට හැකිවීම තුළින් අත්පත් කරගන්නා ලද කාර්යසාධන දර්ශකය පිළිබඳ සතුටු විය හැක.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුණට ලඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක. | එම ඉලක්කය ළඟාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම්. | එම සැලසුම වෙනුවෙන් 2021 වර්ෂය තුළ ඉටුකළ කාර්යය | එම දර්ශකය අනුව 2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| ගෝලීය අරමුණු 11<br>කාර්යක්ෂම හා ගුණාත්මක පොදු මගී ප්‍රවාහන සේවාව ලබා තිරෝගීමත් පොදු මගී ජනතාව මෙන්ම විශේෂයෙන් සමාජයේ අවධානමට ලක්විය හැකි කාන්තාවන්, ආබාධ සහිත පුද්ගල කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීමට සහය වීම හා පොදු මගී බස්නැවතුම්පළවල යටිතල පහසුකම සංවර්ධනය කිරීම 50% ඉහළ නැංවීම. | • බස්රථවල මගී ආසන වැඩිදියුණු කිරීම.<br>• ධාවනය නුසුදුසු තත්ත්වයේ වාහන 20%න් ඉවත් කිරීම.<br>• නව මාර්ග හා සිසුප්‍රවාහන සේවා බස්රථ 20%න් වැඩි කිරීම.<br>• බස්රථ පරීක්ෂා කිරීමේ කණ්ඩායම්වල සේවාව 80%න් ඉහළ නැංවීම.<br>• අබලන් තත්ත්වයේ බස්රථ නැවතුම් ස්ථාන හඳුනාගෙන භූමි කාපට් ඇතිරීම, නවීකරණය කිරීම 50%න් ඉහළ නැංවීම.<br>• වැසිකිළි පද්ධති සංවර්ධනය 70%න් ඉහළ නැංවීම.<br>• බස්රථ සඳහාත්, පොදු මගීන් සඳහාත් ලබාදෙන සේවාව 100% ක් කාර්යක්ෂම කිරීම.<br>• බස්නැවතුම්පළවල කසල බැහැර කිරීම හා පිරිසිදු කිරීමේ කටයුතු ඉටුකිරීම සඳහා රාජ්‍ය ආයතන සමග සම්බන්ධතාවය 100% ඉහළ නැංවීම.<br>• බස්රථ කොන්දොස්තරවරුන්, රියැදුරන් පුහුණු කිරීම 60%න් ඉහළ නැංවීම | බස්නැවතුම්පල භූමි කාපට් කිරීම. | අනුරාධපුර නව බස්නැවතුම්පළ භූමිය තාර යොදා අලුත්වැඩියා කිරීම. | - | - | 100 |
| | | | කහටගස්දිගිලිය බස්නැවතුම්පළ භූමිය තාර යොදා අලුත්වැඩියා කිරීම. | - | - | 100 |
| | | | ගල්කිරියාගම බස්නැවතුම්පළ කාපට් ඇතිරීම. | - | - | 100 |
| | | | අරලගංවිල බස්නැවතුම්පළ කාපට් ඇතිරීම | 0% | - | - |
| | | සෑම ප්‍රධාන නගරයකම ප්‍රධාන බස්නැවතුම්පලවල්හි ඇති වැසිකිළි පද්ධති නූතන උපකරණ සහිතව වැඩිදියුණු කිරීම. | අනුරාධපුර පැරණි බස්නැවතුම්පළ පොදු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම. | - | - | 100 |
| | | | අනුරාධපුර නව බස්නැවතුම්පළ පොදු වැසිකිළි පද්ධතිය අලුත්වැඩියා කිරීම. | - | - | 100 |
| | | ප්‍රධාන නගරවල සහ උප නගරවල බස්නැවතුම්පලවල් නවීකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම. | කැකිරාව බස්නැවතුම්පළ ප්‍රතිසංස්කරණය කිරීම. | - | - | 100 |
| | | | තඹුත්තේගම බස්නැවතුම්පළ වහලය සෑදීම. | - | - | 100 |
| | | | තලාව බස්නැවතුම්පළ මගී පර්යන්තය අලුත්වැඩියා කිරීම. | - | - | 100 |
| | | අබලන් තත්වයේ පවත්නා මගී ආවරණ අලුත්වැඩියා කිරීම. | අනුරාධපුර නගර සීමාවේ ඇති නිතර මගී ජනතාව සේවාව ලබාගන්නා මගී ආවරණ 5ක් අලුත්වැඩියා කිරීම. | - | - | 100 |
| | | මගී ඉල්ලුම අනුව හඳුනාගත් ස්ථානවල නව මගී ආවරණ ඉදි කිරීම. | අලුතෙන් මගී ආවරණ 05 ක් ඉදිකිරීම. | - | - | 100 |
| | | මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම | බස්රථවල මගී ආසන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආසනික තත්ත්ව වාර්තා ලබාගෙන ධාවනයට සුදුසු බවට මෝටර්රථ කොමසාරිස් මගින් වාර්ථා ලබා ගැනීම. | - | - | 100 |
| | | | නව බස්රථ මගී ප්‍රවාහනයට සුදුසු පරිදි ඔම්ණි සහතයක් ලබා දීමට මෝටර් රථ කොමසාරිස් වෙත ඉල්ලීම් කිරීම | - | - | 100 |
| | | | නව මාර්ග සහ සිසුසැරි බස්රථ ධාවනයේ යෙදවීම. | - | - | 100 |
| | | මගී හිතෛෂී ආකල්ප වර්ධනය කිරීම | කාර්යාල පරිශ්‍රය සේවා දායකයන්ට කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා පිළිසකර කිරීම. | - | - | 100 |

උතුරු මැද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2021 වර්ෂයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 25ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රතිපාදන වලට අනුව වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස්කර අනුමැතිය ද ලබා ගන්නා ලද ව්‍යාපෘති වලින් එක් ව්‍යාපෘතියක් හැර අනෙකුත් සියළුම ව්‍යාපෘති ක්‍රියාත්මක කර අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රථම අවසන් කර පොදු ප්‍රවාහන සේවාව භාවිතා කරණු ලබන මගී ජනතාවගේ අයිතියට පත් කිරීමට හැකි විය.

කාර්යක්ෂම හා ගුණාත්මක පොදු මගී ප්‍රවාහන සේවාව ලබන පොදු මගී ජනතාව මෙන්ම විශේෂයෙන් සමාජයේ අවධානමට ලක්විය හැකි කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයන් සහ වයස්ගත පුද්ගලයන් හට මගී ප්‍රවාහන සේවාව භාවිතයේදී සිදුවන අපහසුතා අවම කිරීම සහ බස්රථ වලින් මාර්ගයේදී සිදුවිය හැකි අනතුරු අවම කිරීම සහ මාර්ගයේදී ආරක්ෂාව ලබාදීම මෙන්ම සියලුම මගී ජනතාවට අඩු මිළට ප්‍රවාහන පහසුකම් සැපයීම යනාදී කාරනා තුළින් 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු කරා ළඟා වීමට හැකිවන පරිදි 2021 වර්ෂයේ දී අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

එසේම පෞද්ගලික මගී ප්‍රවාහන සේවයේදී එම සේවාව ලබාගන්නා මගීන් තුල විවිධ වයස් මට්ටම්, විවිධ මානසික මට්ටම්, විවිධ ආර්ථික මට්ටම්,ඉහළ විධායක ශ්‍රේණියේ සිට කම්කරුවා දක්වා වූ විවිධ තරාතිරම්හි මගීන්, විනෝදාත්මක කටයුතු සඳහා ,වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා ගමන් ගන්නා රෝගීන්, වෙනත් කෙනෙකුගේ හෝ සමාජයේ යම්කිසි අවශ්‍යතාවයක් ඉටුකර දීම සඳහා ආදී වශයෙන් මෙම පෞද්ගලික ප්‍රවාහන සේවාවේ සේවය ලබා ගනී. මෙම අපේක්ෂාවන් ඇතිව බස්රථයේ ගමන් ගන්නා මගියා තම ගමන වෙනුවෙන් යම් මුදලක් ගෙවීමටද සූදානමින් සිටී. මේ හේතු නිසා ප්‍රවාහන සේවාව පාවිච්චි කිරීමේදී මගියා තුල ඇති යම්කිසි බලාපොරොත්තුවක් මෙන්ම අයිතිවාසිකම් කීපයක්ද ආරක්ෂා කරමින් විධිමත් හා ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ක්‍රියාවට නැංවෙන ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා සේවා සපයන්නන්ගේ ආකල්ප වර්ධනය හා පුහුණුව මගින් කළමණාකරන ක්‍රියාවලිය තුළ සිවිල් සමාජය සඳහා සෘජුව ආයක විය හැකි පොදු මගී ප්‍රවාහන සේවා සැපයීම හා ගුනාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා ස්ත්‍රීපුරුෂභාවය, වයස සහ ආබාධ සහිත අය යන සාධක මත පදනම්ව පහසුවෙන් ලබා දීමේ තිරසර සංවර්ධන දර්ශක පාදක කර ගනිමින් 2021 වර්ෂය තුළ තිරසර සංවර්ධන අරමුණු සාක්සාත් කිරීම සඳහා ලෝක වසංගතයක් වන කොවිඩ් වසංගත සමයේ වුවද වෙළඳපළ මිළ වැඩිවීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ගැටළු සහගත තත්ත්වයක් මතු වුවද ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල 100% ක ප්‍රගතියක් කරා ළඟා වීමට හැකි වීම ආයතනය ලත් ජයග්‍රහනයකි. එසේම මෙම ජයග්‍රහන කරා ළඟා වීමේදී පළාත් සභාව තුළින් හා පළාත් ප්‍රවාහන අමාත්‍යාංශය මගින් අධීක්ෂණය සහ අනුග්‍රහය ලැබීම, පළාත් අධිකාරිය සතුව ක්ෂේත්‍රයේ අත්දැකීම් ලත් සහ උසස් අධ්‍යාපනයකින් යුත් කාර්ය මණ්ඩලයක් සිටීම මෙන්ම ව්‍යවස්ථා බලතළ සහිතව පළාත් සභාව විසින් ප්‍රඥප්තිය අනුමත කරවා පිහිට වූ ආයතනයක් වීම ආදීය මගින් අධිකාරියේ ජයග්‍රහන දර්ශක වන ගුණාත්මක මගී ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා මගී පහසුකම් සංවර්ධනය කිරීම, මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීම, මගී හිතෛෂී ආකල්ප වර්ධනය කිරීම කිරීම යනාදී ජයග්‍රන දර්ශක කරා ළඟාවීමට හැකි වීම කොවිඩ් 19 වසංගත සමයේ වුවද අප ආයතනය ලද විශාල ජයග්‍රහනයකි.

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

ගුණාත්මක මගී ප්‍රවාහන සේවා සැපයීම සඳහා මගී පහසුකම් සංවර්ධනය කිරීම, මගී ආරක්ෂාව සහ සුවපහසුව ඉහළ නැංවීම, බස්නැවතුම්පළ ආරක්ෂාව තහවුරු කිරීම සහ සනීපාරක්ෂක කටයුතු ඉහළ නැංවීම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් කාර්යක්ෂම හා ගුණාත්මක සේවාව ලබන නිරෝගිමත් පොදු මගී ජනතාව මෙන්ම විශේෂයෙන් සමාජයේ අවධානමට ලක්විය හැකි කාන්තාවන්, ආබාධ සහිත පුද්ගල කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම සහ 2030 වන විට සියලුම දෙනාට ප්‍රමානවත් ආරක්ෂාකාරී සහ සුවපහසු ප්‍රවාහනසේවාවක් ලබාගත හැකිවන පරිදි ප්‍රවාහන පද්ධතිය වැඩිදියුණු කිරීම යන තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධන අභිමතාර්ථ ලඟාකර ගැනීමට කටයුතු සිදුකර ඇත.

## පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මහජනතාව ලබාදුන් සේවාවන්

| අනු අංකය | ලබා දුන් සේවාවන් | ක්‍රියාත්මක කරන ලද ස්ථානය | ප්‍රතිලාභීන් ගණන | සහය දැක්වූ ආයතන |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කාර්යමණ්ඩල සහ අනෙකුත් අත්‍යවශ්‍ය සේවාවල නිළධාරීන් රාජකාරි සඳහා විශේෂ වූ ප්‍රවාහන සේවාවක් ලබා දීම. | අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම රෝහල් සහ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන. | 350 | මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය |
| 02 | බස් මගී ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරිම | උතුරු මැද පළාත තුළ පිහිටි සියළුම බස්නැවතුම්පළවල්. | 15000 | මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය |
| 03 | කොරෝනා අවධානම ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත් දැන්වීම්, අත්පත්‍රිකා, බිත්ති දැන්වීම් | 1000000 | මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය |
| 04 | බස් නැවතුම්පළ සහ මගී ආවරණ ආශ්‍රිතව දැත් පිරිසිදු කිරීමේ උපකරණ සවි කිරීම සහ ඒවා යාවත්කාලීන කිරීම. | උතුරු මැද පළාත තුළ පිහිටි සියළුම බස්නැවතුම්පළවල් සහ මගී ආවරණ | 200 00 | මහ නගර සභා සහ ප්‍රාදේශීය සභා, ජල සම්පාදන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය. |
| 05 | අත්‍යවශ්‍ය භාණ්ඩ මල්ලක් ලබා දීම. | බස්රථ,ආයතනයේ ලියාපදිංචි ත්‍රි රෝදරථ සේවක පිරිස | 1,150 | ස්වෙච්ඡා සංවිධාන හා බස්රථ හිමිකරුවන් |
| 06 | කොරෝනා වසංගතයේදී භාවිතා කරණු ලබන සෞඛ්‍යාරක්ෂිත උපකරන ලබා දීම. (විෂබීජනාශක දියර, මුව ආවරණ, මුහුණු ආවරණ ආදිය) | පෞද්ගලික ප්‍රවාහන සේවාවේ නියුතු සහ ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක පිරිස | 1,300 | ඇහලුම් ආයතන කීපයක් |
| 06 | කොරෝනා වසංගතයේදී භාවිතා කරණු ලබන සෞඛ්‍යාරක්ෂිත උපකරන ලබා දීම. (විෂබීජනාශක දියර, මුව ආවරණ, මුහුණු ආවරණ ආදිය) | පෞද්ගලික ප්‍රවාහන සේවාවේ නියුතු සහ ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක පිරිස සහ පොදු මගී ජනතාවට | 15,000 | ඇහලුම් ආයතන කීපයක් |
| 07 | මාර්ග පරීක්ෂක නිළධාරීන් යොදවා සනීපාරක්ෂක පහසුකම් දෛනිකව සොයා බැලීම. (ගමනාරම්භයේ සිට ගමනාන්තය දක්වා.) | සිසුසැරිය බස්රථ සහ සියළුම පොදු ප්‍රවාහන සේවා බස්රථ | 200,000 | මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණු දුන් ගැටළු හා දුෂ්කරතා

උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය මගින් 2021 වර්ෂයේ මගී පහසුකම් සංවර්ධනය කිරීම මගින් මගී ආරක්ෂාව හා සුවපහසුව ඉහළ නැංවීමේ අරමුණින් බස් නැවතුම්පළ භූමි කාපට් ඇතිරීම, සෑම ප්‍රධාන නගරයකම ප්‍රධාන බස්නැවතුම්පලවල්හි ඇති වැසිකිළි පද්ධති නූතන උපකරණ සහිතව වැඩිදියුණු කිරීම මගින් දෛනිකව ප්‍රවාහන පහසුකම් ලබාගන්නා මගී ජනතාවගේ පහසුව සැලසීම හා ක්‍රමවත් නගර සැලසුමක් සඳහා දායක වීම මෙන්ම ඉහළ යන මගී අවශ්‍යතාවයට සාපේක්ෂව බස් මගී ආවරණ ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම මගින් මගී ජනතාව පොදු මගී ප්‍රවාහන සේවාව ලබා ගැනීමේ ප්‍රවනතාවය වැඩි කිරීම, බස්නැවතුම්පළවල් ඉදිවීම සහ යටිතල පහසුකම් සංවර්ධනය තුළින් මගී ජනතාවට විධිමත් හා ක්‍රමවත් ප්‍රවාහන පහසුකම් ලබා දීමට හැකිවීම, බස්නැවතුම්පළ තුලට බස්රථ ඇතුල් කිරීමට නොහැකි වන පරිදි වලවල් හැරී ඇති බැවින් මගී ජනතාවට බස් පහසුකම් ලබා ගැනීමේදී මහත් අපහසුතාවයන්ට ලක්වන බැවින් එම බස්නැවතුම්පළ භූමි කාපට් ඇතිරීම මගින් මගී ජනතාවට විධිමත් හා ක්‍රමවත් ප්‍රවාහන පහසුකම් ලබා දීම සඳහා සෞභාග්‍යයේ දැක්ම තුළින් "සුවපහසු ගමනක් පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක්" යන්න සාක්සාත් කිරීම සඳහා කොවිඩ් 19 ගෝලීය වසංගතය අභිමුවේ වුවද ඉටුකිරීමට හැකි විය.

2021 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රුපියල් මිලියන 25ක ප්‍රතිපාදන වෙන් වුවද එම ප්‍රතිපාදන සඳහා අනුමත ව්‍යාපෘතිවලින් එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය එයට ප්‍රධානම හේතු සාධකය විය. එමෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මුහුණ පෑමට සිදුවූ අභියෝග සහ ගැටළු ලෙස සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනීමට යාමේදී කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රාජකාරී කටයුතු සිදු කිරීමේදී විශාල දුෂ්කරතා හා ගැටළු රැසකට මුහුණ දීමට සිදු විය. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අප ආයතනය සමග සම්බන්ධවන අනෙකුත් රාජ්‍ය ආයතන සමග රාජකාරී මය ලෙස සම්බන්ධ වීමේදී විවිධ අපහසුතාවයනට ලක් වීමට සිදු විය. එනම් ආයතන කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩි කාලයක් වසා තැබීම, කාර්යමණ්ඩලයට මෙම වසංගතය වැළදීම මෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පනවා තිබූ සෞඛ්‍ය නීතීන් හේතුවෙන්ද නියමිත කාල වලදී අවශ්‍ය රාජකාරී කටයුතු සිදු කරගැනීමට නොහැක් විය. එම ගැටළුව විසදා ගත් ආකාරය මෙම නිදසුන මගින් පෙන්වා දිය හැක. ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තුවක් ලබා ගැනීමට යාමේදී සිදු කරණු ලබන සියලුම ආයතන එක්ව සිදුකරණු ලබන සහභාගීත්ව නිරීක්ෂණ වැඩසටහන් සිදු කිරීමට නොහැකි වීමත් එම කටයුතු සිදු කිරීම දුරකථන මාර්ගයෙන් තනි තනිව අදාල ව්‍යාපෘති නිරීක්ෂණය කර ඇස්තමේන්තු සහ අදාල වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම නිසා ක්‍රියාකාරී සැලැස්මට අනුව නියමිත කාලයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම දැක්විය හැක.

එසේම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු ලබාගෙන සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ නියමිත රාජකාරී ක්‍රමවේද අනුගමනය කරමින් ව්‍යාපෘති සඳහා ගිවිසුම්ගත වුවද, ඇස්තමේන්තු ගත වටිනාකමට වඩා වැඩි වියදමක් වෙළඳපළ මිළ ගණන් වැඩිවීම හේතුවෙන් ගිවිසුම් කරුට දැරීමට සිදුවීම නිසාත්, මිළ විචලනය සඳහා ගෙවීමට නිර්දේශිත වටිනාකමට වඩා වැඩි වියදමක් දැරීමට සිදුවන නිසාත් ගිවිසුම්කරුට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අපහසු කාර්යයක් වූ බැවින් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එක් ව්‍යාපෘතියක් පමණක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එසේම, මෙම ව්‍යාපපෘති ක්‍රියාත්මක කිරීමේදී ආයතනයට ප්‍රමාණවත් පරිදි ප්‍රවාහන පහසුකම් නොමැතිකම, බස්නැවතුම්පළ සංවර්ධනයේදී ව්‍යාපාරික ප්‍රජාවගේ සහ මහජනතාවගේ අවහිරතා මෙන්ම කලින් කලට සිදුවන දේශපාලනික වෙනස්වීම් මත සභාපති, සාමාන්‍යාධිකාරී සහ අධ්‍යක්ෂමණ්ඩලය වෙනස් වීම සහ දේශපාලනික පාර්ශ්වයන්ගේ විවිධ මතවාද සහ බලපෑම් හේතුවෙන් ආයතනයේ කටයුතු කිරීමේදී ඇතිවන ගැටළු සහ අභියෝග ආයතනයේ කාර්යමණ්ඩලයට මෙන්ම ඉදිරි ගමනටද බාධාවක්ව පවතී.

## ආදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 01 | මාර්ග බලපත්‍ර | 4,124.35 | 78% |
| 01 ii | සිසු සැරිය (මාර්ග බලපත්‍ර) | 511.50 | 85% |
| 01 iii | සිසු ප්‍රවාහන (මාර්ග බලපත්‍ර) | 41.30 | 41% |
| 02 i | නව බලපත්‍ර (සාමාන්‍ය) | 1670.00 | 84% |
| 03 | හිමිකාරීත්වය පැවරීම | 2,200.00 | 44% |
| 04 i | ලොග් පත්‍ර | 5,110.90 | 43% |
| 04 ii | සිසුසැරිය ලොග් පත්‍ර | 418.05 | 29% |
| 05 | පිවිසුම් පත්‍ර | 1,276.45 | 32% |
| 06 | කොන්දොස්තර බලපත්‍ර | 478.70 | 60% |
| 07 | විශේෂ චාරිකා බලපත්‍ර | 105.20 | 15% |
| 08 | මගී ප්‍රවේශපත්‍ර | 412.05 | 52% |
| 09 | අතුරුගමන්වාර පත්‍ර | 862.00 | 43% |
| 10 | තාවකාලික මගී දේවා බලපත්‍ර | 79.20 | 26% |
| 11 | කඩකාමර කුලී | 780.35 | 13% |
| 12 | දඩ මුදල් - ජංගම පරීක්ෂක | 630.85 | 31% |
| 13 | වැසිකිලි බදු මුදල් | 955,00 | 35% |
| 14 | ත්‍රී රෝදරථ ආදායම් | 713.10 | 36% |
| 15 i | ඇහලුම් හා වෙනත් මගී සේවා | 40.00 | 20% |
| 15 ii | පාසල් ප්‍රවාහන සේවා | 0.00 | 0% |
| 15 iii | භාණ්ඩ ප්‍රවාහන සේවා | 0.00 | 0% |
| 16 | විවිධ ආදායම් - වෙනත් | 202.33 | 10% |
| 16 ii | රියදුරු බලපත්‍ර | 0.00 | 0% |
| 17 | වෙළඳ ප්‍රචාරය | 180.00 | 36% |
| 18 | පොලී/ආපදා ණය | 252.93 | 126% |
| 19 i | පොලී/රඳවුම් ගිණුම INTEREST | 65.01 | 22% |
| 20 | අමාත්‍යාංශය ප්‍රතිපාදන (වැටුප්) | 56,266.67 | 113% |
| 21 i | අමාත්‍යාංශය ප්‍රතිපාදන (ඉදිකිරීම්) | 2,479.33 | 10% |
| 21 ii | අමාත්‍යාංශය ප්‍රතිපාදන (සැපයුම්) | _ | _ |
| 21 iii | අමාත්‍යාංශය ප්‍රතිපාදන (පුහුණු) | _ | _ |
| **එකතුව** | | **79,855.27** | **78%** |

# 9.5.පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය හා මූලික තොරතුරු

උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක 02 න් සමන්විත වේ. මෙම දෙපාර්තමේන්තුව 1987 අංක 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරමින් අංක 42 පළාත් සභා ලැයිස්තුවේ 29.2 වගන්තිය යටතේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. කෘෂිකර්ම හා සත්ව පාලන අමාත්‍යංශය වෙනම ඒකකයක් වශයෙන් පිහිටුවා තිබුණි.

1987 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා 13 වන සංශෝධනයේ 09 වන උපලේඛණයේ 29.2 වගන්තියෙන් පැවරි ඇති බලතල ප්‍රකාරව උතුරුමැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් ආවරණය වන පරිදි බල ප්‍රදේශය විශාල වීමත්, කාර්යය බහුල වීමත් නිසා 1989 ජුනි 01 වන දින වෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත විය. පළාතේ ක්‍රීඩා පරිපාලනය හා සංවර්ධන කටයුතු වලට ශක්තිමත් දායකත්වයක් ලබා දීමේ අරමුණින් අනුරාධපුර මෛත්‍රීපාල සේනායක මාවතේ මහජන ක්‍රීඩාංගනය අසල 2004 අප්‍රේල් 27 වන දින සිට නව පරිපාලන ගොඩනැගිල්ලක් ස්ථාපිත කරන ලදී. එතැන් සිට අද දක්වා පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව එම භූමියේ පිහිටා තිබේ. පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව යටතේ පොළොන්නරුව ආණ්ඩුකාර කාර්යාලයේ දිස්ත්‍රික් කාර්යාලයක් පිහිටුවා ඇති අතර දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරියකු විසින් එහි අධීක්ෂණ කටයුතු මෙහෙයවනු ලැබේ.

## පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතු භෞතික සහ අනෙකුත් සම්පත්

- දැනට පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු කාර්යාලය පවත්වාගෙන යන දෙමහල් කාර්යාල ගොඩනැගිල්ල.
- උතුරු මැද පළාත් ක්‍රීඩා සංකීර්ණය- අනුරාධපුර.
- අනුරාධපුර පිහිණුම් තටාකය.
- අනුරාධපුර ගෘහස්ත ක්‍රීඩාගාරය.
- අනුරාධපුර හා පොළොන්නරුව බර ඉසිලීමේ පුහුණු මධ්‍යස්ථාන.
- පොළොන්නරුව දිස්ත්‍රික් උප කාර්යාලය.
- කැබ් රථ 02.
- වෑන් රථ 01.

## ක්‍රීඩකයන්ට පුහුණු පහසුකම් සැපයෙන ක්‍රීඩාංගන

- ❖ අනුරාධපුර ජාතික ක්‍රීඩා සංකීර්ණය
- ❖ අනුරාධපුර පිහිනුම් සංකීර්ණය
- ❖ පොළොන්නරුව ජාතික ක්‍රීඩා සංකීර්ණය
- ❖ පොළොන්නරුව ගෘහස්ථ ක්‍රීඩා සංකීර්ණ

## ක්‍රීඩා පුහුණු සංචිත

| | | |
|---|---|---|
| ජිම්නාස්ටික් | වොලිබෝල් | කරාතේ දෝ |
| බැඩ්මින්ටන් | මල්ලව පොර | පාපන්දු |
| ජුඩෝ | බර ඉසිලීම | පිහිනුම් |
| මලල ක්‍රීඩා | කායවර්ධන | |

## දැක්ම

“ජාතික හා ජාත්‍යන්තර කෙළිබිම ජයගන්නා නීරෝගීමත් හා ක්‍රියාශීලී ජනතාවක්, සංවර්ධිත පළාතක්”.

## මෙහෙවර

“උතුරු මැද පළාතේ ජනතාව නීරෝගීමත් හා ක්‍රියාශීලී කිරීම සඳහාත් ක්‍රීඩකයින් ජාතික හා ජාත්‍යන්තර ජයග්‍රහණ වෙත යොමු කිරීම සඳහාත් ක්‍රීඩා පුහුණු කටයුතු, හඳුනා ගන්නා ලද ක්‍රීඩකයින්ට පහසුකම් සැලසීම, යටිතල පහසුකම් හා ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව සංවර්ධනය කිරීම.”

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම.
- උතුරු මැද පළාත තුළ අභිමානවත් ක්‍රීඩා සංස්කෘතියක් බිහි කිරීම.
- ග්‍රාමීය, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රීඩා කෞශල්‍යයෙන් පිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගැනීම.
- පළාත තුළ සිටින සියළුම ප්‍රජාව ආවරණය වන පරිදි ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- විධිමත් හා කාර්යක්ෂම සේවා සපයන ආයතනික පද්ධතියක් සකස් කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ජාතික ක්‍රීඩා උළලේ පදක්කම් වැඩිපුර ලබා ගැනීම.
- ජාතික ක්‍රීඩා උළලේදී පළාත ඉහළ මට්ටමේ තැබීම.
- ග්‍රාමීය මට්ටමේ දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඉදිරියට ගෙන ඒම.
- පුහුණු මධ්‍යස්ථාන, ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම.

## ප්‍රධාන කාර්යයන්




## ප්‍රධාන උපාය මාර්ගයන්




## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 95ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 74 කි. පුරප්පාඩු සංඛ්‍යාව 18 ක් වේ.

## මූලධන වියදම් - 2021

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය (රු.) | 2021වර්ෂයේ වියදම (රු.) | ඉතිරිය (රු.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 3.21 | 3.02 | 0.19 | 94% |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම. | 3.2 | 2.64 | 0.56 | 82% |
| **එකතුව** | **6.41** | **5.66** | **0.75** | **88%** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

සෞභාග්‍යයේ දැක්ම මගින් එළිදක්වා ඇති ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත් වන පවුලක්, ගුණගරුක විනයගරුක සාධාරණ සමාජයක්, සෞභාග්‍යවත් දේශයක් යන චතුර්විධ අරමුණු ජය ගැනීම සඳහා එළි දක්වා ඇති දස ප්‍රතිපදාවන් අනුව දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය මග වේ.

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

**සංරචකය 1 - පළාත්/ජාතික/ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම.**

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධක දර්ශකය (නිමැවුම්) | පාදම 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1.1 | යටිතල පහසුකම් සංවර්ධනය. | සංවර්ධන සභායන් ලබාදෙන ලද ක්‍රීඩා පිටි සංඛ්‍යාව | | 8 |
| | | දෙපාර්තමේන්තුවට අදාල ක්‍රීඩා පිටි හා වෙනත් භෞතික පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කළ මුදල.(රු.මි.) | 6 | 8 |
| | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉදි කරන ලද පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව. | - | - |
| 1.2 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම. | නවීන ක්‍රීඩා දැනුම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්, පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන් සංඛ්‍යාව | 85 | 110 |
| | | නවීන ක්‍රීඩා දැනුම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව වෙනුවෙන් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රමාණය | 00 | 30 |
| | | ජාත්‍යන්තරය නියෝජනය කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | 20 | 25 |
| 1.3 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පුහුණු කඳවුරු පැවැත්වීම | ජාතික මහා ක්‍රීඩා උළෙලේදී ලබා ගත් පදක්කම් සංඛ්‍යාව | 79 | 85 |
| | | ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | - | 20 |
| | | පුහුණු කරල ලද තරඟ ඉසව් සංඛ්‍යාව. | - | 13 |
| | | පුහුණුව ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛයාව. | 1200 | 1500 |
| 1.4 | ක්‍රීඩා නිලධාරීන්,පුහුණුකරුවන් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පුහුණු තරඟාවලි හා උපහාර උත්සව සංවිධානය | උපහාර ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ පුහුණුකරුවන් සංඛ්‍යාව. | 190 | 200 |
| | | දිරි දීමනා හා පෝෂණ දීමනා ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව | 135 | 140 |
| | | පුහුණු තරඟ ඔස්සේ හඳුනා ගත් ක්‍රිඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | - | 300 |
| | | දිරි දීමනා සඳහා හඳුනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | - | 10 |
| 1.5 | කාර්යාලීය උපකරණ, ක්‍රිඩා භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීම. | පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන් සඳහා ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීමට වෙන් කළ මුදල. (රු.මි.) | - | 5 |
| | | කාර්යාලීය උපකරණ මිල දී ගැනීමට වෙන් කළ මුදල. (රු.මි.) | 0.15 | 4.4 |
| | | විවිධ ක්‍රීඩා ඉසව් සංවර්ධනය සඳහා උපකරණ මිල දී ගැනීමට වෙන් කළ මුදල (රු.මි.) | - | - |
| | | මලල ක්‍රීඩා සංවර්ධනය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | - | - |
| | | සංවර්ධනය කරල ලද භෞතික පහසුකම් ප්‍රොයෝජනයට ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සංඛ්‍යාව | - | - |
| | | ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සඳහා පුහුණු මධ්‍යස්ථාන වෙත වෙන් කළ මුදල. | - | 1.06 |

සංරචකය 02. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ප්‍රජා ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ ව්‍යායාම සඳහා සහභාගී වීමට සාමාන්‍ය ජනතාව පෙළඹවීම.

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධක දර්ශකය (නිමැවුම්) | පාදම 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 2.1 | පුහුණු වැඩසටහන් පැවැත්වීම. | ජාත්‍යන්තර තරඟ සඳහා පුහුණු කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | - | 20 |
| | | පුහුණු කිරීම සඳහා හඳුනා ගත් ක්‍රීඩා ඉසව් සංඛයාව. | - | 32 |
| | | පුහුණු කඳවුරු හා සැසි මගින් හඳුනාගත් මැද පෙළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛයාව. | - | 00 |

සංරචකය 03. ධාරිතා සංවර්ධනය

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධක දර්ශකය (නිමැවුම්) | පාදම 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 3.1 | ක්‍රීඩා සමාජ වැඩි දියුණු කිරීම. | ක්‍රියාකාරී ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 6.48 | 7 |
| | | අලුතින් ආරම්භ කරන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව. | 700 | 730 |
| | | පුහුණුව හා උපකරණ ලබා දීම මගින් වැඩි කරගත් ක්‍රීඩා සමාජ සාමාජිකත්වය. | - | - |
| | | උපකරණ හා පහසුකම් සපයන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව. | 700 | 730 |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධක දර්ශක වල ඉලක්ක ලඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරක ලද සංවර්ධන ව්‍යාපෘති**

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධක දර්ශකය (නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 1.1 | යටිතල පහසුකම් සංවර්ධනය. | සංවර්ධන සහායන් ලබාදෙන ලද ක්‍රීඩා පිටි සංඛ්‍යාව | 08 | 6 |
| | | දෙපාර්තමේන්තුවට අදාල ක්‍රීඩා පිටි හා වෙනත් භෞතික පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කළ මුදල.(රු.මි.) | 06 | 1.54 |
| | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉදි කරන ලද පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව. | 01 | 00 |
| 1.2 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම. | නවීන ක්‍රීඩා දැනුම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සහිත ක්‍රීඩා පුහුණුකරුවන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් සඳහා වෙන් කළ මුදල. (රු.මි.) | 04 | 00 |
| | | නවීන ක්‍රීඩා දැනුම පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව වෙනුවෙන් පුහුණු වැඩසටහන් සඳහා වෙන් කළ මුදල. (රු.මි.) | 0.5 | 00 |
| | | ජාත්‍යන්තරය නියෝජනය කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | 20 | 00 |
| 1.3 | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පුහුණු කඳවුරු පැවැත්වීම | ජාතික මහා ක්‍රීඩා උළෙලේදී ලබා ගත් පදක්කම් සංඛ්‍යාව | 85 | 00 |
| | | ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගී වූ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | 20 | 00 |
| | | පුහුණු කරල ලද තරඟ ඉසව් සංඛ්‍යාව. | 13 | 00 |
| | | පුහුණුව ද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛයාව. | 1500 | 00 |

එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධක දර්ශක වල ඉලක්ක ලඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරක ලද සංවර්ධන ව්‍යාපෘති ඉතිරි කොටස.....................

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධක දර්ශකය (නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 1.4 | ක්‍රීඩා නිලධාරීන්,පුහුණු කරුවන් හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා පුහුණු තරඟාවලි හා උපහාර උත්සව සංවිධානය | උපහාර ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ පුහුණුකරුවන් සංඛ්‍යාව. | 190 | 00 |
| | | දිරි දීමනා හා පෝෂණ දීමනා ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව | 135 | 110 |
| | | පුහුණු තරඟ ඔස්සේ හඳුනා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | 300 | 00 |
| | | දිරි දීමනා සඳහා හඳුනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | 10 | 10 |
| 1.5 | කාර්යාලීය උපකරණ ,ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීම. | පුහුණුකරුවන් හා ක්‍රීඩා නිලධාරීන් සඳහා ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ මිල දී ගැනීමට වෙන් කළ මුදල. (රු.මි.) | 5 | 00 |
| | | කාර්යාලීය උපකරණ මිල දී ගැනීමට වෙන් කළ මුදල. (රු.මි.) | 4.4 | 2.08 |
| | | විවිධ ක්‍රීඩා ඉසව් සංවර්ධනය සඳහා උපකරණ මිල දී ගැනීමට වෙන් කළ මුදල (රු.මි.) | - | - |
| | | මලල ක්‍රීඩා සංවර්ධනය සඳහා වෙන් කළ මුදල (රු.මි.) | - | - |
| | | සංවර්ධනය කරල ලද භෞතික පහසුකම් ප්‍රොයෝජනයට ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා පුහුණුකරුවන් සංඛ්‍යාව | - | - |
| | | ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ සඳහා පුහුණු මධ්‍යස්ථාන වෙත වෙන් කළ මුදල. | 1.06 | 00 |

**සංරචකය 02. සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ප්‍රජා ක්‍රීඩා ක්‍රියාකාරකම් සහ ව්‍යායාම සඳහා සහභාගී වීමට සාමාන්‍ය ජනතාව පෙළඹවීම.**

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධක දර්ශකය (නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 2.1 | පුහුණු වැඩසටහන් පැවැත්වීම. | ජාත්‍යන්තර තරඟ සඳහා පුහුණු කරන ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | 20 | 00 |
| | | පුහුණු කිරීම සඳහා හඳුනා ගත් ක්‍රීඩා ඉසව් සංඛ්‍යාව. | 32 | 00 |
| | | පුහුණු කඳවුරු හා සැසි මගින් හඳුනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව. | 20 | 00 |

සංරචකය 03. ධාරිතා සංවර්ධනය

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධක දර්ශකය (නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 3.1 | ක්‍රීඩා සමාජ වැඩි දියුණු කිරීම. | ක්‍රියාකාරී ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ ලබා දීම සඳහා වෙන් කළ මුදල (රු.මි.) | 7 | 00 |
| | | අලුතින් ආරම්භ කරන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව. | 30 | 02 |
| | | පුහුණුව හා උපකරණ ලබා දීම මගින් වැඩි කරගත් ක්‍රීඩා සමාජ සාමාජිකත්වය. | 400 | 350 |
| | | උපකරණ හා පහසුකම් සපයන ලද ක්‍රීඩා සමාජ සංඛ්‍යාව. | 700 | 730 |

## ප්‍රධාන කාර්ය සාධක දර්ශකය ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධක දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා වීම | | |
| 1.1 | සංවර්ධන සහායන් ලබාදෙන ලද ක්‍රීඩා පිටි සංඛ්‍යාව | 08 | 07 | 1.ඇලහැර මහවැලි ක්‍රීඩාංගනයේ ශක්ති වර්ධන ශාලාව අලුත්වැඩියාව. | 1500 |
| | | | | 2.නුවරගල පොදු ක්‍රීඩාංගනයේ අලුත්වැඩියා කටයුතු. | 1700 |
| | | | | 3.තමන්කඩුව 04 ඇල පොදු ක්‍රීඩාංගනයේ අලුත්වැඩියාව | 1900 |
| | | | | 4.වැලිකන්ද සෙවනපිටිය මහවැලි ක්‍රීඩාංගනයේ විදුලි අලුත්වැඩියාව | 2100 |
| | | | | 5.මැදිරිගිරිය ඒකනායක මහවැලි ක්‍රීඩාංගනයේ අලුත්වැඩියාව | 1000 |
| | | | | 6. 140 ලංකාපුර වැලි ඇල ක්‍රීඩා පිටියේ ගැල්වනයිස් බට සවි කිරීම | 900 |
| | | | | 7.ඉපලෝගම රණජයපුර ත්‍රිවිධ හමුදා නිවාස සංකීර්ණයේ අත්පන්දු ක්‍රීඩා පිටිය දිවා රාත්‍රී ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය | 2000 |
| | දෙපාර්තමේන්තුවට අදාල ක්‍රීඩා පිටි හා වෙනත් භෞතික පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කළ මුදල. (රු.මි.) | 06 | 1.54 | 1. කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරිම ව්‍යාපෘතියේ අතැති බිල්පත් ගෙවිම | 80 |
| 1.4 | දිරි දීමනා/පෝෂණ දීමනා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාව | 135 | 10 | ජාතික මහා ක්‍රීඩා උළෙල හා ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගී වීම වෙනුවෙන් වාර්ෂිකව ගෙවනු ලබන දීමනාවකි. | 10 |
| 1.5 | කාර්යාලීය උපකරණ මිල දී ගැනීමට වෙන් කළ මුදල. (රු.මි.) | 4.4 | 2.08 | 1. නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා කාර්යාලීය ලී බඩු හා උපකරණ ලබා ගැනීම හා ලේඛණගාරය හා ගබඩාව සකස් කිරිම.<br>2. ගබඩාව හා ලේඛනාගාරය සඳහා අවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම. | 80 |

## 1.ක්‍රීඩා පිටි සංවර්ධනය



වැලිකන්ද මහවැලි ක්‍රීඩාංගනයේ ශක්තිවර්ධන ශාලාවේ විදුලි අලුත්වැඩියාව

තමන්කඩුව 04 ඇල ක්‍රීඩාංගනය සංවර්ධනය





මැදිරිගිරිය ඒකනායක මහජන ක්‍රීඩාංගනය සංවර්ධනය



ලංකාපුර වැලිඇල වසමේ වොලිබෝල් ක්‍රීඩා පිටිය සඳහා ගැල්වනයිස් බට සවි කිරීම



ඉපලෝගම, රණජයපුර යුධ හමුදා නිවාස සංකීර්ණයේ වොලිබෝල් ක්‍රීඩාංගනය සංවර්ධනය.

## 3.ප්‍රාදේශීය හා අන්තර් ක්‍රීඩා සමාජ තරඟ පැවැත්වීම - අනුරාධපුර හා පොළොන්නරු දිස්ත්‍රික්ක









**2.** නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා කාර්යාලීය ලී බඩු හා උපකරණ ලබා ගැනීම .



**04. XXXI** වන උතුරුමැද පළාත් ක්‍රීඩා උළෙල පැවැත්වීම



## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සභජීවනය ප්‍රවර්ධනය කිරීම හා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියලු කාන්තාවන් හා ළමුන් සවිබල ගැන්වීම යන තිරසර සංවර්ධන අරමුණු 02 ලගා කර ගැනීම හා දර්ශක කෙරේ යොමු විමට හැකි වි ඇත. එම තිරසර සංවර්ධන අරමුණ කරා යාමට හැකි වන ආකාරයේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරිමට හැකියාව ලැබුණි..එනම් 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරිම සියදිවි නසා ගැනීම්/මත්ද්‍රව්‍ය භාවිතය හා යොමුවන ප්‍රමාණ අවම කිරිම යන දර්ශකයන් කෙරේ යොමු විය හැකි විම සතුටට කරුණකි.

ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම,සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරිම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය හා ජාතික දේශසිමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුලත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරිම යන තිරසර සංවර්ධන අරමුණ කරා ගමන් ගන්නා ආකාරයේ ව්‍යාපෘති කිහිපයක්ද ක්‍රියාත්මක කිරිමට හැකිවිය.ඒ අතර කාර්යාල ගොඩනැගිල්ල සංවර්ධන කටයුතු නිම කිරීමට හැකි වීම, වාර්ෂිකව ක්‍රීඩා පිටි සංවර්ධනය, සංවර්ධනය කරන ලද කාර්යාල ගොඩනැගිල්ල සඳහා නවීන ගෘහ භාණ්ඩ මිල දී ගැනීම, ගබඩාව හා ලේඛණාගාරය සඳහා රාක්ක මිල දී ගැනීම යන ව්‍යාපෘති ඉතා සාර්ථකව නිම කිරීමට හැකි විය. අන්තර් ක්‍රීඩා සමාජ, අන්තර් ප්‍රාේදේශීය ලේකම් කොට්ඨාශ, හා අන්තර් දිස්ත්‍රික් තරඟ අවම සහභාගීත්වයෙන් යුතුව නිම කර ගැනීමට හැකි වීමද පැවති වාතාවරණය හමුවේ ලබාගත් ජයග්‍රහණයක් සේ සැලකිය හැක.

2021 වර්ෂයේ වාර්ෂික සංවර්ධන සැලැස්ම යටතේ ඉහත මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මෙහි ඉහළ ප්‍රගතියක් අත්පත් කර ගැනීම සඳහා අවශ්‍ය සියළුම අංශයන් වෙනුවෙන් රුපියල් මිලියන 23.5ක මුදලක් වෙන් කර දී තිබීම අප ලද ජයග්‍රහණයකි. මේ යටතේ ව්‍යාපෘති 19ක් සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) සහ පළාත් සභා සංවර්ධන ප්‍රදාන (PCDG) යටතේ මුදල් වෙන් කර දී තිබුනද ගෝලීය කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ක්‍රීඩා තරඟ පැවැත්වීමට දැඩි බාධා එල්ල වූ අතර ප්‍රදාන ඉලක්කයක් වන ජාතික මහා ක්‍රීඩා උළෙල නොපවත්වන ලදී. එසේම ඇති වූ ආර්ථික අස්ථායිතාව මත 2021/08/30 දිනැතිව ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් නැවැත්වීමට සිදු වූ අතර ක්‍රියාත්මක කළ හැකි වූයේ ව්‍යාපෘති 05ක් පමණි.

මානව සම්පත් හිගය ද මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ ඉලක්කයන් සපුරා ගැනීමට බාධාවක්ව පවතී. සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික) තනතුර පුරප්පාඩුව පැවතීම තුළ දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියේදී ආයතන අධ්‍යක්ෂවරයාට ලැබිය යුතු තාක්ෂණික සහය නොමැති වීම ක්‍රීඩා තරඟ පැවැත්වීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහ ක්‍රීඩා නිලධාරීන් සමග සම්බන්ධීකරණය වීම සහ පහසුකම් සැපයීම, යටිතල පහසුකම් සංවර්ධනය, යන ආයතනයේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමේදී බාධාවක්ව පවතී.

ක්ෂේත්‍රගත සේවා සැපයීම ක්‍රීඩා සංවර්ධනය හා ව්‍යාප්තිය යන ප්‍රධාන අරමුණුවල ඉටු කර ගැනීමෙහි ලා අත්‍යවශ්‍ය වුවද එම කාර්යේදී මූලික කාර්යභාරයක් පැවරෙන ක්‍රීඩා පුහුණුකරු තනතුරු 06ක් පුරප්පාඩුව පවතී. ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තටාකයක් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව සතුව පැවතියද එහි සේවාවන් සැපයීමට අදාල තනතුරු පුරප්පාඩුව පැවතීම නිසා භෞතික සම්පත් නිසි ඵලදායිතාවෙන් යුතුව ආයතනික කාර්යසාධනය උදෙසා භාවිත කිරීම අපහසු වී ඇත.

එමෙන්ම අප දෙපාර්තමේන්තුවේ දැනට විවිධ තරග ඉසව් පුහුණු කරනු ලබන පුහුණු කරුවන්ද ඔවුන්ගෙ පුහුණු කටයුතු සඳහා ප්‍රමාණවත් උපකරණ හා පහසුකම් නොමැති වීමෙන් ගැටලු සහගත තත්වයන්ට මුහුණ දී ඇත නව පුහුණු උපකරණ ඒ පිළිබඳ තාක්ෂණික දැනම මද කම මෙන්ම උතුරු මැද පළාතේ එළිමහන් ක්‍රීඩා කටයුතු සඳහා ප්‍රමාණවත් පහසුකම් නෙමැති බවටද විවිද අංශ වලින් වාර්තා වී ඇත. උතුරු මැද පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා වර්ධනය කිරිම සඳහා සඳහා පුහුණු අවස්ථා අනෙක් පළාත් වලට සාපේක්ෂව නොමැති වීම නිසා ක්‍රීඩක ක්‍රීඩාකාවන් ගේ කුසලතා වර්ධනය සම්බන්ධ ගැටලු පවතින බව නිරික්ෂණය විය.

## ආයතනයේ කාර්ය සාධනය දර්ශක - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධක දර්ශක | වර්ෂය තුළ සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක්(%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| 1.පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩා සහ පුහුණු කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය. | 90% | | |
| 2. විධිමත් හා කාර්යක්ෂම සේවා සපයන ආයතනික පද්ධතියක් සකස් කිරීම. | 90% | | |
| 3.උතුරු මැද පළාත තුළ සිටින සැඟවුණු කුසලතාවලින් හෙබි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මනා ක්‍රීඩා පුහුණුවක් ලබා දී ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම. | | | 55% |
| 4.ජාතික ක්‍රීඩා උළලේ පදක්කම් වැඩිපුර ලබා ගැනිම හා ජාතික ක්‍රීඩා උළලේදී පළාත ඉහළ මට්ටමේ තැබිම. | | | |
| 5.ග්‍රාමීය,ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනා ගැනීම,පහසුකම් සැපයීම හා සංවර්ධනය. | | 80% | |

ඉහත අංක 01 යටතේ 2021 වර්ෂයේ දී ක්‍රීඩා පිටි 07ක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. 1,485,204.16 ක මුදලක් වියදම් කර ඇති අතර එය එම වර්ෂයේදී උක්ත ශීර්ෂය යටතේ වෙන් කරන ලද මුදලින් 88.61 % මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීමක් වන අතර 90%ක පමණ භෞතික ප්‍රගතියක් අත්පත් කර ගැනීමකි.

ඉහත අංක 02 යටතේ නවීකරණය කරන ලද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු පරිපාලන ගොඩනැගිල්ල සඳහා කාර්යාල උපකරණ ලබා ගැනීම සහ ගබඩාව සඳහා රාක්ක මිල දී ගැනීම යන ක්‍රියාකාරකම් වෙනුවෙන් 2,641,598.50 ක මුදලක් වියදම් කර ඇති අතර එය වෙන් කරන ලද මුදලින් 82.55% ක මූල්‍ය ප්‍රගතියක් අත්පත් කර ගැනීමකි. එහෙත් මිල දී ගැනිම් අවශ්‍යතාවය භෞතිකව 100%ක් ලෙස සම්පූර්ණ ප්‍රගතියක් ලබා ඇත.

ඉහත අංක 03, 04 හා 05 යටතේ උපරිම ඵලදායිතාවක් අත්පත් කර ගැනීම සඳහා වන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය සම්පූර්ණ අදියර ප්‍රමාණය කරා ළඟා වීමට නොහැකි වීමට කොරෝනා ආපදා තත්ත්වය හේතු විය. එනම් ජාතික මහා ක්‍රීඩා උලෙ 2020 හා 2021 වර්ෂවලදී පැවැත්වීමට නොහැකි විය. එහෙත් XXXI උතුරුමැද පළාත් ක්‍රීඩා උළෙල අවම සහභාගීත්වයක් යටතේ කිසිඳු උත්සවයකින් තොරව තරඟ ඉසව් පමණක් පැවැත්වීමෙන් අවසන් කර ගැනීමට හැකි විය.

2021 වර්ෂය වන විට ලියාපදිංචි ක්‍රීඩා සමාජ ප්‍රමාණය 702ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි වීම ජයග්‍රහණයකි. 2021 වසර සඳහා පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්කක සපුරා ගැනීම වෙනුවෙන් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) හා පළාත් සභා සංවර්ධන ප්‍රදාන (PCDG) යටතේ රු.මි.23.5ක මුදලක් වෙන් කර තිබූ අතර එය ව්‍යාපෘති 19ක් වෙනුවෙන් වෙන් කර තිබුණි. එහෙත් 2021 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත 2020 හා 2021 වර්ෂයේ ජාතික මහා ක්‍රීඩා උළෙල නොපැවැත් වූ අතර ඒ වෙනුවෙන් වන පුහුණු කඳවුරු පැවැත්වීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම යන කටයුතු ඉටු කර ගැනීමට නොහැකි වීමට උක්ත ජාතික ආපදා තත්ත්වය හේතු විය. එසේම 2021/08/30 දින සිට ක්‍රියාත්මක වන පරිදි අප වෙත ප්‍රතිපාදන වෙන් කර තිබූ ව්‍යාපෘති රැසක් නැවැත්වීමට තීරණය කිරීම මතද අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට බාධාකාරී තත්ත්වයක් ඇති විය.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණු | ගෝලීය අරමුනට ලඟා වීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ලඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටු කළ කාර්ය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය. | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50%- 74% | 75%- 100% |
| 03.නිරෝගී ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම සහජීවනය ප්‍රවර්ධනය කිරීම | 3.4. 2030 වන විට බෝනොවන රෝග නිසා සිදු වන අකල් මරණ අඩු කර ගැනීම හා මානසික සෞඛ්‍යය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරිම | ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාකාරි ක්‍රීඩා සමාජ ප්‍රමාණය 10% ප්‍රමාණයකින් වැඩිකිරිම | ලියාපදිංචි ක්‍රීඩා සමාජ ප්‍රමාණය 720 දක්වා වැඩි කර ගැනීම | | | 76% |
| 09.ස්ථායී යටිතල පහසුකම් ගොඩනැගීම,සංයුක්ත සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරිම හා නවෝත්පාදනයන් දිරිගැන්වීම | 9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබා ගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය හා ජාතික දේශසීමාවන් අතර සිදු කරන යටිතල පහසුකම්ද ඇතුලත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර හා ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරිම | ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණය වාර්ෂිකව 30% කින් වැඩි කර ගැනීම | 1.ක්‍රීඩා පිටි සංවර්ධනය<br><br>2.කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරිම ව්‍යාපෘතියේ අතැති බිල්පත් ගෙවීම<br><br>3.ගබඩාව හා ලේඛනාගාරය සඳහා අවශ්‍ය භාණ්ඩ මිල දී ගැනීම<br><br>4.නව කාර්යාල ගොඩනැගිල්ල සඳහා කාර්යාලීය ලී බඩු හා උපකරණ ලබා ගැනීම හා ලේඛණගාරය හා ගබඩාව සකස් කිරිම | | | 90% |

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

අංක 03 සහ 09 යටතේ අපේක්ෂා කරන ලද ඉලක්ක කරා ළඟා වීම පිණිස සැලකිය යුතු කාර්ය රාශියක් ඉටු කර ගැනීමට හැකි වූ නමුත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා සහ පුහුණුකරුවන් සඳහාත් පුහුණු වැඩසටහන් පැවැත්වීම ඔවුන් වෙනුවෙන් ක්‍රීඩා භාණ්ඩ ලබා දීම, ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා ක්රීඩා භාණ්ඩ හා උපකරණ ලබා දීම, ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීම සහ ක්‍රීඩා තරු වැඩසටහන වැනි වැඩසටහන් රාශියක් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සිදු කිරීමට නොහැකි විය. එහෙත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව වෙනුවෙන් විශාල අඩුපාඩුවක්ව පැවති අංග සමුපූර්ණ පරිපාලන ගොඩනැගිල්ලක් ඉදි කිරීම සහ එයට අවශ්‍ය උපකරණ සපයා ගැනීම වැනි ඵලදායී ව්‍යාපෘති ඉටු කිරීම හා ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම වැනි කටයුතු හරහා දුෂ්කරතා මධ්‍යයේ වුවද සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කර ගැනීමට හැකි වී ඇත.

2021 වර්ෂය වෙනුවෙන් පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරී සැලසුම රුපියල් මිලියන 23.5ක ඉලක්කයක් වෙනුවෙන් සකස් කරන ලදී. එහෙත් කොවිඩ් වසංගත තත්ත්වය හා වියදම් සීමා කිරීමේ ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් 2021 වර්ෂය වෙනුවෙන් එම මුදලින් රුපියල් මිලියන 6.41 ක මුදලක් පමණක් ව්‍යාපෘති වෙනුවෙන් යෙදවීමට සිදු විය. එසේම ජාතික මහා ක්‍රීඩා උළෙල 2020 හා 2021 යන වර්ෂ දෙක තුළදීම පැවැත්වීමට නොහැකි වූයේ ජාතික කොවිඩ් ආපදා තත්ත්වය හේතුවෙනි.

මෙවැනි කරුණු හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු ඉටු නර ගැනීමේ කාර්යයේදී ක්ෂේත්‍රගතව සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කර ගැනීම අපහසු වුවද ධාරිතා සංවර්ධනය හා යටිතල පහසුකම් සංවර්ධනයේදී කැපී පෙනෙන දියුණුවක් අත්පත් කර ගැනීමට හැකි වී ඇත.

2022 වර්ෂයේදී පසුගිය වසර දෙකට සාපේක්ෂව පුළුල් කාර්යභාරයක් වෙනුවෙන් සැලසුම් සකස් කර ඇති අතර ජාතික මහා ක්‍රීඩා උළෙලේ වැඩි රන් පදක්කම් සංඛ්‍යාවක් දිනා ගැනීම හා දෙපාර්තමේන්තුගතව සහ ක්ෂේත්‍රගතව ක්‍රීඩාවේ දියුණුව හා සංවර්ධනය වෙනුවෙන් මානව හා භෞතික සම්පත් උපයෝජනය කිරීම දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුමයි.

## කාර්ය සාධනය පිළිබඳ සමස්ත අදහස Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

කොවිඩ් 19 වෛරසය හේතුවෙන් 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.මූලධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නොලැබුණු අතර 2019 වර්ෂයේ අවිච්ඡේද වූ ව්‍යාපෘති කිහිපයක් සඳහා ප්‍රතිපාදන ලැබීම හා පුනරාවර්ථන වියදම් යටතේ ලැබුණු ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් උපරිම වශයෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගේ අවශ්‍යතා සපුරාලීමට හැකියාව ලැබුණි.

2021 වර්ෂය සම්බන්ධයෙන් බලන විට ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් අත්හිටුවීමට සිදු වූ අතර වාර්ෂික සංවර්ධන සැලැස්ම යටතේ මුදල් වෙන් කර දී තිබූ ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. අප දෙපාර්තමේන්තුවේ වැඩි සම්බන්ධීකරණය ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා වන තරුණ ප්‍රජාව සමග වන බැවින් ප්‍රජා සහභාගීත්වය කෙරෙහි ඍජුවම බලපෑම් කරනු ලැබූ ගෝලීය කොවිඩ් වසංගතය හමුවේ අපගේ බොහෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපහසු විය. එසේම එන්නත්කරණ වැඩසටහනේදී අපගේ ප්‍රමුඛ මානව සම්පත වන තරුණ ප්‍රජාව කෙරෙහි අවධානය යොමු වූයේ අවසන් අදියරයන්හිදී බැවින් ඔවුන් සහභාගී කරවා ගැනීම දුෂ්කර විය.

ඒ අතර වසර ගණනාවක් තිස්සේ ජාතික හා ජාත්‍යන්තර තරග නියෝජනයෙන් ජයග්‍රහණය ලද ක්‍රීඩක ක්‍රීඩිකාවන් හා ඒ සඳහා උර දුන් පුහුණුකරුවන් ඇගයීම වෙනුවෙන් පවත්වනු ලබන ක්‍රීඩා උපහාර උත්සවය, පුහුණු වැඩසටහන්, පුහුණු කඳවුරු, සෞඛ්‍ය නීති රීති වලට අනුව පැවැත්වීමට නොහැකි විය. එසේම කොවිඩ් වසංගතය හමුවේ ගොඩ නැගුණු ආර්ථික අස්ථායිතාව මත ක්‍රීඩා සමාජ, ක්‍රීඩා පුහුණුකරුවන්, සහ පුහුණු මධ්‍යස්ථාන සඳහා ක්‍රීඩා භාණ්ඩ හා අපකරණ මිල දී ගැනීම, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රීඩා උපකරණ මිල දී ගැනීම, වැනි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන ලෙස භාණ්ඩාගාරයෙන් උපදෙස් ලබා දීමද අප මුහුණ දුන් බාධාවකි.

නමුත් එය අභියෝගයක් කර නොගත් අප දෙපාර්තමේන්තුව අවම සහභාගීත්වයක් යටතේ අන්තර් ක්‍රීඩා සමාජ මට්ටමේ සිට ක්‍රීඩා තරඟ අදියරයන් පවත්වා XXXI වන පළාත් ක්‍රීඩා තරඟ උත්සවයකින් තොරව නිම කර ජයග්‍රාහකයන් ඇගයිමට කටයුතු කරන ලදීඑමෙන්ම අන්තර් ක්‍රීඩා සමාජ තරග පැවැත්වීමද අභියෝගයක් වුවත් ප්රාදේශිය වශයෙන් හැකි ආකාරයට තරග පවත්වා අවසන් කරන ලදි.ඒ අතර විශාල ලෙස ජනතාව එක් වන උත්සව සංවිධානයට අවස්ථාව නොලැබිම හේතුවෙන් මලල ක්‍රීඩා සියල්ල පැවැත්විමට නොහැකි විය .

එමෙන්ම නවීන උපකරණවලින් සමන්විත කාර්යාල ගොඩනැගිල්ල, විධිමත් ලේඛණාගාරය හා ගබඩාව වැනි කාර්යාල අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වීම ඵලදායී සේවාවක් සැපයීම වෙනුනේ අප දුෂ්කරතා හමුවේ ලබා ගත් ජයග්‍රහණයකි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හා අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රිඩා පිටිවල යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හැකි විය.

හැකි හැම ආකාරයෙන්ම ක්‍රීයාත්මක වී ගෝලීය වසංගත තත්වය හමුවේ උතුරු මැද පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් ගොඩ නගා ගත් අරමුණු සැලකිය යුතු ප්‍රමාණයක් ඉටු කිරිමට හැකි වීම දෙපාර්තමේන්තුව ලද ජයග්‍රහණයකි.

# 10.පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

පළාත් ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස හා කාන්තා යන විෂයන් මෙම අමාත්‍යාංශ විෂය පථයට අයත් වන අතර ප්‍රධාන වශයෙන් නිවාස හා කාන්තා යන විෂයන් දෙකෙහි සංවර්ධන වැඩසටහන් හා ආයතන කටයුතු සෘජුව අමාත්‍යාංශය විසින් මෙහෙය වන අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරෙන සංවර්ධන වැඩසටහන් හා ආයතන කටයුතු ද, ඉඩම් හා ග්‍රාම සංවර්ධන විෂය පථයට ගැනෙන සංවර්ධන වැඩසටහන් හා ආයතන කටයුතු ද, ව්‍යාවස්ථාපිත ආයතනයක් වන පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදු කරන ලබන මාර්ග සංවර්ධන කටයුතු හා ආයතන කටයුතු අධීක්ෂණය හා මෙහෙය වීම මෙම අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.

## උතුරු මැද පළාතේ මාර්ග සංයුතිය

විධායක ඉංජිනේරු කාර්යාල

| අනුරාධපුර දිස්ත්‍රික්කය | සී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | ඩී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | එකතුව(කි.මී.) |
|---|---|---|---|
| මරදන්කඩවල | 184.55 | 190.40 | 374.95 |
| හොරොව්පොතාන | 146.66 | 226.58 | 373.24 |
| නොච්චියාගම | 212.03 | 107.45 | 319.48 |
| අනුරාධපුර | 197.35 | 173.17 | 370.52 |
| එකතුව | **740.59** | **697.60** | **1438.19** |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | සී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | ඩී ශ්‍රේණියේ මාර්ග (කි.මී.) | එකතුව(කි.මී.) |
|---|---|---|---|
| මින්නේරිය | 153.45 | - | 153.45 |
| මනම්පිටිය | 225.62 | 12.56 | 238.18 |
| සේවාගම | 116.65 | 0.85 | 117.50 |
| එකතුව | **495.72** | **13.41** | **509.19** |

## දැක්ම

"තෘප්තිමත් ජනතාවක් ඉසුරුමත් පළාතක්.”

## මෙහෙවර

“ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස සහ කාන්තා කටයුතු සම්බන්ධ සියළුම පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් හා විනිවිදභාවයෙන් යුක්තව නියාමනය කිරීම මඟින් සංවර්ධනය කිරීම.”

## දිගුකාලීන අරමුණු

ජාතික සාර්ව ප්‍රතිපත්තිවලට අනුකූලව ඉඩම්, වාරිමාර්ග, මාර්ග සංවර්ධන, ග්‍රාම සංවර්ධන, නිවාස කටයුතු හා කාන්තා කටයුතු පිළිබඳ උතුරු මැද පළාතේ ප්‍රතිපත්ති සකස් කිරීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු නියාමනය, අධීක්ෂණය හා මෙහෙයවීම මෙන්ම නිවාස හා කාන්තා කටයුතු සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් පළාතේ ජනතාවගේ ජීවන තත්වය වර්ධනය කිරීමට දායක වීම.

## කෙටිකාලීන අරමුණු

- පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා ආයතනික කටයුතු, නියාමනය, අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා ආයතනික කටයුතු, නියාමනය , අධීක්ෂණය හා මෙහෙයවීම.
- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩ සටහන් හා ආයතනික කටයුතු, නියාමනය, අධීක්ෂණය හා මෙහෙයවීම.

- තෝරාගත් අඩු ආදායම්ලාභීන් වෙත නිවාස ඉදිකිරීම හා සනීපාරක්ෂක පහසුකම් සලසා දීම.
- තෝරාගත් වැන්දඹු කාන්තාවන් සඳහා නිවාස අලුත්වැඩියාව හා වැඩි දියුණු කිරීම සඳහා මූල්‍යාධාර ලබා දීම
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අනුමත මාර්ග සංවර්ධන ව්‍යාපෘති පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ උපදේශණ සහාය සහිතව ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම.
- ක්ෂේත්‍ර අධීක්ෂණය.
- දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- නිවාස ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කාන්තා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළා ත් ඉඩම් දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ කටයුතු නියාමනය හා අධීක්ෂණය.
- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අනුමත මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මත කිරීම.
- අඩු ආදායම්ලාභී පවුල් හා වැන්දඹු කාන්තාවන් ඉලක්ක කොට සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පළාතේ නිවාස හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.
- සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 65ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 39 කි. පුරප්පාඩු සංඛ්‍යාව 26 ක් වේ.

## මූලධන වියදම

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි.) | 2021 වර්ෂයේ වියදම (රු.මි.) | ඉතිරිය (රු.මි.) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1.5 | 0.62 | 0.87 | 41 |
| 2. වාහන | 0.5 | - | 0.5 | - |
| 3. වෙනත් මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 412.9 | 248.26 | 198.7 | 60 |
| **එකතුව** | **414.9** | **248.88** | **200.07** | **60** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

**1.** සෑම පවුලකටම සුව පහසු නිවාසයක් ලබා දීමේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුරූපීව පළාතේ අඩු ආදායම්ලාභී නිවාස නොමැති පවුල් සඳහා නව නිවාස ඉදිකිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2.සෑජුව ආර්ථිකයට දායක වන කාන්තා පරපුරක් ගොඩ නැගීමේ වැඩසටහන යටතේ මෙම අමාත්‍යාංශය විසින් දිරිය කාන්තා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

3.සුව පහසු ගමනක් පරිසර හිතකාමී ප්‍රවාහන පද්ධතියක්.ජාතික ප්‍රතිපත්තියට අනුව සුවපහසුවෙන් හා ඉක්මනින්, ආරක්ෂාකාරීව තම ගමනාන්තය කරා ලඟා වීමේ උතුරු මැද පළාතේ ජනතවගේ අයිතිය සුරක්ෂා කිරීම සඳහා පළාතේ පවතින මාර්ග ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීමේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

4.සෞභග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුව වාරි සෞභාග්‍යා වැඩසටහන සඳහා උතුරු මැද පළාතේ ගොවි ජනතාව පරිහරණය කරනු ලබන ජලාශ, කුඩා වැව් හා ඇල වේලි ඉදිකිරීම හා නඩත්තු කටයුතු සඳහා වන සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කොට පෙළ ගැස්සවීම.

5.ඵලදායී පුරවැසියෙක් හා සතුටින් ජීවත් වන පවුලක් ජාතික ප්‍රතිපත්තියට අනුරූපීව උතුරු මැද පළාතේ ග්‍රාමීය ජන ජීවිතය නඟා සිටුවීමේ වැඩසටහන් පැවැත්වීම.

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශය පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

| | |
|---|---|
| ***ශක්තීන්***<br>1. ආරක්ෂිත නිතී රාමුවක් පැවතීම.<br>2. පුහුණු වූ මානව සම්පතක් සිටීම.<br>3. කාර්ය මණ්ඩලයේ එකමුතුකම.<br>4. සංවිධානාත්මක පරිපාලන පද්ධතියක් පැවතීම | ***දුර්වලතා***<br>1. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රමාණාත්මක කාර්ය මණ්ඩලයක් නොසිටීම<br>2. විධිමත්ව යාවත් කළ ප්‍රමාණාත්මක දත්ත පද්ධතියක් නොපැවතීම.<br>3. අන්තර් ආංශික රාජකාරි හා වගකීම් පිළිබඳව එකිනෙක අංශවල නිලධාරින් තුළ පවතින දැනුවත්භාවය අඩුකම.<br>4. කාර්යාල ඉඩකඩ කළමණාකරණය ප්‍රමාණවත් නොවීම. |
| ***තර්ජන***<br>1. සංවර්ධන ක්‍රියාවලිය තුළ සහ සම්බන්ධ වන ආයතන වලින් ලැබෙන සහයෝගය ප්‍රමාණවත් නොවීම.<br>2. බාහිර පාර්ශ්වයන්ගෙන් එන බලපෑම.<br>3. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මහජනතාවගෙන් එල්ලවන සෘණාත්මක ප්‍රතිචාර<br>4. සංරචක ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂිකව ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපාදනයක් නොලැබීම.<br>5. අනුමත වාර්ෂික සංවර්ධන සැළැස්ම විටින් විට සංශෝධනයට ලක් වීම.<br>6. පළාත් සභා සංවිධාන ව්‍යුහය තුළ අන්තර් සබඳතා වල පවත්නා දුර්වලතා.<br>7. අවශ්‍යතාවන්ට ප්‍රමණවත් පුහුණු වැඩ සටහන් නොපැවතීම. | ***අවස්ථා***<br>1. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමෙන්තුව, පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේනතුව, පළාත් දාර්ග සංවර්ධන අධිකාරිය යන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන මෙම අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර තිබීම.<br>2. පළාතේ පවතින සංවර්ධන විභවතාවය.<br>3. සේවා අපේක්ෂිත ජනතාව. |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක

සංරචකය 01. නිවාස සංවර්ධන

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ( නිමවුම) | පාදම ( Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 11 | පළාතේ අඩු ආදායම්ලාභී පවුල්වල පැල්පත් නිවාස සංවර්ධනය කිරීම. | ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව | - | 110 |
| 11.1 | පළාතේ අඩු ආදායම්ලාභී පවුල් වල සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම. | ඉදිකරන ලද වැසිකිළි සංඛ්‍යාව | - | 150 |

සංරචකය 02. කාන්තා කටයුතු

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ( නිමවුම) | පාදම ( Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 11 | වැන්දඹු හෝ කාන්තා මුලික පවුල් වල නිවාස අලුත්වැඩියා කිරීම. | අලුත්වැඩියා කරන ලද නිවාස සංඛ්‍යාව | - | 50 |

## එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හී කාර්ය සාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ( නිමවුම) | ඉලක්ක | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01 | පළාතේ අඩු ආදායම්ලාභී පවුල්වල පැල්පත් නිවාස සංවර්ධනය කිරීම. | ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව | 110 | 100% |
| 02 | පළාතේ අඩු ආදායම්ලාභී පවුල් වල සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම. | ඉදිකරන ලද වැසිකිළි සංඛ්‍යාව | 150 | 100% |
| 03 | වැන්දඹු හෝ කාන්තා මුලික පවුල් වල නිවාස අලුත්වැඩියා කිරීම. | අලුත්වැඩියා කරන ලද නිවාස සංඛ්‍යාව | 50 | 100% |

## ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ලඟා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංක | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ( නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ලඟා වීම | | | |
| 01 | ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව | 110 | 100% | පළාතේ අඩු ආදායම්ලාභී පැල්පත් නිවාස වල ජීවත්වන පවුල් සඳහා නව නිවාස ඉදි කිරීම. | 39 | 550 |
| 02 | ඉදිකරන ලද වැසිකිළි සංඛ්‍යාව | 150 | 100% | පළාතේ අඩු ආදායම්ලාභී පවුල් වල සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම. | 6 | 750 |
| 03 | අලුත්වැඩියා කරන ලද නිවාස සංඛ්‍යාව | 50 | 100% | වැන්දඹු හෝ කාන්තා මුලික පවුල් වල නිවාස අලුත්වැඩියා කිරීම හෝ වැඩි දියුණු කිරීම. | 2 | 250 |

## නව නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘති

1. කට්ටකුලම, පන්සල අසළ, යාය 01, තිස්සපුර, මැදිරිගිරිය







2. 07 ඇළ, හිඳෝගම, නාච්චාදූව







3. අංක 04 බාරේ, මිරිස් හේන, මැදිරිගිරිය







4. පහළ තලාව, තලාව







5. නාච්චාදූව






## සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතිය




## මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම

| පස් අවුරුදු සැලැස්මෙහි සඳහන් ව්‍යාපෘති හා ඉලක්ක | | 2021 වසර තුල අත්පත් කරගත් ඉලක්කය |
|---|---|---|
| ව්‍යාපෘතිය | ඉලක්කය | |
| නව නිවාස ඉදිකිරීම හා අලුත්වැඩියා කිරීම | 1750 | 310 |

2019 වසර සිට 2021 වසර දක්වා මෙම අමාත්‍යාංශ මඟින් සකස් කරන ලද සිව් අවුරුදු මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මට අනුව 2021 වසර සඳහා නිවාස අලුත්වැඩියා කිරීම හෝ ඉදිකිරීම සඳහා නිවාස 1750 ඉලක්කයක් පැවතියද 2021 වසර සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද සත්‍ය ප්‍රතිපාදනයට අනුව නිවාස හා වැසිකිළි 310 ක් සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලදී.

2021 වසරට පෙර මෙම ව්‍යාපෘතිය යටතේ ගොඩනැගිළි ද්‍රව්‍ය බෙදාදීම සිදු කළ ද අමාත්‍යාංශය මඟින් ඇති කරගත් තීරණයන් ට අනුව ගොඩනැගිළි ද්‍රව්‍ය බෙදා දීම අත්හිටුවා අඩු ආදායම්ලාභී පැල්පත් නිවාස වල ජීවත් වන පවුල් සඳහා රු.300,000.00 ප්‍රතිපාදනයකට යටත්ව නව නිවාස 110 ක් ඉදිකරන ලදී. එසේම අඩු ආදායම්ලාභී අනාරක්ෂිත නිවාස වල ජීවත් වන වැන්දඹු හෝ කාන්තා මූලික පවුල්වල නිවාස අලුත්වැඩියා කරගැනීම සඳහා රු.40,000.00 ප්‍රතිපාදනයකට යටත්ව නිවාස 50 ක් අලුත්වැඩියා කරන ලදී. තවද පළාතේ අඩු ආදායම්ලාභී පවුල් වල සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කර ගැනීම සඳහා එක් පවුලක් සඳහා රු.40,000.00 ප්‍රතිපාදනයකට යටත්ව වැසිකිළි 150 ක් ඉදිකරන ලදී. ඒ අනුව මධ්‍යකාලීන සැලැස්මෙහි සඳහන් සංඛ්‍යාත්මක ඉලක්කය 2021 වසර තුළ ලඟා කර නොගත්ත ද වඩාත් ඵලදායී ලෙස අනුමත ප්‍රතිපාදනය වැයකර නිවාස ව්‍යාපෘතියට අදාළව සමස්ථ අරමුණ සාධනය කොටගෙන ඇත.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක ( නිමැවුම් ) | වර්ෂය තුළ නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| 1. අඩු ආදායම්ලාභීන් සඳහා ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව. | 100% | | |
| 2. අඩු ආදායම්ලාභීන් සඳහා ඉදිකරන ලද වැසිකිළි සංඛ්‍යාව. | 100% | | |
| 3. කාන්තා මූලික පවුල්වල අලුත්වැඩියා කරන ලද නිවාස සංඛ්‍යාව | 100% | | |

## අත්පත් කර ගන්නා ලද කාර්යය සාධන දර්ශක පිළිබඳ කෙටි හැඳින්වීමක්

2021 වර්ෂයේ මෙම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද අඩු ආදායම්ලාභී පවුල් වල නිවාස ඉදිකිරීම සඳහා රු.මි. 39 ක මුදලක් වෙන් කරනු ලැබූ අතර එමඟින් උතුරු මැද පළාතේ අඩු ආදායම්ලාභී පවුල් වල නව නිවාස 110 ක් ඉදිකරන ලදී. එහි භෞතික හා මූල්‍ය ප්‍රතිශතාත්මක අගය 100 % ක් ය. තවද පළාතේ වැසිකිළි පහසුකම් නොමැති පවුල් සඳහා වැසිකිළි ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 6 ක මුදලක් වෙන් කරනු ලැබූ අතර වැසිකිළි 150 ක් ඉදිකරන ලදී. එහි ප්‍රගතිය 100 % ක් ය. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කාන්තා විෂය යටතේ වැය කරනු ලැබූ මුදල රු.මි. 2 ක් ය. එමගින් පළාතේ කාන්තා මූලික අඩු ආදායම්ලාභී පවුල් වල නිවාස 50 ක් අලුත්වැඩියා කිරීම සිදු කල අතර එහි ප්‍රගතිය 100 % කි. ඒ අනුව ආයතනයේ සංවර්ධන විෂයන් ට අදාළ කාර්ය සාධන දර්ශක 100% ක් ලෙස 2021 වසර තුළ දී ලගා කරගැනීමට හැකි විය.

## හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්ක ලගාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 01.ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.(5) | 01.උතුරු මැද පළාතේ වැන්දඹු හෝ කාන්තා මූලික පවුල් වල ජීවන තත්වය උසස් කරලීම සඳහා කාන්තා මූලික පවුල් 50 ක නිවාස අලුත්වැඩියා කර දීම. | 01.වැන්දඹු කාන්තා මූලික පවුල් වල නිවාස අලුත්වැඩියා කර දීම සඳහා මූල්‍යාධාර ලබාදීම. | 01.පළාතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස 50 ක් අලුත්වැඩියා කර දිම. | | | 100% |
| 02.නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම.(11) | 02. උතුරු මැද පළාතේ ජීවත් වන අඩුආදායම් ලාභී පැල්පත් වාසීන්ගේ ජීවන තත්වය උසස් කිරීම සඳහා නව නිවාස 110 ක් ඉදිකර දීම. | i.තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස ඉදිකිරිම.<br><br>ii.තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරිම. | i.අඩු ආදායම්ලාභී පවුල් සඳහා නව නිවාස 110 ක් ඉදිකිරිම.<br><br>ii.අඩු ආදායම්ලාභී වැසිකිළි නොමැති පවුල් 150 සඳහා වැසිකිලි ඉදිකිරීම. | | | 100%<br><br>100% |

## තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමේ දී ආයතන ලද ජයග්‍රහණ හා එම ජයග්‍රහණ ලබා ගැනීමට ආයතනය සතු ශක්තීන් අවස්ථා හා මුහුණ දුන් අභියෝග දුර්වලතා හා තර්ජන

තෘප්තිමත් ජනතාවක් ඉසුරුමත් පළාතක් ගොඩනැගීමේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වසර තුළ මෙම ආමාත්‍යාශය මඟින් සංවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ යටතේ පළාතේ ජනතාවගේ නිවාස ගැටළුව විසඳීම සඳහා අඩු ආදායම්ලාභී නිවාස නොමැති පවුල් වෙත නව නිවාස 110 ක් ඉදිකරන ලදී. ඒ සඳහා රු.මි.39 ක් වැය කරනු ලැබූහ. මෙම ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% ක ප්‍රතිශතයක් ලගාකර ගැනීමට හැකි විය.

උතුරු මැද පළාතේ වැසිකිළි පහසුකම් නොමැති පවුල් 12127 ක ප්‍රමාණයක් සිටින අතර මෙය සෘජුව සෞඛ්‍ය කෙරෙහිද යම් බලපෑමක් සිදු කරනු ලබයි. මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා පළාත තුළ සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් සඳහා වැසිකිළි 150 ක් ඉදි කිරීම වෙනුවෙන් රු.මි. 06 ක ප්‍රතිපාදනයක් වැය කළ අතර එහි ප්‍රගතිය 100% කි. පළාතේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

පළාතේ අඩු ආදායම්ලාභී කාන්තා මූලික පවුල්වල නිවාස අලුත්වැඩියා කොට දී කාන්තා සුරක්ෂණය ඇති කිරිම සඳහා  රු.මි. 02 ක් වැය කළ අතර කාන්තා මූලික පවුල්වල නිවාස 50 ක් අලුතිවැඩියා කිරිමේ කටයුතු නිම කිරීමට හැකි විය. සමස්ථයක් ලෙස පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයේ 2021 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයන් තුළ භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% ක් ලෙස නිමාකර ගැනීමට හැකිවිය.

2021 වසරේ ඉහත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා අමාත්‍යාංශ නිලධාරීන් මෙන්ම මෙම අමාත්‍යාංශය යටතේ ඇති ග්‍රාම සංවර්ධන දෙපාර්තමෙන්තුවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කොට සිටින නිලධාරීන් සිටීම  මහත් පිටුවහලක් විය. එසේම එම නිලධාරීන්  මඟින් ගම් මට්ටමින් පිහිටුවා ඇති ග්‍රාම සංවර්ධන සමිති  පිහිටා තිබීම මෙම කටයුත්ත සාර්ථක කර ගැනීමට මහත් පිටුවහලක් විය. එමෙන්ම මෙම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේ දී මුහුණ දුන් අභියෝග අතර ලක්ෂ 06 ක පමණ ඉංජිනේරු ඇස්තමේන්තුව ඇති නිවාස සැලැස්මක් වෙන් කරන ලද ලක්ෂ 03 ක මුදලකින් නිමා කරලීමයි. තව ද ගොඩනැගිළි ඉදිකිරිම් ද්‍රව්‍ය වල මෙම කාල රාමුවේ මිල ඉහළ යෑම හේතුවෙන් මුල්‍යමය වශයෙන් අභියෝග ඇති විය. එසේම මෙම නිවාස ඉදිකරනු ලබන්නේ පළාතේ පැල්පත් වාසී ජනතාව වෙනුවෙන් වන නිසා ඔවුනගේ ශ්‍රම දායකත්වය ලබා ගැනීමේ දී ඔවුනගේ එදිනෙදා ජිවන රටාවට අනුව බාධාවක් ඇති වීමයි. එහෙයින් මෙම නිවාස ඉදි කිරීමේ දී හා අලුත්වැඩියාවේ දී පරිත්‍යාගශීලින්ගේ ද සහයෝගය ලබා ගැනීමට සිදු විය. කෙසේ වුව ද සියලු දෙනාගේ සහයෝගයෙන් මෙම ව්‍යාපෘතීන් සාර්ථකව නිම කර ගැනීමට හැකි වීම සතුට කරුණකි. .

## COVID 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වනුයේ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතන වල අධීක්ෂණය නියාමනය හා සම්බන්ධීකරණය පවත්වාගෙන යාම වේ. අමාත්‍යාංශය වෙත පැවරී ඇති සෘජු විෂයක් වනුයේ කාන්තා සංවර්ධන කටයුතු හා නිවාස සංවර්ධන කටයුතු වේ. එහි දී ඉඩම්, ග්‍රාම සංවර්ධන, වාරිමාර්ග හා මාර්ග සංවර්ධන යන විෂයන් වලින් ක්‍රියාත්මක කළ අවිච්ඡේද ව්‍යාපෘති වල ප්‍රගතිය 100 % ලෙස සටහන් වූ අතර වාරිමාර්ග හා මාර්ග සංවර්ධන විෂයන් වල ක්‍රියාත්මක කළ නව ව්‍යාපෘති කිහිපයක පහළ ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සිදු විය. කොවිඩ් 19 වසංගත තත්වය තුළ කාර්යය මණ්ඩලයේ පැමිණීම සීමා කිරීමට සිදු වුවද සිටින මානව සම්පත උපයෝගී කරගෙන අවිච්ඡේද ව්‍යාපෘති 100% ක් සාර්ථකව නිම කළ අතර නව ව්‍යාපෘති වල සමස්ථ ප්‍රගතිය ඉහළ අගයකට රැගෙන ඒමට හැකි විය. එසේම කොවිඩ් 19 වසංගත තත්වය නිසා යම් ආකාරයක බලපෑමක් සිදු කරනු ලැබුවද සිටින මානව සම්පත ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම නිසා අමාත්‍යාංශය මගින් අපේක්ෂා කරනු ලැබූ ඉලක්ක කරා ලඟා වීමට හැකි විය.

අමාත්‍යාංශය වෙත පැවරී ඇති සෘජු විෂයන් අතරින් ප්‍රධානතම විෂයන් වනුයේ නිවාස හා කාන්තා සංවර්ධනයයි. **තිරසර සංවර්ධන අරමුණු යටතේ අංක 01 හි සඳහන් “ සෑම දෙසකට සෑම ආකාරයකින්ම පවතින දිළිඳු බව නිම කිරීම” සහ තිරසර සංවර්ධන අරමුණු අංක 11 හි සඳහන් නගර සහ ජනාවාස පරිපූර්ණ , ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම** යන තේමාවන් යටතේ 2021 වර්ෂයේ අඩු ආදායම්ලාභි පවුල් සඳහා නිවාස ඉදිකිරීම සඳහා රු.මි. 33 ක මුදලක් අනුමත වූ අතර එමගින් උතුරු මැද පළාතේ පැල්පත් වාසී අඩු ආදායම්ලාභී පවුල් සඳහා නිවාස 110 ක් ඉදිකරනු ලැබූ අතර එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය 100% කි. තවද පළාතේ අඩු පහසුකම් සහිත ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා 2021 වර්ෂයේ රු.මි. 06 ක් වෙන් කරනු ලැබූ අතර එමඟින් පළාතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි 150 ක් ඉදිකළ අතර එහි ප්‍රගතිය 100% කි. තවද උතුරු මැද පළාතේ වැන්දඹු හෝ කාන්තා මූලික පවුල්වල නිවාස අලුත්වැඩියාව සඳහා 2021 වර්ෂයේ රු.මි. 02 ක් අනුමත කරනු ලැබූ අතර එමඟින් වැන්දඹු හෝ කාන්තා මූලික පවුල් 50 ක නිවාස අලුත්වැඩියාව හෝ වැඩිදියුණු කර ගැනීම සඳහා ව්‍යාපෘති දියත් කළ අතර එහි 100% ක ප්‍රගතියක් අත්පත් කර ගත්හ.

# 10.1. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

උතුරු මැද පළාත තුළ පවතින කෘෂිකාර්මික ජීවන රටාව ගොඩනැගීම සඳහා කුඩා හා මධ්‍යම පරිමාණයේ වැව් අමුණු සංවර්ධනය සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රධාන මෙහෙයක් සිදු කරමින් පවතී. එහිදී ප්‍රධාන වශයෙන් උතුරු මැද පළාත තුළ පවතින පළාත් වාරිමාර්ග පද්ධති වැව් තුන්දහස් දෙසිය විසි හයක (3226) ගොවිබිම් අක්කර එක්ලක්ෂ තිස්නව දහසකට (139,000) ආසන්න ප්‍රමාණයක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්යය හා බැදේ.එම වැව් පද්ධතිය තව දුරටත් සංවර්ධනය කරමින් හා ප්‍රශස්ත මට්ටමකින් නඩත්තු කර පවත්වාගෙන යමින් පළාතේ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය හා ආර්ථික තත්ත්වය ඉහල නැංවීම සඳහා පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී.

දෙපාර්තමේන්තුවේ පළමු ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය කහටගස්දිගිලිය කැකිරාව හන්දිය අසල පිහිටුවන ලදී. දෙවන ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය කැකිරාව ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලය අසල පිහිටුවන ලදී. වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු යටතේ මෙම ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල පාලනය වේ. කහටගස්දිගිලිය ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය යටතේ හොරොව්පොතන, කහටගස්දිගිලිය, කැබිතිගොල්ලෑව, මැදවච්චිය, මිහින්තලේ, පදවිය හා රඹෑව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරනු ලැබේ. කැකිරාව උප කාර්යාලය යටතේ කැකිරාව, ගලෙන්බිඳුණුවැව, පලුගස්වැව, තිරප්පනේ, මැදිරිගිරිය, හිඟුරක්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරනු ලැබේ.

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ දැනට පිහිටුවා ඇති අනුරාධපුර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය යටතේ ගල්නෑව, ඉපලෝගම, මහ විලච්චිය, නොච්චියාගම, පලාගල, මධ්‍යම නුවරගම් පළාත, තලාව, නැගෙනහිර නුවරගම් පළාත යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් හි වාරි කටයුතු සඳහා වැඩ කටයුතු සිදු කරනු ලැබේ. මිට අමතරව දෙපාර්තමේන්තුව සතුව පවතින තත්ත්ව පාලන ඒකකය මගින් මුළු පළාතම ආවරණය වන පරදී සියළුම වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු වල තත්ත්ව පාලන කටයුතු සිදු කරනු ලැබේ. ආයතන අංශය, සැලසුම් අංශය හා ගිණුම් අංශයද දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය තුළ පිහිටුවා ඇත.

## පළාත් වාරිමාර්ග පද්ධති

| විස්තරය | අනුරාධපුර | පොළොන්නරුව | එකතුව |
|---|---|---|---|
| වාරිමාර්ග වැව් ප්‍රමාණය | 2991 | 235 | 3,226 |
| වැව් මගින් වගා කරන ලද කුඹුරු අක්කර ප්‍රමාණය | 128,608 | 19,881 | 138,877 |
| ගොවි පවුල් සංඛ්‍යාව | 83,885 | 5,779 | 89,664 |

## ප්‍රධාන කෘෂිකාර්මික ජලාශ

| අනුරාධපුර දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්) |
| පදවිය | 85,000 | 83,200 | 6,000 |
| වාහල්කඩ | 43,000 | 12,600 | 2,500 |
| නාච්චාදූව | 45,150 | 94,400 | 3,000 |
| තුරුවිල වැව | 5,190 | 12,200 | 500 |
| නුවර වැව | 36,050 | 13,000 | 2,500 |
| මහකනදරා වැව | 36,250 | 50,400 | 3,200 |
| මහවිලච්චිය වැව | 31,500 | 56,560 | 2,500 |
| තිසා වැව | 3,500 | 800 | 350 |
| බසවක්කුලම වැව | 1,910 | 1,440 | 200 |
| රාජාංගනය වැව | 81,603 | 1,188,000 | 4,000 |
| අංගමුව වැව | 14,400 | 5,000 | 1,200 |
| හුරුළු වැව | 55,000 | 308,000 | 3,500 |
| මානන්කට්ටිය වැව | 7,600 | 9,520 | 750 |

| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | | |
|---|---|---|---|
| වැවේ නම | ජල ධාරිතාවය (අක්කර අඩි) | ධාරා ප්‍රදේශය (අක්කර) | මතුපිට විශාලත්වය (අක්කර) |
| පරාක්‍රම සමුද්‍රය | 110,000 | 17,920 | 6,275 |
| මින්නේරි වැව | 110,000 | 59,264 | 6,300 |
| ගිරිතලේ වැව | 18,800 | 6,016 | 775 |
| රොට වැව | 1,028 | 4,800 | - |
| කවුඩුළු වැව | 104,000 | 22,400 | 6,400 |
| බෙබියා වැට | 938 | 1,856 | 261 |
| අඹගස් වැව | 4,000 | 12,512 | 318 |
| මහහල්මිල්ල වැව | 900 | 1,575 | 260 |
| ඇල්ලේ වැව | 1,100 | 330 | - |
| පේස්කුලම වැව | 1,750 | 439 | 535 |

**අස්වද්දා ඇති බිම් ප්‍රමාණය අක්කර 200ට වැඩි (විශාල වාරි මාර්ග) කෘෂි කාර්මික කටයුතු සඳහා ජලය ලබාගන්නා ජලාශ**

## දැක්ම

"ප්‍රශස්ත වාරි කළමනාකරණයක්, සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක්."

## මෙහෙවර

"අතීත උරුමයන් ආරක්ෂාකර ගනිමින්, තාක්ෂණික හා උපදේශන සේවා සැපයීමෙන් සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙන් හා විනිවිදභාවයෙන් යුතුව සුළු හා මධ්‍ය වාරි කර්මාන්තයන්හී ගුණාත්මක සංවර්ධනය, නඩත්තුව, පරිසර ආරක්ෂණය සහ ජල සම්පත ප්‍රශස්ත ලෙස උපයෝජනය කිරීම මගින් පළාතේ තිරසාර සංවර්ධනයේ ප්‍රමුඛ හවුල්කරු වීම."

## දිගුකාලීන අරමුණු

- සංවර්ධිත හා මනා නඩත්තුවෙන් යුතු සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග පද්ධතියක් බිහි කිරීම.
- ජල කළමනාකරණය පිළිබඳ ප්‍රශස්ත දැනුමක් සහ අවබෝධයක් ලබා දීම.
- සංරක්ෂිත හා ආරක්ෂිත පාරිසරික පද්ධතියක් ඇති කිරීම.
- වර්ධනය වූ ආයතනික ධාරිතාවයක් ඇති කිරීම.

## කෙටිකාලීන අරමුණු

- ඇළ මාර්ග පද්ධතීන් මනා ලෙස සංවර්ධනය කරමින් නිසි පරිදි නඩත්තු වැඩපිළිවෙළක් පවත්වාගෙන යාම.
- ගංවතුර උවදුර අවම මට්ටමකට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.
- අවදානම් තත්වයේ පවතින වැව් සංවර්ධනය කිරීම.
- වාරිමාර්ග රක්ෂිත සලකුණු කිරීම මගින් අනවසර ක්‍රියා අවම කිරීම.
- රොන්මඩ හා ජලජ ශාක ඉවත් කිරීම තුළින් ජල ධාරිතාවය සංවර්ධනය.
- දැනුමෙන් හා හැකියාවෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම.
- පසු අස්වනු හානිය අවම කිරීම, යාන්ත්‍රික කෘෂි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- වාරි පද්ධති පුනරුත්ථාපනය කිරීම.
- වාරි පද්ධති නඩත්තු කිරීම.
- වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් ඉදි කිරීම.
- ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරීම.
- ජල ගැලීම් හා හානි කළමනාකරණය කිරීම.
- පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරීම.
- අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.
- තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම.
- කාර්යාල පද්ධති ධාරිතාවය ඉහළ නැංවීම.

## උපාය මාර්ගයන්

| අ.අ | කාර්යය | උපායමාර්ග (ය) |
|---|---|---|
| 01 | වාරි පද්ධති පුනරුත්ථාපනය කිරිම | • මුලස්ථායි වැඩ කොටස් පුනරුත්ථාපනය |
| | | • ඇල වේලි පුනරුත්ථාපනය |
| | | • කෘෂි මාර්ග පුනරුතථාපනය |
| | | • පෝෂක ඇල මාර්ග පුනරුත්ථාපනය |
| | | • පෝෂක ප්‍රදේශ පුනරුත්ථාපනය |
| | | • අපවහන ඇල මාර්ග පුනරුත්ථාපනය |
| | | • එල්ලංගා පද්ධති පුනරුත්ථාපනය |
| 02 | වාරි පද්ධති නඩත්තු කිරිම | • මුලස්ථායි වැඩ කොටස් නඩත්තු කිරිම |
| | | • ඇල වේලි නඩත්තු කිරිම |
| | | • කෘෂි මාර්ග නඩත්තු කිරිම |
| | | • පෝෂක ඇල නඩත්තු කිරිම |
| | | • අපවහන ඇල නඩත්තු කිරිම |
| | | • පෝෂක ප්‍රදේශ නඩත්තු කිරිම |
| | | • එල්ලංගා පද්ධති නඩත්තු කිරිම |
| 03 | වාරි පද්ධතිවල අවශ්‍ය අංග අළුතින් ඉදි කිරීම | • අමුණු ඉදිකිරිම |
| | | • ඇල වේලි ඉදිකිරිම |
| | | • කෘෂි මාර්ග ඉදිකිරිම |
| | | • පෝෂක ඇල ඉදිකිරිම |
| | | • මුලස්ථායි වැඩ කොටස් ඉදිකිරිම |
| | | • අපවහන ඇල මාර්ග ඉදිකිරිම |
| | | • පවතින ඇල මාර්ග කොන්ක්‍රීට් කිරිම |
| 04 | ජල කළමනාකරණ භාවිතයන් සංවර්ධනය කිරිම | • ජල කළමනාකරණටය අදාල නිර්මිත ඉදිකිරිම |
| | | • ගොවි සංවිධාන (වාරි කළමණාකරණ කමිටු) බල ගැන්විම |
| | | • දැනුවත් කිරිමේ වැඩසටහන් |
| | | • තාක්ෂණික පුහුණුව |
| | | • ගොවි උපකරණ ලබා දිම |

| | | |
|---|---|---|
| 05 | ජල ගැලීම සහ හානි කළමනාකරණය කිරිම | • දත්ත රැස් කිරිම හා ගවේෂණය<br>• ආපදා හඳුනා ගැනීම හා පිළියම් යෙදීම<br>• දෙපාර්තමේන්තුවේ ආපදා කළමනාකරණ කමිටුව සක්‍රියව පවත්වාගෙන යාම හා ධාරිතා වර්ධනය |
| 06 | පෝෂක ප්‍රදේශ සංවර්ධනය කිරිම | • සුදුසු ගස් වර්ග සිටුවීම හා නඩත්තුව<br>• ප්‍රදේශ නිර්ණය කිරිම හා මැනුම් කිරිම<br>• ගොවීන් දැනුවත් කිරිමේ වැඩසටහන්<br>• සීමා මායිම් ලකුණු කිරිම<br>• නෛතික රාමුව බලාත්මක කිරිම |
| 07 | අංග සම්පූර්ණ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම | • දත්ත පද්ධතිය ස්ථාපනය කිරිම<br>• දත්ත පද්ධතිය වාර්ෂිකව යාවත්කාලින කිරිම<br>• තොරතුරු කළමනාකරණ ඒකකයේ ධාරිතාවය ඉහළ නැංවීම |
| 08 | තත්ත්ව පාලන ඒකකය පවත්වාගෙන යාම | • මානව හා භෞතික සම්පත් ඉහළ නැංවීම |
| 09 | කාර්යාල ධාරිතාවය ඉහළ නැංවිම | • මානව හා භෞතික සම්පත් වැඩිදියුණු කිරීම |

## අංශය නියෝජනය කරන තිරසාර සංවර්ධන අරමුණු



## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 105ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 89 කි. පුරප්පාඩු සංඛ්‍යාව 16 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 20 | 10.7 | 9.3 | 53.5 |
| 2. යන්ත්‍රසූත්‍ර සවි කිරීම හා උපකරණ | 3.6 | 2.43 | 1.17 | 67.5 |
| 3. වාහන | 0.5 | 0.26 | 0.24 | 52 |
| 4. වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 350 | 138.7 | 211.3 | 39.6 |
| **එකතුව** | **374.1** | **152.1** | **222.01** | **40.7** |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ.

"වර්ෂා ජලය ගබඩා කිරීම සඳහා පවතින වැව් සහ ජලාශ වල ධාරිතාව ඉහළ නැංවීමත් අලුතින් වැව් සහ ජලාශ පද්ධතියක් ගොඩනැගීමට පියවර ගැනීම"

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| ➢ ආඥා පනත් සහ පනත් වලින් ලැබී තිබෙන අධිකාරී බලය.<br>➢ පළපුරුදු දැනුවත් නිලධාරී කණ්ඩායමක් සිටීම.<br>➢ ශක්තිමත් ආයතන පද්ධතියක් පැවතීම. | ➢ දැනුමේ සීමාකම්<br>➢ කාර්ය මණ්ඩලයේ සම්බන්ධීකරන ගැටළු පැවතීම.<br>➢ විධිමත් ඇගයීමක් නොතිබීම. |
| **අවස්ථා** | **තර්ජන** |
| ➢ අමාත්‍යාංශයෙන් ලැබෙන සහය.<br>➢ නිලධාරීන්ගෙන් හා කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහය | ➢ ප්‍රමාණවත් නොවන කාර්ය මණ්ඩලය.<br>➢ ප්‍රමාණවත් වාර්ෂික ප්‍රතිපාදන නොමැතිවීම.<br>➢ නිලධාරී සහ අනෙකුත් කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා ප්‍රමාණවත් පහසුකම් සහ දිරිගැන්වීම් නොමැතිවීම. (වාහන,ලැප්ටොප්,නිවාඩු දින වැටුප්, දුරකථන, ගමන් වියදම් ආදිය)<br>➢ අවශ්‍ය නිලධාරීන් බඳවා නොගැනීම. |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

සංරචකය 1- කෘෂි කර්මාන්තය සඳහා වාරි ජල සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම.

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1.1 | වාරිමාර්ග, ජලාපවහන හා ලවනතාවය බැහැර කිරීමේ පද්ධති පුනරුත්ථාපනය කිරීම. | පුනරුත්ථාපනය කරන ලද වාරිමාර්ග පද්ධති ගණන | 11 | 26 |
| | | වගා තීව්‍රතාවය වැඩිකළ කුඹුරු අක්කර ගණන | 220 | 520 |
| | | ගංවතුර අවදානම අවම කළ ගොවි පවුල් ගණන | 1100 | 2600 |
| 1.2 | වාරිමාර්ග, ජලාපවහන හා ලවනතාවය බැහැර කිරීමේ පද්ධති වැඩිදියුණු කිරීම. | වගා තීව්‍රතාවය වැඩිකළ කුඹුරු අක්කර ගණන | 12.5 | 200 |
| | | ධාරිතාවය වැඩි කළ වැව් ගණන | 5 | 10 |
| | | ගංවතුර අවදානම අවම වූ ගොවි පවුල් ගණන | 500 | 1000 |
| | | වැඩි දියුණු කළ වාරි පද්ධති ගණන | 5 | 10 |

සංරචකය 2 - ධාරිතා සංවර්ධනය

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 2.1 | දෙපාර්තමේන්තුව සඳහා දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම | දත්ත ඇතුළත් කරන ලද වැව් ප්‍රමාණය | - | 500 |
| 2.2 | ආයතනික සංවර්ධනය සහ වත්කම් නඩත්තු කිරීම | අවසන් කරන ලද ව්‍යාපෘති ගණන | 5 | 13 |

## එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| සංරචකය 1 - කෘෂි කර්මාන්තය සඳහා වාරි ජල සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම | | | | |
|---|---|---|---|---|
| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ඉලක්ක | ඉලක්ක සපුරා ගැනීම |
| 1.1 | වාරිමාර්ග, ජලාපවහන හා ලවනතාවය බැහැර කිරීමේ පද්ධති පුනරුත්ථාපනය කිරීම. | පුනරුත්ථාපනය කරන ලද වාරිමාර්ග පද්ධති ගණන | 26 | 10 |
| | | වගා තීව්‍රතාවය වැඩිකළ කුඹුරු අක්කර ගණන | 520 | 200 |
| | | ගංවතුර අවදානම අවම කළ ගොවි පවුල් ගණන | 2600 | 1000 |
| 1.2 | වාරිමාර්ග, ජලාපවහන හා ලවනතාවය බැහැර කිරීමේ පද්ධති වැඩිදියුණු කිරීම. | වගා තීව්‍රතාවය වැඩිකළ කුඹුරු අක්කර ගණන | 200 | 80 |
| | | ධාරිතාවය වැඩි කළ වැව් ගණන | 10 | 4 |
| | | ගංවතුර අවදානම අවම වූ ගොවි පවුල් ගණන | 1000 | 400 |
| සංරචකය2 - ධාරිතා සංවර්ධනය | | | | |
| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම්) | ඉලක්ක | ඉලක්ක සපුරා ගැනීම |
| 2.1 | දෙපාර්තමේන්තුව සඳහා දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම | දත්ත ඇතුළත් කරන ලද වැව් ප්‍රමාණය | 500 | - |
| 2.2 | ආයතනික සංවර්ධනය සහ වත්කම් නඩත්තු කිරීම | අවසන් කරන ලද ව්‍යාපෘති ගණන | 13 | 10 |

## ප්‍රධාන කාර්යසාධක දර්ශකය ලබා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමැවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟාවීම | | | |
| 1.1 | පුනරුත්ථාපනය කරන ලද වාරිමාර්ග පද්ධති ගණන | 26 | 10 | 26 | 116.9 | 4800 |
| | වගා තීව්‍රතාවය වැඩිකළ කුඹුරු අක්කර ගණන | 520 | 200 | | | 800 |
| | ගංවතුර අවදානම අවම කළ ගොවි පවුල් ගණන | 2600 | 1000 | | | 4000 |
| 1.2 | වගා තීව්‍රතාවය වැඩිකළ කුඹුරු අක්කර ගණන | 200 | 80 | 10 | 17.3 | 320 |
| | ධාරිතාවය වැඩි කළ වැව් ගණන | 10 | 4 | | | 1920 |
| | ගංවතුර අවදානම අවම වූ ගොවි පවුල් ගණන | 1000 | 400 | | | 1600 |
| සංරචකය 2 - කෘෂි කර්මාන්තය සඳහා වාරි ජල සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම | | | | | | |
| 2.1 | දත්ත ඇතුළත් කරන ලද වැව් ප්‍රමාණය | 500 | - | - | - | - |
| 2.2 | අවසන් කරන ලද ව්‍යාපෘති ගණන | 13 | 10 | 10 | 13.13 | - (කාර්යාල කටයුතුවලට අදාළ ගොඩනැගිලි හා උපකරණ) |

අංක **199** රත්මලේ තුලාන තිහෝගම වැව ප්‍රතිසංස්කරණය



අංක **17** තිඹිරිවැව තුලාන ටිකිරිසියඹලා වැව ප්‍රතිසංස්කරණය



අංක **14** බෝගහ වැව තුලාන දංගොල්ල වැවප්‍රතිසංස්කරණය



අංක **3** සුදර්ශනගම තුලාන ඒළිපත්ත වැවප්‍රතිසංස්කරණය



අංක **54** හිරල්ලුගම තුලාන පාඩික්ගම මහ වැවප්‍රතිසංස්කරණය



අංක **50** යකාවැව තුලාන බෙල්ලන්කඩවලවැව ප්‍රතිසංස්කරණය



අංක **51** කුඩා කුඹුක්ගොල්ලැව තුලාන හපුමල්ගොල්ලැවවැව ප්‍රතිසංස්කරණය



අංක **588** දොරමඩලාව තුලාන කට්ටමාන්කුලම වැව ප්‍රතිසංස්කරණය



අංක **104** මැදගම තුලාන සියඹලාගස්වැව ප්‍රතිසංස්කරණය



අංක **139** තාමරවැව තුලාන පොතුකොල වැව ප්‍රතිසංස්කරණය



හොරිවිලතුලාන, හොරිවිල වැව දකුණු ප්‍රධාන ඇල ප්‍රතිසංස්කරණය





අංක 551 ඇතුන්ගම තුලාන, කළුහාමි අමුණප්‍රතිසංස්කරණය





අංක 31 සිංහගම තුලාන, අළුත්ඔය මහවැව ප්‍රතිසංස්කරණය






අංක 219 බදනාගල තුලාන, තිස්ස වැව ප්‍රතිසංස්කරණය අදියර ii





හොරිවිල තුලාන, හොරිවිල වැව දකුණු කෘෂි මාර්ගයප්‍රතිසංස්කරණය කිරීම





අංක 529 පෙරිමියන්කුලම තුලාන, මුරියාකල්ල කෘෂිමාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම





## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමැවුම) | වර්ෂය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89 | 50% - 74% |
| ප්‍රතිසංස්කරණය කරන වාරි පද්ධති ගණන | | √ | |
| වගා තීව්‍රතාවය වැඩි කරන කුඹුරු අක්කර ගණන | | | √ |
| ගංවතුර හානිය අවම කරන ගොවි පවුල් ගණන | | | √ |
| වැඩි දියුණු කරන වාරි පද්ධති ගණන | √ | | |

2021 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීමේ දී පළාත් නිශ්චිත ප්‍රදාන (PSDG) යටතේ රුපියල් මිලියන 370 සහ සාමූහික ප්‍රදාන (BG)යටතේරුපියල් මිලියන 328ක් වශයෙන් රුපියල් මිලියන 698ක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත වෙන් කර දෙන ලදි. ඒ අනුව දෙපාර්තමේන්තු ඉතිහාසය තුළ ලද වැඩිම ප්‍රතිපාදන වෙන් කිරීම 2021 වර්ෂයේ දී ලබා දී තිබිණි. දෙපාර්තමේන්තුව වෙත ලද ප්‍රතිපාදන යොදවා පළාත් නිශ්චිත ප්‍රදාන (PSDG) යටතේ ව්‍යාපෘති 44ක් ක්‍රියාත්මක කළ අතර එම ව්‍යාපෘති වල 60%ක භෞතික ප්‍රගතියක් ලබා ගැනීමට හැකි විය. සාමූහික ප්‍රදාන (BG)යටතේ අවිච්ඡේද ව්‍යාපෘති 35ක් ක්‍රියාත්මක කළ අතර එම ව්‍යාපෘති වල 98%ක භෞතික ප්‍රගතියක් ළඟා කර ගැනීමට හැකි විය.

එමෙන් ම 2021 වර්ෂයේ පැවති වාතාවරණය සහ දෙපාර්තමේන්තුව සතු සම්පත් ප්‍රමාණය සැලකීමේ දී ඉහත ප්‍රගතිය ලබා ගැනීම පිළිබඳ සතුටු විය හැක. ජ්‍යෝෂ්ඨ ඉංජිනේරුවරු 3ක් ඉල්ලුම් කර තිබුණ ද ඒ සඳහා අනුමැතිය ලබා දී නොමැත. දෙපාර්තමේන්තුවේ කාර්මික නිලධාරීන් ප්‍රමාණය ද නොමැත. තවද 2021 වර්ෂය ආරම් වන්නේ ම COVID 19 වසංගත ව්‍යාප්තියේ බලපෑම් ද සමග ය. අවස්ථා කිහිපයකි දී ම නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම්, සංචරණ සීමා පැනවීම් සහා සේවකයන් කාර්යාලයට කැඳවීම 50% දක්වා සීමා කිරීම් සිදු විය. මෙසේ සංචරණ සීමා පැනවීම් සිදු කිරීමේ දී හා කාර්ය මණ්ඩල කැඳවීමේ සීමා පැනවීමේ දී දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කටයුතු කලට වේලාවට සිදු කිරීමේ දී විශාල බලපෑමක් ඇති කරන ලදි.

## හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාළ ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ළඟාවීම සඳහා ආයතනය සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ළඟාකර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුළ ඉටු කළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 01 | 2030 වන විට දරිද්‍රතාවෙන් පෙලෙන්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම | ගංවතුර හානි හේතුවෙන් කැඩී ගිය හා අවදානමට ලක්වූ වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම | ගංවතුර හානි හේතුවෙන් කැඩී ගිය හා අවදානමට ලක්වූ වාරි පද්ධති 04ක් ප්‍රතිසංස්කරණය කරන ලදී. | | | √ |
| | | ගංවතුර හානි වලින් ගොවි පවුල් වලට සිදුවන හානිය අවම කිරීම. | ගංවතුර හානි වලින් ගොවි පවුල් 157 කට සිදුවන හානිය අවම කරන ලදී. | | | √ |
| 02 | 2030 වන විට තිරසර ආහාර නිෂ්පාදනපද්ධති පැවතීම තහවුරු කිරීම හා ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම. | වැව සහ ඇලවේලි පද්ධතිය ඇතුළුව වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම. | වැව සහ ඇලවේලි පද්ධතිය ඇතුළුව වාරි පද්ධති 29ක් ප්‍රතිසංස්කරණය කරන ලදී. | | | √ |
| 06 | 2030 වන විට සියළුම ක්ෂේත්‍රයන්හි කාර්යක්ෂමව ජලය භාවිතා කිරීම. | රොන්මඩ ඉවත් කිරීම මගින් වැවෙහි ධාරිතාවය වැඩි කිරීම. | රොන්මඩ ඉවත් කිරීම මගින් වැව් 53 ක ධාරිතාවය වැඩි කරන ලදී.. | | | √ |
| 13 | කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වාභාවික ආපදා වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම. | ගංවතුර හානි හේතුවෙන් කැඩී ගිය හා අවදානමට ලක්වූ වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම | ගංවතුර හානි හේතුවෙන් කැඩී ගිය හා අවදානමට ලක්වූ වාරි පද්ධති 04ක් ප්‍රතිසංස්කරණය කරන ලදී | | | √ |
| 15 | 2030 වන විට කාන්තාකරණය, නියගය සහ ගංවතුර නිසා බලපෑමට ලක් වූ ඉඩම් සහ පස නැවත යථා තත්වයට පත්කිරීම | අත්හැර දමන ලද වාරි පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම. | අත්හැර දමන ලද වාරි පද්ධතීන් ප්‍රතිසංස්කරණය කරන ලදී. | | | √ |

පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව 2021 වර්ෂයේ සංවර්ධන වැඩසටහන යටතේ වාරි ව්‍යාපෘති 36 ක් සහ අවිච්ඡේද වාරිව්‍යාපෘති 35ක් ක්‍රියාත්මක කරන ලදි. මෙසේ වැව්, ඇල වේලි හා අමුණු සංවර්ධනය තුළින් කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය ජලසුරක්ෂිතතාවය වැඩි වේ. ඉන් පළාතේ කුඹුරු ඉඩම් වල වගා තීව්‍රතාවය ඉහළ යන අතර රටට අවශ්‍ය ආහාර නිෂ්පාදනය ද ඉහළ අගයක් කරා ගෙනයාම තුළින් රටේ ආහාර සුරක්ෂිත තාවය තහවුරු වේ. එමෙන් ම එසේ ආහාර සුරක්ෂිත තාවය තහවුරු වන පසුබිමක සාගින්න තුරන් කිරීමට පිටිවහලක් වේ. එසේ ම කෘෂි නිෂ්පාදන අලෙවි කිරීමෙන් ගොවි ප්‍රජාව වෙත මුදල් ලැබෙන අතර එමගින් දුගී බව තුරන් කිරීමට පිටිවහලක් ලැබේ.

අප දෙපාර්තමේන්තුව මගින් වියළි කලාපයේ කුඩා වැව් සංවර්ධනය කිරීම සිදු කරන අතර එම ප්‍රදේශ වල වෙනත් ජල ප්‍රභව ඉතාමත් අල්ප ය. එබැවින් මෙම වැව් අමුණු සහ ඇලවේලි ප්‍රතිසංස්කරණය තුළින් වැසි සමයේ වියළි කලාපයට ලැබෙන වැසි ජලය රඳවා සුරක්ෂා කර තබා ගැනීමෙන් පානීය හා සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය ජලය තිරසරව ලබා ගැනීමේ හැකියාව වැඩි වේ.

දේශගුණ විපර්යාස සහ ඒවායේ බපලෑම් වලට සෘජුවම බලපාන කොටසක් ලෙස වැව් පද්ධති සහ ඒවායේ කර්මාන්ත කරන ගොවි ජනතාව පෙන්වා දිය හැක. එහිදී වාරි පද්ධති ගංවතුර හානි වලට ලක් වී කඩාගෙන යාමෙන් වගා බිම්, දේපළ හා මිනිස් ජීවිත වල සුරක්ෂිත තාවයට බලපෑම් ඇති කළ හැක. තවද නියගය ඇති වූ විට පරිභෝජනයට පානීය ජලය පවා නොලැබීමේ අවධානමක් පවතී. නමුත් වැව් සංවර්ධනය කිරීම තුළින් වැසි සමයේ මෙම වියළි කලාපයට ලැබෙන වැසි ජලය එක්රැස් කර ගබඩා කර තබා ගැනීමට හැකි වෙනවා සේ ම දේශගුණ විපර්යාසයන්ට සුරක්ෂිතව මුහුණ දීමේ හැකියාව වර්ධනය වේ. ගංවතුර අවදානමට මෙන්ම නියං අවදානමට ද ඔරොත්තු දීමේ හැකියාව සුරක්ෂිත වේ.

වැව් සංවර්ධනය කිරීම තුළින් තිරසර වනාන්තර කළමනාකරණය හා වනාන්තර ආරක්ෂාකරණය සිදු වේ. පොළව අභ්‍යන්තර ජල මට්ටම ඉහළ අගයකින් පැවතීම නිසා කාන්තාරීකරණය වලකයි. විශේෂයෙන් ම මිරිදිය පරිසරයේ සහ වනාන්තර වල ජෛව විවිධත්වය ආරක්ෂා වීම සිදු වේ.

## විදේශ ව්‍යාපෘතියට අදාළ සංරචක වශයෙන් ප්‍රගතිය

| ව්‍යාපෘතිය | සංරචකය | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රතිලාභීන් ගණන | වැය කළ මුදල (2021 වසර තුළ) (රු.මි.) |
|---|---|---|---|---|---|
| වැව්ගම්පුබුදුව | UNDP | කිව්ලේකඩ වැව, මොරගොඩ වැව, කපුගම වැව, පලුගස්වැව යන වැව්වල ඇල වේලි සංවර්ධනය කිරීම | හොරොව්පතාන, ගලෙන්බිඳුණුවැව, පලුගස්වැව | ගොවි පවුල් 187 | 1.10 |
| | | රත්මලේ එල්ලංගා පද්ධතිය සංවර්ධනය කිරීම | හොරොව්පතාන | ගොවි පවුල් 155 | 26.61 |
| | | අලුත්හල්මිල්ලවැව එල්ලංගා පද්ධතිය සංවර්ධනය කිරීම | මැදවච්චිය | ගොවි පවුල් 746 | 70.57 |
| | | රජගම, සින්නකුලම, කොළොන්ගස්වැව, පන්වැලියාය වැව් වල ඇල වේලි ප්‍රතිසංස්කරණය කිරීම | පලුගස්වැව, ගලෙන්බිඳුණුවැව, හොරොව්පතාන, මැදවච්චිය. | ගොවි පවුල් 264 | 5.72 |
| පාරිසරික සංවේදී කලාප සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පරිසර පද්ධති සේවා නඩත්තුව | UNDP | ඉහල හබරවත්ත වැව, පහල හබරවත්ත වැව, වැටකොලුවාගම වැව සහ කනුපිච්චියාගම වැව ප්‍රතිසංස්කරණය | ගල්නෑව | ගොවි පවුල් 96 | 1.16 |
| දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ලෝක බැංකුව | රනෝරාව එල්ලංගා පද්ධතිය සංවර්ධනය කිරීම | - | ගොවි පවුල් 177 | 28.03 |
| | | වගයාකුලම කෘෂි මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | නොච්චියාගම | - | 3.67 |
| | | මීහොඳවැව ඒල්ලංගා පද්ධතිය සංවර්ධනය කිරීම | හොරොව්පතාන | ගොවි පවුල් 223 | - |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංක | ව්‍යාපෘති | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණු | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටි කාලීන/ දිගු කාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 01 | වාරි සෞභාග්‍යා | - | 28.43 | 10 | 67% | 38% | - |

## COVID - 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේ දී සංවර්ධන ඉලක්ක සාධනයේ දී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2021 වර්ෂයේ දී පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 698 ක ප්‍රතිපාදනයක් ලැබුණු අතර, ඒ යටතේ ව්‍යාපෘති 79 ක් ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දි දෙපාර්තමේන්තුව තුළ පවතින සේවක හිගය (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු හා කාර්මික නිලධාරි) හා මෙම වසර පුරාවටම පැවති COVID - 19 වසංගතය නිසා බොහෝ දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු විය.

විශේෂයෙන්ම සංචරණ සීමා යෙදීම, සේවකයන් සේවයට කැඳවන ප්‍රතිශතය 50% කට සීමා කිරිම, සංචරණ සීමා හේතුවෙන් සැලසුම් කළ දිනට ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරිමට නොහැකි වීම හා දැඩි සෞඛ්‍ය නීති රීති යටතේ කටයුතු කිරිමට සිදු වීම, යනාදී අපහසුතා හේතුවෙන් කාර්යාල රාජකාරි හා ක්ෂේත්‍ර රාජකාරි අපේක්ෂිත ගුණාත්මක භාවයෙන් සිදු කර ගැනිමට දුෂ්කර විය.

කෙසේ වෙතත් හැකි සෑම විටම අවශ්‍ය පහසුකම් ලබා දෙමින් උපරිම සේවක සංඛාවක් රාජකාරි සඳහා ගෙන්වීමටත්, මාර්ගගත ක්‍රමය ඔස්සේ රැස්වීම් පැවැත්වීම හා රාජකාරි කිරිම ආදී ක්‍රමවේද භාවිතයත් මගින් ඉහත ගැටළු විසඳා ගැනිම සිදු කරන ලදි.

# 10.2. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යටතේ ස්ථාපිත පළාත් සභා නම් නෛතික සංවිධාන ව්‍යුහයේ තවත් එක් විෂයයක් ලෙස ඉඩම් විෂයය හඳුන්වා දිය හැකිය. ඒ අනුව යමින් 1989 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පළාත් ඉඩම් කාර්යාලය නමින් මෙම දෙපාර්තමේන්තුව ආරම්භ විය. ආරම්භයේදී ඉඩම් අධ්‍යක්ෂක යන තනතුර යටතේ ආරම්භ වී වසරක් ඇවෑමෙන් එනම් 1990 වර්ෂයේදී දෙපාර්තමේන්තුවක් බවට පත් කරන ලදී. ඒ අනුව ඉඩම් කොමසාරිස්වරයෙකුගෙන් සමන්විතව උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ලෙස මෙම දෙපාර්තමේන්තුව ස්ථාපිත විය. මේ වන විට නිළධාරින් සහ සෙසු කාර්ය මණ්ඩලය 91 දෙනෙකුගෙන් සමන්විත වේ. පළාත් සභාවේ ආදායම් රැස් කරන්නන් අතර ප්‍රමුඛ ස්ථානයෙහිලා සිටින මෙම දෙපාර්තමේන්තුව ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන ඉඩමක හිමිකම ලබාදීමේ කාර්යය සඳහා නිරන්තරව කැපවී සිටී. පළාත් සභා පරිපාලනය යටතේ ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24හි ජීවත්වන මහජනතාව වෙත කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්, උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදේ. ඒ අනුව රජයේ ඉඩම්වල කළමනාකරණ හා පරිපාලන කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා වෙනත් පනත් හා නීති රෙගුලාසි ප්‍රකාරව රජයේ ඉඩම් බැහැර කිරීම, අධීක්ෂණය, සංවර්ධනය හා සංරක්ෂණය යන කාර්යයන් ඉටු කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව කැපවී කටයුතු කරයි.

## ඉඩම් පරිහරණය

| | අනුරාධපුර(හෙක්.) | පොළොන්නරුව(හෙක්.) | උතුරු මැද පළාත (හෙක්.) |
|---|---|---|---|
| ගෙවතු | 96,424 | 48,926.14 | 145,350.14 |
| කුඹුරු | 131,222 | 83,453.56 | 214,675.56 |
| පොල් | 1,865 | 873.24 | 2,738.24 |
| වෙනත් වගාවන් | 8,577 | 3374.99 | 11,951.99 |
| වනාන්තර | | | |
| • ඝණ | 199,428 | 163163.05 | 362,591.05 |
| • විවෘත | 15,922 | 4445.64 | 20,367.64 |
| • වගා කළ | 5,477 | 1718.68 | 7,195. 68 |
| • ලඳු කැලෑ | 191,100 | 11473.13 | 202,573.13 |
| වගුරු බිම් | 2,542 | 4156.45 | 6,698.45 |
| ජලාශ | 55,241 | 16240.86 | 71,481.86 |
| ඉදිකිරීම් | 1,585 | 1229.44 | 2,814.44 |
| ගල්පර | 2,949 | 5576.66 | 8,525.66 |
| මුඩු බිම් | 82 | 2006.03 | 2088.03 |
| වෙනත්/සුසාන භූමි/මාර්ග | 5,486 | 0 | 5,486 |
| **එකතුව** | **717,900** | **346,637.86** | **1,064,537.87** |

## දැක්ම

"නීත්‍යානුකූල ඉඩමක් - සමෘද්ධිමත් ජනතාවක්"

## මෙහෙවර

"නෛතික රාමුවට අනුකූලව යෝග්‍ය රජයේ ඉඩම් සුදුසුකම් සහිත ප්‍රජාවට විධිමත්ව ලබාදීම, ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය, රජයේ ඉඩම්වල සුරක්ෂිතභාවය සුරැකීම සහ සංවර්ධනය තුලින් ආදායම ජනනය කර ගැනීම, සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගීත්වයෙවන් හා විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාවට නැංවීම."

## දිගුකාලීන අරමුණු

- නීත්‍යානුකූල ඉඩම් හිමිකම් සහිත ප්‍රජාවක් බිහිකිරීම.
- ගුණාත්මක සහ කාර්යක්ෂම සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීම.
- ඉඩම් සම්පත ආරක්ෂා කිරීම හා එම ඉඩම් සංවර්ධන කාර්යයට දායක කර ගැනීම.
- අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම.
- පළාත් සභා ආදායම ඉහළ නැංවීම.

## කෙටිකාලීන අරමුණු

- වර්ෂයකදී දළ වශයෙන් හිමිකම් පත්‍ර 12,000 කට ආසන්න සංඛ්‍යාවක් ලබා දීම.
- සෑම වර්ෂයකදීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහනක් පැවැත්වීම.
- දිස්ත්‍රික්ක 02 ම ආවරණය වන පරිදි තිරසර සංවර්ධන අරමුණු මත පදනම්ව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියා කිරීම.
- අනවසර අල්ලා ගැනීම් පෙර වර්ෂයට සාපේක්ෂව අවම කිරීම.
- වසරින් වසර විවිධාංගිකරණය කරන ලද පුහුණු වැඩසටහන් සැලසුම් කර විවිධ අංශයන්ගෙන් දැනුම ලබා දීම.
- ඵලදායිතා සංකල්ප හඳුන්වා දෙමින් ආයතනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම.
- පෙර වසරට වඩා ඉහළ හා හිඟ අවම වූ බදු ආදායමක් එකතු කිරීම.

## ප්‍රධාන කාර්යයන්

- ➢ සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම.
- ➢ මහජන මිත්‍රශීලී කාර්යක්ෂම සේවා සපයන ආයතනයක් බිහිකිරීම සඳහා විධිමත් ආයතනික හා මූල්‍ය පරිපාලනයක් පවත්වාගෙන යාම.
- ➢ ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා ආයතනික භෞතික සම්පත් සංවර්ධනය.
- ➢ ආයතනික යහපාලන කටයුතු සංවර්ධනය.
- ➢ ඉඩම් වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල යටිතල පහසුකම් සංවර්ධනය.
- ➢ විධිමත් ඉඩම් පරිහරණ රටාවක් මඟින් රජයේ ඉඩම් වල ආරක්ෂාව තහවුරු කිරීම.
- ➢ ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය.
- ➢ රජයේ බදු ආදායම විධිමත්ව රැස්කිරීම හා ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම.
- ➢ නව සංවර්ධන ව්‍යාපෘතීන් හඳුනා ගැනීම සහ ඒ සඳහා සුදුසු ආයෝජකයින් යෙදවීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ✓ ඉඩම් හිමිකම තහවුරු කිරීම.
- ✓ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අවශ්‍ය භෞතික හා මූල්‍ය සම්පත් සැපයීම.
- ✓ රජයේ ඉඩම් ප්‍රශස්ත මට්ටමින් සංවර්ධනය කිරීම.
- ✓ රජයේ ඉඩම් වල ආරක්ෂාව තහවුරු කිරීම.
- ✓ මානව සම්පත් සංවර්ධනය කිරීම.
- ✓ මූල්‍ය සම්පත් විධිමත්ව කළමනාකරණය කිරීම.
- ✓ ඉඩම් ආදායම් හා කාර්යක්ෂමව හා විධිමත්ව රැස්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 109ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 84 කි. පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදන ( රු.මි) | 2021වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය ( රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 3.7 | 3.37 | 0.33 | 91% |
| 2.යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 2.0 | 1.64 | 0.36 | 82% |
| 3.වාහන | 0.5 | 0.26 | 0.24 | 52% |
| 4.වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 4.4 | 3.72 | 0.68 | 84% |
| **එකතුව** | **10.6** | **8.99** | **1.61** | **84%** |

## ජාතික ප්‍රතිපත්තිය තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන්මග

සෞභාග්‍යයේ දැක්මට අනුව ශ්‍රී ලංකාවේ භූමිය භාවිතා කල යුත්තේ ජනතාවගේ යහ පැවැත්ම සඳහාය.මිනිසාට මෙන්ම අනෙක් සත්වයින්ට භූමියට ඇති අයිතිය සුරක්ෂිත කරන භාරකාරයකු ලෙස රජය ක්‍රියා කල යුතුය. එලෙසටම තමන් වෙනුවෙන් හඬක් නැගිය නොහැකි කොට්ඨාස, එනම් සත්වයින් හා අනාගතයේ ඉපදීමට සිටින අනාගත පරම්පරාව සඳහා භූමිය ආරක්ෂා කරන භාරකාරයින් ලෙසට රජය ක්‍රියා කල යුතුය. එහිදී ඉඩම් හා බැඳුණු ආර්ථික සංකල්ප(Land Based Economy - සෑම අයකුටම බිම් අඟලක්) බන්ධනය කල යුතු අතර ජනාවාස ඉදිකිරීම කල යුතු වන්නේ හරිත සංවර්ධනය යන සංකල්පය යටතේය. එසේම මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ කෘෂි වගාවන් සඳහා රජයේ ඉඩම් බදු පදනම මත ලබාදීම සහ ගොවීන්ට වගා කටයුතු කිරීම සඳහා බලපත්‍ර සහිත ඉඩම් ලබාදීමට සැළසුම් කර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයක් මගින් එහි සශ්‍රික ප්‍රතිඵල මහජනතාවට උරුම කර දෙන සමෘද්ධිමක් අනාගතයක් උදෙසා කටයුතු කිරීමේ වගකීම රජයේ නිලධාරීන් වෙත පැවරී ඇත. ඒ අනුව රජයේ ඉඩම් රාජකාරී කටයුතු ග්‍රාම නිලධාරී, ඉඩම් නිලධාරී, ප්‍රාදේශීය ලේකම්, පළාත් ඉඩම් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් ජනරාල්, ඉඩම් විෂය භාර අමාත්‍යාංශ ලේකම්, ඉඩම් අමාත්‍යවරයා හා ජනාධිපති දක්වා වූ ජාලයක් ඔස්සේ ක්‍රියාත්මක වේ. මෙය ඉතා සංකීර්ණ ක්‍රියාවලියකි. රජයේ ඉඩම් වල පරම අයිතිය අතිගරු ජනාධිපතිවරයා සතු වන අතර එම බලතල වලින් කොටසක් ඉඩම් විෂය භාර අමාත්‍යවරයා සහ ඉඩම් කොමසාරිස් ජනරාල් වරයා වෙත පවරා ඇත. රජයේ ඉඩම් කළමනාකරණය ඉඩම් කොමසාරිස් ජනරාල්ට පැවරෙන අතර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවෙන් දිවයින පුරා සියළු රජයේ ඉඩම් ආරක්ෂා කරමින් එහි භාරකාරත්වය ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් දරනු ලබයි. නිරවුල් බිමක හිමිකම තහවුරු කිරීම වෙනුවෙන් පළාත් සභාවේ පරිපාලනය යටතේ පවතින ඉඩම් වලට අදාළ කටයුතු සඳහා පළාත් ඉඩම් කොමසාරිස් විසින් කටයුතු කරනු ඇත.

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය

| ***ශක්තීන්*** | ***දුර්වලතා*** |
|---|---|
| ▪ කාර්යක්ෂම සහ දක්ෂ කාර්ය මණ්ඩලය.<br>▪ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබාදීමේ හැකියාව.<br>▪ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග ශක්තිමත් සම්බන්ධීකරණ පද්ධතියක් පැවතීම.<br>▪ ඉඩම් සංවර්ධනය සඳහා වාර්ෂිකව රජයේ ප්‍රතිපාදන ලබාදීම. | ▪ රජයේ ඉඩම් පිළිබඳව යාවත්කාලීන වූ දත්ත පද්ධතියක් නොමැතිකම.<br>▪ ඉඩම් සංවර්ධනය සඳහා නිශ්චිත සංවර්ධන සැළැස්මක් නොමැති වීම.<br>දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුරප්පාඩු පැවතීම. |
| ***අවස්ථා*** | ***තර්ජන*** |
| ▪ නිපුනතාවයෙන් යුත් කාර්ය මණ්ඩලයක් මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතාවට සේවා සැපයීමට අවස්ථා ලැබීම.<br>▪ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙන මගපෙන්වීම හා සම්බන්ධීකරණය.<br>▪ වෙනත් ආයතන මඟින් ලබාදෙන පුහුණු අවස්ථා. | ▪ ඉඩම් වැඩි ප්‍රමාණයක් මැනීම් කර නොමැතිවීම.<br>▪ මහජනතාව රජයේ ආයතන කෙරෙහි දක්වන ඍනාත්මක ආකල්පය.<br>▪ වර්තමාන අවශ්‍යතා හා ඉඩම් පරිහරණ රටාව අනුව පවතින ඉඩමයම් යම් නීති හා රෙගුලාසි නොගැලපීම.<br>▪ ඉඩම් කළමනාකරණ කටයුතු සඳහා බාධා ඇතිපාලනය කල නොහැකි අවස්ථා තිබීම.<br>▪ ඉඩම් රාජකාරි ඉටු කිරීමේදී නිලධාරීන් හා මහජනතාව අතර සිදුවන අක්‍රමිකතාවයන් |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක

සංරචකය (component) 01 – රජයේ ඉඩම් කාර්යක්ෂමව යොදා ගැනීම

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 01 | රක්ෂිත ආරක්ෂා කිරීම | මැනුම් කරන ලද රක්ෂිත ගණන | - | 2 |

සංරචකය (component) 02 – ඉඩම් සංවර්ධනය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 02 | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | ප්‍රතිසංස්කරණය කරන ලද/සකස් කරන ලද මාර්ග ගණන | - | 5 |

සංරචකය (component) 03 – සැළසුම් හා කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධනය

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 03 | ආයතනික සංවර්ධනය | ලබාදෙන ලද බලපත්‍ර හා දීමනාපත්‍ර ගණන | - | 12475 |
| | | ඉදි කරන ලද නිල නිවාස ගණන | - | 1 |
| | | අළුත් වැඩියා කරන ලද ඉඩම් අංශ ගණන | - | 5 |
| | | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | - | 9 |

## එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්ය සාධන දර්ශක වල ඉලක්ක ලඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම) | ඉලක්ක 2021 | ඉලක්කය සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01 | රක්ෂිත ආරක්ෂා කිරීම | මැනුම් කරන ලද රක්ෂිත ගණන | 2 | 2 |
| 02 | යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | ප්‍රතිසංස්කරණය කරන ලද/සකස් කරන ලද මාර්ග ගණන | 5 | 4 |
| 03 | ආයතනික සංවර්ධනය | ලබාදෙන ලද බලපත්‍ර හා දීමනාපත්‍ර ගණන | 12475 | 3513 |
| | | ඉදි කරන ලද නිල නිවාස ගණන | 1 | 1 |
| | | අළුත් වැඩියා කරන ලද ඉඩම් අංශ ගණන | 5 | 3 |
| | | පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | 9 | 5 |

## ප්‍රධාන කාර්ය සාධන දර්ශකය ලඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම ( රු.මි) | ප්‍රතිලාභීන් ගණන (පවුල්) |
|---|---|---|---|---|---|
| | ඉලක්ක | ලඟාවීම | | | |
| මැනුම් කරන ලද රක්ෂිත ගණන | 2 | 2 | අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම හා ජාලගත කිරීම. | 0.72 | 110 |
| ප්‍රතිසංස්කරණය කරන ලද/සකස් කරන ලද මාර්ග ගණන | 5 | 4 | අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග ඇති කිරීම හා ප්‍රවේශ  මාර්ග ප්‍රතිසංස්කරණය. | 1.46 | 218 |
| අළුත් වැඩියා කරන ලද ඉඩම් අංශ ගණන | 5 | 3 | අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කර්යාල වල  ඉඩම් අංශ අළුත්වැඩියා | 1.49 | |
| ඉදි කරන ලද නිල නිවාස ගණන | 1 | 1 | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අංක 02  නිල නිවාසයේ 02 අදියරේ වැඩ අවසන් කිරීම. | 2.3 | |
| | 1 | 1 | පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිල නිවාස අංක 1හා නිල නිවාස අංක 02 වෙන්කිරීම සඳහා තාප්පය ඉදිකිරීම හා භූමි අලංකරණ කටයුතු සිදු කිරීම. | 1 | |
| පවත්වන ලද පුහුණු වැඩසටහන් ගණන | 9 | 5 | පළාත්ඉඩම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන්පැවැත්වීම. | 0.072 | |
| ලබාදෙන ලද බලපත්‍ර හා දීමනාපත්‍ර ගණන/ | 12475 | 3513 | අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට හා ප්‍රධාන කාර්යාලටය අවශ්‍ය කාර්යාලයීය උපකරණ ලබාදීම. | 1 | |
| | | | අඩු පහසුකම් සහිත ප්‍රා.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට හා ප්‍රධාන කාර්යාලටය අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ දීම. | 0.62 | |
| අළුත්වැඩියා කරන ලද වාහන සංඛ්‍යාව | 1 | 1 | පළාත්ඉඩම් දෙපාර්තමේන්තුවේ වාහන අළුත්වැඩියාව | 0.26 | |

## සංවර්ධන ප්‍රගතිය ව්‍යාපෘති මට්ටමින්

| ව්‍යපෘතිය | 2021 වර්ෂය සඳහා අනුමත මුදල (රු.මි) | වැයකල මුදල (රු.මි) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අංක 02 නිල නිවාසයේ 02 අදියරේ වැඩ අවසන් කිරීම. | 2.7 | 2.37 | 100% | 87.9% |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිල නිවාස අංක 1හා නිල නිවාස අංක 02 වෙන්කිරීම සඳහා තාප්පය ඉදිකිරීම හා භූමි අලංකරණ කටයුතු සිදු කිරීම. | 1 | 1 | 100% | 100% |
| රජයේ ඉඩම් ආරක්ෂා කිරීම සඳහා ගල්පර/කඳු ප්‍රදේශ හා ජල මූලාශ්‍ර සහිත ප්‍රදේශ මායිම් කොට වෙන් කිරීම. | 0.8 | 0.72 | 100% | 90.6 % |
| අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග ඇති කිරීම හා ප්‍රවේශ මාර්ග ප්‍රතිසංස්කරණය. | 1.6 | 1.41 | 100% | 87.9% |
| අනුරාධපුර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍ර.ලේ.කර්යාල වල ඉඩම් අංශ අළුත්වැඩියා කිරීම. | 1.5 | 1.49 | 100% | 99.7% |
| අඩු පහසුකම් සහිත ප්‍ර.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට හා ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය කාර්යාලයීය උපකරණ ලබාදීම. | 1.05 | 1.01 | 100% | 95.7% |
| අඩු පහසුකම් සහිත ප්‍ර.ලේ.කාර්යාලවල ඉඩම් අංශයට හා ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ලබාදීම. | 0.95 | 0.63 | 100% | 66.4% |
| පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ වාහන අළුත්වැඩියාව | 0.5 | 0.27 | 100% | 53% |
| පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 0.5 | 0.07 | 15% | 14% |
| එකතුව | **10.6** | **8.97** | | |

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ අංක 02 නිල නිවාසයේ 02 අදියරේ වැඩ අවසන් කිරීම





පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිල නිවාස අංක 1හා නිල නිවාස අංක 02 වෙන්කිරීම සඳහා තාප්පය ඉදිකිරීම හා භූමි අලංකරණ කටයුතු සිදු කිරීම





ප්‍රාදේශීය ලේකම් කර්යාල වල ඉඩම් අංශ අළුත්වැඩියා කිරීම. (ප්‍රා.ලේ.කා.මඟින් ක්‍රියාත්මක කරන ලදි)



රඹෑව



ගලෙන්බිඳුනුවැව



ඇලහැර

රක්ෂිත මායිම් කොට වෙන් කිරීම (ප්‍රා.ලේ.කා.මඟින් ක්‍රියාත්මක කරන ලදි)



විලච්චිය



කැකිරාව



ගල්නෑව ප්‍රා.ලේ.කො. 471 පිටියේ යාය වසමේ ප්‍රධාන මහවැලි ඇල බැම්ම සිට ආර්.පී.ජී මාටින් මහතාගේ ඉඩම දක්වා එකමුතුගම ගම්මාන මාර්ගය මී.300 ප්‍රතිසංස්කරණය



නොච්චියාගම ප්‍රා.ලේ.කො. තරණගහවැව මාර්ගයේ සිට කරගහවැව දක්වා කෘෂි මාර්ගය මී.270 ඉදි කිරීම.

ප්‍රවේශ මාර්ග සකස් කිරීම හා ප්‍රවේශ  මාර්ග ප්‍රතිසංස්කරණය
(ප්‍රා.ලේ.කා.මඟින් ක්‍රියාත්මක කරන ලදි)



මැදිරිගිරිය ප්‍රා.ලේ.කො. 113 බිසෝ බංඩාර වසමේ බිසෝ බංඩාර අමිල මහතාගේ නිවස අසල සිට බිසෝබංඩාර පොහොර ගබඩාව දක්වා මාර්ගය මී.500ක් සංවර්ධනය කිරීම



නැ.නු.ප ප්‍රා.ලේ.කො. නෙළුම් කන්නිය පීටර් රත්නායක මහතාගේ නිවස අසල සිට කුඹුරු යාය දක්වා වූ කෘෂි මාර්ගය මී.250 සංවර්ධනය කිරීම

2021 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඉඩම් කච්චේරි පැවැත්වීම



**කහටගස්දිගිලිය**



**පලාගල**



**ම.නු.ප.**

## මධ්‍යකාලීන සංවර්ධන සැළැස්මේ අන්තර්ගත කල ආකාරයට එහි ඉලක්ක කරා ලඟාවීම

වාර්ෂික සංවර්ධන සැළැස්මට අනුව ඉඩම් සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 09ක් ක්‍රියාත්මක කර රු. 8,973,090.01ක මුදලක් ඒ සඳහා වැය කර ඇත. ඉඩම් වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග 04ක් සකස් කර ඇත. අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීම සඳහා වැව් රක්ෂිත 02ක් මායිම් කොට වෙන් කිරීම සිදුකර ඇත. එමගින් ඉඩම් සංවර්ධනය සඳහා පහසුකම් සැළසීමත් විධිමත් ඉඩම් පරිහරණ රටාවක් මඟින් රජයේ ඉඩම්වල ආරක්ෂාව තහවුරුවීමත් සිදුවී ඇති අතර අනවසර අල්ලාගැනීම්ද පාලනය වී ඇත. ඉඩම් සංවර්ධනය හා සංරක්ෂණය සඳහා රක්ෂියන්හි පැළ සිටුවීමේ ව්‍යාපෘතියද 2021 වසරේදී ක්‍රියාත්මක කරන ලදි.

ඵලදායී මහජන සේවාවක් ලබාදෙන ආයතනයක් ඇති කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ යන්ත්‍ර හායන්ත්‍රෝපකරණ ලබා දීඇත.මිත්‍රශීලී කාර්යක්ෂම නිලධාරින්ගෙන් යුත් ගුණාත්මක සේවා සපයන ආයතනයක් ඇති කිරීමේ අරමුණින්ඉඩම් අංශ 03ක් නවීකරණය කිරීමට කටයුතු කර ඇති අතර නිලධාරීන්ගේ සේවා පහසුව සඳහා ඉදිකරන ලද නිල නිවාසයේ 11 අදියරේ වැඩ අවසන් කර භාවිතය සඳහා ලබා දී ඇත.ආයතනික අරමුණු හා උපායමාර්ග ඉටුකර ගැනීමට අවශ්‍ය මානව සම්පත් කාර්ක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීම පරමාර්ථ කොට ගෙන ආයතනයක් විසින් නිලධාරීන් සඳහා පුහුණුවීම් ලබාදෙන අතර 2021 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 05ක්පවත්වා නිලධාරීන් 182කු පුහුණු කර ඇත.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක - ක්‍රියාකාරී සැළැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්ය සාධන දර්ශක | වර්ෂය තුල සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%)ලෙස | | | |
|---|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% | 50ට අඩු |
| මහජනතාව වෙත ලබා දුන් ඉඩම් හිමිකම්පත් ගණන | | | | 28.1% |
| පළාත්සභා ඉඩම් වලින් උපයන ලද වාර්ෂික බදු ආදායම | 111% | | | |
| පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන | | | 54.3% | |

## අත්පත් කරගන්නා ලද කාර්යසාධන දර්ශක පිළිබඳ හැඳින්වීමක්

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් ආයතනයේ කාර්යයන් මැන බැලීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශකකිහිපයක් හඳුනාගෙන ඇත.

- මහජනතාව වෙත ලබා දුන් ඉඩම් හිමිකම්පත් ගණන
- පළාත් සභා ඉඩම් වලින් උපයන ලද වාර්ෂික බදු ආදායම
- පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන

රජයේ ඉඩම් වල අයිතිය බැහැර කිරීමේදී රජයේ ඉඩම් ආඥා පනත හා ඉඩම් සංවර්ධන ආඥා පනතට අනුව අනවසරයෙන් භුක්ති විඳින ලද ඉඩම් නීත්‍යානුකූල කිරීම සඳහා කච්චේරි පවත්වා සුදුස්සන් තෝරාගෙන ඔවුන් සඳහා ඉඩම් හිමිකම ලබාදේ. 2021 වසරේදී ඉලක්ක කළ ඉඩම් කච්චේරි ප්‍රමාණය කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් පැවැත්වීමට නොහැකි වුවත් නිලධාරීන්ගේ කැපවීම හා උත්සහය මත 54.3% ක අපේක්ෂිත නිමවුමක් කරා යාමට හැකියාව ලැබුනි. ඒ අනුව හිමිකම්පත් 3513 ක් මහජනතාව වෙත ලබාදීමට හැකි විය.

දිගු කාලීන බදු ක්‍රමය යටතේ ඉඩම් ලබාදීම වර්තමානයේ ඉහළ ගොස් ඇත.එමෙන්ම මධ්‍යකාලීන හා දිගු කාලීන ආයෝජන අවස්ථා සඳහා රජය සතු ඉඩම් ලබාදීම සිදු කරයි. මෙමඟින් ආර්ථික හා සමාජයීය සංවර්ධනයට මෙන්ම යටිතල පහසුකම් සංවර්ධනයද ඉවහල් වී ඇත.රජයේ ඉඩම් සම්පත ප්‍රශස්ත කළමනාකරණය තුලින් රාජ්‍ය බදු ආදායම් ව්‍යුහය ශක්තිමත් කිරීමෙහිලා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල එක්ව කටයුතු කරනු ලබයි. එහිදී නව බදු ආදායම් හා හිඟ බදු ආදායම් ලෙස වෙන් වෙන්ව බදු ගණනය කර ඒවා නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. 2021 වර්ෂයේදී බදුකරුවන්ගෙන් නියමිත කාලවකවානුව තුල බදු අයකර ගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර එමඟින් මෙම වසරේදී උපයන ලද බදු ආදායම 111% වැඩිවීමක් පෙන්වා ඇත.ඒ අනුව මෙම වසරේදී ඉඩම් බදු ඉපයීමේ කාර්යයේදී ඉහළ කාර්යසාධන මට්ටමකට ළඟා වීමට හැකි වී ඇත.

## අංශය නියෝජනය වන තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක යටතේ මෙම වසරේදී දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇති අතර කොවිඩ්-19 වසංගත තත්වය හමුවේ පැවති දුෂ්කරතාවයන් මත වුවද එකී අරමුණු සපුරා ගැනීම සඳහා උත්සහ දරා ඇත.

තිරසර සංවර්ධන අරමුණු 01 හි සඳහන් 1.4 ඉලක්කයට අනුව සියළුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030වසර වන විට ඉඩම් හිමිකාරීත්වය සඳහා ප්‍රවේශ වීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ඊට සම්බන්ධිත ආයතන කටයුතු කරමින් සිටී. ඒ සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අංක 2008/4 හා 2008/4(1) චක්‍රලේඛ අනුව ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනාගෙන ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් සහ බෙදා දීමට සුදුසු ඉඩම් හඳුනාගෙන ඇත. මෙහිදී ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර ලබාදීමට හඳුනාගත් ඉඩම් කට්ටි සංඛ්‍යාව 10938ක් වන අතර රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීමට හඳුනාගත් ඉඩම් කට්ටි සංඛ්‍යාව 2298කි. මෙම වසරේදී ග්‍රාම නිලධාරී වසම් 263ක් ආවරණය කරමින් ඉඩම් කච්චේරි 373ක් පවත්වා ඇති අතර ඒ අනුව බලපත්‍ර හා දීමනා පත්‍ර 3513ක් පුද්ගලයන් වෙත බෙදා දී ඇත. බලපත්‍ර 6856ක් හා දීමනාපත්‍ර 1036ක් පුද්ගලයන් වෙත ලබාදීම සඳහා සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එසේම ඉඩම්ලාභීන්ගේ ඉඩම් ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළු රාජ්‍ය නිලධාරීන් මැදිහත්වී ප්‍රාදේශීය මට්ටමන් විසඳීම හා උපදෙස් සැපයීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ක ජංගම සේවා වැඩසටහන් 12ක් පවත්වා ඉඩම් ගැටළු 385ක් විසඳමින් පුද්ගලයන් වෙත නිරවුල් බිමක හිමිකාරිත්වය ලබාදීම සඳහා කටයුතු කර ඇත.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කළ යුතු බදු ආදායම පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද ඇස්තමේන්තු ඉලක්කයට වඩා වැඩි වී ඇත. ඉඩම් නව බදු දීම් ප්‍රමාණාත්මකව ඉහල යාම, ඉඩම් වල තක්සේරු වටිනාකම ඉහල යාම හා බදු එකතු කිරීම විධිමත් කිරීම මෙසේ බදු ආදායම වැඩිවීම සඳහා බලපෑ හේතු ලෙස පෙන්වා දිය හැකිය.ඒ අනුවමෙම වසරේදී උපයන ලද බදු ආදායම 111%ක වැඩිවීමක් පෙන්වා ඇත.මෙමඟින් තිරසර සංවර්ධන ඉලක්ක 17.1 ට අනුව බදු සහ වෙනත් ආදායම් එක් රැස් කිරීම් වර්ධනය කිරීම යටතේ තිරසර සංවර්ධන අරමුණ කරා ළඟා වීමට පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සුවිශේෂී දායකත්වයක් සපයා ඇත.

සෑම වසරකම ඉඩම් රාජකාරී කටයුතු ඉටු කරන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර මෙම වසර්දී පුහුණු වැඩසටහන් 05ක් පවත්වා නිලධාරීන් 182ක් පුහුණු කර ඇත. තිරසර සංවර්ධන ඉලක්ක 8.2ට අනුව නිලධාරීන්ගේ සේවා පහසුව සඳහා නිල නිවාස දෙකක් ඉදිකර අවසන් කර ඇති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඉඩම් අංශය නවීකරණය කිරීම හා ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීම තුලින් ආයතනික භෞතික සම්පත් සංවර්ධනය කිරීම මඟින් මහජනතාව වෙත කාර්යක්ෂම සේවා සපයන ආයතනයක් ඇති කිරීම සඳහා කටයුතු කර ඇති අතර එමඟින් තිරසර සංවර්ධන අරමුණු කරා අපේක්ෂිත මට්ටමට ලඟා වීමට හැකියාව ලැබී ඇත.

තිරසර සංවර්ධන ඉලක්ක 15.1 ට අනුව අනවසර අල්ලා ගැනීම් පාලනය කිරීම සඳහා රජයේ රක්ෂිත මැනුම් කර මායිම් කිරීම මෙම වසරේදීද ක්‍රියාත්මක කර ලද අතර පළාත් සෞඛ්‍ය හා පරිසර අමාත්‍යාංශයේ දායකත්වයෙන් පරිසර හානිය අවම කර ගැනීම සඳහා මෙම රක්ෂිත වල රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි. ඒ අනුව පරිසර පද්ධති ආරක්ෂා කිරීම ,සංරක්ෂණය කිරීම, ඉඩම් හායනය වැලැක්වීම හා නැවත නගා සිටුවීම මඟින් තිරසර වනාන්තර කළමනාකරණය සඳහා දායකත්වයත් සපයා ඇති අතර අනාගත සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් සම්පත සුරක්ෂිත කිරීමට කටයුතු කර ඇත.

ඉඩම් වල වටිනාකම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා හඳුනා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන බලපත්‍ර ලබාදුන් ඉඩම් සඳහා ප්‍රවේශ මාර්ග සකස්කර ඇත.මෙම වැඩසටහන ආර්ථික, සංවර්ධනය හා මානව යහ පැවැත්ම වෙනුවෙන් තිරසර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යන ඉලක්ක ඔස්සේ තිරසර සංවර්ධන අරමුණු කරා ලඟා වීමකි .

## හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50%-74% | 75%-100% |
| සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම. | සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීම. | ඉඩම් නිරවුල් කිරීමේ කඳවුරු පැවැත්වීම. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් කච්චේරි පැවැත්වීම. | | | 54.3% |
| | | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම | | 50% | |
| ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාව යේ පුනර්ජීවනය | රජයේ බදු ආදායම විධිමත්ව රැස්කිරීම හා ඒ වෙනුවෙන් ක්‍රියාකිරීම. | බදුකරුවන්ගෙන් නියමිත කාලවකවානුවතු ල බදු අයකර ගැනීමේ කටයුතු විධිමත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල යාවත්කාලීන වී නොමැති බදු ගොනු හඳුනාගැනීම හා යාවත්කාලීන කිරීම, බදුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | | | 111% |

## ආදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි) | සත්‍ය ආදායම (රු.මි) | එකතු කිරීමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| 2002.01.03 | 192 | 213.9 | 111% |

## පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ මහජනතාව වෙත ලබා දුන් සේවාවන්

රජයේ ඉඩම් මහජනතාව වෙත බැහැර කිරීම ගත්විට ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගොවි පන්තිය හා ගොවි පන්තිය නොවන කාණ්ඩ වලට අයත් පුද්ගලයන් වෙත නේවාසික හා කෘෂිකාර්මික කටයුතු සඳහා බලපත්‍ර ලබාදීම සහ රජයේ ඉඩම් ආඥා පනත යටතේ කෘෂිකාර්මික ,නේවාසික, කාර්මික, වානිජමය අවශ්‍යතාවයන් සඳහා වැඩි ආදායම්ලාභීන් හා නාගරික ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන් වෙත ඉඩම් ලබාදීමත් ආයතනවලට ඉඩම් ලබාදීමත් සිදුකර ඇත. ඒ අනුව බලපත්‍ර, දීමනාපත්‍ර, දීර්ඝකාලීන බදු බලපත්‍ර හා නිදහස් දීමනාපත්‍ර ඇතුලත්ව පුද්ගලයන් වෙත බෙදා දෙන ලද හිමිකම්පත් ගණන 3513කි. මෙම තත්වය ඉලක්ක කළ ගණනට වඩා අඩුවක් පෙන්නුම් කර ඇත්තේ රටතුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ අනුගමනය කල සංචරන සීමා ආදී ක්‍රියා මාර්ග හේතුවෙන් නිලධාරීන් විසින් ඉලක්ක කළ රාජකාරී කටයුතු සිදුකර ගැනීමට නොහැකි වූ බැවිනි.

ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අංක 2008/4හා 2008/4(1) චක්‍රලේඛය අදාල කර ගනිමින් ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනාගෙන ලියාපදිංචි කිරීමේ වැඩ පිළිවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් 2021 වර්ෂයේදීත් ක්‍රියාත්මක කරන ලදි. සුදුසුකම් සහිත ජනතාවට ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීමේ අරමුණින්ඉඩම්කච්චේරි686ක් පැවැත්වීම සඳහා 2021 වර්ෂයේ ඉලක්ක කළ අතර එකී ඉලක්කය සපුරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් රටතුළ පැවති සෞඛ්‍ය ගැටළු හමුවේ වුවද උනන්දු වී කටයුතු කර ඇත. ඒ අනුව 2021 වසරේදී ග්‍රාම නිලධාරී වසම් 267ක් ආවරණය කරමින් ඉඩම් කච්චේරි 373ක් පවත්වා ඇත.මේ සඳහා ලියාපදිංචි වූ පුද්ගලයින් ගණන 15301කි.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර නිකුත්කර ඇති ඉඩම් සංවර්ධනය කල පසුව ස්ථිර අයිතියක් ලබාදීම සඳහා කොන්දේසි වලට යටත්ව දීමනාපත්‍ර නිකුත් කරන අතර මේ වන විට මෙම කටයුතු කඩිනමින් ඉටු කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් රජයේ ඉඩම් තොරතුරු කළමණාකරණ පද්ධතිය(e-Slims) හඳුන්වා දී ඇත. 2021 වර්ෂය අවසානය වන විට පළාත් සභාවට අයත් ඉඩම් පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ලේම දීමනාපත්‍ර සකස් කිරීමේ කටයුතු e-Slims පද්ධතිය ඔස්සේ සිදු කිරීමට පියවර ගෙන ඇති අතර ඒ අනුව දීමනාපත්‍ර 802ක් සකස් කිරීම සඳහා නිර්දේශ යොමුකර ඇත.

ඉඩම්ලාභීන්ගේ ඉඩම් ආශ්‍රිතව පැන නැගී ඇති ගැටළුවලට රාජ්‍ය නිලධාරීන් මැදිහත් වී උපදෙස් සැපයීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ක ජංගම සේවා වැඩසටහන් 12ක් පවත්වා පුද්ගලයින් 1427කගේ නොවිසඳුන ඉඩම් ගැටළු 385ක් සඳහා විසඳුම් ලබාදීමට කටයුතු කර ඇත. නේවාසික කෘෂිකාර්මික, සහ වානිජ කටයුතු සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ට, පුද්ගලයන්ට රජයේ ඉඩම් බදු දී ආදායම් රැස්කිරීම කරනු ලබයි. රජයේ ඉඩම් සම්පත ප්‍රශස්ත කළමනාකරණය තුලින් රාජ්‍ය බදු ආදායම් ව්‍යුහය ශක්තිමත් කිරීමේ විශේෂ ක්‍රියාවලියක් පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල එක්ව ඉටුකරනු ලබයි. පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව රැස්කළ බදු ආදායම පසුගිය වසරේ මෙන්ම මෙම වසරේද ඇස්තමේන්තු ඉලක්කයට වඩා වැඩි වී ඇත. ඉඩම් බදු ආදායම් පිළිබඳව පුරෝකථනය කිරීමේදී නව බදු ආදායම් රැස් කිරීම සහ හිඟ බදු ආදායම් රැස් කිරීම වෙන් වෙන්ව සලකනු ලබන අතර ඒ අනුව 2021 වසරේදී මෙම දෙඅංශයෙන්ම උපයන ලද බදු ආදායම රු.මි. 213.91කි.මෙය ඉලක්ක කල ආදායමින් 111%ක වැඩිවීමකි.

***මුහුණ දීමට සිදුවූ අභියෝග***

මහජනතාව වෙත කාර්යක්ෂම සේවයක් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම් ,උපදෙස් හා මඟපෙන්වීම මෙම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ලබාදෙයි .දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීමට අදාලව විවිධ ක්‍රියාකාරකම් 2021 වර්ෂයේ ඉටු කිරීම සඳහා සැළසුම් කර තිබුණද පැවති කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් ඉලක්ක කරන ලද වැඩසටහන් සියල්ල බලාපොරොත්තු වූ පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

2021 වර්ෂයේදී ඇස්තමේන්තු කරන ලද බදු ආදායම ඉක්මවා රැස් කර ඇති බදු ආදායමේ ප්‍රමාණය ඉහල අගයක් ගෙන ඇතත් පාලන ගිණුම යටතේ රු.මි. 74.8ක් හා හිඟ පාලන ගිණුම යටතේ රු.මි.340ක් තවදුරටත් අයකර ගැනීමට ඇත. මේ සඳහා හේතු වී ඇත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් බදු එකතු කිරීමේදී පැන නැගී ඇති ක්ෂේත්‍ර ගත අඩුපාඩුකම්, බදු ආදායම් රැස් කිරීම හා සම්බන්ධ චක්‍රලේඛ පිළිබඳව නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන නොවීම, නිලධාරීන්ගේ හිඟය සහ බදුකරුවන්ගේ ආකල්පමය තත්වයන්ය.මෙම තත්වයන් මගහරවා ගැනීම සඳහා ඉලක්ක කරන ලද වැඩසටහන් බොහොමක් රට තුල පැවති අයහපත් සෞඛ්‍ය තත්වය හමුවේ ක්‍රියාත්මක කල නොහැකි විය.

2021 වසරේදී පුද්ගලයන් වෙත ඉඩම් හිමිකම්පත් 12475ක් බෙදාදීම සඳහා ඉලක්ක කර තිබුනද කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් කාර්යාලගත රාජකාරී කටයුතු නිසි වේලාවට ඉටුකරගත නොහැකිවීම මත 28.1%ක ප්‍රගතියක් කරා ළඟාවීමට සිදුවිය.

පළාත් සභා පරිපාලනය යටතේ පවතින ඉඩම් අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 24 හි ඉඩම් රාජකාරී කටයුතු සඳහා නිලධාරීන් යොදවා ඇතත් තනතුරු 25ක පුරප්පාඩු පවතී. ඒ අනුව රාජකාරී ආවරණය කරමින් කටයුතු කරගෙන යාමේ අභියෝගය පවතී.

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් 2021 වර්ෂයේ ඉටු කිරීම සඳහා සැළසුම් කර තිබුනද පැවති කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් හා වෙළඳපොලේ අමුද්‍රව්‍ය හිඟ වීම හා භාණ්ඩ වල මිළ ඉහළයාම මත ඉලක්ක කරන ලද ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

ඉඩම් හිමිකම නීත්‍යානුකූලව ලබාදීමේ අරමුණින්ඉඩම්කච්චේරි686ක් පැවැත්වීම සඳහා ඉලක්ක කල අතර එකී ඉලක්කය සපුරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් පැවති ගැටළු හමුවේ වුවද උනන්දු වී කටයුතු ඇත.ඒ අනුව 2021 වසරේදී ග්‍රාම නිලධාරී වසම් 267ක් ආවරණය කරමින් ඉඩම් කච්චේරි 373ක් පවත්වා ඇත.එසේම මෙම වසරේදී බදු ආදායම් රැස් කිරීම විධිමත් කිරීම හේතුවෙන් බදු ආදායම රැස් කිරීම 111%ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.

කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් කාර්යාලගත රාජකාරී කටයුතු නිසි වේලාවට ඉටුකරගත නොහැකිවීම මත 2021 වසරේදී හිමිකම්පත් 12475ක් පුද්ගලයන් වෙත බෙදාදීම සඳහා ඉලක්ක කර තිබුනද 3513ක ප්‍රමාණයක් පමණක් මහජනතාව වෙත ලබාදීමට හැකි වූ අතර ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල නිලධාරීන් විශාල සහයෝගයක් ලබාදී ඇත.

# 10.3. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

## ආයතනය පිළිබඳ මූලික තොරතුරු

සාරධර්ම සුරකින පරිසර හිතකාමී විනයගරුක නිරෝගී අභිමානවත් සමාජයක් ගම තුළ නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට දායකත්වය සපයන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29 තුළ විවිධ වැඩසටහන් පවත්වමින් ප්‍රජාව සමග සෘජුව සම්බන්ධතා පවත්වාගෙන යනු ලැබේ. ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය සාම්ප්‍රදායික තත්වයන්ගෙන් මිදී තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගත හැකි පරිදි පළාත් සභා ප්‍රතිපාදන යොදා ගනිමින් ප්‍රජා දායකත්වය ප්‍රමුඛ කොටගෙන 2018 වර්ෂයේ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සිදු කොට ඇත. ඒ සඳහා බිම් මට්ටමින් අනුරාධපුර සහ පොළොන්නරු දිස්ත්‍රික්කවල පවතින ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් සහ දිස්ත්‍රික් සංගම් සඳහා ක්‍රියාත්මක සැලසුම් සකස්කර ඇත. 2019 වර්ෂයේ උතුරු මැද පළාත් සභාව මගින් ලබාදුන් ප්‍රතිපාදන යොදා ගනිමින් 2011 අංක 03 දරණ උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සහ පළාත් සභා මූල්‍ය නීති සංග්‍රහය, භාණ්ඩාගාර චක්‍රලේඛන, රේඛීය අමාත්‍යාංශ චක්‍රලේඛන, පළාත් සභා සැලසුම් අංශයේ චක්‍රලේඛන හා ආකෘතිවලට අනුව විනිවිදභාවයකින් යුක්තව කටයුතු කිරීම සිදුවේ. උතුරු මැද පළාත් සභාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම ග්‍රාම සංවර්ධන නිලධාරීන් එක් අයෙක් බැගින් අනුයුක්තකර ඇති අතර සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම පවත්වාගෙන යනු ලබන තිරසර සංවර්ධන ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන (ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන) සඳහා මැහුම් උපදේශිකාවන් එක් අයෙකු බැගින් පත්කර ඇත. අනුරාධපුර හා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සියළුම ක්ෂේත්‍ර රාජකාරී අධීක්ෂණය කිරීමට ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් නිලධාරීන් දෙදෙනෙක් සහ ජ්‍යෙෂ්ඨ මැහුම් උපදේශිකාවන් දෙදෙනෙක් පත්කර ඇත.

1947න් පසු බිහිවූ නිදහස් ශ්‍රී ලංකාවෙහි ප්‍රථම රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දෙපාර්තමේන්තු විෂය ලැයිස්තුවෙහි දක්නට ලැබෙන ග්‍රාම සංවර්ධන විෂය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සඳහා 1987.11.14 දින සම්මත කරන ලද 13 වන සංශෝධනයෙන් පළාත් සභා මඟින් ක්‍රියාත්මක කළ යුතු පළාත් සභා විෂයක් ලෙස ලැයිස්තු ගත කර තිබේ. ඒ අනුව මධ්‍යම රජයේ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරය පළාත් සභාව තුළ ආරම්භ වූ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශය වෙත පැවරී ඇත. මධ්‍යම රජය යටතේ ග්‍රාම සංවර්ධන විෂය තුළ කටයුතු කළ ග්‍රාම සංවර්ධන නිලධාරීන් (RDO) පළාත් සභාවට අන්තර්ග්‍රහණය කර තිබේ. පසු කාලීනව ග්‍රාම සංවර්ධන විෂය ක්ෂේත්‍රය තුළ අත්කරගත් ප්‍රගතියත් සමඟ අදාල කාර්යය සංවිධිත ලෙස ඉටුකිරීම සඳහා 1990.01.01 දින සිට උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත.

අදාල විෂයපථයෙහි පරිපාලනමය හා සංවර්ධන කටයුතු විමධ්‍යගත කරමින් පළාත තුළ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 හි ප්‍රාදේශීය ලේකම්වරුන් ග්‍රාම සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස පත් කිරීම තුළින් ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන කාර්යභාරය ඵලදායී හා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. වර්තමානය වනවිට 2011 අංක 3 දරන උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය මඟින් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල සියලු කාර්යයන් ඉටුකිරිමට අවශ්‍ය බලය ප්‍රදානය කර ඇත.

## ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථාන -11 ලියසවිය මධ්‍යස්ථානය - 14

| |
|---|
| හොරොව්පතාන |
| මැදවච්චිය |
| රඹෑව |
| පදවිය |
| කැබිතිගොල්ලෑව |
| මිහින්තලේ |
| කැකිරාව |
| ඉපලෝගම |
| නොච්චියාගම |
| නාච්චාදූව |
| පලුගස්දමන |

| | |
|---|---|
| තිරප්පනේ | වැලිකන්ද |
| හිඟුරක්ගොඩ | මැදිරිගිරිය |
| මධ්‍යම නුවරගම් පළාත | රඹෑව |
| කහටගස්දිගිලිය | කැබිතිගොල්ලෑව |
| ගල්නෑව | තලාව |
| පලුගස්වැව | රාජාංගනය |
| ඉපලෝගම | පදවිය |

## ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ තොරතුරු

| අංකය | ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන කාර්යාලය | ග්‍රාම සං. සමිති සංඛ්‍යාව | මූල්‍ය වත්කම (රු) | තුලාන සංඛ්‍යාව | ගම් සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1 | නැ.නු.ප | 54 | 55,504,306 | 29 | 72 | 16,382 |
| 2 | ම.නු.ප | 32 | 6,259,781 | 40 | 181 | 15,721 |
| 3 | මහ විලච්චිය | 21 | 6,307,000 | 17 | 102 | 6,817 |
| 4 | නොච්චියාගම | 36 | 10,913,880 | 36 | 110 | 16,355 |
| 5 | රාජාංගනය | 21 | 3,797,805 | 21 | 53 | 10,521 |
| 6 | තඹුත්තේගම | 26 | 7,480,000 | 26 | 63 | 13,843 |
| 7 | ගල්නෑව | 35 | 5,342,850 | 30 | 71 | 11,374 |
| 8 | පලාගල | 35 | 3,713,711 | 35 | 98 | 11,124 |
| 9 | නාච්චාදූව | 37 | 16,799,753 | 19 | 49 | 7,995 |
| 10 | තලාව | 52 | 10,214,887 | 39 | 120 | 19,433 |
| 11 | ඉපලෝගම | 36 | 2,366,601 | 32 | 106 | 10,225 |
| 12 | කැකිරාව | 59 | 4,655,332 | 53 | 118 | 18,873 |
| 13 | මිහින්තලේ | 45 | 25,948,636 | 25 | 82 | 9,890 |
| 14 | තිරප්පනේ | 42 | 7,033,216 | 41 | 81 | 8,031 |
| 15 | පලුගස්වැව | 19 | 5,300,563 | 16 | 38 | 5,419 |
| 16 | හොරොව්පොතාන | 19 | 54,715,034 | 37 | 112 | 11,400 |
| 17 | ගලෙන්බිඳුනුවැව | 38 | 4,615,800 | 41 | 115 | 15,951 |
| 18 | කහටගස්දිගිලිය | 31 | 3,654,000 | 40 | 127 | 11,346 |
| 19 | කැබිතිගොල්ලෑව | 38 | 6,102,946 | 26 | 103 | 8,118 |
| 20 | පදවිය | 45 | 8,100,320 | 15 | 45 | 6,520 |
| 21 | මැදවච්චිය | 44 | 28,500,000 | 37 | 112 | 16,309 |
| 22 | රඹෑව | 38 | 11,549,000 | 38 | 104 | 11,853 |
| 23 | තමන්කඩුව | 53 | 12,518,353 | 56 | 117 | 23,259 |
| 24 | හිඟුරක්ගොඩ | 54 | 23,303,038 | 53 | 140 | 19,211 |
| 25 | මැදිරිගිරිය | 87 | 20,517,007 | 45 | 111 | 20,195 |
| 26 | ලංකාපුර | 31 | 28,021,785 | 28 | 51 | 11,381 |
| 27 | වැලිකන්ද | 34 | 10,470,000 | 29 | 48 | 12,120 |
| 28 | දිඹුලාගල | 49්6 | 11,285,435 | 56 | 90 | 24,745 |
| 29 | ඇළහැර | 33 | 18,700,000 | 28 | 89 | 10,797 |
| | **මුළු එකතුව** | **1141** | **413,691,042** | **988** | **2,708** | **385,208** |

## තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන 10

- මැදවච්චිය NVQ ලියාපදිංචිය ලද තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- කැකිරාව තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- පලුගස්දමන තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- මිහින්තලේ තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- රඹෑව තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- පදවිය තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- හොරොව්පොතාන තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- නොච්චියාගම තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- නාච්චාදූව තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය
- ඉපලෝගම තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය

## දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

- ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් සංගම් 02
- ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගම් 29
- ග්‍රාම සංවර්ධන ව්‍යවසායකත්ව සංගම්
- ග්‍රාම සංවර්ධන තරුණ සංගම්
- ග්‍රාම සංවර්ධන සමිති 675
- ග්‍රාම සංවර්ධන කුඩා කණ්ඩායම්

| | |
|---|---|
| මුළු ග්‍රාම සංවර්ධන සමිති සංඛ්‍යාව | 1141 |
| අනුරාධපුර | 803 |
| පොළොන්නරුව | 338 |

## දැක්ම

“උරුමය සුරකින පිරිපුන් ගමක්, සෞභාග්‍යමත් පළාතක්.”

## මෙහෙවර

“උරුමය සුරකින පිරිපුන් ගමක් බිහි කිරීම සඳහා ප්‍රජාව සංවිධානගත කිරීම, ආයතනගත කිරීම හා දැනුම ආකල්ප හා කුසලතාවලින් සන්නද්ධ කිරීම සහ ග්‍රාම සංවර්ධනයට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සියලු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් හා විනිවිදභාවයකින් යුක්තව සංවර්ධනය කිරීම”.

## දිගුකාලීන අරමුණු

1. පුද්ගල සංවර්ධනය, කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාලව තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම.
2. සාරධර්ම සුරකින, විනයගරුක, අභිමානවත් හා දැනුමැති ප්‍රජාවක් බිහිකිරීම.
3. දැනුම, කුසලතා, ආකල්ප, පුරුදු හා සෞඛ්‍යය යන අංශවලින් යහපත් වූත්, පරිපූර්ණ වූත් දැහැමි පවුල් ඒකක ගොඩනැංවීම.
4. සමිති ගිණුම් ක්‍රියාවලිය මඟින් මූල්‍ය සාක්ෂරතාව, රක්ෂණය, අලෙවිකරණය සහ ක්ෂුද්‍ර මූල්‍යකරණය, බැංකු සංගම්කරණය පිළිබඳ ග්‍රාමීය ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම සහ එම දැනුම ක්‍රියාවට නැංවීම.
5. නායකත්වය, කළමනාකරණය, ඵලදායීතාව වෘත්තීය හා අධ්‍යාපනික සුදුසුකම් වැඩිදියුණුව මූලික කරගත් පුහුණු හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
6. නව නිෂ්පාදන හා සේවා ආරම්භ කිරීම පවත්වාගෙනයාම හා වැඩිදියුණු කිරීම සඳහා ස්වයංරැකියා බිහිකිරීම තුළින්

ග්‍රාමීය ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම.

7. න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව නවීන තාක්ෂණය හා නිර්මාණකරණයට අදාල දැනුම පවුල් ඒකක වෙත හා ග්‍රාමීය සංවිධාන වෙත ප්‍රවේශ කරවීම.

8. ළමා, කාන්තා, ආබාධිත හා තරුණ ප්‍රජාව විෂයෙහි ග්‍රාමීය සංවර්ධනයට අදාලව සුවිශේෂී ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

9. "ගමට දැනුම" සංකල්පය ඔස්සේ ග්‍රාමීය දැනුම් කේන්ද්‍රස්ථාන බිහිකිරීම තුළින් දැනුමැති ප්‍රජාවක් බිහි කිරීම.

10. මත්ද්‍රව්‍ය උවදුර වැලැක්වීම, වකුගඩු රෝග නිවාරණය, පාරම්පරික ගොවිතැන, සාම්ප්‍රදායි ක සංස්කෘතිකාංග සංරක්ෂණය හා රජරට ප්‍රෞඪ සංස්කෘතිය ආරක්ෂා කරගැනීම ආදී පළාතේ අනන්‍යතාවට හා අභිවෘද්ධියට පාදකවන සුවිශේෂී කාර්යයන් කෙරෙහි ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීම.

## කෙටිකාලීන අරමුණු

1. පුද්ගල සංවර්ධනය, කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාලව තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම.

2. සමිති ගිණුම්කරණ වැඩසටහන් ඔස්සේ විධිමත් ගිණුම්කරණ හා විගණන ක්‍රියාවලියක් ස්ථාපිත කොට සමිතිවල ප්‍රගතිය ඉහළ මට්ටමකට ගෙන ඒම දක්වා ගිණුම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.

3. සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය මඟින් කුඩා කණ්ඩායම් ක්‍රමය ශක්තිමත් කිරීම, සමිති වර්ගීකරණය හා ශ්‍රේණිගත කිරීම තුළින් ග්‍රාම සංවර්ධන සමිති හා සංගම්වල කාර්යභාරය හා ප්‍රගතිය වැඩි දියුණු කිරීම.

4. ග්‍රාම සංවර්ධන ව්‍යවසායකත්ව සංගමය ස්ථාපිතකර පළාත පුරා විසිරී සිටින සුළු හා මධ්‍යම පරිමාණ ග්‍රාමීය ව්‍යවසායකයින්ට නිෂ්පාදන හා සේවා අලෙවි කටයුතුවලට අවශ්‍ය පුහුණුව, අරමුදල්, අමුද්‍රව්‍ය, වෙළඳපොළ යන ක්ෂේත්‍රවලට අදාලව පහසුකම් සැපයීම.

5. ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රියාවලිය ශක්තිමත් කොට ග්‍රාමීය ප්‍රජාව සඳහා ග්‍රාමීය බැංකු සංගම්කරණය ඔස්සේ ණය ලබාදීම ක්‍රමවත් කිරීම හා වැඩි දියුණු කිරීම.

6. ග්‍රාමීය ප්‍රජාවගේ මූලික අවශ්‍යතා සැපිරීම හා නාගරික පරිසරයේ පවතින යටිතල පහසුකම් ග්‍රාමීය ප්‍රජාව වෙත ප්‍රවේශ කරවීම යන කාර්යය ද්විත්වය සඳහා තිරසර ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

7. ග්‍රාමීය දැනුම් කේන්ද්‍රස්ථාන ලෙස පුස්තකාල හා තාක්ෂණික, අධ්‍යාපනික පහසුකම් සහිත මධ්‍යස්ථාන ගොඩනැංවීමට ග්‍රාමීය ප්‍රජාව සංවිධානගත කිරීම.

8. ග්‍රාමීය ස්වේච්ඡා නායකත්වය වැඩිදියුණු කිරීම සඳහා තරුණ ප්‍රජාව සම්බන්ධ කිරීමට ග්‍රාමීය තරුණ සංගමය ස්ථාපිතකර තරුණ ප්‍රජාව සවිබලගැන්වීම.

9. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල ක්‍රියාත්මක පාඨමාලා ඔස්සේ ග්‍රාමීය ප්‍රජාව තුළ කාන්තාවන් ඇතුළු ඉලක්කගත කණ්ඩායම්හි වෘත්තීය නිපුණතා හා කුසලතා වැඩිදියුණු කිරීම.

10. ග්‍රාමීය පරිසරය සුරක්ෂිත මෙන්ම ප්‍රියමනාප පරිසරයක් ලෙස ගොඩනැංවීම උදෙසා හරිත ඵලදායිතා සංකල්පය ක්‍රියාවට නැංවීම.

11. ග්‍රාම සංවර්ධන විෂය ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට කටයුතු කළ විශිෂ්ට ක්‍රියාකාරිකයින් හා ස්වේච්ඡා සංවිධාන ඇගයීම.

12. පවුල් ඒකක දියුණු කිරීම තුළින් ''දැහැමි නිවහනක් ''ගොඩනැංවීම

සඳහා ගෘහස්ථ ඵලදායීතාවය පදනම් කරගත් ස්වයං ඇගයීම් හා කණ්ඩායම් ඇගයීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

13. රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන සමඟ අත්දැකීම්, දැනුම හා සම්පත් හුවමාරුව මඟින් බාහිරදාම කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම.

## ප්‍රධාන කාර්යයන්

1. පුද්ගල සංවර්ධනය, කණ්ඩායම් සංවර්ධනය හා ග්‍රාම සංවර්ධනයට අදාළව තිරසර සංවර්ධන දර්ශක ක්‍රියාවට නැංවීම.
2. කුඩා කණ්ඩායම් පිහිටු වීම, ග්‍රාම සංවර්ධන සමිති පිහිටු වීම, ලියාපදිංචි කිරීම, සමිති සක්‍රියව පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු කාර්යයන් ඉටු කිරීම.
3. සමිති ගිණුම් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමිති මූල්‍ය කටයුතු විගණනය හා විමර්ශනය කිරීමට අදාල ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
4. සමිති වර්ගීකරණය හා සමිති ඇගයීම.
5. ග්‍රාමීය ස්වේච්ඡා නායකයින් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන්, අත්දැකීම් හුවමාරු වැඩසටහන් පැවැත්වීම හා ජ්‍යෙෂ්ඨ සමිති ක්‍රියාකාරීන් ඇගයීම හා සම්මාන ප්‍රදානය කිරීම.
6. ග්‍රාමීය ව්‍යවසායකයින් බිහිකිරීම, ජාලගත කිරීම, පුහුණු කිරීම, මූල්‍ය හා භෞතික පහසුකම් සැපයීම, ඇගයීම හා පසුවිපරම් කිරීම.
7. ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය ප්‍රජාව ඉතිරිකිරීම්වලට පෙළඹවීම හා ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අරමුදල් ගොඩනැගීම මගින් බැංකු සංගම් බිහිකිරීම.
8. අඩු ආදායම්ලාභීන් වෙත මූලික අවශ්‍යතා සපුරාගැනීමට අදාලව නිවාස ඉදිකිරීම පානීය ජල අවශ්‍යතා සැපිරීම වැනි විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
9. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ආශ්‍රිත NVQ පුහුණු පාඨමාලා පැවැත්වීම පුහුණුලාභීන් වෙත ද්‍රව්‍ය හා මූල්‍යාධාර පිරිනැමීම, පුහුණුලාභීන්ගේ නිපුණතා, කුසලතා ඇගයීම හා සම්මාන ප්‍රදානය කිරීම.
10. ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය ඇතුළු පළාත් සභාවේ සමගාමී විෂයන් සහිත ආයතන මඟින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සඳහා දායකත්වය සැපයීම.
11. ග්‍රාම සංවර්ධන ක්‍රියාවලිය වෙත තරුණ ප්‍රජාව සම්බන්ධ කිරීම සඳහා විශේෂ ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
12. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා, ආකල්ප ප්‍රවර්ධනය සඳහා විශේෂ පාඨමාලා සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.
13. ග්‍රාමීය පරිසරය තුළ සුරැකි රජරටට සුවිශේෂී වූ සංස්කෘතිකාංග හා කලාකෘති ආරක්ෂිත කිරීම, පෝෂණය කිරීම හා ඇගයීම සඳහා වැඩසටහන් සංවිධානය කිරීම.
14. ග්‍රාමීය ස්වයංපෝෂිතභාවය කෙරෙහි බලපාන ජල ශක්තිය, බලශක්තිය, දැනුම් ශක්තිය, ශ්‍රම ශක්තිය හා ආරක්ෂාව (සෞඛ්‍යය) යන පංච ශක්තීන් වැඩිදියුණු කිරීමට අදාල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

## ප්‍රධාන උපාය මාර්ගයන්

1. සහභාගීත්ව ගැමි විමසුම තුළින් අවශ්‍යතාවයන් හඳුනා ගැනීමට හා තීරණ ගැනීමට ජනතාවට අවස්ථාව සලසා දීම.
2. ගමේ සම්පත් අධ්‍යයනයකර ඒවායින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කිරීම.
3. නිෂ්පාදනයේදී හා අළෙවියේදී මතුවන ගැටළු හඳුනාගෙන හා ඒවා විසඳා

ගැනීමට සංවිධාන ශක්තිය ගොඩනැඟීම.

4. ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ව්‍යවසායකයන් තුළ දැනුම කුසලතා ආකල්ප වැඩිදියුණු කිරීම.

5. සාමාජිකයන් ඉතිරිකිරීම්වලට පෙළඹවීම හා ඔවුන්ගේ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුදල් ගොඩනැඟීම.

6. කුඩා කණ්ඩායම් ගොනු කිරීම.

7. කාන්තාවන්ට ක්‍රියාකාරී ලෙස සංවර්ධන කටයුතුවලට හවුල්වීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම.

8. ග්‍රාමීය ස්වයං පෝෂිතභාවය උදෙසා ජල, බල, දැනුම්, ශ්‍රම හා ආරක්ෂක යන පංච ශක්තීන් වැඩිදියුණු කිරීම් සඳහා ව්‍යාපෘති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

9. ආගමික හා සංස්කෘතික කටයුතු වැඩිදියුණු කිරීම.

10. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම.

11. තරුණයින් සංවිධානගත කිරීම

12. සුභසාධන සේවා සංවිධානය කිරීම හා වැඩිදියුණු කිරීම.

13. ළමා සමාජ පිහිටුවීම හා ළමා සංවර්ධන වැඩසටහන් දියත් කිරීම.

පළාත් සභාව විසින් සපයනු ලබන පළාත් සභා සංවර්ධන ප්‍රදාන, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා ග්‍රාම සංවර්ධන සමිති සතු අරමුදල් උපයෝගී කරගනිමින් හා ග්‍රාම සංවර්ධන නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් ග්‍රාම සංවර්ධන සමිතිවල නිලධාරීන්ගේ සහ සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් මැහුම් උපදේශිකාවන්ගේ උපදෙස් හා මගපෙන්වීම අනුව කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානවල පුහුණුලාභින්ගේ හැකියාවන් ප්‍රවර්ධනය.

## කාර්ය මණ්ඩල සංයුතිය - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 91ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 66 කි. පුරප්පාඩු සංඛ්‍යාව 25 ක් වේ.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1.යන්ත්‍ර සූත්‍ර සවි කිරීම් හා උපකරණ | 2.5 | 2.5 | - | - |
| 2.වෙනත් මූලධන වත්කම් පුනරාවර්තන හා වැඩිදියුණු කිරීම | 6.5 | 6.3 | 0.13 | 2% |
| **එකතුව** | 9.0 | 8.8 | 0.13 | 2% |

## ජාතික ප්‍රතිපත්තිය තුළ අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මඟ

1.ගම සමඟ පිළිසඳර ග්‍රාම සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නැංවීම

2.සෞභාග්‍යයේ දර්ශකයන් ක්‍රියාවට නැංවීම.

RPI (Rural Prosperity Index) = A+B+C

A = දළ දේශීය නිෂ්පාදනය /ඒක පුද්ගල ආදායම වර්ධනය කිරීම

B = දුප්පත්කමේ දර්ශකයට /දරිද්‍රතා රේඛාවට පහලින් ජීවත් වන ජනතාවගේ ජීවිතවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම.

C = ලංකාවට අද්විතීය වන සෑම තරාතිරමකටම අයත් ජන ජීවිතයේ දක්නට ලැබෙන අපගේ ශිෂ්ටාචාර උරුමය තුළින් බිහි වී තිබෙන ඇගයීම් ක්‍රමයක් භාවිත කිරීම.

3.මානව සම්පත් සංවර්ධන සැලස්මක් ක්‍රියාවට නැංවීම.

| සෞභාග්‍යයේ දැක්ම සාක්ෂාත් කරන දර්ශක (RPI= A+B+C ) | ක්‍රියාත්මක ව්‍යාපෘති |
|---|---|
| 1.දළ දේශීය නිෂ්පාදනයේ/ ඒක පුද්ගල ආදායමේ වර්ධනයක් ඇති කිරීම (A) | 1.ව්‍යවසායකත්ව සංගම් පිහිටුවීමේ වැඩසටහන<br>2.තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන (NVQමධ්‍යස්ථාන ) ආරම්භ කිරීම.<br>3.ශ්‍රම කිරුළු පුස්තකාල ස්ථාපිත කිරීමේ වැඩසටහන<br>4.ශ්‍රමාභිමානී නිවාස වැඩසටහන<br>5.ප්‍රාදේශීය සංගම් බලගැන්වීමේ වැඩසටහන<br>6.ස්වේච්ඡා නායකයින් ලෙස තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන<br>7.සූර්ය මන්දිරය - කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානය සඳහා භාණ්ඩ මිල දී ගැනීම |
| 2.දුප්පත්කමේ දර්ශකයට/ දරිද්‍රතා රේඛාවට පහලින් ජීවත්වන ජනතාවගේ ජීවිතවල ගුණාත්මක භාවය වර්ධනය කිරීම (B ) | 1.දැහැමි නිවහන වැඩසටහන<br>2.හැකියාවට පියාපත් මැහුම් පාඨමාලා නිර්මාණ ප්‍රදර්ශනය<br>3.ග්‍රාම සංවර්ධන සමිති වර්ගීකරණ වැඩසටහන<br>4.සමිති කුඩා කණ්ඩායම් වැඩසටහන<br>5.සපිරි සමිති බිහිකිරීමේ වැඩසටහන<br>6.ප්‍රජා ගිණුම්කරණ පුහුණු වැඩසටහන<br>7.සමිති ණය සුරකුම් අරමුදල් ක්‍රියාවට නැංවීමේ වැඩසටහන<br>8.ගම්දොර අභියස ගැමි සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන<br>9.මතින් තොර ගමක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන |
| 3.ලංකාවට අද්විතීය වන සෑම තරාතිරමකටම අයත් ජනජීවිතයේ දක්නට ලැබෙන අපගේ ශිෂ්ටාචාර උරුමය තුළින් බිහිවී තිබෙන ඇගයීම් ක්‍රමයක් භාවිතා කිරීම. (C) | 1.ග්‍රාම සංවර්ධන ඩිප්ලෝමා වැඩසටහන<br>2.කබඩ් මිලදී ගැනීම<br>3.ග්‍රාම සංවර්ධන පර්යේෂණ වැඩසටහන<br>4.පෙළොන්නරුව උපකාර්යාලය අලුත් වැඩියා කිරිම හා සංවර්ධනය කිරිම<br>5.ක්ෂේත්‍ර සහ ආයතන නිලධාරින් පුහුණු කිරීම (මානව සම්පත් සංවර්ධන සැලස්ම ක්‍රියාවට නැංවීම) |

## ශදුඅත විශ්ලේෂණය තුළින් අංශය පවත්නා තත්වය පිළිබඳ විග්‍රහය

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත පරිණත පළපුරුදු කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම.<br>• අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22ක් සහ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07ක් තුළ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයට අයත් සමිති විශාල සංඛ්‍යාවක් පිහිටුවීම සහ රුපියල් මිලියන 413ක මුල්‍ය වත්කම් ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයට අයත් වේ. | • නිවැරදි දත්ත යාවත්කාලීන කිරිම සඳහා කාර්ය මණ්ඩලයේ හිඟතාවය.<br>• ග්‍රාමීය ජනතාවගේ ජන ජීවිතයේ පවතින කාර්ය බහුලතාවය නිසාවෙන් ඒකරාශී කිරිමේ අපහසුතාවය. |
| **අවස්ථාවන්** | **තර්ජන** |
| • උතුරු මැද පළාත තුළ බහුතරයක් ජනතාව කෘෂිකාර්මික කටයුතුවල නියැලී සිටිනු දක්නට ලැබෙන්නකි. මේ නිසාවෙන් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා දායකත්වය ලබා දීමේ ප්‍රමාණය වැඩි කිරීම කළ යුත්තකි.<br>• උතුරු මැද පළාත තුළ ක්‍රියාත්මක වන තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල මැහුම් පාඨමාලා අවසන් කරන ලද සිසුන් සඳහා ස්වයං රැකියා උත්පාදනය කිරීම.<br>• ග්‍රාම සංවර්ධන සමිති හරහා ස්වයං රැකියා උත්පාදනය සඳහා අවස්ථා ලබා දීම. (අඩු පොලියට චක්‍රීය ණය ලබා දීම) | • ව්‍යාපෘති සඳහා වාර්ෂිකව වෙන් කෙරෙන ප්‍රතිපාදන සීමා සහිත බැවින් වැඩි ලෙසක්ම මහජන සුභසාධන කටයුතු ඉටු කිරීමේ හැකියාව අවම මට්ටමක පවති.<br>• අතැම් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරිමේදි බිමේ ග්‍රාමිය ජනතාවගේ ඊට ඇති සෘණාත්මක ආකාල්ප |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාල සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | පාදම (Baseline) 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 01 | ග්‍රාමීය ප්‍රවේශය සහ අනෙකුත් මූලික අවශ්‍යතා සවිබල ගැන්වීම | 1.ඉදිකරන ලද බෝක්කු සංඛ්‍යාව (බෝක්කු වැඩිදියුණු කිරීම) | - | 29 |
| | | 2.ග්‍රාම සංවර්ධන සමිතිවල දායකත්වයෙන් පිහිටුවන ලද නිවාස ඒකක සංඛ්‍යාව | 40 | 87 |
| | | 3.සමාජ ආර්ථික පහසුකම් සහිත ගම්මාන සංඛ්‍යාව | 10500 | 7500 |
| 02 | පුද්ගලයන්ගේ / පවුල්වල සහ සංවිධානවල ධාරිතා සංවර්ධනය | හොඳින් ක්‍රියාත්මක වන කාන්තා වැඩිදියුණු කිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව / නිපුණතා පුහුණුව ඇති කාන්තාවන් සංඛ්‍යාව | 725 | 800 |
| | | ස්ථාපිත පුස්තකාල සංඛ්‍යාව | - | 500 |
| | | නිවාස නඩත්තු සහ කළමනාකරණය පිළිබඳව හොඳින් දැන සිටි පවුල් සංඛ්‍යාව | 440 | 1000 |
| | | ග්‍රාම සංවර්ධන සමිතිවල ක්‍රියාකාරී සාමාජිකයින් සංඛ්‍යාව | 1141 | 800 |
| | | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහිත පවුල් සංඛ්‍යාව | 95 | 150 |
| | | ග්‍රාම සංවර්ධන සමිතියේ සහයෝගීතාවයෙන් ග්‍රාම සංවර්ධන සමිතිය විසින් ආදායම් උත්පාදන කටයුතු සඳහා නිකුත් කර ඇති ණය සංඛ්‍යාව. | 2500 | 3000 |
| | | (නිලධාරීන්ගේ වැඩිදියුණු කිරීමේ කුසලතා සහ කළමනාකරණය) හොඳින් පුහුණු කරන නිලධාරී සංඛ්‍යාව | 29 | 29 |
| | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ තිරසර හා ප්‍රජා පුහුණු සංවර්ධන මධ්‍යස්ථානය සඳහා සපයන ලද ජුකි මැෂින් සංඛ්‍යාව | 29 | 29 |

## එකිනෙක සංරචක සඳහා අප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ළඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්යසාධන දර්ශකය (නිමවුම) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 01 | ව්‍යවසායක සංගම් පිහිටුවීමේ වැඩසටහන | කොට්ඨාශකයක් තුළ පිහිටුවන ලද ව්‍යවසායක සංගම් සංඛ්‍යාව | 29 | 29 |
| 02 | දැහැමි නිවහන වැඩසටහන | ගෘහස්ත ඵලදායිතාවයෙන් යුත් දැහැමි පවුල් කොපමණ සංඛ්‍යාවක් බිහිකරන්නේද යන්න (පවුල්) | 2320 | 2320 |
| 03 | තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන (NVQ)මධ්‍යස්ථාන ආරම්භ කිරීම | ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යනු ලබන ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව | 03 | 03 |
| 04 | හැකියාවට පියාපත් මැහුම් පාඨමාලා නිර්මාණ ප්‍රදර්ශන වැඩසටහන | පවත්වන ලද නිර්මාණ ප්‍රදර්ශන සංඛ්‍යාව | 01 | 01 |
| 05 | ග්‍රාම සංවර්ධන ඩිප්ලෝමා වැඩසටහන | ග්‍රාමීය සංවර්ධන සඳහා ඉවහල් වන දැනුම හා තාක්ෂණය ප්‍රායෝගිකව ගමට රැගෙන යා හැකි නිලධාරීන් සංඛ්‍යාව | 33 | 26 |
| 06 | සමිති වර්ගීකරණ වැඩසටහන | සමිති වර්ගීකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් ප්‍රශස්ත මට්ටමේ සමිති තේරීම් කොට ඇගයීමක් සිදු කරන ලද සංවර්ධන සමිති සංඛ්‍යාව | 675 | 675 |
| 07 | ග්‍රාම කිරුළ පුස්තකාල ස්ථාපිත කිරීමේ වැඩසටහන | ග්‍රාමීය ප්‍රජාවගේ කියවීමේ පුරුද්ද වැඩි කිරීම සඳහා බිහිකිරීමට අපේක්ෂිත පුස්තකාල සංඛ්‍යාව | 68 | 50 (ක්‍රියාකාරී මට්ටමේ පුස්තකාල) |
| 08 | සමිති කුඩා කණ්ඩායම් වැඩසටහන | ග්‍රාමීය සමාජවල වැඩි කරන ලද කුඩා කණ්ඩායම් සංඛ්‍යාව | 29 | 29 |
| 09 | සපිරි සමිති බිහිකිරීමේ වැඩසටහන | ග්‍රාමීය සංවර්ධන සමිතිවල ආර්ථික වර්ධන වේගය 1%කින් වැඩි වූ සපිරි සමිති සංඛ්‍යාව | 29 | 29 |
| 10 | ශ්‍රමාභිමානී නිවාස වැඩසටහන | අඩු ආදායම්ලාභී පැල්පත් නිවාස ස්ථිර නිවාස බවට වැඩිදියුණු කළ සංඛ්‍යාව | 29 | 29 |
| 11 | කබඩ් මිල දී ගැනීම (තොරතුරු කලමනාකරණ පද්ධතියක් නිර්මාණ කිරීම) | මිලදී ගත් කබඩ් සංඛ්‍යාව | 58 | 60 |
| 12 | ප්‍රජා ගිණුම්කරණ පුහුණු වැඩසටහන | නිවැරදි ගිණුම් ක්‍රමයක් ඇතිකිරීම තුළින් කීර්තිමත් සන්නාමයක් සහිත ග්‍රාම සංවර්ධන බැංකු පිහිටුවීම / ඒ සඳහා ගිණුම් පුහුණු කටයුතු ඉටු කිරීම | 02 | - |
| 13 | සමිති ණය සුරැකුම් අරමුදල ක්‍රියාවට නැංවීමේ වැඩසටහන | ක්ෂුද්‍ර මූල්‍ය වර්ධනය වැඩි කරන ලද සාමාජිකයින් සංඛ්‍යාව | 1000 | 1000 |
| 14 | ග්‍රාම සංවර්ධන පර්යේෂණ වැඩසටහන | ග්‍රාමීයව සංවර්ධන අංශය දියුණු කිරීමට හඳුනා ගන්නා ලද නව වැඩසටහන් සංඛ්‍යාව. | 01 | 01 |
| 15 | පොළොන්නරුව උප කාර්යාලය අළුත්වැඩියා කිරීම හා සංවර්ධනය කිරීම. | අළුත්වැඩියා කරන ලද හා සංවර්ධනය කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව. | 01 | 01 |
| 16 | "ගම්දොර අභියස" සංස්කෘතික වැඩසටහන | සමාජ හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා පවත්වන ලද වැඩසටහන් ගණන | 05 | 05 |
| 17 | "මතින් තොර ගමක්" මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | ග්‍රාමීය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගේ ප්‍රතිශතය 1% කින් අඩු කිරීමට පවත්වන ලද වැඩසටහන් ගණන | 05 | 10 |
| 18 | නිලධාරි පුහුණුව (මානව සම්පත් සංවර්ධන කාල සැලැස්ම) ක්‍රියාවට නැංවීම | පවත්වන ලද පුහුණු වැඩසටහන් තුළින් කාර්යක්ෂමව රාජකාරි කිරීමට හැකියාව ලත් නිලධාරීන් සංඛ්‍යාව | 67 | 67 |
| 19 | ප්‍රාදේශීය සංගම් බල ගැන්වීමේ වැඩසටහන | බිහිකරන ලද ප්‍රාදේශීය සංගම් නායකයින් සංඛ්‍යාව | 29 | 29 |
| 20 | ස්වේච්ඡා නායකයන් ලෙස තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන | පිහිටුවන ලද ග්‍රාමීය තරුණ ව්‍යවසායකයන්ගේ සමිති සංඛ්‍යාව[එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එකක්] | 29 | 29 |
| 21 | සූර්ය මන්දිරය - කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානය සඳහා භාණ්ඩ මිලදී ගැනීම (ව්‍යවසායකත්ව වෙළෙඳපල සංවර්ධන වැඩසටහන) | කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 |

## ප්‍රධාන කාර්යසාධන දර්ශකය පහා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | ළඟා විම | | | |
| 01 | කොට්ඨාශයක් තුළ පිහිටුවන ලද ව්‍යවසායක සංගම් සංඛ්‍යාව | 29 | 29 | ව්‍යවසායකයින් නඟා සිටුවීම වෙනුවෙන් ව්‍යවසායක සංගම් සඳහා චක්‍රීය ණය ලබා දීමේ වැඩසටහන | 2.99 | 1450 |
| 02 | ගෘහස්ත ඵලදායිතාවයෙන් යුත් දැහැමි පවුල් කොපමණ සංඛ්‍යාවක් බිහිකරන්නේද යන්න | 2320 පවුල් | 2320 | *පිරිපුන් කැදැල්ල ආදර්ශ පත්‍රිකාවට අනුව නිවාස සකස් කිරීම.<br><br>*ක්ෂුද්‍ර කෘෂිකර්මය හෙවත් කාබනික ගෙවතු වගාව දිරිගැන්වීම. | 2.4 | 2320 |
| 03 | ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යනු ලබන ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව | 03 | 03 | NVQ පාඨමාලාව ප්‍රසස්ත මට්ටමින් පැවැත්වීම සඳහා ග්‍රාමීය පුහුනු මධ්‍යස්ථාන බිහිකිරීම. | 4.4 | 80 |
| 04 | පවත්වන ලද නිර්මාණ ප්‍රදර්ශන සංඛ්‍යාව | 01 | 01 | කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානවල පවත්වන ලද මැහුම් පුහුණු පාඨමාලාවට අදාලව ඉගෙනුම් කටයුතුවලින් සිදුකරන ලද නිර්මාණ ප්‍රදර්ශනය | 1.72 | 1000 |
| 05 | ග්‍රාමීය සංවර්ධන සඳහා ඉවහල් වන දැනුම හා තාක්ෂණය ප්‍රායෝගිකව ගමට රැගෙන යා හැකි නිලධාරීන් සංඛ්‍යාව | 33 | 26 | පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීම. | 2.41 | 26 |
| 06 | සමිති වර්ගීකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් ප්‍රශස්ත මට්ටමේ සමිති තේරීම් කොට ඇගයීමක් සිදු කරන ලද සංවර්ධන සමිති සංඛ්‍යාව | 675 | 675 | ග්‍රාම සංවර්ධන සමිති වර්ගීකරණය කිරීම සහ සමිති ශ්‍රේණිගත කිරීම වෙනුවෙන් වැඩසටහන් පැවැත්වීම | 2.98 | 6960 |
| 07 | ග්‍රාමීය ප්‍රජාවගේ කියවීමේ පුරුද්ද වැඩි කිරීම සඳහා බිහිකිරීමට අපේක්ෂිත පුස්තකාල සංඛ්‍යාව | 68 | 50 | ගෙයින් ගෙට පුස්තකාල හා ගමින් ගමට දැනුම් කේන්ද්‍රස්ථාන සංකල්පය ඔස්සේ ඉ-විද්‍යුත් පුස්තකාල ක්‍රමයක් ප්‍රචලිත කිරීම. | 1.0 | 200 |
| 08 | ග්‍රාමීය සමාජවල වැඩි කරන ලද කුඩා කණ්ඩායම් සංඛ්‍යාව | - | - | කුඩා කණ්ඩායම් මාර්ගෝපදේශය අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 2.49 | 2320 |
| 09 | ග්‍රාමීය සංවර්ධන සමිතිවල ආර්ථික වර්ධන වේගය 1%කින් වැඩි වූ සපිරි සමිති සංඛ්‍යාව | 29 | 29 | දැනුවත් කාණ්ඩයට අයත් සමිති සපිරි කාණ්ඩයේ සමිති බවට පරිවර්තනය කිරීම සඳහා චක්‍රීය ණය ලබා දීමේ වැඩසටහන. | 2.49 | 2320 |
| 10 | අඩු ආදායම්ලාභී පැල්පත් නිවාස ස්ථිර නිවාස බවට වැඩිදියුණු කළ සංඛ්‍යාව | 29 | 29 | අඩු ආදායම්ලාභීන් හට නිවස ඉදි කිරීම සඳහා මුදල් ලබා දිම. | 2.5 | 29 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | මිලදී ගත් කබඩ් සංඛ්‍යාව | 58 | 60 | තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා කබඩ් මිලදී ගැනීම. | 2.58 | 60 |
| 12 | නිවැරදි ගිණුම් ක්‍රමයක් ඇතිකිරීම තුළින් කීර්තිමත් සන්නාමයක් සහිත ග්‍රාම සංවර්ධන බැංකු සංගම් සංඛ්‍යාව | 29 | 29 | R - 18 ගිණුම් ක්‍රමය ක්‍රියාත්මක සමිති සඳහා මුදල් ලබා දීම | 2.49 | 580 |
| 13 | ක්ෂුද්‍ර මූල්‍ය වර්ධනය වැඩි කරන ලද සාමාජිකයින් සංඛ්‍යාව | 1000 | 1000 | ණය සුරැකුම් ක්‍රියාවලිය ක්‍රියාත්මක සමිති සඳහා මුදල් ලබා දීම | 2.49 | 2320 |
| 14 | ග්‍රාමීය සංවර්ධන අංශය දියුණු කිරීමට හඳුනා ගන්නා ලද නව වැඩසටහන් සංඛ්‍යාව. | 01 | 01 | ග්‍රාම සංවර්ධන පර්යේෂණ සඳහා ස්ථාවර ක්‍රමවේදයක් සකස් කිරීම වෙනුවෙන් විවිධ ස්ථර සඳහා වැඩමුළු සකස් කිරීම | 0.9 | 250 |
| 15 | අළුත්වැඩියා කරන ලද හා සංවර්ධනය කරන ලද ගොඩනැගිලි සංඛ්‍යාව. | 01 | 01 | මූලික පහසුකම් සහිතව උප කාර්යාලය අළුත්වැඩියා කිරීම. | 1.9 | 800 |
| 16 | සමාජ හා ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම සඳහා පවත්වන ලද වැඩසටහන් ගණන | 05 | 05 | **ගමට පොදු දේපල හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම<br>** සමිති ආශ්‍රිත භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම<br>** ක්ෂුද්‍ර මූල්‍ය ගැටළු ඇති සමිති සඳහා මූල්‍ය ශක්තිය වැඩි දියුණු කිරීම. | 7.49 | 5000 |
| 17 | ග්‍රාමීය මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගේ ප්‍රතිශතය 1% කින් අඩු කිරීමට පවත්වන ලද වැඩසටහන් ගණන | 05 | 10 | විෂ මත්ද්‍රව්‍ය භාවිතයෙන් සියලු වයස් කාණ්ඩවල ප්‍රජාව මුදවා ගැනීම සඳහා වැඩමුළු පැවැත්වීම. | 0.5 | 500 |
| 18 | පවත්වන ලද පුහුණු වැඩසටහන් තුළින් කාර්යක්ෂමව රාජකාරී කිරීමට හැකියාව ලත් නිලධාරීන් සංඛ්‍යාව | 67 | 67 | මානව සම්පත් සැලැස්මට අනුව නිපුණතා පරතරය අඩු කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 0.4 | 67 |
| 19 | බිහිකරන ලද ප්‍රාදේශීය සංගම් නායකයින් සංඛ්‍යාව | 29 | 29 | ප්‍රාදේශීය සංගම් බලගැන්වීමේ වැඩසටහන් පැවැත්වීම | 2.5 | 675 |
| 20 | පිහිටුවන ලද ග්‍රාමීය තරුණ ව්‍යවසායකයන්ගේ සමිති සංඛ්‍යාව[එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට එකක්] | 29 | 29 | තරුණ ප්‍රජා නායකයින් බිහිකිරීම උදෙසා පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | 2.49 | 2320 |
| 21 | කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානයේ පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | නාගරික හා ග්‍රාමීය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා වන ඩිජිටල් වෙළඳපොළ සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 0.9 | 5000 |

## 01.ගමට මිලියනයක් ග්‍රාම සංවර්ධන වැඩසටහන

ණය සුරැකුම් අරමුදල් ක්‍රමය හදුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම.




තිරසර සංවර්ධන අරමුණුවල සදහන් පළමු වන අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා උතුරුමැද පළාතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 24 ඇති සියලුම ග්‍රාම සංවර්ධන සමිති ආවරණය වන පරිදි ප්‍රාදේශිය සංගම් මුලික කර ගනිමින් ග්‍රාම සංවර්ධන සමිතිවල ණය ලාභීන් සුරක්ෂිත කරමින් ණය අයවීමේ ප්‍රතිශතය 100%ක්ම ඉහල නැංවීමත් එමඟින් සමිතියට සිදුවන මුල්‍යමය හානිය අවම කර ගනිමින් ණයලාභීන්ගේ සුභසාධනය අරමුණු කරගනිමින් ණය වැඩසටහනක් පළාත තුළ ස්ථාපිත කිරිම මෙතුළින් අරමුණු කෙරේ.

විශේෂයෙන්ම මෙහිදී උතුරුමැද පළාතේ පවතින ක්‍රියාකාරි ග්‍රාම සංවර්ධන සමිතිවලින් 80%ක පමණ මෙකී වක්‍රිය ණය වැඩසටහන ක්‍රියාවට නංවනු ලබයි.

එමෙන්ම ග්‍රාම සංවර්ධන සමිතිවල ආර්ථික ශක්තිය වර්ධනය කිරීම, ණය ලබා ගැනීමේදි වයස් ප්‍රමාණය පිළිබඳ ගැටළු විසඳා ගැනීමටත් සාමාජික සුභ සාධනය ඇති කිරීම සදහාත් සුවිශේෂී වැදගත්කමක් මෙම ණය සුරැකුම් අරමුදල ස්ථාපිත කිරීම තුළින් ළඟා කර ගත හැකිය.

- ග්‍රාම සංවර්ධන සමිති ණය සුරැකුම් අරමුදල මාර්ගෝපදේශය 2021 ලෙස ග්‍රන්ථයක් සකස් කොට ඒ තුළින් අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.
- මෙය තෝරා ගන්නා ලද ප්‍රශස්ත මට්ටමින් පවතින සමිති 29ක් තුළ ක්‍රියාත්මක කෙරේ.

මෙහිදී සෑම සාමාජිකයෙකුම අනුගමනය කළ යුතු තිරසර සංවර්ධන පුරුදු 05 වන ඉතුරුම් කිරීම, අඛණ්ඩව සහභාගි වීම, ශ්‍රමය දානය කිරීම, ප්‍රතිඥා දීම හා දැනුම ලබාගැනීම පිළිවෙලින් තිරසර සංවර්ධනයේ ප්‍රධාන සංරචක 5 වන Prosperity, Partnership, Planet, Peace, People අංශයන් නියෝජනය කෙරේ.

## 02.ගිණුම්කරණ ක්‍රමය R 18 ක්‍රමය ක්‍රියාත්මක කිරීම

මෙම වැඩසටහන අදියර කිහිපයකින් ක්‍රියාත්මක වේ.




i. එකම ක්‍රමයකට ගිණුම් තබමු වැඩසටහන
ii. සෑම සමිතියකටම කඹඩ් එකක් වැඩසටහන
iii. සෑම සාමාජිකයකුටම ලිපිගොනුවක් වැඩසටහන.
iv. විමර්ශනය තුළින් ශක්තිමත් සමිතියක් වැඩසටහන
v. විගණනය අනිවාර්යයි - ප්‍රගතිය පැහැදිලියි වැඩසටහන
vi. සෑම සමිතියකටම පරිගණකයක් වැඩසටහන
vii. තිරසර ග්‍රාම සංවර්ධන ඉතුරුම් හා ආයෝජන සංවිධාන (බැංකු සංගම්) බවට ග්‍රාම සංවර්ධන සමිති පත්කිරිමේ වැඩසටහන
viii. ජාත්‍යන්තර ප්‍රවේශයක් හෙවත් කීර්තිමත් සන්නාමයක් සහිත සමිති බවට ග්‍රාම සංවර්ධන බැංකු සංගම් පත්කීරිම

❖ ඉහත වැඩසටහන් අදියරෙන් අදියර ක්‍රියාත්මක කිරීම තුළින් ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය ජාත්‍යන්තර සන්නාමයක් බවට පත්කිරීම අපේක්ෂා කෙරේ.

❖ පහත ක්‍රමවේද යටතේ සුදුසුකම් සපුරා ඇති සමිතියක් මගින් දැනුම් හුවමාරු ක්‍රියාවලියක් ඔස්සේ අදාල ගිණුම් ක්‍රමය පිළිබඳ දැනුම ලබා දීම සිදු කරන ලදි.

| | |
|---|---|
| i.ආදර්ශනය කිරීම | Example |
| ii.අවබෝධ කර දීම | Explanation |
| iii.ධෛර්යමත් කිරීම | Encourage |
| iv.ආචාර ධර්ම හා පරිසරය සකස් කිරීම | Ethics and Environment |
| v.අත්දැකීම් ලබා ගැනීම | Experience |
| vi.අභිමතාර්ථ සාධනය | Expectation of Excellence |

❖ යථෝක්ත කරුණු ඔස්සේ R 18 ගිණුම් ක්‍රමය තෝරාගත් ප්‍රශස්ත සමිති 29 තුළම ක්‍රියාත්මක කිරීම සිදුකර ඇත.

## 03.දැහැමි නිවහන වැඩසටහන

**"සරු ගෙවත්ත" ගෙවතු වගා වැඩසටහන**

මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 29හිම තෝරාගන්නා ලද ගම්මාන හා සමිති මඟින් ගෙවතු වගාවට උපයෝගි වන තොරතුරු සකස් කිරීම සිදු කෙරේ. මෙම ව්‍යාපෘතිය පවුල් ඒකකය තුළ ජීවත් වන සියලුම පුද්ගයින්ගේ එකමුතුවෙන් ස්ථාපිත වීමක් අපේක්ෂා කරන ලද අතර විශේෂයෙන්ම පවුල්වල වෙසෙන ආබාධිත පුද්ගලයින්, වයස්ගත කාණ්ඩ, ළමයින් සහ තරුණ ප්‍රජාව මේ සඳහා දායක කර ගත හැකි අතර ඒ තුළින් නිවසෙහි යහපත් සුරක්ෂිත සංස්කෘතියක් නිර්මාණය වීමට ඇති ඉඩ ප්‍රස්ථාව උපරිම මට්ටමක පවති.

ගෙවතු වගා වැඩසටහනේදි අධීක්ෂණ කටයුතු සිදු කිරීමේදි ප්‍රධාන වශයෙන්ම පහත සඳහන් කළමණාකරණ කරුණු 05 සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වේ. ගෙවතු ඇගයීම් කටයුතු වලදී මෙම ඉතුරුම් සංකල්ප මහඟු ආදර්ශයක් වනු ඇත.

01. බෝග කළමණාකරනය
02. ඉඩම් කළමණාකරණය
03. ජල කළමණාකරණය
04. කසළ කළණාකරණය
05. ශ්‍රම කළමණාකරණය





| | |
|---|---|
| ජල කළමනාකරණය | •ජල ප්‍රභවයක් සාදාගෙන තිබීම<br>•එම ජල ප්‍රභවය විධිමත්ව පාවිච්චි කර තිබීම<br>•ජල බිංදු තාක්ෂණය භාවිත කිරීම<br>•පාවිච්චියෙන් ඉවතලන ජලය වගාවට යොමු කර තිබීම<br>•අවම ජල භාවිතයකින් වගාව පෝෂණය කිරීම. |
| බෝග කළමනාකරණය | •ගෙවත්තකින් අප බලාපොරොත්තු වන්නේ අපගේ ප්‍රධාන අවශ්‍යතාවය වන ආහාර වේල සපුරා ගැනීමයි.එහිදී පහත කරුණු අනුගමනය කළ යුතුය.<br>•එහිදී එය සමබල පෝෂණීය වස විසෙන් තොරව ලබා ගැනීම අපගේ අපේක්ෂාවයි.<br>•සමබල ආහාර වේලාවකට ඇතුලත් වන අංග සියල්ලම ගෙවත්ත තුළින් සපුරා ගත හැකි විය යුතුය.<br>•එනම් කාබොහයිඩ්‍රේට් , ප්‍රෝටීන් , මේද, ඛනිජ ලවන හා විටමිනයි.<br>•ඒවා අඩංගු ආහාර බෝග වන ධාන්‍ය අල වර්ග , එළවළු වර්ග , පලා වර්ග පලතුරු සහ ඖෂධ යන සියල්ල ගෙවත්ත තුළ වගා කර තිබිය යුතුය. |
| කසල කළමනාකරණය | •කසල වර්ග කර බැහැර කිරීම හා දිරාපත්වන දෑ කොම්පෝස්ට් සඳහාත් ප්ලාස්ටික් වැනි දෑ වගා බඳුන් ලෙසත් යොදා ගැනීම<br>•කසල මඟින් ජීව වායු නිපදවීම<br>•කොම්පෝස්ට් වළවල් කිහිපයක් පවත්වාගෙන යාම (තිරසර භාවය ඇතිවන පරිදි)<br>•කොම්පෝස්ට් හේතුවෙන් වගාව සාර්ථක වී තිබීම |
| ශ්‍රම කළමනාකරණය | •පවුලේ සියලු දෙනා වගාවේ නිරත වීම විනෝදාංශයක් ලෙස,වෘත්තීමය ලෙස ක්‍රියාකිරීම.<br>•රූපවාහිනිය නැරඹීම වැනි දෑ වලින් ඉවත්ව එම කාලය වගාව සඳහා යෙදවීමට දරුවන් පුරුදු කර තිබීම.<br>•වගාව පිළිබඳ දරුවන් දැනුවත් කර තිබීම.<br>•මේ තුළින් පවුලේ සමගිය සහ එකමුතුභාවය වර්ධනය වීමක් පෙන්නුම් කර තිබේ.<br>•ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ද මෙකී තත්වය උපයෝගී වේ. |
| ඉඩම් කළමණාකරණය | •විශේෂයෙන් ගම ගෙවත්ත සතුව ඇති භූමිය , එහි ස්වභාවය, වපසරිය පිළිබඳ ව මනා අවබෝධයකින් භූමිය උපරිමයෙන් ප්‍රයෝජනයට ගත යුතුය.<br>•ගෙවත්තට ඇති ඉඩ ප්‍රමාණය ඉතා අඩු නම් උපරිම ප්‍රයෝජනයට ගත හැකි වන සේ ලී තට්ටු හෝ වෙනත් තට්ටු ක්‍රමයකට සකස් කර ගැනීම.<br>•බඳුන් භාවිත කර ගැනීමෙන් බෑග් මළු , ගස්වල එල්ලා තැබිය හැකි බඳුන්, වගාව සඳහා යොදා ගත හැක.<br>•භූමියේ ස්වභාවය අනුව බෑවුම් සහිත නම් පස උපරිම සංරක්ෂණය කර ගැනීමට ගල්වැටි දැමීම, පොල් ලෙලි ඇල්ලීම, ඉවතලන ගඩොල් කැබිලි උළු කැට ඇල්ලීම වැනි ක්‍රියාමාර්ග සිදු කර ගැනීම වැදගත් කරුණක් වේ. |

## 04.ගම්දොර අභියස වැඩසටහන

තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනිම වස් රජරට ගැමි ජනතාවට අනන්‍ය වු සංස්කෘතික ලක්ෂණ ආරක්ෂා කිරිම හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය පාදක කොට ගනිමින් ගම්දොර අභියස ව්‍යාපාරය ආරම්භ කරන ලදි. "රටක සැබෑ සංවර්ධනය ඇති වන්නේ ආර්ථික සෞභාග්‍ය සමඟ ආර්ථික සංවර්ධනයක් ඇති රටකය.රටක් සමාජයක් උසස් මට්ටමකට පත් වන්නේ එම රටේ පවතින සංස්කෘතිය නිසාය". මෙකී සංකල්පය පාදක කර ගනිමින් උතුරුමැද පළාත තුළ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය හා බද්ධ වූ ජනතාවගේ අනාගත අභිවෘද්ධිය උදෙසා ගම්දොර නැමැති මෙකී සංකල්පය ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත කාරණයක් විය.

මෙහි ප්‍රධාන අපේක්ෂාව ග්‍රාමීය ඉපැරණි කලා නිර්මාණ පුනර්ජීවනය කිරීම හා ඇගයීම් මෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ සමගිය හා සහජීවනය වැඩිදියුණු කිරීම වන අතර සාමුහික ශ්‍රමය ඔස්සේ ගමට පොදු දේපල හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සමිති ආශ්‍රිත භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම හා ක්ෂුද්‍ර මුලය ගැටළු සඳහා සමිතිවල මුල්‍ය ශක්තිය වැඩිදියුණු කිරිම දුෂ්කර ග්‍රාමයන්වල යටිතල පහසුකම් වර්ධනය කිරීම, ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය තුළ සිටින ජනතාවගේ ආකල්ප සංවර්ධනය කිරීම,

සමාජයෙන් ගිලිහී යන ගැමි සමාජීය විවිධ සංස්කෘතීන් අංග පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සහ ඔවුන්ගේ දක්ෂතා එළිදැක්වීමේ වේදිකාවක් නිර්මාණයකර දිම සෙසු අරමුණු බවට පත්වී ඇත.

එසේම ශ්‍රමදාන, ලේ දන් දීම, පිංකම්, කොවිඩ් 19 වසංගතයෙන් පීඩා විඳි ජනතාව වෙනුවෙන් බඩු මළු ප්‍රදානය, ප්‍රජා සංවිධාන සවිබල ගැන්වීම හා ක්ෂුද්‍ර මුල්‍ය ණය ප්‍රදානය යන ක්‍රියාකාරකම්ද මෙම වැඩසටහනට අන්තර්ගත කරන ලදි.

**බුෆේ සෙට්, පුටු ලබා දීම**



**සමිතිශාලාව ගොඩනැංවීම (රාජාංගනය ප්‍රාදේශීය කොට්ඨාශය)**



**හොරොව්පොතාන රෙදිපිළි අලෙවිසැල ගොඩනැංවීම.**



## 05.කුඩා කණ්ඩායම් නායකත්ව පුහුණු වැඩසටහන

උතුරු මැද පළාතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 24 තුළම ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයන්ගේ ආර්ථිකය ඉහළ නැංවීම, හුදකලාව සිටින සමිති සාමාජිකයන් ඒකරාශි කර ඔවුන්ගේ හැකියාවන් දැනුම සම්පත් හා ඔවුන් තුළ ඇති විභව ශක්තින් අවදිකර සමාන ජීවනෝපායන් සහිත කණ්ඩායම් ඒකරාශි කර දැනුමෙන් සවිබල ගැන්වීම කුඩා කණ්ඩායම් වැඩසටහනෙහි මූලික පරමාර්ථය වේ. විශේෂයෙන්ම මෙහිදී ඔවුන්ගේ නිෂ්පාදන දේශීය මෙන්ම විදේශීය වෙළඳපල දක්වා රැගෙන යාම අපේක්ෂා කරන අතරම අවම වශයෙන් කුඩා කණ්ඩායම් 150ක් වසර අවසානයේදි බිහි කිරීම මෙන්ම ග්‍රාමීය ස්වයං රැකියාකරුවන් ව්‍යවසායකයින් බිහිකිරීම හා සවිබල ගැන්වීමේ අරමුණු පෙරදැරි කරගෙන මෙකී ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවේ.

ඉහත ක්‍රියාදාමයන් තුළින් තිරසර සංවර්ධන අරමුණු වල 8 හි එන සියල්ලන් සඳහාම පෝෂිත,පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම සාක්ෂාත් කර ගැනිමට හැකිය. එහිදි පරිසරයට අනර්ථයක් සිදු නොවන ලෙස ආර්ථිකය දිරිගන්වන සුළු රැකියා ජනතාවට ලබා දීම සඳහා අවැසි කොන්දේසි සමාජය විසින් නිර්මාණය කිරීම තිරසර ආර්ථික වර්ධනයේ අවශ්‍යතාවයක් වනු ඇත.

01.ප්‍රශස්ත සමිති 29ක් තෝරාගෙන සෑම සමිතියකම කුඩා කණ්ඩායම් ඇතිකොට, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත කුඩා කණ්ඩායම් මාර්ගෝපදේශ ග්‍රන්ථය ලබා දීම හා දැනුවත් කිරීම. එමඟින් ශක්තිමත් කණ්ඩායම් ක්‍රමයක් පවත්වාගෙන යාමේ ඉඩ ප්‍රස්ථා ඇති වේ.

02.සෑම කුඩා කණ්ඩායම් සාමාජිකයකුම නායකයෙක් ලෙසත් ව්‍යවසායකයෙකු ලෙසත් සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ.





## 06.ව්‍යවසායකත්ව සංගම් ප්‍රවර්ධන වැඩසටහන



උතුරු මැද පළාත තුළ ග්‍රාම සංවර්ධන සමිතිවල සිටින ව්‍යවසායකයින්ගේ ප්‍රගතිය සෙසු පළාත් අතරින් දැනට පවතින දර්ශකයට අනුව ඉහළ ස්ථානයක් වෙත ප්‍රවේශ කිරීම හා ඉහළ මධ්‍ය ආදායම් ලබන ජනතාවක් සිටින රටක් බිහිකිරීමට දායක වීම හා ග්‍රාමසංවර්ධන ස්වයං රැකියා කරුවන්ගේ සංගමය ස්ථාපිත කිරීම ප්‍රධාන අරමුණ වේ. ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහන් ලබා දෙන අතර ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු අත්පොත ලබා දීම මේ සඳහා මහත් පිටිවහලක් වේ.



- ❖ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 29 මූලික කර ගනිමින් පිහිටුවා ඇති ව්‍යවසායක සංගම් බල ගැන්වීම .
- ❖ ව්‍යවසායකත්ව මාර්ගෝපදේශන ග්‍රන්ථය සකස් කර ඒ ඔස්සේ ව්‍යවසායකත්ව සංගම් හා ව්‍යවසාය ප්‍රවර්ධනය කිරීම.
- ❖ සෑම සමිති කුඩා කණ්ඩායම් සාමාජිකයෙකුම ව්‍යවසායකයෙක් මෙන්ම ව්‍යවසායකත්ව සංගම් සාමාජිකයෙකු බවට පත් කිරීම.
- ❖ සෑම සමිතියක්ම ග්‍රාමීය වෙළඳපලක් බවට පත්කිරීම.
- ❖ සෑම ප්‍රජා ශාලාවක්ම හරිත ප්‍රජාශාලාවක් හෙවත් ග්‍රාමීය වෙළඳ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.
- ❖ ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම .
- ❖ ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .

## 07.ශ්‍රම කිරුළ ග්‍රාමීය පුස්තකාල ප්‍රවර්ධන වැඩසටහන

උතුරු මැද පළාතේ සියලුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රම කිරුළ දැනුම් කේන්ද්‍රිය මධ්‍යස්ථාන සඳහා පුස්තකාල පොත් ලබා දීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.එමඟින් දැනුම ලැබීමේ රුචිකත්වය වැඩි වූ ප්‍රජාවක් ග්‍රාමීය පරිසරය තුළ බිහි වූ අතර විද්‍යුතීය ග්‍රන්ථ (E- Book) සංකල්පය ගමට හඳුන්වා දීමද දැනුමෙන් පෝෂිත හා අන්තර්ජාල දැනුම කෙරෙහි යොමු වූ ප්‍රජාවක් බිහි වීමද සිදු වේ.

- දැනුම යනු සංවර්ධනයේ කේන්ද්‍රීය සංකල්පය වන අතර ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැනුම ගමට සංකල්පය සක්‍රීය භාවයට පත් කරමින් සියලුම වයස් කාණ්ඩ උදෙසා ප්‍රයෝජනවත් ග්‍රන්ථ පරිශීලනයට ඉඩ ප්‍රස්ථා විවර කරන පුස්තකාල නිර්මාණය කිරීම මෙම වැඩසටහනේ අරමුණු වේ.
- ගෙයින් ගෙට පුස්තකාල හා ගමින් ගමට දැනුම් කේන්ද්‍රස්ථාන සංකල්පය ඔස්සේ ඉදිරියේදි ඉ- විද්‍යුත් පුස්තකාල ක්‍රමයක් ප්‍රචලිත කිරීම අපේක්ෂා කෙරේ.
- පුස්ථකාලාධිපතිවරු දැනුවත් කිරීම සිදු කරන ලදි.
- පුස්තකාල 50ක් සඳහා මෙවර පොත් කට්ටල බෙදා දීම සිදු කරන ලදි.
- පළාතේ රචකයන්ගේ ග්‍රන්ථ සහ පොත් ප්‍රකාශයන්ගේ ග්‍රන්ථ මිලදී ගැනීම හා පළාතේ ග්‍රාමීය ජනතාව පොත් කියවීමේ කාර්යයට සමීප කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් බවට පත් වී ඇත.








## 08.සපිරි සමිති වැඩසටහන

උතුරු මැද පළාතේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සියල්ල තුළම ක්‍රියාත්මක ග්‍රාම සංවර්ධන සමිති උසස් සන්නාමයක් සහිත ග්‍රාම සංවර්ධන සමිති බවට පත් කිරීම ප්‍රධාන අරමුණ වේ. සමිති වර්ගිකරණයට අනුව පහත පරිදි ග්‍රාම සංවර්ධන සමිති ශ්‍රේණිගත කෙරේ.

i. සපිරි ලැයිස්තුවේ/ කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති
ii. දැනුවත් කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති
iii. ඇතුලත් කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති
iv. අළු කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති
v. කළු කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති

ඉහත දක්වා ඇති සමිති වර්ගිකරණය යටතේ **"දැනුවත් කාණ්ඩයට"** අයත් සමිති ඉහළම තිරසරභාවයක් සහිත **"සපිරි කාණ්ඩයේ"** සමිති බවට පත් කිරීමට අවශ්‍ය දැනුම හා සම්පත් සපුරා දීම මෙම වැඩසටහනේ අපේක්ෂාව වේ.

ග්‍රාමීය සංවර්ධනයේ නව ප්‍රවණතා වලට අනුරූපිව අදාළ නිර්ණායක වල වෙනස්කම් ඇති කිරීම තුළින් **"තිරසර සංවර්ධිත ගමක්"** බිහිකිරීමට සමිතිවල දායකත්වය ලබා ගැනීම සිදු කෙරේ. සපිරි සමිති නිර්ණායක සහිත සමිති සකස් කිරීමට දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම සිදු කිරීම වැදගත් කරුණකි.





## 09.ශ්‍රමාභිමාණී නිවාස වැඩසටහන

ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් ගුණ ගරුක ,විනය ගරුක, සාධාරණ සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් යන චතුර්විද අරමුණු ජය ගැනීම උදෙසා මිනිසාගේ මූලික අවශ්‍යතා වලින් ප්‍රධාන එකක් වන නිවාස අවශ්‍යතාවය සපුරාලීම සඳහා පදිංචියට ස්ථිර නිවසක් නොමැති පවුල්වලට ස්ථිර නිවාස ඉදිකර දී ඔවුන්ගේ ජීවන තත්වය උසස් මට්ටමකට ගෙන ඒම හා නිවාස ගොඩනැංවීම තුළින් අභිමානවත් පවුලක් බිහි කිරීම ප්‍රධාන අරමුණ වේ.

තිරසර සංවර්ධනයේ අභිමතාර්ථයන් වන පරිසරයේ තිරසාර පැවැත්ම තිරසාර පැවැත්ම සහතික කිරීම යටතේ උතුරු මැද පළාත තුළ ස්ථිර නිවසක් නොමැති පවුල් සඳහා ස්ථිර නිවසක් සාක්ෂාත් කර ගැනීම වස් ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයන් අතුරින් තෝරා ගත් නිවාස නොමැති හෝ තාවකාලික නිවාස වල ජීවත් වන සාමාජිකයන්ට ස්ථිර නිවසක් ලබා දීම මෙහි අරමුණ වේ.

- අඩු ආදායම්ලාභී එමෙන්ම නිවසක අවශ්‍යතාව සහිත පැල්පත්වාසී හෝ අනෙකුත් මූලික පහසුකම් සහිත නිවාස නොමැති පවුලකට නිවාස සිහිනය සැබෑකර දෙමින් අවම මූලික පහසුකම් හෝ සැපිරෙන නිවසක් ග්‍රාමීය ප්‍රජාවගේ ශ්‍රමය හා සම්පත් කළමණාකරණය කරමින් ඉදි කර දීම.

- නිවැසි ප්‍රජාවසවිබල ගන්වමින් අවශ්‍යතා ධූරාවලියේ ඉහළ ස්ථානයන්ට යොමු කෙරෙන පරිදි සමිති සාමාජිකත්වය ඔස්සේ අදාළ නිවැසියන් සමාජ සජීවිකරණයට ලක්කිරිමද ගෘහ ව්‍යවසායකත්වය හා ඵලදායිතාව වැඩිදියුණු කිරීම ද තවදුරටත් අපේක්ෂා කෙරේ.



## 10.ප්‍රාදේශීය සංගම් බලගැන්වීම

සපිරි ගමක් ඵලදායී සංගමයක් තුළින් තිරසාර සංවර්ධිත රටක් යන දැක්ම ඇතිව පිහිටුවා ඇති ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගමය ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයක ස්ථාන ගත කර ඇත.

ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයන් හා එම සමිති වල ක්‍රියාකාරකම් සඳහා මනා සම්බන්ධීකරණයක් හා මෙහෙයුම් ක්‍රියාවලියක් මඟින් නිවැරදි සේවාවන් සමූහයක් ශක්තිමත් කර,නිර්මාණශීලී පුහුණුවක් මඟින් ඵලදායී සංතෘප්තිමත් පවුල් ඒකකයක් ගොඩනැංවීමේ සත්කාර්යය ඉටු කරන ආයතනයක් ලෙස මෙම ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය සංගමය හැඳින්විය හැකිය. නිර්මාණශීලීත්වය හා නව තාක්ෂණය යොදාගනිමින් සාමකාමී පරිසරය තුළ දැනුම කේන්ද්‍රිය කරගත් සමාජය තුළ මානව සම්පත් කළමනාකරණය මඟින් තිරසාර සංවර්ධනයකට මෙම ආයතනය ඉතා වැදගත් වැඩ කොටසක් ඉටු කරනු ඇත.

නව නිෂ්පාදන හා සේවාවන් ආරම්භ කිරීම මඟින් දුප්පත්කම අවම කිරීම සඳහා ග්‍රාමීය ජනතාවට මහපෙන්වීම මෙමගින් ඉටුවනු ඇත. ගමට දැනුම ලබාදීම මඟින් නිර්මාණාත්මක පරපුරක් බිහි කිරීම මෙම ක්‍රියාවලියේ වැදගත් අරමුණක් වන අතර තරුණ පරපුර ශක්තිමත් කිරීමට ද එය හේතුවනු ඇත.

පවුල් සංවර්ධන ක්‍රියාවලියේ දී සදාචාරාත්මක පවුල් බිහි කිරීමට ද, නිරෝගී පවුල් බිහි කිරීමට ද අවශ්‍ය ක්‍රියාකාරකම් ඉටු කිරීම සඳහා ආයතනයට දැඩි වගකීමක් ඇත.

- ඵලදායී සංතෘප්තිමත් පවුල් ඒකකයක් ගොඩනැගීම.
- දැනුම කේන්ද්‍රියව සංවිධාන ගත වූ ග්‍රාම සංවර්ධන සමිතියට නිවැරදි මාර්ගෝපදේශයක් ලබා දීම.
- ග්‍රාමීය ප්‍රජාවගේ අවශ්‍යතා හඳුනා ගනිමින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට යොමු කිරීම මඟින් මැදිහත්කරුවෙකු වශයෙන් කටයුතු කිරීම.
- ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මූලික කරගෙන රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ග්‍රාමීය සංවර්ධන ක්‍රියාවලියට සක්‍රියව දායක වීම.
- නිර්මාණශීලි ප්‍රජාවක් මඟින් රටේ තිරසර සංවර්ධනයට මඟ පෙන්වීම.





## 11.මතින් තොර ගමක් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන තුළින් ග්‍රාමීය ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඈත් කරවීමට සහ යහමාර්ගයට ප්‍රවිෂ්ට කරවීමට ගන්නා වෑයමක් ලෙස දැක්විය හැකි අතරම මේ සඳහා දේශන පැවැත්විම මඟින් සාකච්ඡා සමුළුපැවැත්වීම මඟින් සහ පාසල් සිසුන්ට මේ සම්බන්දව අවබෝධ කරවිම තුළින් යම්තාක් දුරකට හෝ අවබෝධ කරවීම කල හැකිය. විශේෂයෙන්ම ආගම මඟින් ඉටු විය යුතු කාර්යභාරය නිසියාකාරව සමාජගත කිරිමේ පසුබිම සැකසිමත් තරුණයින් තුළ ගුණාත්මක සංවර්ධනයක් සඳහා අධ්‍යාපනික අවස්ථා සලසා දීමත් විවිධ සංවිධාන මඟින් උපදේශන සේවා දියත් කිරීමත් මෙකී වැඩසටහන ප්‍රමුඛ කිරීමේ හැකියාව පවතී.

- ග්‍රාමීය හා නාගරික ජනජීවිතය තුළ ගැටළුකාරී බවක් මතුකරමින් ව්‍යවසනකාරී ලෙස පැතිර යන විෂ මත්ද්‍රව්‍ය භාවිතයෙන් සියලු වයස් බාණ්ඩවල ප්‍රජාව මුදවාගැනීම මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථයයි.




- මත්ද්‍රව්‍යය ව්‍යාප්තිය බහුල හා ඒ සම්බන්ධයෙන් දැඩි අවදානමට ලක්ව ඇති ප්‍රදේශ මූලික කරගෙන ප්‍රජාව දැනුවත් කරමින් ගැමි නායකත්ව පවුරක් බිහිකිරීම හා පංචශීලය සුරක්ෂිත කරන සමාජයක් නිර්මාණය කිරීමට එහි ශක්තිය යොදාගැනීම එහිදී සිදු කෙරේ.

- අදාළ කාර්යය සඳහා ස්වෙච්ඡාවෙන් ආදර්ශවත්ව කැපවෙන ප්‍රජා නායකයින් ප්‍රජාව විසින් ඇගයීමේ ක්‍රියාවලියක් ද මෙම වැඩසටහන තුළින් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය හා එක්ව මත්ද්‍රව්‍ය නිවාරණ සහයකයින් දැනුවත් කිරීම මෙවර සිදු කරන ලදි.

- ප්‍රාදේශිය මට්ටමින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් ප්‍රදානය කිරීම ද තවත් සුවිශේෂ කාර්යයකි.

## 12.ග්‍රාම සංවර්ධන සමිති වර්ගීකරණය වැඩසටහන.

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේදී සිදු කරන ලද සමිති පරික්ෂාවේදී ලබා ගත් දත්ත පදනම් කරගෙන උතුරු මැද පළාත තුළ විසිරී ඇති සමිති හා පිහිටුවීමට අපේක්ෂිත සමිති වර්ගිකරණය කිරිම කාලීන අවශ්‍යතාවයක් විය. ඒ අනුව එම සමිති සඳහා නිර්ණායක හඳුන්වා දෙමින් ග්‍රාම සංවර්ධන සමිති ඇගයිමකට ලක් කිරිමට සැලසුම් කර ඇත. ඒ අනුව අදාල කොට්ඨාශයේ පළමු වන දෙවන හා තුන්වන ස්ථාන ලබා ගන්නා සමිති සඳහා මුදල් ත්‍යාග ලබා දීමට නියමිතය.

- **"සංවර්ධනය පණ ගැන්වෙනුයේ තරඟකාරිත්වයෙනි. තරඟකාරිත්වය පණ ගැන්වෙනුයේ දැනුමෙනි. නිර්මාණශීලිත්වය හා තාක්ෂණ විද්‍යාව තුළින් දැනුම පණ ගැන්වෙයි."** යන සංකල්පය මත ග්‍රාම සංවර්ධන සමිති අතර විවිධ නිර්ණායක සම්පූර්ණ කිරීම උදෙසා තරඟකාරී පෙළඹුමක් ඇතිකොට සමිති වර්ගීකරණය කිරීමත්, ප්‍රශස්ත මට්ටමේ සමිති තේරීම්කොට ඇගයීමත් මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ.

- සමිති ශ්‍රේණිගත කිරිම හා ඇගයීම තුළින් සමිති අතර ඇති වන තරඟකාරිත්වය නිසා සෑම සමිතියක්ම භෞතික , දැනුම, මූල්‍ය හා ශ්‍රම ශක්තියෙන් පරිපූර්ණ වූ ස්වශක්තියෙන් නැඟී සිටිය හැකි සමිති බවට පත් කිරිමට අවශ්‍ය මඟපෙන්වීම ලබා දීම.

- සමිති වර්ගිකරණ නිර්ණායක හා වර්ගිකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට මුදල් ප්‍රදානය කිරීම.

- මෙහිදී ග්‍රාම සංවර්ධන සමිතිවලට ලබාදෙන නිර්ණායක වලට අනුකූලව ඉදිරිපත් කරන ප්‍රමුඛතා ලේඛණ පදනම් කර පරික්ෂණ කමිටුවේ නිර්දේශ මත යෝජ්‍ය ග්‍රාම සංවර්ධන සමිති සාමාජිකයින් පස් දෙනෙකු තෝරා සම්මාන හා සහතික පත්‍රලබාදීම සහ ප්‍රාදේශිය මට්ටමින් ග්‍රාම සංවර්ධන ක්‍රියාකාරින් 700 දෙනෙකු ඇගයිම මෙහිදී සිදු කරනු ලබයි.

සමිති වර්ගීකරණය පහත පරිදි වේ.

1. සපිරි ලැයිස්තුවේ / කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති - කොළ
2. දැනුවත් ලැයිස්තුවේ / කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති - කහ
3. ඇතුලත් ලැයිස්තුවේ / කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති - රතු
4. අළු ලැයිස්තුවේ / කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති - අළු
5. කළු ලැයිස්තුවේ / කාණ්ඩයේ ග්‍රාම සංවර්ධන සමිති - කළු
6. සුදු ලැයිස්තුවේ සමිති

## 13.තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ( NVQ මධ්‍යස්ථාන) බිහිකිරීම.

උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන යටතේ ඉගෙනුම ලබන සිසුන් ජාතික නිපුණතා සහතිකපත්‍ර ලාභීන් බවට පත්කිරීම ප්‍රධානතම අභිප්‍රාය වේ.

එසේම තිරසර ප්‍රජාපුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන යටතේ ජාතික වෘත්තිය නිපුනතාවය ලබන්නන් දේශියව මෙන්ම ජාත්‍යන්තර වශයෙන් අවශ්‍ය ශ්‍රම වෙළඳපලට අවශ්‍ය වෘත්තිකයන් බිහිකිරීමද එක් අරමුණක් ලෙස දැක්විය හැකිය.

- මැහුම් විෂයයට අදාළව NVQ Level - III හා IV සඳහා ප්‍රශස්ත මට්ටමින් ග්‍රාමීය පුහුණු මධ්‍යස්ථාන බිහිකිරීම.
- NVQ පාඨමාලාව තුළින් වෘත්තීය දැනුම සහිත කාන්තා ප්‍රජාවක් බිහිකිරීම.
- ගෘහස්ත ඵලදායිතාවය හා ගෘහ ආර්ථික කළමනාකරණය පිළිබඳ දැනුම කාන්තාවන් වෙත ලබාදීම.
- ග්‍රාමීය කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම.
- පළමු NVQ පුහුණුලාභින් කණ්ඩායම සහතික පත්‍රලාභින් ලෙස සමත්වීම 2021 වර්ෂයේදි අප ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.
- NVQ මාර්ගෝපදේශ සංග්‍රහ ග්‍රන්ථය ක්‍රියාවට නැංවීම.
- කැකිරාව, පලුගස්දමන, හා මිහින්තලේ තිරසර ප්‍රජා හා පුහුණු NVQ මධ්‍යස්ථාන ලෙස අළුත්වැඩියා කිරිමෙන් පසු පාඨමාලා ආරම්භ කිරීම සිදු කරන ලදි.









## 14.පොලොන්නරුව උප කාර්යාලය අලුත්වැඩියා කිරීම හා සංවර්ධනය කිරීම




- මූලික පහසුකම් සහිතව අලුත්වැඩියා කරනු ලබන උප කාර්යාලය තුළ පොලොන්නරු දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන දත්ත තොරතුරු හා ව්‍යාපෘති කළමනාකරණය කිරීමේ කේන්ද්‍රීය කාර්යභාරය ඉටුකිරීමේ පරිපාලන ඒකකයක් ස්ථාපිත කෙරේ.
- අවශ්‍ය මානව සම්පත හා අනෙකුත් පහසුකම් සැපයීම තුළින් ***පරිධියේ මිනිසුන්*** වෙත සංවර්ධනයේ කේන්ද්‍රීය පහසුකම් වඩාත් ඉක්මනින් ලඟාකරදීම මෙහි මූලික අපේක්ෂාව වේ.
- පරිපාලන කටයුතු මෙහෙය වන උප කාර්යාලයක් ලෙස භාවිත කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.
- පොලොන්නරු දිස්ත්‍රික්කයේ සියළුම ග්‍රාම සංවර්ධන සමිති ප්‍රාදේශීය සංගම්වල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම තවත් අපේක්ෂාවකි.
- ග්‍රාමීය ප්‍රජාවගේ ස්වයංරැකියා කරුවන් සඳහා පුහුණු හ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කිරීම.

පොලොන්නරු දිස්ත්‍රික්කයේ සියළුම ග්‍රාම සංවර්ධන සමිති ප්‍රාදේශීය සංගම්හි ක්‍රියාකාරකමවල දත්ත හා තොරතුරු සුරක්ෂිත කරන ස්ථානයක් ලෙස භාවිතා කිරීම තවත් එක් අභිප්‍රායකි.

## 15.ක්ෂේත්‍ර නිලධාරින් සඳහා කබඩ් මිළදී ගැනීම (තොරතුරු කළමනාකරණය පද්ධතිය පද්ධතියක් නිර්මාණය කිරීම)

- සෑම සමිතියකටම කබඩ් එකක් සංකල්පය යටතේ සියලු සමිති වල තොරතුරු පද්ධති යාවත්කාලීන කිරීම පසුගිය වර්ෂයේ ආරම්භ විය.
- **"සෑම සමිතියකම හා ග්‍රාම සංවර්ධන ව්‍යාපෘතියකම තොරතුරු සහිත කබඩ් එකක්"** ක්ෂේත්‍ර නිලධාරින්ගේ භාරයට පත්කිරීම මෙම වැඩසටහනේ පදනම් කාරණය වේ.
- තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය තහවුරු කිරීමේ මූලික වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාවට නැංවේ.
- සෑම සමිතියකටම ලිපිගොනුවක් සංකල්පය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කටයුතු 2021 වර්ෂයේ සම්පාදනය කරන ලදි.

## 16.හැකියාවට පියාපත් මැහුම් පාඨමාලා නිර්මාණ ප්‍රදර්ශන වැඩසටහන.

උතුරු මැද පළාත පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 තුළ සය මාසික පුහුණු පාඨමාලා 02ක් මගින් බිහි කරනු ලබන මැහුම් පාඨමාලාලාභින්ගේ නිර්මාණ එළිදැක්වීම මෙහිදි සිදු කර ලදී.




- දරිද්‍රතාවයෙන් යුත් ග්‍රාමීය කාන්තාවන් සඳහා මැහුම් පාඨමාලාව හැදෑරීමේදී අවශ්‍ය වන අමුද්‍රව්‍ය සැපයීම.
- මැහුම් පාඨමාලාව තුළින් නිර්මාණ කුසලතාව දියුණු කරගත් කාන්තාවන්ගේ නිර්මාණශීලිබව ඇගයුම් කිරීම.
- ව්‍යවසායකත්වයට නිසි වෙළඳ පොළක් නිර්මාණය කරගැනීමට අවශ්‍ය පසුබිම පුහුණුලාභීන්ට උදාකරදීම.
- සයමාසික මැහුම් පාඨමාලාව Online ක්‍රමයට පැවැත්විම හා ඒ සඳහා විභාග පැවැත්වීම.
- පාඨමාලාවේ සිසුන් වෙත දිරි දීමනා ලබා දීම.
- සිසුවියන්ගේ දෙදින නිර්මාණ ප්‍රදර්ශනයක් පැවැත්වීම සිදු කරන ලදි.

- හැකියාවට පියාපත් වැඩසටහන ඩිජිටල් තලය මත ක්‍රියාත්මක වන ඩිජිටල් ප්‍රදර්ශනයක් බවට පත්කිරීමේ පළමු අදියර ලෙස "කටුකිනිත්තෙන් මැවෙන මල්" කෙටි චිත්‍රපට තරගාවලිය පැවැත්වීම සිදු කරන ලදි.
- ඒ සඳහා කෙටි චිත්‍රපට නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදි.
- චිත්‍රපට නිපැයුම සම්බන්ධව whatSapp දැනුවත් කිරීම් සිදු කිරීමේ ක්‍රමවේදය භාවිතා කිරීම.
- ප්‍රශස්ත විනිශ්චයමණ්ඩලයක් ඉදිරියේදි චිත්‍රපට තේරීම් කටයුතු සිදු කිරීම.
- ජයග්‍රාහි චිත්‍රපට හා ඉදිරිපත් වූ චිත්‍රපට ඇගයීම සහ ඒ සඳහා අවසන දී ත්‍යාග,සහතික පත් ප්‍රදානය සිදු කිරීමට කටයුතු කිරීම.

## 17.ස්වෙච්ඡා නායකයින් ලෙස තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන

- දිදුලන මනසක් - තරුණ රටක් මැයෙන් ක්‍රියාත්මක වූ තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහනේ ඊලඟ අදියර ලෙස තරුණ ප්‍රජාව ස්වෙච්ඡා සංවිධානවල නායකයින් ලෙසත් සහයකයින් ලෙසත් බලගැන්වීම මෙම වැඩසටහනේ අරමුණ වේ.
- සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම තරුණ ප්‍රජා නායකයින් සහිත සමිති සහ කුඩා කණ්ඩායම් ද තරුණ ප්‍රජාව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යවසායකයන් හා ව්‍යාපෘති ද නිර්මාණය කර රටේ සංවර්ධනයට තරුණ ප්‍රජාවේ දායකත්වය ලබාගැනීම අපේක්ෂාව වේ.





- තරුණ සමිති ව්‍යවස්ථා සැකසීම
- ව්‍යවසායකත්ව ණය ප්‍රදානය කිරීම.

තරුණ සමිති පිහිටුවා ඔවුන් සවිබල ගැන්වීම මෙම වසරේ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක විය.

## 18.සූර්ය මන්දිරය - කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානය



ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභිනවයෙන් ඉදි කරන ලද සූර්ය මන්දිර ගොඩනැගිල්ල තුලින් ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය තුළ ආධුනික ව්‍යවසායෙකුට නව දැනුම පුහුණුව ලබා දී නිපුණයෙකු බවට පත්වීමෙන් පසුව ව්‍යාපාරිකයෙක් බිහිකිරීම තුළින් තිරසර සංවර්ධනයට අනුගතව දරිද්‍රතාවය පිටුදකින පළාතක් බිහිකිරීම ප්‍රධාන අරමුණු අතර වේ.

- SMART SHOW ROOM සංකල්පය ඔස්සේ නාගරික හා ග්‍රාමීය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා වන සියලු කටයුතු ඉටුකෙරෙන ඩිජිටල් වෙළඳපොලක් නිර්මාණය කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ.
- ග්‍රාමීය ව්‍යවසායක සංගමයේ ප්‍රධාන කේන්ද්‍රස්ථානය ලෙස ව්‍යවසායකත්ව පුහුණු ක්‍රියාවලිය, ක්ෂුද්‍ර මූල්‍යය - ව්‍යවසායකත්ව ණය සැපයුම් ක්‍රියාවලිය, ව්‍යවසායකත්ව සායනය (Business Clinic) යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම ව්‍යාපෘතියෙහි සෙසු අරමුණු වේ.
- මෙවර අදාල ගොඩනැගිල්ල සඳහා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම සිදු කරන ලදි.

## 19. ක්ෂේත්‍ර හා ආයතනගත නිලධාරීන් පුහුණු කිරීම - මානව සම්පත් සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නැංවීම

- නිපුණතා දියුණුකිරීම පාදක කරගත් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම හා ඒ ඔස්සේ වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීම මෙම වැඩසටහනේ පළමු කාර්යය වේ.
- අදාළ සැලැස්ම තුළ නිපුණතා පරතර විශ්ලේෂණයකින් අනතුරුව නිපුණතා පරතරය අඩුකිරීමේ වැඩසටහන් ලෙස පුහුණු කටයුතු ක්‍රියාත්මක කරන ලදි.
- ග්‍රාම සංවර්ධන නිලදාරීන්, මැහුම් උපදේශිකාවන් ප්‍රමුඛ සියලු කාර්යමණ්ඩලය සඳහා සිව්දින පරිගණක පුහුණුව ලබා දීම මෙම වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කරන ලදි.





## 20. ග්‍රාම සංවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන.

උතුරු මැද පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් රජරට විශ්ව විද්‍යාලය සමග සම්බන්ධීකරණයෙන් ග්‍රාම සංවර්ධන කටයුතුවල රාජකාරි කරන ග්‍රාම සංවර්ධන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් සඳහා ග්‍රාම සංවර්ධන පශ්චාත් උපාධි පාඨමාලාවක් සකස් කර ඇති අතර මේ පිලිබඳ අදාළ නිලධාරීන් ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

ලොව සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවගෙන් 70% ක ප්‍රමාණයක් වාසය කරනුයේ ග්‍රාමීය පරිසර තුළය. එබැවින් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් රටේ සමස්ථ සංවර්ධනයේ ප්‍රධාන අවශ්‍යතාවක් වී ඇත. ශ්‍රී ලංකාවටද පොදු මෙම තත්ත්වය තුළ පසුගිය රජයන් මඟින් ගම නැගුම,ග්‍රාම ශක්ති,ගම්පෙරලිය වැනි විවිධ වැඩසටහන් ඒ සඳහා දියත් කරන ලදී. මෙම සෑම වැඩසටහනකටම සාපේක්ෂව ග්‍රාමීය සංවර්ධනය උදෙසා නව දැනුම හා තාක්ෂණය යොදාගැනීමේ අවශ්‍යතාව දිනෙන් දින ඉස්මතුවෙමින් පවතී.

තිරසර ග්‍රාම සංවර්ධනය (SUSTAINABLE RURAL DEVELOPMENT) නව ග්‍රාම සංවර්ධනය (NEW RURAL DEVELOPMENT) ග්‍රාම සංවර්ධනය සඳහා නව තාක්ෂණය (NEW TECHKOWLODGY FOR RURAL DEVELOPMENT) යන නව විෂයය පථයන් රැසක් මේ වන විට ගෝලීය වශයෙන් සංවර්ධනය වී ඇත. මෙම නව දැනුම ප්‍රායෝගිකත්වය හා මුසුකරමින් ගමට දැනුම සංකල්පය (KNOWLADGE TO VILLAGE) ඔස්සේ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරය තුළ නව ප්‍රවණතාවන් බිහි කිරීමට සුදුසු පරිදි ග්‍රාම සංවර්ධන නිලධාරීන් පුහුණු කිරීම මූලික අවශ්‍යතාවයක්ව පවතී.




ඒ අනුව ජාතික විශ්ව විද්‍යාලයක් මඟින් නිර්මාණය කරනු ලබන නව පාඨමාලාවක් රජරට විශ්ව විද්‍යාලය මඟින් නිර්මාණය කර

ග්‍රාම සංවර්ධන නිලධාරීන්ට මෙන්ම ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා යොමු වන සියලු උපාධිධාරී නිලධාරීන්ට එම පාඨමාලාව හැදෑරීම සඳහා අවස්ථාව උදාකරදීම මෙම වැඩසටහනේ මූලික අපේක්ෂාව වේ. මෙතෙක් මෙරට ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය තුළ ග්‍රාම සංවර්ධන විෂයය සඳහා උපාධි හෝ ඩිප්ලෝමා වැඩසටහනක් ක්‍රියාත්මක නොවන තත්වයක් තුළ එම ගැටළුවද සළකා බලමින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහනෙහි මේ වන විට විෂයය නිර්දේශයන්ට අනුව පාඨමාලා පැවැත්වීමේ කටයුතු ආරම්භ කර ඇත. තවද පවතින කොවිඩ් වසංගත තත්වය පහව යනතෙක් ඔන්ලයින් )on line) ක්‍රමය යටතේ දේශණපැවැත්වීම සිදු කරගෙන යමින් පවතී.

- තිරසර සංවර්ධන අරමුණුවල 4 වන අරමුණ වන "පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම" අරමුණෙහි 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම අරමුණ වේ.

- 2021 වර්ෂය තුළදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්තව සේවය කරනු ලබන ග්‍රාම සංවර්ධන නිලධාරින් 26 දෙනෙකු මෙකී පශ්චාද් උපාධි ඩිප්ලෝමා වැඩසටහන සඳහා ඉල්ලුම් කර ඇත.

- ඒ වෙනුවෙන් එක් අයෙකු සඳහා රු.93,000ක මුදලත් රජරට විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය වෙතට බැර කර ඇත.

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ළඟාවීම

2019 වසර සිට 2021 වසර දක්වා මෙම දෙපාර්තමේන්තුව මඟින් සකස් කරන ලද සිව් අවුරුදු මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මට අනුව 2021 වසර සඳහා නිවාස ඉදිකිරීම සඳහා නිවාස 87 ඉලක්කයක් පැවතියද 2021 වසර සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ලබා දෙන ලද සත්‍ය ප්‍රතිපාදනයට අනුව නිවාස 30ක් පමණක් ඉදිකරන ලදී. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන 27ක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 26ක ක්‍රියාත්මක වේ. සෑම වර්ෂයකම කණ්ඩායම් දෙක බැගින් බඳවා ගන්නා අතර, 2021 වර්ෂයේ 800ක් ඉලක්ක කර තිබුණද රටේ පැවති කොවිඩ් වසංගත තත්වය නිසා බඳවා ගැනීමට හැකිවූයේ එක් කණ්ඩායමක් පමණි.ඒ අනුව, 414ක් බඳවා ගත් අතර,විභාගයට 234ක් අයදුම් කලද 221ක් සමත් වී ඇත. සක්‍රීය තත්වයේ පැවති පුස්තකාල 50ක් සඳහා පොත් 100 බැගින් යුත් පොත් කට්ටල 50ක් ලබා දෙන ලදී.

පිරිපුන් කැදැල්ල උපදෙස් පත්‍රිකාවට අනුව දැහැමි නිවහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29 තුළ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක එක් සමිතියකට රු.80,000.00 බැගින් සමිති 29 ක් සඳහා මුදල් ලබා දෙන ලදී. එහිදී පිරිපුන් කැදැල්ල උපදෙස් පත්‍රිකාවට අනුව ගෙවතු හා නිවාස සකස් කර ඇති සමිති සාමාජිකයන්ගේ අවශ්‍යතාව මත චක්‍රීය ණයක් ලෙස ලබා දීමට කටයුතු කරන ලදී. සමිති සාමාජිකයන්ගේ අවශ්‍යතාවය හා ආදායම් උත්පාදනය සඳහා සක්‍රීය තත්වයේ පවතින සමිති වෙත මුදල් නිදහස් කරන ලදී. ක්ෂේත්‍රගත නිලධාරීන්ගේ, මැහුම් උපදේශිකාවන්ගේ හා කාර්යාලගත නිලධාරීන්ගේ කුසලතා සහ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ තුළින් ඉහළ ඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීමට කටයුතු කරන ලදී. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල පවත්වනු ලබන මැහුම් පුහුණු පාඨමාලා ගුණාත්මක හා ඵලදායී කරගැනීමට මධ්‍යස්ථාන සඳහා මහන මැෂින් ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව මධ්‍යකාලීන සැලැස්මෙහි සඳහන් සංඛ්‍යාත්මක ඉලක්කය 2021 වසර තුළ ලඟා කර නොගත්ත ද වඩාත් ඵලදායී ලෙස අනුමත ප්‍රතිපාදනය වැයකර ව්‍යාපෘතියට අදාළව සමස්ථ අරමුණ සාධනය කොටගෙන ඇත.

## ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| ආයතනයේ කාර්ය සාධන දර්ශක (නිමැවුම්) | වර්ෂය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100%-90% | 75% - 89% | 50% - 74% |
| ගෘහස්ත එලදායිතාවය හා මූල්‍ය කළමණාකරණය තුළින් ශක්තිමත් වූ පවුල් සංඛ්‍යාව | 90% | | |
| ගමින් ගමට දැනුම කේන්ද්‍රිය වූ පුස්තකාල ස්ථාපිත කිරීම | 100% | | |
| ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හ අනන්‍ය වූ සංස්කෘතික ලක්ෂණ ආරක්ෂා කිරීම | 90% | | |
| පැල්පත් නිවාස අවම කිරිමේ සංකල්පය යටතේ අඩුආදායම්ලාභි නිවාස ස්ථිර නිවාස බවට පත් කිරීම | 100% | | |
| තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානවල ඉගෙනුම ලැබූ NVQ 4 සිසුන් සංඛ්‍යාව | | 85% | |
| ආරම්භ කරන ලද තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ගණන | 100% | | |
| බිහි කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, සපිරි සමිති, ව්‍යවසායක සංගම් සංඛ්‍යාව | 100% | | |
| තරුණ ව්‍යවසයකයින් බවට පත් වූ සංඛ්‍යාව | 90% | | |
| ගිණුම්කරණය පිළිබඳ මනා දැනුමක් සහිත විමර්ශන නිලධාරීන් සංඛ්‍යාව | 90% | | |
| ස්වයංරැකියා සඳහා යොමු වූ පවුල් ගණන සහ තරුණ ව්‍යවසායකයින් සංඛ්‍යාව | 95% | | |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව තුළින් ගමට දැනුම බෙදන නිලධාරින් සංඛ්‍යාව | 90% | | |
| රාජකාරි ඉටු කිරීමේදී එක් එක් විෂයය පිළිබඳ මනා දැනුවත්භාවයකින් යුතු නිලධාරීන් ගණන | 100% | | |
| අළුත්වැඩියා කරන ලද ගොඩනැඟිලි සංඛ්‍යාව | 100% | | |
| මූල්‍යමය වශයෙන් ශක්තිමත් වූ ප්‍රාදේශීය සංගම් ගණන | 100% | | |
| ග්‍රාම සංවර්ධන නිලධාරීන් සහ මැහුම් උපදේශිකාවන් සඳහා ලබා දෙන ලද කාර්යාල උපකරණ සංඛ්‍යාව | 100% | | |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් තුළින් බිහිකරන ලද ආදර්ශමත් නායකයින් සංඛ්‍යාව. | 100% | | |

## අත්පත් කර ගන්නා ලද කාර්ය සාධන දර්ශක පිළිබඳ හැඳින්වීම

ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව නව්‍යකරණ වැඩසටහන් ඔස්සේ යමින් සහ වර්ෂයෙන් වර්ෂය තුළ නව වැඩසටහන් උත්පාදනය කරමින් යම් වර්ධනීය තත්වයකට ළඟා වෙමින් සිටි. එසේම 2021 වර්ෂය තුළද 2020 වර්ෂය තුළ පැවති කර ගැනීමට අපහසු වූ ව්‍යාපෘති රාශියක් ඉටුකර ගැනීමට හැකි වී තිබීම අප ලැබූ භාග්‍යක් ලෙස සැලකිය හැකිය. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන තුළින් රු.මි.51 ක මුදලක් සමස්ථ වර්ෂය තුළදී සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට හැකියාව ලැබුණි.

ඌණ කාර්ය මණ්ඩලයක් යටතේ වුවද මනා කාර්යක්ෂමතාවයකින් යුතුව සහ අමාත්‍යංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ඇතැම් ව්‍යාපෘතීන් ද ඉතා සාර්ථකව ඉටුකිරීමට හැකියාව ලැබුණි. 2021 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව කරන ලද දැහමි නිවහන සංකල්පය ඔස්සේ යමින් ක්ෂුද්‍ර කෘෂිකර්මය හෙවත් කාබනික ගෙවතු වගාව දිරිගැන්වීමත් වකුගඩු රෝග නිවාරණ ගම්මාන වැඩසටහන ඔස්සේ ගෘහස්ත ඵදායිතාවයෙන් යුත් පවුල් බිහිකිරීමටත් ණය කළමණාකරණය කිරීමේ පුරුදු ග්‍රාමීය ප්‍රජාව තුළ ඇතිකිරීම යන කරුණු ප්‍රචලිත කිරීමට හැකියාව ලැබුණි. 2021 වර්ෂයේ දී පැවති කොවිඩ් වසංගත තත්වය මත වුවද ගමින් ගමට දැනුම කේන්ද්‍රීය වූ ශ්‍රම කිරුළු පුස්තකාල ස්ථාපිත කිරීම ද සිදු කරන ලද්දකි. මෙහිදි සියලුම වයස් කාණ්ඩයන් සඳහා ප්‍රයෝජනවත් ග්‍රන්ථ බෙදා දුන් අතර එකී ග්‍රන්ථ පරිශීලනයට වැඩි ඉඩ ප්‍රස්ථා සැලසීම නිතැතින්ම සිදුවන ලද්දකි.

ග්‍රාමීය සංස්කෘතිය තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ අනන්‍ය වූ සංස්කෘතික ලක්ෂණයන් ආරක්ෂා කිරිම උදෙසා ගම්දොර වැඩසටහන නමින් වැඩසටහනක් ක්‍රියාවට නංවන ලද අතර ඒ තුළින් සාමුහික ශ්‍රමය ඔස්සේ ගමට පොදු දේපල හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සමිති ආශ්‍රිත භෞතික අවශ්‍යතා වැඩි දියුණු කිරීම සහ මුල්‍ය ශක්තිය වර්ධනය කිරීම යන කරුණු සාධනය කර ගැනීමට මෙම වර්ෂය තුළදී හැකි වුණි.

2021 වර්ෂය තුළදී රට තුළ පැවති වසංගත තත්වය නිසා වුවද පැල්පත් නිවාස අවම කොට ස්ථිර නිවාස ඉදිකිරිම යටතේ ශ්‍රමාභිමාණි නිවාස 30ක ප්‍රමාණයක් සෑම කොට්ඨාශයකම එක බැගින් ඉදිකර දීම අප ලැබූ විශිෂ්ට ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය. තිරසර ප්‍රජා පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ කිරීම නිසාවෙන් මැහුම් විෂයට අදාලව NVQ 4 මට්ටම දක්වා සිසුන් හට වෘත්තිය දැනුම ලබා දීම සිදු කරන ලද අතර ව්‍යවසායක සංගම්, සපිරි සමිති, තරුණ ව්‍යවසායකයින් බිහිකිරීම , විමර්ශන නිලධාරීන් ගිණුම් කටයුතු සඳහා යොමුකරලීම, ව්‍යවසායකයින් ස්වයංරැකියා කටයුතු වලට යොමු කරන ලද ප්‍රමාණය යනාදී ව්‍යාපෘතීන් සඳහා විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර ඒ වෙනුවෙන් චක්‍රීය ණය අරමුදල් ලබා දී අදාල සමිති දිරිගැන්වීමට කටයුතු කරන ලදි.

එමෙන්ම මෙම වර්ෂය තුළද ළඟා කර ගැනිමට අපේක්ෂත වූ ප්‍රධානතම ඉලක්කය වූයේ පශ්චාද් උපාධි ඩිප්ලෝමා වැඩසටහනයි. ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය සඳහා ඉවහල්වන දැනුම හා තාක්ෂණය ප්‍රායෝගිකව ගම වෙත රැගෙන යා හැකි නිලධාරියෙකු බිහිකිරීම වෙනුවෙන් සහ ග්‍රාම සංවර්ධන විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන අරම්භ කරන ලද මෙකී වැඩසටහන රජරට විශ්ව විද්‍යාලය තුළ ක්‍රියාත්මක කරන ලදී. එමඟින් දියුණු දැනුම් යාන්ත්‍රණයක් බිහිකිරීමට හැකි වි තිබීම විශිෂ්ට ගණයේ සේවාවක් ලෙස සැලකිය හැකිය. මෙම වර්ෂය තුළදි මානව සැලැස්මට අනුව පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් සකස් කර තිබුණද කොවිඩ් වසංගත තත්වය නිසාවෙන් නිලධාරීන් ඒකරාශි කිරිමේ ගැටළු මතු විය. එසේ වුවද ඩිජිටල් අලෙවිකරණ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට කටයුතු කරන ලදි. එමෙන්ම පරිගණක පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් ක්ෂේත්‍ර නිලධාරින්ගේ පරිගණක දැනුම වැඩිදියුණු කිරිමට සමත් විය.

පොලොන්නරුව දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ස්ථාපිත කරන ලද උප කාර්යාලය ග්‍රාමීය ප්‍රජාව සඳහා පහසුකම් සැලසීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථාපිත කරන ලදි. ක්ෂේත්‍ර නිලධාරින්ගේ මෙන්ම සමිතිවල තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම උදෙසා මෙන්ම කාර්යක්ෂම කිරිම වෙනුවෙන් තොරතුරු සහිත කබඩ් එකක් යන සංකල්පය ඔස්සේ යමින් කබඩ් 60ක් ලබා දීම සිදු කරන ලදි. එය ඔවුනට මහත් පහසුවක් වීම විශේෂයකි. එසේම මත්ද්‍රව්‍ය නිවාරන වැඩසටහන් පැවැත්වීම ද යම්තාක් දුරකට අවම මට්ටම පැවතියද ඒ සඳහා යම්යම් වැඩසටහන් වර්ෂය අවසානයේ දි සිදු කරන ලදි. එමඟින් විෂ මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොර ග්‍රාමීය ප්‍රජාවක් බිහිකිරීමේ ප්‍රථම අදියර ලෙස ක්‍රියාත්මක වුණි. යථෝක්ත කරුණු සාධනය කිරීමේදී 2021 වර්ෂය තුළ රටේ උද්ගත වී ඇති කොවිඩ් වසංගත තත්වය තුළ වුවද අපගේ ග්‍රාම සංවර්ධන සමිතිවල මූල්‍ය තත්වය 2020 වර්ෂයට සාපේක්ෂව රු.මි. 33 සිට 42ක් දක්වා ඉහළ නංවාලීමට සමත් වීම ආයතනය ලැබූ විශිෂ්ට ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

## හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ළඟා විම සඳහා ආයතනය තුළ සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුළ ඉටු කළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49 % | 50% - 74% | 75% - 100 % |
| SDG 01 – සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම | ප්‍රතිලාභීන් 24000 ක් සඳහා සහන සැලසීම | **පරෝපකාරී වෙමු යන සංකල්පය ඔස්සේ ක්‍රියාකිරීම.<br>**පංච ශක්තිය සංකල්පය ක්‍රියාවට නැඟීම. | සමිති වර්ගීකරණය, සමිති කුඩා කණ්ඩායම් වැඩසටහන, සපිරි සමිති වැඩසටහන,සමිති ණය සුරැකුම් වැඩසටහන ,ගම්දොර වැඩසටහන, ප්‍රාදේශීය සංගම් වැඩසටහන සඳහා චක්‍රීය ණය ලබාදීම සහ ව්‍යවසායකත්ව වෙළඳපොළ සංවර්ධන වැඩසටහන (සූර්ය මන්දිරය ගොඩනැඟිල්ල) | | | 95% |
| SDG 04 - පරිපූර්ණ, සාධාරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහසැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා සැලසීම | ප්‍රතිලාභීන් 1200 දෙනෙකු සඳහා. | ගමට දැනුම සංකල්පය ඔස්සේ ක්‍රියා කිරීම | තිරසර ප්‍රජා පුහුණු මධ්‍යස්ථාන අළුත්වැඩියා කොට ආරම්භ කිරීම,ග්‍රාම සංවර්ධන ඩිප්ලෝමා වැඩසටහන ආරම්භ කිරීම, ග්‍රම කිරුළ පුස්තාකල සඳහා පොත් බෙදා දීම, ප්‍රජා ගිණුම් පුහුණු වැඩසටහන් පැවැත්වීම, ග්‍රාම සංවර්ධන පර්යේෂණ වැඩසටහන පැවැත්වීම, නිලධාරී පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කරන ලදි. | | | 95% |

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ළඟා වීම සඳහා ආයතනය තුළ සැලසුම් කළ ඉලක්ක | එම ඉලක්කය ළඟා කර ගැනීමට ආයතනය අරමුණු කළ සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුළ ඉටු කළ කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුළ ලබා ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0%-49% | 50% - 74% | 75% - 100% |
| SDG 05 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | ප්‍රතිලාභීන් 1000 ක් සඳහා | දරිද්‍රතාවයෙන් යුත් ග්‍රාමීය කාන්තාවන් සඳහා මැහුම් පාඨමාලාව හැදෑරීමේදි අවශ්‍ය වන අමුද්‍රව්‍ය සැපයීම හා ව්‍යවසායකත්වයට නිසි වෙළඳපොළක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය පසුබිම පුහුණුලාභීන්ට උදාකර දීම | හැකියාවට පියාපත් මැහුම් පාඨමාලා නිර්මාණ ප්‍රදර්ශන වැඩසටහන පැවැත්වීම | | | 85% |
| SDG 08 - සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායි සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | ප්‍රතිලාභීන් 1450 ක් සඳහා | ව්‍යවසායකත්ව මාර්ගෝපදේශන ග්‍රන්ථය සකස් කර ඒ ඔස්සේ ව්‍යවසායකත්ව සංගම් හා ව්‍යවසාය ප්‍රවර්ධනය කිරීම සහ ග්‍රාමීය වෙළඳ මධ්‍යස්ථානයක් ඇතිකරීමට කටයුතු කිරීම. | ව්‍යවසායක සංගම් පිහිටුවීමේ වැඩසටහන් පැවැත්වීම සහ ප්‍රජා ගිණුම් පුහුණු වැඩසටහන් පැවැත්වීම. | | | 95% |
| SDG 16 - තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇතිකිරීම,යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායි,වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැඟීම | ප්‍රතිලාභීන් 3700ක් සඳහා | එකම පවුලක්,එකම හඬක්, එකම හීනයක් යන සංකල්ප ක්‍රියාවට නැංවීම. | තොරතුරු කළමණාකරණ පද්ධතිය නිර්මාණය කිරීම උදෙසා කබඩ් ලබා දීම, පොලොන්නරුව උපකාර්යාලය අළුත්වැඩියා කිරීම, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම, තරුණ ප්‍රජාව පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම කරන ලදි. | | | 95% |
| SDG 11- නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවි මත් සහ තිරසර ලෙස සකස් කිරීම. | නිවාස 30ක් සඳහා | ආරක්ෂාකාරී සහ සුනම්‍ය හා තිරසර නගර සහ මානව ජනාවාස ඇති කිරීම | අඩු ආදායම්ලාභී ශ්‍රමාභිමාණී නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. | | | 100% |
| SDG 12 - තිරසර පාරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම | ප්‍රතිලාභීන් 2320 | වත්කම පැය/පවුල් පැය භාවිතය මඟින් දැහැමි පවුලක් නිර්මාණය කිරීම. | දැහැමි නිවහන සංකල්පය ඇති කිරීම | | | 100% |

## වෙනත් රේඛීය අමාත්‍යාංශ ,දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංක | ව්‍යාපෘතිය | තමන්ගේ විෂය පථයට හසුවන අරමුණ | මුදල | | ප්‍රගතිය | | ලැබුණු කෙටිකාලීන / දිගුකාලීන ප්‍රතිඵල |
|---|---|---|---|---|---|---|---|
| | | | වෙන් කළ (රු.මි.) | වැය කළ (රු.මි.) | භෞතික (%) | මූල්‍ය (%) | |
| 01 | අඩු ආදායම්ලාභින් සඳහා නිවාස ව්‍යාපෘතිය (ආණ්ඩුකාරවර ප්‍රතිපාදන මඟින්) | ආරක්ෂාකාරී සුනම්‍ය හා තිරසර මානව ජනාවාස ඇති කිරීම. | 11.75 | 11.75 | 95% | 100% | හිසට සෙවණක් නොමැති අඩුආදායම්ලාභීන් සඳහා ස්ථිර නිවසක් හිමි කරදීම සහ අඩක් ඉදිකර තිබූ නිවාස සම්පූර්ණ ස්ථිර නිවාස බවට පත්කරලීම. |
| 02 | අඩු ආදායම්ලාභින් සඳහා නිවාස ව්‍යාපෘතිය (පළාත් ඉඩම්, වාරිමාර්ග, ග්‍රාම සංවර්ධන නිවාස හා කාන්තා කටයුතු අමාත්‍යාංශය මඟින්) | ආරක්ෂාකාරී සුනම්‍ය හා තිරසර මානව ජනාවාස ඇති කිරීම. | 33 | 33 | 95% | 100% | හිසට සෙවණක් නොමැති අඩුආදායම්ලාභීන් සඳහා ස්ථිර නිවසක් හිමි වීම |
| 03 | අඩු ආදායම්ලාභි වැන්දඹු නිවාස අළුත්වැඩියා කිරීමේ වැඩසටහන | අඩු ආදායම්ලාභි කාන්තා ගෘහමූලික පවුල්වල කාන්තාවන් සහ දරුවන් සුරක්ෂිත කිරීම | 0.2 | 0.2 | 98% | 100% | අඩක් නිමකල නිවාස ආරක්ෂාකාරී ස්ථිර නිවාස බවට පත් වීම |
| 04 | අඩු ආදායම්ලාභීන් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩසටහන | සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් තහවුරු කිරීම සහ සියල්ලටම සෑම වයසකදීම සුභ සාධනය කිරීම. | 0.6 | 0.6 | 98% | 100% | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙල සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම |

## COVID-19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

2021 වර්ෂය තුළදී ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති 20ක් යටතේ ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබුනි. එයින් ව්‍යාපෘති කිහිපයක්ම 2021 වර්ෂයේ පෙබරවාරි සිටම ආරම්භ කර ක්‍රියාවට නැංවීය.

එසේම මුල් මාස කිහිපය තුළ අනුමත කර ගන්නා ලද සහ මුදල් ප්‍රතිපාදන වෙන් කර ගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සිදු කර ගන්නා ලද අතර දෙවන කාර්තුව සහ තුන්වන කාර්තු වලදි රටතුළ පැවති COVID 19 තත්වය හමුවේ අනුමත ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ ගැටළුකාරි තත්වයන්ට මුහුණු දීමට සිදුවිණි.

විශේෂයෙන්ම කුඩා කණ්ඩායම් ව්‍යාපෘතිය, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන, සපිරි සමිති වැඩසටහන් ආදි ප්‍රජාව රැස්කිරීම සම්බන්ධයෙන් ගැටළුකාරි තත්වයන් පැනනැගුණු අතර අවසන් කාර්තුවේදි යම්තාක් දුරකට එකි ගැටළු මඟ හරවා ගනිමින් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට හැකි විය.

ශ්‍රමාභිමාණී නිවාස ඉදිකිරිමේ ව්‍යාපෘතියේ දි නිවාස ඉදිකිරීමේ දී අමුද්‍රව්‍ය ලබා ගැනිමේ වෙළඳපොළ හිඟකම නිසාවෙන් අදාළ ව්‍යාපෘතිය මුල්කාර්තුවේදි අඩපණ වු අතර පසුව අපහසුවෙන් වුවද ක්‍රියාවට නැංවීමට හැකියාව ලැබුණි.

2021 වර්ෂය තුළදී කළ යුතුව තිබුණු ගම්දොර අභියස සංස්කෘතික කළා මංගල්‍ය COVID 19 තත්වය හමුවේ කර ගැනිමේ හැකියාව පැවතුණද ඒ වෙනුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් පවැත්විමට කටයුතු කරන ලදි.

## ආදායම් ඉපයීම්

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) |
|---|---|---|
| වෙනත් ඉපයීම් (භාණ්ඩ වෙන්දේසිය හා සූර්ය බල විදුලි පද්ධතිය මගින්) | | 0.34 |

# 10.4.පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 1159/37 හා 2000/11/24 වන දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ එල කරන ලද නිවේදනයක් මගින් 1998 අංක 01 දරණ උතුරු මැද පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය පිහිටුවීම අදාල ප්‍රඥප්තිය මගින් ස්ථාපිත කර ඇත. ප්‍රඥප්තියේ 26(2) ප්‍රකාරව සකස් කර අනුමත කර ඇති අධිකාරියේ පරිපාලන හා විනය කාර්ය පරිපාටිය මගින් අධිකාරියේ කටයුතු පාලනය කරනු ලබයි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව සමගාමී ලැයිස්තුවට ගැනෙන මාර්ග විෂය ක්‍රියාත්මක කිරීම උතුරු මැද පළාත් සභාවේ මාර්ග විෂය භාර අමාත්‍යාංශය යටතේ උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක වේ.

සභාපති ඇතුලු අධ්‍යක්ෂක මණ්ඩලකින් අධිකාරිය සමන්විත වන අතර සාමාන්‍යාධිකාරි ප්‍රමුඛ විධායක කාර්ය මණ්ඩලයකින් පරිපාලනය වේ. පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අනුරාධපුර දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාස 04 කින්ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ විධායක ඉංජිනේරු කොට්ඨාස 03 කින් ද සමන්විත වේ. අනුරාධපුර දිස්ත්‍රික්කය අනුරාධපුර, හෙරොව්පතාන, මරදන්කඩවල හා නොච්චියාගම විධායක ඉංජිනේරු කොට්ඨාස වශයෙන්ද පොළොන්නරුව දිස්ත්‍රික්කය මනම්පිටිය, මින්නේරිය හා සේවාගම විධායක ඉංජිනේරු කොට්ඨාස වශයෙන්ද පිහිටා ඇත.

## දැක්ම

"ආරක්ෂාකාරී සහ කාර්යක්ෂම ඒකාබද්ධ මාර්ග පද්ධතියක්, සමෘද්ධිමත් ප්‍රජාවක්."

## මෙහෙවර

"මාර්ග සංවර්ධන සැලසුම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, නඩත්තුව ඇතුළු අධ්‍යයන සහ පර්යේෂණ කටයුතු සියළු පාර්ශවකරුවන්ගේ මනා සහභාගිත්වයෙන් සහ විනිවිදභාවයකින් යුක්තව ඉටු කිරීම."

## දිගුකාලීන අරමුණු

- උතුරු මැද පළාත තුළ ගුණාත්මක පළාත් මාර්ග පද්ධතියක් ඇති කිරීම.
- මාර්ගයන්හි වැඩිවන රථවාහන සංඛ්‍යාවට (Traffic volume) අනුරූපීව අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය.
- ආරක්ෂිත ප්‍රාදේශීය මාර්ග පද්ධතියක් ඇති කිරීම මගින් මාර්ග අනතුරු අවම කිරීම.
- මාර්ග වත්කම් කළමනාකරණය
- ආයතනික ධාරිතා සංවර්ධනය

## කෙටිකාලීන අරමුණු

- ➢ දෛනික හා කාලීන නඩත්තු ශක්තිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම මගින් මාර්ග බාධා හා අවහිරතා අවම කර ගමනා ගමනය විධිමත්ව පවත්වා ගැනීම.
- ➢ විධිමත් කාණු සහ ජල අපවහන පද්ධතියක් පවත්වා ගැනීම සහ මේ සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීම සහ සහයෝගය ලබා ගැනීම.

## ප්‍රධාන කාර්යයන්

**01. මාර්ග සැලසුම්, සංවර්ධන කටයුතු සහ සේවාවන් සම්බන්ධිත වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම.**

- ❖ මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම.
- ❖ මාර්ග ප්‍රවේශයන්, පරිශ්‍රයන් ඇතුළු යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ❖ මාර්ගවල යටිතල පහසුකම් සංවර්ධනය (පාලම්, බෝක්කු ඇතුළු නිර්මිතයන්)
- ❖ මාර්ග සංඥා සහ සළකුණු ස්ථාපිත කිරීම.

**02. මාර්ග නඩත්තු කිරීම.**

- ❖ දෛනික නඩත්තුව
- ❖ කාලීන නඩත්තුව
- ❖ හදිසි අවස්ථා නඩත්තුව

**03. අධ්‍යයන සහ පර්යේෂණ සිදු කිරීම**

**I. ශක්‍යතා අධ්‍යයනය**

- ❖ අධිබර වාහන ගමනාගමනය පිළිබඳ අධ්‍යයනයන්.
- ❖ මාර්ගයන්හි රථවාහන ප්‍රමාණයන් සහ එහි ප්‍රවර්ධනයන් (Traffic Volume) අධ්‍යයනය.
- ❖ අනවසර සහ මාර්ග රක්ෂිතවලට සිදුවී ඇති බලපෑම් පිළිබඳ අධ්‍යයනයන්
- ❖ විශේෂිත මාර්ග අවශ්‍යතා සහ සිද්ධි සහිත මාර්ගයන් හඳුනා ගැනීම.

**ii. සමාජ සහ පාරිසරික අධ්‍යයනයන්, කාණු සහ ජලප්‍රවාහන පද්ධතින් පිළිබඳව අධ්‍යයනයන්.**

- ❖ කාණු සහ ජලප්‍රවාහන පද්ධතීන් පිළිබඳව අධ්‍යයනයන්

**iii. නව තාක්ෂණික ඉදි කිරීම් සහ රසායනාගාර පරීක්ෂණයන්.**

**04. තිරසර සංවර්ධනය මූලික කරගත් කාර්යාල පරිශ්‍රයක් ගොඩනැගීම**

## ප්‍රධාන උපාය මාර්ගයන්

- ❖ මාර්ග රක්ෂිත අත්පත් කර ගැනීමට අදාල නීතිමය පසුබිමක් (පළාත් සභා නීති අංශයේ සහයෙන්) සකසා සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.
- ❖ අධිබර වාහන ගමනාගමනය සහ එය හේතුකොට මාර්ගයන්ට සිදුවන හානි, ආශ්‍රිත ගැටළු සහ එය වලකාලීම සම්බන්ධව ඉදිරි කටයුතු කිරීම.

- ❖ මාර්ග රක්ෂිතය උපයෝගී කොට සේවා සලසනු ලබන ආයතන (ජලසම්පාදන, විදුලි බල හා ටෙලිකොම් ආදි) සමග අන්‍යෝන්‍ය සම්බන්ධතාවයක් ඇති කිරීම සහ එම කටයුතු හේතු කොට මාර්ගයන්ට වන හානි අවම කිරීමට පියවර ගැනීම.
- ❖ මාර්ග සංවර්ධන, නඩත්තු කාර්යයන් කළමණාකරණය සහ කාර්යක්ෂම සිදු කිරීමට නව තාක්ෂණය සහ මෘදුකාංග උපයෝගී කර ගැනීම.
- ❖ සෞභාගයේ දැක්ම මාර්ගෝපදේශයේ සඳහන් හරිත මෙන්ම සුහුරු කලාපයක් යන සංකල්පය පෙරදැරි කර, තෝරාගත් මාර්ගයන් හි රුක්රෝපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## කාර්ය මණ්ඩල තොරතුරු - 2021

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 171ක් වන අතර දැනට සේවයේ නියුතු සංඛ්‍යාව 163 කි. පුරප්පාඩු සංඛ්‍යාව 15 කි.

## මූලධන වියදම්

| වියදමේ ස්වභාවය | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි) | 2021 වර්ෂයේ වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | උපයෝජනය (%) |
|---|---|---|---|---|
| 1. ගොඩනැගිලි ඉදිකිරීම | 1.5 | 0.00 | 1.5 | 100 |
| 2. යන්ත්‍ර සූත්‍ර සවිකිරීම හා උපකරණ | 6.0 | 3.91 | 2.09 | 65 |
| **එකතුව** | **7.5** | **3.91** | **3.59** | **65** |

## ජාතික ප්‍රතිපත්ති තුල අංශයේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගමන් මග

01. මාර්ග ලක්ෂයේ සංවර්ධනය කිරීමේ ජාතික ව්‍යාපෘතියට සමගාමීව ප්‍රාදේශියව සහ ග්‍රාමීයව පවතින පළාත් සභා මාර්ග කි.මී. 800ක් කාපට්අතුරා නව්‍ය කරනය කිරීම.

02. රථවාහන තදබදය අවම කිරීම සහ රථවාහන අනතුරු අවම කිරීම පිණිස ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව සහතික කරනු ලබන පරිදි ඉහත මාර්ගයන් හි (කි.මී. 800) මතුපිට අලුතින් සැකසීම.

03. ඉහත සංවර්ධන කටයුතු සිදු කරන තෙක් පවතින මාර්ගයන් නිසි පරිදි නඩත්තු කර ගමනාගමනයට සරිලන පරිදි පරිසාධන මට්ටමින් පවත්වා ගැනීම.

## ශුදුඅත විශ්ලේෂණය තුළින් අංශයේ පවත්නා තත්ත්වය පිළිබඳ විග්‍රහය

| ශක්තීන් | දුර්වලතා |
|---|---|
| • දක්ෂ, බහුකාර්ය කාර්ය මණ්ඩලයේ පැවැත්ම.<br>• ප්‍රමාණවත් සම්පත් සහ කාර්යාල අවකාශය.<br>• නඩත්තු ඒකකවල ප්‍රමාණවත් යන්ත්‍රෝපකරණ තිබීම.<br>• මාර්ග ඉදිකිරීමේදී පළපුරුදු කොන්ත්‍රාත්කරුවන් සිටීම. | • ඉදිකිරීම් කටයුතු සඳහා අමු ද්‍රව්‍යය සොයා ගැනීමේ අපහසුතාව.<br>• නීති සහ රෙගුලාසි සම්පාදනයේ දුර්වලතාවයන්.<br>• මාර්ගවලට හානි වන අධික බර පටවා ගත් වාහන නියාමනයට නිසි යාන්ත්‍රනයක් නොමැත.<br>• නිසි යාවත්කාලීන දත්ත පද්ධතියක් නොමැත. |
| **තර්ජන** | **අවස්ථාවන්** |
| • සංවර්ධන ක්‍රියාවලියේදී ආයතන අතර ප්‍රමාණවත් සහයෝගීතාවයක් නොමැති වීම.<br>• මාර්ග රක්ෂිත ආක්‍රමණය කළ අයගෙන් / .විත්තිකරුවන්ගෙන් බලපෑම් සහ තර්ජන<br>• අවිනිශ්චිත සිදුවීම් වලින් වන බලපෑම් (සීමා 19 කොවිඩ් ,ඉන්දන හිගතාවයන්)<br>• ප්‍රමාණවත් නොවන ප්‍රතිපාදන සහ ප්‍රතිපාදන නිකුතුව.<br>• අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් මතුවන පාරිසරික තර්ජන, අධික වර්ෂාව, ගංවතුර | • නව රෙගුලාසි පැනවීම සහ සංවිධාන පනත යාවත්කාලීන කිරීම.<br>• විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති මගින් සිදු කරන සංවර්ධන වලින් ලබන ප්‍රතිලාභ.<br>• පුද්ගල හැකියාවන් වැඩි දියුණු කිරීම සහ ගොඩ නැගීම සඳහා පුහුණුව සහ අනෙකුත් අවස්ථා සාක්ෂාත් කර ගැනීම. |

## මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අදාළ සංරචක අනුව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු 09 : සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.

සංරචකය 1:- පළාතේ ගුණාත්මක මාර්ග ජාලයක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | පාදම 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 1.1 | මාර්ග පුනරුත්තාපනය | පුනරුත්තාපනය කරන ලද මාර්ග දුර (km) | 13.0 | 4.35 |
| 1.2 | මාර්ග වැඩිදියුණු කිරීම | වැඩිදියුණු කරන ලද මාර්ග දුර (km) | 6.0 | 18.87 |
| 1.3 | මාර්ග නඩත්තු කිරීම | නඩත්තු කරන ලද මාර්ග දුර (km) | - | 1375 |
| 1.4 | මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම | සිදුකරන ලද මාර්ග සලකුණු කිරීම් ප්‍රමාණය (sqm). | - | 4842 |
| | | සවිකරන ලද මාර්ග සංඥා පුවරු ගණන | - | 59 |
| 1.5 | නිර්මිත ඉදිකිරීම | ප්‍රතිසංස්කරණය කරන ලද සපත්තු පාලම් සංඛ්‍යාව | - | 2 |
| | | ප්‍රතිනිර්මාණය කරන ලද හියුම් නල බෝක්කු සංඛ්‍යාව | - | 29 |
| | | ඉදිකරන ලද පැති කාණු වල දිග (m) | - | 384 |
| | | නැවත සකස්කරන ලද පැති බැම් වල දිග (m) | - | 287 |

තිරසර සංවර්ධන අරමුණු 11: නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම

සංරචකය 3:- ආයතනික ධාරිතා සංවර්ධනය

| අනු අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | පාදම 2015 | ඉලක්ක 2021 |
|---|---|---|---|---|
| 3.1 | නිලධාරීන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම | පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>• තාක්ෂණික කාර්ය මණ්ඩලය (No)<br>• කළමනාකරණ කාර්ය මණ්ඩලය (No) | 1<br>3 | 3<br>5 |

**එකිනෙක සංරචකය සඳහා උප සංරචකයන්හි කාර්යසාධන දර්ශක වල ඉලක්ක ලඟා කර ගැනීම කෙරෙහි ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති**

| අංකය | උප සංරචකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | ඉලක්කය | ඉලක්ක සපුරා ගැනීම |
|---|---|---|---|---|
| 1.1 | මාර්ග පුනරුත්තාපනය | පුනරුත්තාපනය කරන ලද මාර්ග දුර (km) | 4.35 | 95% |
| 1.2 | මාර්ග වැඩිදියුණු කිරීම | වැඩිදියුණු කරන ලද මාර්ග දුර (km) | 18.87 | 95% |
| 1.3 | මාර්ග නඩත්තු කිරීම | නඩත්තු කරන ලද මාර්ග දුර (km) | 1375 | 100% |
| 1.5 | මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම | සිදුකරන ලද මාර්ග සලකුණු කිරීම් ප්‍රමාණය (sqm). | 4842 | 98% |
| | | සවිකරන ලද මාර්ග සංඥා පුවරු ගණන | 59 | 95% |
| 1.6 | නිර්මිත ඉදිකිරීම | ප්‍රතිසංස්කරණය කරන ලද සපත්තු පාලම් සංඛ්‍යාව | 2 | 100% |
| | | ප්‍රතිනිර්මාණය කරන ලද හියුම් නල බෝක්කු සංඛ්‍යාව | 29 | 100% |
| | | ඉදිකරන ලද පැති කාණු වල දිග (m) | 384 | 100% |
| | | නැවත සකස් කරන ලද පැති බැම් වල දිග (m) | 287 | 100% |
| 3.1 | නිලධාරීන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම | පුහුණු වැඩසටහන් පැවැත්වීම<br>• තාක්ෂණික කාර්ය මණ්ඩලය<br>• කළමනාකරණ කාර්ය මණ්ඩලය | 3<br>5 | 100% |

## ප්‍රධාන කාර්යය සාධන දර්ශකය ලඟාකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති.

| අනු අංකය | ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (නිමැවුම්) | ප්‍රමාණය | | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය | වියදම (රු.මි.) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක (km) | ළඟාවීම | | | |
| 01 | පුනරුත්තාපනය කරන ලද මාර්ග දුර (km) | 4.35 | 95% | මාර්ග බොරළු යොදා සංවර්ධනය කිරීම | 17.38 | මාර්ග සංවර්ධන ව්‍යාපෘතියකදී ප්‍රතිලාභීන් ගණන නිෂ්චිතව ප්‍රකාශ කිරීමට සංගණනයක් සිදුකර තහවුරු කර ගත යුතුව ඇත. |
| 02 | වැඩිදියුණු කරන ලද මාර්ග දුර (km) | 18.87 | 95% | මාර්ග මැකඩම් ක්‍රමයට තාර යොදා සංවර්ධනය කිරීම | 3.96 | |
| 03 | නඩත්තු කරන ලද මාර්ග දුර (km) | 1375 | 100% | මාර්ග කොන්ක්‍රීට් කිරීම | 2.84 | |
| | | | | මාර්ග කාපට් අතුරා සංවර්ධනය කිරීම | 272.35 | |

අලියාවැටුණුවැව පිවිසුම් මාර්ගය බෝක්කු 03 ක් යොදා ඒ.බී.සී. පාදකය සහිතව සංවර්ධනය කිරීම



පරසන්ගස්වැව-මැදගම- කෝලිබැන්දැව මාර්ගය සංවර්ධනය කිරීම



මරදන්කඩවල-මීදිවත්ත මාර්ගය මැකඩම් ක්‍රමයට තාර යොදා සංවර්ධනය කිරීම





සුසාන භූමිය - විජයපුර - පුබුදුපුර මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම



කපුගොල්ලැව - දුටුවැව මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම



පින්පාර මාර්ගයේ පවතින පාලම පුළුල් කර සංවර්ධනය කිරීම

## මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්මේ අන්තර්ගත කළ ආකාරයට එහි ඉලක්ක කරා ලගාවීම

2021 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති හා නඩත්තු ක්‍රියාකාරකම් සිදු කිරීමේදී මාර්ග පුනරුත්ථාපන හා මාර්ග වැඩිදියුණුව ඉලක්කගත ප්‍රමාණයෙන් 95% ක ප්‍රගතියක් අත්පත් කර ගෙන ඇති අතර, මාර්ග නඩත්තු ක්‍රියාකාරකම් සිදුකිරීමේදී ඉලක්කගත ප්‍රමාණයෙන් 100% ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත.

## ආයතනයේ කාර්යය සාධන දර්ශක - ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

| ආයතනයේ කාර්යය සාධන දර්ශක (නිමැවුම්) | වර්ෂය තුළ සත්‍ය නිමවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|
| | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| පුනරුත්තාපනය කරන ලද මාර්ග දුර | 95 | | |
| වැඩිදියුණු කරන ලද මාර්ග දුර | 95 | | |
| නිම කරන ලද නිර්මිත ගණන | 95 | | |

## හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු

| අදාල ප්‍රධාන ගෝලීය අරමුණ | ගෝලීය අරමුණට ලගාවීම සඳහා ආයතනය සැලසුම් කල ඉලක්ක | එම ඉලක්කය ලඟාකර ගැනීමට ආයතනය අරමුණු කල සැලසුම් | එම සැලසුම් වෙනුවෙන් 2021 වර්ෂය තුල ඉටුකල කාර්යය | එම දර්ශක අනුව 2021 වර්ෂය තුල ලබාගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% -74% | 75% - 100% |
| සවිමත් යටිතල පහසුකම් ගොඩනැඟීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම | ආර්ථික සංවර්ධන සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය විය හැකි වීම අවධානයට ගෙන ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. | මාර්ග පුනරුත්ථාපනය, මාර්ග වැඩිදියුණු කිරීම හා මාර්ග නඩත්තු කිරීම | මාර්ග පුනරුත්ථාපනය, මාර්ග වැඩිදියුණු කිරීම හා මාර්ග නඩත්තු කිරීම | | | 95% |
| නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරිම | විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින් සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ග වල ආරක්ෂාව ඉහළ නැංවීම | | | | | 95% |

## තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

අධිකාරියේ මෙහෙවර සමාජයට දායාද කරනු පිණිස ඉටු කළ යුතු ප්‍රධාන කාර්යයන් ගුණාත්මක ලෙස සිදු කිරීමට හා තිරසර සංවර්ධන අරමුණු කරා ලගාවීමට ආයතනයේ භෞතික, මූල්‍ය හා මානව සම්පත් උපරිම අයුරින් උපයෝගී කර ගන්නා ලදී.

ප්‍රදේශයේ මාර්ග සංවර්ධන හා අදාල තාක්ෂණික සේවාවන් අවශ්‍ය වේලාවන්වලදී අවශ්‍ය ආයතනවලට ලබාදීම මෙම අධිකාරියෙන් සිදු වූ සුවිශාල සේවාවකි.

මේ අයුරින් පළාතේ මාර්ග සංවර්ධන ක්‍රියාවලිය උදෙසා අනෙකුත් ආයතන හා මනා සම්බන්ධිකරණයක් පවත්වා ගනිමින් තිරසර සංවර්ධනය මූලික කරගත් නිසා අපේක්ෂිත ප්‍රතිඵල කරා උපරිම අයුරින් ලගා වීමටත් ආයතනයේ කාර්යය සාධනය පසුගිය වසරට වඩා ඉහල නංවා ගැනීමටත් හැකි විය.

එසේම මෙම ඉලක්ක ලගාකරගැනීමේදී පහත දුෂ්කරතා වලටද මුහුණපෑමට සිදුවිය.

01) අමුද්‍රව්‍ය මිල ගණන් කෙටි කාලයක් තුළ අසීමිත ලෙස ඉහළ යාම

මාර්ග සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය වන බොරළු, මිශ්‍ර ගල් (ඒබීසී) හා ඇස්පෝල්ට් මිශ්‍රණය ප්‍රමාණවත්ව ලබා ගැනීම දුෂ්කර කාර්යයක් වූ අතර විශේෂයෙන්ම අමුද්‍රව්‍ය මිල ගණන් කෙටිකාලයක් තුළ අසීමිත ලෙස ඉහළ යාම නිසා සැපයුම්කරුවන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට යොමු නොවීම නිසා අමුද්‍රව්‍යය සපයා ගැනීමේ කාර්යය අපහසු විය.

02) COVID 19 ගෝලීය වසංගතය නිසා මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

## විදේශ ව්‍යාපෘතියට අදාල සංරචක වශයෙන් ප්‍රගතිය

| අනු අංකය | ව්‍යාපෘතිය | දායක නියෝජිත ආයතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මි) | ව්‍යාපෘති කාලසීමාව |
|---|---|---|---|---|
| 1 | නොච්චියාගම - ගාලේදිවුල්වැව මාර්ගය (0+000-5+000) | ලෝක බැංකුව | 375.39 | 2020.06.01 - 2021.08.24 |
| 2 | ඔයාමඩුව-පේමඩුව මාර්ගය (0+000-11+200) | | | |
| 3 | ඕ 2 ප්‍රධාන ඇල බැම්ම මාර්ගය (1+608-4+400) | | 507.77 | 2020.09.24 - 2021.12.19 |
| 4 | කොතලාවල මාර්ගය (0+000-5+000) | | | |
| 5 | මැදිරිගිරිය නව නගරය- අඹගස්වැව මාර්ගය (0+000-3+500) හා (12+000-15+000) | | | |
| 6 | අසේලපුර කුරුළු බැද්ද මාර්ගය (0+000-8+000) | | | |
| 7 | දඹුලු හල්මිල්ලෑව -ගල්කිරියාගම මාර්ගය (0+000-11+000) | | 498.35 | 2020.12.22 - 2022.03.17 |
| 8 | නෑගම-හල්මිල්ලෑව මාර්ගය (0+000-5+000) | | | |
| 9 | රත්මලේ - නාච්චාදුව මාර්ගය (0+000-3+000) | | | |
| 10 | අලිස්ථාන - තුරුවිල මාර්ගය (10+700-14+400) | | | |

## වෙනත් රේඛීය අමාත්‍යංශ, දෙපාර්තමේන්තු වලින් ලද ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති

| අනු අංක | ව්‍යාපෘතිය/ වැඩ සටහන/ ක්‍රියාකාරකම | මූල්‍ය ප්‍රභවය | ක්‍රියාත්මක කරන ස්ථානය (විධායක ඉංජිනේරු කොට්ඨාශය) | ක්‍රියාත්මක කාලසීමාව / දිනය | සහභාගී වූ ගණන / ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ඇස්තමේන්තු ප්‍රතිපාදනය (රු.මි.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|---|
| 1 | මින්නේරිය මූලික ආයුර්වේද රෝහලේ පිහිටි පංචකර්ම මධ්‍යස්ථානය වෙත පිවිසෙන දෙවන පිවිසුම් මාර්ගය කාපට් කිරීම (0+000-0+040 km) | ආයුර්වේද දෙපාර්තමේන්තු ප්‍රතිපාදන | මින්නේරිය | 2021.07.08<br>2021.12.08 | මාර්ග සංවර්ධන ව්‍යාපෘතියකදී ප්‍රතිලාභීන් ගණන නිශ්චිතව ප්‍රකාශ කිරීමට සංගණනයක් සිදුකර නොමැති කර ගත යුතුව ඇත. | 9.31 | 100% |
| 2 | ගල්කිරියාගම බස් නැවතුම්පල භූමිය කාපට් ඇතිරීම | මාර්ගස්ථ මඟී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රතිපාදන | මරදන්කඩවල | 2021.09.10<br>2021.12.15 | | 4.93 | 80% |
| 3 | කහටගස්දිගිලිය බස් නැවතුම්පල තාර දමා පිළිසකර කර සංවර්ධනය කිරීම | | හොරොව්පොතාන | 2021.09.15<br>2021.11.15 | | 2.78 | 100% |
| 4 | අරලගංවිල බස් නැවතුම්පල භූමිය කාපට් ඇතිරීම | | මනම්පිටිය | 2021.12.28<br>2022.01.15 | | 6.80 | 0% |

## Covid 19 ගෝලීය වසංගතය නිසා 2021 වර්ෂයේදී සංවර්ධන ඉලක්ක සාධනයේදී මුහුණ දුන් ගැටළු හා දුෂ්කරතා

සංචරණ සීමා හේතු කොට පොදු ප්‍රවාහන සේවා අඩාල විම, සේවක පැමිණීම සීමා විම, ප්‍රවාහන කටයුතු සීමා වීම නිසා භාණ්ඩ සහ සේවා කටයුතු වලට බාධා පැමිණීම (කර්මාන්ත, ව්‍යාපාර වැසී යාම), රාජ්‍ය සහ කාර්යාල වලින් වූ සේවා කටයුතුවල පසුබෑම, ව්‍යාපාතීන් සඳහා වූ සේවක පිරිස් සීමා කිරිමට සිදු විම සහ ඉන් සිදුව ඇති බලපෑම් හා අවධානම, ව්‍යාපෘතීන් සිදු වූ පසුගාමීත්වය සහ නිත්‍ය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සිදු වූ දුෂ්කරතා, සංවර්ධන කටයුතු සඳහා අමු ද්‍රව්‍ය සපයාගැනිමේ අපහසුතා හා මිළ ඉහල යාමේ ප්‍රවනතාවය, ප්‍රවාහනය සීමා වීම නිසා සේවයට වාර්තා කළ සේවක සංඛ්‍යාව අඩුවීම හා සෞඛ්‍යය මාර්ගෝපදේශ අනුව 50% ක සේවකයින්ගෙන් කාර්යාල කටයුතු සිදුකිරීමට සිදු වීම ගැටළු හා දුෂ්කරතා ලෙස හඳුනා ගත හැකිය.

## අදායම් ඉපයීම

| ශීර්ෂය | ඉලක්කය (රු.මි.) | සත්‍ය ආදායම (රු.මි.) | එකතු කිරීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන<br>පරිපාලන වියදම් - 5%<br>සෘජුවම මාර්ග සංවර්ධනය කර එමගින් ලබන ආදායම | 16.67<br>12.78 | 7.99<br>6.06 | 47.97<br>47.46 |
| මාර්ග නඩත්තු<br>පරිපාලන වියදම් - 5% | 16.67 | 16.67 | 100 |
| විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන (වෙනත් ආයතන වල)<br>උපදේශන සේවා ආදායම 3% | 1.0 | - | - |
| මූල්‍ය ආදායම<br>ස්ථාවර තැම්පතු පොළී<br>සේවක ණය සඳහා පොළී ආදායම | 3.23<br>0.70 | 3.03<br>0.07 | 93.18<br>100.87 |
| රසායනාගාර ආදායම | 10.0 | 10.8 | 108.17 |
| යන්ත්‍ර සූත්‍ර ආදායම | 28.59 | 24.17 | 84.52 |
| වෙනත් ආයතන මාර්ග භාවිතා කිරිම තුළින් ලබන ආදායම | 1.60 | 2.21 | 137.99 |
| සූර්යය බල පද්ධති ආදායම | 1.80 | 1.46 | 81.13 |
| වෙනත් ආදායම් | 2.50 | 7.99 | 319.75 |
| සේවක ණය වාරික අය කිරිම් | 11.50 | 13.24 | 115.21 |
| මාර්ග 100,000 ව්‍යාපෘතිය<br>පරිපාලන වියදම් | 57.69 | - | - |

# ඇමුණුම්

## පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දුන් සංවර්ධන ව්‍යාපෘති - 2021

### 01. පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. ප්‍රධාන අමාත්‍යාංශය | අවිච්ඡේද | ප.නි.සං.ප්‍ර.(PSDG) | 12,548,056.00 | 10,764,263.09 | 5 |
| | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 397,215,000.00 | 140,384,971.38 | 131 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 20,500,000.00 | 16,830,394.75 | 11 |
| 02.පළාත් පාලන දෙපාර්තමේන්තුව | අවිච්ඡේද | ප.නි.සං.ප්‍ර.(PSDG) | 2,678,073.00 | 2,575,561.43 | 2 |
| | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 211,591,664.94 | 91,248,673.57 | 279 |
| | | වෙනත් | 112,491,988.73 | 49,910,762.13 | 220 |
| 03.පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 99,185,000.00 | 66,678,467.49 | 27 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 11,000,000.00 | 1,615,428.00 | 3 |
| 04.පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 15,000,000.00 | 13,356,565.76 | 5 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | 889,133.59 | 2 |
| 05.මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 21,544,700.00 | 11,576,321.40 | 15 |
| 06.පුස්තකාල සේවා මණ්ඩලය | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 7,150,000.00 | 3,751,790.00 | 6 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 02. පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ව නිෂ්පාදන, සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.කෘෂිකර්ම අමාත්‍යාංශය | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 79,000,000.00 | 74,254,462.06 | 10 |
| | | ප.නි.සං.ප්‍ර.(PSDG) | 12,158,738.00 | 11,737,703.72 | 5 |
| 02.පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | අවිච්ඡේද | ප.නි.සං.ප්‍ර.(PSDG) | 12,500,000.00 | 12,500,000.00 | 1 |
| | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 112,500,000.00 | 105,415,364.37 | 13 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,000,000.00 | 2,316,425.00 | 3 |
| 03.පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | | ප.නි.සං.ප්‍ර.(PSDG) | 108,000,000.00 | 91,130,278.10 | 48 |
| | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 4,000,000.00 | 3,050,478.59 | 4 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**03.** පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.සෞඛ්‍ය අමාත්‍යාංශය | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 10,600,000.00 | 7,028,550.00 | 12 |
| 02.පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | අවිච්ඡේද | ප.නි.සං.ප්‍ර.(PSDG) | 5,993,291.00 | 971,969.14 | **5** |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,442,486.00 | 3,440,236.69 | **5** |
| | නව | උපමාන පාදක (BG) | 747,000,000.00 | 9,532,271.87 | 155 |
| | | ප.නි.සං.ප්‍ර.(PSDG) | 425,000,000.00 | 250,805,872.15 | 78 |
| | | ලෝක බැංකුව ආධාර (PSSP) | 329,442,094.12 | 321,685,706.05 | 80 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 4,000,000.00 | 3,538,450.00 | 3 |
| 03.පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 130,300,000.00 | 93,952,978.22 | 20 |
| 04.පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 78,900,000.00 | 30,563,806.33 | 37 |
| 05.පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 40,243,834.45 | 33,773,480.67 | 16 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## 04.පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

| සංරචකය | අඛණ්ඩ/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.සමුපකාර අමාත්‍යාංශය | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 5,000,000.00 | 4,999,552.67 | 4 |
| 02.සමූපකාර සේවක කොමිෂන් සභාව | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 200,000.00 | 182,470.00 | 1 |
| 03.සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 46,000,000.00 | 37,707,318.82 | 35 |
| 04.මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 25,000,000.00 | 3,375,180.43 | 11 |
| 05.පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 3,216,166.40 | 3,023,512.10 | 3 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,200,000.00 | 2,641,598.50 | 2 |
| 06.කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 57,907,900.00 | 51,937,446.94 | 51 |
| 07.කර්මාන්ත සංවර්ධන අධිකාරිය | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,173,811.00 | 2,840,237.00 | 5 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

**05. පළාත් ඉඩම්, වාරිමාර්ග, නිවාස, ග්‍රාම සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය**

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01.වාරිමාර්ග අමාත්‍යාංශය | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 39,000,000.00 | 39,000,000.00 | 6 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,241,230.00 | 2,624,418.98 | 4 |
| 02.පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 367,823,399.82 | 149,329,626.96 | 47 |
| 03.පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 10,000,000.00 | 8,637,061.65 | 8 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | 336,028.36 | 2 |
| 04.පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 50,000,000.00 | 49,459,763.63 | 39 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,000,000.00 | 987,157.00 | 1 |
| 05.පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | අවිච්ඡේද | ප.නි.සං.ප්‍ර.(PSDG) | 170,327,842.22 | 110,019,002.22 | 11 |
| | නව | ප.නි.සං.ප්‍ර.(PSDG) | 263,246,579.43 | 126,166,999.89 | 50 |
| | | ප.ස.සං.ප්‍ර.(PCDG) | 11,506,617.07 | 11,398,824.51 | 1 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

| සංරචකය | අඛණ්ඩ/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ආණ්ඩුකරවර ලේකම් කාර්යාලය | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 205,600,000.00 | 147,300,000.00 | 1061 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| සංරචකය | අඛණ්ඩ/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,000,000.00 | 2,996,189.00 | 3 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## ප්‍රධාන ලේකම් කාර්යාලය

| සංරචකය | අඛණ්ඩ/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම් කාර්යාලය | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 112,100,090.35 | 41,148,921.48 | 4 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | සංරචකය |
|---|---|---|---|---|---|
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 1,267,000.00 | 1,159,188.70 | 2 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 3,500,000.00 | 2,812,255.76 | 9 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

### පළාත් භාණ්ඩාගාරය

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් භාණ්ඩාගාරය | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 12,000,000.00 | 11,943,753.78 | 5 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 20,000,000.00 | 18,736,994.96 | 7 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ෂණ දෙපාර්තමේන්තුව

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුව | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 2,463,622.00 | 2,344,030.00 | 4 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## පළාත් සභාව හා පළාත් සභා ලේකම් කාර්යාලය

| සංරචකය | අවිච්ඡේද/නව | මූල්‍ය ප්‍රභවය | වෙන් කල මුදල (රු.මි) | 2021 වර්ෂයට අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම (රු.මි.) | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| පළාත් සභාව හා පළාත් සභා ලේකම් කාර්යාලය | නව | ප.ස.සං.ප්‍ර.(PCDG) | 800,000.00 | 700,500.00 | 2 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## උතුරු මැද පළාතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති ප්‍රගති සාරාංශය 2021.12.31 දිනට

| ව්‍යාපෘතියේ නම | ආධාර ලබා දෙන රට/ ආයතනය | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාල සීමාව | 2021.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (Climate Smart Irrigated Agriculture Project) | World Bank (ලෝක බැංකුව) | කෘෂිකාර්මික නිෂ්පාදනය සහ අලෙවිකරණය. | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව. | 5242.00 | 2018-2024 | 265.55 |
| | | කෘෂිකාර්මික කටයුතු සඳහා ජල සම්පාදනය. | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව. | | | |
| | | ව්‍යාපෘති කළමණාකරණය, මෙහෙයවීම හා ඇගයීම | කෘෂිකර්ම අමාත්‍යාංශය | | | |
| නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයJICA - ජපානය | ග්‍රාමීය ජල ව්‍යාපෘති සැලසුම් කිරීම හා ඉදි කිරීම. | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන හා ක්‍රිඩා අමාත්‍යාංශය. | 3200.00 | 2018 - 2023 | 761.78 |
| | | ග්‍රාමීය මාර්ග සැලසුම් කිරීම හා ඉදි කිරීම. | | | | |
| | | වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම. | | | | |
| පළාත් පාලන ආයතන ප්‍රවර්ධනය කිරීමේ ආංශික ව්‍යාපෘතිය ( පුරනැගුම) | ADB<br>ශ්‍රි ලංකා රජය | ජල සැපයුම් ලබා දීම | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 2300.00 | 2017-2021 | 1903.53 |
| සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ( Health System Enhancement Project (HSEP) | ආසියානු සංවර්ධන බැංකුව | සෞඛ්‍ය පහසුකම් සංවර්ධනය | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 1484 | 2019-2023 | 218.42 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන රට/ ආයතනය | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව | 2021.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| විල්පත්තු වනෝද්‍යාන බලපෑම් ප්‍රදේශ කළමණාකරන ව්‍යාපෘතිය | ජර්මනිය | විල්පත්තුව වනෝද්‍යාන මායිම් ප්‍රදේශ සංවර්ධනය | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | යුරෝ මිලියන 60 | 2019-2022 | 11.0 |
| ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය. | ජර්මනිය | ආහාර වල ගුණාත්මක තත්වය වැඩි දියුණු කිරීම | අනුරාධපුර දිස්ත්‍රික් වාණිජ මණ්ඩලය | - | 2019-2021 | - |
| පළාත් පාලන ආයතන සඳහා වු ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය | UNDP | ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | රු.මි.41 | 2020.09.10 - 2022.03.31 | 15.58 |
| අයි මාර්ග ව්‍යාපෘතිය (i- Roads) | ADB (ආසියානු සංවර්ධන බැංකුව) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග 04ක් සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග 03ක් ප්‍රතිසංස්කරණය කිරීම | මාර්ග සංවර්ධන අධිකාරිය | 10154.00 | 2016.08.01-2021.07.31 (වැඩිදියුණු කිරීම - අ.මා 02ක් සහ නඩත්තු කිරීම - අ.මා.03) | 1377.53 |
| ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය | ලෝක බැංකුව<br>ශ්‍රී ලංකා රජය | පළාත් පාලන ආයතන ක්‍රමෝපායන් ශක්තිමත් කිරීම<br>සේවාවන් වැඩිදියුණු කිරීම හා ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය<br>ආයතනික සංවර්ධනය | අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,පළාත්පාලන දෙපාර්තමේන්තුව උතුරු මැද පළාත | 1583.33 | 2019-2022 | 144.72 |

මුලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන රට/ ආයතනය | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව | 2021.12.31 දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | සංවර්ධනය සඳහා වූ ප්‍රංශ ආයතනය **(AFD)/**ප්‍රංශය ඇ.ඩො.මි.**57.5** සහ ශ්‍රී ලංකා රජයේ මූල්‍ය ප්‍රතිපාදන ඇ.ඩො.මි.**10.0** | වැසි ජල කළමනාකරණය හා කාණු පද්ධතිය නවීකරණය කිරීම | අනුරාධපුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය(AIUDP) (උපාය මාර්ගික නගර සංවර්ධන වැඩසටහන/මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය) | 10125.00 (ඇ.ඩො.මි.) | 2016-2021 | 217.67 |
| | | පොදු ප්‍රවාහනය හා ප්‍රවාහන කළමනාකරණය | | | | |
| | | පොදු ස්ථාන සහ නාගරික පහසුකම් වැඩිදියුණු කිරීම | | | | |
| | | උරුම කළමනාකරණය | | | | |
| | | හැකියාවන් වර්ධනය සහ තාක්ෂණික සහය | | | | |
| | | අප ජල කළමනාකරණ සැලැස්ම සඳහා ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම | | | | |
| වැවගම් පුබුදුව (CRIWMP) | GEF(හරිත දේශගුණ අරමුදල) | i. කුඩා වැව් 101ක් හා අමුණු 9ක් ප්‍රතිසංස්කරණය | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 1872.00 | 2017-2024 | 971.04 |
| | | ii.දේශගුණික සංවේදී කෘෂිකර්මය | පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | | |
| | | iii.ප්‍රජා ජල සම්පාදන පද්ධති 02ක් ඉදිකිරීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | | | |
| | | iv.පෙරහන් පද්ධති ලබාදීම. (කුඩා 10, විශාල 7) | | | | |
| | | v.වැසි ජල ටැංකි 245ක් ලබාදීම. | | | | |
| | | Vi.ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම | | | | |
| කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය (ASMP) | World Bank (ලෝක බැංකුව) | නවීන කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන පිහිටු වීම. (නියමු ව්‍යාපෘතීන්) | පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය. | 1710.00 | 2016-2021 | 750.63 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව

| ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන ලබා දෙන රට/ ආයතන | ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම | ක්‍රියාත්මක කරන ආයතනය | ව්‍යාපෘතියේ මුළු පිරිවැය (රු.මි) | ව්‍යාපෘති කාලසීමාව | **2021.12.31** දිනට වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|
| තඹුත්තේගම ජල සම්පාදන ව්‍යාපෘතිය | චීන සංවර්ධන බැංකුව, ලංකා රජය | ජල පවිත්‍රාගාරය, ජල කුලුණ, නල මාර්ග පද්ධතිය ඉදි කිරීම. | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය | 16,166.28 | 2018 - 2021 | 11,505.93 |
| උතුරු මැද පළාත් මග ඇළ ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | මොරගහ කන්ද ජලාශයේ සිට අනුරාධපුරය දක්වා නව ඇළ මාර්ගයක් ඉදිකිරීම. | කෘෂිකර්ම වාරිමාර්ග හා මහවැලි අමාත්‍යාංශය | 65,000 | 2017 - 2023 | 10,502.00 |
| ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය | එක්සත් රාජධානය (I,II) නෙදර්ලන්තය (III) | ග්‍රාමීය පාලම් ඉදි කිරීම (174) | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය | 5840.88 | 2013 සිට මේ දක්වා | 5,948.80 |
| අනුරාධපුර උතුර - අදියර I ජල සම්පාදන ව්‍යාපෘතිය | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය, ශ්‍රී ලංකා රජය | ජල සම්පාදනය | නාගරික සංවර්ධන ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය | 11,515.00 | 2013-2022 | 6,195.77 |
| අනුරාධපුර උතුර - අදියර II ජල සම්පාදන ව්‍යාපෘතිය | | | | ජපන් යෙන් මි.27,496 | 2018-2024 | 398.56 |
| මාර්ග සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය | ලෝක බැංකුව | මාර්ග සංවර්ධනය කිරීම | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය | 1483.00 | 2019-2023 | 731.32 |

මූලාශ්‍රය:- පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව